

# හිතොපදෙශ සන්නය.



# හිතොපදෙශ සන්නය.

විෂ්ණුශර්මන්නම් පණ්ඩිතයාගේ හිතොපදෙශයෙහිවූ ශ්ලොකයන්ගේ මේ සන්නපොත වැලිගම ශ්‍රීසුමඞ්ගල තෙරුන්නාන්සේ විසින් කරණලදී.

# හිතොපදෙශ සන්නය.

හින්දු දෙශයෙහි ප්‍රසිද්ධ නීති පණ්ඩිත යෙක්වූ

**විෂ්ණු ශර්මන් විසින් රචිත**

හිතොපදෙශයෙහිවූ ශ්ලොකයන්ගේ මේ සන්නපොත

**සුසෙවිඳ සොය්සා දිශානායක**

රාජවාසල මුදලි මන්ත්‍රිශ්වරයානන්ගේ

අයදුම සඳහා

වැලිගම ශ්‍රී සුමඞ්ගල තෙරුන්නාන්සේ විසින්

ලියනලදී.

ලක්රිවිකිරණ මුද්‍රයන්ත්‍රයේ අච්චුගසනලදී

1878.

# HITÓPADÉSA.

AS EDITED BY

THE EMINENT POLITICIAN

# VISHNU-SARMA.

TRANSLATED INTO SINHALESE

BY

WELLIGAMA SRI SUMANGALA TERUNNANSE

AT THE REQUEST OF

## S. DE SOYSA DISSANAYAKA ESQ:

MUDALIYAR OF HIS EXCELLENCY THE

GOVERNOR'S GATE.

PRINTED AT THE LAKRIVIKIRANA PRESS.

1878.

ශ්‍රීමච්ඡුබඃ ප්‍රබලො ව්‍යයී යඃ
සුසෙව්ද සොය්සාදිදිශාධිපාඛ්‍යඃ
අනාථනාථොදිතරජමන්ත්‍රී
මුද්‍රාපිතා තෙන ඉදං දයාවාන්

ලෝවැඩ කැමතිවූ සුසෙව්ද සොය්සා ද්ශානාය කාෂ්ඨිබාන වාසල මුදලිතුමානන්ගේ අවසරය ලද් දැවූ ජෙන් කරෝලිස් වීරක්කොඩි විසින් මුද්‍රාඩකාණ කරණලදී.

# පූර්වාරම්භය.

## හිතොපදෙශය.

මේ පොත—විෂ්ණුශර්මන්-යනනම්ඇති බ්‍රාහ්මණ පණ්ඩිතයා විසින් ජම්බුද්වීපයෙහිවූ මගධරට පාටලිපුත්‍ර නුවරදී පුරාණකාලයෙහි කරණ ලද්දේය. මේ පොතකිරීමට හෙතුවද එහිම මෙසේ කියනලදී.

මගධදෙශයෙහි—ගංගා නදියගේ ඉවුරෙහි—පාටලිපුත්‍ර—නම් නුවරක් ඇත්තේය. ඒ නුවරෙහි සියලු ස්වාමිගුණයෙන් යුක්තවූ සුදර්ශන නම් ඇති රජෙක්වූයේය. ඒ රජතෙම එක්දිනයෙක්හි කිසිවෙක්හු විසින් කියන ලද්දාවූ—අනෙක සංශයොච්ඡෙදි පරොක්ෂාර්ථස්‍යදර්ශකම්, යනාදි ශ්ලොක දෙකක් ඇසුයේය. ඒ අසා නොදත්නාලද ශාස්ත්‍රඇත්තාවූ නිරන්තරයෙන් නුසුදුසු මාර්ගයෙහි පවත්නාවූ තමන් පුත්‍රයන්ගේ ශාස්ත්‍ර ඉගණීමට පටන් නොගන්නාවූ කාරණයනිසා කලකිරුණු සිත්ඇති ඒරජතෙම, කොඃර්ථඃ පුත්‍රෙණ ජාතෙන යොන විද්වාන් නධාර්මිකඃ, යනාදීන් ප්‍රකාශවූ කරුණුසිතා ඉක්බිති ඒ රජතෙම පණ්ඩිත සභාවක්කෙළේය, පින්වත් පණ්ඩිතවරුනි මාගේ වචනයතෙම අසනු ලැබේවා. නිරන්තරයෙන් නොමග යන්නාවූ ශාස්ත්‍ර නූගත්තාවූ මාගේ පුත්‍රයන්ට දැන් නීතිශාස්ත්‍රය ඉගැන්වීමෙන් නැවත උත්පත්තිය කරවීමටයමෙක් පොහොසත්ද එබඳුවූ කිසි පණ්ඩිතයෙක් ඇත්තේදැයි ඇසුයේය. මෙපණ්ඩිතයන් අතුරෙන් සියලු නීතිශාස්ත්‍ර තත්වය දන්නාවූ විෂ්ණුශර්මන්නම් පණ්ඩිතතෙම දෙවයන්වහන්ස මේ රජපුත්‍රයෝ උතුම්කුලයෙහි උපන්නාහුය එහෙයින් මාවිසින් නීතිශාස්ත්‍රය පුහුණුකරවීමට හැකිවෙත්යයි බෘහස්පතිමෙන් කියේය. නැවතද ඔබැවින් මම සමසක් ඇතුළත නුඹවහන්සේගේ පුත්‍රයන් නීතිශාස්ත්‍රය දන්නාවුන් කරන්නෙමි කීයේය. රජතෙම මාගේ මේ පුත්‍රයන්ට නීතිශාස්ත්‍රය පුහුණුකරවීම පිණිස පින්වත්හු ප්‍රමාණයයි කියා ඒ විෂ්ණුශර්මන්හට බොහෝ ආදරමූල්කොට පුත්‍රයන් පාවාදුන්නේය. එකල්හි ද්‍රාසාදම්සත්තායෙහි පැපළේ උන්නාවූ රජපුත්‍රයන්ගේ ඉදිරියෙහි ප්‍රස්තාව ක්‍රමයෙන්, කාව්‍යශාස්ත්‍රවනොදෙන, යනාදීය ඒපණ්ඩිතතෙම කීයේය.

මෙහි කියනලද, පාටලිපුත්‍ර නුවර. උදයභද්දරජ්ජුගේ පුත්‍රවූ උදයාශ්ව රජ්ජු රජවූ සතරවෙනි වර්ෂයෙහි පිහිටුවූබව වායු පුරාණයෙහි කියනලදී, ඒ මෙසේයි.

ස වෛ පුරවරං රාජා පෘථිව්‍යාං කුසුමාහ්වයං
ගංගායාඃ දක්ෂිණෙ කොණෙ චතුර්ථෙබ්දෙ කරිෂ්‍යති.

පුරාණකාලයෙහි මගධදෙශයෙහි ප්‍රධානව තිබුනේ මේ නුවරයි මේ නුවර පිහිටුවනලදැයි මෙහි කියනලද කාලය වර්තමාන කාලයකෙරෙන් අවුරුදු දෙදහස් තුන්සිය හැත්තෑගණනකට පමණ පළමුයි. මේ කාලයකෙරෙන් අවුරුදු 50 කට පළමු මෙම උදයාශ්වරජ්ජුගේ මුත්තනුවූ අජාතසත්තු රජ්ජුගේ කාලයෙහි මේ නුවරකරණලදබව දීඝසඟියේ කියාතිබෙයි දැනටද මේ නුවර ජනාගහනාදියෙන් සම්බාධව තිබෙයි.

තවද මේ පොත ඉගණීමෙන් ලැබියහැකි ප්‍රයොජනද, ශ්‍රැතොහිතොපදෙශොයං, යනාදි ශ්ලොකයෙන් මෙහිම පහළවෙයි. සංස්කෘත භාෂාවෙහි දක්ෂබවද, සියලු කාරණයෙහි විසිතුරුකථා ඇතිබවද, නීතිශාස්ත්‍රය දැන්මද යනමේ ප්‍රයොජන මෙයින් ලැබියහැකිවෙයි. මේ පොතද නීතිශාස්ත්‍රයට අන්තර්ගතවූ එකකි. මෙම පණ්ඩිතයා විසින් කාරණලද පඤ්චතන්ත්‍රය කෙරෙන්ද වෙනත් නීතිශාස්ත්‍රපොත්වලින්ද කාරුණු උදුරා ගෙණ මෙහි ලියනබවද සඳහන්කරතිබෙයි. නීතිශාස්ත්‍රය ප්‍රකාශකර තිබෙනපොත්නම්, ගුරු—ශුක්‍ර—කාමන්දක—මහාභාරත—පඤ්චතන්ත්‍ර—හිතොපදෙශ යනමේ ආදියයි. මේ පොතෙන් උගන්වන්නාවූ නීතිශාස්ත්‍රයනම් අෂ්ටාදශ විද්‍යාස්ථානයන් අතුරෙන් එකකි. ප්‍රධානවූ ශාස්ත්‍රවශයෙන් පවත්නා අෂ්ටාදශවිද්‍යාස්ථානයද මෙසේ කියයුතුය. ඒ මෙසේයි.

අඞ්ගානි චතුරො වෙදා මීමාංසා න්‍යායවිස්තරඃ
පුරාණං ධර්මශාස්ත්‍රඤ්ච විද්‍යා හ්‍යෙතාශ්චතුර්දශ.
ආයුර්වේදො ධනුර්වේදො ගාන්ධර්වශ්චෙති තෙ ත්‍රයඃ
අර්ථශාස්ත්‍රං චතුර්ථන්තු විද්‍යාහ්‍යෂ්ටාදශෛව තු.

සන්ධියෙහිත් (මනාකොට අක්ෂරයන්ගේ ක්‍රම උගන්වන්නාවූ ශාස්ත්‍රයනම්වූ ශික්ෂාවය, සාමවෙදගතයාගහොමාදි ක්‍රියාවිධායකවූ—ආශ්වලායන ආපස්තම්බ-කාත්‍යායනාදීන් විසින් කරණලද සූත්‍රාන්තර්ගතවූ ශාස්ත්‍ර යයි කියනලද ක්‍රියාකල්ප විකල්පය, ම ප්‍රාද්‍යුපසර්ගාදෙන් ශබ්දයන්ගේ ඉපදීම අවබොධකරන්නාවූ ව්‍යාකරණ ශාස්ත්‍රය. ග්‍රහ නකත් ආදීන්ගේ ගමන් ස්වරූපාදිය ප්‍රකාශකරන්නාවූ පඤ්චවිධවූ ජ්‍යොතිශ්ශාස්ත්‍රය, වර්ණාගම වර්ණවිපර්යාසාදීන් කියනලද ප්‍රකෘති ප්‍රත්‍යය ශබ්ද

වශව වෙන්කරන්නාවූ නිරුක්තිශාස්ත්‍රය. අක්ෂරයන්ගේ නියමයයි කියනලද පිංගලාදීන් විසින් ප්‍රකාශිත ඡන්දශ්ශාස්ත්‍රය යනාමේ) වෙදාංගහුනාවූ ශාස්ත්‍රයද, (දශමණ්ඩලයක් සූක්ත එක්දහස් එක්සිය එකානූවක් ඇත්තාවූ ඍග්වේදය, දෙවෙනිවූ යජුර්වේදය, තුන්වෙනිවූ සාමවේදය, සතරවෙනිවූ අථර්වණවේදය) යි යනාමේ වේදසතරද, ජෛමිනි විසින් කරණලද කර්මවිෂයවූද—බ්‍රහ්මවිෂයවූද යි දෙයාකාරවූ පරීක්ෂාව මුල්කොට තත්ත්වාවබෝධය කරන්නාවූ මීමාංසා ශාස්ත්‍රයද, ද්‍රව්‍යගුණාදිපදාර්ථයන්ගේ අවබෝධය පිණිස ගොතමාදීන්විසින් කරණලද්දාවූ තර්කශාස්ත්‍රනම්වූ න්‍යායවිස්තරයද, ධන්වන්තරීන් විසින් කියනලද්දාවූ අෂ්ටාංගයෙකින් යුක්තවූ වෛද්‍යශාස්ත්‍රයයි කියනලද ආයුර්වේදය, භෘගුවිසින් කියනලද චතුර්විධවූ ආයුධයන්ගෙන් මිදීම්ආදිය ප්‍රකාශ කරන්නාවූ ධනුර්වේදය, භරතමුනිවිසින් කියනලද නැටීම් ගීතාදිය විෂයකොට පවත්නා ගාන්ධර්වශාස්ත්‍රය, ගුරු—ශුක්‍ර—කාමන්දක—පඤ්චතන්ත්‍ර—මහාභාරත—හිතොපදෙශාදීයෙහි කියනලද නීතිශාස්ත්‍රය යන මේ සතර මුලකි චතුර්දශ විද්‍යාවන්හා සමග අෂ්ටාදශවිද්‍යාවෝවෙත්.

මෙහි දක්වනලද ගුරුකම් එකින් එකටම ඥානය දියුණුවීම පිණිස හා ලොකයාගේ හික්මීම ගෙණදීම පිණිසද අතිශයින් ප්‍රයොජනවත්වූ අතිමනොහර කරුණුයි. ඒ නිසා මේ පොත ලොකයාවිසින් භාවිතාකටයුතු ප්‍රධාන වැදගත් උතුම් ප්‍රකරණයෙක්වෙයි. එහෙයින් බොහෝ කාලයකපටන් සංස්කෘත භාෂාව උගන්වන්නාවූ ගුරුවරුන් විසින්—බොම්බාය—බෙංගාලය—බාරාණසී—ආදී ඉන්දියාදෙශයෙහි සෑම පලාත්වලම භාවිතාකරවමින් එනවත්ඇර එරෝපයෙහි ප්‍රාචීදිග ශාස්ත්‍ර ප්‍රගුණකරවන්නාවූ පාඨශාලාවල අවුරුදු හැත්තෑවකපමණ කාලයපටන් ඉගැන්වීමට නියමකරතිබෙනබව පෙණෙයි.

තවද, සංස්කෘත ඉගෙණගන්නවුන්විසින් මෙපමණ බහුලවශයෙන් ප්‍රගුණකරන්නාවූ වෙනපොත් ඇත්නම් ස්වල්පයෙක. මේ පොත ඉන්දියාදෙශවාසීන්විසින් ඔවුන්ගේ භාෂාවල්ටද එරෝපාරටවාසීන්විසින් ඔවුන්ගේ භාෂාවලටද නගණලද්දේය. ඉංග්‍රීසි භාෂාවට බොහෝදෙනාන්විසින්නගා වෙන් වෙන් වශයෙන් පොත්කරණලද්දේ හුය. සංස්කෘතභාෂාවෙන් තිබෙන්නාවූ හිතොපදෙශ පොත් සහ හින්දි ඉංග්‍රීසිභාෂාවලින් තිබෙන්නාවූ පොත්ද මෙකල ලක්දිව් වාසීන්ට ලැබී එයින් කිසිකෙනෙක්. ඉගණීම පිණිස ව්‍යාවෘතවනබවද්‍රක මේ කාලයෙහි මේ පොත සිංහල භාෂාවටත්නගා ලොකයාට දුන්නේනම් බොහෝදෙනා එය නිරායාසයෙන්හා සතුටින් ප්‍රගුණකිරීමෙන් ශාස්ත්‍ර දියුණුවීමට හෙතුවෙයියනු සලකා අපේ ඇගෑම-මණින් සිංහල භාෂාවට නැගුවෙමු. එහි යම් යම් තැනෙකහි දෙෂ භාගයෙක් ඇත්තේනම් ඒද

ලෝකාර්ථකාමී පණ්ඩිතයන්විසින් ශුබකර පුණ්‍යානුකරවත්‍ය ලැබේවා: එබඳුවූ යම් ප්‍රමාදයක් මෙහි හටගත්තේවී නමුත් ලොකයා මෙය ආදරයෙන් පිළිගෙණ සාවිතාකළහොත් මගේ උත්සාහය සඵලවෙයි සිතමි. මේ ඇර ඉතා බිහ්‍යැකමින් ත්‍රිපවරක් කියවාබලා කල්පනාවට ගැණීම පිණිස උත්සාහකළහොත් නූගත් නුවණැමදවූ බොහෝදෙනාටත් මෙය වැටැහි යන්නට පුළුවන. ශ්ලෝකය සහ අන්වයත් එක්වරක් කී පමණින් අභිප්‍රාය නොවැටැහි ගියත් නැවත නැවත ත්‍රිපවරක් කියවාබැලීමෙන් අභිප්‍රාය වැටහියන්නට හැකිවෙයි. අභිප්‍රාය නොවැටහෙන්නවුන් විසින් මතුකියන ක්‍රමයටද කියාබැලියයුතු. ඒ මෙසේයි

අහාර්‍යත්වාත්, (සොරුන් විසින්) පැහැරගතයුතු නොවනබැවින්ද; අනර්ඝත්වාත්, අගය මෙතෙකැයි නියමකළ නොහැකිබැවින්ද; සර්වදා, හැමකල්හි; අක්ෂයත්වාච්ච, නොගෙවෙනබැවින්ද; සර්වද්‍රව්‍යේෂු, සියලු ද්‍රව්‍යයන්ටවඩා; විද්‍යැව, ශාස්ත්‍රයම; අනුත්තමං ද්‍රව්‍යම්, අතිශයින් උත්කෘෂ්ටවූ ද්‍රව්‍යයයි; ආහුඃ, (පණ්ඩිතයෝ) කීහු.

මෙහි සංස්කෘතභාෂාවෙහි පදයන් නොකියා, සොරුන්විසින් පැහැරගතයුතු නොවනබැවින්ද, අගය මෙතෙකැයි නියමකළ නොහැකිබැවින්ද, හැමකල්හි නොගෙවෙනබැවින්ද, සියලු ද්‍රව්‍යයන්ටවඩා ශාස්ත්‍රයම අතිශයින් උත්කෘෂ්ටවූ ද්‍රව්‍යයයි පණ්ඩිතයෝ කීහු. යනාදී සිංහල භාෂාවේ පදයන් පමණක් කියාල අදහස හැඟීයාම පහසුවෙයි. නොහැඟිගියකල මෙසේම අනික් සන්නද කියන්නේනම් මැනව.

මෙහි මිත්‍රලාභනම් පරිච්ඡේදය, මිත්‍රභෙදනම් පරිච්ඡේදය, විග්‍රහනම් පරිච්ඡේදය; සන්ධිනම් පරිච්ඡේදයයි පරිච්ඡේද සතරක්වෙත්. නොයෙක් කථාභා මිශ්‍රව තිබෙනබැවින් අදහසක් පිළිවෙළින් අවබොධකිරීම දුෂ්කරවනබෙන්නාවූ දීර්ඝකථා ත්‍රිපයක්ඇර අනික් කථාවන්ද සංස්කෘතපාඨනොගෙණ අදහස පමණක් දැන ගැණීම පිණිස දක්වා ඇති සංස්කෘතපාඨසහිතවූ පොතක් සමග එක්කර බැලීමෙන් කථාවල සංස්කෘත පාඨයන්ගේ අර්ථද දැනගන්නට කැමතිවූවන්ට මේ පොත උපකාරයක් වෙන්නට පුළුවන එසේ කථාවන්ගේ අර්ථ දැනගැණීමට උත්සාහගැන්ම සංස්කෘතභාෂාව ඉගණීමට මහත් හෙතුවෙයි

තවද නොයෙක්දෙන විසින් අච්චුගස්වනලද හිතොපදෙශ පොත්වල ශ්ලොකයන්ගේ අඩුවැඩිකම්හා එක පිළිවෙළනට නැතිබව්ද පෙණෙයි ඒ පොත් අතුරෙන් කලිකතා නුවර ශ්‍රීතාරානාථ තර්කවාචස්පති පණ්ඩිතයාවිසින් අච්චුගස්වනලද හිතොපදෙශයෙහිවූ ශ්ලොකයන් පිළිවෙළින ලියමින් සනාථකර ඇත. එසේ ලියනකල ශ්ලොකතුනක් ස්ථාන තුනකින් [illegible] තිබෙනබව පසුව දකින්ට ලැබුණු හෙයින් එසද මෙහි ලියන්නාමු.

167 ශ්ලොකයට අනතුරුවූ ශ්ලොකයයි.

සඛ්‍යො හි චපලා නිත්‍යං දෙවානාමපි විශ්‍රුතම්
තාශ්චාපි රක්ෂිතා යෙෂාං තෙ නරාඃ සුඛභාගිනඃ.

සඛ්‍යඃ, සඛීහු; නිත්‍යම්, නිරන්තරයෙන්; චපලාඃහි, චඤ්චලයෝමය සි; දෙවානාං අපි, දෙවියන්විසිනුදු; විශ්‍රුතම්, දන්නාලද්දේය. තාඃච, ඒ සඛීහුද; යෙෂාම්, යම්කෙනෙකුන්විසින්; රක්ෂිතාඃ, රක්නාලද්දාහුද; තෙනරාඃඅපි, ඒ මනුෂ්‍යයෝද; සුඛභාගිනඃ, සැපඇත්තාහුවෙත්.

348 වෙනි ශ්ලොකයට අනතුරු ශ්ලොකයයි.

මතිරෙව බලාත් ගරීයසී යදභාවෙ කරිණාමියං දශා
ඉති ඝොෂයතීව ඩිණ්ඩිමඃ කරිණො හස්තිපකාහතඃ ක්වණන්.

හස්තිපකාහතඃ, ඇත්ගොව්වන් විසින් ගසනලද්දාවූ; ක්වණන්, ශබ්ද කරන්නාවූ; ඩිණ්ඩිමඃ, ඩිණ්ඩිමනම් කුඩාබෙරයතෙම; කරිණඃ, ඇතුන් ඝොෂයති, ඝොෂාකරවයි. ඉති, මෙසේ; යදභාවෙ, යම් නුවණක්නැතිකල්හි; කරිණාම්, ඇතුන්ගේ; ඉයංදශාඉව, මේ ගතියමෙන්; බලාත්, ශක්තියට්වඩා; මතිඃඑව, නුවණම; ගරීයසී, අතිශයින් බරවන්නීය.

666 වෙනි ශ්ලොකයට අනතුරු ශ්ලොකයයි.

මුදං විෂාදඃ ශරදං හිමාගමඃ තමො විවස්වාන් සුකෘතං කෘතඝ්නතා
ප්‍රියොපපත්තිඃ ශුචම් ආපදං නයඃ ශ්‍රියං සමෘද්ධාමපි හන්ති දුර්නයඃ.

විෂාදඃ, කලකිරීමතෙම, මුදං, සතුටද; හිමාගමඃ, ශීතකාලයතෙම; ශරදම්, ශරත්කාලයෙහි ගුණයද; විවස්වාන්, සූර්යයාතෙම; තමඃ, අන්ධකාරයද; කෘතඝ්නතා, කළ උපකාර නසනබව; සුකෘතම්, සුචරිතයද; ප්‍රියොපපත්තිඃ, ප්‍රියමිත්‍රයන්ගේ පැමිණීම; ශුචම්, ශොකයද; නයඃ, නීතියතෙම; ආපදම්, විපත්තිද; දුර්නයඃ, නුසුදුසු නීතියතෙම; සමෘද්ධාංඅපි, වැඩිනාවූද; ශ්‍රියම්, ඓශ්වර්යයද; හන්ති, නසා.

# මෙහි කථාවන්ගේ පටුනයි.


| | පිට | පේළිය |
|---|---|---|
| කවුඩු—ඉදුබු—භූෂිකා—පරවි—මුවයන මොවුන්ගේ කථාව. ... | 209 | 12 |
| ව්‍යාඝ්‍ර—මෘග දෙදෙනාගේ. ... ... ... ... ... | 215 | 16 |
| කවුඩු—මුව—සිවල්තුන්දෙනාගේ ... ... ... ... | 216 | 20 |
| ගිජුලිහිණි—බළල්—පක්ෂියන මොවුන්ගේ ... ... ... | 218 | 17 |
| මහලු වෙළෙන්දාගේහා ඔහුගේ ස්ත්‍රියගේ ... ... ... | 219 | 28 |
| වැදි—මුව—ඌරු—සර්ප—සිවල්යන මොවුන්ගේ ... ... | 220 | 19 |
| වෙළඳ භාර්‍යා—රජපුත්‍ර දෙදෙනාගේ... ... ... ... | 221 | 2 |
| සිවල්—හස්ති දෙදෙනාගේ ... ... ... ... ... | 222 | 17 |
| දත්බෙහි උලඟුගිලූ වඳුරාගේ ... ... ... ... ... | 223 | 6 |
| කොටලු—සොර—බලු—රදායන මොවුන්ගේ ... ... ... | 223 | 18 |
| ඝණ්ටාකර්ණ—කූටවින් දෙදෙනාගේ ... ... ... ... | 224 | 5 |
| කන්දප්පකෙලි—ගොපලු—කරනැවැම් දෙදෙනාගේ අඹුවන් හා සත්පුරුෂයන මොවුන්ගේ ... ... ... ... | 224 | 24 |
| භූෂිකා—බළල් සිංහයන මොවුන්ගේ ... ... ... ... | 95 | 30 |
| ගොපලු භාර්‍යාවගේහා සොරසැමි දෙදෙනාගේ ... ... | 102 | 31 |
| කවුඩුධෙනු—නාග දෙදෙනාගේ ... ... ... ... | 104 | 30 |
| සිංහයාගේහා සාවාගේ ... ... ... ... ... ... | 105 | 16 |
| පක්ෂීන්ගේහා වඳුරන්ගේ ... ... ... ... ... | 126 | 21 |
| ව්‍යාඝ්‍ර සමක් පොරවනලද කොටලුවාගේ ... ... ... | 127 | 29 |
| සාවුන්ගේහා හස්තීන්ගේ ... ... ... ... ... | 129 | 19 |
| කවුඩු හංස දෙදෙනාගේ... ... ... ... ... ... | 132 | 17 |
| කවුඩු—වටුදෙදෙනාගේ ... ... ... ... ... ... | 132 | 29 |
| වඩුවාගේ ... ... ... ... ... ... ... ... | 133 | 21 |
| නිලවර්ණ සිවලාගේ ... ... ... ... ... ... | 143 | 31 |
| තම්පුත්‍රයා බිලිදුන් වීරවර රජපුත්‍රයාගේ ... ... ... | 155 | 9 |
| භික්ෂු—කරනැවැම් දෙදෙනාගේ ... ... ... ... | 159 | 19 |
| හංසයන් දෙදෙනාගේහා ඉදිබුවාගේ ... ... ... ... | 172 | 9 |
| මසුන් තුන්දෙනාගේ ... ... ... ... ... ... | 173 | 11 |
| වෙළඳ භාර්‍යාවූ රත්නප්‍රභාවගේ ... ... ... ... | 173 | 26 |
| මුගටියාගේහා කොකුන්ගේ ... ... ... ... ... | 174 | 25 |
| සෘෂියාගේහා මීයාගේ ... ... ... ... ... ... | 175 | 22 |
| කොකාගේහා කකුළුවාගේ ... ... ... ... ... | 176 | 15 |
| බ්‍රාහ්මණ—බඩහැල දෙදෙනාගේ ... ... ... ... | 177 | 25 |
| සුන්ද—උපසුන්ද දෙදෙනාගේ ... ... ... ... ... | 179 | 16 |
| බමුණාගේහා එළුවාගේ ... ... ... ... ... ... | 188 | 18 |
| ඔටු—කවුඩු—සිවල්—ව්‍යාඝ්‍රයන මොවුන්ගේ ... ... ... | 188 | 31 |
| මහලුසප්පාගේහා මැඩියන්ගේ... ... ... ... ... | 191 | 23 |
| බ්‍රාහ්මණයාගේහා මුගටියාගේ ... ... ... ... ... | 200 | 20 |

# හිතොපදෙශ සන්නය.

---

සිද්ධිඃ සාධ්‍යෙ සතාමස්තු ප්‍රසාදාත්තස්‍ය ධූර්ජටේඃ,
ජාහ්නවීඵේනලේඛේව යන්මූර්ධ්නි ශශිනඃ කලා.

ජාහ්නවීඵේනලේඛාඉව, ගංගානදියගේ පෙණරෙදක්වැනිවූ; ශශිනඃ, චන්ද්‍රයාගේ; කලා, ( අභිනව ) රේඛාතොමෝ; යන්මූර්ධ්නි, යමෙකුගේ මස්තකයෙහි වේද—තස්‍යධූර්ජටේඃ, ඒ ඊශ්වරයාහට; ප්‍රසාදාත්, ප්‍රසන්නය හෙතුකොට ගෙණ; සතාම්, සත්පුරුෂයන්ගේ; සාධ්‍ය, සිද්ධ කටයුතු අර්ථයෙහි; සිද්ධිඃ, නිෂ්පත්තියතොමෝ; අස්තු, වේවා *

හිතොපදෙශනම් මෙ ශාස්ත්‍රයෙහි ප්‍රයොජන මීට අනතුරු
ශ්ලෝකයෙන් ප්‍රකාශකරණලදී.

2 ශ්‍රුතො හිතොපදෙශොයං පාටවං සංස්කෘතොක්තිෂු,
වාචාං සර්වත්‍ර වෛචිත්‍ර්‍යං නීතිවිද්‍යාං දදාති ච.

ශ්‍රුතඃ, අසනලද්දාවූ; අයම්හිතොපදෙශඃ, මේ හිතොපදෙශ (නම් ශාස්ත්‍ර) ය තෙම; සංස්කෘතොක්තිෂු, සංස්කෘත කථා ව්‍යවහාරයන්හි; පාටවම්, දක්ෂබවද; සර්වත්‍ර, සියලුතැන්හි; වාචාම්, වචනයන්ගේ; වෛචිත්‍ර්‍යම්, විසිතුරුබවද; නීතිවිද්‍යාම්ච, නීතිශාස්ත්‍රයද; දදාති, දේ.

ධනය ශාස්ත්‍රය යන දෙක සෙවියයුතුබවහා සුචරිත ක්‍රියාවෙහි යෙදියයුතුබවත් ප්‍රකාශකරණු පිණිස මීට අනතුරු ශ්ලෝකය කියනලදී.

3 අජරාමරවත් ප්‍රාඥෝ විද්‍යාමර්ථංච චින්තයෙත්,
ගෘහීත ඉව කෙශෙෂු මෘත්‍යුනා ධර්මමාචරෙත්.

ප්‍රාඥඃ, නුවණැතිතැනැත්තේ; විද්‍යාම්, ශාස්ත්‍රයද; අර්ථං, ධනයද; අජරාමරවත්, ජරාමරණ නැත්තකුමෙන්; චින්තයෙත්, සිතන්නේය;

---

* මේ ප්‍රකරණය කරණලද පණ්ඩිතයා ශිවභක්තිකයෙකු බැවින් තමන් අදහා දෙවියන්ට මේ ශ්ලෝකයෙන් ස්තුතිකොට අශීර්වාද්කළබව පෙනේ. ඊශ්වරයා යනු නාමමාත්‍රයම මුත් ඉන්ද්‍රිය සහිතවූ දෙයක් නොවෙක් නැතැයි ශිවසමය අවබොධකළ පණ්ඩිතයන්ගේ මතයයි.

මෘත්‍යුනා, මරුවාවිසින්; කෙශෙෂු, කෙශයන්හි; ගෘහීතඃඉව, ගන්නා ලද්දකුමෙන්; ධර්මම්, (දානාදි සුචරිත) ධර්මයෙහි; ආචරෙත්, හැසිරෙන් නේය.

ද්‍රව්‍යසැපයීමට වඩා ශාස්ත්‍රඉගනීම උතුම්බවට කාරණනම්.

4 සර්වද්‍රව්‍යෙෂු විද්‍යෛව ද්‍රව්‍යමාහුරනුත්තමම්,
අහාර්‍ය්‍යත්වාදනර්ඝ්‍යත්වාද ක්‍ෂය්‍යත්වාච්ච සර්වදා.

අහාර්‍ය්‍යත්වාත්, (සොරුන්විසින්) පැහැරගතයුතු නොවනබැවින්ද; අනර්ඝ්‍යත්වාත්, අගයමෙතෙකැයි නියමකළනොහැකිබැවින්ද; සර්වදා, හැමකල්හි; අක්‍ෂය්‍යත්වාච්ච, නොක්‍ෂයවෙනබැවින්ද; සර්වද්‍රව්‍යෙෂු, සියලු ද්‍රව්‍යයන් අතුරෙහි; විද්‍යාඑව, ශාස්ත්‍රයම; අනුත්තමම්ද්‍රව්‍යම්, අතිශයින් උත්කෘෂ්ටවූ ද්‍රව්‍යයයි; ආහුඃ, (පණ්ඩිතයෝ) කීහු.

ශා ස්ත්‍ර ඉ ග නී මෙ හි වැ ඩ.

සඞ්ගමයති විද්‍යෛව නීචගාපි නරං සරිත්,
සමුද්‍රමිව දුර්ධර්ෂං නෘපං භාග්‍යමතඃ පරම්.

නීචගා, පාත්භූමියකරාපැමිණෙන්නාවූ; සරිත්, නදීතොමෝ; සමුද්‍රම්ඉව, සාගරයකරා (පැමිණෙන්නාක්) මෙන්; විද්‍යාඑව, ශාස්ත්‍රයම; නරම්අපි, මනුෂ්‍යයාද; දුර්ධර්ෂම්, ආශ්‍රයකළනොහැක්කාවූ; නෘපම්, රජ්ජුරුවන්කරාද; අතඃපරම්, නැවත; භාග්‍යම්, වාසනාවකරාද; සඞ්ගමයති, ගැලපීමකෙරේ.

ශාස්ත්‍ර ඉගනීමෙන්ම අනික් ප්‍රයෝජනත් ඉෂ්ටවනබව.

6 විද්‍යා දදාති විනයං විනයාද්‍යාති පාත්‍රතාම්,
පාත්‍රත්වාද්ධනමාප්නොති ධනාද්ධර්මං තතඃ සුඛම්.

විද්‍යා, විද්‍යාතොමෝ; විනයම්, (ඉන්ද්‍රියනිග්‍රහයෙන්) හික්මීම; දදාති, දේ—විනයාත්, හික්මීමහේතුකොටගෙණ; පාත්‍රතාම්, (දන්ලැබීමෙහි) සුදුසුබවට; යාති, පැමිණේ. පාත්‍රත්වාත්, සුදුසුබව හෙතුකොටගෙණ; ධනම්, (මුක්තාමාණික්‍යාදි) ධනයට; ආප්නොති, පැමිණේ. ධනාත්, ධනයහෙතුකොටගෙණ; ධර්මම්, (දානාදි) සුචරිතධර්මයටද; තතඃ, නැවත; සුඛම්, සැපතටද (පැමිණේ.)

කඩුසිල්පාදි ආයුධශිල්ප ඉගනීමට වඩා ශාස්ත්‍රඉගනීම ප්‍රශස්තබව.

7 විද්‍යා ශස්ත්‍රඤ්ච ශාස්ත්‍රඤ්ච ද්වෙ විද්‍යෙ ප්‍රතිපත්තයෙ,
ආද්‍යා හාස්‍යාය වෘද්ධත්වෙ ද්විතීයාද්‍රියතෙ සදා.

විද්‍යාශස්ත්‍රංච, යුද්ධශාස්ත්‍රයද; ශාස්ත්‍රංච, ශාස්ත්‍රයද; (යන) ද්වෙ, දෙක; විද්‍යෙ, ශාස්ත්‍රයන්ද; ප්‍රතිපත්තයෙ, පැමිණීමපිණිසවෙත්. ආද්‍යා; මුලකී ආයුධවිද්‍යා තොමෝ; වෘද්ධත්වෙ, වෘද්ධබවඇතිකල්හි; හාස්‍යාය, සිනාපිණිස වන්නීය; ද්විතීයා, දෙවනුකී විද්‍යාතොමෝ; සදා, සැමකල්හි; ආද්‍රියතෙ, ආදරකරණුලැබේ.

මේශාස්ත්‍රය දක්වනුලබණ ප්‍රකාරයනම්.

8 යන්නවෙ භාජනෙ ලග්නඃ සංස්කාරො නාන්‍යථා භවෙත්,
කථාච්ඡලෙන බාලානාං නීතිස්තදිහ කථ්‍යතෙ.

නවෙභාජනෙ, අළුත්වූ (මැටි) භාජනයෙක්හි; ලග්නඃ, ඇළුනාවූ; සංස්කාරඃ, සැරසීමතෙම; යත්, යම්හෙයකින්; අන්‍යථානභවෙත්, අන්පරිද්දෙකින් (වෙනස්) නොවන්නේද. තත්, එහෙයින්; බාලානාම්, ළදරුවන්ගේ; කථාච්ඡලෙන, කථාව කරණකොටගෙණ වැසිමෙන්; ඉහමෙහි; නීතිඃ කථ්‍යතෙ, නීතිශාස්ත්‍රයතෙම කියනුලැබේ.

මේශාස්ත්‍රයෙහි දක්වනුලබණ පද්ධතිනම්.

9 මිත්‍රලාභඃ සුහෘද්භෙදො විග්‍රහඃ සන්ධිරෙව ච,
පඤ්චතන්ත්‍රාත් තථාන්‍යස්මාද් ග්‍රන්ථාදාකෘෂ්‍ය ලිඛ්‍යතෙ.

මිත්‍රලාභඃ, මිත්‍රලාභ (නම්පරිච්ඡෙද) යද; සුහෘද්භෙදඃ, මිත්‍රභෙද (නම්පරිච්ඡෙද)යද; විග්‍රහඃ, යුද්ධ (පරිච්ඡෙද) යද; සන්ධිඃ එවච, ගැලපීම සඳහා මෛත්‍රීකිරීමද; (යනචතුර්විධවූ නීතිශාස්ත්‍රයතෙම) පඤ්චතන්ත්‍රාත්, පඤ්චතන්ත්‍ර (නම්ප්‍රකරණ) ය කෙරෙන්ද; තථා, එසේම; අන්‍යස්මාත්ග්‍රන්ථාත්, අනික්පොත්කෙරෙන්ද; ආකෘෂ්‍ය; ඇද; (උදුරාගෙණ) ලිඛ්‍යතෙ; (මාවිසින්) ලියනුලැබේ.

ශාස්ත්‍රඥගතුන්ට නිග්‍රහාදිය.

10 අනෙකසංශයොච්ඡෙදි පරොක්ෂාර්ථස්‍ය දර්ශකම්,
සර්වස්‍ය ලොචනං ශාස්ත්‍රං යස්‍ය නාස්ත්‍යන්ධ එව සඃ.

අනෙකසංශයොච්ඡෙදි, නොයෙක්සැක උදුරනා සුලුවූ; පරොක්ෂාර්ථස්‍ය, ඉන්ද්‍රියවිෂයනුවූ (නුදුටු) කාරණයාගේ; දර්ශකම්, ප්‍රකාශකරනුයේවූ; සර්වස්‍යලොචනම්, සියල්ලට ඇසක්වූ; ශාස්ත්‍රම් ශාස්ත්‍රයතෙම, ස්‍යනාස්ති, යමෙකුට නැත්තේද; සඃ, ඒතෙම; අන්ධඃඑව, අන්ධයෙක්මය.

අනර්ථයට කාරණවූ කරුණු සතරෙක්,

11 යෞවනං ධනසම්පත්තිඃ ප්‍රභුත්වමවිවෙකිතා,
එකෛකමප්‍යනර්ථාය කිමු යත්‍ර චතුෂ්ටයම්.

යෞවනම්, තරුණඅවස්ථාවද; ධනසම්පත්තිඃ, ධනයටපැමිණීමද; ප්‍රභුත්වම්, පොහොසත්බවද; අවිවෙකිතා, පරීක්‍ෂානැතිබවද; (යන) එකෛකමපි, එකඑකක්දු; අනර්ථාය, අවැඩපිණිස; (වෙත්) කත්‍ර, එහි; චතුෂ්ටයම්, සතරම්; (සමෙකුටපවතීද) කිමු, (ඕහට අවැඩඑළවීම) කියනුකිම.

## ලැබුනේවිනමුත් ප්‍රයෝජන නැත්තාවූ පුත්‍රයන්ගේ ස්වභාවය.

12 කොර්ථඃ පුත්‍රෙණ ජාතෙන යො න විද්වාන් න ධාර්මිකඃ,
කාණෙන චක්‍ෂුෂා කිංවා චක්‍ෂුඃ පීඩෛව කෙවලම්.

යඃ, යමෙක්තෙම; නවිද්වාන්, පඬිතනොවේද; නධාර්මිකඃ, සත්පුරුෂ නොවේද; (එබඳුවූ) ජාතෙන පුත්‍රෙණ, උපන්නාවූ පුත්‍රයාගෙන්; කඃ අර්ථඃ, ප්‍රයොජනකවරේද; කාණෙනචක්‍ෂුෂා, දැල්වීයනොහෙන ඇසින්; කිම්වා, ප්‍රයොජනකිම; චක්‍ෂුඃ, ඇසට; පීඩාඑවකෙවලම්, පීඩාපමණෙකි.

## අඥනයාකෙරෙන් නිතර භය එළවනබව.

13 අජාතමෘතමූර්ඛාණාං වරමාද්‍යෞ න චාන්තිමඃ,
සකෘද්දුඃඛකරාවාද්‍යා වන්තිමස්තු පදෙ පදෙ.

අජාතමෘතමූර්ඛාණම්, නූපන්නෙක්ද මළඑකෙක්ද අඥනයෙක්ද යන මේ තුන්දෙනඅතුරෙන්; ආද්‍යෞ, ප්‍රථමකීදෙදෙන; වරම්, උතුම්වෙත්; අන්තිමඃ, පසුවකී අඥනයෙම; නච, උතුම්නොවේ. ආද්‍යෞ, මුලකීදෙදෙන; සකෘත්, එක්වරක්; දුඃඛකරෞ, දුක්ඇතිකෙරෙත්. අන්තිමස්තු, පසුවකී අඥනයාවනාහි; පදෙපදෙ, පියවරක් පියවරක්පාසා (දුක්ඇති කෙරේ).

## ශාස්ත්‍ර නූගත්තාවූ පුත්‍රයන්ට නිග්‍රහයෙක්.

14 වරං ගර්භස්‍රාවො වරමෘතුෂු නෛවාභිගමනං
වරං ජාතඃ ප්‍රේතො වරමපි ච කන්‍යෛව ජනිතා,
වරං වන්ධ්‍යා භාර්‍ය්‍යා වරමපි ච ගර්භෙෂු වසතිඃ
නචාවිද්වාන් රූපද්‍රවිණගුණයුක්තොපි තනයඃ.

ගර්භස්‍රාවඃ, (නියමකාලය නොපැමිණ යම් උපද්‍රවයකින්) දරුගර්භය වැටීමතෙම; වරම්, උතුම්වේ. ඍතුෂු, ඔසප්කාලයෙහි; අභිගමනම්, අසබ්මීය; නවරම්එව්, උතුම්නොවේමය. ජාතඃ, උපන්තැනැත්තෙක්; ප්‍රේතඃ, මැරුනේ; වරම්, උතුම්වේ. අපිච, නැවතද; ජනිතා, උපන්නියක්; කන්‍යාඑව, කන්‍යාවූවාම; වරම්, උතුම්. වන්ධ්‍යාභාර්‍ය්‍යා, වඳඅඹුතොමෝ; වරම්, උතුම්වන්නීය. අපිච, නැවතද; ගර්භෙෂු, ගර්භයන්හි; වසතිඃ, වාස

සර්වාභරණයතොමෝ; වරම්, උතුම්වන්නීය. රූපද්‍රවිණගණ, මහාශරීර ලක්ෂණාංගා ධනසමූහයෙන්ද; යුක්තඃ අපි, යුක්තවූද; තනයඃ, පුත්‍රතෙම; අවිද්වාන්, ශාස්ත්‍ර නොදනීද; නචා, උතුම්නොවේ.

ගොත්‍රය උසස්බවට පමුණුවන්නාවූ පුත්‍රයා උතුම්බව.

15 සජාතො යෙන ජාතෙන යාති වංශඃ සමුන්නතිම්,
පරිවර්තිනි සංසාරෙ මෘතඃ කො වා න ජායතෙ.

ජාතෙන, උපන්නාවූ; යෙන, යමකු කරණකොටගෙණ; වංශඃ, ගොත්‍රයතෙම; සමුන්නතිම්, උසස්බවට; යාති, පැමිණේද, සඃ, හෙතෙම; ජාතඃ උපන්නේවේ. සංසාරෙ, සංසාරයෙහි; පරිවර්තිනි, (නොයෙක් සත්වාවාසයන්හි හැසිරෙන්නේ,) පෙරලෙනකල්හි; මෘතඃ, මළාවූ; කඃවා, කවරෙක්නම්; නජායතෙ, නොඋපදීද.

උගතුන්ගේ ප්‍රධානකොටසට අයිති නුවූවන්ට නිග්‍රහයෙක්.

16 ගුණිගණගණනාරම්භෙ න පතති කඨිනී සසම්භ්‍රමාද් යස්‍ය,
තෙනාම්බා යදි සුතිනී වද වන්ධ්‍යා කීදෘශී භවති.

ගුණිගණගණනාරම්භෙ, ගුණඇත්තවුන් සමූහයක් පිළිබඳවූ ගණනාවගේ පටන්ගැන්මෙහි; සසම්භ්‍රමාත්, වෙග සහිතවීම හෙතුකොටගෙණ; යස්‍ය, යමකුගේ; කඨිනී, උල්කටුවතොමෝ; නපතති, නොවැටෙන්නේද. තෙන, ඕහුකරණකොටගෙණ; අම්බා, මව්තොමෝ; යදි සුතිනී, ඉදින්දරුවන් ඇත්තීනම්; වන්ධ්‍යා, වඳස්ත්‍රීතොමෝ; කීදෘශී, කෙබඳුදයත්තු; වද, කියව.

අනුන්ට ද්‍රව්‍යදීම ආදී කාරණ පසක් නැත්තාහට නිග්‍රහයෙක්.

17 දානෙ තපසි ශෞර්යෙ ච යස්‍ය න ප්‍රථිතං මනඃ,
විද්‍යායාමර්ථලාභෙ ච මාතුරුච්චාර එව සඃ.

දානෙ, (ධනධාන්‍යාදිය) දීමෙහිද; තපසි, (ඉන්ද්‍රිය නිග්‍රහාදි) තපසෙහිද; ශෞර්යෙච, මහත් (ශක්තිසම්පන්නාවූ) වික්‍රමයෙහිද; විද්‍යායාම්, ශාස්ත්‍රයෙහිද; අර්ථලාභෙච, ධනලාභයෙහිද; යස්‍යමනඃ, යමකුගේ චිත්තය තෙම; නප්‍රථිතම්, නොපතළේද, සඃ, හෙතෙම; මාතුඃ, උච්චාරඃ එව; මවගේ මලසමානමවේ.

අඥාන පුත්‍රයන් සියයකටවඩා නුවණැති එකම පුත්‍රයෙක්
උතුම්ය යනබව.

18 වරමෙකො ගුණී පුත්‍රො න ච මූර්ඛශතෛරපි,
එකශ්චන්ද්‍රස්තමො හන්ති න ච තාරාගණෛරපි,

ගුණී, ගුණඇත්තාවූ; එකඃ පුත්‍රඃ, එක්පුත්‍රයෙක්; වරම්, උතුම්වේ, මූර්ඛශතෛඃ අපි, අඥනපුතුන් සියගණනක්ද; නච, උතුම්නොවේ. (ඒ කෙසේද) එකඃ චන්ද්‍රඃ, එක්චන්ද්‍රයෙක්; තමඃහන්ති, අඳුරුනසා. තාරගණෛඃ අපි, තාරකාවන්ගේ රශ්මියක්විසිනුදු; නච (අන්ධකාරය) නොනසනුලැබේ.

### කීකරුපුත්‍රයන් ලැබීම පිණිස කාරණ.

19 පුණ්‍යතීර්ථෙ කෘතං යෙන තපඃ ස්වාප්‍යතිදුෂ්කරම්,
තස්‍ය පුත්‍රො භවෙද්වශ්‍යඃ සමෘද්ධො ධාර්මිකඃ සුධීඃ.

අතිදුෂ්කරම්, අතිශයින් දුකින් කටයුතුවූ; ස්වාපිතපඃ, කිසියම් (බ්‍රහ්මචය්‍යාදි) තපසක්තෙම; පුණ්‍යතීර්ථේ, '(සත්‍යං තීර්ථං ක්ෂමා තීර්ථං තීර්ථමින්ද්‍රිය නිග්‍රහඃ, සර්වභූත දයාතීර්ථං සර්වත්‍රාර්ජවමෙවච; දානං තීර්ථං දමස්තීර්ථං සන්තොෂ තීර්ථමුච්‍යතෙ, බ්‍රහ්මචය්‍යං පරං තීර්ථං තීර්ථංච ප්‍රියවාදිතා; ඥානං තීර්ථං ධෘතිස්තීර්ථං පුණ්‍යං තීර්ථමුදාහෘතම්,' සත්‍යවූ වචනයද, ඉවසීමද, චක්ෂුරාදි ඉන්ද්‍රිය නිග්‍රහයද, සියලු සත්වයන්කෙරේ අනුකම්පාවද, සියලු කාරණයෙහි ඇදනැතිබවද, ධන ධාන්‍යාදිය දීමද, ඉන්ද්‍රිය දමනයද, ලදදෙයකින් සතුටුවීමද; උතුම් ව්‍රතයක්වූ බ්‍රහ්මචය්‍යාවද, ඇසූවන් සතුටුඑළවන ප්‍රියවචනඇතිබවද; ප්‍රඥාවද, වීය්‍යයද—යන මොහු පුණ්‍යතීර්ථයයි කියනලදී. මේ) පුණ්‍යතීර්ථයෙහි; යෙනකෘතම්, යමකුවිසින් කරණලද්දේද; තස්‍ය, ඔහුගේ; පුත්‍රඃ, පුත්‍රතෙම; වශ්‍යඃ, (තමාට) අයිතිබවද; සමෘද්ධඃ, අධිකවූ ධනය ඇත්තෙක්ද; ධාර්මිකඃ, සුචරිතයෙහි හැසිරෙන්නෙක්ද; සුධීඃ, මනාවූ ධාරණ බුද්ධිය ඇත්තෙක්ද; භවෙත්, වන්නේයි.

### සත්වයන්කෙරෙහි ඇතිව තිබෙන්නාවූ සැප.

20 අර්ථාගමො නිත්‍යමරොගිතා ච ප්‍රියා ච භාය්‍යා ප්‍රියවාදිනී ච,
වශ්‍යශ්ච පුත්‍රොර්ථකරී ච විද්‍යා ෂඩ්ජීවලොකෙෂු සුඛානි රාජන්.

අර්ථාගමඃ, ධනයලැබීමද; නිත්‍යම්, නිරන්තරයෙන්; අරොගිතාච, රොග නැතිබවද; ප්‍රියාචභාය්‍යා, (තමහට) ප්‍රියසතුටුඑළවනභාය්‍යාද; ප්‍රියවාදිනීච, සන්තොෂ එළවන මධුරවචන ඇති භාය්‍යාද; වශ්‍යඃ පුත්‍රඃච, (තමා සතුටුලෙසක්කළහැකිසේ) යටත්බව ඇත්තාවූ පුත්‍රද; අර්ථකරීචවිද්‍යා, ධනය ඇතිකරන්නාවූ විද්‍යාද; (යන) ෂට්, (වස්තු) සය; රාජන්, මහරජාණෙනි; ජීවලොකෙෂු, සත්වයන්අතුරෙහි; සුඛානි, සැපයෝවෙත්.

## ප්‍රසිද්ධ නූවූ බොහෝ පුත්‍රයන්ටවඩා ප්‍රසිද්ධවූ එකමපුත්‍රයෙක් උතුම් යයනබව.

21 කො ධන්‍යො බහුභිඃ පුත්‍රෛඃ කුශූලාපූරණාඪකෛඃ,
වරමෙකඃ කුලාලම්බී යත්‍ර විශ්‍රූයතෙ පිතා.

කුශූලාපූරණාඪකෛඃ, බීජප්‍රයොජනකොට ඇති ධාන්‍ය විශෙෂයාගේ පිරීමෙහිනැළි සමානවූ; බහුභිඃ පුත්‍රෛඃ, බොහෝවූ පුත්‍රයන්ගෙන්; කඃධන්‍යඃ, කවරවාසනාවෙක්ද; යත්‍ර, යම්කාරණයක් කෙරෙහි; පිතා, පියතෙම; විශ්‍රූයතෙ, ප්‍රසිද්ධකරණු ලැබේද; කුලාලම්බී, කුලය (පවුල)රක්‍ෂාකරන්නාවූ; (එබඳු) එකඃ, එක් පුත්‍රයෙක්; වරම්, උතුම්වේ.

## සුචරිතක්‍රියාවෙන් තොරවූ මනුෂ්‍යයන් තිරිසනුන්හා සමානබව.

22 ආහාරනිද්‍රාභයමෛථුනංච සාමාන්‍යමෙතත් පශුභිර්නරාණාම්,
ධර්මො හි තෙෂාමධිකො විශෙෂො ධර්මෙණ හීනාඃ පශුභිඃ—
සමානාඃ.

නරාණාම්, මිනිසුන්ගේ; ආහාර, යම්ද්‍රව්‍යයක් ශරීරයතුලටගැණීමද; නිද්‍රා, නිදීමද; භය, බියද; මෛථුනංච, අසද්ධර්මයද; (රතික්‍රීඩාව) එතත්, මේ සතර; පශුභිඃ, තිරිසනුන්හා සමග; සාමාන්‍යම්, සමානබව වේ ධර්මඃහි, සුචරිත ධර්මය වනාහි; තෙෂාම්, ඒ මිනිසුන්ගේ; අධිකඃ විශෙෂඃ, වැඩිවූ වෙනසවේ. ධර්මෙණහීනාඃ, සුචරිතයෙන් තොරවූ මනුෂ්‍යයෝ; පශුභිඃ, තිරිසනුන්හා; සමානාඃ, සදෘශයෝවෙත්.

## එළුදෙනගේ බෙල්ලෙහිවූ තනමෙන් නිරර්ථක මනුෂ්‍යයෝ.

23 ධර්මාර්ථකාමමොක්‍ෂාණං යස්‍යෛකොපි න විද්‍යතෙ,
අජාගලස්තනස්‍යෙව තස්‍ය ජන්ම නිරර්ථකම්.

ධර්ම, (දානාදි) සුචරිතයද; අර්ථ, (මුක්තාමාණික්‍යාදි) ධනයද; කාම, (ප්‍රියවූ රූපාදි විෂයෙහි) ඇලීමද; මොක්‍ෂාණාම්, නිර්වාණයද යනමොවුන් අතුරෙන්; එකඃ අපි, එකෙකුදු; යස්‍යනවිද්‍යතෙ, යමකුට නැත්තේද අජාගලස්තනස්‍යෙව; එළුදෙනගේ බෙල්ලෙහිවූ තනයවැනිවූ, තස්‍ය ජන්ම; ඔහුගේ ඉපදීමතෙම, නිරර්ථකම්; ප්‍රයොජනනොවේ.

## මව්කුසතුල වසන්නාවූ සත්වයාහටම නියමවන්නාවූ කාරණා.

24 ආයුඃ කර්ම ච විත්තංච විද්‍යා නිධනමෙව ච,
පඤ්චෛතාන්‍යපි සෘජ්‍යන්තෙ ගර්භස්ථස්‍යෙව දෙහිනඃ.

ඇසුා, ජීවිතයඇතිව පවත්නා කාලයද; කර්මච, ක්‍රියාවද; විත්තච, ධනයද; විද්‍යා, ශාස්ත්‍රයද; නිධනමෙවච, මරණයද; (යන) එතානිපචඅපි, මොහුපසම; ගර්භස්ථස්‍යෛව, මව්කුස වසන්නාවූම; දෙහිනඃ, සත්ත්වයාහට, සෘජ්‍යන්තෙ, සරණුලැබෙත්.

එකාන්තයෙන්වන්නාවූ ස්වභාවයන් උත්තමයන්ට
පවාවනබව.

25 අවශ්‍යම්භාවිනො භාවා භවන්ති මහතාමපි,
නග්නත්වං නීලකණ්ඨස්‍ය මහා හි ශයනං හරෙඃ.

මහතාම්අපි, උත්තමයන්ගේද; අවශ්‍යම්භාවිනඃ, ඒකාන්තයෙන් වන්නාවූ; භාවාඃ, ක්‍රියාවෝ; භවන්ති, වෙත්. නීලකණ්ඨස්‍ය, (ශෛවයන් විසින් නීලකණ්ඨයයි දන්නාලද) ඉසුරුහුගේ; නග්නත්වම්, අපගතවස්ත්‍රඇතිබවද; හරෙඃ, (වෛෂ්ණවයන් විසින් හරියයි දන්නාලද) විෂ්ණුහුගේ; මහාහිශයනම්, මහත්වූ නිදීමෙක්දවේ. •

යමෙක් ලොකයෙහි නොවන්නේනම් ඒ නොවන්නේය,
යමෙක් ලොකයෙහි වන්නේනම් ඒ කාරණයද
අන්පරිද්දෙකින් වෙනස්නොවේ.

26 යදභාවි න තද්භාවි භාවි චෙන්න තදන්‍යථා,
ඉති චින්තාවිෂඝ්නොයමගදඃ කිංනපියතෙ.

යත්අභාවි, යමෙක් ස්වභාවයෙන්නොවන්නේද; තත්, ඒ; නභාවි, නොවේ. චෙත්භාවි, (යමෙක්) ඉදින් ස්වභාවයෙන්වේද; තත් අන්‍යථාන, ඒ අන්පරිද්දෙකින් නොවේ. ඉති චින්තාවිෂඝ්නඃ, මෙසේ සිතිම රූපවූ විෂනසන්නාවූ; අයම් අගදඃ, මේ ඖෂධයතෙම; කිංනපියතෙ, කවරහෙයකින් (ජනයාවිසින්) බොනු නොලැබේද.

පුරුෂයාගේ උත්සාහය නැතිව භාග්‍යය සිදුනොවනබව.

27 යථාහ්‍යෙකෙන චක්‍රෙණ න රථස්‍ය ගතිර්භවෙත්,
එවං පුරුෂකාරෙණ විනා දෛවං න සිධ්‍යති

• විෂ්ණු ඊශ්වර දෙදෙනා ශිවආගමෙහි ඇඳහිම්ට විසතුවූ මූර්ති තුනෙන් දෙවනාතුත්වනා මූර්තිහී, 'පඤ්චවිංශාපපරෙච්ඡයඃ', සී. ශෛවපණ්ඩිතයන් විසින් කියනාලද බැවින් ශිව විෂ්ණු දෙදෙනා ප්‍රාණයඇදිකොට ඇති සියලු ප්‍රපංචිය තත්වලින් තොරයයි කියයුතු. වායු—ජල—විශනිඅදි ද්‍රව්‍යයන්ගේ පවා පැවැත්ම ඉන්ද්‍රියබලයෙන් ජීවා ප්‍රාණය නැතැයි කියනාලද මේ ශිව විෂ්ණු දෙදෙනා ලොවඇත් තෝ හොාවිත්යයි ඒම ශූනායව හොවරයි.

රථස්‍යගතිඃහි, රථයාගේ ගමන විනාහි; එකෙනචක්‍රෙණ, එක් චක්‍රයෙකින්; (එක්රෝදයෙකින්) යථානභවෙත්, යම්සේ නොවන්නේද. එවම්, එසේම; පුරුෂකාරෙණවිනා, පුරුෂයාගේ උත්සාහය නැතිව; දෛවම්, පුණ්‍යය හෙවත් භාග්‍යයතෙම; නසිධ්‍යති, සිඩනොකෙරේ.

### අලස නොව උත්සාහ කටයුතු බව.

28 පූර්වජන්මකෘතං කර්ම තද්දෛවමිති කථ්‍යතෙ,
තස්මාත් පුරුෂකාරෙණ යත්නං කුර්‍ය්‍යාදතන්ද්‍රිතඃ.

පූර්වජන්මකෘතම්, පෙරජාතියෙහි කරණලද්දාවූ; කර්ම, යම් කර්මයෙක්ඇද්ද; (සුචරිත ක්‍රියාව කරණකොටගෙණ තමාට සැපදීමට යොග්‍යවූ බලය) තත්, ඒ; දෛවම්ඉති, පුණ්‍යයයි; කථ්‍යතෙ, (නුවණැත්තන් විසින්) කියනුලැබේ. තස්මාත්, එහෙයින්; පුරුෂකාරෙණ, පුරුෂයාගේ ක්‍රියාවෙන්; අතන්ද්‍රිතඃ, අලසනූවූ (කම්මැලිනූවූ) තැනැත්තේ; යත්නම් කුර්‍ය්‍යාත්; උත්සාහ කරන්නේය.

### උත්සාහකරන්නාවූ පුරුෂ සිංහයාකරා ඓශ්වර්‍ය්‍යය එළඹෙනබැවින් භාග්‍යය ඉවතලා උත්සාහකටයුතුබව ආදිය.

29 උද්‍යොගිනං පුරුෂසිංහමුපෛති ලක්ෂ්මී
දෛවෙන දෙයමිති කාපුරුෂාවදන්ති,
දෛවං නිහත්‍ය කුරු පෞරුෂමාත්මශක්ත්‍යා
යත්නෙ කෘතෙ යදි න සිධ්‍යති කොත්‍ර දොෂඃ;

උද්‍යොගිනම්, උත්සාහ ඇත්තාවූ; පුරුෂ සිංහම්, ශ්‍රෙෂ්ඨ පුරුෂයාකරා; ලක්ෂ්මීඃ, ශ්‍රීතොමෝ; (ඓශ්වර්‍ය්‍යය) උපෛති, එළඹේ. කාපුරුෂාඃ, අලස පුරුෂයෝතුමූ; දෛවෙනදෙයම්ඉති, භාග්‍යය හෙතුකොටගෙණ දියයුතුයයි; වදන්ති, කියත්. දෛවම්, පුණ්‍යය; නිහත්‍ය, ඉවත්කොට; නොහොත් පරාජයකොට, ආත්ම ශක්ත්‍යා; තමාගේ බලයෙන්, පෞරුෂම්; පුරුෂයා පිළිබඳවූ ක්‍රියාව, කුරු; කරව. යත්නෙකෘතෙ, උත්සාහකළ කල්හි; යදින සිධ්‍යති, ඉදින් සිඩනොවේද; අත්‍ර, මෙහි; කඃදොෂඃ, දොෂය කුමක්වේද.

### මනුෂ්‍යයා තමාවිසින් කරණලද ක්‍රියාවට පැමිණෙනබව.

30 යථා මෘත්පිණ්ඩතඃ කර්තා කුරුතෙ යද්‍යදිච්ඡති,
එවමාත්මකෘතං කර්ම මානවඃ ප්‍රතිපද්‍යතෙ.

කර්තා, (මැටිභාජන) ඉදිකරණ පුරුෂතෙම; මෘත්පිණ්ඩතඃ, එක්මැටිපිඩක් කෙරෙන් යත්යත් ඉච්ඡති, යම්යම (කලසැලිආදි භාජනවර්ග

ක්) කැමතිවේද; (ඒ කැමතිහජන) යථාකුරුතෙ, සවිශේෂ කෙරේද. එවම්, එසේම; ආත්මකෘතවිකර්මා, තමාවිසින් කළාවූ කර්මයට; මානවඃ, මනුෂ්‍යතෙම; ප්‍රතිපද්‍යතෙ, පැමිණේ.

### පුරුෂයාගේ උත්සාහනැතිව භාග්‍යයෙන් ක්‍රියා ඉෂ්ටනොවනබව.

81 කාකතාලීයවත් ප්‍රාප්තං දෘෂ්ටවාපි නිධිමග්‍රතඃ,
න ස්වයං දෛවමාදත්තෙ පුරුෂාර්ථම පෙක්ෂතෙ.

කාකතාලීයවත්, කවුඩකුයනකල තල්ඵලයක්වැටුනායයි අකාරණයෙන් සිතිමමෙන්; ප්‍රාප්තම්නිධිම්, පැමිණියාවූ නිධානයක්; අග්‍රතඃ, ඉදිරියෙහි; දෘෂ්ටවාපි, දැකද; දෛවම්, භාග්‍යදෙතම; ස්වයම්, තෙමේ; න ආදත්තෙ, නොගණී; පුරුෂාර්ථම්, පුරුෂයාගේ ක්‍රියාව; අපෙක්ෂතෙ, කැමතිවේ.

### උත්සාහ නොකොට කැමතිව ඕනෑකළපමණින් කටයුතු නොසැදෙනබව.

82 උද්‍යමෙන හි සිද්ධ්‍යන්ති කාර්‍ය්‍යාණි න මනොරථෛඃ,
න හි සුප්තස්‍ය සිංහස්‍ය ප්‍රවිශන්ති මුඛෙ මෘගාඃ.

කාර්‍ය්‍යාණි, කාරණයෝ; උද්‍යමෙනහි, උත්සාහයෙන්වනාහි; සිද්ධ්‍යන්ති, සිදුවෙත්. මනොරථෛඃ, ආශාවන්කරණකොටගෙණ; න, සිදු නොවේ. සුප්තස්‍ය සිංහස්‍ය, නිදීමට පැමිණි සිංහයකුගේ; මුඛෙ, මුඛයෙහි; මෘගාඃ, මුවෝ; නහිප්‍රවිශන්ති, නොවදිත්.

### ශාස්ත්‍ර නූගත්තන් නොහොබනාබව.

83 මාතා ශත්‍රුඃ පිතා වෛරී යෙන බාලො න පාඨිතඃ,
න ශොභතෙ සභාමධ්‍යෙ හංසමධ්‍යෙ බකො යථා.

පිතා, පියතෙම; වෛරී, ක්‍රොධඇත්තෙක්වේ. මාතා, මව්තොමෝ; ශත්‍රුඃ, සැතුරියක්වන්නීය. යෙන, යම්පියකුවිසින්; බාලඃ, ළදරුතෙම; නපාඨිතඃ, ශාස්ත්‍ර පුහුණු නොකරවනලදද; (හෙතෙම) හංසමධ්‍යෙ, හංස සමූහයාගේ මධ්‍යයෙහි; බකඃයථා, කොකෙකුමෙන්; සභාමධ්‍යෙ, සභාමධ්‍යයෙහි; නශොභතෙ, නොහොබී.

34 රූපයෞවනසම්පන්නා විශාලකුලසම්භවාඃ,
විද්‍යාහීනා න ශොභන්තෙ නිර්ගන්ධා ඉව කිංශුකාඃ,

රූපයෞවන සම්පන්නාඃ, දැකීමට ප්‍රියවූ රූපසටහණින්හා තරුණ භාවයෙන්ද යුක්තවූ; විශාලකුල සම්භවාඃ, මහත්වූ ගොත්‍රයෙහි උපන්

නාහුද; විද්‍යාහීනාඃ, ශාස්ත්‍ර ඉගැණීමෙන් තොරවූවාහු; නිර්ගන්ධාඃ, සුවඳ නැත්තාවූ; කිංශුකාඃ ඉව, කැලමල්මෙන්; නශොභන්තෙ, නොහොබිත්,

පොත් කියවීමෙන්හා ගුරුන්ගේ සමීපයෙහිද නූගත්තන් නොහොබනාබව.

35 පුස්තකෙෂු ච නාධීතං නාධීතං ගුරුසන්නිධෞ,
න ශොභතෙ සභාමධ්‍යෙ ජාරගර්භා ඉව ස්ත්‍රියඃ.

පුස්තකෙෂුච, ප්‍රකරණයන්කෙරෙහි; නාධීතම්, පුහුණු නොකරණලද්දේද; ගුරුසන්නිධෞ, ආචාරීන්ගේ සමීපයෙහි; නාධීතම්, පුහුණු නොකරණලද්දේද; ජාරගර්භාඃ, පරපුරුෂයන් කරණකොටගෙණ ලදදරුගැප් ඇත්තාවූ; ස්ත්‍රියඃ ඉව, ස්ත්‍රීහුමෙන්; සභාමධ්‍යෙ, සභාමධ්‍යයෙහි; නශොභතෙ, නොහොබි.

පණ්ඩිතයන්ගේ ආශ්‍රයෙන් අඥානයාද දක්ෂයකුවනබව.

36 කාචඃ කාඤ්චනසංසර්ගාද්ධත්තෙ මාරකතීද්‍යුතීඃ,
තථා සත්සන්නිධානෙන මූර්ඛො යාති ප්‍රවීණතාම්.

කාචඃ, වීදුරුවතෙම; කාඤ්චනසංසර්ගාත්, රන්හා ඇලීම හෙතුකොටගෙණ; මාරකතීඃ, මරගමිණීයපිළිබඳවූ; (දියමනති) ද්‍යුතීඃ, ශොභාවන්; ධත්තෙ, දරා; තථා, එසේම; සත්සන්නිධානෙන, පණ්ඩිතයන්ගේ ආශ්‍රයෙන්, මූර්ඛඃ, අඥානතෙම; ප්‍රවීණතාම්, දක්ෂබවට; යාති; පැමිණේ.

තමාටවඩා අඩුවූ නුවණගුණ ඇත්තවුන් ආශ්‍රය කිරීමෙන් තමන්ගේ නුවණගුණ අඩුවීම් ආදිය.

37 හීයතෙ හි මතිස්තාත හීනෛඃ සහ සමාගමාත්,
සමෛශ්ච සමතාමෙති විශිෂ්ටෛශ්ච විශිෂ්ටතාම්,

තාත, පුත; හීනෛඃ සහ සමාගමාත්, (තමාටවඩා) අඥානයන්හා සමග එක්වීම හෙතුකොටගෙණ; මතිඃ, ප්‍රඥාව; හීයතෙහි; පිරිහේමය. සමෛඃච, (තමාහා) සමාන නුවණැත්තන්හා සමග එක්වීම හෙතුකොටගෙණ; සමතාම්එති, නුවණ සමානබවට පැමිණේ. විශිෂ්ටෛඃච, (තමාටවඩා) අධික ප්‍රඥාදියෙන් යුක්තයන්හා එක්වීමෙන්; විශිෂ්ටතාම්, (නුවණ) උතුම්බවට පැමිණේ.

නූසුදුසු ද්‍රව්‍යයෙහි පිහිටුවනලද්දාවූ කිසියම් ක්‍රියාවක් ඵලනොදෙනබව,

38 නාද්‍රව්‍යෙ නිහිතා කාචිත් ක්‍රියා ඵලවතී භවෙත්,
න ව්‍යාපාරශතෙනාපි ශුකවත් පාඨ්‍යතෙ වකඃ.

අද්‍රව්‍යෙ, ද්‍රව්‍යයක්නැතිකල්හි; නිහිතා, පිහිටුවනලද්දාවූ; කාචිත්ක්‍රියා, කිසි ක්‍රියාවක්තොමෝ; ඵලවතීනභාවෙත්, ඵලඇත්තී නොවන්නීය. ව්‍යාපාරශතෙනාපි, ක්‍රියාසියයෙකින්දු; ශුකඃ, කොක්තෙම; ශුකඃවත්, ගිරවෙක්මෙන්; නපාඨ්‍යතෙ, කථානොකෙරේ.

මනාගොත්‍රයෙහි ගුණනැති පුත්‍රයන් නූපදනාබව.

39 අස්මිං සතු නිර්ගුණං ගොත්‍රෙ නාපත්‍යමුපජායතෙ,
ආකරෙ පද්මරාගානාං ජන්ම කාචමණෙඃ කුතඃ.

අස්මින්තුගොත්‍රෙ, මේ වංශයෙහි වනාහි; නිර්ගුණම් අපත්‍යම්, ගුණනැති පුත්‍රතෙම; නඋපජායතෙ, නොඋපදී; පද්මරාගානාම් ආකරෙ, පද්මරාග මාණික්‍යයන්ගේ උත්පත්ති ස්ථානයෙහි; කාචමණෙඃ, කාචමාණික්‍යයකගේ; ජන්ම, ඉපදීමතෙම, කුතඃ, කවරහෙයකින්වේද.

සැහැල්ලුවූවෙක් නුඹුත් උත්තමයන්ගේ ආශ්‍රයෙන් ගෞරව
කටයුතුබවට පැමිණෙනබව.

40 කීටොපි සුමනඃ සඞ්ගා දාරොහති සතාං ශිරඃ,
අශ්මාපි යාති දෙවත්වං මහද්භිඃ සුප්‍රතිෂ්ඨිතඃ.

සුමනඃ, සමන්මලකට; (පිච්චමලකගේ) සඞ්ගාත්, ඇලීම හෙතුකොට ගෙණ; කීටඃ අපි, පණුවෙක්පවා; සතාම්ශිරඃ, උත්තමයන්ගේ ඉසට; ආරොහති, නැගේ. මහද්භිඃ උත්තමයන්විසින්; සුප්‍රතිෂ්ඨිතඃ, මනාකොට පිහිටුවනලද්දාවූ; අශ්මා අපි, ගලෙක්පවා; දෙවත්වම්යාති, දෙව්බවට පැමිණේ.

41 යථොදයගිරෙද්‍රව්‍යං සන්නිකර්ෂෙණ දීප්‍යතෙ,
තථා සත්සන්නිධානෙන හීනවර්ණොපි දීප්‍යතෙ.

උදයගිරෙඃ, උදය පර්වතයාගේ; (අලුයම්වේලේ ඉරුඋදාවන දිශාවගේ) සන්නිකර්ෂෙණ, ආසන්නවීමෙන්; ද්‍රව්‍යම්, (නොයෙක්) වස්තුතෙම; යථාදීප්‍යතෙ, යම්සේ බබලාද. තථා, එසේම, සත්සන්නිධානෙන; පණ්ඩිතයන්හා ගැලපී විසීම හෙතුකොටගෙණ; හීනවර්ණඃ අපි, ලාමකවූ ස්වභාඇති තැනැත්තේද; දීප්‍යතෙ, බබලා.

නුවණැත්තවුන්ගේහා අඥානයන්ගේකාලය ගතවන අන්දම.

42 කාව්‍යශාස්ත්‍රවිනොදෙන කාලො ගච්ඡති ධීමතාම්,
ව්‍යසනෙන ච මූර්ඛාණං නිද්‍රයා කලහෙන වා.

ධීමතාම්, නුවණැත්තවුන්ගේ; කාලඃ, කාලයතෙම; කාව්‍යශාස්ත්‍ර විනොදෙන, කාව්‍යශාස්ත්‍රය පිළිබඳවූ සතුටින්; ගච්ඡති, යේ. මූර්ඛාණම්,

අඥනයන්ගේ; (කාලයතෙම) ව්‍යසනෙනව, (ස්ත්‍රී—ද්‍යූත—හෙවත් සූදු කිඩා පානා— කරුණු නැතිව ඇවිදීම යනමෙ) විපත්තියෙන්ද; නිද්‍රයා, නිදීමෙන්ද; කලහෙනවා, ඩබරකිරීමෙන්හෝ; (ඉක්මේ)

43 අසාධනා විත්තහිනා බුද්ධිමන්තඃ සුහෘත්තමාඃ,
සාධයන්ත්‍යාශු කාර්‍ය්‍යාණි කාකකූර්මමෘගා ඛුවත්.

අසාධනාඃ, උපායක් නැත්තාවූ; විත්තහිනාඃ, ධනයක් නැත්තාවූ; බුද්ධිමන්තඃ, නුවණ ඇත්තාවූ; කාකකූර්මමෘගාඛුවත්, කව්ඩු—ඉදිබු—මුව—මූෂිකාය යන මොහුමෙන්; සුහෘත්තමාඃ, උතුම් මිත්‍රධර්මයෙහි පිහිටියාහු; කාර්‍ය්‍යාණි, කටයුතුවූ කාරණයන්; ආශු සාධයන්ති, වහා සිඩකෙරෙත්.

දවස්පතා අඥනයා ශොකාදියට පත්වනබව.

44 ශොකස්ථානසහස්‍රාණි භයස්ථානශතානි ච,
දිවසෙ දිවසෙ මූඪ මාවිශන්ති න පණ්ඩිතම්.

ශොකස්ථාන සහස්‍රාණි, චිත්තවිකලයට හෙතුවූ කාරණයන්ගේ දහස්ගුද; භයස්ථානශතානිච, භයටහෙතු කාරණයන්ගේ සියගණන් තොමෝද; දිවසෙ දිවසෙ, දවසක් දවසක්පාසා; මූඪම්, අඥනයාට; ආවිශන්ති, ප්‍රවෙශවෙත්; පණ්ඩිතම්, පණ්ඩිතයාට; න, ප්‍රවෙශනොවෙත්,

මරණරොගාදින් අතුරෙන් අද කුමක් වැටෙන්නේදැයි නැගිට නැගිට අවබොධ කටයුතුය යනබව.

45 උත්ථායොත්ථාය බොධව්‍යං මහද්භයමුපස්ථිතම්,
මරණව්‍යාධිශොකානාං කිමද්‍ය නිපතිෂ්‍යති.

මරණව්‍යාධි ශොකානාම්,මරණ-රොග—ශොක—යනමොවුන් අතුරෙන්; අද්‍ය, අද; කිම්නිපතිෂ්‍යති, කුමක්වැටෙන්නේදැයි; උත්ථාය උත්ථාය, නැගිට නැගිට; උපස්ථිතම් මහත්භයම්, එළඹසිටියාවූ මහාභයතෙම; බොධව්‍යම්, අවබොධ කටයුතු,

දුර්ජ්ජනයාකෙරෙන් ප්‍රියවූ ලාභයක්ඇතිකල්හිද එයින් ශුභවූ පැවතිමක් නොවනබව,

46 අනිෂ්ටාදිෂ්ටලාභෙපි න ගතිර්ජ්ජායතෙ ශුභා,
යත්‍රාස්තෙ විෂසංසර්ගො මෘතං තදපි මෘත්‍යවෙ.

අනිෂ්ටාත්, ප්‍රියනැත්තාකෙරෙන්; ඉෂ්ටලාභෙඅපි, ප්‍රියවූ ලැබීමක් ඇතිකල්හිද; ශුභාගතිඃ, මනාවූ පැවැත්මක්තොමෝ; නජායතෙ, නොඋපදී; අමෘතම්, අමෘතයක්; විෂසංසර්ගඃ, විෂයක්හා සමග මිශ්‍රවූයේ; ය

ත්‍රාසෙන, යම්තැනෙක්හිවූයේද; තත්අපි, ඒ අමෘතයපවා; මෘත්‍යවෙ, මරණයපිණිස; (වින්නේය)

සැකයකට නොපැමිණ යහපතක් දකින්ට නුදුලුවන්බව.

47 න සංශයමනාරුහ්‍ය නරො භද්‍රාණි පශ්‍යති,
සංශයං පුනරාරුහ්‍ය යදි ජීවති පශ්‍යති.

නරඃ, මිනිස්තෙම; සංශයම් අනාරුහ්‍ය, සැකයට නොනැගී; භද්‍රාණි, වැඩදායක උතුම් කාරණයන්; නපශ්‍යති, නොදකී. සංශයම්, සැකයට ආරුහ්‍ය, නැගී; පුනඃ, පසුව; යදිජීවති, ඉදින් ජීවත් විද; පශ්‍යති, (මනාකාරණයක්) දකී.

සු ච රි ත ධ ර්‍ම අ ට න ම්.

48 ඉජ්‍යාධ්‍යයනදානානි තපඃ සත්‍යං ධෘතිඃ ක්‍ෂමා,
අලොභ ඉති මාර්ගො යං ධර්‍මස්‍යාෂ්ටවිධඃ ස්මෘතඃ

ඉජ්‍යාධ්‍යයනදානානි, යාගයද-ඉගෙණගැන්මද-දීමද- (යනමේතුන ද); තපඃ, තපසද; සත්‍යම්, සැබෑබසද; ධෘතිඃ, සන්තොෂයද; ක්‍ෂමා ඉවසීමද; අලොභඃඉති, ලොභනොවීමය යන; අයම්මාර්ගඃච, මේමගතෙමේද; අෂ්ටවිධඃධර්‍මඃ, අටවැදෑරුම්වූ ධර්‍මයයි; ස්මෘතඃ, දන්නාලදී.

වඩාවසඳහා ආශ්‍රයකරණු ලබණ ධර්‍මහා උත්තමයන් විසින්
ආ ශ්‍ර ය ක ර ණු ල බ ණ ධ ර්‍ම.

49 තත්‍ර පූර්‍වශ්චතුර්‍වර්ගො දම්භාර්ථමපි සෙව්‍යතෙ,
උත්තරස්තු චතුර්‍වර්ගො මහාත්මන්‍යෙව තිෂ්ඨති.

තත්‍ර, ඒඅටදෙනාඅතුරෙහි; පූර්‍වඃචතුර්‍වර්ගඃ, මුල්වූ සතරකොටසතෙම; දම්භාර්ථම්අපි, කපටිභාවය සඳහාද; සෙව්‍යතෙ, සෙවනයකරණුලැබේ; උත්තරඃ චතුර්‍වර්ගඃතු, පසුවැනි සතරකොටසවනාහි; මහාත්මනිඑව, උත්තමයාකෙරෙහිම; තිෂ්ඨති, පවතී.

අනුන්ගේ පැවැත්ම පමණක් දැක කාරණ අකාරණ නොදැන
ඊට අනුව ක්‍රියාකරන්නාවුන්ගේ ස්වභාවය.

50 ගතානුගතිකො ලොකඃ කුට්ටනීමුපදෙශිනීම්,
ප්‍රමාණයති නො ධර්‍මෙ යථාගොඝ්නමපිද්විජම්.

ගතානුගතිකඃ, අනුන්ගේ ක්‍රියාවට සමානව පවත්නාවූ; ලොකඃ, ජනතෙම; උපදෙශිනීම්, අනුශාසනා කරන්නාවූ; කුට්ටනීම්, සොරසැමියන්හා ඝටන යොදන්නියක්; යථාප්‍රමාණයති, යම්සේ ප්‍රමාණකෙරේ

දඃ (එපරිද්දෙන්) ධර්මේ, සුචරිතයෙහි; විජම්, බ්‍රාහ්මණයා; හොත්නම් අපි, ගවයන් මරන්නෙක් කොටත්; න, ප්‍රමාණ නොකෙරේ.

සත්පුරුෂයන් තමාටමෙන් අනුන්ටත් කරුණාකරණබව.

51 ප්‍රාණා යථාත්මනො ඉෂ්ටා භූතානාමපි තෙ තථා,
ආත්මෞපම්‍යෙන භූතානාං දයාං කුර්වන්ති සාධවඃ.

ආත්මනඃ, තමාගේ; ප්‍රාණාඃ, ප්‍රාණයෝ; යථා අභීෂ්ටාඃ, යම්සේවිශෙෂ යෙන් ප්‍රියයෝද; තෙ, ඒප්‍රාණයෝ; භූතානාම්අපි, සත්වයන්ගේද; තථා, එසේම (ප්‍රිය) වෙත්. සාධවඃ, සත්පුරුෂයෝ; ආත්මෞපම්‍යෙන, තමාහාසමානකිරීමෙන්; භූතානාම්, සත්වයන්ට; දයාම්කුර්වන්ති, අනුකම්පාකෙරෙත්.

යාචකයන් ඉවත්කිරීම- දීම- සැපදුක්දෙකයන මෙහි අනුන් ත
මා ට ස මා න ක ට යු තු බ ව.

52 ප්‍රත්‍යාඛ්‍යානෙ ච දානෙ ච සුඛදුඃඛෙ ප්‍රියා ප්‍රියෙ,
ආත්මෞපම්‍යෙන පුරුෂඃ ප්‍රමාණමධිගච්ඡති.

ප්‍රත්‍යාඛ්‍යානෙච, (යාචකයන්) ඉවත්කිරීමෙහිද; දානෙච, දීමෙහිද; සුඛදුඃඛෙ, සැපතෙහිහා දුකෙහිද; ප්‍රියා ප්‍රියෙ, සතුටුවීමෙහි හා නොස තුටුවීමෙහිද; ආත්මෞපම්‍යෙන, තමාහාසමානකිරීමෙන්; පුරුෂඃ, පුරු ෂතෙම; ප්‍රමාණම් අධිගච්ඡති, ප්‍රමාණකිරීමට පැමිණේ.

අනුන් අඹුවන්කෙරෙහි හා එසේම අනුන්ගේ ධනයකෙරෙහිද
සත්වයන් කෙරෙහිද පවත්නා ක්‍රමය.

53 මාතෘවත් පරදාරෙෂු පරද්‍රව්‍යෙෂු ලොෂ්ඨවත්,
ආත්මවත් සර්වභූතෙෂු යඃ පශ්‍යති ස පණ්ඩිතඃ.

පරදාරෙෂු, අනුන්ගේ අඹුවන්කෙරෙහි; මාතෘවත්, මවක්මෙන්ද; ප රද්‍රව්‍යෙෂු, අනුන්ගේ වස්තුවකෙරෙහි; ලොෂ්ඨවත්, මැටිපිඩක්මෙන්ද; සර්වභූතෙෂු, සියලුසත්වයන්කෙරෙහි; ආත්මවත්, තමාමෙන්ද; යඃ පශ්‍ය ති, යමෙක්තෙම දකීද; සඃ, හෙතෙම; පණ්ඩිතඃ, පඬිතවේ.

දිළිඳුන්ට දීයයුතුබවහා ධනඇත්තවුන්ටදීම ප්‍රයොජන නොවනබව.

54 දරිද්‍රාන් භර කෞන්තෙය මා ප්‍රයච්ඡෙශ්වරෙ ධනම්,
ව්‍යාධිතස්‍යෞෂධං පථ්‍යං නිරුජස්‍ය කිමෞෂධෛඃ.

කෞන්තෙය, කුන්තිනම් බිසවගේ පුත්‍රවූ මහරජ; දරිද්‍රාන්භර, දිළිඳු න් පොෂ්‍යයකළමැනව. ඊශ්වරෙ, සම්පත්ඇත්තාකෙරෙහි; ධනම්, ධ

නය; මාප්‍රයච්ඡ, නොදෙව. ඖෂධම්, බෙහෙත; ව්‍යාධිතස්‍ය, රෝගඇත්තාහට; පථ්‍යම්, හිතවේ. නිරුජස්‍ය, රොගනැත්තාහට; ඖෂධෛඃ, ඖෂධයන්කරණකොටගෙණ; කිම්, ප්‍රයොජන නොවේ.

### තමාට උපකාර නැත්තාට දීම ශොභනබව.

55 දාතව්‍යමිති යද්දානං දීයතෙනුපකාරිණෙ,
දෙශෙ කාලෙ ච පාත්‍රෙ ච තද්දානං සාත්විකං විදුඃ.

අනුපකාරිණෙ, උපකාරනොකරණ තැනැත්තාට; දාතව්‍යම්, දියයුතුවූ; යද්දානම්දීයතෙ, යම් දානයෙක් දෙනුලැබේද. තද්දානම්, ඒ දානයතෙම; දෙශෙ, (කාශිආදී) දෙශයෙහිද; කාලෙච, (ග්‍රහණාදී) කාලයෙහිද; පාත්‍රෙච, (මන්ත්‍රකරන්නාවූ ගින්නතැබීම මුල්කොට ඇති ගින්නදයන) ස්ථානයෙහිද; සාත්විකම්විදුඃ, ශොභනයයි දනිත්.

### ධර්මශාස්ත්‍රාදිය පුරදුකලේවීනමුත් දුර්ජ්ජනයාගේ ස්වභාවය වෙනස් නොවනබව.

56 න ධර්මශාස්ත්‍රං පඨතීති කාරණං
න චාපි වෙදාධ්‍යයනං දුරාත්මනඃ;
ස්වභාව එවාත්‍ර තථාතිරිච්‍යතෙ
යථා ප්‍රකෘත්‍යා මධුරං ගවාං පයඃ,

දුරාත්මනඃ, අසත්පුරුෂයාගේ; ධර්මශාස්ත්‍රම් පඨතිති, ධර්මශාස්ත්‍රය කියයි යනුද; නකාරණම්, ලකුණුනොවේ. වෙදාධ්‍යයනම් අපි, වෙදපුහුණුකිරීමද; නච, (කාරණ) නොවේ. ගවාම්පයඃ, ගවදෙනුන්ගේ ක්ෂීරය තෙම; ප්‍රකෘත්‍යා, ස්වභාවයෙන්; යථාමධුරම්, යම්සේ මිහිරිවේද. තථා එසේම; අත්‍ර, මෙහි; ස්වභාවඃඑව, තමාගේවීමම; අතිරිච්‍යතෙ, ඉතිරිවේ;

### තමාටඅසිති නුවූ ඉන්ද්‍රියහා සිත්නැත්තාගේ හා උපායනැත්තාවූ ප්‍රඥාවගේද ස්වභාවය.

57 අවශෙන්ද්‍රිය චිත්තානාං හස්තිස්නානමිවක්‍රියා,
දුර්භගාභරණප්‍රායො ඥානං භාරඃ ක්‍රියාං විනා.

අවශෙන්ද්‍රියචිත්තානාම්, තමාටඅසිතිනුවූ ඉන්ද්‍රියහා සිත්ඇත්තවුන්ගේ; ක්‍රියා, ක්‍රියාතොමෝ; හස්තිස්නානම් ඉව, (සොඬඅගින්දියඅරගෙණ) ඇතෙකුගේ ස්නානයක්වැනිවේ. දුර්භගාභරණඃ, ස්වාමිපුරුෂයා කෙරෙහි සෙනහරහිතස්ත්‍රියගේ-නොහොත් අවාශනාවන්ත ස්ත්‍රියගේ ආභරණමෙන්; ක්‍රියාම්විනා, උපායනැත්තාවූ, ඥානම්, ප්‍රඥාව; ප්‍රායඃභාරඃ, බොහෝසෙයින් බරවේ.

විශ්වාස නොකටයුත්තෝ.

58 ශෘඞ්ගිණාච නදීනාච නඛිනාං ශස්ත්‍රපාණිනාම්,
විශ්වාසො නෛව කර්තව්‍යඃ ස්ත්‍රීෂු රාජකුලෙෂු ච.

ශෘඞ්ගිණාච, අංඇත්තාවූ (මුවගවආදි) සිව්පාවුන්ගේද; නදීනාංච: ගංගාවන්ගේද; නඛිනාම්, නියඇත්තවුන්ගේද; ශස්ත්‍රපාණිනාම්, ආයුධගත් අත්ඇත්තවුන්ගේද; ස්ත්‍රීෂු, ස්ත්‍රීන්කෙරෙහිද; රාජකුලෙෂුච, රජකුලයන්කෙරෙහිද; විශ්වාසඃ, විශ්වාසයතෙම; නකර්තව්‍යඃඑව, නොකටයුතුමවේ.

ස්වභාවයම මුත් ගුණය පරීක්ෂාකළ නොහැකිබවත් ගුණයටවඩා ස්වභාවයමත්තෙහි පවත්නාබවත් දැක්වීමයි.

59 සර්වස්‍ය හි පරීක්ෂ්‍යන්තෙ ස්වභාවා නෙතරෙ ගුණාඃ,
අතීත්‍ය හි ගුණාන් සර්වාන් ස්වභාවො මූර්ධ්නි වර්තතෙ.

සර්වස්‍යහි, සියල්ලගේම; ස්වභාවාඃ, ස්වභාවයෝ; පරීක්ෂ්‍යන්තෙ, සෙයනුලැබෙත්. ඉතරෙගුණාඃ, අනික්ගුණයෝ; න, පරීක්ෂාකරණුනොලැබෙත්. හි, ඒඑසේමැයි; සර්වාන්ගුණාන්අතීත්‍ය, සියලුගුණයන් ඉක්ම; ස්වභාවඃ, ස්වභාවයතෙම; මූර්ධ්නි, මස්තකයෙහි; වර්තතෙ, පවතී.

නියමය වැලකිය නොහැකිබව.

60 ස හි ගගනවිහාරී කල්මෂධ්වංසකාරී
දශශතකරධාරී ජ්‍යොතිෂාං මධ්‍යචාරී
විධුරපි විධියොගාත් ග්‍රස්‍යතෙ රාහුණාසෞ
ලිඛිතමපි ලලාටෙ ප්‍රොජ්ඣිතුං කඃ සමර්ථඃ.

ගගනවිහාරී, ආකාශයෙහි හැසිරෙන සුලුවූ; කල්මෂධ්වංසකාරී, පවිනසන සුලුවූ; දශශතකරධාරී, දහසක් රැස්ඇත්තාවූ; ජ්‍යොතිෂාම්මධ්‍යචාරී, තාරකාවන්ගේ මධ්‍යයෙහි හැසිරෙන සුලුවූ; සඃඅසෞවිධුඃඅපි, ඒ මේසඳමඬලපවා; විධියොගාත්, ක්‍රමයෙදීම හෙතුකොටගෙණ; රාහුණා, රාහුවිසින්; ග්‍රස්‍යතෙ, ගිලිනුලැබේ; හි, ඒ එසේමැයි; ලලාටෙ, නලලෙහි; ලිඛිතම් අපි, ලියනල්දද්ද; ප්‍රොජ්ඣිතුං, වලක්වන්ට; කඃසමර්ථඃ, කවුරෙක් පොහසද්ද.

විපත්තියක් එළවීමට හෙතුනොවන ද්‍රව්‍යාදිය.

61 සුජීර්ණමන්නං සුවිචක්ෂණඃ සුතඃ
සුශාසිතා ස්ත්‍රී නෘපතිඃ සුසෙවිතඃ.
සුචින්ත්‍ය චොක්තං සුවිචාර්‍ය යත් කෘතං
සුදීර්ඝකාලෙපි න යාති වික්‍රියාම්,

සුජීර්ණම් අන්නම්, මනාකොට දිරීමට ගියාවූ ආහාරයද; සුවිචක්ෂණඃ සුතඃ, මනා නුවණැති පුත්‍රද; සුශාසිතා ස්ත්‍රී, මනාකොට අනුශාසනාකරණලද ස්ත්‍රීද; සුසෙවිතඃ නෘපතිඃ, මනාකොට ආශ්‍රයකරණලද රජද, සුචින්ත්‍ය උක්තම්, මනාවපරීක්ෂාකොට කියනලද වචනයද; සුවිචාර්‍ය්‍ය යත් කෘතං, යමක් මනාව පරීක්ෂාකොට කරණලදද ඒතෙම; සුදීර්ඝකාලෙපි, ඉතා බොහෝකාලයෙහිද; වික්‍රියාම්, වෙනසකට; නයාති, නොපැමිණේ.

බා ල යා ගේ ක ථා ව.

62 වෘද්ධස්‍ය වචනං ග්‍රාහ්‍යමාපත්කාලෙ හ්‍යුපස්ථිතෙ
සර්වත්‍රෛවං විචාරෙණ භොජනෙපි ප්‍රවර්ත්‍යතෙ.

ආපත්කාලෙ, විපත්තිකාලයක්; උපස්ථිතෙහි, එළඹසිටිකල්හි වනාහි; වෘද්ධස්‍ය වචනම්, නුවණැත්තහුගේ කීමතෙම; ග්‍රාහ්‍යම්, ගතයුත්තේ; එවම්, එසේවිනමුදු; සර්වත්‍ර, සියලුදෙයෙහි, විචාරෙණ, පරීක්ෂාකිරීම කරණකොටගෙණ; භොජනෙ අපි, ආහාරයෙහිද; ප්‍රවර්ත්‍යතෙ, පැවැත්මවේ.

නු සු දු සු කි ම.

63 ශඞ්කාභිඃ සර්වමාක්‍රාන්තමන්නං පානඤ්ච භූතලෙ
ප්‍රවෘත්තිඃ කුත්‍ර කර්තව්‍යා ජීවිතව්‍යං කථන්නු වා.

ශඞ්කාභිඃ, සැකවලින්; භූතලෙ, පොළෝතෙලෙහි; අන්නම් පානඤ්ච, ආහාරපානදෙකද; (යන) සර්වම්, සියල්ල; ආක්‍රාන්තම්, (ඉදින්) මඩනාලද්දේද; කුත්‍ර, කවරදෙයෙක්හි; ප්‍රවෘත්තිඃ කර්තව්‍යා, දිවිපැවැත්ම තොමෝ කටයුත්තීද; කථන්නුවා, කෙසේනම්; ජීවිතව්‍යම්, ජීවත්විය යුතුද.

දු ක ට පැ මි ණෙ න තැ නැ ත් තෝ.

64 ඊර්ෂ්‍යී ඝෘණී ත්වසන්තුෂ්ටඃ ක්‍රොධනො නිත්‍යශඞ්කිතඃ
පරභාග්‍යොපජීවී ච ෂඩෙතෙ දුඃඛභාගිනඃ.

ඊර්ෂ්‍යී, අනුන්ගේ දියුණුව නොකැමැතිවීමයයි කියනලද ඊර්ෂ්‍යාවඇති තැනැත්තේද; ඝෘණී, ලොභ සුලු තැනැත්තේද; අසන්තුෂ්ටඃ, ලදදෙයෙකින් සතුටුනොවන තැනැත්තේද; ක්‍රොධනඃ, කිපෙන සුලු තැනැත්තේද; නිත්‍යශඞ්කිතඃ, නිතර සැකකරණ ලද්දේද; පරභාග්‍යොපජීවීච, අනුන්ගේ වාසනාව ශරණකොටගෙණ ජීවිකාව කරණ සුලු තැනැත්තේද; (යන) එතෙෂ්ට්, මොහු සදෙන; දුඃඛභාගිනඃ, දුක්කොටස් ඇත්තාහුවෙත්.

### නුවණැත්තන්පවා මුළාවනබව.

65 සුමහාන්ත්‍යපි ශාස්ත්‍රාණි ධාරයන්තො බහුශ්‍රුතාඃ
ඡෙත්තාරඃ සංශයානාංච ක්ලිශ්‍යන්තෙ ලොභමොහිතාඃ.

සුමහාන්ති, ඉතා මහත්වූ; ශාස්ත්‍රාණිධාරයන්තඃ, ශාස්ත්‍ර දන්නාවූ; සංශයානාංච, සැකයන්ගේද; ඡෙත්තාරඃ, සිඳින සුලුවූ; බහුශ්‍රුතාඃ, බහුශ්‍රුතයෝ—හෙවත් උගත්හුපවා; ලොභමොහිතාඃ, ලොභයවිසින් මුළාකරවනලද්දාහු, ක්ලිශ්‍යන්තෙ, කිලිටිවෙත්—හෝ—තැවෙත්.

### ලොභයෙහිනපුර.

66 ලොභාත් ක්‍රොධඃ ප්‍රභවති ලොභාත් කාමප්‍රජායතෙ
ලොභාන් මොහශ්ච නාශශ්ච ලොභඃ පාපස්‍යකාරණම්.

ලොභාත්, ලොභය හෙතුකොටගෙණ; ක්‍රොධඃ ප්‍රභවති, ක්‍රොධය උපදී; ලොභාත්, ලොභය හෙතුකොටගෙණ; කාමඃ ප්‍රජායතෙ, කාමය තෙම උපදී; ලොභාත්, ලොභය හෙතුකොටගෙණ; මොහඃච, මුළාවද; නාශශ්ච, මරණයද; (උපදී) ලොභඃ, ලොභයතෙම; පාපස්‍යකාරණම්, පාපයට උත්පත්තිස්ථානය (යි කියනලදී.)

### සමූහයකාගේ ඉදිරියෙන් විරුද්ධක්‍රියාවට නොයායුතුබව.

67 න ගණස්‍යාග්‍රතො ගච්ඡෙත් සිද්ධෙ කාර්‍ය්‍යෙ සමං ඵලම්
යදි කාර්‍ය්‍යවිපත්තිඃ ස්‍යාත් මුඛරස්තත්‍ර හන්‍යතෙ.

ගණස්‍ය, සමූහයාගේ; අග්‍රතඃ, ඉදිරියෙන්; නගච්ඡෙත්, නොයන්නේය. කාර්‍ය්‍යෙ, කටයුත්ත; සිද්ධෙ, සිදුවූකල්හි; සමම්ඵලම්, ප්‍රයොජනය සමානවේ. කාර්‍ය්‍ය විපත්තිඃ, කටයුත්තගේ විපත්තියතොමෝ; යදිස්‍යාත්, ඉදින්වන්නීද; තත්‍ර, එහි, මුඛරඃ, අග්‍රතැනැත්තේ; හන්‍යතෙ, නසනුලැබේ.

### ඉන්ද්‍රියනිග්‍රහයෙහිවැඩ.

68 ආපදාං කථිතඃ පන්ථා ඉන්ද්‍රියානාමසංයමඃ
• තජ්ජයඃ සම්පදාං මාර්ගො යෙනෙෂ්ටං තෙන ගම්‍යතාම්.

ඉන්ද්‍රියානාම්, (චක්ෂුරාදි) ඉන්ද්‍රියයන්ගේ; අසංයමඃ, නිග්‍රහ නොකිරීම තෙම; ආපදාම්, විපත්තීන්ගේ; පන්ථාඃ, මගෙක්යයි; කථිතඃ, කියනලදී; තජ්ජයඃ, ඒ ඉන්ද්‍රියයන්ගේ (නිග්‍රහයෙන්) ජයග්‍රහණයතෙම; සම්පදාම්, සම්පත්තීන්ගේ; මාර්ගඃ, මගවේ. යෙනෙෂ්ටම්, යම් මාර්ගයක් කරණකොටගෙණ සැපවැඩීමවේද; තෙන, ඒ මාර්ගයෙන්; ගම්‍යතාම්, යනු ලැබේවා.

### විපත්ති එළවන්නවුන්ට ප්‍රියයන්ද හෙතුවනබව.

69 ආපදමාපතන්තීනාං හිතොප්‍යායාති හෙතුතාම්
මාතෘජඞ්ඝා හි වත්සස්‍ය ස්තම්භීභවති බන්ධනෙ.

ආපදම්, විපත්තින්; ආපතන්තීනාම්, වැටෙන්නවුන්ට; හිතඃ අපි, හිතයද; හෙතුතාම්, හෙතුබවට; ආයාති, පැමිණේ. හි, ඒ එසේමැයි; මාතෘජඞ්ඝා, මවගේ ජඞ්ඝාතොමෝ; (ගවදෙනගේ දණෙන්පාත කකුල) වත්සස්‍ය බන්ධනෙ, වස්සාගේ බැඳීමෙහි; ස්තම්භීභවති, කණුවක්මෙන්වේ.

### නෑයන්ගේ ස්වභාවය.

70 ස බන්ධුර්‍යො විපන්නානාමාපදුද්ධරණක්ෂමඃ
න තු භීතපරිත්‍රාණ වස්තූපාලම්භපණ්ඩිතඃ.

විපන්නානාම්, විපත්තියට පැමිණියවුන්ගේ; ආපද් උද්ධරණක්ෂමඃ, විපත්තියනැතිකිරීමටහැකිවූ; යඃ, යමෙක්ඇද්ද; සඃ, හෙතෙම; බන්ධුඃ, නෑයෙක්වේ. භීතපරිත්‍රාණ, භයකෙරෙන් රක්ෂාකිරීමෙහි; වස්තූපාලම්භපණ්ඩිතඃ, භයඉපදවූවාහට නින්දාමූල්කොට දූෂ්‍යකරන්නාවූ පණ්ඩිතතෙම; නතු, නෑයෙක්නොවේ.

### උත්තමයන්ට ස්වභාවයෙන් ඇතිවන කාරණ.

71 විපදි ධෛර්‍යමථාභ්‍යුදයෙ ක්ෂමා
සදසි වාක්පටුතා යුධි වික්‍රමඃ.
යශසි චාභිරුචිර්ව්‍යසනං ශ්‍රුතෞ
ප්‍රකෘතිසිද්ධමිදං හි මහාත්මනාම්.

විපදි, විපත්තියක් එළඹසිටිකල්හි; ධෛර්‍යම්, නොසෙල්වෙනබව ; අථ, නැවත; අභ්‍යුදයෙ, වැඩීමෙහි; ක්ෂමා, ඉවසීමද; සදසි, සභාවෙහි; වාක්පටුතා, ප්‍රස්තාවානු රූපවූ කථාවෙහි දක්ෂබවද; යුධිවික්‍රමඃ, යුද්ධකාලයෙහි වික්‍රමයද; යශසි, කීර්තියෙහි; අභිරුචිඃ, කැමැත්තද; ශ්‍රුතෞ, ශාස්ත්‍රය ඇසීමෙහි; ව්‍යසනම්, ඇලීමද; ඉදම්, මේතෙම; මහාත්මනාම්, උත්තමයන්ට; ප්‍රකෘති සිද්ධංහි, ස්වභාවයෙන් සිද්ධමැයි.

### ලොවබොහෝකොටනැත්තෝ.

72 සම්පදි යස්‍ය න හර්ෂො විපදි විෂාදො න රණෙ ච ධීරත්වම්
තං භුවනත්‍රයතිලකං ජනයති ජනනී සුතං විරලම්.

සම්පදි හර්ෂඃ, සැපඇතිකල්හි සතුට; යස්‍යන, යමෙකුට නැත්තේද; විපදිවිෂාදඃ, විපත්තියක් ඇති කල්හි දුකටපැමිණීමද; න, (යමෙකුට)

නැත්තේද. රණෙබීරත්වච, යුධයෙහි නුවණැතිබව ඇත්තේද; භුව නත්‍යතිලකව්, තුන්ලොවට ශ්‍රෙෂ්ඨව; තම්සුතම්. ඒ පුත්‍රයා; ජනනී; මව්තොමෝ; විරලම්ජනයති, මදකොට උපදවන්නීය.

මේ ලොකයෙහි සැපකැමැත්තාවිසින් දුරුකටයුතු දොෂහය.

73 ෂඩ්දෙෂාඃ පුරුෂෙණෙහ හාතව්‍යා භූතිමිච්ඡතා

නිද්‍රා තන්ද්‍රා භයං ක්‍රොධ ආලස්‍යං දීඝීසූත්‍රතා.

නිද්‍රා, නිදිඅධිකබවද; තන්ද්‍රා, අලසබවද; භයම්, භයද; ක්‍රොධඃ, අනුන්ට අනුපකාරකරණු කැමතිව සිත පෙරලීමද; ආලස්‍යම්, කම්මැලිබවද; දීඝීසූත්‍රතා, ආරම්භකළ කටයුතු බොහෝකාලයෙකින් කරණබවද; (යනමේ) ෂඩ්දෙෂාඃ, දොෂ හයෙක්, ඉහ, මේලොකයෙහි; භූතිං ඉච්ඡතා, ඓශ්වය්‍යී කැමැත්තාවූ; පුරුෂෙණ, පුරුෂයාවිසින්; හාතව්‍යාඃ, දුරුකටයුත්තාහුවෙත්.

ස්වල්ප ද්‍රව්‍යයන්ද එක්වූකල කටයුතුකළහැකිබව.

74 අල්පානාමපි වස්තූනාං සංහතිඃ කාය්‍යීසාධිකා

තෘණෛගුීණත්වමාපන්නෛනාබ්ධ්‍යන්තෙ මත්තදන්තිනඃ.

අල්පානාම් අපි; ස්වල්පවූද; වස්තූනාම්, ද්‍රව්‍යයන්ගේ; සංහතිඃ, සමූහයතොමෝ; කාය්‍යීසාධිකා, කටයුතු සිඩකරන්නීය; (ඒ මෙසේයි) ගුණත්වම් ආපන්නෛඃ, සමූහබවට පැමිණියාවූ; තෘණෛඃ, තණ කරණකොටගෙණ; මත්තදන්තිනඃ, මත්තහස්තිහු; බධ්‍යන්තෙ, බඳිනුලැබෙත්.

තමන් ගොත්‍රයෙහිවූ දුර්වලයන්හා සමගද එක්වීම ප්‍රශස්තබව.

75 සංහතිඃ ශ්‍රෙයසී පුංසාං ස්වකුලෛරල්පකෛරපි

තෘෂෙණාපි පරිත්‍යක්තා න ප්‍රරොහන්ති තණ්ඩුලාඃ.

අල්පකෛඃ අපි, ස්වල්පවූද; ස්වකුලෛඃ, තමාගේ ගොත්‍රයෙහි උපන්නවුන්හා සමග; සංහතිඃ, සමාගමතොමෝ; පුංසාම්, පුරුෂයන්ගේ, ශ්‍රෙයසී, අතිශයින් ප්‍රශස්තයෙහිවන්නේය. (ඊට කාරණනම්) තෘෂෙණ අපි, දහයිපොත්තෙන්ද; පරිත්‍යක්තාඃ, හරණලද්දාවූ; තණ්ඩුලාඃ, සහල්; නප්‍රරොහන්ති, හටනොගණිත්.

76 සංහතාස්තු හරන්තීමෙ ජාලං මම විහඞ්ගමාඃ

යදා තු නිපතිෂ්‍යන්ති වශමෙෂ්‍යන්ති මෙ තදා.

සංහතාඃ, සමගිවූ; ඉමෙවිහඞ්ගමාඃතු, මේ පක්ෂීහු වනාහි; මමජාලම් මාගේ දැල; හරන්ති, ගෙණයෙත්. යදාතුනි පතිෂ්‍යන්ති, යම්වේලෙක්හි වැටෙන්නාහුද. තදා, එකල්හි; මෙවශම්, මාගේ අයිතියට; එෂ්‍යන්ති පැමිණෙන්නාහුය.

මිත්‍රයන් මව්පියන්හා සමානව වැඩකැමැතිබව.

77 මාතා මිත්‍රං පිතා චෙති ස්වභාවාත්ත්‍රිතයං හිතම්

කාර්‍ය්‍යකාරණතශ්චාන්‍යෙ භවන්ති හිතබුද්ධයඃ.

මාතා, මව්ද; මිත්‍රම්, මිතුද; පිතාචඉති, පියාදයන; ත්‍රිතයම්, තුන්දෙනා; ස්වභාවාත් හිතම්, තමන් ස්වභාවයෙන් වැඩකැමතිවේ. අන්‍යෙ, සෙස්සෝ; කාර්‍ය්‍ය කාරණතඃ, කටයුතු හෙතුකොටගෙණ; හිතබුද්ධයඃ ච, වැඩීමට කල්පනා ඇත්තාහු; භවන්ති, වෙත්.

මිත්‍රයන්ගේ ආශ්‍රයඇත්තා පිණැත්තකුබව.

78 යස්‍ය මිත්‍රෙණ සම්භාෂා යස්‍ය මිත්‍රෙණ සංස්ථිතිඃ

යස්‍ය මිත්‍රෙණ සංලාපස්තතො නාස්තීහ පුණ්‍යවාන්.

මිත්‍රෙණ, මිත්‍රයාහා සමග; සම්භාෂඃ, කථාකිරීම; යස්‍ය, යමෙකුටවේද; මිත්‍රෙණ, මිත්‍රයාහා සමග; සංස්ථිතිඃ, එකතැනවිසීම; යස්‍ය, යමෙකුටවේද; මිත්‍රෙණ, මිත්‍රයාහා සමග, සංලාපඃ, ඔව්නොවුන් කථාකිරීම; යස්‍ය, යමෙකුටවේද; තතඃ, ඊටවඩා; පුණ්‍යවාන්, පිණැත්තෙක්; ඉහ, මේලොකයෙහි; නාස්ති, නැත්තේය.

තමාවිසින්කරණලද හොඳනොහොඳ ක්‍රියාවගේ ඵලයට මැවුම්කාර

දෙවියන්ගේ අයිතිකමින් පැමිණෙනබව.

79 යස්මාච්ච යෙන ච යථා ච යදා ච යච්ච යාවච්ච යත්‍ර—

චශුභාශුභමාත්මකර්ම

තස්මාච්ච තෙන ච තථා ච තදා ච තච්ච තාවච්ච—

තත්‍ර ච විධාතෘවශාදුපෛති

යස්මාත්ච, යමක් හෙතුකොටගෙණද; යෙනච, යම් කාරණයෙකින්ද; යථාච, යම් පරිද්දෙකින්ද; යදාච, යම්කාලෙක්හිද; යත්‍රච, යම්ස්ථානයෙක්හිද; යාවත්, යම්පමණවූ; ශුභාශුභම්, සුචරිත දුශ්චරිතවූ; යත් ආත්මකර්මච, තමාවිසින්කරණලද යම් ක්‍රියාවෙක්ඇද්ද; තස්මාත්ච, ඒ හෙතුකොටගෙණද; තෙනච, ඒ කාරණයෙන්ද; තථාච, එ පරිද්දෙන්ද; තදාච, එකල්හිද; තත්‍රච, ඒ ස්ථානයෙහිද; තාවත්ච, එපමණ; තත්ච, ඒ ක්‍රියාවගේ ඵලයට; විධාතෘවශාත්, මැවුම්කරණ සුලු දෙවියන්ගේ අයිතිබව හෙතුකොටගෙණ උපෛති, ජනයා පැමිණේ,

තමන්විසින් කරණලද අපරාධයට ලැබෙන්නාවූ ඵලනම්.

80 රොගශොකපරිතාපබන්ධනව්‍යසනානි ච
ආත්මාපරාධවෘක්‍ෂස්‍ය ඵලාන්‍යෙතානි දෙහිනාම්.

රොග, ලෙඩද; ශොක, සිතෙහි දුකද; පරිතාප, සිත තැවීමද; බන්ධනා, සිරවීමද; ව්‍යසනානිච, නොයෙක් විපත්තිහුද; එතානි, යන මොහු; දෙහිනාම්; මිනිසුන්ගේ; ආත්මාපරාධවෘක්‍ෂස්‍ය, තමාවිසින් කරණලද දොෂනැමැති වෘක්‍ෂයාගේ; ඵලානි, ඵලයෝනම්වෙත්.

ධනයහා අඹුවටද වඩා තමා රක්‍ෂාකටයුතුබව.

81 ආපදර්ථෙ ධනං රක්‍ෂෙද්දාරාන් රක්‍ෂෙද්ධනෛරපි
ආත්මානං සතතං රක්‍ෂෙද්දාරෛරපි ධනෛරපි.

ආපත්අර්ථෙ, විපත්තිවලින් මිදීමයයි කියනලද ප්‍රයොජනය නිමිත්ත කොටගෙණ; ධනම්රක්‍ෂෙත්, ධනයරක්නේය; ධනෛඃ අපි, ධනයදීම හෙතුකොටගෙණද; දාරාන්, අඹුවන්; රක්‍ෂෙත්, රක්නේය; දාරෛඃ අපි, අඹුවන් පරිත්‍යාගකිරීමෙන්ද; ධනෛඃ අපි, ධන පරිත්‍යාගය හෙතු කොටගෙණද; සතතම්, නිරන්තරයෙන්, ආත්මානම්, තමා; රක්‍ෂෙත්, රක්‍ෂාකරන්නේය.

සියල්ලටමවඩා ප්‍රාණයන් ප්‍රධානබව.

82 ධර්මාර්ථකාමමොක්‍ෂාණාං ප්‍රාණාඃ සංස්ථිතිහෙතවඃ
තන්නිඝ්නතා කින්න හතං රක්‍ෂතා කින්න රක්‍ෂිතම්.

ප්‍රාණාඃ, ප්‍රාණයෝ; ධර්මාර්ථකාමමොක්‍ෂාණාම්, සුචරිතය—ධනය—සැපතය—මොක්‍ෂය යන මොවුන්ගේ; සංස්ථිතිහෙතවඃ, පැවතීමට හෙතු වෙත්. තං, ඒ ප්‍රාණය, නිඝ්නතා, නසන්නාවිසින්, කිං, කුමක්; නහතම්, නොනසනලදද; රක්‍ෂතා, රක්‍ෂාකරන්නා විසින්; කිංනරක්‍ෂිතම්; කුමක්නම් රක්‍ෂානොකරණලදද.

සත්පුරුෂයන්ගේ ප්‍රයොජනයෙහිදී ජීවිතපරිත්‍යාගය උතුම්බව.

83 ධනානි ජීවිතඤ්චෛව පරාර්ථෙ ප්‍රාඥ උත්සෘජෙත්
සන්නිමිත්තෙ වරං ත්‍යාගො විනාශෙ නියතෙ සති.

ධනානි, ධනයන්ද; ජීවිතඤ්චෛව, ජීවිතයද; ප්‍රාඥඃ, නුවණැති පුරුෂ තෙම; පරාර්ථෙ, අනුන්ගේ කාරණයෙහි; උත්සෘජෙත්, හරණේය. විනාශෙ, මරණය; නියතෙසති, නියතවූකල්හි; සන්නිමිත්තෙ, සත්පුරුෂයන්ගේ වැඩෙහි; ත්‍යාගඃ, ජීවිතයහැරීම; වරම්, උතුම්වේ.

ස්වාමියාගේ හා සෙවකයන්ගේද සමානත්වය ස්වාමියා සැලකියයුතුබව.

84 ජාතිද්‍රව්‍යබලානාච සාම්‍යමෙෂාං මයා සහ
මත්ප්‍රභුත්වඵලං බෲහි කදා කිංතද්භවිෂ්‍යති.

මයාසහ, මාහාසමග; එෂාම්, මොවුන්ගේ; ජාතිද්‍රව්‍යබලානාච, ජාති—ද්‍රව්‍ය—ශක්ති—යනමොවුන්ගේ; සාම්‍යම්, සමානබවවේ. මත්ප්‍රභුත්වඵලම්, මාගේ ප්‍රධානභාවයෙහි ඵලය; බෲහි, කියව. කදා, කවරකලෙක්හි, තත්, ඒ; කිංභවිෂ්‍යති, කුමක්වන්නේද.

ස්වාමියාගේ ජීවිතය පරිත්‍යාග කිරීමෙන්ද සෙවකයන් රැක්කයුතුබව.

85 විනා වර්තනමෙවෛතෙ න ත්‍යජන්ති මමාන්තිකම්
තන්මෙ ප්‍රාණව්‍යයෙනාපි ජීවයෛතාන්මමාශ්‍රිතාන්.

වර්තනම්විනාඑව, ආහාරයක්නැතිවම; එතෙ, මෙපරෙව්යෝ; මමාන්තිකම්, මාගේ සමීපය; නත්‍යජන්ති, නොහරිත්. තත්, එබැවින්; මෙ, මාගේ; ප්‍රාණව්‍යයෙනාපි, ජීවිතය පරිත්‍යාගකිරීමෙන්ද; එතාන්මමාශ්‍රිතාන්; මාගේ ආශ්‍රයට පැමිණියාවූ මොවුන්; ජීවය, ජීවත්කළමැනව.

නැසෙන ස්වභා ඇත්තාවූ ශරීරයෙහි උත්සාහයනොකොට කීර්තිය සෙවියයුතුබව.

86 මාංසමූත්‍රපුරීෂාස්ථිනිර්මිතෙ ච කලෙවරෙ
විනශ්වරෙ විහායාස්ථාං යශඃ පාලය මිත්‍ර මෙ.

මාංස, මාංසද; මූත්‍ර, මූත්‍රද; පුරීෂ, මලද; අස්ථි, ඇටද; (යනමෙයින්) නිර්මිතෙ, කරණලද්දාවූ; විනශ්වරෙ, නැසෙන සුලුවූ; කලෙවරෙ, ශරීරයකෙරෙහි; ආස්ථාම්, උත්සාහය නොහොත් ශ්‍රද්ධාව; විහාය, හැරදමා; මිත්‍ර, මිත්‍රය; මෙ, මාගේ; යශඃ, කීර්තිය; පාලය, රක්ෂාකරව.

ශරීරය කරණකොටගෙණ කීර්තිය සහිතවූ සියල්ල ලැබියහැකිබව.

87 යදි නිත්‍යමනිත්‍යෙන නිර්මලං මලවාහිනා
යශඃ කායෙන ලභ්‍යෙත තන්න ලබ්ධං භවෙන්නු කිම්.

අනිත්‍යෙන, නිත්‍යනොවූ, මලවාහිනා, අපවිත්‍රවහනයවන සුලුවූ; කායෙන, ශරීරයෙන්; නිත්‍යම්, නිත්‍යවූ; නිර්මලම්, ශුද්ධවූ; යශඃ, කීර්තිය; යදිලභ්‍යෙත, ඉදින් ලබන්නෙනම්. තත්, ඒ ශරීරයතෙම; කිංනු, කුමක්නම්; ලබ්ධංනභවෙත්, ලබනලද්දේ නොවන්නේද.

ශරීරය ක්‍ෂණයෙකින් නැසෙනනුමුත් ගුණය ලොකාන්තිමයදක්වා පවත්නාබව.

88 ශරීරස්‍ය ගුණනාඤ්ච දූරමත්‍යන්තමන්තරම්,
ශරීරං ක්‍ෂණවිධ්වංසි කල්පාන්තස්ථායිනො ගුණාඃ.

ශරීරස්‍ය, ශරීරයාගේද; ගුණනාංච, ගුණයන්ගේද; අන්තරම්, අතර; අත්‍යන්තම්, අතිශයින්; දූරම්, දුරැයි. ශරීරම්, ශරීරයතෙම; ක්‍ෂණවිධ්වංසී, ක්‍ෂණයෙකින් නැසෙනස්වභා ඇත්තේවේ. ගුණාඃ, ගුණයෝ; කල්පාන්තස්ථායිනඃ, ලොකයෙහි අන්තිමයදක්වා පවත්නා ස්වභාඇත්තාහු වෙත්,

මරණයලත්වූකල නුවණමුළාවනබව.

89 යොධිකාද්‍යොජනශතාත් පශ්‍යතීහාමිෂංඛගඃ
ස එව ප්‍රාප්තකාලස්තු පාශබන්ධං න පශ්‍යති.

ඉහ, මේ ලොකයෙහි; යඃඛගඃ, යම්පක්‍ෂියෙක්; අධිකාත් යොජනශතාත්, යොදුන් සියයකට වඩා ඇතින්වූ; ආමිෂම්, ආහාරයක්; පශ්‍යති, දකිද. ප්‍රාප්තකාලඃ, පැමිණියාවූ මරණකාලය ඇත්තාවූ; සඃඑව, ඒපක්‍ෂියාම; පාශබන්ධම්, රැහැනින් යෙදුපුඩුව; නපශ්‍යති, නොදකී.

ලොකයෙහි විධිබලවත්බව,

90 ශශිදිවාකරයොර්ග්‍රහපීඩනං ගජභුජඞ්ගමයොරපි බන්ධනම්,
මතිමතාංච විලොක්‍ය දරිද්‍රතාං විධිරහො බලවානිති මෙ මතිඃ.

ශශිදිවාකරයොඃ, චන්‍ද්‍රසූර්‍ය්‍යදෙදෙනාහට; ග්‍රහපීඩනම්, රාහුග්‍රහයායයි නම්ලත් ඡායාව කරණකොටගෙණ පීඩාවද; ගජභුජඞ්ගමයොඃ අපි, හස්ති සර්පි දෙවර්ගයාගේ; බන්ධනම්, බැඳීමද; මතිමතාම්, පණ්ඩිතයන්ගේ; දරිද්‍රතාංච, දිළිඳුබවද; විලොක්‍ය, දැක; අහො, විස්මයෙක; විධිඃ, විධිතෙම; බලවාන්ඉති, බලඇත්තේයයි; මෙමතිඃ, මාගේබුද්ධියයි.

මරණයට නියමවූ කාලය වැලැක්වියනොහැකිබව,

91 ව්‍යොමෙකාන්තවිහාරිණොපි විහගාඃ සම්ප්‍රාප්නුවන්ත්‍යාපදං
බද්ධ්‍යන්තෙ නිපුණෛරගාධසලිලාන්මත්ස්‍යාඃ සමුද්‍රාදපි
දුර්ණීතං කිමිහාස්ති කිං සුචරිතං කඃ ස්ථානලාභෙ ගුණඃ
කාලොහි ව්‍යසනප්‍රසාරිතකරො ගෘහ්ණාති දූරාදපි.

ව්‍යොමෛකාන්තවිහාරිණඃ, නිරන්තරයෙන් ආකාශයෙහි හැසිරෙණ සුලුවූ; විහගාඃඅපි, පක්‍ෂීහු පවා; ආපදම්, විපත්තියට; සම්ප්‍රාප්නුවන්ති, පැමිණෙත්,

නිපුණෙනඃ, දක්‍ෂයන්විසින්; අගාධසලිලාත්, ගැඹුරුවූ දියඇති; සමුද්‍රාත්, සාගරය කෙරෙන්; මත්ස්‍යාඃ, මත්ස්‍යයෝ; බධ්‍යන්තෙ, බඳිනුලැබෙත්. ඉහ, මේලෝකයෙහි; කිංදුශ්චරිතං, දුශ්‍යවූ හැසිරීමනම් කිම; සුචරිතංකිං, මනාහැසිරීමනම් කිම; ස්ථානලාභෙ, ස්ථානලැබීමෙහි; කෝගුණඃ, කවරගුණයෙක්ද; කාලඃහි, විපත්තිකාලයවනාහි; ව්‍යසනප්‍රසාරිතකරඃ, ව්‍යසනනැමැති අඟුකරණලද අත්ඇත්තෙ; දූරත්අපි, දුරුවූ ස්ථානයකෙරෙන්ද; ගෘහ්ණාති, ගණී.

මිත්‍රයන් සියයක් නුමුත් නොයෙක්ජාතියෙන් කටයුතුබව,

92 යානි කානි ච මිත්‍රාණි කර්ත්තව්‍යානි ශතානි ච

පශ්‍ය මූෂිකමිත්‍රෙණ කපොතා මුක්තබන්ධනාඃ.

යානිකානිචමිත්‍රාණි, යම්කිසිජාතියක මිත්‍රයෝ; ශතානිච, සියගණනක්ද; කර්ත්තව්‍යානි, කටයුත්තාහුවෙත්. මූෂිකමිත්‍රෙණ, මිත්‍රභාවයට පැමිණිමීයාවිසින්; කපොතාඃ, පරවියෝ; මුක්තබන්ධනාඃ, දැලකපා හැරීමෙන් මුදනලද බැඳුම්ඇත්තාහුවූවාහුයි. පශ්‍ය, බලව.

තමාහා ගැලපෙනතැනැත්තා හා සමග ගැලපියයුතුබව,

93 යද්‍යෙන යුජ්‍යතෙ ලොකෙ බුධස්තත්තෙන යොජයෙත්

අහමන්නංභවාන් භොක්තා කථංප්‍රීතිර්භවිෂ්‍යති.

ලෝකෙ, ලෝකයෙහි; යෙන, යමකුහාසමග; යත්, යම්දෙයකින්; යුජ්‍යතෙ, යෙදේද; බුධඃ, පණ්ඩිතතෙම; තෙන, ඔහුහාසමග; තත්, ඒ කාරණයෙන්; යොජයෙත්, යෙදෙන්නේය; අහම්, මම; අන්නම්, ආහාරවෙමි. භවාන්, පින්වත්තෙම; භොක්තා, අනුභවකරණ ස්වභාඇත්තෙක; ප්‍රීතිඃ, ප්‍රීතියෙක්; කථම්භවිෂ්‍යති, කෙසේවන්නේද.

සතුරට ප්‍රියව විසීම විපත්තියට කාරණාවේ,

94 භක්‍ෂ්‍යභක්‍ෂකයොඃ ප්‍රීතිර්විපත්තෙරෙව කාරණම්.

ශෘගාලාත් පාශබද්ධොසෞ මෘගඃ කාකෙන රක්‍ෂිතඃ.

භක්‍ෂ්‍ය භක්‍ෂකයොඃ, අනුභවකටයුතුවූ වාහුගේ හා අනුභවකරන්නාද යන දෙදෙනාගේ; ප්‍රීතිඃ, ඇල්ම; විපත්තෙඃඑව, විපත්තියටම; කාරණම්, හෙතුවේ. ශෘගාලාත්, සිවලාගේ කිම හෙතුකොටගෙණ; පාශබද්ධඃ, රැහැනින් බඳනාලද්දාවූ; අසෞමෘගඃ, මේමුවතෙම; කාකෙන, කවුඩාවිසින්; රක්‍ෂිතඃ, රක්නාලදී.

ස්වභාවය නොදන්නා තැනැත්තාට විසීමට අවකාශනොදියයුතුබව,

95 අඥාතකුලශීලස්‍ය වාසො දෙයො න කස්‍යචිත්

මාර්ජ්ජාරස්‍ය හි දොෂෙණ හතො ගෘධ්‍රො ජරද්ගවඃ,

අඥාතකුලශීලස්‍ය, නොදන්නාවූ කුලසිරිත්ඇත්තාහට; වාසඃ, නවා තැන්ව විසීමට කැමැත්ත; කස්‍යචිත්, කිසිකාරණයෙකින්; නදෙයඃ, නොදියයුතුය. මාර්ජාරස්‍යහි, බලලාගේවනාහි; දොෂෙණ, දොෂයක රණකොටගෙණ; ජරද්ගවඃගෘධ්‍රඃ, ජරද්ගවනම් ඇතිවෘකතෙම; (මුවන්මරන්නාවූ දිවියාසමාන වනයෙහි වසන සිව්පාවගීයක්) හතඃ, නසනලදී.

භයඑළඹීමට පළමුව භයවියයුතුබව,

96 තාවද්භයස්‍ය භෙතව්‍යං යාවද්භයමනාගතම්
ආගතන්තු භයං වීක්ෂ්‍ය නරඃ කුර්‍ය්‍යාද්‍යථොචිතම්.

යාවත්, යම්තාක්; භයම්අනාගතම්, භයනොපැමිණියේද; තාවත්, ඒතාක්; භයස්‍ය, භයට; භෙතව්‍යම්, භයවියයුතුය. ආගතම්, පැමිණියාවූ; භයම් වීක්ෂ්‍යව, භයදැකද; නරඃ, මනුෂ්‍යතෙම; යථොචිතම්, සුදුසුවූ කාරණය; කුර්‍ය්‍යාත්, කරන්නේයී.

ජාතියෙහිවූ පමණට නැසීමහා පිදීමද යනදෙක නොකටයුතුබව

97 ජාතිමාත්‍රෙණ කිං කශ්චිද්හන්‍යතෙ පූජ්‍යතෙ ක්වචිත්.
ව්‍යවහාරං පරිඥාය වධ්‍යඃ පූජ්‍යොථවා භවෙත්.

කිම්, කුමක්ද; ජාතිමාත්‍රෙණ, ජාතියපමණින්; කශ්චිත්, කිසියම්තැනෙක්හි; හන්‍යතෙ, නසනුලැබේද. ක්වචිත්, කිසියම්තැනෙක්හි; පූජ්‍යතෙ, පුදනුලැබේද. ව්‍යවහාරම්, ව්‍යවහාරය; පරිඥාය, දැන; වධ්‍යඃ, නැසියයුතුය. අථවා, නොහොත්; පූජ්‍යඃභවෙත්, පිදියයුතුදවේ.

ගෙටපැමිණියාවූ සතුරාටද සුදුසුවූ සංග්‍රහකටයුතුබව,

98 අරාවප්‍යුචිතං කාර්‍ය්‍යමාතිථ්‍යං ගෘහමාගතෙ
ඡෙත්තුඃ පාර්ශ්වගතාං ඡායාං නොපසංහරති ද්‍රුමඃ.

ගෘහම්ආගතෙ, ගෙයකරාපැමිණියාවූ; අරෞඅපි, සතුරාකෙරෙහිදඃ උචිතම්, සුදුසුවූ; ආතිථ්‍යම්, ආගන්තුකසංග්‍රහය; කාර්‍ය්‍යම්, කටයුතුය. ද්‍රුමඃ,, ගසතෙම; ඡෙත්තුඃ,. ගසකපන්නාවූසතුරාහට; පාර්ශ්වගතාම්ඡායාම්, පාර්ශ්වයෙහිවූසෙවන; නඋපසංහරති, නොහකුළුවා.

තණපත්‍රආදි සතරක්සත්පුරුෂයන්ගේ ගෙයි කඩනොව පවතිනාබව,

99 තෘණානි භූම්රුදකං වාක් චතුර්ථී ච සූනෘතා
එතාන්‍යපි සතාං ගෙහෙ නොච්ඡිද්‍යන්තෙ කදාචන.

තෘණානි, තණපත්‍රයෝද; භූමිඃ, භූමියද; උදකම්, වතුරද; චතුර්ථී, සතරවෙනිවූ; සූනෘතා, සත්‍යප්‍රියවූ; වාක්ච, වචනයදයන; එතාන්අපි,

මොහුද; සතාම්ගෙහෙ, සත්පුරුෂයන්ගේ ගෘහයෙහි; කදාචන, කිසි කාලෙකත්; නොච්ඡිද්‍යන්තෙ, කඩනොවෙත්,

සත්පුරුෂයෝ ගුණනැත්තා කෙරෙහිද අනුකම්පා කෙරෙත්.

100 නිර්ගුණෙෂ්වපි සත්වෙෂු දයාං කුර්වන්ති සාධවඃ.
න හි සංහරතෙ ජ්‍යොත්ස්නාං චන්ද්‍රශ්චාණ්ඩාලවෙශ්මනි;

සාධවඃ, සත්පුරුෂයෝ; නිර්ගුණෙෂ්වපිසත්වෙෂු, අසත්පුරුෂයන්කෙරෙහිද; දයාම්කුර්වන්ති, අනුකම්පාකෙරෙත්. චන්ද්‍රඃ, චන්ද්‍රමණ්ඩලයතෙම; ජ්‍යොත්ස්නාම්, චන්ද්‍රකාන්තිය; චාණ්ඩාලවෙශ්මනි, චණ්ඩාලගෘහයෙහි; නහිසංහරතෙ, නොහකුළුවා.

ගෙටපැමිණි බාලයකුවතමුත් සත්කාර කටයුතුබව,

101 බාලො වා යදි වා වෘද්ධො යුවා වා ගෘහමාගතඃ,
තස්‍ය පූජා විධාතව්‍යා සර්වස්‍යාභ්‍යාගතො ගුරුඃ.

බාලඃවා, බාලයෙක්හෝ; යදිවා, නොහොත්; වෘද්ධඃවා, මහල්ලෙක්හෝ; යුවාවා, තරුණයෙක්හෝ; ගෘහමාගතඃ, ගෙයකරපැමිණියේද; තස්‍යසර්වස්‍ය, ඒ සියල්ලට; පූජාවිධාතව්‍යා, පූජාකටයුත්තිය. අභ්‍යාගතඃ, ඉදිරියටපැමිණිකැනැත්තේ; ගුරුඃ, ගුරුවේ.

ආගන්තුකයකු ආහාරනොලැබ ගෙයින් නික්මයාමෙහිදෝෂ,

102 අතිථිර්‍යස්‍ය භග්නාශො ගෘහාත් ප්‍රතිනිවර්ත්තතෙ
ස තස්මෛ දුෂ්කෘතං දත්වා පුණ්‍යමාදාය ගච්ඡති.

අතිථිඃ, ආගන්තුකයෙක්තෙම; භග්නාශඃ, ආහාරනොලද්දේ; යස්‍යගෘහාත්, යමකුගේගෘහයකෙරෙන්; ප්‍රතිනිවර්ත්තතෙ, හැරීඒද. සඃ, හෙතෙම; තස්මෛ, ඔහට; දුෂ්කෘතම්දත්වා, දුශ්චරිතයදී; පුණ්‍යම් ආදාය, කුශලයගෙණ; ගච්ඡති, යේ.

උතුම්ගොත්‍ර ඇත්තකුගේද ගෙටපැමිණි නීචයාට පවා සුදුසුලෙස සංග්‍රහකටයුතුබව.

103 උත්තමස්‍යාපි වර්ණස්‍ය නීචොපි ගෘහමාගතඃ
පූජනීයො යථායොග්‍යං සර්වදෙවමයොතිථිඃ-

උත්තමස්‍යඅපිවර්ණස්‍ය, උතුම්ජාතිඇත්තෙකුගේහෝ; ගෘහම්, ගෙයක් කරා; ආගතඃ, ආවාවූ; නීචඃඅපි, නීචයෙක්නමුදු; යථායොග්‍යම් සුදුසුපරිද්දෙන්; පූජනීයඃ, පිදියයුතුය. අතිථිඃ, ආගන්තුකතෙම; සර්වදෙවමයඃ, සියලු දිව්‍යමයයෙවි.

ස්ව ර්ග ය ට ය න් නෝ,

104 සර්වහිංසානිවෘත්තා යෙ නරාඃ සර්වසහාශ්ච යෙ
සර්වස්‍යාශ්‍රයභූතාශ්ච තෙ නරාඃ ස්වර්ගගාමිනඃ.

යෙනරාඃ, යම්මනුෂ්‍ය කෙනෙක්; සර්වහිංසානිවෘත්තාඃ, සියලුහිංසාවලින්වැලකුනාහුද; යෙ, යම්කෙනෙක්; සර්වසහාශ්ච, සියලුඅපරාධ ඉවසන්නාහුද; සර්වස්‍ය, සියල්ලන්විසින්; ආශ්‍රයභූතාශ්ච, ආශ්‍රයකරණලද්දාහු ද; තෙනරාඃ, ඒමනුෂ්‍යයෝ; ස්වර්ගගාමිනඃ, ස්වර්ගයටයෙත්.

මිත්‍රධර්මයපමණක් මරණකාලයෙහිත් තමා නොහැර පවත්නාබව,

105 එක එව සුහෘද්ධර්මෝ නිධනෙප්‍යනුයාති යඃ
ශරීරෙණ සමං නාශං සර්වමන්‍යත්තු ගච්ඡති.

යඃ එකඃ සුහෘද්ධර්මඃ එව යම්එකම මිත්‍රධර්මයපමණක්; නිධනෙඅපි, මරණකාලයෙහිපවා; අනුයාති, පසුපස්සෙහියේද. සර්වමන්‍යත්තු, අනික් සියල්ලවනාහි; ශරීරෙණසමං, ශරීරයහාසමග; නාශංගච්ඡති, විනාශයට පැමිණේ.

මාංසඅනුභව කරන්නාගේහා මරණුලබණ තැනැත්තාගේද වෙනස.

106 යොත්ති යස්‍ය යදා මාංසමුභයොඃ පශ්‍යතාන්තරම්
එකස්‍ය ක්ෂණිකා ප්‍රීතිරන්‍යඃ ප්‍රාණෛර්විමුච්‍යතෙ

යඃ, යමෙක්තෙම; යදා, යම්කාලයෙක්හි, යස්‍ය; යමකුගේ, මාංසම්අත්ති; මාංසඅනුභවකෙරේද. උභයොඃ, මේදෙදෙනාගේ; අන්තරම්, වෙනස; පශ්‍යත, දක්නේය. එකස්‍ය, එකෙකුට; ක්ෂණිකා, ස්වල්පකාලයෙක්හි පවත්නාවූ; ප්‍රීතිඃ, පිනායාමක් වන්නීය. අන්‍යඃ, අනික්තැනැත්තේ; ප්‍රාණෛඃ, ප්‍රාණයන්විසින්; විමුච්‍යතෙ, මුදනුලැබේ.

මරණදුකෙහි මහත්බව,

107 ම්‍රිතව්‍යමිති යද්දුඃඛං පුරුෂස්‍යොපජායතෙ
ශක්‍යතෙ නානුමානෙන පරෙපි පරිවර්ණිතුම්,

ම්‍රිතව්‍යම්ඉති, මැරියයුතුයයන; යද්දුඃඛම්, යම්මේදුකෙක්තෙම; පුරුෂස්‍ය, පුරුෂයාහට; උපජායතෙ, උපදීද; ඒදුක, පරඃ, අනිකෙක්; අනුමානෙනඅපි, අනුමානයෙනුදු; පරිවර්ණිතුම්, කියන්ට; නශක්‍යතෙ, නොහැකිවේ.

ස ත්ව ඝා ත න යෙ හි ලා ම ක භා ව ය.

108 ස්වච්ඡන්දවනජාතෙන ශාකෙනාපි ප්‍රපූර්‍යතෙ
අස්‍ය දග්ධොදරස්‍යාර්ථෙ කඃ කුර්‍යාත් පාතකං මහත්.

[illegible]ජානෙන, තමා කැමැත්තෙන් වනයෙහි හටගත්තාවූ; [illegible] ශාකයෙන්ද; ප්‍රපූරයිතෙ, කුක්ෂිය පුරණ්නලැබේ. අස්‍යදග්ධ [illegible]දරස්‍ය, මේ දව්[illegible] කුක්ෂියගේ; අර්ථේ, ප්‍රයොජනයෙහි; කඃ, කවරක්නම්; මහත් [illegible]කම්, බලවත්වූ පාපයක්; * කුයසිාත්, කරන් [illegible]ද.

පණ්ඩිතයන් නැත්තාවූ දෙශයෙහි අඥානයන්පවා පූජ්‍යවනබව.

109 යත්‍ර විද්වජ්ජනො නාස්ති ශ්ලාඝ්‍යස්තත්‍රාල්පධීරපි

[illegible]පාදපෙ දෙශෙ එරණ්ඩොපි ද්‍රුමායතෙ.

යත්‍ර, යම් දෙශයෙක්හි; විද්වජ්ජනඃ, පණ්ඩිතයෙක්; නාස්ති, නැත්තේද; තත්‍ර, ඒ දෙශයෙහි, අල්පධීඃ අපි, නුගත් තැනැත්තේද; ශ්ලාඝ්‍යඃ, පූජ්‍යවේ. නිරස්තපාදපෙ, වෘක්ෂනැත්තාවූ; දෙශෙ, දෙශයෙහි; එරණ්ඩඃ අපි, එරඬු වෘක්ෂයද; ද්‍රුමායතෙ, වෘක්ෂයක්මෙන්වේ.

උතුම් සිත්ඇත්තවුන්ට පොළෝතලයෙහි සියල්ලන්ම තමාගේ ගොත්‍රයෙහි ජනයන් සමානබව.

110 අයං නිජඃ පරො වෙති ගණනා ලඝුචෙතසාම්

උදාරචරිතානාන්තු වසුධෛව කුටුම්බකම්.

අයම්, මේතෙම; නිජඃ, තමා සන්තකය; වා, නොහොත්; පරොඉති, අනිකෙකැයි; ගණනා, ගණන්ගැණීම; ලඝුචෙතසාම්, සැහැල්ලු කල්පනාඇත්තවුන්ගේවේ. උදාරචරිතානාංතු, මහත් අදහස් ඇත්තවුන්ගේ වනාහි; වසුධාඑව, පොළොවම; කුටුම්බකම්, කුලය සමානවේ.

කිසිවකුටවත් කිසිවෙක් මිත්‍රනොවනබවහා අමිත්‍රනොවනබව.

111 න කශ්චිත් කස්‍යචින්මිත්‍රං න කශ්චිත් කස්‍යචිද්රිපුඃ

ව්‍යවහාරෙණ මිත්‍රාණි ජායන්තෙ රිපවස්තථා.

කස්‍යචිත්, කිසිවෙකුට නමුදු; මිත්‍රං, මිත්‍රවූ; කශ්චිත්න, කිසිවෙක් නැත්තේය. කස්‍යචිත්, කිසිවෙකුටද; රිපුඃ, සතුරුවූ; කශ්චිත්න, කිසිවෙක් නැත්තේය. ව්‍යවහාරෙණ, ව්‍යවහාරය කරණකොටගෙණ මිත්‍රාණි, මිත්‍රයෝ; ජායන්තෙ, ඇතිවෙත්. රිපවඃ, සතුරෝද; තථා, එසේමැයි,

මි ත්‍රා දී හු සෙ වි ය යු තු බ ව.

112 ආපත්සු මිත්‍රං ජානීයාද් යුද්ධෙ ශූරමෘණෙ ශුචිං

භාර්‍ය්‍යාං ක්ෂීණෙෂු විත්තෙෂු ව්‍යසනෙෂු ච බාන්ධවාන්.

---

* තිරිසනුන්මැරීම පාපයෙක්යයි මේපොතකළ පණ්ඩිතයාගේ ලබ්ධියයි.

ආපත්සු, විපත්තියෙහි; මිත්‍රං, මිත්‍රයාද; යුද්ධෙ, සටනෙහි; ශූරං, දක්ෂයාද; ඍණෙ, ණයදීමෙහි; ශුචිං, පවිත්‍ර පුජ්යාද; විත්තෙෂු ක්ෂීණෙෂු, ධනයක්ෂයවූකල්හි, භාර්‍ය්‍යාං, අඹුවද; ව්‍යසනෙෂු ච, උපද්‍රවයන්හි; බාන්ධවාන්, නෑයන්ද; ජානීයාත්, දන්නේය. හෙවත් සොයන්නේය.

විපත්ති ආදියෙහිදී නොහරණ තැනැත්තන් නෑසන්බව.

113 උත්සවෙ ව්‍යසනෙ චෛව දුර්භික්ෂෙ රාෂ්ට්‍රවිප්ලවෙ
රාජද්වාරෙ ශ්මශානෙ ච යස්තිෂ්ඨති ස බාන්ධවඃ.

උත්සවෙ, විවාහාදියෙහිද; ව්‍යසනෙචඑව, විපත්තියෙහිද; දුර්භික්ෂෙ ආහාරනැති කාලයෙහිද; රාෂ්ට්‍රවිප්ලවෙ, අන්‍යරජුන්ගේ දෙශවලින් භයඇතිකල්හිද; රාජද්වාරෙ, රජගෙය ඉදිරියෙහිද; ශ්මශානෙච, සොහොනෙහිද; යඃ, යමෙක්තෙම; තිෂ්ඨති, සිටීද; සඃ, හෙතෙම; බාන්ධවඃ, නෑවේ.

වැඩකැමැත්තවුන්ගේ කිමලෙස නොපිළිපදින්නවුන්ට
විපත්ති එළවනබව.

114 සුහෘදාං හිතකාමානාං යඃ ශෘණොති න භාෂිතම්
විපත් සන්නිහිතා තස්‍ය ස නරඃ ශත්‍රුනන්දනඃ.

හිතකාමානාම්, වැඩකැමැතිවූ; සුහෘදාං, මිත්‍රයන්ගේ; භාෂිතං, වචනය; යඃ, යමෙක්තෙම; න ශෘණොති, නොඅසාද, තස්‍ය, ඔහට; විපත්, විපත්තිතොමෝ; සන්නිහිතා, එළඹසිටිනිය සඃ නරඃ, ඒ මනුෂ්‍යතෙම; ශත්‍රුනන්දනඃ, සතුරන් සතුටුකරන්නේවේ.

දුර්ජනයන්කෙරෙන් ගුණවතුන්ටද භය එළවනබව,

115 අපරාධො න මෙස්තීති නෛතද් විශ්වාසකාරණම්
විද්‍යතෙ හි නෘශංසෙභ්‍යො භයං ගුණවතාමපි.

මෙ, මාහට; අපරාධඃ, දොෂයෙක්; න අස්තිති, නැත්තේයයි; එතද්, මෙතෙම; විශ්වාසකාරණංන, ඇදහියයුතු කාරණයෙක්නොවේ. නෘශංසෙභ්‍යඃ, කෲරවූ ජනයන්කෙරෙන්; ගුණවතාං අපි, ගුණවතුන්හටද; භයං, භයතෙම; විද්‍යතෙහි, ඇතිවේමය.

ආයුෂගෙවිනු තැනැත්තන්ට අයිතිනොවන කාරණ.

116 දීපනිර්වාණගන්ධඤ්ච සුහෘද්වාක්‍යමරුන්ධතීම්
න ජිඝ්‍රන්ති න ශෘණ්වන්ති න පශ්‍යන්ති ගතායුෂඃ

ගතායුෂඃ, කෙළවරවූ ආයුෂඇති ජනයෝ; දීපනිර්වාණගන්ධං, පහනිවුණු ගඳ; න ජිඝ්‍රන්ති, ආඝ්‍රාණය නොකෙරෙත්. හෙවත් නොදනිත්,

සුහෘත්වාක්‍යංච, මිත්‍රයන්ගේ වචනද; නශෘණොති, නොඅසත්. අරුන්ධතිම්, ඉතාසියුම්වූ අරුන්ධතිනම් තාරකාවද; නපශ්‍යන්ති, නොදකිත්.

දු රු ක ට යු තු මි ත්‍ර යෙ ක්.

117 පරොක්‍ෂෙ කාර්‍ය්‍යහන්තාරං ප්‍රත්‍යක්‍ෂෙ ප්‍රියවාදිනම්
වර්ජ්ජයෙත් තාදෘශං මිත්‍රං විෂකුම්භංපයොමුඛම්.

පරොක්‍ෂෙ, අසම්මුඛයෙහි; කාර්‍ය්‍යහන්තාරං, කටයුතු හානිකරණ සුළුවූ; ප්‍රත්‍යක්‍ෂෙ, සම්මුඛයෙහි; ප්‍රියවාදිනං, ප්‍රියවචන කියන්නාවූ; තාදෘශංමිත්‍රං, එබඳු මිත්‍රයා; විෂකුම්භංපයොමුඛං, ඇතුලත විෂපුරවා මුඛයෙහි කිරිඉසිනලද සැලියක්මෙන්; වර්ජ්ජයෙත්, වැඩකැමැති තැනැත්තේ දුරුකරන්නේය.

ව චා නො ක ට යු ත් තෝ.

118 සංලාපිතානාං මධුරෛර්වචොභි
ර්මිථ්‍යාපචාරෛශ්ච වශීකෘතානාං.
ආශාවතාං ශ්‍රද්ධතාං ච ලොකෙ
කිමර්ත්ථීනාං වඤ්චයිතව්‍යමස්ති,

මධුරෛඃවචොභිඃ, මිහිරි වචනවලින්; සංලාපිතානාං, කථාකරන්නවුන්ගේද; මිථ්‍යාපචාරෛඃ, අවිද්‍යමාන කථාවෙන් සතුටුකිරීම්වලින්; වශීකෘතානාංච, අයිතිකරන්නවුන්ගේද; ආශාවතාං, දීර්ඝවූ තෘෂ්ණා ඇත්තවුන්ගේද; ශ්‍රද්ධතාංච, භක්තිඇත්තවුන්ගේද; අර්ත්ථිනාං, යාචකයන්ගේද; ලොකෙ, ලොකයෙහි; වඤ්චයිතව්‍යංකිං, වචාකටයුතුවූ කුමක්නම්; අස්ති, ඇත්තේද.

ශුබ අදහස්ඇත්තාවූ උපකාරවන්තයාකෙරෙහි අපරාධකරන්නාවූ
තැනැත්තන් පොළොව නූසුලනබව,

119 උපකාරිණි විශ්‍රබ්ධෙ ශුද්ධමතෞ යඃ සමාචරති පාපම්
තං ජනමසත්‍යසන්ධං භගවති වසුධෙ කථං වහසි.

උපකාරිණි, උපකාරඇත්තාවූ; විශ්‍රබ්ධෙ, විශ්වාසකරණලද්දාවූ; ශුද්ධමතෞ, පිරිසිදුවූ අදහස්ඇත්තාකෙරෙහි; යඃ, යමෙක්තෙම; පාපං සමාචරති, අපරාධයක් කෙරේද; භගවතිවසුධෙ, එම්බා පින්වත් මහාපෘථිවිය; අසත්‍යසන්ධං, මිථ්‍යා ගැලපීම් ඇත්තාවූ; තංජනං, ඒ ජනයා; කථංවහසි, කෙසේනම් උසුලසිද.

දුර්ජනයාහා සමග මිත්‍රනොවියයුතුබව.

120 දුර්ජනෙන සමං සඛ්‍යං ප්‍රීතිං චාපි න කාරයෙත්
උෂ්ණො දහති චාඞ්ගාරඃ ශීතඃ කෘෂ්ණායතෙ කරම්.

දුර්ජනෙනසමං, අසත්පුරුෂයාහා සමග; සඛ්‍යං, මිත්‍රභාවයහෝ; ප්‍රීතිංචාපි, සතුටුවීමහෝ; නකාරයෙත්, සැපයැමැති තැනැත්තේ නොකරන්නේය. උෂ්ණඃ අඞ්ගාරඃ, උෂ්ණවූ අඟුරුතෙම; දහති, අතදවා. ශීතඃ ශීතවූ අඟුරුතෙම; කරං, අත; කෘෂ්ණායතෙ, කළුවූවාක්මෙන්කෙරේ.

අ ස ත් පු රු ෂ යා ගේ ස්ව භා ව.

121 ප්‍රාක් පාදයොඃ පතති ඛාදති පෘෂ්ඨමාංසං
කර්ණෙ කලං කිමපි රෞති ශනෛර්විචිත්‍රම්.
ඡිද්‍රං නිරූප්‍ය සහසා ප්‍රවිශත්‍යශංකඃ
සර්වං ඛලස්‍ය චරිතං මශකඃ කරොති,

ප්‍රාක්, ඉදිරියෙහි; පාදයොඃ, පාදෙක සමීපයෙහි; පතති, වැටේ. (අනමුඛයෙහි) පෘෂ්ඨමාංසං, පිටෙහි මාංසය; ඛාදති, කා; විචිත්‍රං, විසිතුරුවූ; කලං, මධුරවූ; කිංඅපි, කිසියම් වචනයක්; ශනෛඃ, සෙමින්; කර්ණෙ, කණෙහි; රෞති, කියා. ඡිද්‍රං, දොෂයක්; නිරූප්‍ය, දැක; අශංකඃ, සැකනැත්තේ; සහසා, වහා; ප්‍රවිශති, වදී. ඛලස්‍ය; දුර්ජනයාගේ; සර්වංචරිතං, සියලු හැසිරීම; මශකඃ, මදුරුතෙම; කරොති, කෙරේ.

දුර්ජනතෙම ප්‍රියවචන කියතුයේද විශ්වාසනොකටයුතුබව,

122 දුර්ජනඃ ප්‍රියවාදී ච නෛතත් විශ්වාසකාරණම්
මධු තිෂ්ඨති ජිහ්වාග්‍රෙ හෘදි හාලාහලං විෂම්.

දුර්ජනඃ, දුර්ජනතෙම; ප්‍රියවාදීච, ප්‍රියවචනකියන සුලුවූයේද; එතත්, මේතෙම; විශ්වාසකාරණම්න, ඇදහියයුතු කාරණයෙක්නොවේ. ජිහ්වාග්‍රෙ, දිව්අගෙහි; මධුතිෂ්ඨති, මීතෙම පවතී. තස්‍ය, ඔහුගේ; හෘදි, සිතෙහි; හාලාහලම්, කෲරවූ; විෂම්, විසපවතී.

ඉතා මහත් සුචරිත දුශ්චරිතදෙක්හි විපාකය මේලොකයෙහිදී
වි ඳි න බ ව.

123 ත්‍රිභිර්වර්ෂෛස්ත්‍රිභිර්මාසෛස්ත්‍රිභිඃ පක්ෂෛස්ත්‍රිභිර්දිනෛඃ
අත්‍යුත්කටෛඃ පාපපුණ්‍යෛරිහෛව ඵලමශ්නුතෙ.

අත්‍යුත්කටෛඃ, ඉතා මහත්වූ; පාපපුණ්‍යෛඃ, දුශ්චරිත සුචරිතවලින්; ත්‍රිභිඃ වර්ෂෛඃ; තුන්අවුරුද්දෙකින්හෝ; ත්‍රිභිඃමාසෛඃ, තුන්මාසයෙ

කින්හෝ; ත්‍රිභිඃපක්‍ෂෛඃ, පක්‍ෂතුනෙකින්හෝ; ත්‍රිභිඃදිනෛඃ, දිනතුනෙකින්හෝ; ඉහෛව, මේ ආත්මයෙහිදීම; ඵලම් අශ්නුතෙ, ඵල අනුභව කෙරේ.

124 භක්‍ෂිතෙනාපි භවතා නාහාරෙ මම පුෂ්කලඃ
ත්වයි ජීවති ජීවාමි චිත්‍රග්‍රීව ඉවානඝ.

භක්‍ෂිතෙනඅපි, අනුභවකරණලද්දුවූද; භවතා, පින්වතා කාරණකොටගෙණ; ආහාරඃ, ආහාරයතෙම; මම, මාගේ; පුෂ්කලඃන, තෘප්තිකරන්න්නොවේ. අනඝ, එම්බානිෂ්පාපිවූ පණ්ඩිතය, චිත්‍රග්‍රීවඃඉව; චිත්‍රග්‍රීවයාමෙන්. ත්වයිජීවති, තා ජීවත්වනකල්හි, ජීවාමි, ජීවත්වෙමි.

සුචරිතයෙහි යෙදෙන්නාවූ තිරිසනුන්ගේද විශ්වාසය දක්නාලද්දේය.

125 තිරශ්චාමපි විශ්වාසො දෘෂ්ටඃ පුණ්‍යෛකකර්මණාම්,
සතාං හි සාධුශීලත්වාත් ත්වච්චිත්‍රග්‍රීවයොරිව;

ත්වච්චිත්‍රග්‍රීවයොඃ ඉව, තාහාචිත්‍රග්‍රීවදෙදෙනාගේමෙන්; සතාංහි, සත්පුරුෂයන්ගේ වනාහි; සාධුශීලත්වාත්, මනා ස්වභාඇතිබැවින්; පුණ්‍යඑකකර්මණාං, එකම සුචරිතක්‍රියාවෙහි යෙදෙන්නාවූ; තිරශ්චාංඅපි, තිරිසනුන්ගේපවා, විශ්වාසඃ; විශ්වාසයතෙම, දෘෂ්ටඃ; දක්නාලද්දේය.

කිපුනුකල්හිද සත්පුරුෂයාගේ සිත වෙනස්නොවනබව.

126 සාධොඃ ප්‍රකොපිතස්‍යාපි මනො නායාති වික්‍රියාම්,
නහි තාපයිතුං ශක්‍යං සාගරම්භස්තෘණොල්කයා;

ප්‍රකොපිතස්‍ය අපි, කිපුනාවූද; සාධොඃ, සත්පුරුෂයාගේ; මනඃ, චිත්තයතෙම; වික්‍රියාම්, පෙරළීමකට; නආයාති, නොපැමිණේ. සාගරම්භඃ, සමුද්‍රයෙහි ජලයතෙම; තෘණඋල්කයා, තණසුලෙකින්; තාපයිතුං, රත්කරන්ට; නහිශක්‍යං, නුපුලුවනි.

දුර්ජනයාහා සමගමිත්‍රවීම නුසුදුසුබව.

127 මාර්ජාරො මහිෂො මෙෂඃ කාකඃ කාපුරුෂස්තථා;
විශ්වාසාත් ප්‍රභවන්ත්‍යෙතෙ විශ්වාසස්තත්‍ර නොචිතඃ;

මාර්ජාරඃ, බළලාද; මහිෂඃ, මීවාද; මෙෂඃ, එළුවාද; කාකඃ, කාව්ඩාද තථා, එසේම; කාපුරුෂඃ, අසත්පුරුෂයාද යන; එතෙ, මොහු; විශ්වාසාත්, විශ්වාසභාවයෙන්; ප්‍රභවන්ති, වෙද්ද; තත්‍ර, ඔහුනොකෙරෙහි; විශ්වාසඃ, විශ්වාසයතෙම; නොචිතඃ, වැඩක්නොවේ.

මහාවැලඳගැණිම් ඇත්තාවූද සතුරහාසමග සන්ධි නොකටයුතුබව.

128 ශත්‍රුණා නහි සන්දධ්‍යාත් සුශ්ලිෂ්ටෙනාපි සන්ධිනා,
සුතප්තමපි පානීයං ශමයත්‍යෙව පාවකම්;

සන්ධිනා, මිත්‍රභාවයඇත්තාවූ; සුශ්ලිෂ්ටෙනඅපි, මහාකොට වැලඳගත්තාවූද; ශත්‍රුණා, සතුරහාසමග; නහිසන්දධ්‍යාත්, නොගැළපෙන්නේය. සුතප්තං අපි, බොහෝසේරත්කරණලද්දාවූද; පානීයම්, ජලය තෙම; පාවකම්, ගින්න; ශමයතිඑව, නිවාමය.

ශාස්ත්‍රදැනීමෙන් සැරසුනාවූද දුර්ජනයා දුරුකටයුතුබව.

129 දුර්ජනඃ පරිහර්තව්‍යො විද්‍යයාලඞ්කෘතොපි සන්,
මණිනා භූෂිතඃ සර්පඃ කිමසෞ න භයඞ්කරඃ;

විද්‍යයා, ශාස්ත්‍රයෙන්; අලඞ්කෘතඃ අපිසන්, සැරසුනාවූද; දුර්ජනඃ, අසත්පුරුෂතෙම; පරිහර්තව්‍යඃ, දුරුකටයුතුවේ. මණිනා, මාණික්‍යයෙන්; භූෂිතඃ, සරසනලද්දාවූද; අසෞසර්පඃ, මේසර්පතෙම; කිංනභයඞ්කරඃ, කෙසේනම් භය එළවන්නේ නොවේද.

යමක්කළනොහැකිනම් ඒ කිරීම නොහැකිමය යමක් කළහැකිනම්
ඒ කිරීම හැකිමය.

130 යදශක්‍යං න තච්ඡක්‍යං යච්ඡක්‍යං ශක්‍යමෙව තත්,
නොදකෙ ශකටං යාති න ච නෞර්ගච්ඡති ස්ථලෙ;

යත්, යමක්තෙම; අශක්‍යං, කළනොහැකිද; තත්, ඒතෙම; නශක්‍යං කළනොහේ. යත්, යමක්තෙම; ශක්‍යං, කළහැකිද; තත්, ඒතෙම; ශක්‍යං එව, කළහැකිමය. උදකෙ, දියෙහි; ශකටං, ගැලතෙම; නයාති, ගමන්නොකෙරේ. ස්ථලෙ, ගොඩතැන්හි; නෞඃ, නැවතොමෝ; නගච්ඡති, නොයා

මහත්වූධනය හෙතුකොටගෙණද සතුරකෙරෙහිත් නොඇළුනාවූ
ස්ත්‍රියකෙරෙහිත් විශ්වාසකිරීම මරණයට කාරණයක්බව.

131 මහතාප්‍යර්ථසාරෙණ යො විශ්වසිති ශත්‍රුෂු,
භාර්‍ය්‍යාසු ච විරක්තාසු තදන්තං තස්‍ය ජීවනම්;

මහතා, මහත්වූ; අර්ථසාරෙණඅපි, ධනබලයහෙතුකොටගෙණද; ශත්‍රුෂු, සතුරන්කෙරෙහිද; විරක්තාසු, ඇළුම්නැත්තාවූ; භාර්‍ය්‍යාසුච, අඹුවන්කෙරෙහිද; යඃ, යමෙක්තෙම; විශ්වසිති, විශ්වාසකෙරේද; තස්‍ය, ඔහුගේ; ජීවනං, ජීවත්වීමතෙම; තත්අන්තං, ඒකාරණය කෙළවරකොට ඇත්තේය.

අසත්පුරුෂයාගේ මිත්‍රභාවය මැටිකලයක්මෙන් වහාබිඳේ, පසුව
මිත්‍රකිරීමද නොහැකිවේ. සත්පුරුෂයාගේ මිත්‍රභාවය
රන්කලයක්මෙන් නොබිඳී පවතී, බිඳුනේද
ගැළපීම හැකිවේ.

132 මෘද්ඝටවත් සුඛභෙද්‍යො දුඃසන්ධානශ්ච දුර්ජනො භවති,
සුජනස්තු කනකඝටවත් දුර්භෙද්‍යශ්චාශු සන්ධෙයඃ;

දුර්ජනඃ, අසත්පුරුෂතෙම; මෘත්ඝටවත්, මැටිකලයක්මෙන්; සුඛභෙද්‍යඃ, සුවසේ බිඳියහැකිවේ. දුඃසන්ධානඃච භවති, මිත්‍රකිරීමද නොහැකිවේ සුජනස්තු, සත්පුරුෂයාවනාහි; කනකඝටවත්, රන්කලයක්මෙන්; දුර්භෙද්‍යඃ, බිඳියනොහේ. ආශු, වහා; සන්ධෙයඃච, මිත්‍රකළ යුතුදවේ.

භයහා ලොභයහෙතුකොටගෙණ අඥානයන්ගේද, දැකීමෙන්
සත්පුරුෂයන්ගේද මිත්‍රභාවය වීමාදිය.

133 ද්‍රවත්වාත් සර්වලොහානාං නිමිත්තාන්මෘගපක්ෂිණාම්,
භයාල්ලොභාච්ච මූර්ඛාණාං සඞ්ගතං දර්ශනාත් සතාම්;

සර්වලොහානාං, සියලු ලොහවර්ගයන්ගේ; ද්‍රවත්වාත්, වැගිරෙණබව හෙතුකොටගෙණද; මෘගපක්ෂිණාම්, සිව්පාපක්ෂීන්ගේ; නිමිත්තාත්, කිසිකාරණයක් හෙතුකොටගෙණද; මූර්ඛාණාම්, නුවණනැත්තවුන්ගේ; භයාත්, භයහෙතුකොටගෙණද; ලොභාත්ච, ලොභයහෙතුකොටගෙණද; සතාම්, සත්පුරුෂයන්ගේ; දර්ශනාත්, දැකීම හෙතුකොටගෙණද; සංගතම්, ඇලීමවේ.

සත්පුරුෂයෝ නාළිකෙරඵලමෙන් ඇතුලත මෙලෙක්වෙත්. දුර්ජනයෝ
ඩෙබරඵලමෙන් පිටතම සිත්කලුවෙත් ඇතුලත රළුවෙත්.

134 නාරිකෙලසමාකාරා දෘශ්‍යන්තෙපි හි සජ්ජනාඃ,
අන්‍යෙ බදරිකාකාරා බහිරෙව මනොහරාඃ;

සජ්ජනාඃ, සත්පුරුෂයෝ; නාරිකෙලසමාකාරාඃ, නාළිකෙර ඵලහා සමානවූවාහු; දෘශ්‍යන්තෙ, දක්නාලැබෙත්. අන්‍යෙ, සෙසුඅසත්පුරුෂයෝ; බදරිකාකාරාඃ, ඩෙබරඵලහා සමානවූවාහුයි. බහිඃඑව, පිටතම; මනොහරාඃහි, සිත්කලුවෙත්මැයි.

ප්‍රේමය නැඩවූකල්හිද සත්පුරුෂයන්ගේ ගුණ වෙනස්නොවනබව.

135 ස්නෙහච්ඡෙදෙපි සාධූනාං ගුණා නායාන්ති වික්‍රියාම්,
භඞ්ගෙනාපි මෘණාලානාමනුබධ්නන්ති තන්තවඃ;

ස්නෙහච්ඡෙදෙපි, ප්‍රේමය සිඳුනුකල්හිද; සාධූනාං, සත්පුරුෂයන්ගේ; ගුණාඃ, ගුණයෝ; වික්‍රියාං, වෙනසකට; නායාන්ති, නොයෙත්. මෘණාලානාං, නෙළුම්දඬුහුගේ; භඞ්ගෙපි, බිඳීමකරණකොටගෙණද; තන්තවඃ, නූල්හෙවත් සූත්‍රයෝ; අනුබධ්නන්ති, නොහැර බැඳිසිටිත්.

මිත්‍රයන්ට ඇතිවියයුතුගුණ.

136 ශුචිත්වං ත්‍යාගිතා ශෞර්‍ය්‍යං සමානං සුඛදුඃඛයොඃ,
දාක්ෂිණ්‍යං චානුරක්තිශ්ච සත්‍යතා ච සුහෘද්ගුණාඃ;

ශුචිත්වං, පිරිසිදුබවද; ත්‍යාගිතා, දෙනසුලුබවද; ශෞර්‍ය්‍යං, ශූරභාවයහෙවත් වීර්‍ය්‍යයද; සුඛදුඃඛයොඃ, සැපදුක්දෙක්හි; සමානං, සමානබවද; දාක්ෂිණ්‍යංච, අනුකූලහෙවත් එකඟබවද; අනුරක්තිඃච, ඇල්මද; සත්‍යතාච, සැබෑකියනබවද යනමොහු; සුහෘත්ගුණාඃ, මිත්‍රයන්ගේ ගුණයෝවෙත්.

සත්පුරුෂයාවිසින් ප්‍රීතියෙන් කියනලද කථාවෙහි උතුම්බව.

137 ඝර්මාර්ත්තිං න තථා සුශීතලජලෛඃ ස්නානං න මුක්තාවලී,
න ශ්‍රීඛණ්ඩවිලෙපනං සුඛයති ප්‍රත්‍යඞ්ගමප්‍යර්පිතම්,
ප්‍රීත්‍යෛ සජ්ජනභාෂිතං ප්‍රභවති ප්‍රායො යථා චෙතසඃ
සද්‍යුක්ත්‍යා ච පරිෂ්කෘතං සුකෘතිනාමාකෘෂ්ටිමන්ත්‍රොපමම්;

සුකෘතිනාම්, පින්ඇත්තවුන්ගේ; ආකෘෂ්ටිමන්ත්‍රොපමං, තමාකරා සිත්අදනාමන්ත්‍රයක් බඳුවූ; සද්‍යුක්ත්‍යාච, මනාකාරණයෙන්ද; පරිෂ්කෘතං, සරසනලද්දාවූ; සජ්ජනභාෂිතං, සත්පුරුෂයාවිසින් කියනලද්දාවූ වචනය; චෙතසඃ, චිත්තයාගේ; ප්‍රායඃ, බොහෝසේ; ප්‍රීත්‍යෛ, ප්‍රීතිය පිණිස. යථාප්‍රභවති, යම්පරිද්දෙකින්වේද; ඝර්මාර්ත්තිං, දාහයෙන් පිඩිතයන්හු; සුශීත ලජලෛඃ, මනාසිහිල්දියවලින්; ස්නානං, නෑමද; මුක්තාවලී, මුතුමාලාවද; ප්‍රත්‍යඞ්ගං, සකලශරීරයෙහි; අර්පිතංඅපි, ගල්වනලද්දාවූද; ශ්‍රීඛණ්ඩවිලෙපනං, සඳුන්කල්ක ආලෙපයද; තථා, එපරිද්දෙන්; නසුඛයති, සැපඇතිනොකෙරේ.

මිත්‍රයාගේ කෙලෙසීමට කරුණු.

138 රහස්‍යභෙදො යාච්ඤා ච නෛෂ්ඨුර්‍ය්‍යං චලචිත්තතා,
ක්‍රොධො නිඃසත්‍යතා ද්‍යූතමෙතන්මිත්‍රස්‍ය දූෂණම්,

රහස්‍යභෙදඃ, රහස්කටයුතුකාරණයාගේ බිඳීමද; යාච්ඤාච, ඉල්වීමද; නෛෂ්ඨුර්‍ය්‍යං, කෲරබවද; චලචිත්තතා, චපලවූ සිත්ඇතිබවද; ක්‍රොධඃ, කිපීමද; නිඃසත්‍යතා, බොරුකියනබවද; ද්‍යූතම්, දූකෙළිද යනා; එතත්, මේතෙම; මිත්‍රස්‍ය, මිත්‍රයාගේ; දූෂණම්, කිලිටිවීමට කරුණුයි.

දක්ෂබවහා සත්‍යවාදිබවද යන දෙක කථාවෙහි යෙදීමෙන්ද, දැඩිබවහා
චංචල නොවනබවද යන දෙක දැකීමෙන්ද
ද ත හැ කි බ ව.

139 පටුත්වං සත්‍යවාදිත්වං කථායොගෙන බුධ්‍යතෙ
අස්තබ්ධත්වමචාපල්‍යං ප්‍රත්‍යක්ෂේණාවගම්‍යතෙ.

පටුත්වං, දක්ෂබවද; සත්‍යවාදිත්වං, සැබෑවචනඇතිබවද; කථායොගෙන, කථාවෙහි යෙදීමෙන්; බුධ්‍යතෙ, දත්නාලැබේ. අස්තබ්ධත්වං, දැඩිනොවන බවද; අචාපල්‍යං, නොවිමසා ක්‍රියානොකරණබවද; ප්‍රත්‍යක්ෂේණ, දැකීමෙන්; අවගම්‍යතෙ, දත්නාලැබේ.

මොලොක්වූ පිරිසිදු සිත් ඇත්තාහුගේ මිත්‍රභාවය අන් ප්‍රකාරයෙක්මය
කෛරවිකයන්ගේ වචනයෙහි පමණක් මිත්‍රභාවය
ප ව ති ය න බ ව.

140 අන්‍යදෙව හි සෞහාර්දං භවෙත් ස්වච්ඡාන්තරාත්මනඃ
ප්‍රවර්තීතෙන්‍යථා වාණී ශාඨ්‍යොපහතචෙතසඃ.

ස්වච්ඡාන්තරාත්මනඃ, පිරිසිදු සිත්ඇත්තහුගේ; සෞහාර්දං, මිත්‍රභාවය; අන්‍යථා එවහි, අන්‍ය ප්‍රකාරයෙකින්ම; භවෙත්, වන්නේය. ශාඨ්‍යොපහතචෙතසඃ, වඤ්චාභාවයෙන් මඩනාලද සිත් ඇත්තහුගේ; වාණී, වචනයතොමෝ; අන්‍යථා, අන්පරිද්දෙකින්; ප්‍රවර්ත්තතෙ, පවතී.

දුර්ජනයන්ගේ සිත්හි අනිකක වචනයෙහි අනිකක යනාදීන්
ඔවුන්ගේ ස්වභාවයහා සත්පුරුෂයන්ගේ
ස්ව භා ව ය ත්.

141 මනස්‍යන්‍යද්වචස්‍යන්‍යත් කායෙ චාන්‍යද්දුරාත්මනාම්
මනස්‍යෙකං වචස්‍යෙකං කර්මණ්‍යෙකං මහාත්මනාම්.

දුරාත්මනාම්, චාසිත් ඇත්තවුන්ගේ; මනසි, සිත්හි; අන්‍යත්, අනිකෙකි. වචසි, වචනයෙහි; අන්‍යත්, අනිකෙකි; කායෙ ච, ක්‍රියාවෙහිද; අන්‍යත්, අනිකෙක්; මහාත්මනාම්, උතුම් අදහස් ඇත්තවුන්ගේ; මනසි, සිත්හි; එකං, එකක්මය; වචසි, කීමෙහි; එකං, එකමය; කර්මණි, ක්‍රියාවෙහි; එකං, එකමය.

තමාගේ ඉඩමෙන් නොයායුතුබව.

142 ස්ථානභ්‍රෂ්ටා න ශොභන්තෙ දන්තාඃ කෙශා නඛා නරාඃ
ඉති විඥාය මතිමාන් ස්වස්ථානං න පරිත්‍යජෙත්.

ස්ථානභ්‍රෂ්ටාඃ, තමාගේ ඉඩමෙන් අන්තැනකට පැමිණියාවූ; දන්තාඃ, දත්ද; කෙශාඃ, කෙශයෝද; නඛාඃ, නියද; නරාඃ, මනුෂ්‍යයෝද; න

ශොභනෙහ, බබලන්නාහු නොවෙත්; ඉති, මේ කාරණය; විඥය, දැන; මතිමාන්, නුවණැති පුරුෂතෙම; ස්වස්ථානං, තමාගේ ස්ථානය; නපරිත්‍යජෙත්, නොහරණේය.

අලස පුරුෂයන් තමාගේ දෙශයෙහිම මියයනබවආදිය.

143 ස්ථානමුත්සෘජ්‍ය ගච්ඡන්ති සිංහාඃ සත්පුරුෂා ගජාඃ
තත්‍රෛව නිධනං යාන්ති කාකාඃ කාපුරුෂා මෘගාඃ.

සිංහාඃ, සිංහයෝද; සත්පුරුෂාඃ, සත්පුරුෂයෝද; ගජාඃ, හස්තීහුද; ස්ථානම්, තමාගේ ඉඩම; උත්සෘජ්‍ය, හැර; ගච්ඡන්ති, යෙත්. කාකාඃ, කවුඩෝද; කාපුරුෂාඃ, අලසපුරුෂයෝද; මෘගාඃ, මුවෝද; තත්‍රෛව, එහිම; නිධනංයාන්ති, මරණයට පැමිණෙත්.

පණ්ඩිතයාට ස්වකීය රටය අන්‍යරටයයි විශෙෂයක් නැතිව සියලුතැන් හි ගෞරව ලැබෙණබව.

144 කො වීරස්‍ය මනස්විනඃ ස්වවිෂයඃ කො වා විදෙශඃ ස්මෘතඃ
යං දෙශං ශ්‍රයතෙ තමෙව කුරුතෙ බාහුප්‍රතාපාර්ජිතම්.
යද්දංෂ්ට්‍රානඛලාංගුලප්‍රහරණඃ සිංහො වනං ගාහතෙ
තස්මින්නෙව හතද්විපෙන්ද්‍රරුධිරෛඃ තෘෂ්ණාං ඡිනත්ත්‍යාත්මනඃ.

වීරස්‍ය, ශූරවූ; මනස්විනඃ, පණ්ඩිතයාහට; ස්වවිෂයඃ, තමාගේ දෙශයක්නම්; කඃ, කුමක්ද; විදෙශඃවා, අන්‍යදෙශයෙක්හෝ; කඃස්මෘතඃ, කුමක්නම් දන්නාලද්දේද; යංදෙශම්, යම්රටක්; ශ්‍රයතෙ, ආශ්‍රයකෙරේද; තංඑව, ඒ දෙශයම; බාහු ප්‍රතාපාර්ජිතම්, හස්තතෙජසින් තමාට අයිතිකිරීම; කුරුතෙ, කෙරේ· දංෂ්ට්‍රා, දත්ද; නඛ, නියද; ලාංගුල, නගුටද; ප්‍රහරණඃ, ආයුධකොටඇති; සිංහඃ, සිංහයෙක්; යත්වනම්, යම් වනයක්; ගාහතෙ, අලලාද; තස්මිංඑව, ඒ වනයෙහිම; හතද්විපෙන්ද්‍රරුධිරෛඃ, නසනලද ඇතුන්ගේ ලෙහෙවලින්; ආත්මනඃ, තමාගේ; තෘෂ්ණාම්, පිපාසය, ඡිනත්ති, සිඳී·

අන්‍ය ස්ථානයක් නොබලා පළමු ස්ථානය නොහළ යුතුය යනබව.

145 චලත්‍යෙකෙන පාදෙන තිෂ්ඨත්‍යෙකෙන බුද්ධිමාන්
නාසමීක්ෂ්‍ය පරං ස්ථානං පූර්වමායතනං ත්‍යජෙත්·

බුද්ධිමාන්, නුවණැති තැනැත්තේ; එකෙනපාදෙන, එක් පාදයෙකින්; චලති, යේද; ඒකෙන, එක් පාදයෙකින්; තිෂ්ඨති, සිටීද; පරම්ස්ථානම්, අන්‍යස්ථානයක්; අසමීක්ෂ්‍ය, නොබලා; පූර්වම්ආයතනම්, පළමු ස්ථානය; නත්‍යජෙත්, නොහරණේය.

## අනුන්ගේ අවවාදය ඇතිකල්හි පණ්ඩිතවීම පහසුබව.

146 පරොපදෙශෙ පාණ්ඩිත්‍යං සර්වේෂාං සුකරං නෘණාම්
ධර්මේ ස්වීයමනුෂ්ඨානං කස්‍යචිත් තු මහාත්මනඃ.

පරොපදෙශෙ, අනුන්ගේ ගුරුකම් ඇතිකල්හි; පාණ්ඩිත්‍යම්, පණ්ඩිතභාවය; සර්වේෂාංනෘණාම්, සියලු මිනිසුන්ටම; සුකරම්, පහසුයි. ධර්මේ, සුචරිතක්‍රියාවෙහි; ස්වීයම්, තමාට අයිතිවූ; අනුෂ්ඨානම්, ආරම්භයතෙම; කස්‍යචිත් මහාත්මනඃතු, කිසියම් උතුම් අදහස් ඇත්තෙකුට වනාහිවේ.

## රට හැරයාමට සුදුසුකරුණු.

147 යස්මින් දෙශෙ න සම්මානො න වෘත්තිර් ච බාන්ධවාඃ
න ච විද්‍යාගමඃ කශ්චිත් තං දෙශං පරිවර්ජයෙත්.

යස්මිංදෙශෙ, යම් රටෙක්හි; නසම්මානඃ, ගෞරව නැත්තේද; නවෘත්තිඃ, ජීවිකාව කිරීමට කරුණු නැත්තේද; බාන්ධවාඃ, නෑයෝ; නච, නැත්තාහුද; කශ්චිත් විද්‍යාගමඃ, කිසි ශාස්ත්‍ර ඉගණීමෙක්; නච, නැත්තේද; තංදෙශම්, ඒරට; පරිවර්ජයෙත්, හරණේය.

## විසීමට නුසුදුසු ප්‍රදෙශ.

148 ධනිකඃ ශ්‍රොත්‍රියො රාජා නදී වෛද්‍යස්තු පඤ්චමඃ
පඤ්ච යත්‍ර න විද්‍යන්තෙ තත්‍ර වාසං න කාරයෙත්.

ධනිකඃ, ධනවත්තයෙක්ද; ශ්‍රොත්‍රියඃ, අංගසහිතවූවෙද උගත්වන බ්‍රාහ්මණයෙක්ද; රාජා, රජෙක්ද; නදී, ගංගාවක්ද; පඤ්චමඃ, පස්වෙනිවූ; වෛද්‍යඃතු, වෙදෙක්ද යනමේ; පඤ්ච, පස; යත්‍රනවිද්‍යන්තෙ, යම් රටෙක්හි නැත්තාහුද; තත්‍ර, ඒරටෙහි; වාසංනකාරයෙත්, විසීම නොකරන්නේය.

149 ලොකයාත්‍රා භයං ලජ්ජා දාක්ෂිණ්‍යං ත්‍යාගශීලතා
පඤ්ච යත්‍ර න විද්‍යන්තෙ න කුර්‍ය්‍යාත් තත්‍ර සංස්ථිතිම්.

ලොකයාත්‍රා, ශරීරය උසුලන්නාවූ ජීවිකාවද; භයං, භයද; ලජ්ජා, ලජ්ජාවද; දාක්ෂිණ්‍යං, අනුකූලබවද; ත්‍යාගශීලතා, ලොභනොවන ස්වභාවයදයන; පඤ්ච, පස; යත්‍ර, යම්තැනෙක්හි; නවිද්‍යන්තෙ, නැත්තාහුද; තත්‍ර, එහි; සංස්ථිතිම්, විසීම; නකුර්‍ය්‍යාත්, නොකරන්නේය.

150 තත්‍ර මිත්‍ර න වස්තව්‍යං යත්‍ර නාස්ති චතුෂ්ටයම්
ඍණදාතා ච වෛද්‍යශ්ච ශ්‍රොත්‍රියඃ සජලා නදී.

මිත්‍ර, මිත්‍රය; ඍණදාතාච, ණයදෙනතැනැත්තෙක්ද; වෛද්‍යඃච, වෙදහුද; ශ්‍රොත්‍රියඃ, අංගසහිතවූ වෙදඋගත්වන්නෙක්ද; සජලානදී, දියසහිත නදියක්දයන; චතුෂ්ටයම්, සතර; යත්‍රනාස්ති, යම්තැනෙක නැත්තාහුද; තත්‍ර, ඒ දෙශයෙහි; නවස්තව්‍යං, නොවිසියයුතු.

## ආගන්තුකයන්ට සත්කාර කටයුතුබව.

151 ගුරුරග්නිර්විජාතීනාං වර්ණානාං බ්‍රාහ්මණො ගුරුඃ
පතිරෙකො ගුරුඃ ස්ත්‍රීණාං සර්වත්‍රාභ්‍යාගතො ගුරුඃ.

විජාතීනාං, බ්‍රාහ්මණජාතිඇත්තවුන්ට; අග්නිඃ, ගිනිතෙම; ගුරුඃ, උතුම්වේ. වර්ණානාම්, ගොත්‍රයන්ට; බ්‍රාහ්මණඃ, බමුණුතෙම; ගුරුඃ, උතුම්වේ. ස්ත්‍රීනාම්, ස්ත්‍රීන්ට; පතිඃ, ස්වාමිතෙම; එකඃගුරුඃ, එකම උත්තමයෙක්වේ, අභ්‍යාගතඃ, තමාකරා පැමිණියාවූ ආගන්තුකතෙම; සර්වත්‍ර, සැමතැන්හි, ගුරුඃ, උතුම්වේ.

152 උත්තමස්‍යාපි වර්ණස්‍ය නීචොපි ගෘහමාගතඃ
පූජනීයො යථායොග්‍යං සර්වදෙවමයොතිථිඃ.

උත්තමස්‍ය, උතුම්වූ; වර්ණස්‍යඅපි, කුලඇතිවෙකුගේද; ගෘහං, ගෙය කරා; ආගතඃ, පැමිණියාවූ; නීචඃඅපි, අධම කුලඇත්තෙක්නමුදු; යථායොග්‍යම්, සුදුසු පරිද්දෙන්; පූජනීයඃ, පිදියයුතුය. අතිථිඃ, ආගන්තුකතෙම; සර්වදෙවමයඃ, සියලු උතුම්දෙයින් කරණලද්දේය.

## නිරන්තරයෙන් ඇළුම්ඇත්තාහුගේ ලකුණු.

153 මුඛං ප්‍රසන්නං විමලා ච දෘෂ්ටිඃ කථානුරාගො මධුර ච වාණී
ස්නෙහොධිකං සම්භ්‍රමදර්ශනඤ්ච සදානුරක්තස්‍ය ජනස්‍ය
ලක්‍ෂ්ම.

ප්‍රසන්නංමුඛම්, ප්‍රසන්නවූමුඛයද; විමලාදෘෂ්ටිඃච, නිර්මලවූ බැලීමද; කථාඅනුරාගඃ, කථාවෙහි ඇලීමද; මධුරවවාණී, මිහිරිවචනයද; අධිකංස්නෙහඃ, මහත්වූ ඇලීමද; සම්භ්‍රමදර්ශනඤ්ච, වේගවත්වබැලීමද; සදාඅනුරක්තස්‍ය, හැමකල්හිඇළුම්ඇත්තාවූ; ජනස්‍ය, ජනයාගේ; ලක්‍ෂ්ම. ලකුණුයි.

## ප්‍රියනැත්තාගේ ලකුණු.

154 අදෘෂ්ටිදානං කෘතපූර්වනාශනං අමානනං දුශ්චරිතානුකීර්තනම්
කථාප්‍රසඞ්ගෙන ච නාමවිස්මෘතිර්විරක්තභාවස්‍ය ජනස්‍ය
ලක්‍ෂණම්.

අදෘෂ්ටිදානං, ඉවතබැලීමද; කෘතපූර්වනාශනම්, පළමු කළදෙය නැතිකිරීමද; අමානනං, අගෞරවයද; දුශ්චරිතානුකීර්තනම්, නොකටයුතුක්‍රියාවන් විස්තරකිරීමද; කථාප්‍රසඞ්ගෙනච, කථාවෙහි යෙදීමෙන්ද; නාමවිස්මෘතිඃ, නම සිහිනැතිවීමදයන මොහු; විරක්තභාවස්‍ය, නොඇළුනාවූ අදහස්ඇත්තාවූ; ජනස්‍ය, මනුෂ්‍යයාගේ; ලක්‍ෂණම්, ලකුණුයි.

වයොවෘද්ධයා කෙරෙහි තරුණවූ අඹුවගේ සිත් නොඇලෙන බව.

155 ශශිනිව හිමාර්තානාං ඝර්මාර්තානාං රවාවිව
මනො න රමතෙ ස්ත්‍රීණාං ජරාජීර්ණේන්ද්‍රියෙ පතෞ.

හිමාර්තානාං, ශීතයෙන් පීඩිතයන්ගේ; ශශිනි ඉව, සඳකෙරෙහිමෙන්ද; ඝර්මාර්තානාං, දහයෙන් පීඩිතයන්ගේ; රවෞ ඉව, ඉරුකෙරෙහිමෙන්ද; ජරාජීර්ණ ඉන්ද්‍රියෙ, ජරාවෙන් දිරණලද ඉන්ද්‍රියයන් ඇත්තාවූ; පතෞ, ස්වාමියා කෙරෙහි; ස්ත්‍රීනාං, ස්ත්‍රීන්ගේ; මනොනරමතෙ, සිත නොඇලේ.

156 පලිතෙෂ්වපි දෘෂ්ටෙෂු පුංසඃ කා නාම කාමිතා,
භෛෂජ්‍යමිව මන්‍යන්තෙ යදන්‍යමනසඃ ස්ත්‍රියඃ.

අන්‍යමනසඃ, අන්‍යසිත් ඇත්තාවූ; ස්ත්‍රියඃ, ස්ත්‍රීහු; භෛෂජ්‍යම් ඉව, බෙහෙතක්මෙන්; යත්, යම්කාරණයෙකින්; මන්‍යන්තෙ, සිතත්ද එහෙයින්; පුංසඃ, පුරුෂයාගේ; පලිතෙෂු දෘෂ්ටෙෂු අපි, දක්නාලද පැසුනාවූ ඉසරැවුල්ඇතිකල්හිද; කාමිතා, මෛථුනය කැමතිබවනම්, කානාම, කුමක්ද.

මහල්ලාවිසින් තරුණභාර්‍ය්‍යාව උතුම්කොට සලකනබව.

157 ධනාශා ජීවිතාශා ච ගුර්වී ප්‍රාණභෘතාං සදා
වෘද්ධස්‍ය තරුණී භාර්‍ය්‍යා ප්‍රාණෙභ්‍යොපි ගරීයසී.

ප්‍රාණභෘතාං, මිනිසුන්ගේ; ධනාශා, ධනයෙහි ඇලීමද; ජීවිතාශාච, ජීවිතයෙහි ආශාවද; සදා, හැමකල්හි; ගුර්වී, බලවත්වන්නීය. වෘද්ධස්‍ය මහල්ලාහට; තරුණී භාර්‍ය්‍යා, තරුණවූ අවස්ථාවෙහිසිටි අඹුතොමෝ; ප්‍රාණෙභ්‍යඃ අපි, ජීවිතවලටදවඩා; ගරීයසී, අතිශයින් උතුම්වන්නීය.

මහල්ලා විෂයරස අනුභවකිරීමටද හැරීමටද නොහැකිවේ.

158 නොපභොක්තුං න ච ත්‍යක්තුං ශක්නොති විෂයාන් ජරී
අස්ථි නිර්දශනඃ ශ්වෙව ජිහ්වයා ලෙඪි කෙවලම්.

ජරී, ජරාතුර තැනැත්තේ; විෂයාන්, විෂයරසයන්; උපභොක්තුං, අනුභවකිරීමටද; න, නොහැකිවේ. ත්‍යක්තුං, හරණටද; නචශක්නොති, නොහැකිවේ. නිර්දශනඃ, පතිතවූ දත්ඇති; ශ්වා, බල්ලෙක්; අස්ථිඉව, ඇටමෙන්; ජිහ්වයා කෙවලං, දිවින්පමණක්; ලෙඪි, රසවිඳී.

ස්ත්‍රියගේ විනාශයට කාරණ.

159 ස්වාතන්ත්‍ර්‍යං පිතෘමන්දිරෙ නිවසතිර්‍යාත්‍රොත්සවෙ සඞ්ගතිඃ
ගොෂ්ඨී පූරුෂසන්නිධාවනියමො වාසො විදෙශෙ තථා.
සංසර්ගඃ සහ පුංශ්චලීභිරසකෘද්වෘත්තෙර්නිජායාඃ ක්ෂතිඃ
පත්‍යුර්වාර්ද්ධකමීර්ෂිතං ප්‍රවසනං නාශස්‍ය හෙතුඃ ස්ත්‍රියාඃ.

ස්වාතන්ත්‍ර්‍යං, ස්වාමිපුරුෂයාගේ අයිතිනැතිව තමාම ප්‍රධානබවද; පිතෘමන්දිරෙ, පියාගේගෙයි; නිවසතිඃ, විසීමද; යාත්‍රොත්සවෙ, ජයගන්නා කැමැති උත්සවයෙහි; සඞ්ගතිඃ, ගමනද; ගොෂ්ඨී, සමූහයාඇත්තීද; අනියමඃ, නියමනැතිව; පූරුෂසන්නිධෞ, පුරුෂයන්ගේ සමීපයෙහි විසීමද; තථා, එසේම; විදෙශෙ, අන්‍යදෙශයෙහි; වාසඃ, විසීමද; පුංශ්චලීභිඃසහ, පුරුෂයාගෙන්වෙන්ව වසනස්ත්‍රීන්හා සමග; සංසර්ගඃ, එක්වීමද; නිජායාඃ, තමාපිළිබඳවූ; වෘත්තෙඃ, දිවිරක්නාද්‍රව්‍යයාගේ; අසකෘත්, නොයෙක්වාරයෙහි; ක්‍ෂතිඃ, හානියහෝ කෙළවරවීමද; පත්‍යුඃ, ස්වාමිපුරුෂයාගේ; වාර්ධකං, මහලුබවහා; ඊර්ෂිතං, හිමියාකෙරෙහි ඊර්ෂ්‍යාකරණලදද; ප්‍රවසනං, ස්වාමියා අන්‍යරටක විසීමද; ස්ත්‍රියාඃ, ස්ත්‍රියගේ; නාශස්‍ය, හානියට; හෙතුඃ, කරුණුයි,

ස්ත්‍රීන්ගේ දූෂ්‍යයට කරුණු.

160 පානං දුර්ජනසංසර්ගඃ පත්‍යා ච විරහොටනම්
ස්වපනශ්චාන්‍යගෘහෙ වාසො නාරීණං දූෂණානි ෂට්.

පානං, මද්‍යපානයද; දුර්ජනසංසර්ගඃ, නින්දිතජනයාහා ඇලීමද; පත්‍යා ච, ස්වාමියාගෙන්; විරහඃ, වෙන්වීමද; අටනං, කැමතිතැනයාමද; අන්‍යගෘහෙ, අනුන්ගේගෙයි; ස්වපනශ්ච, නිදීමද; වාසඃ, විසීමද; නාරීණං, ස්ත්‍රීන්ගේ; දූෂණානි, දූෂ්‍යයට කාරණයෝ; ෂට්, මොහුසයයි.

ස්ත්‍රීන්ගේ පතිව්‍රතාවට කරුණු.

161 ස්ථානං නාස්ති ක්‍ෂණො නාස්ති නාස්ති ප්‍රාර්ථිතා නරඃ
තෙන නාරද නාරීණං සතිත්වමුපජායතෙ.

ස්ථානංනාස්ති, අවකාසවූ ස්ථානයෙක් නැත්තේද; ක්‍ෂණඃනාස්ති, අවකාසවූ. කාලයෙක් නැත්තේද; ප්‍රාර්ථිතා, ස්ත්‍රිය පතන්නාවූ; නරඃ නාස්ති, පුරුෂයෙක් නැත්තේද; නාරද; එම්බානාරදය; තෙන, ඒ කාරණයෙන්; නාරීණම්, ස්ත්‍රීන්ගේ; සතිත්වම්, පතිදෙවතාබව; උපජායතෙ, ලැබේ.

ස්ත්‍රීන්ගේ ස්වභාව.

162 න ස්ත්‍රීණමප්‍රියඃ කශ්චිත් ප්‍රියො වාපි න විද්‍යතෙ
ගාවස්තෘණමිවාරණ්‍යෙ ප්‍රාර්ථයන්ති නවං නවම්.

ස්ත්‍රීණම්, ස්ත්‍රීන්ට; අප්‍රියඃ, ප්‍රියනුවූ; කශ්චිත්, කිසිවෙක්; න, නැත්තේය. ප්‍රියඃවාඅපි, ප්‍රියයෙක්ද; නවිද්‍යතෙ, නැත්තේය. ගාවඃ, ගවයෝ; අරණ්‍යෙ, වනයෙහි; තෘණම්ඉව, තණමෙන්; නවංනවං, අළුත් අළුත් පුරුෂයන්; ප්‍රාර්ථයන්ති, පතත්.

163 සුවෙශං පුරුෂං දෘෂ්ට්වා භ්‍රාතරං යදි වා සුතම්
යොනිඃ ක්ලිද්‍යති නාරීණාං සත්‍යං සත්‍යං හි නාරද.

භ්‍රාතරං, සහොදරවූහෝ; යදිවා, නොහොත්; සුතං, පුත්‍රවූහෝ; සුවෙශම්, මනාවසැරසුනාවූ; පුරුෂම්, පුරුෂයකුහු; දෘෂ්ට්වා, දැක, නාරීණම්, ස්ත්‍රීන්ගේ; යොනිඃ, යොනිතොමෝ; ක්ලිද්‍යති, තෙත්වේ. නාරද, එම්බානාරදය; සත්‍යං, සත්‍යය; සත්‍යංහි, සැබෑමැයි.

රක්‍ෂාකටයුතු ස්ත්‍රීහු පුරුෂයන්වෙත නොහැසිරියයුතුබව.

164 ඝෘතකුම්භසමා නාරී තප්තාඞ්ගාරසමඃ පුමාන්
තස්මාත් ඝෘතඤ්ච වහ්නිඤ්ච නෛකත්‍ර ස්ථාපයෙද් බුධඃ

නාරී, ස්ත්‍රීතොමෝ; ඝෘතකුම්භසමා, ගිතෙල්කලයක් සමානවන්නීය. පුමාන්, පුරුෂතෙම; තප්තඅඞ්ගාරසමඃ, රත්වූ අඟුරුසමානවේ. තස්මාත්, ඒ කාරණයෙන්; බුධඃ, නුවණැති තැනැත්තේ; ඝෘතඤ්ච, ගිතෙල්ද; වහ්නිඤ්ච, ගින්නද; එකත්‍ර, එක්තැනෙක්හි; නස්ථාපයෙත්, නොතබන්නේය.

ස්ත්‍රීන් නිසා පණ්ඩිතයන් පවා කැලඹෙනබව.

165 මාත්‍රා ස්වස්‍රා දුහිත්‍රා වා න විවික්තාසනො භවෙත්
බලවානින්ද්‍රියග්‍රාමො විද්වාංසමපි කර්ෂති.

මාත්‍රා, මවහාසමගහෝ; ස්වස්‍රා, නැන්දෑහාසමගහෝ; දුහිත්‍රාවා, දුවහාසමගහෝ; විවික්තාසනඃ, මිනිසුන්ගෙන් වෙන්වසින්නෙක්; නභවෙත්, නොවන්නේය. බලවාන්, බලඇත්තාවූ; ඉන්ද්‍රියග්‍රාමඃ, ඉන්ද්‍රියසමූහයතෙම; විද්වාංසංඅපි, පණ්ඩිතයාද; කර්ෂති, අදී.

ස්ත්‍රීන්ට නින්දාකිරීමක්.

166 න ලජ්ජා න විනීතත්වං න දාක්ෂිණ්‍යං න භීරුතා
ප්‍රාර්ථනාභාව එවෛකං සතීත්වෙ කාරණං ස්ත්‍රියාඃ.

ලජ්ජා, ලජ්ජාවක්හෝ; න, නැත්තේය. විනීතත්වං, හික්මුනුබවක්හෝ; න, නැත්තේය. දාක්ෂිණ්‍යං, අනුකූලබවක්හෝ; න, නැත්තේය. භීරුතා, භයඇතිබවක්හෝ; න, නැත්තේය. ප්‍රාර්ථනා අභාවඃ එව, නොපැතීමම; ස්ත්‍රියාඃ, ස්ත්‍රියගේ; සතීත්වෙ, පතිදෙවතාභාවයෙහි; එකංකාරණං, එකම කරුණයි.

ස්ත්‍රීතොමෝ කමාකැමතිසේ නොහැසිරියයුත්තිය.

167 පිතා රක්ෂති කෞමාරෙ භර්තා රක්ෂති යෞවනෙ
පුත්‍රශ්ච ස්ථාවිරෙ භාවෙ න ස්ත්‍රී ස්වාතන්ත්‍ර්‍යමර්හති.

කෞමාරෙ, කුමාරිකා අවස්ථාවෙහි; පිතා, පියතෙම, රක්ෂති, රකී. යෞවනෙ, තරුණ අවස්ථාවෙහි; භර්තා, ස්වාමිපුරුෂතෙම; රක්ෂති, රකී. ස්ථාවිරෙභාවෙච, මහලුබව ඇතිකල්හිද; පුත්‍රඃ, පුත්‍රතෙම රකී. ස්ත්‍රී, ස්ත්‍රීතොමෝ; ස්වාතන්ත්‍ර්‍යම්, තමාගේ ප්‍රධානභාවය; න අර්හති, සුදුසු නොවේ.

ස්ත්‍රී න් ගේ උ පා යෙ හි ද ක්ෂ බ ව.

168 උශනා වෙද යච්ඡාස්ත්‍රං යච්ච වෙද වෘහස්පතිඃ
ස්වභාවෙනෛව තච්ඡාස්ත්‍රං ස්ත්‍රීබුද්ධෞ සුප්‍රතිෂ්ඨිතම්.

උශනා, සිකුරුතෙම; යත්ශාස්ත්‍රං, යම් ශාස්ත්‍රයක්; වෙදඃ, දන්නේවේද. වෘහස්පතිඃ, වෘහස්පතිතෙම; යච්චවෙදඃ, යමක් දන්නේවේද; තත් ශාස්ත්‍රම්, ඒ ශාස්ත්‍රයතෙම; ස්වභාවෙනඑව, ස්වභාවයෙන්ම; ස්ත්‍රීබුද්ධෞ, ස්ත්‍රීන්ගේ බුද්ධියෙහි; සුප්‍රතිෂ්ඨිතම්, මනාකොට පිහිටියේවේ.

ධ න ව තු න් ගේ බ ල ස ම්ප ත්ත බ ව.

169 ධනවාන් බලවාල් ලොකෙ සර්වඃ සර්වත්‍ර සර්වදා
ප්‍රභුත්වං ධනමූලං හි රාඥමප්‍යුපජායතෙ.

ලොකෙ, ලොකයෙහි; සර්වත්‍ර, සැමතැන්හි; සර්වදා, සැමකල්හි; ධනවාන්, ධනවත්තෙම; සර්වඃබලවාන්, සියලුබල ඇත්තේවේ. ධනමූලං, ධනය මුල්කොටඇත්තාවූ; ප්‍රභුත්වංහි, ස්වාමිබව වනාහි; රාඥංඅපි, රජ්ජුන්ටද; උපජායතෙ, ලැබේ.

170 ධනෙන බලවාල්ලොකො ධනාද්භවති පණ්ඩිතඃ
පශ්‍යෛනං මූෂිකං පාපං ස්වජාතිසමතාං ගතම්.

ධනෙන, ධනය හෙතුකොටගෙණ; ලොකඃ, ජනතෙම; බලවාන්, බලඇත්තේවේ. ධනාත්, ධනය හෙතුකොටගෙණ; පණ්ඩිතඃභවති, පණ්ඩිතයෙක්වේ. ස්වජාතිසමතාංගතම්, තමාගේ ජාතියහා සමබවට පැමිණියාවූ; පාපං, ලාමකවූ; එනංමූෂිකං, මේමියා; පශ්‍ය, බලව.

නුවණ මදවූ ධනහීනයාගේ සියලු ක්‍රියාවන් හානිවනබව.

171 අර්ථෙන තු විහීනස්‍ය පුරුෂස්‍යාල්පමෙධසඃ
ක්‍රියාඃ සර්වා විනශ්‍යන්ති ග්‍රීෂ්මෙ කුසරිතො යථා.

අර්ථෙන, ධනයෙන්; විහීනස්‍ය, පිරිහුනාවූ; අල්පමෙධසඃ, ප්‍රඥනැත්තාවූ; පුරුෂස්‍යතු, පුරුෂයාගේ වනාහි; සර්වාඃ ක්‍රියාඃ, සියලු ක්‍රියාවෝ; ග්‍රීෂ්මෙ, ග්‍රීෂ්මඍතුවෙහි; කුසරිතඃයථා, කුඩානදීයකගේ ජලයෝමෙන්; විනශ්‍යන්ති, විනාශවෙත්.

ධනවන්තයාට මිත්‍රාදි සියල්ලන් ඇතිබව.

172 යස්‍යාර්ථාස්තස්‍ය මිත්‍රාණි යස්‍යාර්ථාස්තස්‍ය බාන්ධවාඃ

යස්‍යාර්ථාඃ ස පුමාල්ලොකෙ යස්‍යාර්ථාඃ ස හි පණ්ඩිතඃ.

අර්ථාඃ, ධනයෝ; යස්‍ය; යම්කෙනෙකුගේද; මිත්‍රාණි, මිත්‍රයෝ; තස්‍ය, ඔහුගේවෙත්. අර්ථාඃ, ධනයෝ; යස්‍ය, යමෙකුගේද; බාන්ධවාඃ, නෑයෝ; තස්‍ය, ඔහුගේවෙත්. අර්ථාඃ, ධනයෝ; යස්‍ය, යමෙකුගේද; සඃ, හෙතෙම; ලොකෙ, ලොකයෙහි; පුමාන්, පුරුෂයෙක්වේ. අර්ථාඃ, ධනයෝ; යස්‍ය, යමෙකුට ඇත්තේද; සඃහි, හෙතෙම වනාහි; පණ්ඩිතඃ, පණ්ඩිතමැයි.

දිළිඳුතාව සියලු දෙයින් ශූන්‍යබව.

173 අපුත්‍රස්‍ය ගෘහං ශූන්‍යං සන්මිත්‍රරහිතස්‍ය ච

මූර්ඛස්‍ය ච දිශඃ ශූන්‍යාඃ සර්වශූන්‍යා දරිද්‍රතා-

අපුත්‍රස්‍ය, පුත්‍රයන් නැත්තාහුගේ; ගෘහංශූන්‍යම්, ගෙය සිස්වේ. සන්මිත්‍රරහිතස්‍යච, මනා මිත්‍රයන් නැත්තාහුගේද; මූර්ඛස්‍යච, අඥනයාගේද; දිශඃශූන්‍යාඃ, දිශාවෝ සිස්වෙත්. දරිද්‍රතා, දිළිඳුබව; සර්වශූන්‍යා, සියල්ලෙන් සිස්වන්නීය.

දිළිඳුබවද මරණයද යන දෙකින් දිළිඳුබව අධික දුක්වෙයි.

174 දාරිද්‍ර්‍යාන්මරණාද්වාපි දාරිද්‍ර්‍යමවරං ස්මෘතම්

අල්පක්ලෙශෙන මරණං දාරිද්‍ර්‍යමති දුඃසහම්.

දාරිද්‍ර්‍යාත්, දිළිඳුභාවයෙන්ද; මරණාද්වාපි, මරණයෙන්ද යනමේ දෙකින්; දාරිද්‍ර්‍යං, දිළිඳුබව; අවරං, අධමයයි; ස්මෘතම්, දන්නාලදී. මරණං, මරණයතෙම; අල්පක්ලෙශෙන, මදවූ දුකින් යුක්තවූයේවේ. දාරිද්‍ර්‍යම්, දිළිඳුබව; අතිදුඃසහම්, අතිශයින් ඉවසියනොහේ.

ධනහීනයා අනිකෙක්වනබව.

175 තානීන්ද්‍රියාණ්‍යවිකලානි තදෙව නාම

සා බුද්ධිරප්‍රතිහතා වචනං තදෙව.

අර්ථොෂ්මණා විරහිතඃ පුරුෂඃ ස එව

අන්‍යඃ ක්ෂණෙන භවතීති විචිත්‍රමෙතත්.

තානි, ඔහු; අවිකලානි, විකලනුවූ; ඉන්ද්‍රියාණි, ඉන්ද්‍රියයෝවෙත්; තදෙව, එම; නාම, නාමයවේ. සා, ඕතොමෝ; අප්‍රතිහතා, නොපැකිල පවත්නාවූ; බුද්ධිඃ, නුවණය; තදෙව, එම; වචනං, වචනයයි; අර්ථොෂ්මණා, ධනය පිළිබඳවූ අහංකාරයෙන්; විරහිතඃ, තොරවූ; සඃපුරුෂඃඑව, ඒ පුරුෂයාම; ක්ෂණෙන, ඇසිල්ලෙකින්; අන්‍යඃ භවති, අනිකෙක්වේ; ඉතිඑතත්, මෙසේ මේ කාරණයතොම; විචිත්‍රම්, විසිතුරුවේ.

## ප්‍රකාශ නොකටයුතු කාරණ.

176 අර්ථනාශං මනස්තාපං ගෘහෙ දුශ්චරිතානි ච
වඤ්චනඤ්චාපමානඤ්ච මතිමාන්න ප්‍රකාශයෙත්.

අර්ථනාශං, ධනහානියද; මනස්තාපං, ශොකයද; ගෘහෙ, ගෘහයෙහි; දුශ්චරිතානිච, නොකටයුතුද; වඤ්චනඤ්ච, අනුන්විසින්කළ වඤ්චාවද; අපමානඤ්ච, අගෞරවයද; මතිමාන්, නුවණැති තැනැත්තේ; නප්‍රකාශයෙත්; ප්‍රකාශනොකරන්නේය.

177 ආයුර්විත්තං ගෘහච්ඡිද්‍රං මන්ත්‍රමෛථුනභෙෂජම්
තපොදානාපමානඤ්ච නව ගොප්‍යානි යත්නතඃ.

ආයුඃ, ආයුගණනද; විත්තං, ධනයද; ගෘහච්ඡිද්‍රං, ගෙයි නොකටයුතුද; මන්ත්‍ර, මන්ත්‍රයද; මෛථුනභෙෂජම්; මෛථුනයහා බෙහෙතද; තපො, තපසද; දානඅපමානඤ්ච, දීමහා අගෞරවයද යන; නව, නවය; යත්නතඃ, උත්සාහයෙන්; ගොප්‍යානි, රක්‍ෂාකටයුතුවෙත්.

## නුවණැත්තාවූ දිළින්දාට වනයහැර අන්තැනෙක සැපනැතිබව.

178 අත්‍යන්තවිමුඛෙ දෛවෙ ව්‍යර්ථයත්නෙ ච පෞරුෂෙ
මනස්විනො දරිද්‍රස්‍ය වනාදන්‍යත් කුතඃ සුඛම්.

දෛවෙ, භාග්‍යය; අත්‍යන්තවිමුඛෙ, අතිශයින් ඉවතබැලූකල්හි; පෞරුෂෙ, පුරුෂයා පිළිබඳවූ; ව්‍යර්ථයත්නෙච, සිස්වූ උත්සාහයඇති කල්හි; දරිද්‍රස්‍ය, දිළිඳුවූ; මනස්විනඃ, පණ්ඩිතයාහට; වනාත්, වනයහැර; අන්‍යත්කුතඃ, අන්කොතැන්හි; සුඛම්, සැපඇතිවේද.

## පණ්ඩිතතෙම එකාන්තයෙන් මියයෙසි ලොභ බවට නොයේ.

179 මනස්වී ම්‍රියතෙ කාමං කාර්පණ්‍යං න තු ගච්ඡති
අපි නිර්වාණමායාති නානලො යාති ශීතතාම්.

මනස්වී, පණ්ඩිතතෙම; කාමං, එකාන්තයෙන්; ම්‍රියතෙ, මියේ. කාර්පණ්‍යං, ලොභබවට; නතුගච්ඡති, නොයේ. අනලඃ, ගින්නතෙම; නිර්වාණංඅපි, නිවීමටද; ආයාති, පැමිණේ, ශීතතාම්, සිහිල්බවට; නයාති, නොයේ.

## පණ්ඩිතයාගේ ස්වභාවය.

180 කුසුමස්තවකස්‍යෙව ද්වෙ වෘත්තී තු මනස්විනඃ
සර්වේෂාං මූර්ධ්නි වා තිෂ්ඨෙද්විශීර්‍ය්‍යෙදථ වා වනෙ.

කුසුමස්තවකස්‍යෙව, මල්කැනගේ (මල්පොකුරගේ) මෙන්; මනස්විනඃතු, පණ්ඩිතයාගේවනාහි; ද්වෙවෘත්තී, පැවතුම්දෙකෙක්වෙත්. සර්වේ

ෂාං, සිඝල්ලවූන්ගේ; මූර්ධනිවා, මුදුනෙහිහෝ; තිෂ්ඨේත්, සිටිනේය, අ
ථවා, නොහොත්, වනෙ, වනයෙහි; විශීර්යේත්, විසිරයන්නේය.

ගෞරවර්ණනාකරණලද්දාවූ දිළිඳු පුරුෂතෙම අනුන්විසින්
ප්‍රාර්ථනාකරණු නොලැබේ.

181 වරං විභවහීනෙන ප්‍රාණෛඃ සන්තර්පිතොනලඃ
නොපචාරපරිභ්‍රෂ්ටඃ කෘපණඃ ප්‍රාර්ථ්‍යතෙ ජනඃ.

විභවහීනෙන, ධනහීනයාවිසින්; ප්‍රාණෛඃ, ප්‍රාණයන් කරණකො
ටගෙණ; සන්තර්පිතඃ, දවනලද්දාවූ; අනලඃ, ගින්නතෙම; වරං, උතු
මිවේ; උපචාරපරිභ්‍රෂ්ටඃ, පිරිහුනාවූ ගෞරවඇති; කෘපණඃ ජනඃ, දිළි
ඳුපුරුෂතෙම; නප්‍රාර්ථ්‍යතෙ, ප්‍රාර්ථනාකරණු නොලැබේ.

ධනහානිය සියලු විපත්තියට ස්ථානබව.

182 දාරිද්‍ර්‍යාද්ධ්‍රියමෙති හ්‍රීපරිගතඃ ප්‍රභ්‍රශ්‍යතෙ තෙජසො
නිස්තෙජාඃ පරිභූයතෙ පරිභවාන්නිර්වේදමාපද්‍යතෙ.
නිර්විණ්ණඃ ශුචමෙති ශොකපිහිතො බුද්ධ්‍යා පරිත්‍යජ්‍යතෙ
නිර්බුද්ධිඃ ක්ෂයමෙත්‍යහො නිර්ධනතා සර්වාපදාමාස්පදම්.

දාරිද්‍ර්‍යාත්, දිළිඳුභාවය හෙතුකොටගෙණ; හ්‍රියං, ලජ්ජාවට; එති, පැමි
ණේ. හ්‍රීපරිගතඃ, ලජ්ජාවෙන් පිඩිත තැනැත්තේ; තෙජසඃ, අනුභාව
සකෙරෙන්; ප්‍රභ්‍රශ්‍යතෙ, පිරිහෙනුලැබේ. නිස්තෙජාඃ, අනුභාවනැති
තැනැත්තේ; පරිභූයතෙ, නින්දාකරණුලැබේ. පරිභවාත්, නින්දාකි
රීම හෙතුකොටගෙණ; නිර්වේදං, නොසතුටුබවට; ආපද්‍යතෙ, පැමි
ණේ. නිර්විණ්ණඃ, නොසතුටු තැනැත්තේ; ශුචං, සිත්තැවීමට; එති, පැ
මිණේ. ශොකපිහිතඃ, ශොකයෙන්වසනලද තැනැත්තේ; බුද්ධ්‍යා, ප්‍රඥා
ව විසින්; පරිත්‍යජ්‍යතෙ, තොරකරණුලැබේ. නිර්බුද්ධිඃ, ප්‍රඥාහීන තැනැ
ත්තේ; ක්ෂයම්, දුර්වලභාවයට; එති, පැමිණේ. අහො, විස්මයෙක; නිර්ධ
නතා, දිළිඳුබව; සර්වාපදාම්, සියලු විපත්තින්ගේ; ආස්පදම්, ස්ථානවේ.

අනුන්ගේ ධනයෙහි රසවිඳීම සැපනොවනබව.

183 වරං මෞනං කාය්‍ය්‍යං න ච වචනමුක්තං යදනෘතං
වරං ක්ලෛව්‍යං පුංසාං න ච පරකලත්‍රාභිගමනම්.
වරං ප්‍රාණත්‍යාගො න ච පිශුනවාක්‍යෙෂ්වභිරුචි
ර්වරං භික්ෂාශිත්වං න ච පරධනාස්වාදනසුඛම්.

මෞනං, කථානොකරණව්‍රතය; කාය්‍ය්‍යං, කටයුතුවූයේ; වරං, උතුම්
වේ. උක්තං, කියනලද්දාවූ; යත්වචනං, යම්වචනයෙක්; අනෘතං, සත්‍ය

ප්‍රියනොබැඳ, නව, උතුම්නොවේ. පුංසාං, පුරුෂයන්ගේ; ෂෞෂ්‍යං, නපුංසකබව; වරං, උතුම්වේ. පරකලත්‍ර අභිගමනං, අනුන් අඹුවන්වෙත එළඹීම; නව, උතුම්නොවේ. ප්‍රාණත්‍යාගඃ, මියෑම; වරං, උතුම්වේ. පිශුනවාක්‍යෂු, කෙලාම් වචනයන්හි; අභිරුචිඃ, ඇලීම; නව, උතුම් නොවේ. භික්ෂාශිත්‍වං, සිඟා අනුභවකරණබව; වරං, උතුම්වේ. පරධනාස්වාදනසුඛම්, අනුන් ධනය රසවිඳිනා සැපතතෙම; නව, උතුම් නොවේ.

උතුම් නොවන කාරණ,

184 වරං ශූන්‍යා ශාලා න ච ඛලු වරෙ දුෂ්ටවෘෂභඃ
වරං වෙශ්‍යා පත්නී න පුනරවිනීතා කුලවධූඃ.
වරං වාසොරණ්‍යෙ න පුනරවිවෙකාධිපපුරෙ
වරං ප්‍රාණත්‍යාගො න පුනරධමානාමුපගමඃ.

ශූන්‍යා, හිස්වූ; ශාලා, ශාලාතොමෝ; වරං, උතුම්වේ. දුෂ්ටවෘෂභඃ, නූරගවතෙම; ඛලු, ඒකාන්තයෙන්; නචවරඃ, උතුම්නොවේ. වෙශ්‍යා පත්නී, වෙශීවූ අඹුතොමෝ; වරං, උතුම්වේ. පුනඃ, නැවත, අවිනීතා, නොහික්මුනාවූ; කුලවධූඃ, කුලස්ත්‍රීතොමෝ; න, උතුම්නොවේ. අරණ්‍යෙ, වනයෙහි; වාසඃ, විසීම; වරං, උතුම්වේ. පුනඃ, නැවත; අවිවෙකාධිපපුරෙ, පරීක්ෂාරහිතවූ රජහුගේ නුවරෙහි විසීම; න, උතුම් නොවේ. ප්‍රාණත්‍යාගඃ, මරණය; වරම්, උතුම්වේ. පුනඃ, නැවත; අධමානාම්, අධමයන්ගේ සමීපයට; උපගමඃ, එළඹීමතෙම; න, උතුම් නොවේ.

ඉල්වීමෙහි දොෂ.

185 සෙවෙව මානමඛිලං ජ්‍යොත්ස්නාව තමො ජරෙව ලාවණ්‍යම්
හරිහරකථෙව දුරිතං ගුණශතමප්‍යර්ථිතා හරති.

අඛිලංමානං, සියලු සැලකිම; සෙවාඉව, ආශ්‍රයකිරීම නැතිකරන්නාමෙන්ද; තමඃ, අන්ධකාරය; ජ්‍යොත්ස්නාඉව, චන්ද්‍රකාන්තිය නැතිකරන්නාක්මෙන්ද; ලාවණ්‍යම්, ශරීර ශොභාව; ජරාඉව, ජරාවනැතිකරන්නාමෙන්ද; දුරිතං, උපද්‍රවය; හරිහරකථාඉව, විෂ්ණුරීශ්වර දෙදෙනා පිළිබඳවූ කථාවෙන් නැතිකරන්නාමෙන්ද; අර්ථිතා, ඉල්වනබව; ගුණශතම්අපි, ගුණසියයක්නමුදු; හරති, පහකරන්නීය.

පුරුෂයහට සිනාසියයුතු කාරණා.

186 පලලවග්‍රාහි පාණ්ඩිත්‍යං ක්‍රයක්‍රීතච මෛථුනම්.
භොජනඤ්ච පරාධීනං තිස්‍රඃ පුංසාං විඩම්බනාඃ.

පල්ලවග්‍රාහී, අතුඅගක් අතටගන්නාවූ; පාණ්ඩිත්‍යං, පණ්ඩිතභාව යද; ත්‍රයක්‍රීතං, මිලදෙනලද්දවූ; මෛථුනාව, මෛථුනායද; පරාධීනං; අනුන්සන්තකවූ; භොජනව, අනුභවයද; ත්‍රිසුඃ, තුන; පුංසාං, පුරුෂයන්ගේ; විඩම්බනාඃ, සිනාවට කාරණයෝයි.

ජීවත්වූයේ වීනමුත්,මළාහාසමානයෝ·

187 රොගී චිරප්‍රවාසී පරාන්නභොජී පරාවසථශායී

යජ්ජීවති තන්මරණං යන්මරණං සොස්‍ය විශ්‍රාමඃ.

රොගී, රොගයෙන්පෙළෙන තැනැත්තේද; චිරප්‍රවාසී, බොහෝකලක් අන්රටකවසන තැනැත්තේද; පරාන්නභොජී, අනුන්ගේ ආහාර අනුභවකරණ සුලුතැනැත්තේද; පරාවසථශායී, අනුන්ගේ ගෙයි නිදන සුලුතැනැත්තේද; යත්ජීවති; යම් ජීවත්වීමෙක් ඇද්ද; තත්, ඒ තෙම; මරණං, මරණයයි· යන්මරණං, යම් මරණයෙක්ඇද්ද; සඃ, හෙතෙම; අස්‍ය, මොහුගේ; විශ්‍රාමඃ, විඩාසන්සිඳිමයි·

ලොභී තැනැත්තා දුකට පැමිණෙනබව.

188 ලොභෙන බුද්ධිශ්චලති ලොභො ජනයතෙ තෘෂාම්

තෘෂාර්තො දුඃඛමාප්නොති පරත්‍රෙහ ච මානවඃ.

ලොභෙන, ලොභය හෙතුකොටගෙණ; බුද්ධිඃ, ප්‍රඥාතොමෝ; චලති, චංචලවේ. ලොභඃ, ලොභයතෙම; තෘෂාම්, අධික ආශාවයයි කියනලද පිපාසය; ජනයතෙ, උපදවා. තෘෂාර්තඃ, පිපාසයෙන් පිඩිතවූ; මානවඃ, මනුෂ්‍යතෙම; පරත්‍ර, පරලොකයෙහිද; ඉහච, මේ ආත්මයෙහිද; දුඃඛම්, දුකට, ආප්නොති, පැමිණේ.

යමෙක් ලදදෙයකින් සතුටුනොවන්නේවීනම් ඕහටසියලු විපත්ති එළඹා.

189 ධනලුබ්ධො හ්‍යසන්තුෂ්ටො නියමාත්මා ජිතෙන්ද්‍රියඃ

සර්වා එවාපදස්තස්‍ය යස්‍ය තුෂ්ටං න මානසම්.

ධනලුබ්ධඃ, ධනයෙහි ලොභවූ; අසන්තුෂ්ටඃහි, ලදදෙයකින් සතුටු නොවන්නාවූ; නියමාත්මා, ව්‍රතයෙහි පිහිටි සිත්ඇත්තාවූ; ජිතෙන්ද්‍රියඃ, ඉන්ද්‍රිය නිග්‍රහකරන්නෙක්වේද. යස්‍ය, යමෙකුගේ; මානසං, සිත; නතුෂ්ටං, සතුටුනුවූයේද; තස්‍ය, ඕහට; සර්වාඃඑව ආපදඃ, සියලු විපත්තිහුම වේත්.

### යමෙකුගේසිත ලද්දෙයකින් සතුටුවූයේවීනම් ඕහට සියලු සැපලද්දේවේ.

190 සර්වාඃ සම්පත්තයස්තස්‍ය සන්තුෂ්ටං යස්‍ය මානසම්
උපානද්ගූඪපාදස්‍ය නනු චර්මාවෘතෙව භූඃ.

යස්‍ය, යමෙකුගේ; මානසම්, අදහස; සන්තුෂ්ටං, ලද්දෙයකින් සතුටුවූයේද; තස්‍ය, ඕහට; සර්වාඃ සම්පත්තයඃ, සියලු සම්පත්හුම්ලද්දාහුවෙත් උපානත්, වහනින්; (සෙරෙප්පුවෙන්) ගූඪපාදස්‍ය, වසනලද පාදයඇත්තාහට; භූඃ, පෘථිවිතොමෝ; චර්මාවෘතාභූවනනු, සම්අතුරණලද්දක් වැනිමය.

### ලොභවූවන්ට ධනයෙන් සැපතක්නැතිබව.

191 සන්තොෂාමෘතතෘප්තානාං යත් සුඛං ශාන්තචෙතසාම්
කුතස්තද්ධනලුබ්ධානාමිතශ්චෙතශ්ච ධාවතාම්.

සන්තොෂ, ලත්දෙයකින් සතුටුවීමයයි කියනලද; අමෘතතෘප්තානාම්, අමෘතයෙන් සතුටුවූ; ශාන්තචෙතසාම්, සංහිඳුනාවූ සිත්ඇත්තවුන්ගේ; යත්සුඛං, යම්සැපතක්වේද; ඉතශ්ච ඉතශ්චධාවතාම්; ඒ ඒ තැන දුවන්නාවූ; ධනලුබ්ධානාම්, ධනයෙහි ලොභවූවන්ට; තත්, ඒ සැපත; කුතඃ, කොයින්ලැබේද.

### ආ ශා ව න් දු රු වී මෙ හි වැ ඩ,

192 තෙනාධීතං ශ්‍රුතංතෙන තෙන සර්වමනුෂ්ඨිතම්
යෙනාශාඃ පෘෂ්ඨතඃ කෘත්වා නෛරාශ්‍යමවලම්බිතම්,

යෙන, යමකුවිසින්; ආශාඃ, ආශාවන්; පෘෂ්ඨතඃකෘත්වා, දුරුකොට; නෛරාශ්‍යම්, ආශානැතිබව; අවලම්බිතම්, වැලඳගන්නාලදද; තෙන, ඔහුවිසින්; සර්වංඅධීතං, සියල්ල පුහුනුකරණලද්දේය. තෙන, ඔහුවිසින්; සර්වංශ්‍රුතම්, සියල්ල අසනලද්දේය, තෙන, ඔහුවිසින්; සර්වංඅනුෂ්ඨිතම්, සියල්ල පටන්ගන්නාලද්දේය.

### පි න් ඇ ති ජී ව ත් වී ම

193 අසෙවිතෙශ්වර ද්වාර මදෘෂ්ට විරහව්‍යථම්
අනුක්තක්ලීබවචනං ධන්‍යං කස්‍යාපි ජීවනම්.

අසෙවිත, ආශ්‍රයනොකරණලද; ඊශ්වරද්වාරං, අධිපතීන්ගේ ගෘහද්වාරඇත්තේද; අදෘෂ්ට, නොදක්නාලද්දාවූ; විරහව්‍යථ, අඹුසැමීන්ගෙන් වෙන්වීමෙහි පීඩාඇත්තේද; අනුක්ත, නොකියනලද්දාවූ; ක්ලීබවචනං නපුංසකවචන ඇත්තේද; කස්‍යඅපි, කවරකුහුගේනමුදු; ජීවනං, ජීවත්වීමතෙම; ධන්‍යං, පිණැත්තේවේ.

තෘෂ්ණාවෙන් පිඩිතයාහට යොදුන්සියයක්නමුත් දුරුනොවනබව.

194 න යොජනශතං දූරං බාධ්‍යමානස්‍ය තෘෂ්ණයා
සන්තුෂ්ටස්‍ය කරප්‍රාප්තෙප්‍යර්ථෙ භවති නාදරඃ.

තෘෂ්ණයා, ආශාවෙන්; බාධ්‍යමානස්‍ය, පිඩාකරණලබන්නාහට; යොජනශතම්, යොදුන්සියයක්; නදූරං, දුරුනොවෙ. සන්තුෂ්ටස්‍ය, සතුටු සිත් ඇත්තාහට; කරප්‍රාප්තෙපි, අතටපත්වූද; අර්ථෙ, ධනයෙහි; ආදරඃ, ආදරය; නභවති, නොවෙ,

ධර්ම—සැප—සෙනහ—පණ්ඩිතබව යනාවෙ සතරෙහි විභාගය,

195 කො ධර්මො භූතදයා කිං සෞඛ්‍යම් අරොගිතා ජගති
ජන්තොඃ කඃ ස්නෙහඃ සද්භාවඃ කිං පාණ්ඩිත්‍යං පරිච්ඡෙදඃ.

ධර්මඃ, ධර්මයතෙම; කඃ, කවරේද; භූතදයා, සත්වයන්කෙරෙහි අනුකම්පාවයි. සෞඛ්‍යං, සැපතනම්; කිං, කුමක්ද; ජගති, ලොකයෙහි; ජන්තොඃ, සත්වයාගේ; අරොගිතා, නිරොගිබවයි. කඃස්නෙහඃ, සෙනහය නම් කවරේද; සද්භාවඃ, සත්පුරුෂබවයි. පාණ්ඩිත්‍යං, පණ්ඩිතබව; කිං, කුමක්ද; පරිච්ඡෙදඃ, ගුණනුගුණදෙක පරීක්‍ෂාකිරීමයි.

කටයුතු නොකටයුතු නොවිමසන්නවුන්ට විපත්තිඑළවනබව.

196 පරිච්ඡෙදො හි පාණ්ඩිත්‍යං යදාපන්නා විපත්තයඃ
අපරිච්ඡෙදකර්තෘණාං විපදඃ ස්‍යුඃ පදෙ පදෙ.

යත්, යම්හෙයකින්; විපත්තයඃ, විපත්තින්ට; ආපන්නාඃ, පැමිණියාහුද; පරිච්ඡෙදඃහි, නියමකිරීම වනාහි; පාණ්ඩිත්‍යං, පණ්ඩිතබව වෙ. අපරිච්ඡෙදකර්තෘණාං, නියමනැතිව ක්‍රියාකරන්නවුන්ට; පදෙපදෙ, පියවරක් පියවරක්පාසා; විපදඃස්‍යුඃ, විපත්තිඑළවත්

ජී වි ත යා ගේ බ ල ව ත් බ ව.

197 ත්‍යජෙදෙකං කුලස්‍යාර්ථෙ ග්‍රාමස්‍යාර්ථෙ කුලං ත්‍යජෙත්.
ග්‍රාමං ජනපදස්‍යාර්ථෙ ආත්මාර්ථෙ පෘථිවීං ත්‍යජෙත්.

කුලස්‍ය, ගොත්‍රයකගේ; අර්ථෙ, කාරණයෙහි; එකං, එක්පුරුෂයක්හු; ත්‍යජෙත්, හරණේය. ග්‍රාමස්‍ය, ගමකගේ; අර්ථෙ, කාරණයෙහි; කුලං, ගොත්‍රය; ත්‍යජෙත්, හරණේය. ජනපදස්‍ය, දෙශයාගේ; අර්ථෙ, කාරණයෙහි; ග්‍රාමං, ගම හරණේය, ආත්මාර්ථෙ, ආත්මයාගේ කාරණයෙහි; පෘථිවීං, පොළොව; ත්‍යජෙත්, හරණේය,

## පරීක්ෂා කට යුතු බව.

198 පානීයං වා නිරායාසං ස්වාද්වන්නං වා භයෝත්තරම්.
විචාර්‍යපි ඛලු පශ්‍යාමි තත්සුඛං යත්‍ර නිර්වෘතිඃ.

නිරායාසං, දුකක්නැත්තාවූ; පානීයංවා, ජලයහෝ; භයෝත්තරම්, මහත්භයඑළවන්නාවූ; ස්වාදුඅන්නංවා, මිහිරි ආහාරහෝ; විචාර්‍යපිඛලු, පරීක්ෂාකොට; පශ්‍යාමි, දකිමි. යත්‍ර, යම්තැනෙකන්හි; නිර්වෘතිඃ, මිදීමවේද; තත්සුඛං, ඒ සැපයි.

## අළිඳුව ජීවත්වීමටවඩා උතුම්කාරණා.

199 වරං වනං ව්‍යාඝ්‍රගජේන්ද්‍රසෙවිතං ද්‍රුමාලයඃ පක්වඵලාම්බු භක්ෂණම්
තෘණානි ශය්‍යා පරිධානවල්කලං න බන්ධුමධ්‍යෙ ධනහීනජීවනම්.

ව්‍යාඝ්‍ර, ව්‍යාඝ්‍රයන්හා; ගජේන්ද්‍ර, හස්තිරාජයන්විසින්ද; සෙවිතං, සෙවනයකරණලද්දාවූ; වනං, වනයතෙම; වරං, උතුම්වේ. ද්‍රුමාලයඃ, ගස්මුලවිසීමද; පක්වඵල, පැසුනාවූඵලහා; අම්බුභක්ෂණම්, දියඅනුභවයද; තෘණානි, තෘණයන්හි; ශය්‍යා, සැතපීමද; පරිධානවල්කලං, වෘක්ෂපට්ටා හැඳීමද උතුම්වේ. බන්ධුමධ්‍යෙ, ඥාතීන්මධ්‍යයෙහි; ධනහීන ජීවනම්, ධනරහිතවූ ජීවත්වීමතෙම; න, උතුම්නොවේ.

## සත්පුරුෂයන්හා එක්ව විසීමට වර්ණනාවක්.

200 සංසාරවිෂවෘක්ෂස්‍ය ද්වෙ එව මධුරෙ ඵලෙ
කාව්‍යාමෘතරසාස්වාදඃ සඞ්ගමඃ සජ්ජනෛඃ සහ.

සංසාරවිෂවෘක්ෂස්‍ය, සංසාරනැමැතිවිෂ වෘක්ෂයාගේ; කාව්‍යඅමෘතරස ආස්වාදඃ, කාව්‍යනැමැති අමෘතයාගේ රසවිඳීමද; සජ්ජනෛඃසහ, පණ්ඩිතයන්හා සමග; සඞ්ගමඃ, එක්වීමදයන; මධුරෙඵලෙ, මිහිරුඵලයෝ; ද්වෙඑව, දෙකක්මවෙත්.

## සංසාරයෙහි සාරතුනක්.

201 සඞ්ගමඃ කෙශවභක්තිර්ගඞ්ගාම්භසි නිමජ්ජනම්
අසාරෙ ඛලු සංසාරෙ ත්‍රීණි සාරාණි භාවයෙත්,

සමාගමඃ, පණ්ඩිතයන්හාඑක්වීමද; කෙශවභක්තිඃ, විෂ්ණුහට ඇල්මද; ගඞ්ගාම්භසි, ගංගානදියගේ ජලයෙහි; නිමජ්ජනම්, ගිලීමද; * අසාරෙඛලු, ඒකාන්තයෙන් අසාරවූ; සංසාරෙ, සංසාරයෙහි; ත්‍රීණිසාරාණි, සාරතුනක්; භාවයෙත්, සලකන්නේය.

* ශිවභක්තිය ඇත්තවුන්සඳහා මේ තෙම කියනලදී. මතමතන්ගේ ඇදහීම් වැට ලබාව උපදවාගැන්ම මෙහි ශාස්තෘ අදහසයි.

ශොකගින්නෙන් තවනලද්දේ.

202 අර්ථාඃ පාදරජොපමා ගිරිනදීවෙගොපමං යෞවනං
ආයුෂ්‍යං ජලබින්දුලොලචපලං ඵෙණොපමඃ ජීවනම්.
ධර්මං යො න කරොති නිශ්චලමතිඃ ස්වර්ගාර්ගලොද්ඝාටනං
පශ්චාත්තාපහතො ජරාපරිණතඃ ශොකාග්නිනා දහ්‍යතෙ.

අර්ථාඃ, ධනයෝ; පාදරජඋපමාඃ; පාදයෙහි දූහුවිලිහා සමානයෝවෙත්. යෞවනං, තරුණභාවයතෙම; ගිරිනදීවෙගොපමං, පර්වතයෙහි හටගත්නදියකගේ වෙගයක්වැනිවෙයි. ආයුෂ්‍යං, පරමායුෂය; ජලබින්දුලොලචපලං, දියබිංදුවක්මෙන් අස්ථිරව චචලවෙයි. ජීවනම්, ජීවත්වීමතෙම; ඵෙණොපමං, පෙණපිඩක්වැනිවෙයි. යඃ, යමෙක්තෙම; නිශ්චලමතිඃ, ස්ථිරවූ බුද්ධිඇත්තේ; ස්වර්ගාර්ගලොද්ඝාටනං, දිව්‍යලොකයෙහි අගුල නගන්නාවූ; ධර්මං, සුචරිතය; නකරොති, නොකෙරේද; ජරාපරිණතඃ, ජරාවට පෙරලුනාවූ; පශ්චාත්තාපහතඃ, පසුතැවිල්ලෙන් මිරිකුනාවූ ඔහුතෙම; ශොකාග්නිනා, ශොකනැමැති ගින්නවිසින්; දහ්‍යතෙ, දවනුලැබේ.

රැස්කරණලද ධනය සුදුස්සන්ට දියයුතුබව.

203 උපාර්ජිතානාං විත්තානාං ත්‍යාග එව හි රක්ෂණම්
තඩාගොදරසංස්ථානාං පරීවාහ ඉවාම්භසාම්.

උපාර්ජිතානාම්, රැස්කරණලද්දාවූ; විත්තානාම්, ධනයන්ගේ; ත්‍යාගඃඑවහි, දීමම; රක්ෂණම්, රක්ෂාකිරීමවේ. තඩාගොදරසංස්ථානාම්, වැවතුල පවත්නාවූ; අම්භසාම්, ජලයන්ගේ; පරීවාහඃඉව, හාත්පසින් වැහීමමෙනි.

204 යදධොධඃ ක්ෂිතෞ විත්තං නිචඛාන මිතම්පචඃ
තදධො නිලයං ගන්තුං චක්‍රෙ පන්ථානමග්‍රතඃ.

මිතම්පචඃ, තමාපමණට පිසන්නාවූ දිළිඳුතැනැත්තේ; ක්ෂිතෞ, පොළොවෙහි; අධඃ අධඃ, යට යට; විත්තං, ධනය; යත්නිචඛාන, යම් කාරණයෙකින්සැරුයේද; තත්, ඒ කාරණයෙන්; අග්‍රතඃ, ඉදිරියෙන්; අධඃනිලයං, යටිභාගයෙහිවූ වාසස්ථානයට; ගන්තුං, යනුපිණිස; පන්ථානම්, මාර්ගය; චක්‍රෙ, කෙළේය.

ධනරැස්කිරීමට කැමති දුරුෂයා දුකට පැමිණෙනබව.

205 නිජසෞඛ්‍යං නිරුන්ධානො යො ධනාර්ජනමිච්ඡති
පරාර්ථං භාරවාහීව ක්ලෙශස්‍යෛව හි භාජනම්.

යඃ, යමෙක්තෙම; නිජසෞඛ්‍යං, තමාගේ සැපත; නිරුන්ධාන:, වළක්වන්නේ; ධනාර්ජිනම්, ද්‍රව්‍ය රැස්කිරීමට, ඉච්ඡති, කැමතිවේද හෙතෙම; පරාර්ථං, අනුන්සඳහා; භාරවාහීඉව, බරඋසුලන්නෙක්මෙන්; ක්ලෙශස්‍යඑවහි, දුකටම; භාජනම්, භාජනවේ.

දන් දීමද අනුභවයද නැත්තා පොළොවෙහි සාරණලදවලමධනකොට ඇතිබව-

206 දානොපභොගහීනෙන ධනෙන ධනිනො යදි
පෘථ්වීඛාතනිධානෙන ධනෙන ධනිනො වයම්.

දාන, දීමද; උපභොගහීනෙන, අනුභවයද නැත්තාවූ; ධනෙන, ද්‍රව්‍යය කාරණකොටගෙණ; යදිධනිනඃ, ඉදින්ධනඇත්තාහුවෙද්ද; පෘථ්වීඛාත, පොළොවෙහි සාරණලද්දාවූ; නිධානෙන, වලයයිකියනලද්දාවූ; ධනෙන, ද්‍රව්‍යය කාරණකොටගෙණ; වයම්, අපි, ධනිනඃ, ද්‍රව්‍ය ඇත්තාහුවමු.

දීමහා අනුභවයනැති තැනැත්තා ජීවත්වූවත් මළඑකෙක්හු හා සමානබව.

207 දානොපභොගහීනාශ්ච දිවසා යාන්ති යස්‍ය වෛ
ස කර්මකාරභස්ත්‍රෙව ශ්වසන්නපි න ජීවති.

දානොපභොගහීනාඃ, දීමහා අනුභවයද නැත්තාවූ; දිවසාඃ, දිනයෝ; යස්‍ය, යමෙක්හුහට; වෛයාන්ති, ඉක්මයේද්ද; සඃ, හෙතෙම; කර්මකාරභස්ත්‍රාඉව, කම්කරුවන්ගේ ගිනිදල්වන හම්යන්ත්‍රයක්මෙන්; ශ්වසන්අපි, හුස්මවාතය නික්මවන්නේද; නජීවති, දිවිඇත්තේ නොවේ.

ඉන්ද්‍රිය නිග්‍රහය නොකරන්නාගේ ආත්මයෙන් ප්‍රයොජන නැතිබව ආදිය.

208 ධනෙන කිං යො න දදාති නාශ්නුතෙ
බලෙන කිං යශ්ච රිපූන් න බාධතෙ.
ශ්‍රුතෙන කිං යො න ච ධර්මමාචරෙත්
කිමාත්මනා යො න ජිතෙන්ද්‍රියො භවෙත්.

යත්, යම්කාරණයෙකින්; නදදාති, ද්‍රව්‍ය නොදේද; නඅශ්නුතෙ, අනුභව නොකෙරේද; ධනෙන, ද්‍රව්‍යයෙන්; කිං, ප්‍රයොජනනොවේ. යත්ච, යම් කාරණයෙකින්; රිපූන්, සතුරන්; නබාධතෙ, නොවලක්වාද; බලෙන, ශක්තියෙන්; කිං, ප්‍රයොජනනොවේ. යත්, යම්කාරණයෙකින්; ධර්මං, සුචරිතක්‍රියාවෙහි; නචආචරෙත්, නොහැසිරෙන්නේද; ශ්‍රැ

තෙන, ශාස්ත්‍රදැනීමෙන්; කිං, ප්‍රයොජනනොවේ. යඃ, යමෙක්තෙම; ජිතෙන්ද්‍රියඃ, දිනනලද ඉඳුරන්ඇත්තේ; නභවෙත්, නොවන්නේද; ආත්මනා, ඇත්මයෙන්; කිං, ප්‍රයොජනනොවේ.

අනුභව නොකිරීම හෙතුකොටගෙණ ලොභ තැනැත්තා
දිලිඳුන් හා සමාන සි.

209 අසම්භොගෙන සාමාන්‍යං කෘපණස්‍ය ධනං පරෛඃ
අස්‍යෙදමිති සම්බන්ධො හානෞ දුඃඛෙන ගම්‍යතෙ.

කෘපණස්‍ය, ලොභයාගේ; ධනං, ධනයතෙම; අසම්භොගෙන, අනුභව නොකිරීම හෙතුකොටගෙණ; පරෛඃ, දිළිඳුන්හා; සාමාන්‍යං, සමානබවවේ. හානෞ, ද්‍රව්‍යනටකල්හි; දුඃඛෙන, දුකට පැමිණීම හෙතුකොටගෙණ; ඉදම්, මේතෙම; අස්‍යඉති, මොහුගේය යන; සම්බන්ධඃ, සම්බන්ධයතෙම; ගම්‍යතෙ, හැගේ.

ලොභ තැනැත්තාගේ ධනය ගිනිසොර රජයන මොවුන්හා
සාධාරණත්වයට යනබව.

210 න දෙවාය න විප්‍රාය න බන්ධුභ්‍යො න චාත්මනෙ
කෘපණස්‍ය ධනං යාති වහ්නිතස්කරපාර්ථිවෛඃ.

කෘපණස්‍ය, ලොභතැනැත්තාගේ; ධනං, ධනය; දෙවාය, දෙවියන්ටද; න, නොවේ. විප්‍රාය, බමුනන්ටද; න, නොවේ. බන්ධුභ්‍යඃ, නෑයන්ටද; න, නොවේ. ආත්මනෙ, තමාටද; නයාති, නොපැමිණේ. වහ්නිතස්කරපාර්ථිවෛඃ, ගිනි—සොර—රජ—යන මොවුන්හා සමග සාධාරණබවට; යාති, පැමිණේ.

තමා අනුභව නොකරන්නාවූ නොදෙන්නාවූ
ධනය නස්නාබව.

211 දානං භොගො නාශස්තිස්‍රො ගතයො භවන්ති විත්තස්‍ය
යො න දදාති න භුංක්තෙ තස්‍ය තෘතීයා ගතිර්භවති.

දානං, දීමද; භොගඃ, අනුභවයද; නාශඃ, විනාශයදයන; විත්තස්‍ය, ද්‍රව්‍යයාගේ; තිස්‍රඃගතයඃ, පැවතීම්තුනක්; භවන්ති, වෙත්. යඃ, යමෙක්තෙම; නදදාති, ද්‍රව්‍යනොදේද; නභුංක්තෙ, අනුභව නොකෙරේද; තස්‍ය, ඔහට; තෘතීයාගතිඃ, තුන්වෙනිවූ පැවැත්මයයි කියනලද ධනවිනාශය තොමෝ; භවති, වන්නීය.

### ලොකයෙහි නොලැබියහැකි කාරණ සතරක්.

212 දානං ප්‍රියවාක්සහිතං ඥානමගර්වං ක්ෂමාන්විතං ශෞර්‍ය්‍යම්
ත්‍යාගසහිතං ච විත්තං දුර්ලභමෙතච්චතුර්භද්‍රම්.

ප්‍රියවාක්සහිතං, ප්‍රිය වචනයෙන් යුක්තවූ; දානං, දීමද; අගර්වං, අහංකාරනැත්තාවූ; ඥානම්, නුවණද; ක්ෂමාන්විතම්, ඉවසීමඇත්තාවූ; ශෞර්‍ය්‍යම්, ශූරභාවයද; ත්‍යාගසහිතං, දීමෙන්යුක්තවූ; විත්තංච, ධනයද යන; එතත් ච තුර්භද්‍රම්, මේ උතුම් කාරණ සතර; දුර්ලභම්, ලැබිය නොහේ.

### ධනරැස්කටයුතුවෙයි, බොහෝකොටද රැස්නොකටයුතුවෙයි,

213 කර්තව්‍යඃ සඤ්චයො නිත්‍යං කර්තව්‍යො නාතිසඤ්චයඃ
පශ්‍ය සඤ්චයශීලො සෞ ධනුෂා ජම්බුකො හතඃ,

නිත්‍යම්, නිරන්තරයෙන්; සඤ්චයඃ, ද්‍රව්‍ය රැස්කිරීමතෙම; කර්තව්‍යඃ, කටයුතු. අතිසඤ්චයඃ, අතිශයින් රැස්කිරීමතෙම; නකර්තව්‍යඃ, නොකටයුතු. සඤ්චයශීලඃ, ද්‍රව්‍ය රැස්කරණ ස්වභා ඇත්තාවූ; අසෞජම්බුකඃ, මේ සිවල්තෙම; ධනුෂා, දුන්නෙන්; හතඃ, නසනලද්දේවේ. පශ්‍ය, මේ කාරණය බලව.

### සත්වයන්ගේ ප්‍රාණහානියට කාරණ.

214 ජලමග්නිර්විෂං ශස්ත්‍රං ක්ෂුද්ව්‍යාධිඃ පතනං ගිරෙඃ
නිමිත්තං කිඤ්චිදාසාද්‍ය දෙහී ප්‍රාණෛර්විමුච්‍යතෙ.

ජලම්, දියද, අග්නිඃ, ගිනිද; විෂම්, විෂද; ශස්ත්‍රං, ආයුධද; ක්ෂුත්, ක්ෂුධාවද; ව්‍යාධිඃ, රොගද; ගිරෙඃ, පර්වතයකෙරෙන්; පතනං, වැටීමදයන; කිඤ්චිත්නිමිත්තං, කිසිකාරණයකට; ආසාද්‍ය, පැමිණ; දෙහී, සත්වතෙම; ප්‍රාණෛඃ, ප්‍රාණයන්විසින්; විමුච්‍යතෙ, මුදනුලැබේ.

### නොසිතනලද්දාවූ සැපදුක් සත්වයන්ට පැමිණෙනබව.

215 අචින්තිතානි දුඃඛානි යථෛවායාන්ති දෙහිනාම්
සුඛාන්‍යපි තථා මන්‍යෙ දෛවමත්‍රාතිරිච්‍යතෙ.

දෙහිනාම්, සත්වයන්ට; අචින්තිතානි, නොසිතනලද්දාවූ; දුඃඛානි, දුඃඛයෝ; යථාඑවආයාන්ති, යම්පරිද්දෙකින් පැමිණෙද්ද; සුඛානිඅපි, සැපයෝද; තථාමන්‍යෙ, එබඳුයයි සිතමි. අත්‍ර, මෙහි, දෛවම්, භාග්‍යය; අතිරිච්‍යතෙ, ඉතිරිවනුලැබේ.

එක්තර සිවලෙකුගේ ලොභසංභගත අදහසක්.

216 මාසමෙකං නරො යාති ද්වෞ මාසෞ මෘගශූකරෞ
අහිරෙකං දිනං යාති අද්‍ය භක්‍ෂ්‍යො ධනුර්ගුණඃ.

නරඃ, මනුෂ්‍යතෙම; ඒකංමාසං, එක්මාසයක් මුලුල්ලෙහි; යාති, ආහාරබවටයෙයි. මෘගශූකරෞ, මුවාහා ඌරාද යන දෙදෙනා, ද්වෞ මාසෞ, මාසදෙකක් මුලුල්ලෙහි අනුභව කටයුතුබවටයෙත්; අහිඃ, සර්පතෙම; එකංදිනං, එක්දිනයෙහි අනුභව කටයුතුබවට; යාති, පැමිණේ, ධනුර්ගුණඃ, දුන්නට අයිතිවූ නහරමය රැහැණ; අද්‍ය, අදදිනයෙහි; භක්‍ෂ්‍යඃ, කෑයුතුවේ.

යමක්දේද, යමක් අනුභවකෙරේද ධනවන්තයාටලත්
ධනය එපමණබව.

217 යද් දදාති යදශ්නාති තදෙව ධනිනො ධනම්
අන්‍යෙ මෘතස්‍ය ක්‍රීඩන්ති දාරෛරපි ධනෛරපි,

යත්, යම්ද්‍රව්‍යයක්; දදාති, දේද. යත්, යම්ද්‍රව්‍යයක්; අශ්නාති, අනුභවකෙරේද. ධනිනඃ, ධනඇත්තා සත්තකවූ; ධනම්, ධනයතෙම; තත් එව, එපමණමය. මෘතස්‍ය, මළතැනැත්තාගේ; දාරෛඃඅපි, අඹුවන්හා සමගද; ධනෛඃඅපි, ධනයන්හා සමගද; අන්‍යෙ, සෙස්සෝ; ක්‍රීඩන්ති, ක්‍රීඩාකෙරෙත්.

218 යද්දදාති විශිෂ්ටෙභ්‍යො යච්චාශ්නාති දිනෙ දිනෙ
තත්තෙ විත්තමහං මන්‍යෙ සෙව්‍යං කස්‍යාපි රක්‍ෂසි.

යත්, යම්ද්‍රව්‍යයක්; විශිෂ්ටෙභ්‍යඃ, ගුණවතුන්ට; දදාති, දේද. යත්, යම්ද්‍රව්‍යයක්; දිනෙ දිනෙ, සියලුදවස්හි; අශ්නාති, අනුභවකෙරේද. තත්විත්තං, ඒ ධනය; තෙ, තාගේයයි; අහංමන්‍යෙ, මම සිතමි, සෙව්‍යං, අනුභවකටයුතු ධනය; කස්‍යඅපි, කවරෙක්හට වනාහි; රක්‍ෂසි, රක්‍ෂාකෙරෙහිද.

පණ්ඩිතයන්ගේ ස්වභාවය.

219 නාප්‍රාප්‍යමභිවාඤ්ඡන්ති නෂ්ටං නෙච්ඡන්ති ශොචිතුම්
ආපත්ස්වපි න මුහ්‍යන්ති නරාඃ පණ්ඩිතබුද්ධයඃ.

පණ්ඩිතබුද්ධයඃ, පණ්ඩිතබුද්ධිඇති; නරාඃ, මනුෂ්‍යයෝ; අප්‍රාප්‍යං, නොලැබියයුතු ධනය; නාභිවාඤ්ඡන්ති, කැමතිනොවෙත්. නෂ්ටං, නැසුනුදෙයට; ශොචිතුං, ශොකකිරීමටද; නෙච්ඡන්ති, කැමතිනොවෙත්. ආපත්සුඅපි, විපත්තීන්ට පැමිණිකල්හිද; නමුහ්‍යන්ති, මුළානොවෙත්.

ශාස්ත්‍රඋගත්තේවී නමුත් අලසතැනැත්තේ අඥනවෙයි.

220 ශාස්ත්‍රාණ්‍යධීත්‍යාපි භවන්ති මූර්ඛා යස්තු ක්‍රියාවාන් පුරුෂඃ ස විද්වාන්

සුචින්තිතං චෞෂධමාතුරාණාං න නාමමාත්‍රෙණ කරොත්‍යරොගම්.

ශාස්ත්‍රාණි, ශාස්ත්‍රයන්; අධීත්‍යඅපි, ප්‍රගුණකොටද; මූර්ඛාඃභවන්ති, අඥනයෝවෙත්. ක්‍රියාවාන්, ක්‍රියාඇත්තාවූ; යඃපුරුෂඃතු, යම් පුරුෂයෙක් වනාහි වේද; සඃ, හෙතෙම, විද්වාන්, පණ්ඩිතවේ. සුචින්තිතව, මනාකොට සොදනලද්දවූද; ඖෂධං, බෙහෙත, නාමමාත්‍රෙණ, නාමය පමණින්; ආතුරාණාම්, රෝගඇත්තවුන්ගේ; අරොගම්, නිරොගිබව; න කරොති, නොකෙරේ.

උගත් ශාස්ත්‍රයඇතත් උත්සාහනැත්තාහට එයින් ගුණයක් නොලැබෙණබව.

221 න ස්වල්පමප්‍යධ්‍යවසායභීරොඃ කරොති විඥනවිධිර්ගුණං හි

අන්ධස්‍ය කිං හස්තතලස්ථිතොපි ප්‍රකාශයත්‍යර්ථමිහ ප්‍රදීපඃ,

විඥනවිධිඃ, ශාස්ත්‍රඉගණීමතෙම; අධ්‍යවසාය භීරොඃහි, උත්සාහයෙහි භය තැනැත්තාහට වනාහි; ස්වල්පංඅපි, මදකුත්; ගුණං, ගුණයක්; නකරොති, නොකෙරේ. අන්ධස්‍ය, අන්ධයාගේ; හස්තතලස්ථිතඃඅපි, අත්ලෙහිවූද; ප්‍රදීපඃ, ප්‍රදීපයතෙම; ඉහ, මෙලොකයෙහි; අර්ථම්, ද්‍රව්‍යයක්; ප්‍රකාශයති කිම්, කෙසේ ප්‍රකාශකෙරේද නොහැක්කෝමය.

ලද්දවූ දුක්සැපදෙක සෙවනය කටයුතුබව.

222 සුඛමාපතිතං සෙවෙත් දුඃඛමාපතිතං තථා

චක්‍රවත් පරිවර්තන්තෙ දුඃඛානි ච සුඛානි ච.

ආපතිතං, පැමිණියාවූ; සුඛම්, සැපත; සෙවෙත්, සෙවනයකරන්නේය. තථා, එසේම; ආපතිතං, පැමිණියාවූ, සුඛම්, සැපතද සෙවනයකරන්නේය. දුඃඛානිච, දුඃඛයෝද; සුඛානිච, සැපයෝද; චක්‍රවත්, රථචක්‍රයක්මෙන්; පරිවර්තන්තෙ, පෙරලෙත්.

සියලු සම්පත් උත්සාහකරන්නාකරා පැමිණෙනබව.

223 නිපානමිව මණ්ඩූකාඃ සරඃ පූර්ණමිවාණ්ඩජාඃ

සොද්‍යොගං නරමායාන්ති විවශාඃ සර්වසම්පදඃ.

මණ්ඩූකාඃ, මැඩියෝ; නිපානංඉව, සිව්පාවන්ගේ පැන්බිම සඳහා කරණලද වළක්කරාමෙන්ද; අණ්ඩජාඃ, මත්ස්‍යයෝ; පූර්ණම්, පිරුණාවූ; සරඃ

ඉව, විලක්කරමෙන්ද; විවශාඃ, ක්ෂුද්‍රසුනුවූ නොහොත් අයිතිනුවූ; සර්වස
ම්පදඃ, සියලු සම්පත්තිහු; සඋද්‍යොගං, උත්සාහසහිතවූ; නරං, මනුෂ්‍ය
යාකරා; ආයාන්ති, පැමිණෙත්.

ශ්‍රී ශ්‍රෙ සියලන්වනතැනැත්තෝ.

224 උත්සාහසම්පන්නමදීර්ඝසූත්‍රං ක්‍රියාවිධිඥං ව්‍යසනෙෂ්වසක්තම්
ශූරං කෘතඥං දෘඪසෞහෘදඤ්ච ලක්ෂ්මීඃ ස්වයං යාති නිවාස
හෙතොඃ.

උත්සාහසම්පන්නං, උත්සාහයෙන් යුක්තවූ; අදීර්ඝසූත්‍රම්, කටයුත්තෙහි
බොහෝකල් නොයවන්නාවූ; ක්‍රියාවිධිඥං, ක්‍රියාවිධිදන්නාවූ; ව්‍යස
නෙෂු, ව්‍යසනයන්හි; අසක්තම්, නොඇලෙන්නාවූ; ශූරං, ශූරවූ; කෘත
ඥං, කළඋපකාරදන්නාවූ; දෘඪසෞහෘදංච, ස්ථිරවූ මිත්‍රයන් ඇත්තාවූ පු
රුෂයාකරාද; ලක්ෂ්මීඃ, ඉසුර; ස්වයම්, තමා; නිවාසහෙතොඃ, විසීම හෙ
තුකොටගෙණ; යාති, එළඹෙන්නීය.

නොයෙක්ස්වභාවයෝ.

225 විනාප්‍යර්ථෛර්ධීරඃ ස්පෘශති බහුමානොන්නතිපදං
සමායුක්තොප්‍යර්ථෛඃ පරිභවපදං යාති කෘපණඃ.
ස්වභාවාදුද්භූතාං ගුණසමුදයාවාප්තිවිෂයාං
ද්‍යුතිං සෛංහීං කිං ශ්වා ධෘතකනකමාලොපි ලභතෙ.

අර්ථෛඃ, ධනවලින්; විනාඅපි, වෙන්වද; ධීරඃ, පණ්ඩිතතෙම; බහුමා
න, බොහෝසේ සැලකියයුතුවූ; උන්නතිපදං, උසස්වූ ස්ථානය; ස්පෘ
ශති, ආශ්‍රයකෙරේ. කෘපණඃ, ලොභතැනැත්තේ; අර්ථෛඃ, ධනවලින්;
සමායුක්තඃඅපි, යුක්තවූයේද; පරිභවපදං, ගර්හාකටයුතු ස්ථානයට; යා
ති, පැමිණේ; මේ කුමක්ද; උද්භූතාං, උපන්නාවූන්ගේ; ස්වභාවාත්, ස්ව
භාව හෙතුවෙන්වේද; ගුණසමුදයඅවාප්තිවිෂයාං, ගුණසමූහයාගේ
පැමිණීම්ගොචර ස්වභාවයෙන්වේද. ධෘතකනකමාලඃඅපි, රන්මාලාව
ක් පැළැන්දවූද; ශ්වා, බලුතෙම, සෛංහීං ද්‍යුතිං, සිංහයා පිළිබඳවූ
බැබලීම; කිංලභතෙ, කෙසේලබාද.

මිනිසුන්ගේ දිළිඳුබවහා ධනවත්බවත් නිත්‍යනොවේ.

226 ධනවානිති හි මදසෙත කිං ගතවිභවො විෂාදමුපයාසි
කරනිහිතකන්දුකසමාඃ පාතොත්පාතා මනුෂ්‍යාණාම්.

ධනවාන්ඉති, ධනඇත්තේමැයි; තෙ, තාගේ; මදඃහි, අහංකාරයවනා
හි; කිං, කුමටද; ගතවිභවඃ, පිරිහුනාවූ ධනඇත්තේ; විෂාදං, දුකට; උ

පයාසි, පැමිණෙහි. මනුෂ්‍යාණං, මිනිසුන්ගේ; පාතළත්පාතාඃ, දිළිඳු බවහා ධනවත්බවද යනමොහු; කරනිහිත, අත්ලෙහි තබණලද්දාවූ; තන්දුකසමාඃ, පන්දුවක්හා සමානවෙත්.

බ නා දී න් ගේ අ නි ස්ථි ර භා ව ය.

227 අභ්‍රච්ඡායා බලප්‍රීතිනිවශස්‍යානි යොෂිතඃ
කිඤ්චිත්කාලොපභොග්‍යානි යෞවනානි ධනානි ච.

අභ්‍රච්ඡායා, වලාපටලයෙහි සෙවනද; ඛලප්‍රීතිඃ, දුර්ජනයාගේ ප්‍රේමය ද; නවශස්‍යානි, අළුත්වූ ධාන්‍යයෝද; යොෂිතඃ, ස්ත්‍රීහුද; යෞවනානි, තරුණඅවස්ථාවෝද; ධනානිච, ධනයෝද; කිඤ්චිත්කාලඋපභොග්‍යානි, මඳකාලයෙක්හි අනුභවකටයුතුවෙත්.

ජීවිකාව පිණිස අධික උත්සාහ නොකටයුතුබව.

228 වෘත්‍යර්ථං නාතිචෙෂ්ටෙත සා හි ධාත්‍රෛව නිර්මිතා
ගර්භාදුත්පතිතෙ ජන්තෞ මාතුඃ ප්‍රස්‍රවතඃ ස්තනෞ.

වෘත්තිඅර්ථං, ජීවිකාව පිණිස; නඅතිචෙෂ්ටෙත, අධික උත්සාහ නො කරන්නේය. සාහි, ඒ ජීවිකාව වනාහි; ධාත්‍රාඑව. බ්‍රහ්මයාවිසින්ම; නිර් මිතා, මවනලද්දීය. ගර්භාත්, මවගේ ගර්භයකෙරෙන්; ජන්තෞ, ජනයා; උත්පතිතෙ, නැගිකල්හි; මාතුඃ, මවගේ; ස්තනෞ, පයොධරවයතුම්; ප්‍රස්‍රවතඃ, කිරිවගුරුවත්.

ජීවත්වීමට ප්‍රයොජනවූද්‍රව්‍ය ලැබෙණ අන්දම.

229 යෙන ශුක්ලීකෘතා හංසාඃ ශුකාශ්ච හරිතීකෘතාඃ
මයූරාශ්චිත්‍රිතා යෙන ස තෙ වෘත්තිං විධාස්‍යති.

යෙන, යමක්හුවිසින්; හංසාඃ, හංසයෝ; ශුක්ලීකෘතාඃ, සුදුපැහැ ඇතිකරණලද්දාහුද; ශුකාඃච, ගිරාපක්ෂීහුද; හරිතීකෘතාඃ, යමක්හු විසින් කශාවර්ණකරණ ලද්දාහුද; මයූරාඃ, මයූරයෝ; යෙන, යමක්හු විසින්; චිත්‍රිතාඃ, රෙඛාඇතිකරණ ලද්දාහුද; සඃ, හෙතෙම; තෙ, තට; වෘත්තිං, දිවිරැකිම; විධාස්‍යති, විධානකරන්නේය.

ධනය හෙතුකොටගෙණ සැපනැතිබව.

230 ජනයන්ත්‍යර්ජනෙ දුඃඛං තාපයන්ති විපත්තිෂු
මොහයන්ති ච සම්පත්තෞ කථමර්ථාඃ සුඛාවහාඃ.

අර්ජනෙ, ද්‍රව්‍යරැස්කිරීමෙහි; දුඃඛංජනයන්ති, දුක් උපදවත්. විපත්ති ෂු, ධනයනටකල්හි; තාපයන්ති, සිතතැවීමකෙරෙත්, සම්පත්තෞ, ධ

නයඇතිකල්හි; මොහයනතිව, මුළාද කෙරෙත්. අජීඃ, ධනයෝ; කථං, කෙසේනම්; සුඛාවහාඃ, සැපඑළවන්නාහුද.

යමක්හුගේ ද්‍රව්‍යයන් කෙරෙහි ආශාව ධර්‍මය සඳහා නම් ඔහුගේ ධනයෙහි ආශා නොකිරීමම උතුම්වේ.

231 ධර්‍මාර්ථං යස්‍ය විත්තෙහා වරං තස්‍ය නිරීහතා
ප්‍රක්ෂාලනාඞ්‍ධි පඞ්කස්‍ය දූරදස්පර්ශනං වරම්.

යස්‍ය, යමක්හුගේ; විත්තේහා, ධනආශාව; ධර්‍මාර්ථං, ධර්‍මය ප්‍රයොජනකොටවේද; තස්‍ය, ඔහුගේ; නිරීහතා, ආශානොවනබව; වරං, උතුම්වේ. පඞ්කස්‍යහි, කර්‍දමයාගේ වනාහි; ( මඩ ) ප්‍රක්ෂාලනාත්; පිරිසිදු කිරීමටවඩා; දූරාත්, දුරින්; අස්පර්ශනං, නොතැවරීම; වරං, උතුම්වේ.

ධනවත්හයා සියලුතැන්හිම සෙසු ජනයාගේ ද්‍රව්‍ය පැහැරගන්නාබව.

232 යථා හ්‍යාමිෂමාකාශෙ පක්ෂිභිඃ ශ්වාපදෛර්භුවි
භක්ෂ්‍යතෙ සලිලෙ මත්ස්‍යෛස්තථා සර්‍වත්‍ර විත්තවාන්.

ආකාශෙ, අහස්හි; පක්ෂිභිඃ, පක්ෂීන්විසින්ද; භුවි, පොළෝතලයෙහි; ශ්වාපදෛඃ, දිවි වලස්ආදි චණ්ඩකරණ සිව්පාවන් විසින්ද; සලිලෙ, දියෙහි; මත්ස්‍යෛඃ, මසුන්විසින්ද; යථාහි භක්ෂ්‍යතෙ, යම් පරිද්දෙකින් ඒ ඒ සත්වතෙම කණුලැබේද; තථා, එපරිද්දෙන්; විත්තවාන්, ධනවත්තෙම; සර්‍වත්‍ර, සැමතැන්හි සෙස්සන්ගේ ද්‍රව්‍ය අනුභවකෙරේ.

මරණයකෙරෙන් සත්වයන්ට නිතර භයඑළවන්නාමෙන් ධන ඇත්තාහටත් නිතර භයඑළවනබව.

233 රාජතඃ සලිලාදග්නෙශ්චෞරතඃ ස්වජනාදපි
භයමර්ථවතාං නිත්‍යං මෘත්‍යොඃ ප්‍රාණභෘතාමිව.

රාජතඃ, රජුකෙරෙන්ද; සලිලාත්, ජලයකෙරෙන්ද; අග්නෙඃ, ගින්නකෙරෙන්ද; චෞරතඃ, සොරකෙරෙන්ද; ස්වජනාත්අපි, තමා පිළිබඳ ජනයාකෙරෙන්ද; ප්‍රාණභෘතාං, සත්වයන්ට; මෘත්‍යොඃඉව, මරණය කෙරෙන් භයඑළවන්නාමෙන්ද; අර්ථවතාං, ධනඇත්තවුන්ට; නිත්‍යං, නිරන්තරයෙන්; භයං, භයඑළවා.

ධනාශාවයයි කියනලද සැපතක්නැතිහෙයින් සත්වයාකෙරෙහි ධනාශාවට වැඩිතරම් දුකක් නැත්තේය.

234 ජන්මනි ක්ලෙශබහුලෙ කින්නු දුඃඛමතඃ පරම්
ඉච්ඡාසම්පද් යතො නාස්ති යච්චෙච්ඡා න නිවර්තතෙ.

ඉච්ඡාසම්පත්, ආශාවයයි යන සැපතක්; යතඃනාස්ති, යම් කාරණයෙකින් නැත්තේද; ඉච්ඡා, ධනආශාතොමෝ; යත්‍රනනිවර්තතෙ, සම්තැනෙක්හි නොනවත්නීද ඒකාරණයෙන්; අතඃපරම්, ඒ ධනආශාවට වැඩිවූ; දුඃඛම්, දුකෙක්, ක්ලෙශබහුලෙ, අධිකවූ දුක්ඇති; ජනමනි, සංසාරයෙහි; කිනැනු, කොයිද.

ලද්දාවූ ධනයාගේ නාශයිය යම්හෙයකින් මරණයසමානද
එහෙයින් ධනය නොසිතන්නේය යනබව.

235 ධනං තාවදසුලභං ලබ්ධං කෘච්ඡ්‍රෙන පාල්‍යතෙ
ලබ්ධනාශො යථා මෘත්‍යුස්තස්මාදෙතන්න චින්තයෙත්.

ධනං, ධනයතෙම; තාවත්, පළමුකොට; අසුලභං, ලැබියනොහේ. ලබ්ධං, ලබනලද ධනය; කෘච්ඡ්‍රෙන, දුකින්; පාල්‍යතෙ, රක්නාලැබේ. ලබ්ධනාශඃ, ලබනලද ධනයාගේ හානිය; යථාමෘත්‍යුඃ, යම් කාරණයෙකින් මරණයද; තස්මාත්, ඒ කාරණයෙන්; එතත්, මේ ධනය; නචින්තයෙත්, නොසිතන්නේය.

ඒ ආශාව ඉදින් හැරියේවීනම් දිළිඳෙක්හෝ ධනවතෙක්
නැත්තේය.

236 සා තෘෂ්ණා චෙත් පරිත්‍යක්තා කො දරිද්‍රඃ ක ඊශ්වරඃ
තස්‍යාශ්චෙත් ප්‍රසරො දත්තො දාස්‍යඤ්ච ශිරසි ස්ථිතම්.

සාතෘෂ්ණා, ඒ ආශාතොමෝ; චෙත්පරිත්‍යක්තා, ඉදින්හරණලද්දීද; දරිද්‍රඃ, දිළිඳෙක්නම්; කඃ, කවරෙක්ද; ඊශ්වරඃ, ධනවතෙක්; කඃ, කවරෙක්ද; තස්‍යාඃ, ඒ තෘෂ්ණාවට; ප්‍රසරඃ, ඉපදීමට හෙවත් හැසිරීමට අවකාශය; චෙත්දත්තඃ, ඉදින්දෙනලද්දේද; දාස්‍යඤ්ච, දාසභාවයද; ශිරසි, මුදුනෙහි; ස්ථිතම්, සිටියේවේ.

යම් යම් පරිද්දෙකින් ආශාව පවතීද එහෙයින්
ආශාවපවතී යනබව.

237 යද්‍යදෙව හි වාඤ්ඡෙත තතො වාඤ්ඡා ප්‍රවර්තතෙ
ප්‍රාප්ත එවාර්ථඃ සොර්ථො යතො වාඤ්ඡා නිවර්තතෙ.

යත්යත්එවහි, යමක් යමක් වනාහි; වාඤ්ඡෙත, කැමැතිවන්නේද; තතඃ, එහෙයින්; වාඤ්ඡා, ආශාතොමෝ; ප්‍රවර්තතෙ, පවතී හෙවත් වඩී. යතඃ, යම්කාරණයෙකින්; වාඤ්ඡා, ආශාතොමෝ; නිවර්තතෙ, නවතීද. සඃඅර්ථඃ, ඒ කාරණයතෙම; අර්ථඃ, අර්ථවශයෙන්; ප්‍රාප්තඃඑව, පැමිණියේමය.

### උත්තමයන්ගේ ප්‍රේමය දිවිකෙළවරකොට පවත්නාබව.

238 ආමරණාන්තාඃ ප්‍රණයාඃ කොපාස්තත් ක්‍ෂණභංගුරාඃ
පරිත්‍යාගාශ්ච නිඃසඞ්ගා භවන්ති හි මහාත්මනාම්.

මහාත්මනාම්, උතුම්සිත්ඇත්තවුන්ගේ; ප්‍රණයාඃ, ප්‍රේමයෝ; ආමරණාන්තාඃ, මරණය කෙළවරකොට ඇත්තාහුවෙත්. කොපාඃ, කොපයෝ; තත්ක්‍ෂණභංගුරාඃ, එකෙණෙහිනස්නා සුලුවෙත්. නිඃසඞ්ගාඃ, ඇලීම්රහිතවූ; පරිත්‍යාගාඃච, දනක්‍රියාවෝද; භවන්තිහි, වෙත්මැයි.

### සත්පුරුෂයන්ගේ විපත්ති දුරලීමට සත්පුරුෂයෝම පොහොසත්බව.

239 සන්ත එව සතාං නිත්‍යමාපදුද්ධරණක්‍ෂමාඃ
ගජානාං පඞ්කමග්නානාං ගජා එව ධුරන්ධරාඃ.

සන්තඃඑව, සත්පුරුෂයෝම; නිත්‍යං, නිරන්තරයෙන්; සතාං, සත්පුරුෂයන්ගේ; ආපත්උද්ධරණක්‍ෂමාඃ, විපත්තිදුරලීමට පොහොසත්වෙත්. පඞ්කමග්නානාං, මඩෙහි ගිළුනාවූ; ගජානාං, ඇතුන්ගේ; ධුරන්ධරාඃ, ඔසවාලන්නාහු; ගජාඃඑව, හස්තිහුමවෙත්.

### ගුණවතුන්කෙරෙහි ගුණවතෙක්ම මුත් අසත්පුරුෂයකුගේ සතුටක් නැතිබව.

240 ගුණී ගුණඥෙ රමතෙ නාගුණශීලස්‍ය ගුණිනි පරිතොෂඃ
අලිරෙති බලාත් කමලං න හි භෙකස්තවෙකවාසොපි.

ගුණඥඃ, පණ්ඩිතතෙම; ගුණිනි, ගුණඇත්තාකෙරෙහි; රමතෙ, ඇළෙ. අගුණශීලස්‍ය, ගුණස්වභාවනැත්තාහුගේ; ගුණිනි, ගුණඇත්තාකෙරෙහි; පරිතොෂඃන, සන්තොෂයෙක් නැත්තේය. අලිඃ, බමරතෙම; බලාත්, බලයෙන්; කමලංඑති, පියුමක්කරා පැමිණේ. එකවාසඃඅපි, එක් සථානයෙහි විසීම ඇත්තාවූද; භෙකඃතු, මැඩිතෙම වනාහි; නහි, පියුමකරා නොපැමිණේ.

### පැමිණියාවූ යාචකාදීන්ට ආහාරදී සතුටුකිරීමට ප්‍රශංසා.

241 ශ්ලාඝ්‍යඃ ස එකො භුවි මානවානාං
ස උත්තමඃ සත්පුරුෂඃ ස ධන්‍යඃ.
යස්‍යාර්ථිනො වා ශරණාගතා වා
නාශාවිභින්නා විමුඛාඃ ප්‍රයාන්ති.

යස්‍ය, යමක්හුගේ; ශරණ ආගතාඃවා, පිහිටසඳහා පැමිණියෝහෝ; අර්ථිනොවා, යාචකයෝහෝ; ආශාවිභින්නාඃ, කඩවූ ආශාඇත්තාහු; විමු

රාඃ, පිටිපාතෙහෙත් නොසතුටුවූවාහු; නප්‍රයාන්ති, නොයෙද්ද; භුවි, පොළෝතලයෙහි; මානවානාං, මිනිසුන්අතුරෙන්; එකඃසඃ, හුදකලාවූ හෙතෙම; ශ්ලාඝ්‍යඃ, පූජ්‍යවේ. සඃ, හෙතෙම; උත්තමඃ, උතුම්වේ. සඃ, හෙතෙම; සත්පුරුෂඃ, සත්පුරුෂවේ, ධන්‍යඃ, පිණැත්තේවේ.

භයින්මිදීමපිණිස පිහිට ප්‍රාර්ථනාකොට ආවෙකුට පිහිටනොවීමෙහි දෙෂ.

242 ලොභාද්වාථ භයාද්වාපි සන්ත්‍යජෙච්ඡරණාගතම්
බ්‍රහ්මහත්‍යා සමං තස්‍ය පාපමාහුර්මනීෂිණඃ

ලොභාත්වා, ලොභය හෙතුකොටගෙණහෝ; අථවා, නොහොත්; භයාත්අපි, භය හෙතුකොටගෙණහෝ; ශරණාගතම්, පිහිටසඳහා ආශ්‍රයටහෝ ගෙටපැමිණියකු; සන්ත්‍යජෙත්, හරණේද; තස්‍ය, ඕහුගේ; පාපම්, පාපයතෙම; බ්‍රහ්මහත්‍යාසමං බ්‍රාහ්මණයන් මරන්නකුහා සමය යි; මනීෂිණඃ, පණ්ඩිතයෝ; ආහුඃ, කීහු.

මිත්‍රයෝ සතර දෙනෙක්.

243 ඖරසං කෘතසම්බන්ධං තථා වංශක්‍රමාගතම්
රක්ෂකං ව්‍යසනෙභ්‍යශ්ච මිත්‍රං ඥෙයං චතුර්විධම්.

ඖරසං, සමානගොත්‍රඇති ස්ත්‍රියගෙන් තමානිසා උපන් පුත්‍රද; කෘතසම්බන්ධං, කරණලද උපකාරඇත්තාද; තථා, එසේම්; වංශක්‍රමාගතම්, කුලපරම්පරාවෙන් ආ තැනැත්තාද; ව්‍යසනෙභ්‍යඃ, විපත්තිවලින්; රක්ෂකම්, රක්ෂාකරන්නාදයන; චතුර්විධම්, සතරපරිදි ඇත්තාවූ; මිත්‍රං, මිත්‍රතෙම; ඥෙයං, දතයුතු.

ලින්පැන්ආදී ද්‍රව්‍යසතරක ස්වභාව.

244 කූපොදකං වටච්ඡායා ශ්‍යාමාස්ත්‍රී ඉෂ්ටකාලයම්
ශීතකාලෙ භවෙදුෂ්ණමුෂ්ණකාලෙ ච ශීතලම්.

කූපඋදකං, ලින්පැන්ද; වටච්ඡායා, නුගගස සෙවනද; ශ්‍යාමාස්ත්‍රී, කළු රන්වන් ස්ත්‍රීද; ඉෂ්ටකාලයම්, උලුගෙයද; ශීතකාලෙ, ශීතකාලයෙහි; උෂ්ණම්භවෙත්, උෂ්ණවන්නේය. උෂ්ණකාලෙච, උෂ්ණකාලයෙහිද, ශීතලම්, ශීතවන්නේය.

ඒ ඒ අයවලුන්ට බලඇති ස්ථාන.

245 අම්භාංසි ජලජන්තූනාං දුර්ගං දුර්ගනිවාසිනාම්
ස්වභූමිඃ ශ්වාපදාදීනාං රාඥාං සෛන්‍යං පරං බලම්.

ජලජන්තූනාං, දියෙහි වසන සත්වයන්ට; අම්භාංසි, ජලයන්ද; දුර්ගනිවාසිනාම්, යානොහැකි පර්වතවිවරආදී විෂමස්ථානයන්හි වසන්නාවූ

න්ට; දුර්ගං, යානොහැකි විෂමස්ථානද; භයාපදාදිනාම්, සිංහව්‍යාඝ්‍රාදි චණ්ඩමෘගයන්ට; ස්වභූමිඃ, තමාගේ ස්ථානයද; රාජ්‍යං, රජුන්ට; සෙනාඥං, සෙනාව වසන ස්ථානයද; පරංබලම්, උතුම්බලයයි.

ස්ත්‍රීන්නිසා පුරුෂයාගේ හික්මීම් ආදිය වෙනස්වයනබව.

246 සන්මාර්ගේ තාවදාස්තෙ ප්‍රභවති පුරුෂස්තාවදෙවෙන්ද්‍රියාණාං
ලජ්ජාං තාවද්විධත්තෙ විනයමපි සමාලම්බතෙ තාවදෙව.
භ්‍රෑචාපාකෘෂ්ටමුක්තාඃ ශ්‍රවණපථගතා නීලපක්ෂ්මාණ එතෙ
යාවල්ලීලාවතීනාං න හෘදි පරිණතා දෘෂ්ටිවාණාඃ පතන්ති.

ලීලාවතීනාං, ස්ත්‍රීන්ගේ; ශ්‍රවණපථගතාඃ, කථාඇසෙනතැන්හිවූ; භ්‍රෑචාප, බැමනැමැති දුන්නෙන්; ආකෘෂ්ටමුක්තාඃ, ඇදහරණලද්දාවූ; පරිණතාඃ, නමනලද්දාවූ; නීලපක්ෂ්මාණඃ, නීලවර්ණවූ ඇස්ලෝම යෝයයි කියනලද්දාවූ; එතෙදෘෂ්ටිවාණාඃ, මේ බැලීමනැමැති ඊදඬු; හෘදි, පිරිමින්ගේ සිත්හි; යාවත්නපතන්ති, යම්තාක් නොවැටේද්ද; තාවත්, ඒතාක්කල්; සන්මාර්ගේ, මනාපැවැත්මෙහි; ආස්තෙ, හිඳී; පුරුෂඃ, පුරුෂ තෙම; තාවදෙව, ඒතාක්ම; ඉන්ද්‍රියාණාම්, චක්ෂුරාදි ඉන්ද්‍රියයන්ගේ; ප්‍රභවති, දමනයෙහි පොහොසත්වේ, තාවත්, ඒතාක්; ලජ්ජාං, ලජ්ජාව; විධත්තෙ, උසුලා; තාවදෙව, ඒතාක්කල්ම; විනයංඅපි, හික්මීමද; සමාලම්බතෙ, ආශ්‍රයකෙරේ,

ස්වභාවයෙන් ස්ත්‍රීන්ගේ පවත්නා දෝෂයෝ.

247 අසත්‍යං සාහසං මායා මාත්සර්‍ය්‍යං චාතිලුබ්ධතා
නිර්ගුණත්වමශෞචත්වං ස්ත්‍රීණාං දෝෂාඃ ස්වභාවජාඃ.

අසත්‍යං, බොරුකීමද; සාහසං, රලුවීමද; මායා, නුගුණවැසීමද; මාත්සර්‍ය්‍යං, ධනාදිය අනුන්ට නොලැබ තමාටම ලැබීමට කැමතිවීමද; අතිලුබ්ධතාච, බලවත් ලොභබවද; නිර්ගුණත්වං, ගුණනැතිබවද; අශෞචත්වං, පිරිසිදුනොවනබවද යනමොහු; ස්ත්‍රීණාං, ස්ත්‍රීන්ගේ; ස්වභාවජාඃ, තමාගේ බලයෙන් උපන්නාවූ; දෝෂාඃ, දෝෂයෝවෙත්.

අ ඹු ව ගේ පැ ව තු ම්.

248 සා භාර්‍ය්‍යා යා ගෘහෙ දක්ෂා සා භාර්‍ය්‍යා යා ප්‍රජාවතී
සා භාර්‍ය්‍යා යා පතිප්‍රාණා සා භාර්‍ය්‍යා යා පතිව්‍රතා.

යා, යම්ස්ත්‍රියක්; ගෘහෙ, ගෙයිකටයුතු ක්‍රියාවෙහි; දක්ෂා, දක්ෂද; සා, ඕතොමෝ; භාර්‍ය්‍යා, අඹුවන්නීය. යා, යම්ස්ත්‍රියක්; ප්‍රජාවතී, දරුවන්ඇත්තිද; සා, ඕතොමෝ; භාර්‍ය්‍යා, අඹුවන්නීය. යා, යම්ස්ත්‍රියක්; පතිප්‍රාණා,

ස්වාමියා ජීවිතයමෙන් සිතන්නීද; සා, ඕතොමෝ; භාර්‍ය්‍යා, අඹුවන්නීය. යා, යම්ස්ත්‍රියක්; පතිව්‍රතා, ස්වාමියාඇර අන්පුරුෂයන් නොපතන්නීද; සා, ඕතොමෝ; භාර්‍ය්‍යා, අඹුවන්නීය,

### නොයෙක්දෙනාගේ රූපලක්ෂණය ලැබෙණ ක්‍රමය.

249 කොකිලානාං ස්වරො රූපං නාරීරූපං පතිව්‍රතම්
විද්‍යා රූපං කුරූපාණං ක්ෂමා රූපං තපස්විනාම්.

කොකිලානාං, කොවුල්යන නම්ඇති පක්ෂීන්ගේ; ස්වරඃ, ශබ්දයතෙම; රූපං, මනාරූපයවේ. පතිව්‍රතම්, ස්වාමියා ප්‍රාර්ථනාකිරීම; නාරීරූපං, ස්ත්‍රීන්ගේ මනාරූපයනම් වන්නේය; කුරූපාණම්, අප්‍රිය රූපය ඇත්තවුන්ට; විද්‍යාරූපං, තමාළගත් විද්‍යාවරූපනම් වන්නේය. තපස්විනාම්, තපොව්‍රත ඇත්තවුන්ට; ක්ෂමා, ඉවසීමතොමෝ; රූපං, මනාරූපයයි.

### අඹුවයයි නොකියයුතු ස්ත්‍රීහු.

250 න සා භාර්‍ය්‍යෙති ඛ්‍යාතව්‍යා යස්‍යාං භර්ත්තා න තුෂ්‍යති
අග්නිසාක්ෂිකමප්‍යෙෂා භර්ත්තා හි ශරණං ස්ත්‍රියාඃ.

යස්‍යාං, යම් අඹුවක්කෙරෙහි, භර්ත්තා, ස්වාමිතෙම; නතුෂ්‍යති, සතුටුනොවේද; සා, ඕතොමෝ; භාර්‍ය්‍යාඉති, අඹුවයයි; නඛ්‍යාතව්‍යා, ප්‍රකාශනොකටයුත්තීය. අග්නිසාක්ෂිකමප්‍යෙෂාදඃ, ගිනිසම්පයට පැමිණීමඉම් කොටඇති; භර්ත්තා, ස්වාමිතෙම; ස්ත්‍රියාඃ, ස්ත්‍රියගේ; සරණම්, පිහිටවේ.

### ශරීරබලයටවඩා උපායමහත්බව.

251 උපායෙන හි යච්ඡක්‍යං න තච්ඡක්‍යං පරාක්‍රමෛඃ
ශෘගාලෙන හතො හස්ති ගච්ඡතා පඞ්කවර්ත්මනා.

උපායෙනහි, උපායෙන් වනාහි; යත්ශක්‍යං, යමක් කළහැකිවේද; තත්, එය; පරාක්‍රමෛඃ, අනුභාව වලින්; නශක්‍යං, කළනොහේ. පඞ්කවර්ත්මනා, මඩඇතිමාර්ගයෙන්; ගච්ඡතා, යන්නාවූ; ශෘගාලෙන, සිවලාවිසින්; හස්ති, ඇත්තෙම; හතඃ, නසනලද්දේය.

### ස්වාමිබවටසුදුස්සෙක්.

252 කුලාචාරජනාචාරෛරතිශුද්ධඃ ප්‍රතාපවාන්
ධාර්ම්මිකො නීතිකුශලඃ ස ස්වාමි යුජ්‍යතෙ භුවි.

කුලආචාර, කුලචාරිත්‍රද; ජනආචාරෛඃ, ජනයාගේ චාරිත්‍රද යන මෙයින්; අතිශුද්ධඃ, ඉතාපිරිසිදුවූ; ප්‍රතාපවාන්, තෙජස්ඇත්තාවූ; ධාර්මිකඃ, ධර්මයෙන් හැසිරෙන්නාවූ; නීතිකුශලඃ, නීතිශාස්ත්‍රයෙහි දක්ෂවූ, සඃ ස්වාමී, ඒ ස්වාමිතෙම; භුවි, පොළොවෙහි; යුජ්‍යතෙ, යෙදේ,

රජක් පුරවරට ඕනෑබව.

253 රාජානං ප්‍රථමං විඥෙත් තතො භාය්‍යාං තතො ධනම්
රාජන්‍යසති ලොකෙස්මින් කුතො භාය්‍යා කුතො ධනම්.

රාජානං, රජකු; ප්‍රථමංවිඥෙත්, පළමුකොට ලබන්නේය. තතඃ, පසුව; භාය්‍යාං, අඹුවකු ලබන්නේය. තතඃ, පසුව; ධනම්, ධනයලබන්නේය. රාජනි අසති, රජ්ජුරුවන්නැති කල්හි; අස්මින්ලොකෙ, මේලොකයෙහි; භාය්‍යා, අඹුතොමෝ, කුතඃ, කොයිද; ධනම්, ධනයක්; කුතඃ, කොයිද,

වැසිවැසීමමෙන් රජ්ජුරුවන් ජනයාට ආධාරබව.

254 පර්ජන්‍ය ඉව භූතානාමාධාරඃ පෘථිවීපතිඃ
විකලෙපි හි පර්ජන්‍යෙ ජීව්‍යතෙ න තු භූපතෞ.

පෘථිවීපතිඃ, රජතෙම; පර්ජන්‍යඃඉව, වැසිමෙන්; භූතානාං, සත්වයන්ට; ආධාරඃ, ආධාරවේ. පර්ජන්‍යෙ, වැසි; විකලෙපිහි, වෙනස්වූකල්හිද; ජීව්‍යතෙ, ජීවත්වේ; භූපතෞ, රජ්ජුරුවන් වෙනස්වූ කල්හි; න තු, ජීවත්නොවේ.

රජ්ජුගෙන් වන වැඩ.

255 නියතවිෂයවර්ත්තී ප්‍රායශො දණ්ඩයොගාජ්
ජගති පරවශෙස්මින් දුර්ලභඃ සාධුවෘත්තඃ.
කෘශමපි විකලං වා ව්‍යාධිතං වා ධනං වා
පතිමපි කුලනාරී දණ්ඩභීත්‍යාභ්‍යුපෛති.

දණ්ඩයොගාත්, රජුන්විසින් දඬුවම් යෙදීම හෙතුකොටගෙණ; ප්‍රායශඃ, බොහෝසේ; නියතවිෂයවර්ත්තී, නියමවූ අයැති දෙයෙහි පවත්නාසුලුවේ. පරවශෙ, අනුන්ට අයිතිවූ; අස්මින් ජගති, මේ ලොකයෙහි; සාධුවෘත්තඃ, මනාපැවතුම්ඇතිවෙක්; දුර්ලභඃ, ලැබියනොහේ, කුලනාරී, කුලවත් ස්ත්‍රීතොමෝ; දණ්ඩභීත්‍යා, දඬුවමට භයහෙතුකොට ගෙණ; කෘශංඅපි, වැරුණාවූද; (ශරීරයෙහි මාංශ අඩුවූ) විකලංවා, ඇස්ආදිය වෙනස්වූහෝ; ව්‍යාධිතංවා, රොගයට පැමිණියාවූහෝ; අධනංවා, දිළිඳුවූහෝ; පතිංඅපි, ස්වාමිපුරුෂයාකරාද; අභ්‍යුපෛති, පැමිණේ.

අසත්පුරුෂයන්කෙරේ නොඇලුනු තැනැත්තන් වැඩෙනබව.

256 යදි සත්සංගරහිතො භවිෂ්‍යසි භවිෂ්‍යසි
යදි සජ්ජනගොෂ්ඨීෂු පතිෂ්‍යසි පතිෂ්‍යසි.

යදි, යම්කලෙක්නි; අසත්සංගරහිතඃ, දුර්ජ්ජනයන්හා සමග ඇළුම් නැත්තේ; භවිෂ්‍යසි, වන්නෙහිද, භවිෂ්‍යසි, වැඩෙන්නෙහිය. යදි, යම්

කලෙක්හි; අසජ්ජනගොෂ්ඨිෂු, අඥාන පිරිවරජනයන් කෙරෙහි; පතිෂ්‍යසි, ඇළිම්වශයෙන් වැටෙන්නෙහිද; පතිෂ්‍යසි, වැටෙන්නෙහිය ඉන් වත් මැරෙන්නෙහිය.

දෙශඇතිකල්හි අනාජීඵලවනබව.

257 එකස්‍ය දුඃඛස්‍ය න යාවදන්තං ගච්ඡාම්‍යහං පාරමිවාර්ණවස්‍ය
තාවද්විතීයං සමුපස්ථිතං මෙ ඡිද්‍රෙෂ්වනර්‍ථා බහුලීභවන්ති.

අර්ණවස්‍ය, සාගරයාගේ; පාරංඉව, එතරටයාම නොහැකිවූවාක්මෙන්; අහං, මම; එකස්‍යදුඃඛස්‍ය, එක දුකකගේ; අන්තං, කෙළවරට; යාවත්න ගච්ඡාමි, යම්තාක් නොපැමිණෙම්ද; තාවත්, ඒතාක්; මෙ, මට; විතීයං, දෙවෙනිදුකක්; සමුපස්ථිතං, එළඹසිටියේය. ඡිද්‍රෙෂු, දෙශඇතිකල්හි; අනර්ථාඃ, හානිහු; බහුලීභවන්ති, බහුලවෙත්,

ස්වභාවයෙන් හටගත් මිත්‍රභාවය නැතිනොවනබව.

258 ස්වභාවජං තු යන්මිත්‍රං භාග්‍යෙනෛවාභිජායතෙ
තදකෘත්‍රිමසෞහාර්‍දමාපත්ස්වපි න මුඤ්චති.

ස්වභාවජං, ස්වභාවයෙන් හටගත්තාවූ; යත්මිත්‍රංතු, යම් මිත්‍රතාවක් වනාහි; භාග්‍යෙනඑව, වාසනාව හෙතුකොටගෙණම; අභිජායතේ, උපදීද; තත්අකෘත්‍රිමසෞහාර්‍දං, නොකරණලද්දාවූ ඒ මිත්‍රභාවයතෙම; ආපත්සු අපි, විපත්තීන් එළඹසිටිකල්හිදු; නමුඤ්චති, නොම්දේ.

ස්වභාවයෙන් හටගත් මිත්‍රධර්‍මයෙහි බලය.

259 න මාතරි න දාරෙෂු න සොදර්‍යෙ න චාත්මජෙ
විශ්වාසස්තාදෘශඃ පුංසාං යාදෘඞ්මිත්‍රෙ ස්වභාවජෙ.

ස්වභාවජෙ, ස්වභාවයෙන් උපන්නාවූ; මිත්‍රෙ, මිත්‍රයාකෙරෙහි; යාදෘක් විශ්වාසඃ, යම්බඳුවූ විශ්වාසයෙක් ඇද්ද; තාදෘශඃ, එබඳුවූ විශ්වාසයෙක්; පුංසාං, පුරුෂයන්ගේ; මාතරි, මවකෙරෙහිද; න, නැත්තේය. දාරෙෂු, අඹුවන්කෙරෙහිද; න, නැත්තේය. සොදර්‍යෙ, සහෝදරයාකෙරෙහිද; න, නැත්තේය, ආත්මජෙ, පුත්‍රයාකෙරෙහිද; නච, නැත්තේවේ;

තමාගේ ක්‍රියාවට සුදුසුයයි සිතන සැපදුක් අන්‍යජාතියෙක්හි
ලැ බි ය යු තු ය ය නා දී ය.

260 ස්වකර්‍මසන්තානවිචෙෂ්ටිතානි කාලාන්තරාවර්ත්ති ශුභාශුභානි
ඉහෛව දෘෂ්ටානි මයෛව තානි ජන්මාන්තරාණිව
දශාන්තරාණි,

ස්වකර්මසන්තාප, තමාගේ ක්‍රියාවගේ නැවීමවූ; විචෙෂ්ටිතානි, කර්මයෝ; කාලාන්තරවෘත්ති, අන්‍යකාලයෙක්හි පවත්නාවූ; ශුභාශුභාණි, සැපදුක් විපාකයෝවෙත්. ජන්මාන්තරාණි, අන්‍යජාතියෙක්හිවූ; දෘශ්‍යාන්තරාණිඉව, දශ්ඩවූ අන්‍යාර්ථයෝමෙන්; තානි, ඕහු; ඉහඑව, මේ ලොකයෙහිදීම; මයාඑව, මාවිසින්ම; දෘෂ්ටානි, දක්නාලද්දුහුයි.

ශරීරය—සැපත—එක්වීම—ඉපදීම—යනමේ සතරෙහි ස්වභාවය.

261 කායඃ සන්නිහිතාපායඃ සම්පදඃ පදමාපදාම්
සමාගමාඃ සාපගමාඃ සර්වමුත්පාදි භඞ්ගුරම්.

කායඃ, ශරීරයතෙම; සන්නිහිත, සමීපයෙහි යෙදී පවත්නාවූ; අපායඃ, වෙන්වීමහෝ විනාශයවේ. සම්පදඃ, සම්පත්තීහු; ආපදාම්, විපත්තීන්ගේ; පදම්, ස්ථානයවේ; සමාගමාඃ, ධනාදීන්ගේ එක්වීම්හු; සාපගමාඃ, පහවීම්වශයෙන් විනාශසහිතවෙත්. උත්පාදි, ඉපදීමඇති ද්‍රව්‍යය; සර්වම්භංගුරං, සියල්ලබිඳෙන සුලුවේ,

මිත්‍රං—යන අක්ෂරදෙක නැමැති රත්නයාගේ උතුම්බව.

262 ශොකාරාතිභයත්‍රාණං ප්‍රීතිවිශ්‍රම්භභාජනම්
කෙන රත්නමිදං සෘෂ්ටං මිත්‍රමිත්‍යක්ෂරද්වයම්.

ශොක, ශොකයකෙරෙන්ද; ආරාතිභය, සතුරන්ගේ භයකෙරෙන්ද; ත්‍රාණං, රක්ෂාකරන්නාවූ; ප්‍රීති, ප්‍රීතියද; විශ්‍රම්භ, විශ්වාසයදයන මීට; භාජනම්, ස්ථානවූ; මිත්‍රංඉති, මිත්‍රංයන; අක්ෂරද්වයම්, අකුරුදෙකනම්වූ; ඉදංරත්නම්, මේ රත්නයතෙම; කෙන, කවරක්හුවිසින්; සෘෂ්ටං, මවනලද්දේවේද.

ශොභන අශොභන මිත්‍රයෝ.

263 මිත්‍රං ප්‍රීතිරසායනං නයනයොරානන්දනං චෙතසඃ
පාත්‍රං යත් සුඛදුඃඛයොඃ සහ භවෙන්මිත්‍රෙණ තද් දුර්ලභම්.
යෙ චාන්‍යෙ සුහෘදඃ සමෘද්ධිසමයෙ ද්‍රව්‍යාභිලාෂාකුලා
ස්තෙ සර්වත්‍ර මිලන්ති තත්වනිකෂග්‍රාවා තු තෙෂාං විපත්.

මිත්‍රං, මිත්‍රතෙම; නයනයොඃ, නෙත්‍රදෙක්හි; ප්‍රීතිරසායනං, රසායනනම් බෙහෙතක්මෙන් ප්‍රීතිඑළවාද; චෙතසඃ, චිත්තයාගේ; ආනන්දනං, සන්තොෂය කරන්නාවූ; භාජනං, ස්ථානද; යත්, යමෙක්තෙම; සුඛදුඃඛයොඃ, සැපදුක්දෙක්හි; මිත්‍රෙණසහභවෙත්, මිත්‍රයාහාසමග වේද; තත්, එබඳුමිත්‍රයෙක්; දුර්ලභං, ලැබීම අපහසුවේ. ද්‍රව්‍යාභිලාෂාකුලාඃ, ධනආශාවෙන් කැලඹුනාවූ; යෙචඅන්‍යෙ සුහෘදඃ, යම් ඉතිරිමිත්‍රු

යෝද්ද; තෙ, ඕහු; සර්වත්‍ර, සැමතැන්හි; විලසන්ති, ගැළපෙත්. තෙෂාං ත්‍රි, ඔහුන්ට වනාහි; තත්වනිකෂග්‍රාවා, ඇති ස්වභාවය අවබොධකිරීම පිණිස පරීක්ෂාකරණ උරගලක්මෙන්; විපත්, විපත්තිවළුවා.

ස්ථිරවූකාරණයන්හැර නියමනුවූ කාරණයන් සෙවනයකරන්නාහුගේ
නියමවූ කාරණයන් හානිවනබව.

264 යො ධ්‍රුවාණි පරිත්‍යජ්‍ය අධ්‍රුවාණි නිෂෙවතෙ
ධ්‍රුවාණි තස්‍ය නශ්‍යන්ති අධ්‍රුවං නෂ්ටමෙව හි.

යඃ, යමෙක්තෙම; ධ්‍රුවාණි, ස්ථිරවූ නොහොත් නියමවූ කාරණයන්; පරිත්‍යජ්‍ය, දුරුකොට; අධ්‍රුවාණි, ස්ථිරනොවූ නොහොත් නියමනුවූකාරණයන්; නිෂෙවතෙ, ආශ්‍රයකෙරේද; තස්‍ය, ඕහුගේ; ධ්‍රුවාණි, නියමවූ කාරණයෝ; නශ්‍යන්ති, නැසෙත්, අධ්‍රුවංහි, නියමනුවූ කාරණය වනාහි; නෂ්ටංඑව, නැසුනේමය.

ප්‍රථමපබතියෙහි අවසාන ශ්ලොකය.

265 මිත්‍රං ප්‍රාප්නුත සජ්ජනා ජනපදෛඃ ලක්ෂ්මීඃ සමාල
ම්බ්‍යතාම්
භූපාලාඃ පරිපාලයන්තු වසුධාං ශශ්වත් ස්වධර්මේ ස්ථිතාඃ.
ආස්තාං මානසතුෂ්ටයෙ සුකෘතිනාං නීතිර්නවොඪෙව වඃ
කල්‍යාණං කුරුතාං ජනස්‍ය භගවාංශ්චන්ද්‍රාර්ධචූඩාමණිඃ.

සජ්ජනාඃ, සත්පුරුෂයෝ; මිත්‍රං, මිත්‍රබවට; ප්‍රාප්නුත, පැමිණෙත්. නොහොත්, සජ්ජනාඃ, සත්පුරුෂවරුනි; මිත්‍රං, මිත්‍රබවට; ප්‍රාප්නුත, පැමිණෙව්වා. ජනපදෛඃ, දෙශයන්විසින්; ලක්ෂ්මීඃ, සම්පත්තිතොමෝ; සමාලම්බ්‍යතාං, මනාකොට වැලඳගන්නා ලැබේවා. භූපාලාඃ, රජහු; ශශ්වත්, නිරන්තරයෙන්; ස්වධර්මේ, තමාගේමනාරාජනීතියෙහි; ස්ථිතාඃ, පිහිටියාහු; වසුධාං, පොළොව; පරිපාලයන්තු, රකිත්වා. නීතිඃ, නීතිශාස්ත්‍රයතොමෝ; නවොඪාඉව, අළුත විවාහකරණලද භාය්‍යාවක්මෙන්; සුකෘතිනාං, සුචරිතයෙහි යෙදෙන්නාවූ; වඃ, තොපගේ; මානසතුෂ්ටයෙ, සිත පිළිබඳවූ සන්තොසය පිණිස; ආස්තාං, හිඳීවා. භගවාන්, පිණැත්තාවූ; චන්ද්‍රාර්ධචූඩාමණිඃ, අර්ධචන්ද්‍රනැමැති ශිඛාමාණික්‍යයතෙම; ජනස්‍ය, ජනයාගේ; කල්‍යාණං, මංගල්‍යය; කුරුතාං, කෙරේවා.

# හිතොපදෙශයෙහි දෙවනභාගය.

වැඩෙන්නාවූ සෙනහස කෙළාම්කියන්නාවූ අඥානයන් විසින් නැතිකරණබව.

266 වර්ධමානො මහාස්නෙහො මෘගෙන්ද්‍රවෘෂයොර්වනෙ
පිශුනෙනාතිලුබ්ධෙන ජම්බුකෙන විනාශිතඃ.

වනෙ, වනයෙහි; මෘගෙන්ද්‍රවෘෂයොඃ, සිංහ—ගවදෙදෙනාගේ; වර්ධමානඃ, වඩනුලබන්නාවූ; මහාස්නෙහඃ, මහත් ප්‍රෙමයතෙම; පිශුනෙන, මිත්‍රභෙදය කරන්නාවූ; අතිලුබ්ධෙන, බලවත්ලොභවූ; ජම්බුකෙන, සිවලාවිසින්; විනාශිතඃ, නසනලද්දේවේ.

තමා ධනයෙන්හා නුවණගුණආදියෙන් අඩුයයිසිතීමෙහිවැඩ.

267 අධොධඃ පශ්‍යතඃ කස්‍ය මහිමානොපචීයතෙ
උපර්‍යුපරි පශ්‍යන්තඃ සර්වෙ එව දරිද්‍රති.

අධඃඅධඃ, පාතපාත හෙවත් තමා ධනාදියෙන් පාත්යයි; පශ්‍යතඃ; දක්නාවූ හෙවත් සලකන්නාවූ; කස්‍ය, කවරෙකුගේනම්; මහිමා, අනුභාවතොමෝ; නඋපචීයතෙ, රැස්කරණු නොලැබේද; උපරිඋපරි, මත්තෙහි මත්තෙහි හෙවත් සැපආදියෙන් අධිකයයි; පශ්‍යන්තඃ, දක්නාවූ; සර්වෙඑව, සියල්ලම; දරිද්‍රති, දිළිඳුවේ.

ධනවන්තයා ගුණනැත්තෙක්වුවත් පූජ්‍යවනබව.

268 බ්‍රහ්මහාපි නරඃ පූජ්‍යො යස්‍යාස්ති විපුලං ධනම්.
ශශිනස්තුල්‍යවංශොපි නිර්ධනඃ පරිභූයතෙ.

යස්‍ය, යමෙකුට; විපුලංධනං, බොහෝවූ ධනයතෙම; අස්ති, ඇත්තේද. නරඃ, ඒ මනුෂ්‍යතෙම; බ්‍රහ්මහාපි, බ්‍රාහ්මණයන් මරන්නෙක්වූයේද; පූජ්‍යඃ, ජනයාවිසින් පිදියයුතුවේ. නිර්ධනඃ, දිළිඳු පුරුෂතෙම; ශශිනඃ, චන්ද්‍රයාහා; තුල්‍යවංශඃ අපි, සමානවූ ගොත්‍ර ඇත්තේද; පරිභූයතෙ, ජනයාවිසින් නින්දාකරණුලැබේ.

වෙළඳම් නොකරන්නාවූ අලසයාකරා සැපත ලන්නොවනබව.

269 අව්‍යවසායිනමලසං දෛවපරං සාහසාච්ච පරිහීනම්
ප්‍රමදෙව හි වෘද්ධපතිං නෙච්ඡත්‍යුපගූහිතුං ලක්ෂ්මීඃ.

අව්‍යවසායිනම්, වෙළඳම්කිරීමක් නැත්තාවූ; අලසං, කම්මැළිවූ; දෛවපරං, වාසනාවෙන් පිටත්වූ; සාහසාත්, අපරාධය හෙතුකොටගෙණ;

පරිහිනං, පිරිහුනු තැනැත්තා; උපගූහිතුං, වැළඳගැණීමට; ලජ්ජතිඃ, සම්පත්තෙනොමෝ; හි, යම්කාරණයකින්; ප්‍රමදා, තරුණභාගස්ත්‍රීතෙනොමෝ; චාඛපතිංඉව, මහලු පුරුෂයා වැළඳගැන්මට නොකැමැතිවන්නාක් මෙන්; නාභිවඤ්ඡති, කැමතිනොවේ.

ශ්‍රෙෂ්ඨ බව ට බා ධ ක කා ර ණ.

270 ආලස්‍යං ස්ත්‍රීසෙවා සරොගතා ජන්මභූමිවාත්සල්‍යම්
සන්තොෂො භීරුත්වං ෂඩ් ව්‍යාඝාතා මහත්වස්‍ය.

ආලස්‍යඃ, කම්මැලිබවද; ස්ත්‍රීසෙවා, ස්ත්‍රීන්ගේ සෙවනයකිරීමද; සරොගතා, රොගසහිතබවද; ජන්මභූමිවාත්සල්‍යං, ජන්මභූමියෙහි ඇලෙනබවද; සන්තොෂඃ, සතුටද; භීරුත්වං, භය ස්වභාවදශන; ෂට්, මේ කාරණ සය. මහත්වස්‍ය, පූජ්‍යබව; ව්‍යාඝාතාඃ, හානිකරන්නාහුවෙත්.

ස ම්පා ත් නො වැ ඩී ම ට කා ර ණ.

271 සම්පදා සුස්ථිතම්මන්‍යො භවති ස්වල්පයාපි යඃ
කෘතකෘත්‍යො විධිම්මන්‍යෙ න වර්ධ්‍යති තස්‍ය තාම්.

යඃ, යමෙක්තෙම; ස්වල්පයාඅපි, මඳවූද; සම්පදා, ධනසම්පත් හෙතුකොටගෙණ; සුස්ථිතං, මනාවපිහිටියෙකැයි; මන්‍යඃ, අහංකාරඇත්තේ; භවති, වේද. කෘතකෘත්‍යඃ, බොහෝ ධනසම්පත් ඇත්තෙක්; විධිඃ මන්‍යෙ, බ්‍රහ්මයා යයි සිතන්නේද; තස්‍ය, ඔහුගේ; තාං, ඒ සම්පත්තිය; න වර්ධ්‍යති, නොවැඩේ.

ලො ව නො ල ද හැ කි වෙ ක්.

272 නිරුත්සාහං නිරානන්දං නිර්වීර්‍ය්‍යමරිනන්දනම්
මාස්ම සීමන්තිනී කාචිත් ජනයෙත් පුත්‍රමීදෘශම්.

නිරුත්සාහං, උත්සාහ නැත්තාවූ; නිරානන්දං, සතුටුනොවන්නාවූ; නිර්වීර්‍ය්‍යම්, වීර්‍ය්‍යරහිතවූ; අරිනන්දනම්, සතුරුපක්ෂය සතුටුකරන්නාවූ; ඊදෘශම් පුත්‍රං, මෙබඳු පුත්‍රයකු; කාචිත් සීමන්තිනී, කිසි ස්ත්‍රියක් තොමෝ; මාස්මජනයෙත්, නොවදුවා.

ධ න ස ප ව ත් ව න ක්‍ර ම ය.

273 අලබ්ධං චෛව ලිප්සෙත ලබ්ධං රක්ෂෙදවෙක්ෂයාත්
රක්ෂිතං වර්ධයෙත් සම්‍යක් වෘද්ධං තීර්ථෙෂු නික්ෂිපෙත්.

අලබ්ධංචඑව, නොලද්දාවූ ධනයද; ලිප්සෙත, කැමතිවන්නේය. ලබ්ධං, ලද්දාවූ ධනය; අවෙක්ෂයාත්, බැලීමෙන්; රක්ෂෙත්, රක්නේය, ර

සඤ්චිතං, රක්නාලද ධනය; වර්ධියෙන්, දියුණුකරන්නේය. වෘධං, වැඩුනාවූ ධනය; තීර්ථෙෂු, භාජනවූ සුදුසුස්ථානයන්හි; සම්‍යක්, මනාව පරිත්‍යාගකිරීම් වශයෙන්; නිඃක්ෂිපෙත්, ප්‍රවෙශකරන්නේය.

ධ නා ය ප ව ත් ව න ක්‍ර ම ය.

**274** අඤ්ජනස්‍ය ක්ෂයං දෘෂ්ට්වා වල්මීකස්‍ය ච සඤ්චයම්
අවන්ධ්‍යං දිවසං කුර්‍ය්‍යාත් දානාධ්‍යයනකර්මභිඃ.

අඤ්ජනස්‍ය, ඇසගානාඅඳුනගේ; ක්ෂයංදෘෂ්ට්වා, කෙළවරවීමබලා (ධනය මඳමඳවද වියදම් නොකරන්නේය) වල්මීකස්‍ය, තුඹසගේ; සඤ්චයච, රැස්වීමද; (බලා මඳමඳවූවත් ධනය රැස්කරන්නේය) දානාධ්‍යයන කර්මභිඃ, දීමය—ඉගෙණගැන්මය—ක්‍රියාය යන මෙයින්; දිවසං, දිනය; අවන්ධ්‍යංකුර්‍ය්‍යාත්, සිස්නොකරන්නේය.

ධ නා දි ය වැ ඩෙ න ක්‍ර ම ය.

**275** ජලබින්දුනිපාතෙන ක්‍රමශඃ පූර්‍ය්‍යතෙ ඝටඃ
ස හෙතුඃ සර්වවිද්‍යානාං ධර්මස්‍ය ච ධනස්‍ය ච.

ජලබින්දුනිපාතෙන, දියබින්දුවැටීමෙන්; ඝටඃ, කලයතෙම; ක්‍රමශඃ, (ඩිඳ ඩිඳව) පිළිවෙළින්; පූර්‍ය්‍යතෙ, පිරේ. සර්වවිද්‍යානාං, සියලුශාස්ත්‍රයන්ගේද; ධර්මස්‍යච, සුචරිතයාගේද; ධනස්‍යච, ධනයාගේද වැඩීමෙහි; සඃ හෙතුඃ, හෙතෙමකරුණුයි.

කා ර ණ ස ත ර ක්.

**276** කොතිභාරඃ සමර්ථානාං කිං දූරං ව්‍යවසායිනාම්
කො විදෙශඃ සවිද්‍යානාං කඃ පරඃ ප්‍රියවාදිනාම්.

සමර්ථානාං, බලඇත්තවුන්ට; අතිභාරඃ, අධිකබරෙක්නම්; කඃ, කවරේද; ව්‍යවසායිනාං, වෙළඳම්කරන්නාවූන්ට; දූරංකිං, දුරනම් කුමක්ද; සවිද්‍යානාං, දත්තාවූ ශාස්ත්‍රඇත්තවුන්ට; කඃ විදෙශඃ, අන්‍ය දෙශයනම් කවරේද; ප්‍රියවාදිනාං, ප්‍රියවචනඇත්තවුන්ට; කඃපරඃ, සතුරෙක්නම් කිම.

වෙ ළ ඳ ම් ක ට සු තු ඛ ව.

**277** කරෙතු නාම නීතිඥෝ ව්‍යවසායමිතස්තතඃ
ඵලං පුනස්තදෙව ස්‍යාද් යද්විධෙර්මනසි ස්ථිතම්.

නීතිඥඃ, නීතිශාස්ත්‍රයදන්නා පුරුෂතෙම; ඉතස්තතඃ, මෙරටින්ද ඒරටින්ද; ව්‍යවසායංනාම, වෙළඳම්නම්; කරෙතු, කෙරේවා. විධෙඃ, බ්‍රහ්ම

සාගේ; මනසි, සිත්හි; යත්සචිතම්, යමක් පැවැත්තේද; තත්ඵලංඑව, ඒ ඵලයම; පුනඃසයාත්, පසුව වන්නේය.

සියලු ක්‍රියාවන්ගේ බාධාවද සැකයද හළුනාබව.

**278** විසමයඃ සර්වථා හෙයඃ ප්‍රත්‍යූහඃ සර්වකර්මණාං

තස්මාද්විසමයමුත්සෘජ්‍ය සාධ්‍යසිද්ධිර්විධීයතාං.

විසමයඃ, ආශ්චර්‍ය්‍යයද; සර්වකර්මණාම්, සියලුක්‍රියාවන්; ප්‍රත්‍යූහඃ, බාධාකරණ සැකයද; සර්වථා, සියලුලෙසින්; හෙයඃ, දුරුකටයුතුවේ. තස්මාත්, ඒ කාරණයෙන්; විසමයං, විස්මය; උත්සෘජ්‍ය, ඉවත්කොට; සාධ්‍යසිද්ධිඃ, කටයුතුදෙය සිඩකිරීමතොමෝ; විධීයතාං, කරණුලැබේවා.

බලවත් පීඩාවට පැමිණි තැනැත්තාගේ ආයුෂය මර්මස්ථානයන් රක්නාබව.

**279** නිමග්නස්‍ය පයොරාශෞ පර්වතාත් පතිතස්‍ය ච

තක්ෂකෙණාතිදෂ්ටස්‍ය ආයුර්මර්මාණි රක්ෂති.

පයොරාශෞ, ගැඹුරුජලයෙහිහි; නිමග්නස්‍ය, ගිලුනාහුගේද; පර්වතාත්, පර්වතයකෙරෙන්; පතිතස්‍යච, වැටුනාහුගේද; තක්ෂකෙණ, නාගයකු විසින්; අතිදෂ්ටස්‍ය, දෂ්ටකරණලද්දාහුගේද; ආයුඃ, ආයුතෙම; මර්මාණි, මර්මස්ථානයන්; රක්ෂති, රකී.

ඊදඬු සියයකින් විද්දේවී නමුත් මැරියයුතු කාලය නොපැමිණියත් නොමියනබව.

**280** නාකාලෙ ම්‍රියතෙ ජන්තුර්විඩඃ ශරශතෛරපි

කුශාග්‍රෙණෛව සංස්පෘෂ්ටඃ ප්‍රාප්තකාලො න ජීවති.

ශරශතෛඃඅපි, ඊදඬු සියයෙකින්නමුදු; විඩඃ, විදිනාලද්දාවූ; ජන්තුඃ, සත්වතෙම; අකාලෙ, මරණයට නියමනුවූ කාලයෙහි; නම්‍රියතෙ, නොමියේ. ප්‍රාප්තකාලඃ, පැමිණියාවූ මරණයට සුදුසුකල්ඇති තැනැත්තේ; කුශාග්‍රෙණ එව, තණකොල අගෙකින්ම; සංස්පෘෂ්ටඃ, වන්නේ; නජීවති; ජීවත්නොවේ.

අනුන් විසින් රක්ෂානොකරණ ලද්දේද වාසනාවවිසින් රක්නාලද්දේ ජීවත්වෙයි. මනාකොට රක්ෂාකරණ ලද්දේද වාසනාව නැතිකල්හි නැසෙයි යනාදිය.

**281** අරක්ෂිතං තිෂ්ඨති දෛවරක්ෂිතං සුරක්ෂිතං දෛවහතං විනශ්‍යති

ජීවත්‍යනාථොපි වනෙ විසර්ජිතඃ කෘතප්‍රයත්නොපි ගෘහෙ න ජීවති.

අරක්ෂිතඃ, අනුන්විසින් රක්ෂානොකරණලද්දාවූ; දෛවරක්ෂිතං, වාසනාවවිසින් රක්ෂාකරණලද තැනැත්තේ; තිෂ්ඨති, පවතී. දෛවහතං, ව්‍යසනයෙන් නසනලද්දාවූ; සුරක්ෂිතං, මනාකොට රක්ෂාකරණලද තැනැත්තේ; විනශ්‍යති, නසී. වනෙවිසර්ජිතඃ, වනයෙහි හරණලද්දාවූ; අනාථඃඅපි, ස්වාමියෙක්නැති තැනැත්තේද; ජීවති, ජීවත්වේ. කෘතප්‍රයත්නඃඅපි, අනුන්විසින් උත්සාහකරණලද තැනැත්තේද; ගෘහෙ, ගෘහයෙහි; නජීවති, ජීවත්නොවේ.

බලයෙන් ස්වාමිබවට පැමිණි තැනැත්තා අනුන්විසින් ස්වාමි
බවට නොපමුණුවාම ස්වාමිවනබව.

282 නාභිෂෙකො න සංස්කාරඃ සිංහස්‍ය ක්‍රියතෙ මෘගෛඃ
වික්‍රමාර්ජිතරාජ්‍යස්‍ය ස්වයමෙව මෘගෙන්ද්‍රතා.

මෘගෛඃ, සිව්පාවන් විසින්; සිංහස්‍ය, සිංහයාට; අභිෂෙකඃ, අභිෂෙක ජලයවත්කිරීමෙක්; න, නොකරණුලැබේ- සංස්කාරඃ, සැරසීමෙක්ද; නක්‍රියතෙ, නොකරණුලැබේ. වික්‍රමාර්ජිතරාජ්‍යස්‍ය, බලයෙන් ස්වාමිබවට පැමිණිදෙශයට; ස්වයම්එව, තමාම; මෘගෙන්ද්‍රතා, සිව්පාවන්ට ශ්‍රෙෂ්ඨබවවේ.

ධනය කැමැත්තාවූ අඥාන රාජසෙවකයන් විසින් ශරීරයෙහි
තමා ප්‍රධානබවද හරණලද්දේය යනු.

283 සෙව්‍යා ධනමිච්ඡද්භිඃ සෙවකෛඃ පශ්‍ය යත් කෘතම්
ස්වාතන්ත්‍ර්‍යං යච්ඡරීරස්‍ය මූඪෛස්තදපි හාරිතම්.

ධනමිච්ඡද්භිඃ, ධනය කැමැත්තාවූ; සෙවකෛඃ, රජුන්ආශ්‍රය කරන්නන්විසින්; සෙව්‍යා, ආශ්‍රයකිරීමෙන්; යත්කෘතං, යමක් කරණලදද එය; පශ්‍ය, බලව. ශරීරස්‍ය, ශරීරයාගේ; යත්ස්වාතන්ත්‍ර්‍යං, යම් තමා ප්‍රධානබවක් ඇද්ද; තත් අපි, ඒ ප්‍රධානබවද; මූඪෛඃ, අඥානයන් විසින්; හාරිතං, හරණලදී.

අනුන්ගේඅයිතියට පැමිණියෝ බොහෝදුක්වූවසත් නුවණැ
ත්තෝ එපමණදුක් නොලැබ තපස්රැක
සැපඇත්තාහුවෙත්.

284 ශීතවාතාතපක්ලෙශාන් සහන්තෙ යෙ පරාශ්‍රිතාඃ
තදංශෙනාපි මෙධාවී තපස්තප්ත්වා සුඛී භවෙත්.

යෙ, යම්කෙනෙක්; පරාශ්‍රිතාඃ, රජුන්ගේ අයිතියට පැමිණියෝද ඔහු; ශීතවාතාතප, ශීතය—සුලඟ—අව්වය—යනා; ක්ලෙශාන්, පීඩාවන්

ගේදුක්; සහනෙන, ඉවසත්, මෙධාවී, නුවණැති තැනැත්තේ; තත් අභේනඅපි, එයින් අබියක් දුකින් ශුෂ්කවද; තපස්තපස්වා, තපස්ක්‍රියා කොට; සුඛීභවෙත්, සැපඇත්තෙක්වේ.

අනුන්ට අයිතිව ජීවත්වන්නා මළඑකකුහා සමානබව.

285 එතාවජ්ජන්ම සාඵල්‍යං යදනායත්තවෘත්තිතා
යෙ පරාධීනතාං යාතාස්තෙ වෛජීවන්ති කෙ මෘතාඃ.

යත් අනායත්තවෘත්තිතා, අනුන්ට අයිතිනොව යම් ජීවත්වනබවක් ඇද්ද; එතාවත්, මෙපමණක්ම; ජන්මසාඵල්‍යං, ප්‍රයෝජනසහිතවූ ඉපදීමවේ; යෙ, යම්කෙනෙක්; පරාධීනතාං, අනුන්අයිතිබවට; යාතාඃ, පැමිණියාහුද; වෛ, ඉදින්; තෙජීවන්ති, ඔහු ජීවත්වෙත්නම්; මෘතාඃ, මළාහු; කෙ, කවරහුද.

ධනආශාවෙන් ධනවතුන්ට අයිතිව පවත්නාවුන් සඳහා.

286 එහි ගච්ඡ පතොත්තිෂ්ඨ වද මෞනං සමාචර
එවමාශාග්‍රහග්‍රස්තෛඃ ක්‍රීඩන්ති ධනිනොර්ථිභිඃ.

එහි, මෙහිඑව. ගච්ඡ, යව; පත, වැටෙව; උත්තිෂ්ඨ, නැගිසිටුව; වද, කියව, මෞනං සමාචර, කථානොකොට ඉඳුවයි; එවං, මෙසේ; ආශාග්‍රහ, ආශානැමැති රාහුග්‍රහයාවිසින්, ග්‍රස්තෛඃ, ගිලිනලද්දාවූ; අර්ථිභිඃ, ආශාඇත්තන් හාසමග; ධනිනඃ, ධනඇත්තාහු; ක්‍රීඩන්ති, කෙළිත්.

ධනලොභයෙන් අනුන් ආශ්‍රයකරන්නාවුන් වෙශ්‍යා ස්ත්‍රීන්
ස මා න බ ව.

287 අබුධෛරර්ථලාභාය පණ්‍යස්ත්‍රීභිරිව ස්වයම්
ආත්මා සංස්කෘත්‍ය සංස්කෘත්‍ය පරොපකරණීකෘතඃ.

පණ්‍යස්ත්‍රීභිඃඉව, වෙශ්‍යාස්ත්‍රීන් විසින්මෙන්; අබුධෛඃ, නුවණනැත්තන්විසින්; අර්ථලාභාය, ද්‍රව්‍යලැබීම පිණිස; ස්වයම්, තමා; ආත්මා, ශරීරය; සංස්කෘත්‍ය සංස්කෘත්‍ය, සරස සරසා; පරොපකරණී, අනුන්ගේ උපකරණ භාණ්ඩයක්මෙන්; කෘතඃ, කරණලදී,

අ නි ත් කා ර ණ යෙ ක්.

288 යා ප්‍රකෘත්‍යෙව චපලා නිපතත්‍යශුචාවපි
ස්වාමිනො බහු මන්‍යන්තෙ දෘෂ්ටිං තාමපි සෙවකාඃ,

යා, යම්ස්ත්‍රියක්; ප්‍රකෘත්‍යාඑව, ස්වභාවයෙන්ම; චපලා, චංචලද ඕතො ම්බ්‍රා; අශුචෞඅපි, අපවිත්‍රයෙහිද; නිපතති, වැටෙන්නීද; දෘෂ්ටිං, දක්

නාලද්දවූ; තාං, ඇට; ස්වාමිනඃ, ස්වාමිහුද; සෙවකාඃඅපි, සෙවකයෝ ද; බහුමන්‍යන්තෙ, බොහෝ ආදරකෙරෙත්.

ආධිපතීන් ආශ්‍රයකරන්නා අඥානයකුබව.

229 ප්‍රණමත්‍යුන්නතිහෙතොර්ජීවිතහෙතොර්විමුංචති ප්‍රාණාන්
දුඃඛීයති සුඛහෙතොඃ කො මූඪඃ සෙවකාදන්‍යඃ.

උන්නතිහෙතොඃ, උසස්බවට පැමිණීම හෙතුකොටගෙණ; ප්‍රණමති, නටත්වේ. ජීවිතහෙතොඃ, ජීවත්වීම හෙතුකොටගෙණ; ප්‍රාණාන් විමුංචති, ජීවිතයත්හරී. සුඛහෙතොඃ, සැපතට පැමිණීම හෙතුකොටගෙණ; දුඃඛීයති, දුක්විඳුනු කැමතිවේ. සෙවකාත්, රජුන් ආශ්‍රයකරන්නාටවඩා; අන්‍යඃ මූඪඃ, අන් අඥානයෙක්; කඃ, කවරෙක්ද.

රජුන්ගේ ආශ්‍රය අතිශයින් දුෂ්කරබව.

290 මෞනාන්මූකඃ ප්‍රවචනපටුර්වාතුලො ජල්පකො වා
ක්ෂාන්ත්‍යා භීරුර්යදි න සහතෙ ප්‍රායශො නාභිජාතඃ.
ධෘෂ්ටඃ පාශ්වේ වසති නියතං දූරතශ්ච ප්‍රගල්භඃ
සෙවාධර්මඃ පරමගහනො යොගිනාමප්‍යගම්‍යඃ.

මෞනාත්, කථානොකිරීම හෙතුකොටගෙණ; මූකඃ, අඥානයෙක් වේ. ප්‍රවචනපටුඃ, කථාකිරීමෙහි දක්ෂතැනැත්තේ; වාතුලඃ, උමතුවෙක්හෝ; ජල්පකොවා; ජයගන්නාපිණිස කථාකරන්නෙක්හෝ වේ. ක්ෂාන්ත්‍යා, ඉවසීම හෙතුකොටගෙණ; භීරුඃ, භයසුලු තැනැත්තෙක් වේ. ප්‍රායශඃ, බොහෝසෙයින්; යදින සහතෙ, ඉදින් නොයිවසන්නේ ද; නාභිජාතඃ, අපණ්ඩිතයෙක්හෝ මනාගොත්‍ර* නැත්තෙක්වේ. පාශ්වේවසති, සමීපයෙහි වෙසේද; ධෘෂ්ටඃ, ලජ්ජා නැත්තෙක්වේ. නියතං, නියමයෙන්; දූරතඃච, දුරුව විසීම හෙතුකොටගෙණද; ප්‍රගල්භඃ, අහංකාර ඇත්තෙක්වේ.

සෙවාධර්මඃ, රජුන් ආශ්‍රයකිරීම පිළිබඳවූ හැසිරීමතෙම; පරමගහනඃ, අතිශයින් අවුල්වේ. යොගිනාං අපි, තපස්ඇත්තන් විසින්පවා; අගම්‍යඃ, දතනොහැකිවේ. *

---

* මෙහි—ගම්‍යඃ—යන්න—ගත්‍යර්ථාධාතොඃ, යන සූත්‍රයෙන් විධානකරණලැබූ—ක්‍යණ—ප්‍රත්‍යයාන්තයි, එහෙයින්—යොගිනාං—යන්න—ල්‍යභාවකාර්‍යණකත්‍රාණෙවා, යනාමූෂාබොධ සූත්‍රයෙන් විහිතකර්තෘඅර්ථයෙහි ෂෂ්ඨීයයි,

උත්තමයන් ආශ්‍රය කටයුතු බව.

291 කථං නාම න සෙව්‍යන්තෙ යත්නතඃ පරමෙශ්වරාඃ
අචිරෙණෛව යෙ තුෂ්ටාඃ පූරයන්ති මනොරථාන්.

තුෂ්ටාඃ, සතුටුකරණ ලද්දාවූ; යෙ, යම්කෙනෙක්; අචිරෙණඑව, මඳ කලකින්ම; මනොරථාන්, කැමතිවූ කාරණයන්; පූරයන්ති, සම්පූර්ණකෙරෙද්දඒ; පරමෙශ්වරාඃ, උතුම්ශ්‍රෙෂ්ඨයෝ; කථංනාම, කෙසේනම්; යත්නතඃ, උත්සාහයෙන්; නසෙව්‍යන්තෙ, ආශ්‍රයකරණු නොලැබෙද්ද.

රජුන් ආශ්‍රයෙහි වැඩ.

292 කුතඃ සෙවාවිහීනානාං චාමරොද්ධූතසම්පදඃ
උද්දණ්ඩධවලච්ඡත්‍ර වාජිවාරණවාහිනී.

සෙවාවිහීනානාං, රජුන්ගේ ආශ්‍රයනැත්තවුන්ට; චාමර උද්ධූතසම්පදඃ, සලනලද චාමරඇති ඓශ්වර්‍ය්‍යයෝ; කුතඃ, කෙසේනම් ලැබෙද්ද; උද්දණ්ඩධවලච්ඡත්‍ර, මනාදණ්ඩෙහි නගනලද ශ්වෙතච්ඡත්‍රයක්හෝ; වාජි, අසුන්හෝ; වාරණ, ඇතුන්හෝ; වාහිනී, සෙනාවහෝ කෙසේ ලැබේද.

තමාට ප්‍රයොජන නොවන ක්‍රියාවෙහි යෙදීමේ දොෂ.

293 අව්‍යාපාරෙෂු ව්‍යාපාරං යො නරඃ කර්තුමිච්ඡති
ස භූමෞ නිහතඃ සෙතෙ කීලොත්පාටීව වානරඃ.

යඃනරඃ, යම්මිනිසෙක් තෙම; අව්‍යාපාරෙෂු, තමාවිසින් ක්‍රියාකිරීමක් නැති තන්හි; ව්‍යාපාරංකර්තුං, ක්‍රියාකිරීම පිණිස, ඉච්ඡති, කැමතිවේද; සඃ, හෙතෙම; කීලඋත්පාටී, (මිනිසුන්විසින් කියතෙන් ඉරණලද දණ්ඩෙහි ගහනලද) ඉඟුලුඋලඇති; වානරඃඉව; වඳුරමෙන්; නිහතඃ, (තමාඅණ්ඩයදෙබු පලුදෙකතුල තුබූහෙයින් උලඉගුලූ කල්හි දඬුදෙක අතරට අණ්ඩයඅසුවී) නසනලද්දේ; භූමෞසෙතෙ, බිම සයනයකෙරේ.

ස්වාමියාට වැඩකැමැත්තෙන් අනුන්කෙරෙහි ස්වාමිබව
සිතීමෙන් කලකිරෙණබව.

294 පරාධිකාරචර්චාං යඃ කුර්‍ය්‍යාත් ස්වාමිහිතෙච්ඡයා
ස විෂීදති චීත්කාරාත් තාඩිතො ගර්දභො යථා.

යඃ, යමෙක්තෙම; ස්වාමිහිතෙච්ඡයා, ස්වාමියා හට වැඩ කැමැත්තෙන්; පරාධිකාරචර්චාං, අනුන් ප්‍රධානවියයුතු දෙය පිළිබඳව පරීක්ෂාකිරීම; කුර්‍ය්‍යාත්, කෙරේද; සඃ, හෙතෙම; චීත්කාරාත්, මහත් ශබ්දකිරීම හෙතුකොටගෙණ; තාඩිතඃ, ස්වාමියා විසින් තළා මරණලද්දාවූ; ගර්දභඃ යථා, කොටලුවාමෙනි.

## කා ර ණ යෙ ක්

295 යාචතෙ කාර්‍ය්‍යකාලෙ යඃ ස කිං භෘත්‍යඃ ස කිං සුහෘත්
යො න සම්භාෂයෙද් භෘත්‍යාන් කාර්‍ය්‍යකාලෙ ස කිං ප්‍රභුඃ.

යඃ, යමෙක්තෙම; කාර්‍ය්‍යකාලෙ, කටයුතු කාලයෙහි; යාචතෙ, යාච්ඤා කෙරේද; සඃ, හෙතෙම; කිංභෘත්‍යඃ, කෙසේ සෙවකයෙක්වේද; සඃ හෙ තෙම, කිංසුහෘත්, කෙසේ මිත්‍රයෙක්වේද; යඃ, යමෙක්තෙම; කාර්‍ය්‍යකා ලෙ, කටයුතු කාලයෙහි; භෘත්‍යාන්, සෙවකයන්ට; නසම්භාෂයෙත්, කථානොකරන්නේද; සඃ, හෙතෙම; කිංප්‍රභුඃ, කෙසේ ස්වාමිවේද.

## ච ල ක් ව න් නෙ ක් නැ ති ස්ථා න:

296 ආශ්‍රිතානාං භෘතෞ ස්වාමිසෙවායාං ධර්මසෙවනෙ
පුත්‍රස්‍යොත්පාදනෙ චෛව න සන්ති ප්‍රතිහස්තකාඃ.

ආශ්‍රිතානාං, ආශ්‍රයකරණලද්දවුන්ගේ; භෘතෞ, පොෂ්‍යයකරන්නා වූ ස්වාමියා කෙරෙහිද; ස්වාමිසෙවායාං, ස්වාමියාගේ සෙවකයාකෙරෙහි ද; ධර්මසෙවනෙ, ධර්මයාගේ හැසිරීමෙහිද; පුත්‍රස්‍ය උත්පාදනෙචෛව, පුත්‍රයාගේ ඉපදීමෙහිද; ප්‍රතිහස්තකාඃ, තල්ලුකොට වැලැක්වියහැකි කාහු; නසන්ති, නොවෙත්.

## සතර ප්‍රකාරයෙකින් සෙවනය කටයුතු ස්ථානයෝ.

297 පෘෂ්ඨතඃ සෙවයෙදර්කං ජඨරෙණ හුතාශනම්
ස්වාමිනං සර්වභාවෙන පරලොකමමායයා.

අර්කං, ඉරු; පෘෂ්ඨතඃ, පිටදිශාවෙන්ද; හුතාශනම්, ගිනි; ජඨරෙණ, කුක්ෂිසදිශාවෙන්ද; ස්වාමිනං, ස්වාමියා; සර්වභාවෙන, සියලු ප්‍රකාරයෙ න්ද; පරලොකං, මතු උපදනාලොකය; අමායයා, වඤ්චාරහිතවීමෙන්ද; සෙවයෙත්, සෙවනය කරන්නේය.

## ර ජ ජු ගේ ආ ශ්‍ර ය කි රී මෙ හි ප්‍ර යෝ ජ න.

298 සුහෘදාමුපකාරකාරණාත් ද්විෂතාමප්‍යපකාරකාරණාත්
නෘපසංශ්‍රය ඉෂ්‍යතෙ බුධෛර්ජඨරං කො න බිභර්ති කෙවලම්.

සුහෘදං, මිත්‍රයන්ට; උපකාරකාරණාත්, උපකාරකිරීම හෙතුකොට ගෙණද; ද්විෂතාං, සතුරන්ට; අපකාරකාරණාත්අපි, අවැඩකිරීම හෙ තුකොටගෙණද; නෘපසංශ්‍රයඃ, රජ්ජුන්ගේ ආශ්‍රයතෙම; බුධෛඃ, පණ්ඩි තයන් විසින්; ඉෂ්‍යතෙ, කැමතිවනුලැබේ. කෙවලං ජඨරං, තමාගේ එ කම බඩපමණක්; කඃනබිභර්ති, කවරෙක්නම් පොෂ්‍යය නොකෙරේද.

තමා පමණක් රැකෙන්නාගේ ජීවිතය නිෂ්ඵලබව.

299 ජීවිතෙ යස්‍ය ජීවන්ති විප්‍රා මිත්‍රාණි බාන්ධවාඃ

සඵලං ජීවිතං තස්‍ය ආත්මාර්ථං කො න ජීවති.

යස්‍ය, යමෙක්හුගේ; ජීවිතෙ, ජීවත්වීම ඇතිකල්හි; විප්‍රාඃ, බ්‍රාහ්මණයෝද; මිත්‍රාණි, මිත්‍රයෝද; බාන්ධවාඃ, නෑයෝද; ජීවන්ති, ජීවත්වෙද්ද; තස්‍ය, ඔහුගේ; ජීවිතං, ජීවිතයතෙම; සඵලං, ඵලසහිතවේ. ආත්මාර්ථං, තමාගේ ප්‍රයොජනය පිණිසම; කඃනජීවති, කවරෙක්නම් ජීවත් නොවේද.

තමා බඩසඳහාම ක්‍රියාකරන්නාගේ ජීවත්වීම කවුඩාගේ ජීවත්වීමහා සමානබව.

300 යස්මින් ජීවති ජීවන්ති බහවඃ ස තු ජීවතු

කාකොපි කිං න කුරුතෙ චඤ්චවා ස්වොදරපූරණම්.

යස්මින්, යමක්හු; ජීවති, ජීවත්වනකල්හි; බහවඃ, බොහෝජනයෝ; ජීවන්ති, ජීවත්වෙද්ද; සඃතු, හෙතෙම වනාහි; ජීවතු, ජීවත්වේවා. කාකඃඅපි, කවුඩෙක්ද; චඤ්චවා, තුඩින්, ස්වොදරපූරණම්, තමාගේ කුසපිරීම; නකුරුතෙ, නොකෙරේද; කිං, කවර ප්‍රයොජනද.

දාසභාවාදියට පැමිණෙන්නෝ

301 පඤ්චභිර්‍යාති දාසත්වං පුරාණෛඃ කොපි මානවඃ

කොපි ලක්ෂෛඃ කෘතඃ කොපි ලක්ෂෛරපි න ලභ්‍යතෙ.

පඤ්චභිඃ පුරාණෛඃ, පුරාණ (පණම්දහසයේරුපියල්) පසක්පමණින්; කොපිමානවඃ, කිසි මනුෂ්‍යයෙක්; දාසත්වංයාති, දාසබවට පැමිණේ. කොපි, කිසි මනුෂ්‍යයෙක්; ලක්ෂෛඃ, මෙම රුපියල් ලක්ෂගණනෙකින්ද; කෘතඃ, සුදුසු ප්‍රමාණයට පැමිණියෙක්වේ. කොපි, කිසිවෙක්; ලක්ෂෛඃඅපි, ලක්ෂගණනින්ද; නලභ්‍යතෙ, සුදුසු ප්‍රමාණය නොලැබේ.

අධමවූ දාසයන්අතුරෙහුත් පළමුවෙනි නොවන්නා මනුෂ්‍යයන්අතුරෙහි ගණන්කළ නොහැකිබව.

302 මනුෂ්‍යජාතෞ තුල්‍යායාං භෘත්‍යත්වමතිගර්හිතම්

ප්‍රථමො යො න තත්‍රාපි සොපි ජීවත්සු ගණ්‍යතෙ.

තුල්‍යායාං, සමානවූ; මනුෂ්‍යජාතෞ, මනුෂ්‍යජාතියෙහි; භෘත්‍යත්වම්, දාසබව; අතිගර්හිතම්, අතිශයින්නින්දිතවේ. තත්‍රාපි, ඒ දාසභාවයෙහිද; යඃ, යම්දාසයෙක්තෙම; ප්‍රථමඃන, පළමුවෙනිනොවේද; සඃඅපි, ඔහුද; ජීවත්සු, ජීවත්වන්නවුන් අතුරෙහි; ගණ්‍යතෙ, ගණන්ගන්නාලැබේද.

ලොව ද්‍රව්‍යයන් අතුරෙහි පවත්නා නානාප්‍රකාර වෙනස්බැව්.

303 වාජිවාරණලොහානාං කාෂ්ඨපාෂාණවාසසාම්
නාරීපුරුෂතොයානාමන්තරං මහදන්තරම්.

වාජි, අශ්වයෝය; වාරණ, ඇත්හුය; ලොහානාං, ලොහද්‍රව්‍යද යනමොවුන්ගේද; කාෂ්ඨ, දඬුය; පාෂාණ, ගල්ය; වාසසාම්, වස්ත්‍රය යන මොවුන්ගේද; නාරී, ස්ත්‍රීහුය; පුරුෂ, පුරුෂයෝය; තොයානාම්, ජලය යන මොවුන්ගේද; අන්තරං, ඔවුනොවුන්ගේ වෙනස්බවෙහිදුර; මහත් අන්තරං, මහත්වූ අතරක්වේ.

දුකටපැමිණි නමුත් ඒ ඒ සත්වයෝ තමතමන්ට සුදුසු ඵලයට
රුචිවනබව.

304 අල්පස්නායුවශාවශෙෂමලිනං නිර්මාංසමප්‍යස්ථිකං
ශ්වා ලබ්ධ්වා පරිතොෂමෙති න ච තත්තස්‍ය ක්ෂුධාශාන්තයෙ.
සිංහො ජම්බුකමංකමාගතමපි ත්‍යක්ත්වා නිහන්ති ද්විපං
සර්වඃ කෘච්ඡ්‍රගතොපි වාඤ්ඡති ජනඃ සත්වානුරූපං ඵලම්.

අල්පස්නායුවශා, ස්වල්පවූ නහරහාමෙද තෙල් යනමේදෙක; අවශෙෂමලිනං, ඉතිරිවීමෙන් කිලිටිවූ; නිර්මාංසං, මාංසනැත්තාවූ; අස්ථිකං අපි, ඇටයද; ලබ්ධ්වා, ලැබ; ශ්වා, බලුතෙම; පරිතොෂං, සන්තොෂයට; එති, පැමිණේ. තත්, ඒ ඇටය; තස්‍ය, ඒ බල්ලාගේ; ක්ෂුධාශාන්තයෙ, ක්ෂුධාවසන්සිඳිම පිණිස; නච, නොවේ. සිංහඃ, සිංහතෙම; අංකං ආගතංඅපි, ඇකයට (තුරුල්ලට) ආවාවූද; ජම්බුකං, සිවලා; ත්‍යක්ත්වා, හැරදමා; ද්විපං, හස්තියකු; නිහන්ති, නසා. සර්වඃජනඃ, සියලු ජනාතෙම; කෘච්ඡ්‍රගතඃ අපි, දුකටපැමිණියේද; සත්වානුරූපං, සත්වයන්ට සුදුසුවූ; ඵලංවාඤ්ඡති, ඵලයට රුචිවේ.

බල්ලෙකුගේහා ඇතෙකුගේ පැවතුම්.

305 ලාඞ්ගූලචාලනමධශ්චරණාවපාතං
භූමෞ නිපත්‍ය වදනොදරදර්ශනං ච.
ශ්වා පිණ්ඩදස්‍ය කුරුතෙ ගජපුඞ්ගවස්තු
ධීරං විලොකයති චාටුශතෛශ්ච භුඞ්ක්තෙ.

ශ්වා, බලුතෙම; ලාඞ්ගූල, නගුට (වල්ගය) චාලනං, සැලීමද; අධශ්චරණ, පාමුල්හි; අවපාතං, වැටීමද; භූමෞනිපත්‍ය, භූමියෙහි වැදහෙව; වදනොදරදර්ශනංච, මූඛයහා බඩදැක්වීමද; පිණ්ඩදස්‍ය, ආහාරදුන් තැ

නැත්තාහට; තුරුතෙ, කෙරේ ගජපුංගවඃතු, උතුම් හස්තිතෙම; ධීරං විලොකයති, ස්ථිරවබලා. චාටුශතෛඃව, සියගණින් ප්‍රියතාවලින් යු ක්තව; භුඞ්කෙත, අනුභවකෙරේ.

ජීවත්වන තැනැත්තාගේ අන්දම.

306 යජ්ජීව්‍යතෙ ක්‍ෂණමපි ප්‍රථිතං මනුෂ්‍යෛ

විඥානවික්‍රමයශොභි රභජ්‍යමානම්.

තන්නාම ජීවිතමිහ ප්‍රවදන්ති තජ්ඥාඃ

කාකොපි ජීවති චිරච බලිං ච භුඞ්කෙතෙ.

විඥාන, දැනීමය; වික්‍රම, මහත්බලය; යශොභිඃ, කීර්තියයන මොවුන් විසින්; අභජ්‍යමානං, නොසිඳිනු ලබන්නාවූ; මනුෂ්‍යෛඃ මිනිසුන්විසි න්; ප්‍රථිතං, ප්‍රශංසාකරණලද්දෙක්; ක්‍ෂණංඅපි, ඇසිල්ලකුදු; යත්ජී ව්‍යතෙ, යම්ජීවිතයක් පවත්වනු ලැබේද; තත්නාම, ඒ ජීවත්වීමනම්; ඉ හ, මේ ලොකයෙහි; ජීවිතං, ජීවිතයයි. තඥාඃ, ඒ තතු දන්නෝ; ප්‍රවද න්ති, කියත්. කාකඃඅපි, කව්ඩෙක්ද; ජීවති, ජීවත්වේ. චිරං, බොහෝකා ලයක් මුලුල්ලෙහි; බලිචභුඞ්කෙත, බලිබත්ද අනුභවකෙරේ.

බඩරැකිමපමණක් කැමතිවන්නාවූ මනුෂ්‍ය සිව්පාවාත් ස්‍වභා සිව්පාවත් දෙදෙනාගේ වෙනසක්නැතිබව,

307 අහිතහිතවිචාරශුන්‍යබුද්ධෙඃ

ශ්‍රැතිවිෂයෛර්බහුභිර්බහිස්කෘතස්‍ය.

උදරභරණමාත්‍රකෙවලෙච්ඡොඃ

පුරුෂපශොශ්ච පශොශ්ච කො විශෙෂඃ.

අහිතහිත විචාර, වැඩඅවැඩදෙක පරීක්‍ෂාකරන්නාවූ; ශුන්‍යබුද්ධෙඃ, නුවණනැත්තාවූ; ශ්‍රැතිවිෂයෛඃ, ඇසීමෙන් අවබොධකරන්නාවූ; බ හුභිඃ, බොහෝ කාරණවලින්; බහිස්කෘතස්‍ය, පිටත්කරණලද්දාවූ; උද රභරණ මාත්‍රකෙවල, එකම බඩරැකිම පමණක්; ඉච්ඡොඃ, ස්වභාවයෙ න් කැමැත්තාවූ; පුරුෂපශොඃච, පුරුෂ සිව්පාවාගේද; පශොඃච, සිව්පා වාගේද; කඃවිශෙෂඃ, වෙනස කවරේද.

මිනිසුන්ගේ උතුමාධම බවට ස්‍වභාවයෙන් නොපැමිණෙන බවහා තමාගේ ක්‍රියාවන්ම පමුණුවනබව.

308 න කස්‍යචිත් කශ්චිදිහ ස්‍වභාවාදභවත්‍යුදාරොභිමතඃ ඛලො වා

ලොකෙ ගුරුත්‍වං විපරීතතාං වා ස්‍වචෙෂ්ටිතාන්‍යෙව නරං

නයන්ති

ඉහ, මෙලොකයෙහි, කස්‍යචිත්, කිසිවකුගෙ; ස්වභාවාත්, ස්වභාවය හෙතුකොටගෙණ; කශ්චිත්, කිසිතැනෙක්හි; උදාරඃ, උතුම්බවක්හෝ; බලාද්වා, අධමබවක්හෝ; අභිමතඃ නාභවති, සැමතිවූයේනොවේ. ලොකෙ, ලොකයෙහි; ගුරුත්වං, උතුම්බවටහෝ; විපරීතතාංවා, අධමබවට හෝ; නරං, මනුෂ්‍යයා; ස්වචෙෂ්ටිතානිඑව, තමාගේ ක්‍රියාවෝම; නයන්ති, පමුණුවත්.

සත්වයෙක් බලවත් උත්සාහයෙන් උතුම්බවටද උත්සාහනැතිව ක්ෂණයෙන් අධමබවටද පැමිණෙනබව.

309 ආරොප්‍යතෙ ශිලා ශෛලෙ යත්නෙන මහතා යථා
න්‍යපාත්‍යතෙ ක්ෂණෙනාධස්තථාත්මා ගුණදොෂයොඃ.

මහතායත්නෙන, බලවත් උත්සාහයෙන්; ශිලා, ගලතොමෝ; ශෛලෙ, පර්වතයකෙරෙහි; ආරොප්‍යතෙ, නගනුලැබේද. ක්ෂණෙනඑව, මඳ ක්ෂණයෙකින්ම අධඃ, පාතට; යථානිපාත්‍යතෙ, යම්සේ හෙලනුලැබේද. ගුණදොෂයොඃ, ගුණදොෂ දෙදෙනාකෙරෙහි; ආත්මා, තමාද; තථා, එබඳුයි.

තමාගේ ක්‍රියාව කරණකොටගෙණ උත්තමාධමබවට පැ මි ණෙ නා බ ව.

310 යාත්‍යධොධො ව්‍රජත්‍යුච්චෛර්නරඃ ස්වෛරෙව කර්මභිඃ
කූපස්‍ය ඛනිතා යද්වත් ප්‍රාකාරස්‍යෙව කාරකඃ.

යද්වත්, යම්පරිද්දෙකින්; කූපස්‍ය, ලිඳ; ඛනිතා, සාරන්නෙක්ද; ප්‍රාකාරස්‍ය, ප්‍රාකාරය; ( තාප්පය ) කාරකඃඉව. කරන්නාද (පාතටහා උඩට ද පැමිණෙන්නා ) මෙන්; ස්වෛඃඑව, *තමා පිළිබඳවූම; කර්මභිඃ, ක්‍රියාවන් හෙතුකොටගෙණ; නරඃ, මිනිස්තෙම; අධඃ අධඃ, පාතට පාතට හෙවත් අධම අධම බවට; යාති, පැමිණේ. උච්චෛඃ, උතුම්ක්‍රියාවන් හෙතුකොටගෙණ උතුම්බවටද; ව්‍රජති, පැමිණේ. *

---

* මෙහි—කාරකඃ—යනු—තෘන්‍ණකෞසෙ, යන සූත්‍ර—යෙන්වූ ණක—ප්‍රත්‍යයාන්තබැවින්—ප්‍රාකාරස්‍ය—යනු—ජගත්‍යාං කාරකඃ කෘෂ්ණාඃ—යන්හෙහි—ජගත්‍යාං යනුමෙන්, ක්‍රියෙකඃතෘස්‍යව්‍යකෘත්‍යුකකාතවතු—යනාදී මුග්ධබොධසූත්‍රයෙන් අනුකාතකර්මාර්ථයනිවූ ෂෂ්ඨියයි. කූපස්‍ය—යන ෂෂ්ඨියද—ඛනිතා—යන්නෙහි කෘත්ප්‍රත්‍යයබලා එම සූත්‍රයෙන් කර්මසංඥා ලද්දේවේ.

කියනලද කාරණය සිව්පාවෝපවා දැනගණිත් පණ්ඩිතයෝ
නොකියනලද කාරණයත් අවබොධකෙරෙත්.

311 උදීරිතොඪීඃ පශුනාපි ගෘහ්‍යතෙ
හයාශ්ච නාගාශ්ච වහන්ති දෙශිතාඃ.

අනුක්තමප්‍යූහති පණ්ඩිතො ජනඃ
පරෙඞ්ගිතඥානඵලා හි බුඞයඃ.

උදීරිතඃඅර්ථඃ, කියනලද අර්ථයතෙම; පශුනාපි, සිව්පාවෙකුවිසින්ද; ගෘහ්‍යතෙ, ගන්නාලැබෙ. දෙශිතාඃ, (අනුන්විසින්) කියනලද්දාවූ; හයාඃ ච, අශ්වයෝද; නාගාඃච, ඇත්හුද; වහන්ති, (බර) උසුලත්. පණ්ඩිතඃ ජනඃ, පණ්ඩිත ජනතෙම; අනුක්තංඅපි, (අනුන්විසින්) නොකියනලද දෙයද; ඌහති, සලකා. බුඞයඃ, ප්‍රඥාවෝ; පරඉඞ්ගිත, අනුන්ගේ ශරීරය ක්‍රියාකිරීමේ ලකුණු; ඥානඵලාඃහි, දැනගැණීම ප්‍රයොජනකොට ඇත්තිවන්නාහුය.

ශරීරය පිළිබඳවූ නොයෙක් ක්‍රියාවලින් සිතෙහි සතුටහා
නොසතුට දතහැකිබව.

312 ආකාරෛරිඞ්ගිතෛර්ගත්‍යා චෙෂ්ටයා භාෂණෙන ච
නෙත්‍රවක්ත්‍රවිකාරෙණ ලක්ෂ්‍යතෙන්තර්ගතං මනඃ.

ආකාරෛඃ, අදහස අඟවන්නාවූ මූඛය ප්‍රසන්නවීමහා වෙනස්වීමද යන ආකාරවලින්ද; ඉඞ්ගිතෛඃ, යම් යම් කාරණා ශරීරයෙන් අඟවන ක්‍රියාවලින්ද; ගත්‍යා, ගමන හෙතුකොටගෙණද; චෙෂ්ටයා, ශරීරයෙන් ක්‍රියාකිරීම හෙතුකොටගෙණද; භාෂණෙනච, කථාකිරීම හෙතුකොටගෙණද; නෙත්‍රවක්ත්‍රවිකාරෙණ, ඇස්හා මුඛය වෙනස් කිරීම හෙතුකොටගෙණද; අන්තර්ගතං, අභ්‍යන්තරයෙහිවූ; මනං, සිත; ලක්ෂ්‍යතෙ, දන්නාලැබෙ.

ප ණ්ඩි ත බ ව ට කා ර ණ.

313 ප්‍රස්තාවසදෘශං වාක්‍යං සද්භාවසදෘශං ප්‍රියම්
ආත්මශක්තිසමං කොපං යො ජානාති ස පණ්ඩිතඃ.

ප්‍රස්තාවසදෘශං, කාලයහා සමානවූ; වාක්‍යං, කථාවද; සද්භාවසදෘශං, විද්‍යමාන කාරණයහා සමානවූ; ප්‍රියම්, ප්‍රියබවද; ආත්මශක්තිසමං, තමාගේ බලයහා සමානවූ; කොපං, කිපීමද; යඃජානාති, යමෙක් දනීද; සඃ හෙතෙම; පණ්ඩිතඃ, පණ්ඩිතයෙව්.

නුවණ මදනැනැත්තාගේ ක්‍රියා.

314 අනාහූතො විශෙද් යසතු අපෘෂ්ටො බහු භාෂතෙ
ආත්මානං මන්‍යතෙ ප්‍රීතං භූපාලස්‍ය ස දුර්මතිඃ.

යඃතු, යමෙක් වනාහි; අනාහූතඃ, නොකැඳවනලද්දේ; විශෙත්, අනුන්ගේ ගෙට වදනේද; අපෘෂ්ටඃ, අනුන්විසින් නොවිචාරණලද්දේ; බහුභාෂතෙ, බොහෝකොට කියාද; භූපාලස්‍ය, රජ්ජුරුවන් විසින්; ආත්මානං, තමාට; ප්‍රීතං, සතුටුවනලදැයි; මන්‍යතෙ, සිතාද; සඃ, හෙතෙම; දුර්මතිඃ, නුවණනැත්තෙක්වේ.

ස්වභාවයෙන් හොඳය නොහොඳයයි යම් යම් කාරණ ලොකයා
නොගෙණ ඔවුනොවුන්ට රුච්වන යමක්ම
මනායයි ගන්නාබව.

315 කිමප්‍යස්ති ස්වභාවෙන සුන්දරං වාප්‍යසුන්දරම්
යදෙව රොචතෙ යස්මෛ භවෙත් තත්තස්‍ය සුන්දරම්.

ස්වභාවෙන, තමාගේවීමෙන්; සුන්දරංවාඅපි, ශොභනවූද; අසුන්දරංඅපි, අශොභනවූද; කිංඅපි අස්ති, කුමක්නම් ඇත්තේද; යස්මෛ, යමෙකුට; යත්එව, යම්ක්‍රියාවක්ම; රොචතෙ, රුච්වේද; තස්‍ය, ඔහුට; තත්, ඒ කාරණය; සුන්දරං භවෙත්, මනාවේ.

නුවණඇති තැනැත්තන් අනුන්ගේ අදහස්ලෙසට ඔවුනොවුන්කරා එළඹ ඔවුන් තමාට අයිතිකරණබව.

316 යස්‍ය යස්‍ය හි යො භාවස්තෙන තෙන හි තං නරම්
අනුප්‍රවිශ්‍ය මෙධාවී ක්ෂිප්‍රමාත්ම වශං නයෙත්.

මෙධාවී, නුවණැති පුරුෂතෙම; යස්‍යයස්‍යහි, යම් යම් කෙනෙකුගේ; යඃභාවඃ, යම් අදහසක්වේද; තෙන තෙනහි, ඒ ඒ අදහස් පරිද්දෙන් වනාහි; තංනරම්, ඒ මනුෂ්‍යයාකරා; අනුප්‍රවිශ්‍ය, වැද; ක්ෂිප්‍රං, වහා; ආත්මවශං, තමාගේ අයිතිබවට; නයෙත්, පමුණුවන්නේය.

රජ්ජුරුවන්කෙරේ පවත්නා අන්දම.

317 කොත්‍රෙත්‍යහම්ති බ්‍රූයාත් සම්‍යගාදෙශයෙති ච
ආඥාමවිතථාං කුර්‍යාත් යථා ශක්තිමහිපතෙඃ.

අත්‍ර, මෙහි, කඃඉති, කවරෙක් සිටින්නේදැයි; (විචාරණලද තැනැත්තේ) අහංඉති; මෙහි මම සිටිමි කියා; බ්‍රූයාත්, කියන්නේය; සම්‍යක් ආ

දෙශය ඉතිව, මනාකොට ආඥාකළමැනවැයිද (කියන්නේය;) මහිපතෙඃ, රජහුගේ; අවිතථාං, වෙනස්නුවූ; ආඥාං, අණ; යථාශක්ති, ශක්තිවූ පරිද්දෙන්; කුර්‍යාත්, කරන්නේය.

රජගෙයි වසන තැනැත්තෝ.

318 අල්පෙච්ඡුර්ධෘතිමාන් ප්‍රාඥශ්ඡායෙවානුගතඃ සදා
ආදිෂ්ටො න විකල්පෙත ස රාජවසතෞ වසෙත්.

අල්පෙච්ඡුඃ, ආශානැත්තාවූ; ධෘතිමාන්, ධෛර්‍ය්‍යඇත්තාවූ; ප්‍රාඥඃ, නුවණැත්තාවූ; ඡායාඉව, ඡායාවමෙන්, සදාඅනුගතඃ, හැමකල්හි නොහැර පවත්නාවූ; ආදිෂ්ටඃ, අණකරණලද්දේ; නවිකල්පෙත, වෙනස් නොකරන්නේද; සඃ, හෙතෙම; රාජවසතෞ, රජගෙයි; වසෙත්, වසන්නේය.

දෙෂයට භය ඇත්තාහුගේ ක්‍රියාපටන් නොගැණීම නින්දිත
පුරුෂයාගේ ලකුණක්බව.

319 දොෂභීතෙරනාරම්භඃ කාපුරුෂස්‍ය ලක්ෂණම්
කෛරජීර්ණභයාද්භ්‍රාතභෝජනං පරිහීයතෙ.

දොෂභීතෙඃ, දොෂ හෙතුකොටගෙණ භයඇත්තාහුගේ; අනාරම්භඃ, ක්‍රියා පටන්නොගැණීමතෙම; කාපුරුෂස්‍ය, අලසයාගේ; ලක්ෂණම්, ලකුණයි. භ්‍රාතඃ, සහෝදරයාගේ; අජීර්ණභයාත්, අජීර්ණභය හෙතුකොටගෙණ; කෛඃ, කවරහුවිසින්; භොජනං පරිහීයතෙ, අනුභවය වලක්වනු ලැබේද.

මනාගොත්‍ර නැත්තාවූහෝ ශාස්ත්‍ර නූගත්තාවූහෝ මනාවූ
කථා නැත්තාවූහෝ ලන්ව වසන්නෙක්ම
රජුන්විසින් වැළඳගන්නාබව.

320 ආසන්නමෙව නෘපතිර්භජතෙ මනුෂ්‍යං
විද්‍යාවිහීනමකුලීනමසංගතං වා.
ප්‍රායෙණ භූමිපතයඃ ප්‍රමදා ලතාශ්ච
යඃ පාර්ශ්වතො වසති තං පරිවෙෂ්ටයන්ති.

විද්‍යාවිහීනං, ශාස්ත්‍රදැනීමෙන් තොරවූහෝ; අකුලීනං, මනාගොත්‍රයෙහි නූපන්නාවූහෝ; අසඞ්ගතංවා, ගැළපෙන්නාවූ වචනනැත්තාවූහෝ; ආසන්නං මනුෂ්‍යංඑව, ලන්ව වසන මිනිසකුම; නෘපතිඃ, රජතෙම; භජතෙ, ආශ්‍රයකෙරේ. භූමිපතයඃ, රජහුද, ප්‍රමදාඃ, ස්ත්‍රීහුද; ලතාඃච, වැල්ද; පාර්ශ්වතඃ, සමීපයෙන්; යඃවසති, යමෙක් වෙසේද; තං, ඔහු; ප්‍රායෙණ, බොහෝසෙයින්; පරිවෙෂ්ටයන්ති, වෙළාගණිත්.

### අධිපතින්ගේ ප්‍රියබව දැනගන්නාලකුණු

321 දූරාදවෙක්ෂණං හාසඃ සම්ප්‍රශ්නෙ සාදරො භෘශම්
පරොක්ෂෙපි ගුණශ්ලාඝා ස්මරණං ප්‍රියවස්තුෂු.

දුරත්, දුරින්; අවෙක්ෂණං, බැලීමද; හාසඃ, සිනාවද; සම්ප්‍රශ්නෙ, ය කක් විචාළකල්හි; භෘශම්, අතිශයින්; සාදරඃ, ආදරසහිතවීමද; පරොක්ෂෙපි, අසම්මුඛයෙහිද; ගුණශ්ලාඝා, ගුණයට ප්‍රශංසාකිරීමද; ප්‍රියවස්තුෂු, ප්‍රියද්‍රව්‍ය ඇතිකල්හි; ස්මරණං, සිහිකිරීමද.

322 තත්සෙවකෙනුරක්තිශ්ච දානං ප්‍රීතිවිවර්ධනම්
සුරක්තෙශ්වරචිහ්නානි දොෂෙපි ගුණසංග්‍රහඃ.

තත්සෙවකෙ, ඔහු ආශ්‍රයකරන්නවුන්කෙරෙහි; අනුරක්තිඃච, ඇලීමද; දානං, දීමද; ප්‍රීතිවිවර්ධනම්, ප්‍රීතියවැඩීමද; දොෂෙපි, නුගුණයෙහිද; ගුණසංග්‍රහඃ, ගුණයන්හා එක්කිරීමද; සුරක්තෙශ්වර, සිත්ඇලීම්ඇති අධිපතින්ගේ; චිහ්නානි, ලකුණුවෙත්.

### අධිපතින්ගේ සිත් නොඇලීම දැනගැණීමට ලකුණු.

323 කාලයාපනමාශානාං වර්ධනං ඵලඛණ්ඩනම්
විරක්තෙශ්වරචිහ්නානි ජානීයාන්මතිමාන්නරඃ.

ආශානාං, ද්‍රව්‍යආශාවන්; කාලයාපනං, කල්ඉක්මීමද; ඵලඛණ්ඩනම්, ප්‍රයොජන නැත්තාවූ; වර්ධනං, වැඩීමද; විරක්තෙශ්වරචිහ්නානි, නොඇළුනාවූ අධිපතින්ගේ ලකුණුයයි; මතිමාන්නරඃ, නුවණැති මනුෂ්‍ය තෙම; ජානීයාත්, දන්නේය.

### හානිය ප්‍රකාශකරන්නාවූ විපත්තිද දියුනුව ප්‍රකාශකරන්නාවූ වැඩීමද නුවණැත්තන් දක්වනබව.

324 අපායසන්දර්ශිනජාං විපත්තිමුපායසන්දර්ශිනජාං ච සිද්ධිම්
මෙධාවිනො නීතිවිධිප්‍රයුක්තාං පුරඃ ස්ඵුරන්තීමිව දර්ශයන්ති.

අපායසන්දර්ශිනජාං, ධනවිනාශය දැකීම ගටගන්නාවූ; විපත්තිං, විපත්තිද; උපායසන්දර්ශිනජාං, රැස්වීමගේ ප්‍රකාශවීම උපදනාවූ; නීතිවිධිප්‍රයුක්තාං, නීතිශාස්ත්‍ර ක්‍රමයෙහි[යොදනලද්දාවූ; සිද්ධිච, වැඩීමද; ස්ඵුරන්තිංඉව, බබලන්නියක්මෙන්; මෙධාවිනඃ, නුවණැත්තෝ; පුරඃ, ඉදිරියෙහි; දර්ශයන්ති, දක්වත්.

### දොෂගුණවීමහා ගුණදොෂවීමාදිය.

325 දොෂා ගුණා ගුණා දොෂා දොෂා දොෂා ගුණා ගුණාඃ
රක්ත විරක්ත මධ්‍යස්ථ ස්වාමිනි ත්‍රිවිධා ගුණාඃ.

ස්වාමිනි, ස්වාමියා; රක්තෙ, සිතඇළුනුකල්හි; දොෂාඃ, දොෂයෝ; ගුණාඃ, ගුණයෝවෙත්; විරක්තෙ, සිතනොඇළුනු කල්හි; ගුණාඃ, ගුණයෝ; දොෂාඃ, දොෂයෝවෙත්. මධ්‍යස්ථෙ, මධ්‍යස්ථවූ සිතඇතිකල්හි; දොෂාඃ, දොෂයෝ; දොෂාඃ, දොෂයෝමය. ගුණාඃ, ගුණයෝ; ගුණාඃ, ගුණයෝමවෙත්.

කාලයට නුසුදුසු වචන කියන්නාවූ නුවණැත්තෙක්පවා
ගර්හාවට පැමිණෙනබව.

326 අප්‍රාප්තකාලවචනං බෘහස්පතිරපිබ්‍රුවන්
ප්‍රාප්නුයාද්බුද්ධ්‍යවඥානමපමානං ච ශාශ්වතම්.

අප්‍රාප්තකාලවචනං, සුදුසුකාලය නොපැමිණිතැන්හි වචනය; බ්‍රුවන්, කියන්නාවූ; බෘහස්පතිඃඅපි, බෘහස්පතිපවා; බුද්ධි අවඥානං, ඥානයාගේ හෙලාදැකිමටද; ශාශ්වතම්, සදාකල්පවත්නාවූ; අපමානච, අගෞරවයටද; ප්‍රාප්නුයාත්, පැමිණේ.

නොවිචාරණලද්දාවූද දාසයාවිසින් ස්වාමියාට කරුණු
කියයුතුකල්.

327 ආපද්‍යුන්මාර්ගගමනෙ කාර්‍ය්‍යකාලාත්‍යයෙෂු ච
අපෘෂ්ටෙනාපි වක්තව්‍යං භෘත්‍යෙන හිතමිච්ඡතා.

අපෘෂ්ටෙනාපි, නොවිචාරණලද්දාවූද; හිතමිච්ඡතා, වැඩකැමැත්තාවූ; භෘත්‍යෙන, දාසයාවිසින්; ආපදි, විපත්තියක්ඇතිකල්හිද; උන්මාර්ගගමනෙ, නොමගයන්කල්හිද; කාර්‍ය්‍යකාලාත්‍යයෙෂුච, කටයුතු කාලය ඉක්මෙන කල්හිද; වක්තව්‍යං, කියයුතු.

ජීවිකාවකිරීමද ප්‍රශංසාවට පැමිණීමද යම් ගුණයකින්වේනම්
ඒ ගුණය රක්ෂාකටයුතුය යනබව.

328 කල්පයති යෙන වෘත්තිං යෙන ච ලොකෙ ප්‍රශස්‍යතෙ සද්භිඃ
ස ගුණස්තෙන ච ගුණිනා රක්‍ෂ්‍යඃ සංවර්ධනීයශ්ච.

යෙන, යම්ගුණයක් හෙතුකොටගෙණ; වෘත්තිං, ජීවිකාව; කල්පයති, කෙරේද.; යෙන, යම් ගුණයක් හෙතුකොටගෙණ; ලොකෙ, ලොකයෙහි; සද්භිඃ, පණ්ඩිතයන් විසින්; ප්‍රශස්‍යතෙ, ප්‍රශංසාකරණු ලැබේද; තෙනච, ඒ හෙතුවෙන්ද; සඃ ගුණඃ, ඒ ගුණයතෙම; ගුණිනා, ගුණඇත්තාවිසින්; රක්‍ෂ්‍යඃ, රක්‍ෂාකටයුතුවේ. සංවර්ධනීයශ්ච, වැඩියයුතුදවේ.

## ශුභවූ මංගල්‍ය වාක්‍යයක්.

829 ගම්‍යතාමභිලාභාය ක්ෂේමාය විජයාය ච
ශත්‍රුපක්ෂවිනාශාය පුනරාගමනාය ච.

අභිලාභාය, ඔනලැබීම පිණිසද; ක්ෂේමාය, සැරගිතවූ පාලනය පිණිසද; විජයායච, සතුරන් ජයගැණීම පිණිසද; ශත්‍රුපක්ෂවිනාශාය, සතුරුපක්ෂයාගේ නැසීම පිණිසද; පුනඃ ආගමනායච, පසුව එනු පිණිසද; ගම්‍යතාං, යනුලැබේවා.

ඉතා ස්වල්ප නමුත් මනුෂ්‍යයක්හු අධිපතීන්ට ප්‍රයෝජනවනබව.

830 දන්තස්‍ය නිඝර්ෂණකෙන රජන් කර්ණස්‍ය කණ්ඩූයනකෙන වාපි
තෘණෙන කාර්‍ය්‍යං භවතීශ්වරාණාං කිමඞ්ගවාක් පාණිමතා නරෙණ.

රජන්, එම්බා මහරජ; දන්තස්‍ය, දත; නිඝර්ෂණකෙන, පිරිසිදුකරන්නාවූද; කර්ණස්‍ය, කණ; කණ්ඩූයන කෙනවාපි, කසන්නාවූද; තෘණෙන, තණපත්‍රයෙන්; ඊශ්වරාණාං, අධිපතීන්ට; කාර්‍ය්‍යංභවති, කටයුතු ඇතිවේ. පාණිමතා; අත්පා ආදි ශරීරවයව ඇත්තාවූ; නරෙණ, මනුෂ්‍ය යෙකුගෙන්; කිමඞ්ගවාක්, ප්‍රයෝජනවූ කටයුතුඇතිබව කියනුකිම.

ගුණඇත්තා මිනාව පිළිනොගත්තේවී නමුත් ඔහු ගුණවතෙ
ක්මය අඥනයා ආදරයෙන් පිළිගත්තේද
ඔහු අඥනයාමය.

831 මණිර්ලුඨති පාදෙෂු කාචඃ ශිරසි ධාර්‍ය්‍යතෙ
ක්‍රයවික්‍රයවෙලායාං කාචඃ කාචො මණිර්මණිඃ.

මණිඃ, මාණික්‍යයතෙම; පාදෙෂු, පාදයන්හි; ලුඨති, පෙරළේද: කාචඃ, වීදුරුවක්තෙම; ශිරසි, ඉසෙහි; ධාර්‍ය්‍යතෙ, උසුලනුලැබේද; ක්‍රය වික්‍රය වෙලායාං, මිලදී ගන්නාවූද විකුනන්නාවූද කාලයෙහි; කාචඃ, වීදුරුවතෙම; කාචඃ, වීදුරුවමය. මණිඃ, මාණික්‍යයතෙම; මණිඃ, මාණික්‍යමවේ.

නින්දාකරණලද්දාවූද ස්ථිරවූ පැවතුම් ඇත්තාහුගේ බුද්ධිය හානියයි
සැක නොකටයුතුබව.

832 කදර්ථිතස්‍යාපි ච ධෛර්‍ය්‍යවෘත්තෙර්බුද්ධෙර්විනාශො න හි ශඞ්කනීයඃ
අධඃ කෘතස්‍යාපි තනූනපාතො නාධඃ ශිඛා යාති කදාචිදෙව.

කදර්ථිතස්‍යඅපිච, නින්දාකරණලද්දාවූද; ධෛර්‍ය්‍යවෘත්තෙඃ, ස්ථිරවූ පැවතුම් ඇත්තාහුගේ; බුද්ධෙඃ විනාශඃ, බුද්ධිහානියවෙසිතියා; නශඞ්කනී

ණීයඃ, සැකහොකම්පුත්‍ර; අධඃකෘතස්‍යාපි, යටිදිශාවෙන් කරණලද්දාවූ ද; තනූනපාතඃ, ගින්නගේ; ශිඛා, දැල්ලතොමෝ; කදාචිත්එව, කිසි කලෙකත්හිදු; අධඃනයාති, යටිදිශාවට නොයයි.

### රජ්ජුරුවන් සියල්ලවුන්කෙරෙ සමව පැවතිමේ ගුණ.

333 නිර්විශෙෂො යදා රාජා සමං සර්වෙෂු වර්තතෙ
තදොද්‍යමසමර්ථානාමුත්සාහඃ පරිහීයතෙ.

රාජා, රජතෙම; නිර්විශෙෂඃ, වෙනස්නැත්තේ; සර්වෙෂු, සියලුලවුන් කෙරෙහි; සමං, සමව, යදාවර්තතෙ, යම්කාලයෙක්හි පවතීද; තදා, ඒ කාලයෙහි; උද්‍යමසමර්ථානාං, උත්සාහකිරීමෙහි ශක්තිඇත්තාවූ සතුර න්ගේ; උත්සාහඃ, උත්සාහ වැඩීමතෙම; පරිහීයතෙ, පිරිහේ.

### උත්තමාධම මධ්‍යම වශයෙන් තුන්ප්‍රකාරවූ මිනිසුන්අතුරෙනි සුදුසු සුදුසු ක්‍රියාවන්හි ඔවුනොවුන් යෙදියයුතුබව.

334 ත්‍රිවිධාඃ පුරුෂා රාජන් උත්තමාධමමධ්‍යමාඃ
නියොජයෙත් තථෛවෛතාං ස්ත්‍රිවිධෙෂ්වෙව කර්මසු.

රාජන්, මහරජ; උත්තම අධමමධ්‍යමාඃ, උත්තම—අධම—මධ්‍යම්‍යයන; පුරුෂාඃ, පුරුෂයෝ; ත්‍රිවිධාඃ, ත්‍රිවිධවෙත්. එතාන්, මෙ පුරුෂයන්; තථා එව, එසේම; ත්‍රිවිධෙෂුඑව කර්මසු, තුන්ප්‍රකාර ක්‍රියාවන් විෂයෙහිම; නියොජයෙත්, යොදන්නේය.

### දාසයන්හා ආභරණයන්ද සුදුසු ස්ථානයෙහිම යොදන්නේය.

335 ස්ථාන එව හි යුජ්‍යන්තෙ භෘත්‍යාශ්චාභරණානි ච
න හි චූඩාමණිඃ පාදෙ නූපුරෙ න ච මූර්ධ්නි.

භෘත්‍යාඃච, දාසයෝද; ආභරණානිච, ආභරණයෝද; ස්ථානෙඑවහි, සුදුසු ස්ථානයෙහිම; යුජ්‍යන්තෙ, යොදනුලැබෙත්. චූඩාමණිඃ, ශිඛාමාණික්‍යයතෙම; (ඉසෙහි පළඳිනා මැණික) පාදෙ, පාදයෙහි; නහි, යොදනු නොලැබේ. නූපුරඃ, පාදයෙහි පළඳිනා වළල්ලතෙම; මූර්ධ්නි, මුදුනෙහි; නච, යොදනු නොලැබේ.

### සත්කාර ගෞරව කටයුතුවූ පණ්ඩිත අමාත්‍යාදි යමෙකුට අනාදරකළේ වීනම් ඒ ක්‍රියාව කරන්නාවූ ස්වාමියාගේ දෙෂම මුත් පණ්ඩිතයාගේ දෙෂයක් නොවන බව.

336 කනකභූෂණසංග්‍රහණොචිතො යදි මණිස්ත්‍රපුණි ප්‍රණිධීයතෙ
න ස විරෞති න චාපි ස ශොභතෙ භවති යොජයිතුර්වචනීයතා

කනකභූෂණ, රන්ආභරණයක්හා; සංග්‍රහණඋචිතඃ, සොදාගැන්ම ට සුදුසුවූ; මණිඃ, මාණික්‍යයතෙම; ත්‍රපුණි, ත්‍රපුයයි නම්ඇති ලො

හ ද්‍රව්‍යය මින්තෙහි; යදිප්‍රණිධීයතෙ. ඉදින් තබනුලැබේද; සඃ, ඒ මාණික්‍යයතෙම; නාවිරෝති, නොහඬා. සඃ, ඒ මාණික්‍යයතෙම; නාවශොභතෙ, බබලන්නේද නොවේ. යොජයිතුඃ, (රුවමහා) ගලපන්නාහට; වචනීයතා භවති, නින්දාකටයුතුබවවේ.

මූ ල කි කා ර ණ ය ස ඳ හා ම.

337 මුකුටෙ රොපිතඃ කාචශ්චරණාභරණෙ මණිඃ
න හි දොෂො මණෙරස්ති කින්තු සාධොරවිඥතා.

කාචඃ, වීදුරුවක්තෙම; මුකුටෙ, ඉසපළඳින ආභරණයෙහිහෝ ඔටුන්නෙහි; රොපිතඃ, තබනලද්දේද; මණිඃ, මාණික්‍යයක්තෙම; චරණාභරණෙ, පාදාභරණයෙහි තබනලද්දේද; මණෙඃ, මාණික්‍යයාගේ; දොෂඃ, දෝෂයෙක්; නාස්ති, ඇත්තේ නොවේ. සාධොඃ, පණ්ඩිතයාගේ; අවිඥතා, නොදන්නාබවක්නම්; කින්තු, කුමක්ද.

රජ්ජුරුවන් විසින් තමන් සේවකයන්ගේ අදහස් දැ න ග ත යු තු බ ව.

338 බුද්ධිමානනුරක්තොයම්භොභයගුණෙ ජනඃ
ඉති භෘත්‍යවිචාරඥෙ භෘත්‍යෛරාපූර්‍ය්‍යතෙ නෘපඃ

අයං, මේතෙම; බුද්ධිමාන්, නුවණැත්තේය; අනුරක්තඃ, (මේතෙම) ඇළුම්ඇත්තේය; ඉහ, මේ ස්ථානයෙහි; උභයගුණඃ ජනඃ, ගුණදෙකඇති ජනයායයි; ඉති, මෙසේ; භෘත්‍යවිචාරඥඃ, සේවකයන් පරීක්ෂාකිරීම දන්නාවූ; නෘපඃ, රජතෙම; භෘත්‍යෛඃ, සේවකයන් විසින්; ආපූර්‍ය්‍යතෙ, පූරණුලැබේ.

ඒ ඒ මිනිසුන්ට සුදුසුවීමෙන් ගැළපෙන්නාවූද නොගැළපෙන්නාවූද ද්‍රව්‍යාදිය.

339 අශ්වඃ ශස්ත්‍රං ශාස්ත්‍රං වීණා වාණී නරශ්ච නාරී ච
ප්‍රාප්‍ය මනුෂ්‍යවිශෙෂං භවන්ති යොග්‍යා අයොග්‍යාශ්ච.

අශ්වඃ, අශ්වද; ශස්ත්‍රං, ආයුධද; ශාස්ත්‍රං, ශාස්ත්‍රද; වීණා, වීණාවද; වාණී, වචනද; නරඃච, මනුෂ්‍යද; නාරීච, ස්ත්‍රීද; මනුෂ්‍යවිශෙෂං, මනුෂ්‍යවර්ගයාකරා; ප්‍රාප්‍ය, පැමිණ; යොග්‍යාඃ, යෙදෙන්නාවූ සුදුස්සෝද; අයොග්‍යාඃච, නොයෙදෙන්නාවූ නුසුදුස්සෝද; භවන්ති, වෙත්.

ශක්තිනැත්තාවූ ඇළුම්ඇත්තාගෙන්ද ශක්තිඇත්තාවූ අනුපකාර කරන්නාගෙන්ද ප්‍රයොජන නැතිබව.

340 කිං භක්තෙනාසමර්ථෙන කිං ශක්තෙනාපකාරිණා
භක්තං ශක්තඤ්ච මාං රාජන් භාවඥාතුං ත්වමර්හසි.

භක්තෙන, ආදරයඇත්තාවූ; අසමර්ථෙන, ශක්තිනැත්තාගෙන්; කිං, ප්‍රයොජන නොවේ; අපකාරිණ, සතුරුවූ; ශක්තෙන, බලඇත්තාගෙන්; කිං, ප්‍රයොජන නොවේ. රජන්, එම්බා මහරජ; ත්වං, නුඹවහන්සේ; භක්තං, ඇළුම්ඇත්තාවූද; ශක්තංච, බලඇත්තාවූද; මාං, මට; අවඥතුං, අගෞරව කිරීම, නඅර්හසි, සුදුස්සෙහි නොවේ.

රජ්ජුරුවන් විසින් පිරිවර ජනයාට අනාදරකිරීම හෙතුකොට
ගෙණ රටට පැමිණෙන හානිය.

341 අවඥනාද්‍රාඥෙ භවති මතිහිනඃ පරිජන
ස්තතස්තත්ප්‍රාධාන්‍යාද්භවති න සමීපෙ බුධජනඃ.
බුධෛස්ත්‍යක්තෙ රාජ්‍යෙ න හි භවති නීතිර්ගුණවතී
විපන්නායාං නීතෞ සකලමවශං සීදති ජගත්.

රාඥඃ, රජහුගේ; අවඥනාත්, අනාදරකිරීම හෙතුකොටගෙණ; පරිජනඃ, පිරිවර ජනතෙම; මතිහිනඃ, පිරිහුනාවූ නුවණඇත්තේ; භවති, වේ. තතඃ, පසුව; තත්ප්‍රාධාන්‍යාත්, ඔහු ප්‍රධානබැවින්; බුධජනඃ, පණ්ඩිතතෙම; සමීපෙ, සමීපයෙහි; නභවති, නොවේ. බුධෛඃ, නුවණැත්තන් විසින්; රාජ්‍යෙත්‍යක්තෙ, දෙශයහළකල්හි; නීතිඃ, නීතිශාස්ත්‍රයතොමෝ; ගුණවතී, ගුණඇත්තී; නහිභවති, නොවන්නීය; නීතෞ, නීතිය; විපන්නායාං, වෙනස්වූ කල්හි; අවශං, කැමතිසේ නොපවත්නාවූ; සකලංජගත්; සියලු දෙශය; සීදති, බසීහෙවත් පිරිහේ.

රජ්ජුරුවන් විසින් අමාත්‍යයන්ට සංග්‍රහකළකල්හි රටවැසිහුද
ඇමතියන් පුදනබව.

42 ජනං ජනපදා නිත්‍යමර්චයන්ති නෘපාර්චිතම්
නෘපෙණාවමතො යස්තු ස සර්වෛරවමන්‍යතෙ.

නෘපාර්චිතම්, රජ්ජුරුවන් විසින් පුදනලද්දාවූ; ජනං, පණ්ඩිත ජනයාට; ජනපදාඃ, ජනපදවාසීහු; නිත්‍යං, නිතර; අර්චයන්ති, පුදත්. යඃතු, යම් පණ්ඩිතයෙක් වනාහි; නෘපෙණ, රජ්ජුරුවන් විසින්; අවමතඃ, නින්දාකරණලද්දේද; සඃ, ඒ පණ්ඩිතතෙම; සර්වෛඃ, සියල්ලන් විසින්; අවමන්‍යතෙ, නින්දාකරණුලැබේ.

කියනලද මනාකාරණ බාලයාකෙරෙන්ද නුවණැත්තන්
විසින් ගතයුතුබව.

343 බාලාදපි ග්‍රහිතව්‍යං යුක්තමුක්තං මනීෂිභිඃ
රවෙරවිෂයෙ කිං න ප්‍රදීපස්‍ය ප්‍රකාශනම්.

උක්තං, කියනලද්දවූ; සූක්තං, යෙදෙන්නාවූ සුදුසුකාරණයතෙම; මනීෂිභිඃ, පණ්ඩිතයන් විසින්; බාලාත් අපි, ළදරුවකුකෙරෙන්ද; ග්‍රහීතව්‍යං, ගතයුතු. රවෙඃ, ඉරුගේ; අවිෂයෙ, රැස්නැති ස්ථානයෙහි; ප්‍රදීපස්‍ය, පහන; කිංනප්‍රකාශනම්, කෙසේ ආලෝක නොකෙරේද.

සාර අසාරබව දැනගත නොහැකි තැන්.

344 බන්ධුස්ත්‍රීභෘත්‍යවර්ගස්‍ය බුද්ධෙඃ සත්වස්‍ය චාත්මනඃ
ආපන්නිකෂපාෂාණෙ නරො ජානාති සාරතාං.

බන්ධු, නෑයන්ගේද; ස්ත්‍රී, ස්ත්‍රියගේද; භෘත්‍යවර්ගස්‍ය, දාසවර්ගයාගේද; බුද්ධෙඃ, ප්‍රඥාවගේද; සත්වස්‍ය, සත්වයාගේද; ආත්මනඃච, තමාගේද; ආපත්, විපත්තිද; සාරතාං, සාරබවද; නරඃ, මනුෂ්‍යතෙම; නිකෂපාෂාණෙ, උරගලෙහිගා; ජානාති, දනීද.

ර ජ හු ගේ බ ල ය.

345 යස්‍ය ප්‍රසාදෙ පද්මාශ්‍රී විජයශ්ච පරාක්‍රමෙ
මෘත්‍යුශ්ච වසති ක්‍රොධෙ සර්වතෙජොමයො හි සඃ.

යස්‍ය; යම්රජකුහුගේ; ප්‍රසාදෙ, පැහැදීමඇති කල්හි; පද්මාශ්‍රී, ධනය ඇතිවේද; පරාක්‍රමෙ, අනුභාවයඇති කල්හි; විජයශ්ච, ජයලැබේද; ක්‍රොධෙ; කිපිකල්හි; මෘත්‍යුඃච, මරණයද, වසති, වෙසේද; සඃ, ඒ රජතෙම; සර්වතෙජොමයඃහි; සියලු තෙජසින් කරණලද්දේමය.

රජකෙනෙක් බාලයයි නින්දානොකොට යුතුබව.

346 බාලොපි නාවමන්තව්‍යො මනුෂ්‍ය ඉති භූමිපඃ
මහතී දෙවතා හ්‍යෙෂා නරරූපෙණ තිෂ්ඨති.

බාලඃඅපි, ළදරුවූයේද; භූමිපඃ, රජතෙම; මනුෂ්‍යඃඉති, මනුෂ්‍යයෙකැයි; නඅවමන්තව්‍යඃ, අගෞරව නොකටයුතුවේ. එෂාමහතී දෙවතා හි, මේ මහත්වූ දෙවතාතොමෝ වනාහි; නරරූපෙණ, මනුෂ්‍ය රූපයෙන්; තිෂ්ඨති, සිටිනීය.

දාසයන් විසින් ස්වාමියාකෙරෙහි පැවතියයුතු ක්‍රමයක්.

347 නිරපෙක්ෂො න කර්තව්‍යො භෘත්‍යෛඃ ස්වාමී කදාචන
නිරපෙක්ෂං ප්‍රභුං කෘත්වා භෘත්‍යඃ ස්‍යාද්දධිකර්ණවත්.

භෘත්‍යෛඃ, දාසයන් විසින්; ස්වාමී, ස්වාමිතෙම; කදාචන, කිසිකලෙක්හි; නිරපෙක්ෂඃ, (දාසයන්) ඕනෑනොකරන්නෙක්; නකර්තව්‍යඃ, නොකටයුතුවේ. ප්‍රභුං, ස්වාමියා; නිරපෙක්ෂංකෘත්වා, (දාසයන්) නො

පතන්නාකොට; භෘත්‍යඃ උසතෙම; දධිකණිවත්, දධිකණ (හම්බලලා) මෙන්, * ස්‍යාත්, වන්නේය.

ඉතා කුඩා සතුරගෙන් ජයගන්නා අන්දම.

348 ක්ෂුද්‍රශත්‍රුර්භවෙද්‍යස්‍ය වික්‍රමාන්නෛව ලභ්‍යතෙ
තමාහර්තුං පුරස්කාර්‍ය්‍යඃ සදෘශස්තස්‍ය සෛනිකඃ.

යස්‍ය, යමෙකුට; ක්ෂුද්‍රශත්‍රුඃ, කුඩාවූ සතුරෙක්; භවෙත්, වන්නේද; වික්‍රමාත්, බලය හෙතුකොටගෙණ; නෛවලභ්‍යතෙ, ගතනොහේද; තං ආහර්තුං, ඔහු නසනු පිණිස; තස්‍යසදෘශඃ, ඒහා සමානවූ; සෛනිකඃ, සෙනාවඇත්තෙක්; පුරස්කාර්‍ය්‍යඃ, ඉදිරියෙහි කටයුතුවේ,

බලඇති අධිපතීන්ගේ ස්වභාවය.

349 ප්‍රතිවාචමදත්ත කෙශවඃ ශපමානාය න චෛද්‍යභූභෘතෙ
අනුහුඞ්කුරුතෙ ඝනධ්වනිං න හි ගොමායුරුතානි කෙශරී.

කෙශවඃ, කෘෂ්ණරජතෙම; ශපමානාය, නිග්‍රහකරන්නාවූ; චෛද්‍යභූභෘතෙ, චෛදිරජහට; ප්‍රතිවාචං, ප්‍රත්‍යුත්තරයක්; නඅදත්ත, නොකීයේය. කෙශරී, සිංහතෙම; ඝනධ්වනිං, මෙඝ ශබ්දයට; අනුහුඞ්කුරුතෙ, ප්‍රතිවචනදීමකෙරේ. ගොමායුරුතානි, සිවල්ශබ්දයන්ට; නහිකුරුතෙ, ප්‍රත්‍යුත්තරදීම නොකෙරේ.

උසස්ගති පැවැත්වීමෙන් ලැබෙණ විපත්ති.

350 තෘණානි නොන්මූලයති ප්‍රභඤ්ජනො
මෘදූනි නීචෛඃ ප්‍රණතානි සර්වතඃ.
සමුච්ඡ්‍රිතානෙව තරූන් ප්‍රබාධතෙ
මහාන් මහත්‍යෙව කරොති වික්‍රමම්.

සර්වතඃ, සියලු පරිද්දෙන්; නීචෛඃ, පාත්වූ පැවතුම් ඇත්තවුන් විසින්; ප්‍රණතානි, වදිනලද්දාහුවෙත්. ප්‍රභඤ්ජනඃ, වාතයතෙම; මෘදූනිතෘණානි, මොලොක්වූ තණපත්‍රයන්; නඋන්මූලයති, ඉදිරීම නොකෙරේ, සමුච්ඡ්‍රිතාන්, උස්වූ; තරූන්එව, වෘක්ෂයන්ටම; ප්‍රබාධතෙ, පීඩාකෙරේ. මහාන්, උත්තමතෙම; මහතිඑව, පූජ්‍යවූවක්හු කෙරෙහිම; වික්‍රමම් කරොති, වික්‍රමයකෙරේ.

---

* ගුහාවක සැතපෙන්නාවූ සිංහයෙකුගේ ලොමයන් මීයෙක් කපයි. මීයාට කිසිවක් කලනොහැකි සිංහතෙම බිලලෙක්හා සමග මිත්‍රව ආහාරදී සංග්‍රහකොට බිලලා තමා සමීපයෙහි වාසයකරවා සැපසේ සැතපුනේය—මෙසේ සිංහයා විසින් සංග්‍රහකරණලද බිලලාතෙම මැතකාලයෙහි මීයා මැරුයේය. ඉන්පසු මීයාගේ ශබ්දය පමණවත් නොඅසන්නාවූ සිංහතෙම බිලලාට සත්කාර නොකොට හැරියේය.

කා ර ණ ස ත ර ක ගේ බි ඳී ම ට හෙ තු.

351 අම්භසා භිද්‍යතෙ සෙතුස්තථා මන්ත්‍රොප්‍යරක්ෂිතඃ
පෛශුන්‍යාද්භිද්‍යතෙ ස්නෙහො වාග්භිර්භිද්‍යෙත හි කාතරඃ.

සෙතුඃ, පාලමතෙම; අම්භසා, ජලය කාරණකොටගෙණ; භිද්‍යතෙ, බිඳේ. අරක්ෂිතඃ, රක්ෂානොකරණ ලද්දාවූ; මන්ත්‍රඃඅපි, රහස්කථාවද; තථා, එසේම බිඳේ. ස්නෙහඃ, ප්‍රේමයතෙම; පෛශුන්‍යාත්, කෙලාම් කිම හෙතුකොටගෙණ; භිද්‍යතෙ, බිඳේ. කාතරඃ, අඥානතෙම; වාග්භිඃ, වචණයන් කාරණකොටගෙණ; භෙද්‍යඃහි, බිඳියයුතුමැයි.

කාරණය නොදැන ශබ්දය පමණට භයනොවියයුතුබව-

352 ශබ්දමාත්‍රාන්න භෙතව්‍යමඥාත්වා ශබ්දකාරණම්
ශබ්දහෙතුං පරිඥාය කුට්ටිනී ගෞරවං ගතා.

ශබ්දකාරණං, ශබ්දය ඉපදීමට හෙතුව; අඥාත්වා, නොදැන; ශබ්දමාත්‍රාත්, ශබ්දය පමණක් හෙතුකොටගෙණ; නභෙතව්‍යං, භයනොවියයුතුය. ශබ්දහෙතුං, ශබ්දය හටගන්නා කාරණය; පරිඥාය, දැන; කුට්ටිනී, සොර පුරුෂයන්හා ස්ත්‍රීන් යොදවන තැනැත්ති තොමෝ; ගෞරවං, ගරුකටයුතුබවට; ගතා, පැමිණියාය.

ස්වාමියාට දැනුම්නොදී කිසියම් ක්‍රියාවක් නොකටයුතුබව.

353 නානිවෙද්‍ය ප්‍රකුර්වීත භර්තුඃ කිංචිදපි ස්වයම්
කාර්‍ය්‍යමාපත්ප්‍රතීකාරාදන්‍යත්‍ර ජගතීපතෙඃ.

ජගතීපතෙඃ, පෘථිවීශ්වරවූ; භර්තුඃ, ස්වාමියාහට; අනිවෙද්‍ය, නොදන්වා. ආපත්ප්‍රතීකාරාත්අන්‍යත්‍ර, විපත්ති වැලක්මපිණිස කරන්නාවූ ක්‍රියාවන්හැර; කිංචිත්අපිකාර්‍ය්‍යං, අන්කිසි කටයුත්තක්; ස්වයම්, තමා; නප්‍රකුර්වීත, නොකරන්නේය.

ස්වල්පයක් විඳදම්කරමින් බොහෝ ධනරැස්කිරීම රජ ඇමති
ස ත් ගේ ක්‍රි යා ව බ ව.

354 කමණ්ඩලූපමොමාත්‍යස්තනුත්‍යාගො බහුග්‍රහඃ
නෘපතෙ කිංගුණී මූර්ඛො දරිද්‍රඃ කිං වරාටකඃ.

තනුත්‍යාගඃ, ස්වල්පයක් විඳදම්කරන්නාවූ; බහුග්‍රහඃ, බොහෝ ධනය රැස්කරන්නාවූ; අමාත්‍යඃ, ඇමතිතෙම; කමණ්ඩලූපමඃ, නළය කුඩාවූ සන්‍යාසීන්ගේ පැන් භාජනයක්වැනිවේ. නෘපතෙ, මහරජ; ගුණී, ගුණඇති තැනැත්තේ; කිංමූර්ඛඃ, කෙසේනම් අඥානවේද, වරාටකඃ, ව

රටකයක් හෙවත් කවඩියෙක් රැස්කරණ තැනැත්තේ. * දරිද්‍රඃකිං, කෙසේ දිළිඳෙක්වේද.

යම් අමාත්‍යයෙක් තුට්ටුවක් උපදවානම් ඒ අමාත්‍යයා ප්‍රධානබව

355 ස හ්‍යමාත්‍යඃ සදා ශ්‍රෙයාන් කාකිනිං යඃ ප්‍රවර්ධයෙත්
කොෂඃ කොෂවතඃ ප්‍රාණඃ ප්‍රාණඃ ප්‍රාණා න භූපතෙඃ.

යඃ, යමෙක්තෙම; කාකිනීං, තුට්ටුවක්; ප්‍රවර්ධයෙත්, වර්ධනයකෙරේද; සඃ අමාත්‍යඃහි, ඒ අමාත්‍යතෙම වනාහි; සදා, හැමකල්හි, ශ්‍රෙයාන්, ප්‍රධානවේ. කොෂවතඃ, ධනඇත්තාහට; කොෂඃ, ධනයතෙම; ප්‍රාණඃ, ප්‍රාණයෝවෙත්. භූපතෙඃ, රජ්ජුගේ; ප්‍රාණඃ, ප්‍රාණයෝ; නප්‍රාණඃ, ප්‍රාණයෝනොවෙත්.

ධනහීන තැනැත්තා කුලයෙන්හා මනාහැසිරීමෙන්ද සමන්විතවූවත් අනුන්විසින් ආශ්‍රයනොකරණබව.

356 කිංචාන්‍යෛර්නි කුලාචාරෛඃ සෙව්‍යතාමෙති පූරුෂඃ
ධනහීනඃ ස්වපත්න්‍යාපි ත්‍යජ්‍යතෙ කිම්පුනඃ පරෛඃ.

අන්‍යෛඃ කුලආචාරෛඃ, ඉතිරිවූ මනාකුල මනාහැසිරීම් යනමේ හෙතුකොටගෙණ; පූරුෂඃ, පුරුෂතෙම; කිංච, කෙසේද; සෙව්‍යතාම්, සෙවනය කටයුතුබවට; නඑති, නොපැමිණේ. ධනහීනඃ, දිළිඳු තැනැත්තේ; ස්වපත්න්‍යාඅපි, තමාගේ අඹුවවිසින්ද; ත්‍යජ්‍යතෙ, හරණුලැබේ. පරෛඃ, අන්‍යයන් විසින්; කිම්පුනඃ, හරණබව කියනුකිම.

ධනය හාණිවීමට කාරණ.

357 අතිව්‍යයොනපෙක්ෂා ච තථාර්ජනමධර්මතඃ
පොෂණං දූරසංස්ථානාං කොෂව්‍යසනමුච්‍යතෙ.

අතිව්‍යයඃ, අධිකකොට වියදම්කිරීමද; අනපෙක්ෂාච, ධනය නොසෙවීමද; තථා, එසේම; අධර්මතඃ, අධර්මයෙන්; අර්ජනම්, ධනරැස්කිරීමද; දූරසංස්ථානාං, දුරවසන්නාවුන්; පොෂණං, පොෂ්‍යයකිරීමද; කොෂව්‍යසනං, ධනය විනාශයට කාරණයයි; උච්‍යතෙ, කියනුලැබේ.

---

* වරාටකානාං දශකද්වයං යත් සා කාකිණී තාශ්ච පණශ්චතස්‍රඃ යී, වරාටකය යි නම්ලත් බොල්ලන් විස්සක් කාකිණියක් හෙවත් තුට්ටුවක්වේ. ඒකාකිණී සතරක් පණමක්වෙයියනු—භාෂ්‍යකාරවාදීන් විසින් සිද්ධාන්තශිරෝමණියෙහි කියනලද බැවින් මෙහි කී වරාටක විස්සක් තුට්ටුවක අගයහා සමානයි. වරාටක—යනු සිංහලභාෂාවෙන්—බොල්ලෝ—යයි ව්‍යවහාරකරණලද කවඩින්ගේ නාමයෙකි. කවඩි—යනු—මරාටිභාෂා,එක්තර ප්‍රාකෘත භාෂාවක ශබ්දයෙකි

ධන ඉපදීම් නොබලා වහා වියදම්කිරීමෙහි දෝෂ.

358 ක්ෂිප්‍රමායමනාලොච්‍ය ව්‍යයමානඃ ස්වවාඤ්ඡයා
ශ්‍රමණායත එවාසෞ ධනී වෛශ්‍රවණොපමඃ.

ආයංඅනාලොච්‍ය, ධනඉපදීම නොබලා; ස්වවාඤ්ඡයා, තමාගේ කැමැත්තෙන්; ක්ෂිප්‍රං, වහා; ව්‍යයමානඃ, වියදම්කරණ සුලුවූ; අසෞ, මේතෙම; වෛශ්‍රවණොපමඃ, වෛශ්‍රවණයා මෙන්; ධනී, ධනඇත්තේද; ශ්‍රමණායතෙඑව, භික්ෂුවක්මෙන්වේ.

රාජසන්තක ධනය පිළිබඳවූ ස්වාමිභාවයට නුසුදුස්සෝ.

359 බ්‍රාහ්මණඃ ක්ෂත්‍රියො බන්ධුර්නාධිකාරෙ ප්‍රශස්‍යතෙ
බ්‍රාහ්මණඃ සිද්ධමප්‍යර්ථං කෘච්ඡ්‍රෙණාපි න යච්ඡති.

බ්‍රාහ්මණඃ, බ්‍රාහ්මණයෙක්හෝ; ක්ෂත්‍රියඃ, ක්ෂත්‍රියයෙක්හෝ; බන්ධුඃ නෑයෙක්හෝ; අධිකාරෙ, (රාජසන්තක ධනයට) ස්වාමිභාවයෙහි; නප්‍රශස්‍යතෙ, ප්‍රශංසාකරණු නොලැබේ. බ්‍රාහ්මණඃ, බමුණුතෙම; සිද්ධං අර්ථංඅපි, උපන්නාවූ ධනයද; කෘච්ඡ්‍රෙණාපි, දුකින්ද; නයච්ඡති, නොදේ.

රාජසන්තක ධනයෙහි ප්‍රධානබවට පැමිණි ක්ෂත්‍රියයාගා
නැසාද පිළිපදිනා ක්‍රමය.

360 නියුක්තඃ ක්ෂත්‍රියො ද්‍රව්‍යෙ ඛඩ්ගං දර්ශයතෙ ධ්‍රුවම්
සර්වාර්ථං ග්‍රසතෙ බන්ධුරාක්‍රම්‍ය ඥාතිභාවතඃ.

ද්‍රව්‍ය, ධනවිෂයෙහි; නියුක්තඃ, (ස්වාමිභාවයට) යෙදුනාවූ; ක්ෂත්‍රියඃ, ක්ෂත්‍රියගොත්‍රඇති තැනැත්තේ; ධ්‍රුවම්, ඒකාන්තයෙන්; ඛඩ්ගංදර්ශයතෙ, කඩුවදක්වා. බන්ධුඃ, ඥාතිජනතෙම; ඥාතිභාවතඃ, නෑබව හෙතුකොටගෙණ; සර්වාර්ථංආක්‍රම්‍ය සියලුද්‍රව්‍ය පැහැරගෙණ; ග්‍රසතෙ, අනුභවකෙරේ.

බොහෝකාලයක් සේවයකළ නියොගකරන්නාගේ අපරාධ
යක් ඇතිකල්හිද සැකනොකටයුතුබව.

361 අපරාධෙපි නිඃශඞ්කො නියොගී චිරසෙවකඃ
ස ස්වාමිනමවඥාය චරෙච්ච නිරවග්‍රහඃ.

චිරසෙවකඃ, බොහෝකාලයක් සේවයකළාවූ; නියොගී, නියොගකිරීමෙහි ප්‍රවිෂ්ටතැනැත්තේ. අපරාධෙපි, අපරාධයක්ඇති කල්හිද; නිඃශඞ්කඃ, සැකනොකටයුතු; සඃච, ඒ සේවකතෙමේද; ස්වාමිනං ස්වාමියාට; අවඥාය, අගෞරවකොට; නිරවග්‍රහඃ, තමාකැමති පරිද්දෙන් ;කරන් තෙත්; චරෙත්, හැසිරෙන්නේය.

ස්වාමියාට උපකාරකරන්නෙක් ද්‍රව්‍ය විධානයෙහි නොපිහිටුවි ය යු තු බ ව.

362 උපකර්ත්තාධිකාරස්ථඃ ස්වාපරාධං න මන්‍යතෙ
උපකාරං ධ්වජීකෘත්‍ය සර්ව්වමෙව විලුම්පති.

උපකර්ත්තා, උපකාරකරන්නෙක්; අධිකාරස්ථඃ, ධනවිධානකරණ ප්‍රධානධුරයෙහි පිහිටියේ, ස්වාපරාධං, තමාගේ අපරාධය; නමන්‍යතෙ, නොසිතා, උපකාරං, උපකාරය; ධ්වජීකෘත්‍ය, ධ්වජයක්මෙන් උසස්කොටගෙණ; සර්ව්වංඑව, සියල්ලම; විලුම්පති, පැහැරගණී.

රහස්ස්ථානයෙහි ක්‍රීඩාකරණලද්දාවූ අමාත්‍යයෙක් රජෙක්මෙන් බලඇත්තෙක් නොකටයුතුබව.

363 උපාංශුක්‍රීඩිතොමාත්‍යඃ ස්වයං රාජායතෙ යතඃ
අවඥා ක්‍රියතෙ තෙන සදා පරිචයාද්ධ්‍රුවම්.

උපාංශු, රහස්තැන්හි; ක්‍රීඩිතඃ, ක්‍රීඩාකරණලද්දාවූ; අමාත්‍යඃ, ඇමති තෙම; ස්වයං, තෙමේ; යතඃ, යම්කාරණයක් හෙතුකොටගෙණ; රාජායතෙ, රජෙක්මෙන්වේද. තෙන, ඒ ඇමතියාවිසින්; සදාපරිචයාත්, හැමකල්හි පුරුද්ද හෙතුකොටගෙණ; ධ්‍රුවම්, එකාන්තයෙන්; අවඥාක්‍රියතෙ, අගෞරව කරණුලැබේ.

දූෂ්‍යවූ සිත්ඇති ඉවසිලිඇත්තාවූ අමාත්‍යයා සියලු අනර්ථකරන්නෙක්බව.

364 අන්තර්දුෂ්ටඃ ක්ෂමායුක්තඃ සර්ව්වානර්ථකරඃ කිල
ශකුනිඃ ශකටාරශ්ච දෘෂ්ටාන්තාවත්‍ර භූපතෙ.

අන්තර්දුෂ්ටඃ, දූෂ්‍යවූ සිත්ඇති; ක්ෂමායුක්තඃ, නොහරණලද ඉවසිලිඇති තැනැත්තේ; සර්ව්වානර්ථකරඃකිල, එකාන්තයෙන් සියලු නපුරකරන්නෙක්වේ. භූපතෙ, එම්බා මහරජ; අත්‍ර, මේ කාරණයෙහි; ශකුනිඃ, (හස්තිනාපුරයෙහි දුර්‍යෝධන රජුගේ මාමාවූ) ශකුනිනම් ඇමතිද; ශකටාරඃච, (මගධරට පැළලුප්නුවර—නන්දරජුගේ ඇමතිවූ)—ශකටාර නම් පණ්ඩිතයාද; දෘෂ්ටාන්තෞ, උදාහරණවෙත්.

පසුව වැඩිදියුනුවට පැමිණී සියල්ලන්ම වශගකළ නොහැකි බවහා වැඩිදියුනුව සිතපෙරළීමෙන් අන්‍ය ස්වභාවය ක ට ප මු ණු ව න බ ව.

365 සදාත්‍යාමසාධ්‍යඃ ස්‍යාත් සමෘද්ධඃ සර්ව්ව එව හි
සිද්ධානාමයමාදෙශ සෘද්ධිශ්චිත්තවිකාරිණී.

සමෘද්ධිඃ, (ඓශ්වර්‍ය්‍යයෙන්) දියුණුවූ; සර්වඃඑව, සියල්ලම; ආයත්‍යාං, මතුකාලයෙහි; සද්‍ය, හැමකල්හි; අසාධ්‍යඃස්‍යාත්, වශගකළ නොහැක්කේවන්නේය. සිද්ධානාං, වැඩුනාවුන්ගේ; අයංආදෙශඃ, මේ අන්‍යප්‍රකාරයෙක්වේ. ශුද්ධිඃ, වැඩීම නොමෝ; චිත්තවිකාරිණී, සිතපෙරළන්නීය.

අමාත්‍යයක්හුගේ දූෂ්‍යවීමට කරුණු.

366 ප්‍රාප්තාර්ථග්‍රහණං ද්‍රව්‍යපරිවර්ත්තනානුරෝධනම්
උපෙක්ෂා බුද්ධිහීනත්වං භොගොමාත්‍යස්‍ය දූෂණම්.

ප්‍රාප්තාර්ථග්‍රහණං, ලද්දාවූ ධනය ගැන්මද; ද්‍රව්‍යපරිවර්ත්තඃ, ද්‍රව්‍යමාරු කිරීමද; අනුරෝධනම්, නිතර හැසිරීමද; උපෙක්ෂා, තමාගේ අයිතියට නොගැණීමද; බුද්ධිහීනත්වං, නුවණ නැතිබවද; භොගඃ, විෂයරස අනුභවයද.

ප ළ මු කා ර ණ ය ම.

367 නියොග්‍යාර්ථග්‍රහාපායො රාඥං නිත්‍යපරීක්ෂණම්
ප්‍රතිපත්තිප්‍රදානං ච තථා කර්ම්මවිපර්ය්‍යයඃ.

නියොග්‍යාර්ථග්‍රහ, ස්වාමියාගේ ධනගබඩාව; අපායඃ, නොවැඩීමහෝ නැසීමද; රාඥං, රජ්ජුන්විසින් (තමන්කෙරේ ඇළුම් ඇති නැති බව); නිත්‍යපරීක්ෂණම්, නිතර පරීක්ෂාකිරීමද; ප්‍රතිපත්ති, ස්වාමියාවිසින් සතුටින්දෙනලද ද්‍රව්‍ය, ප්‍රදානංච, අනුන්ටදීමද; තථා, එසේම; කර්ම්මවිපර්ය්‍යයඃ, (නියොගකරණලද) ක්‍රියාවන් වෙනස්කොට කිරීමද; අමාත්‍යස්‍ය අමාත්‍යයා; දූෂණම්, දූෂ්‍යකරණ කරුණුයි.

රජඇමතියන්ට පීඩාකළකල්හි හෙවත් යාච්ඤාකළකල්හි
ඇතුළත තිබෙණද්‍රව්‍ය මැත්කොටදෙනබව.

368 නිෂ්පීඩිතා වමන්ත්‍යුච්චෛරන්තඃසාරං මහීපතෙඃ
දුෂ්ටව්‍රණා ඉව ප්‍රායො භවන්ති හි නියොගිනඃ.

දුෂ්ටව්‍රණාඃඉව, අසාධ්‍යවණයන්මෙන්; උච්චෛඃ, මහත්වශයෙන්; නිෂ්පීඩිතාඃ, මිරිකණලද්දාහු; අන්තඃසාරං, (වණය) ඇතුළත පවත්නාසැරව; වමන්ති, ( පිටතට ) නිකුත්කෙරෙත්; නියොගිනඃ, නියොගකරන්නාවූ ඇමතිවරයෝ; මහීපතෙඃ, රජහුගේ; (ධනය පීඩාකරණලද්දාහුම) ප්‍රායඃ, බොහෝසෙයින්; (නිකුත්කරන්නාහු) භවන්තිහි, වෙත්මැයි.

අතිශයින් පීඩාකරණලද්දාහුද ඇමතියෝ රජහුගේ ධනය
නොහරණාහුය යනබව.

369 මුහුර්නියොගිනො බොධ්‍යා වසුධාරා මහීපතෙඃ.
සකෘත් කිං පීඩිතං ස්නානවස්ත්‍රං මුඤ්චෙද්බහූදකම්.

භූත්‍යඃ, නිරන්තරයෙන් හෙවත් අතිශයින්; බොධ්‍යාඃ, අවබොධකරණ හෙයින් පීඩාකරණලද්දාවූ; නියොගිනඃ, ඇමතියෝ; මහිපතෙඃ, රජහු ගේ; වසුධාරාඃ, ද්‍රව්‍යරාශීන්; (නොහරණහුය) සන්තෘප්තිඛිතං, එක්වරක් මිරිකණලද්දාවූ; ස්තානවස්ත්‍රං, (මිනිසුන්ගේ) දියනාන, වස්ත්‍රයතෙම බහුදකං, බොහෝදිය; කිංමුචෙත්, කෙසේනම් නික්මවන්නේද·

අණකඩකරන්නාවූ පුත්‍රයෙකුටපවා රජක්හු ක්‍ෂමානොවනහෙයින්:

රජුන්ගේ සිත්හි පවත්නා ආලයෙහි කිසිවෙකුටත් වෙන සක් නැතිව සාධාරණබව.

370 ආඥාභඞ්ගකරාන් රාජා න ක්‍ෂමෙත සුතානපි

විශෙෂඃ කො නුරාගස්‍ය රාඥශ්චිත්තගතස්‍ය ච.

රාජා, රජතෙම; ආඥාභංගකරාන්, රජඅණ ඉක්මවා පවත්නාවූ; සුතා න්අපි, පුත්‍රයන්ටපවා; නක්‍ෂමෙත, ක්‍ෂමානොකරන්නේය. (නිදහස් නොකරන්නේය) රාඥඃ, රජුගේ; චිත්තගතස්‍ය, සිත්හි පවත්නාවූ; අ නුරාගස්‍ය, ස්නෙහයාගේ; විශෙෂඃ, වෙනසක්නම්; කඃච, කුමක්ද.

ඓශ්වර්‍ය්‍යයද—මිත්‍රබවද—කුලයද—සුචරිතයද—ශාස්ත්‍රඵලයද සැපතද—රාජ්‍යයද විනාශවීමට කාරණ.

371 ස්තබ්ධස්‍ය නශ්‍යති යශො විෂමස්‍ය මෛත්‍රී

නෂ්ටෙන්ද්‍රියස්‍ය කුලමර්ථපරස්‍ය ධර්මඃ·

විද්‍යාඵලං ව්‍යසනිනඃ කෘපණස්‍ය සෞඛ්‍යං

රාජ්‍යං ප්‍රමත්තසචිවස්‍ය නරාධිපස්‍ය.

ස්තබ්ධස්‍ය, දැඩිතැනැත්තාගේ; යශඃ, කීර්ත්තියහෝ ඓශ්වර්‍ය්‍යයද විෂමස්‍ය, දූෂ්‍යවූ පැවතුම්ඇත්තාගේ; මෛත්‍රී, මිත්‍රබවද; නෂ්ටඉන්ද්‍රිය ස්‍ය, නිග්‍රහ නොකරණලද ඉන්ද්‍රිය ඇත්තාහුගේ; කුලම් කුලයද; අර්ථප රස්‍ය, ධනයෙහි ඇලුනාහුගේ; ධර්මඃ, මනා පැවතිමද; ව්‍යසනිනඃ, විප ත්තියට පැමිණියාහුගේ; විද්‍යාඵලං, ශාස්ත්‍රයෙහි ප්‍රයොජනද; කෘපණ ස්‍ය, දිළිඳු තැනැත්තාගේ; සෞඛ්‍යං, සැපඇතිබවද; ප්‍රමත්තසචිවස්‍ය, ප්‍රමාදවූ අමාත්‍යයන්ඇති; නරාධිපස්‍ය, රජහුගේ; රාජ්‍යං, රටද; (යන මේ සියල්ල) නශ්‍යති, නොපවතී.

රජකෙනෙකුගෙන් ලොවටඇති වැඩ,

372 තස්කරෙභ්‍යො නියුක්තෙභ්‍යඃ ශත්‍රුභ්‍යො නෘපවල්ලභාත්

නෘපතිර්නිජලොභාච්ච ප්‍රජා රක්‍ෂෙත් පිතෙව හි.

තස්කරෙභ්‍යඃ, සොරුන්කෙරෙන්ද; නියුක්තෙභ්‍යඃ, නියොගකරන්න වුන් කෙරෙන්ද; ශත්‍රුභ්‍යඃ, සතුරන්කෙරෙන්ද; නෘපවල්ලභාත්, රජහ

ට ඇළුම්ඇතිව වසන්නාවුන්කෙරෙන්ද; නිජලොභාත්ච, තමාපිළිබඳවූ ලොභය කෙරෙන්ද; රජා, රජතෙම; පිතාඉව, පියෙක්මෙන්; ප්‍රජාඃ, ලෝවැසියන්; රක්‍ෂෙත්, රක්‍ෂාකරන්නේය.

වෙශාස්ත්‍රියක් තමාගේ නිර්දෝෂතාවය ප්‍රකාශකිරීම සඳහා
කරන්නාවූ සත්‍යක්‍රියාවක්.

373 ආදිත්‍යචන්ද්‍රාවනිලොනලශ්ච ද්‍යෞර්භූමිරාපො හෘදයං යමශ්ච
අහශ්ච රාත්‍රිශ්ච උභෙ ච සන්ධ්‍යෙ ධර්ම්මශ්ච ජානාති
නරස්‍ය වෘත්තම්.

ආදිත්‍යචන්ද්‍රෞ, ඉරුසඳුදෙදෙනාද; අනිලඃ, වාතයද; අනලඃච, ගින්නද; ද්‍යෞඃ, අහසහෝ දෙව්ලොවද; භූමිඃ, පෘථිවියද; ආපඃ, ජලයද; හෘදයං, සිතද; යමඃච, මරුවාද; අහඃච, දවලද; රාත්‍රිඃච, රාත්‍රියද; උභෙසන්ධ්‍යෙච, උදය සවස දෙකාද; ධර්ම්මඃච, ධර්ම්මයද; නරස්‍ය, මනුෂ්‍යයාගේ; වෘත්තම්, පැවැත්ම; ජානාති, දනී.

අසත්‍යවූ කාරණයන්පවා දක්‍ෂයන්ට සත්‍යවූ කාරණයන්මෙන්
දැ ක් වි ය හැ කි බ ව.

374 අතථ්‍යාන්‍යපි තථ්‍යානි දර්ශයන්ති හි පෙශලාඃ
සමෙ නිම්නොන්නතානීව චිත්‍රකර්ම්මවිදො ජනාඃ.

චිත්‍රකර්ම්මවිදඃ, සිතියම්දන්නාවූ; ජනාඃ, මනුෂ්‍යයෝ; සමෙ, සමවූතැන්හි; නිම්නඋන්නතානිඉව, උස්මිටිතැන් දක්වන්නාක්මෙන්; පෙශලාඃ, කපටිවූහෝ දක්‍ෂයෝ; අතථ්‍යානිඅපිහි, අවිද්‍යමාන කාරණයන්පවා; තථ්‍යානි, විද්‍යමානකාරණයන්මෙන්; දර්ශයන්ති, ප්‍රකාශකෙරෙත්.

පැමිණි කටයුත්තෙහි බුද්ධිය යමෙකුට ඇත්නම් ඔහු දුෂ්කරවූද
කාරණයන්කෙරෙන් නිදහස්වෙයි යනබව.

375 උත්පන්නෙෂ්වපි කාර්‍ය්‍යෙෂු මතිර්‍යස්‍ය න හීයතෙ
ස නිස්තරති දුර්ගාණි ගොපී ජාරබයං යථා.

උත්පන්නෙෂුකාර්‍ය්‍යෙෂු, කටයුත්තක් පැමිණිකල්හි; යස්‍ය, යමක්හුගේ; මතිඃ, ප්‍රඥාතොමෝ; නහීයතෙ, නොපිරිහේද; සඃ, හෙතෙම; ගොපී, ගොපලුභාර්‍ය්‍යාතොමෝ; ජාරබයංයථා, සොරසැමියන් දෙදෙනාමෙන්; දුර්ගාණිඅපි, දුකසේ යායුතුතැන්ද; නිස්තරති, එතරවේ. *

* වාරවතිනම් පුරයෙහි එක්තරා ගොපාලයකුගේ හොරහිමියන් පතන්නාවූ අඹුවක් ඇත්තීය. ඈ ඒ නුවර දණ්ඩනායකයාහා ඔහුගේ පුත්‍රයාසමගද ඇලී වසන්නීය. ඈ එක්දිනක් දණ්ඩනායක පුත්‍රයාහා සමග ඇලෙනු ලබන්නී සිටියාය. ඒ අතුරෙහි දණ්ඩනායකයාද ආයේය. එදුක දණ්ඩනායක පුත්‍රයා කොටුවෙහිසඟ

ස්ත්‍රීන්ට පුරුෂයන් මෙපමණඇතැයි තෘප්තියක් නැතිබව,

376 නාග්නිස්තෘප්‍යති කාෂ්ඨානාං නාපගානාං මහොදධිඃ
නාන්තකඃ සර්වභූතානාං න පුංසාං වාමලොචනා.

අග්නිඃ, ගිනිතෙම; කාෂ්ඨානාං, කාෂ්ඨයන්ගේ හෙවත් දඬුද්‍රව්‍යයන්ගේ; නතෘප්‍යති, මේ ඇතැයි ඒපාවීමකට නොපැමිණේ; මහොදධිඃ, සාගරයතෙම; ආපගානාං, නදීන්ගේ; න, තෘප්තියක්නැත්තේය. අන්තකඃ, මරුතෙම; සර්වභූතානාං, සියලුසත්වයන්ගේ, න, තෘප්තියක් නැත්තේය. වාමලොචනා, ස්ත්‍රීතොමෝ; පුංසාං, පුරුෂයන්ගේ; න, තෘප්තියක් නැත්තේය,

ද්‍රව්‍යදීම් ආදි ක්‍රියාවලින් ස්ත්‍රීන්ගේ සිත් ගතනොහැකිබව.

377 න දානෙන න මානෙන නාර්ජවෙන න සෙවයා
න ශස්ත්‍රෙණ න ශාස්ත්‍රෙණ විෂමාඃ සර්වථා ස්ත්‍රියඃ,

දානෙන, දීමෙන්; න, (ස්ත්‍රිය සතුටුකළ) නොහේ. මානෙන, සිතින් ප්‍රියවීමෙන්; න, (සතුටුකළ) නොහේ ආර්ජවෙන, ඇදනැතිව පැවැත්මෙන්; න, (සතුටුකළ) නොහේ. සෙවයා, සෙවනයකිරීමෙන්; න, (සතුටුකළ) නොහේ. ශස්ත්‍රෙණ, ආයුධයෙන්; න, (වශගතවයට පැමිණවීම) නොහැකිවේ; ශාස්ත්‍රෙණ, ශාස්ත්‍රයෙන්; න, (වසගකළ) නොහේ· ස්ත්‍රියඃ, ස්ත්‍රීහු; සර්වථා, සියලු පරිද්දෙන්; විෂමාඃ, අසමානවෙත්.

ගුණාදියෙන්යුත් ස්වාමියාහැර ගුණාදියෙන් හීනවූ පුරුෂයන්කරා
ස්ත්‍රී න් ය න බ ව.

378 ගුණාශ්‍රයං කීර්තියුතං ච කාන්තං
පතිං රතිඥං සධනං යුවානම්.
විහාය ශීඝ්‍රං වනිතා ව්‍රජන්ති
නරාන්තිකං ශීලගුණාදිහීනම්.

---

වා දණ්ඩනායකයාහා සමඟ ඒසේම ක්‍රීඩාකරන්නී සිටියාය. ඊවපසු ඇගෙ ස්වාමිවූ ගොපලුතෙම ගාලකෙරෙන් ඇයේය—ඔහුදුටු දණ්ඩනායකය නුඹ පොල්ලක් ගෙණ ක්‍රොධය ප්‍රකාශකෙරෙමින් විගා යවයි ගොපලු භාර්‍ය්‍යාතොමෝ කීය. එසේ කළ කල්හි ගොපොල්ලා එහි අවුත් දණ්ඩනායකයා කුමක්නිසා මෙහි ඇයේදැයි අඹුවගෙන් විචාළේය. ඒකල්හි ගොපලු අඹුතොමෝ මේතෙම මොනකාරණයක් නිසාද පුත්‍රයා කෙරෙහි කිපුණේය. පුත්‍රයාද දුවන්නේ මෙහි අවුත්වන්නේය· මාවිසින් කොටුවෙහිලා රක්නාලද්දේය. සොයන්නාවූ ඔහුගේ පියාවිසින් නොදක්නාලද්දේය. එබැවින් ඒතෙම ඒ පුතෙමයෙහි සියා දණ්ඩනායක පුත්‍රයා කොටුවකෙරෙන් බස්වා දක්වීය. මේ කථාවෙහි මාතෘකාව වශයෙන්—උත්පන්නෙෂ්වපි—යනාදිශ්ලොකය කියනලදී·

වනිතා, ස්ත්‍රීතොමෝ; ගුණාශ්‍රයං, ගුණයට ස්ථානවූ; කීර්තියුතංච, කීර්තියෙන්ද යුක්තවූ, කාන්තං, මනොහරවූ; රතිඥං, ඇළිමදන්නාවූ; සධනං, ධනඇත්තාවූ; යුවානම්, තරුණවූ; පතිං, ස්වාමියා; ශීඝ්‍රං, වහා; විහාය, හැර; ශීලගුණාදිහීනම්, ශීලගුණ ආදියෙන් හීනවූ; නරාන්තරං, අන්මිනිසක්හුකරා; ව්‍රජන්ති, පැමිණෙත්.

ස්ත්‍රීන්ගේ පවිටු අදහසක්.

379 න තාදෘශීං ප්‍රීතිමුපෛති නාරී විචිත්‍රශය්‍යාං ශයිතාපි කාමම්
යථා හි දූර්වාදිවිකීර්ණභූමෞ ප්‍රයාති සෞඛ්‍යං පරකාන්තසඞ්ගාත්.

දූර්වාදිවිකීර්ණභූමෞ, විසුරුණාවූ ඊතණආදියඇති භූමියෙහි; පරකාන්තසඞ්ගාත්, සොරසැමියන්හා ඇළීම හෙතුකොටගෙණ; යථාහිසෞඛ්‍යං, යම්බඳුවූ සැපතකට; ප්‍රයාති, පැමිණේද; තාදෘශීංප්‍රීතිං, එබඳුවූ ප්‍රීතියකට; විචිත්‍රශය්‍යාං, විසිතුරු යහනෙක්හි; ශයිතාඅපි, සැතපුනාවුද; නාරී, ස්ත්‍රීතොමෝ; කාමම්, එකාන්තයෙන්; න උපෛති, නොපැමිණේ.

ස්ත්‍රීන්ගේ දෘෂ.

380 ආහාරෙ ද්විගුණඃ ස්ත්‍රීණාං බුද්ධිස්තාසාං චතුර්ගුණා
ෂඩ්ගුණො ව්‍යවසායශ්ච කාමශ්චාෂ්ටගුණඃ ස්මෘතඃ.

ස්ත්‍රීණාං, ස්ත්‍රීන්ගේ; ආහාරඃ, ආහාරයතෙම; ද්විගුණඃ, දෙකොටසෙක්වේ. තාසාං, ඒ ස්ත්‍රීන්ගේ; බුද්ධිඃ, ප්‍රඥතොමෝ; චතුර්ගුණා, සතරකොටසක් වන්නීය. ව්‍යවසායඃච, වෙළඳමද; ෂඩ්ගුණඃ, සකොටසෙක්වේ. කාමඃච, කාමයද; අෂ්ටගුණඃ, අටකොටසෙකැයි; ස්මෘතඃ, දන්නාලදී.

මහත්බලයටවඩා උපාය ජයගන්නාබව.

381 උපායෙන හි යච්ඡක්‍යං න තච්ඡක්‍යං පරාක්‍රමෛඃ
කාකී කනකසූත්‍රෙණ කෘෂ්ණසර්පමඝාතයත්.

උපායෙනහි, උපායෙන් වනාහි; යත්ශක්‍යං, යමක්කළහැකිද; තත්, ඒතෙම; පරාක්‍රමෛඃ, මහත්වීර්‍ය්‍යවිලින්; නශක්‍යං, කළහැකිනොවේ. කාකී, කව්ඩුවෙනුතොමෝ; කනකසූත්‍රෙණ; රන්හුය (නූල) කරණකොටගෙණ; කෘෂ්ණසර්පම්, නාගයා, අඝාතයත්, මැරවීය. *

* එක් ගස්සිදුරෙක්හි වසන්නාවූ නාගයෙක් ඒ ගසෙහි වසනා කවුඩුවෙනුවකගේ බිජු කා නැතිකෙරෙයි. ඒ දුක ශොකපත්වූ කවුඩුවෙනුතොමෝ නාගයා මරණු පිණිස ඒ ගසට නුදුරුවිලෙක්හි පැන් නානනාවූ රාජපුත්‍රයක්හුගේ විල් ඉවුරෙහිවූ ගලමත්තෙහි තබනාලද රන්නූල ඇගේ තුඩින්ගෙණවුත් සර්පයාවසනා ගස්බිලයෙහි හෑවීය. එකල්හි රන්නූලගෙණයනා පසුපස්සෙහි ගියාවූ රාජපුරුෂයන්විසින් ගස්බිලයෙහි බලනූලබන්නේ සර්පයාදක මරණලද්දේය. උපායෙහි බලය දක්වීම පිණිස මේ කථාව සඳහා මූලකී ශ්ලොකය කියනලදී.

### අසත්පුරුෂ භාර්‍ය්‍යාවන්ගේහා කපටි මිත්‍රාදීන්ගේද දොෂ.

382 දුෂ්ටා භාර්‍ය්‍යා ශඨං මිත්‍රං භෘත්‍යශ්චොත්තරදායකඃ
සසර්පෙ ච ගෘහෙ වාසො මෘත්‍යුරෙව න සංශයඃ.

දුෂ්ටාභාර්‍ය්‍යා, පව්ටුඅඹුවද; ශඨංමිත්‍රං, කපටිමිත්‍රයාද; උත්තරදායකඃ, උත්තරදෙන්නාවූ; භෘත්‍යඃච, මෙහෙකරුද; සසර්පෙගෘහෙ, සර්පයකු සහිතවූගෙයි; වාසඃච, විසීමද; මෘත්‍යුඃඑව, මරණයමවේ. නසංශයඃ, සැකනැත්තේය.

### නුවණැත්තාහට බලය අයිතිබවහා අඥානයාගේ දුර්වලබව.

383 බුද්ධිර්යස්‍ය බලං තස්‍ය නිර්බුද්ධෙස්තු කුතො බලම්
පශ්‍ය සිංහො මදොන්මත්තඃ ශශකෙන නිපාතිතඃ.

බුද්ධිඃ, ප්‍රඥතොමෝ; යස්‍ය, යමක්හුගේද; බලං, බලය; තස්‍ය, ඔහුගේවේ. නිර්බුද්ධෙඃතු, අඥානයාහට වනාහි; බලම්, බලයෙක්; කුතඃ, කොයින්වේද; මදොන්මත්තඃ, මදයෙන්මත්වූ; සිංහඃ, සිංහතෙම; ශශකෙන, සාවාවිසින්; නිපාතිතඃ, හෙලනලද්දේය; පශ්‍ය, බලව. †

---

† මන්දරනම් පර්වතයෙහි දුර්දාන්තයනා නම්ඇති සිංහයෙක් වෙසෙයි. හෙතෙම හැමකල්හි සිව්පාවුන් මරයි. පසුව සියලු සිව්පාවෝ එක්ව ස්වාමිනි කවරකාරණයෙකින් සියලු සිව්පාවුන්ගේ මරණයකරනුලැබේද නුඹවහන්සේගේ ආහාරය සඳහා අපිම දවස්පතා එක එක සිව්පාවා නුඹසමීපයට එලවන්නම්හයි සිංහයාට කීවිය. ඉදින් මේ කාරණය තොපට කැමතිනම් එසේවේවයි සිංහයා කීයේය. එතැන් පටන් දවස්පතා සමීපයට එලවියාවූ එක එක සිව්පාවාකමින් සිංහයා සිටියේය. පසුව එක් මහලු සාවෙකුට වාරය පැමිණියේය. එකල්හි සාවා සිතනුයේ ජීවිත ආශාවෙන් භයහෙතුකොටගෙණ හික්මීම කරනුලැබෙයි. ඉදින් මරණයට පැමිණෙම්නම් මාගේ සිංහයාට යටත්ව පැවැත්මෙන් කවර ප්‍රයොජනද එහෙයින් පමාවයම් සිතුයේය. පසුව සිංහයාද ක්ෂුධාවෙන් පීඩිතව කොපයෙන් තෝ කවර හෙයකින් පමාවීමෙන් ආයෙහිදැයි සාවා විචාලේය. මම අපරාධයක් නොකලෙමි මාර්ගයෙහි අනික් සිංහයෙක් විසින් බලාත්කාරයෙන් අල්වාගන්නා ලද්දේය. දෙවනු එමැයි ඔහුගේ ඉදිරියෙහි දිවුර ස්වාමීන් වහන්සේට දැනුම්දීම පිණිස මෙහි ආමි කීයේය. කොපසහිතවූ සිංහතෙම ඒ අසත්පුරුෂයා කොතැන්හි සිටිද වහාගොස් මට දක්වවයි කීයේය. පසුව සාවා සිංහයාගෙණ ගැඹුරුවූ ලිඳක් සමීපයට ආයේය. එහි අවුත් ස්වාමිනි බැලුවමැනවැයි කියා ඒ ලිදෙහිවූ දියෙහි ඒ සිංහයාගේම ජායාරූපය දක්වූයේය. සිංහයාද අභිමානයෙන් පිපී ඒ ජායාරූපය මත්තෙහි පැනනැස්සුණේය. මේ කථාව අරබයා ප්‍රඥාවගේ බලය දක්වීම පිණිස මූලති ශ්ලොකය කියනලදී:

ඉදින් මරණයට පැමිණේනම් භය හේතුකොටගෙණ ජීවිත
ආශාවෙන් කරන්නාවූ භික්ෂීමෙන් ප්‍රයොජන නැතිබව.

324 ත්‍රාසහෙතොර්විනීතිසතු ක්‍රියතෙ ජීවිතාශයා
පඤ්චත්වං චෙද්ගමිෂ්‍යාමි කිං සිංහානුනයෙන මෙ.

විනීතිඃතු, භික්ෂීම වනාහි; ජීවිතාශයා, ජීවිතයෙහි ආශාවෙන්; ත්‍රාසහෙතොඃ, භයහෙතුකොටගෙණ; ක්‍රියතෙ, කරණුලැබේ. පඤ්චත්වං, මරණබවට; චෙත්ගමිෂ්‍යාමි, ඉදින් පැමිණෙම්නම්; මෙ, මාගේ; සිංහ අනුනයෙන, සිංහයාට අනුව පැවැත්මෙන්; කිං, ප්‍රයොජනකිම.

අනුන්ගේ විචාරීමක් නැතිව කරුණු කියයුතුතැන්.

325 ආපද්‍යුන්මාර්ගගමනෙ කාය්‍ය්‍යකාලාත්‍යයෙෂු ච
කල්‍යාණවචනං බ්‍රූයාදපෘෂ්ටොපි හිතො නරඃ.

අපෘෂ්ටඃඅපි, නොවිචාරණලද්දවූද; හිතඃනරඃ, වැඩකැමැති මනුෂ්‍ය තෙම; ආපදි, විපත්තිකාලයෙහිද; උන්මාර්ගගමනෙ, නොමගයනකල්හිද; කාය්‍ය්‍යකාල, කටයුතුකාලය; අත්‍යයෙෂුච, ඉක්මයනකල්හිද; කල්‍යාණවචනං, මනාවචනය; බ්‍රූයාත්, කියන්නේය.

රජුටහා අමාත්‍යයාට අයිතිදෙය.

326 භොගස්‍ය භාජනං රජා මන්ත්‍රී කාය්‍ය්‍යස්‍ය භාජනම්
රජකාය්‍ය්‍යපරිධ්වංසි මන්ත්‍රී දොෂෙණ ලිප්‍යතෙ.

රජා, රජතෙම; භොගස්‍ය, ධනයාගේ; භාජනං, ස්ථානයයි. මන්ත්‍රී, අමාත්‍යතෙම; කාය්‍ය්‍යස්‍ය, කටයුතු රජකෘත්‍යයාගේ; භාජනං, ස්ථානය වේ. රජකාය්‍ය්‍ය පරිධ්වංසී, රජහුගේ කටයුතු පිරිහෙළන්නාවූ; මන්ත්‍රී, ඇමතිතෙම; දොෂෙණ, දොෂයවිසින්, ලිප්‍යතෙ, ගල්වනුලැබේ.

ස්වාමියානුට ආලයෙන් පවත්නාසැටි.

327 වරං ප්‍රාණපරිත්‍යාගඃ ශිරසො වාපි කර්ත්තනම්
න තු ස්වාමිපදවාප්තිපාතකෙච්ඡාරුපෙක්ෂණම්.

ප්‍රාණපරිත්‍යාගඃ, ප්‍රාණයන්දීමහෝ; වා, නොහොත්; ශිරසඃ, මස්තකයාගේ; කර්ත්තනංඅපි, කැපීම; වරං, උතුම්වේයි. ස්වාමි පදවාප්තිපාතකෙච්ඡාඃ, ස්වාමිහුගේ තනතුරට පැමිණීම හෙළීමට කැමැත්තාහට; උපෙක්ෂණම්, ඉවසීම; නතු, උතුම්නොවේ.

රජුහා ඇමතිදයන දෙදනාම අතිශයින් උසස්වීමෙහි දොෂ.

388 අත්‍යුච්ඡ්‍රිතෙ මන්ත්‍රිණි පාර්ථිවෙ ච
විෂ්ටභ්‍ය පාදාවුපතිෂ්ඨතෙ ශ්‍රීඃ
සා ස්ත්‍රීස්වභාවාදසහා භරස්‍ය
තයොර්ද්වයොරෙකතරං ජහාති.

මන්ත්‍රිණි, ඇමතියාද; පාර්ථිවෙච, රජුද; අත්‍යුච්ඡ්‍රිතෙ, අතිශයින් වැඩුනුකල්හි; ශ්‍රීඃ, ඓශ්වර්ය්‍යශ්‍රීතොමෝ; පාදෞ, පාදෙක; විෂ්ටභ්‍ය, එල්වී; උපතිෂ්ඨතෙ, සිටිනීය. සා, ඒ ඓශ්වර්ය්‍යශ්‍රීතොමෝ; ස්ත්‍රීස්වභාවාත්, ස්ත්‍රී ස්වභාවබැවින්; භරස්‍ය; පොෂ්‍යය; අසහා, නොඉවසන්නී; තයොඃ ද්වයොඃ, ඔවුන් දෙදෙනා අතුරෙන්; එකතරං, එකක්හු; ජහාති, හරණීය.

රජුවිසින් එක්අමාත්‍යයකු රාජකාර්ය්‍යයෙහි ප්‍රධානත්වයට පමුණුවනලද කල්හි ඒ අමාත්‍යයා මුළාවූයේවීනම් එයින් පැමිණෙන හානිය.

389 එකං භූමිපතිඃ කරොති සචිවං රාජ්‍යෙ ප්‍රධානං යදා
තං මොහාච්ඡ්‍රයතෙ මදඃ ස ච මදාලස්‍යෙන නිර්භිද්‍යතෙ.
නිර්භින්නස්‍ය පදං කරොති හෘදයෙ තස්‍ය ස්වතන්ත්‍රස්පෘහා
ස්වාතන්ත්‍ර්‍යස්පෘහයා තතඃ ස නෘපතෙඃ ප්‍රාණාන්තිකං ද්‍රුහ්‍යති.

භූමිපතිඃ, රජතෙම; යදා, යම්කාලයෙක්හි; එකංසචිවං, එක් අමාත්‍යයකු; රාජ්‍යෙ, රජ්ජටඅයිතිවූ කාර්‍ය්‍යයෙහි; ප්‍රධානං කරොති, ප්‍රධාන කෙරේද; මොහාත්, මුළාවීම හෙතුකොටගෙණ; මදඃ, අහංකාරයතෙම; තංශ්‍රයතෙ, ඔහු ආශ්‍රයකෙරේ. මදාලස්‍යෙන, අහංකාර අලසභාවය විසින්; සඃච, ඒ තෙමේද; නිර්භිද්‍යතෙ, බිඳිනුලැබේ. නිර්භින්නස්‍ය, බිඳිනලද්දාවූ; තස්‍ය; ඔහුගේ; හෘදයෙ, සිත්හි; ස්වතන්ත්‍රස්පෘහා, තමාගේ ප්‍රධානවීම පිණිස ආශාතොමෝ; පදංකරොති, ලකුණක්හෝ වස්තුවක් කරයි. ස්වාතන්ත්‍ර්‍යස්පෘහයා, තමාගේ ප්‍රධානත්වය පිණිස ආශාව හෙතුකොටගෙණ; තතඃ, පසුව; සඃ, හෙතෙම; නෘපතෙඃ, රජුගේ; ප්‍රාණාන්තිකං, ප්‍රාණයන් කෙළවරකොට; ද්‍රුහ්‍යති, හානිකිරීම පිණිස අදහස්කෙරේ.

විෂමිශ්‍රබතද සෙලවෙන්නාවූ දතද නපුරු අමාත්‍යයාද මුලින්ම උදුරාහැරීම සැපබව.

390 විෂදිග්ධස්‍ය භක්තස්‍ය දන්තස්‍ය චලිතස්‍ය ච
අමාත්‍යස්‍ය ච දුෂ්ටස්‍ය මූලාදුද්ධරණං සුඛම්.

විෂදිග්ධස්‍ය, විෂතවරණ ලද්දාවූ; හස්තස්‍ය, බතදෑ; චලිතස්‍ය, චණ්ඩව ලවූ; දන්තස්‍යච, දතද; දුෂ්ටස්‍ය, දොෂකරණලද්දාවූ; අමාත්‍යස්‍යච, ඇමතියාද; මූලාත්, මුලින්; උද්ධරණං, ඉදිරීම; ධ්‍රුවං, සැපයි.

රජුන් සන්තක ඓශ්චර්‍ය්‍යය අමාත්‍යයන් සන්තක කිරීමෙහි දොෂ.

391 යඃ කුරුතෙ සචිවායත්තාං ශ්‍රියං තදව්‍යසනෙ සති
සොන්ධවජ්ජගතීපාලඃ සීදෙත් සඤ්චාරකෛවිනා.

යඃ, යම්රජෙක්තෙම; ශ්‍රියං, ඓශ්චර්‍ය්‍යය, සචිවායත්තාං, ඇමතියන් අයිතිවූවක්; කුරුතෙ, කරන්නේද; තද්ව්‍යසනෙසති, ඔහුකෙරෙන්හෝ ඕහට විපත්තියක් ඇතිකල්හි; සඃ ජගතීපාලඃ, ඒ රජතෙම; සඤ්චාරකෛඃවිනා, අන්ධයෂ්ටියගෙණ ගමන්කරවන්නාවුන්ගෙන් වෙන්වූ; අන්ධවත්, අන්ධයෙක්මෙන්; සීදෙත්, කලකිරේ.

සියල්ලන්ම ඓශ්චර්‍ය්‍යයට කැමතිබව.

392 න සොස්ති පුරුෂො ලොකෙ යො න කාමයතෙ ශ්‍රියම්
පරස්‍ය යුවතිං රම්‍යාං සාකාඞ්ක්ෂාං වීක්ෂතෙ න කඃ.

යඃ, යමෙක්තෙම; ශ්‍රියම්, ඓශ්චර්‍ය්‍යය; න්කාමයතෙ, කැමතිනොවේද; සඃ පුරුෂඃ, ඒ පුරුෂතෙම; ලොකෙ, ලොකයෙහි; න අස්ති, නැත්තේය. සාකාඞ්ක්ෂං, කැමතිකරන්නාවූ; රම්‍යාං, සිත්කලුවූ; පරස්‍යයුවතිං, අනුන්සන්තක තරුණියක්; කඃ, කවරෙක්; නවීක්ෂතෙ, නොබලාද.

යමෙක් ප්‍රියනම් නොකටයුතු ක්‍රියාවන් කලේවී නමුත් ඔහු
ප්‍රි ය ය ය න බ ව.

393 කුර්වන්නපි ව්‍යලීකානි යඃ ප්‍රියඃ ප්‍රිය එව සඃ
අශෙෂදොෂදුෂ්ටොපි කායඃ කස්‍ය න වල්ලභඃ.

යඃ, යමෙක්තෙම; ප්‍රියඃ, ප්‍රියද; සඃ, හෙතම; ව්‍යලීකානි, අප්‍රියක්‍රියාවන්; කුර්වන් අපි, කරන්නේද; ප්‍රියඃඑව, ප්‍රියමය. අශෙෂදොෂ දුෂ්ටඃ අපි, නොයෙක් දොෂයන් විසින් දූෂ්‍යකරණ ලද්දාවූද; කායඃ, ශරීරයතෙම; කස්‍ය, කවරක්හට; නවල්ලභඃ, ප්‍රියනොවේද.

අප්‍රියවූ ක්‍රියාවන් කරන්නාවූද ප්‍රියතැනැත්තා ප්‍රියය යනබව.

394 අප්‍රියාණ්‍යපි කුර්වාණො යඃ ප්‍රියඃ ප්‍රිය එව සඃ
දග්ධමන්දිරසාරෙපි කස්‍ය වහ්නාවනාදරඃ.

යඃ, යමෙක්තෙම; ප්‍රියඃ, ප්‍රියද; සඃ, හෙතෙම; අප්‍රියාණි, නොසතුටුක්‍රියාවන්; කුර්වාණඃඅපි, කරන්නේද; ප්‍රියඃ එව, ප්‍රියමය. දග්ධමන්දිර

සාරඅපි, දවනලද්ද මනොඥප්‍රාසාද ඇත්තාවූද; වශ්‍යො, හින්නකෙරෙහි; කස්‍ය, කවරකුගේ; අනාදරඃ, අගෞරවයෙක් ඇතිවේද.

රජුවිසින් බොහෝසෙයින් බලනුලබණ තැනැත්තේ ඓශ්වර්‍ය්‍යය
භජනයකෙරෙයි යනබව.

395 යස්මින්නෙනවාධිකං චක්ෂුරාරොපයති පාර්ථිවඃ
සුතෙමාත්‍යෙප්‍යුදාසීනෙ ස ලක්ෂ්මියාශ්‍රියතෙ ජනඃ.

පාර්ථිවඃ,රජතෙම; සුතෙ, පුත්‍රයන්ද; අමාත්‍යෙ, ඇමතියන්ද; උදාසීනෙ අපි, ආශානැත්තන්හෝ සන්‍යාසීන්දයන; යස්මින්එව, යමක්හු කෙරෙහිම; අධිකං, බහුලව; චක්ෂුඃ ආරොපයති, ඇසනගාද; සඃජනඃ, එ ජනතෙම; ලක්ෂ්මියා, ඓශ්වර්‍ය්‍යය විසින්; ආශ්‍රියතෙ, ආශ්‍රයකරණුලැබේ.

ස්වාමියා විසින් කරණලද කථාදිය ඇති තැනැත්තා ඓශ්වර්‍ය්‍යය
ආ ශ්‍ර ය ක ර ණ බ ව.

396 අප්‍රියස්‍යාපි පථ්‍යස්‍ය පරිණාමඃ සුඛාවහඃ
වක්තා ශ්‍රොතා ච යත්‍රාස්ති රමන්තෙ තත්‍ර සම්පදඃ.

අප්‍රියස්‍යඅපි, ප්‍රියනුවූද; පථ්‍යස්‍ය, හිතවූ ඖෂධයාගේ; පරිණාමඃ, අන්‍ය අවස්ථාවකට පෙරළීමතෙම; සුඛාවහඃ, සැපඑළවන්නේවෙයි. වක්තා, කථාකරන්නේද; ශ්‍රොතාච, අසන්නේද; යත්‍රආස්තෙ, යම්තැනෙක්හිසිටීද; තත්‍ර, ඔහුකෙරෙහි; සම්පදඃ, සම්පත්තිහු; රමන්තෙ, ඇළෙත්.

පළමුසිටියාවූ ඇමතියන්ට අපරාධකොටහැර අලුතෙන්ආ ඇමතියන් රක්ෂාකිරීම හානිය යනබව.

397 මූලභෘත්‍යාපරාධෙන නාගන්තූන් ප්‍රතිපාලයෙත්
නාතඃ පරතරොන්‍යොස්ති රාජ්‍යභෙදකරො යතඃ.

මූලභෘත්‍ය අපරාධෙන, පුරාණකාලයෙහිවූ අමාත්‍යයන්ට අපරාධකිරීමෙන්; ආගන්තූන්, අළුත ඇමතියන්; නප්‍රතිපාලයෙත්, රක්ෂානොකරන්නේය. අතඃ පරතරඃ, මෙයින් පිටත්වූ; රාජ්‍යභෙදකරඃ රාජ්‍යයාගේ බිඳීමකරන්නාවූ; අන්‍යඃ, අන් අපරාධයෙක්; යතඃන අස්ති, යම් කාරණයෙකින් නැත්තේද එහෙයින්.

අසත්පුරුෂයා නිරන්තරයෙන් ආශ්‍රයකරණුලබන්නේවීනමුත් තමාගේ,
දුර්ජන ස්වභාවයටම පැමිණෙනබව.

398 දුර්ජනඃ ප්‍රකෘතිං යාති සෙව්‍යමානොපි යත්නතඃ
ස්වෙදනාභ්‍යඤ්ජනොපායෛඃ ශ්වපුච්ඡමිව නාමිතම්.

ස්වෙදන, තැවීමද; අභ්‍යඤ්ජන, ඖෂධගැල්වීමදයන; උපායෛඃ, උපායවලින්; නාමිතං, නමනලද්දෑවූ; ශ්වපුච්ඡමිව, බල්ලෙකුගේ වාලධියමෙන්; නිත්‍යශඃ, නිරන්තරයෙන්; සෙව්‍යමානඃඅපි, ආශ්‍රයකරණලබන්නාවූද; දුර්ජනඃ, අසත්පුරුෂතෙම; ප්‍රකෘතිංයාති, තමාගේ මුල් ස්වභාවයට පැමිණේ.

ඒ ස ද හා ම.

399 ස්වදිතො මර්දිතශ්චෛව රජ්ජුභිඃ පරිවෙෂ්ටිතඃ
මුක්තො ද්වාදශභිර්වර්ෂෛඃ ශ්වපුච්ඡඃ ප්‍රකෘතිං ගතඃ.

ස්වදිතඃ, තවනලද්දෑවූ; මර්දිතඃචඑව, මඩනාලද්දෑවූද; රජ්ජුභිඃ, රැහැන්වලින්; පරිවෙෂ්ටිතඃ, වෙළනලද්දෑවූ; ද්වාදශභිඃවර්ෂෛඃ, අවුරුදු දොළොසකින්; මුක්තඃ, මුදනලද්දෑවූ; ශ්වපුච්ඡඃ, බල්ලාගේ වල්ගයතෙම; ප්‍රකෘතිං, පළමු ස්වභාවයට; ගතඃ, ගියේය.

දුර්ජනයන් සතුටුකළ නොහැකිබව.

400 වර්ධනං වාථ සන්මානං ඛලානාං ප්‍රීතයෙ කුතඃ
ඵලන්ත්‍යමෘතසෙකෙපි න පථ්‍යානි විෂද්‍රුමාඃ.

වර්ධනංච, වැඩීමද; අථ, නැවත; සන්මානං, මනාකොට පිදීමද; ඛලානාං, දුර්ජනයන්ගේ; ප්‍රීතයෙ, ප්‍රීතිය පිණිස; කුතඃ, කොයි ප්‍රකාරයෙකින්වේද; අමෘතසෙකෙඅපි, අමෘතයෙන් ගල්වනලදකල්හිද; විෂද්‍රුමාඃ, විෂවෘක්ෂයෝ; පථ්‍යානි, හිතවූඵලයන්; නඵලන්ති, නූපදවත්.

අනුන්විසින් නොවිචාරණලද තැනැත්තේද වැඩටනිසි කාරණය කියයුතුය යන්න.

401 අපෘෂ්ටොපි හිතං බ්‍රූයාත් යස්‍ය නෙච්ඡෙත් පරාභවම්
එෂ එව සතාං ධර්මො විපරීතමතො න්‍යථා.

යස්‍ය, යමක්හුගේ; පරාභවං, පිරිහීම; නඉච්ඡෙත්, නොකැමැත්තේවීනම්; අපෘෂ්ටඃ අපි, නොවිචාරණලද තැනැත්තේද; හිතං, වැඩෙන් නාවූ කාරණය; බ්‍රූයාත්, කියන්නේය. එෂඃඑව, මේ තෙමේම; සතාං, පණ්ඩිතයන්ගේ; ධර්මඃ, ධර්මයයි. අතඃ අන්‍යථා, මෙයින් අන්‍යක්‍රමයෙක්වීනම්; විපරීතං, අඥනයන්ගේ ධර්මයයි.

සෙනඟ ඇත්තවුන් ආදීන්ගේ ස්වභාවය.

402 ස ස්නිග්ධො කුශලාන්නිවාරයති යස්තත් කර්ම යන්නිර්මලං
සා ස්ත්‍රී යානුවිධායිනී ස මතිමාන් යඃ සද්භිරභ්‍යර්ච්‍යතෙ.
සා ශ්‍රීර්‍යා න මදං කරොති ස සුඛී යස්තෘෂ්ණයා මුච්‍යතෙ
තන්මිත්‍රං යදකෘත්‍රිමං ස පුරුෂො යඃ ඛිද්‍යතෙ නෙන්ද්‍රියෛඃ.

යඃ, යමෙක්තෙම; අකුශලානි, දුශ්චරිතයන්; වාරයති, වලක්වාද; සඃ, හෙතෙම; ස්නිග්ධඃ, සෙනහඇත්තෙක්වේ. යත්, යමක්; නිර්මලං, පිරිසිදුද; තත්, ඒතෙම කර්ම ක්‍රියාවවේ. යා, යම් කැනැත්තියක්; අනුවිධායිනී, පසුවහෝ නොවෙනස්ව නියොගකරන්නීද; සා ඕතොමෝ; ස්ත්‍රී, ස්ත්‍රියවන්නීය. යඃ, යමෙක්තෙම; සද්භිඃ, පණ්ඩිතයන්විසින්; අගර්හ්‍යතෙ, පුදනුලැබේද; සඃ, හෙතෙම; මතිමාන්, පණ්ඩිතවෙයි. යා, යම් ඓශ්චය්‍යීයක්තොමෝ; මදංනකරෙති, අහංකාර නොකරන්නීද; සා, ඕතොමෝ; ශ්‍රීඃ, ඓශ්චය්‍යීයවන්නීය. යඃ, යමෙක්තෙම; තෘෂ්ණායාඃ, ආශාවකෙරෙන්; මුච්‍යතෙ, මිදේද; සඃ, හෙතෙම; සුඛී, සැපඇත්තේවේ. යත්, යමෙක්තෙම; අකෘත්‍රිමං, නොකරණලදද; තත්, ඒතෙම; මිත්‍රං, මිත්‍රවේ. යඃ, යමෙක්තෙම, ඉන්ද්‍රියෛඃ, චක්ෂුරාදී ඉන්ද්‍රියයන්විසින්; නබාධ්‍යතෙ, තවනුනොලැබේද; සඃ, හෙතෙම; පුරුෂඃ, පුරුෂයෙක්වේ.

රජ්ජුරුවන් කාමයෙහි ඇලීමෙන් ඇති නපුර.

403 නෘපඃ කාමාසක්තො න ගණයති කාය්‍යීං න ච හිතං
යථෙෂ්ටං ස්වච්ඡන්දඃ ප්‍රවිචරති මත්තො ගජ ඉව.
තතො මානධ්මාතඃ ස පතති යදා ශොකගහනෙ
තදා භෘත්‍යෙ දොෂාන් ක්ෂිපති න නිජං වෙත්ත්‍යවිනයම්.

කාමආසක්තඃ, කාමයෙහි ඇළුනාවූ; නෘපඃ, රජතෙම; කාය්‍යීං, කටයුතු, නගණයති, නොවිමසයි. හිතං, වැඩිඉද; නච, නොවිමසයි. මත්තඃ ගජඃඉව, මත්වූ ඇතෙක්මෙන්; ස්වච්ඡන්දඃ, තමාගේ කැමැත්තෙහි සිටියේ; යථෙෂ්ටං, කැමති පරිද්දෙන්. ප්‍රවිචරති, හැසිරෙයි; තතඃ, පසුව; මානධ්මාතඃ, අහංකාරයෙන් ඉදිමුනාවූ; සඃ, හෙතෙම; යදා, යම්දවසෙක්හි; ශොකගහනෙ, සිත්තැවීම නැමැතිවනයෙහි; පතති, වැටේද; තදා, එකල්හි; භෘත්‍යෙ, අමාත්‍යයාකෙරෙහි; දොෂාන්, දොෂයන්; ක්ෂිපති, තබයි. නිජංඅවිනයං, තමාගේ නොහික්මීම; නවෙත්ති, නොදනී.

අනුන්ගේ දොෂයනිසා අනිකෙකුට දඬුවම් නොකොට තමා
විසින්ම දුන දොෂ ඇත්තාහට දඬුවම්කටයුතු
තුය යනබව.

404 න පරස්‍යාපරාධෙන පරෙෂාං දණ්ඩමාචරෙත්
ආත්මනාවගමං කෘත්වා බධ්නීයාත් පූජයෙච්ච වා.

පරස්‍ය, අන්‍යයාගේ; අපරාධෙන, දොෂයෙන්; පරෙෂාං, අනුන්ට; දණ්ඩංන ආචරෙත්, දඬුවම්නොකරන්නේය. ආත්මනා, තමාවිසින්; අවගමං කෘත්වා, අවබොධකොට; බධ්නීයාත්, බඳින්නේය. වා, නොහොත්; පූජයෙත්ච, පුදන්නේය.

වරද නිවරද දෙක නියමනොකොට සංග්‍රහ නිග්‍රහ කිරීම විනාශයට කාරණයක්බව,

405 ගුණදොෂාවනිශ්චිත්‍ය විධිනා ග්‍රහනිග්‍රහෞ
ස්වනාශාය යථා න්‍යස්තෝ දර්පාත් සර්පමුඛෙ කරඃ.

දර්පාත්, අහංකාරය හෙතුකොටගෙණ; සර්පමුඛෙ, සර්පයාගේ මුඛයෙහි; න්‍යස්තඃ, තබනලද්දාවූ; කරඃ, හස්තයතෙම; ස්වනාශායයථා, තමාගේ විනාශය පිණිස යම්සේවේද; ගුණදොෂෞ, ගුණදොෂදෙක; අනිශ්චිත්‍ය, නියමනොකොට; ග්‍රහනිග්‍රහෞ, සංග්‍රහ නිග්‍රහදෙක; විධිනා, නියොගකිරීමෙන් (එසේම තමාගේ විනාශයවෙයි.)

රහස්කථාව රක්‍ෂාකටයුතුබව.

406 මන්ත්‍රවීජමිදං ගුප්තං රක්‍ෂණීයං යථා තථා
මනාගපි න භිද්‍යෙත තද්භින්නං න ප්‍රරොහති.

ඉදංමන්ත්‍රවීජං, මේ රහස්කථා නැමැති බීජය; (ඇටය) ගුප්තං, සඟවනලද්දේ; යථාතථා, කිසියම්ලෙසකින්; රක්‍ෂණීයං, රැක්කයුතුය. මනාක් අපි, ස්වල්පයකුදු; නභිද්‍යෙත, නොසිඳින්නේය. භින්නං, සිඳිනලද්දාවූ; තත්, ඒ රහස්කථා බීජයතෙම; නප්‍රරොහති, දලුනොගණී.

කල් නොඉක්මවියයුතු කරුණු.

407 ආදෙයස්‍ය ප්‍රදෙයස්‍ය කර්තව්‍යස්‍ය ච කර්මණඃ
ක්‍ෂිප්‍රමක්‍රියමාණස්‍ය කාලඃ පිබති තද්‍රසම්.

ක්‍ෂිප්‍රං, වහා; අක්‍රියමාණස්‍ය, නොකරණු ලබන්නාවූ; ආදෙයස්‍ය, ගතයුතු ද්‍රව්‍යයාගේද; ප්‍රදෙයස්‍ය, දියයුතු ද්‍රව්‍යයාගේද; කර්තව්‍යස්‍ය, කටයුතුවූ; කර්මණඃච, ක්‍රියාවගේද; තත්රසම්, ඒ රසය; කාලඃ, කාලයතෙම; පිබති, බොයි.

රහස්කථාව කල්නොඉක්මවියයුතුබව.

408 මන්ත්‍රො යොධඉවාධීරඃ සර්වාඞ්ගඃ සංවෘතෛරපි
චිරං න සහතෙ ස්ථාතුං පරෙභ්‍යො භෙදශඞ්කයා.

මන්ත්‍රඃ, රහස්වූ කථාවතෙම; අධීරඃයොධඃඉව, අඥාන සටන්කාරයකු වැනි වෙයි. සංවෘතෛඃ, වසනලද්දාවූ; සර්වාඞ්ගෛඃඅපි, සියලු අවයවවලින් යුක්තවද; පරෙභ්‍යඃ, සතුරන්කෙරෙන්, භෙදශඞ්කයා, බිඳීමෙහි සැකයෙන්; චිරංස්ථාතුං, බොහෝකලක් (සටන්භූමියෙහි) සිටින්ට; නසහතෙ, හැකිනොවේ.

එක්වරක් දුෂ්ටක්‍රියාකළ එකාත්හු දෙවනු මිත්‍රත්වයට
නොගතයුතුබව.

409 සකෘද්දුෂ්ටං යො නු මිත්‍රං පුනඃ සන්ධාතුමිච්ඡති
ස මෘත්‍යුමෙව ගෘහ්ණාති ගර්භමශ්වතරී යථා.

සකෘත්, එක්වරක්; දුෂ්ටං, දුෂ්ටක්‍රියාවෙහි පවත්නාලද්දවූ; මිත්‍රං, මිත්‍රයන්හු; යඃනු, යමෙක් වනාහි; පුනඃසන්ධාතුං, නැවත ගැළපීමට; ඉච්ඡති, කැමැතිවේද; සඃ, හෙතෙම; අශ්වතරී, අශ්වයකුටදුව කොටලුදෙනක්හුගේ කුස උපන් අශ්වෙළඹතොමෝ; ගර්භංයථා, ගැප් ගැණීමමෙන්; මෘත්‍යුංඑව, මරණයම; ගෘහ්ණාති, ගණී.

ඔවුනොවුන්ගේ ගැළපීම නොදැන බලය නියමකල
නොහැකිබව.

410 අඞ්ගාඞ්ගිභාවමඥත්වා කථං සාමර්ථ්‍යනිර්ණයඃ
පශ්‍ය ටිට්ටිභමාත්‍රෙණ සමුද්‍රො ව්‍යාකුලීකෘතඃ.

අඞ්ගාඞ්ගිභාවං, ඔවුනොවුන්ගේ සම්බන්ධය; අඥත්වා, නොදැන; සාමර්ථ්‍යනිර්ණයඃ, බල ඇතිනැතිබව නියමකිරීම; කථං, කෙසේද; ටිට්ටිභමාත්‍රෙණ, කැටිකුරුලු පක්ෂියාවිසින්; සමුද්‍රඃ, සාගරයතෙම; ව්‍යාකුලීකෘතඃ, කැලඹීමකරණ ලද්දේය. පශ්‍ය, බලව.

විපත්ති දුරලීමපිණිස තමා සුදුසුද නැද්දයනු දැනීමෙහි වැඩ,

411 දුඃඛමාත්මා පරිච්ඡෙත්තුමෙව යොග්‍යො න වෙති වා
අස්තීදෘග්යස්‍ය විඥානං ස කෘච්ඡ්‍රෙපි න සීදති.

ආත්මා, තමා; දුඃඛංපරිච්ඡෙත්තුං, දුක්නැතිකිරීමට; යොග්‍යඃ එව වා, සුදුස්සෙක්වූයේමයයිහෝ; නවාඉති, නුසුදුසුසෙක්යයි කියාහෝ; ඊදෘක්විඥානං, මෙබඳුවූ අවබොධය; යස්‍ය අස්ති, යමෙක්හට ඇත්තේද; සඃ, හෙතෙම; කෘච්ඡ්‍රෙඅපි, දුකක්ඇති කල්හිදු; නසීදති, නොතැවේ.

මරණයට හෙතු කාරණ සතරෙක්.

412 අනුචිතකර්මාරම්භඃ ස්වජනවිරොධො බලීයසා ස්පර්ධා
ප්‍රමදාජනවිශ්වාසො මෘත්‍යොර්ද්වාරාණි චත්වාරි.

අනුචිතකර්මාරම්භඃ, නුසුදුසු ක්‍රියාවගේ පටන්ගැන්මද; ස්වජනවිරොධඃ, ඥාති ජනයාගේ විරුද්ධයද; බලීයසා, බලඇත්තක්හුහා සමග; ස්පර්ධා, හාස්‍ය ක්‍රියාකිරීමද; ප්‍රමදාජන විශ්වාසඃ, ස්ත්‍රීන්ගේ ඇදහීමද; මෘත්‍යොඃ, මරණයාගේ; චත්වාරිද්වාරාණි, ද්වාරයෝ සතරෙක්වෙත්.

### ර ජු න් ගේ ආ ශ්‍ර යෙ හි ස්ව භා ව.

413 සම්පත්තයඃ පරවශාඃ සදා චිත්තම නිර්වෘතම්
ස්වජීවිතෙප්‍යවිශ්වාසස්තෙෂාං යෙ රාජසංශ්‍රයාඃ.

යෙ, යම්කෙනෙක්; රාජසංශ්‍රයාඃ, රජුන්ගේ ආශ්‍රය ඇත්තාහුද; තෙෂාං, ඔවුන්ගේ; සම්පත්තයඃ, සම්පත්තීහු; පරවශාඃ, අනුන් සන්තක වෙත්. සදා, හැමකල්හි; අනිර්වෘතම්, ස්ථිරනුවූහෝ සන්නොසිඳුනාවූ; චිත්තම්, සිතද ඇතිවෙයි; ස්වජීවිතෙපි, තමාගේ ජීවිතයෙහි පවා; අවිශ්වාසඃ, විශ්වාස නැත්තේය.

### දු ර්ජ න ය න් ගේ ආ ශ්‍ර යෙ හි දො ෂ:

414 කොර්ථාන් ප්‍රාප්‍ය න ගර්විතො විෂයිනඃ කස්‍යාපදො ස්තංගතාඃ
ස්ත්‍රීභිඃ කස්‍ය න ඛණ්ඩිතං භුවි මනඃ කො වාස්ති රාඥං ප්‍රියඃ.
කඃ කාලස්‍ය භුජාන්තරං න ච ගතඃ කොර්ථී ගතො ගෞරවං
කො වා දුර්ජනවාගුරාසු පතිතඃ ක්ෂෙමෙන යාතඃ පුමාන්.

අර්ථාන්ප්‍රාප්‍ය, ධනවලටපැමිණ; කඃ, කවිරෙක්; නගර්විතඃ, අහංකාරනුවූයේද; විෂයිනඃ, විෂය රසයෙහි මහත් ඇලීම්ඇත්තාවූ; කස්‍ය, කවරක් හට; ආපදඃ, විපත්තිහු; අස්තංගතාඃ, නොපැවැත්තාහුද; ස්ත්‍රීභිඃ, ස්ත්‍රීන්විසින්; භුවි, පොළොවෙහි; කස්‍ය, කවරක්හුගේ; මනඃ, සිත; නඛණ්ඩිතං, නොසිඳිනලද්දේද; රාඥං, රජුන්ට; ප්‍රියඃ, ප්‍රියවූ; කඃවා, කවරෙක්හෝ; අස්ති, ඇත්තේද; කඃ, කවරෙක්; කාලස්‍ය, මරුවාගේ; භුජාන්තරං, අත්අතරට; නචගතඃ, නොගියේද; අර්ථී, ඉල්වන සුලුවූ; කඃ, කවරෙක්; ගෞරවංගතඃ, ගෞරවයට පැමිණියේද; දුර්ජනවාගුරාසු, අසත්පුරුෂයන්ගේ දැල්හි; පතිතඃ, වැටුනාවූ; කඃපුමාන්, කවර පුරුෂයෙක්නම්; ක්ෂෙමෙන, නිදුකින්; යාතඃ, ගියේද,

### ගැණීමටහෝ හරින්ටහෝ නොහැකි කරුණු සඳහා උපමාවක්.

415 යථා සමුද්‍රෙ නිමග්නො ලබ්ධ්වා සර්පාවලම්බනම්
න මුඤ්චති න චාධත්තෙ තථා මුග්ධොස්මි සම්ප්‍රති.

සමුද්‍රෙ, සාගරයෙහි; නිමග්නඃ, ගිලුනාවූ පුරුෂයෙක්; සර්පඅවලම්බනම්, සර්පයක්හුගේ එල්වීම; ලබ්ධ්වා, ලැබ; යථානමුඤ්චති, යම්සේ නොහරීද; නචආධත්තෙ, නොමඅල්වාගණීද; තථා, එ පරිද්දෙන්; සම්ප්‍රති, මෙකල්හි; මුග්ධඃඅස්මි, මුළාවූවෙක්වෙමි.

## එක්පක්ෂයක් ගැණීමෙන් පෙණෙන අලාභහා
## එසේම අනික් පක්ෂය ගැණීමෙන්ද
## පැමිණෙන නපුරද ත්වීම

416 එකත්‍ර රාජවිශ්වාසො නශ්‍යත්‍යන්‍යත්‍ර බාන්ධවඃ
කිං කරෙමි ක්ව ගච්ඡාමි පතිතො දුඃඛසාගරෙ.

එකත්‍ර, එක්පක්ෂයක් ගැන්මෙහි; රාජවිශ්වාසඃ, රජහුගේ විශ්වාසය තෙම; නශ්‍යති, නැසෙයි. අන්‍යත්‍ර, අනික්පක්ෂය ගත්කල්හි; බාන්ධවඃ, ඥාතිජනතෙම; (නසියි) කිංකරෙමි, කුමක්නම් කෙරෙම්ද; ක්ව ගච්ඡාමි, කොතැන්හියෙම්ද; දුඃඛසාගරෙ; දුක්මුහුදෙහි; පතිතඃ, වැටුනෙක්වෙමි.

## ස්ත්‍රීන්ගේ හා රජාදීන්ගේ පැවතුම්.

417 දුර්ජනගම්‍යා නාර්‍ය්‍යඃ ප්‍රායෙණපාත්‍රභෘද්භවති රාජා,
කෘපණානුසාරි ච ධනං දෙවො ගිරිජලධිවර්ෂී ච.

නාර්‍ය්‍යඃ, ස්ත්‍රීහු; දුර්ජනගම්‍යාඃ, අසත්පුරුෂයන් කරා පැමිණිය යුත්තාහුහෝ අසත්පුරුෂයන්ට ප්‍රිය කටයුත්තාහුය. රාජා, රජතෙම; ප්‍රායෙණ, බොහෝසෙයින්; අපාත්‍රභෘත්, නුසුදුස්සන් පාලනය කරන්නෙක්; භවති, වෙයි. ධනංච, ධනයද; කෘපණඅනුසාරී, දිලිඳුන්හා එක්ව පවතී. දෙවඃ, මෙඝයතෙම; ගිරිජලධිවර්ෂීච, පර්වත සමුද්‍රදෙක්හි වස්නෙක් දවේ.

## ඓශ්වර්‍ය්‍ය—ශාස්ත්‍ර—ස්ත්‍රී—වර්ෂා—යන මොවුන් ආශ්‍රයකරණතැන්.

418 නීචමාශ්‍රයතෙ ලක්ෂ්මීරකුලෙන සරස්වතී
අපාත්‍රං භජතෙ නාරී ගිරෞ වර්ෂති වාසවඃ.

ලක්ෂ්මීඃ, ඓශ්වර්‍ය්‍යයතොමෝ; නීචං ආශ්‍රයතෙ, නීචයා ආශ්‍රයකරන්නීය. සරස්වතී, ශාස්ත්‍රයතොමෝ; අකුලෙන, මනාකුලනැත්තාහා ආශ්‍රයකරන්නීය. නාරී, ස්ත්‍රීතොමෝ; අපාත්‍රං, අයොග්‍යස්ථානය; භජතෙ, සෙවනයකරන්නීය. වාසවඃ, ශක්‍රතෙම; ගිරෞ, පර්වතයෙහි; වර්ෂති, වර්ෂාකෙරෙයි.

## සමහර අඥානයන් මනාවූ ආශ්‍රයලැබීමෙන් බැබලීම උදුලනබව.

419 කශ්චිදාශ්‍රය සෞන්දර්‍ය්‍යාද්ධත්තෙ ශොභාමසජ්ජනඃ
ප්‍රමදාලොචනන්‍යස්තං මලිමසම්වාඤ්ජනම්,

ප්‍රමදාලොචන, ස්ත්‍රියගේ ඇසෙහි; න්‍යස්තං, යොදනලද; මලිමසං අඤ්ජනම්ඉව, කිලිටිවූ අඳුනක්මෙන්; කශ්චිත් අසජ්ජනඃ, කිසි අඥාන

යෙන්; ආශ්‍රය භෝජ්‍යයසිාත්, ආශ්‍රයාගේ මනාබව හෙතුකොටගෙණ, ශොභාං, බැබලිම; ධතෙනු, උසුලා.

උත්සාහයෙන් සතුටුකරණු ලබන්නාවූ රජ්ජුගේ සන්තොෂයකට නොපැමිණීම කවර විචිත්‍රයෙක්ද යනබව.

420 ආරාධ්‍යමානො නෘපතිඃ ප්‍රයත්නාත්
න තොෂමායාති කිමත්‍ර චිත්‍රම්.
අයං ත්වපූර්වඃ ප්‍රතිමා විශෙෂො
යඃ සෙව්‍යමානො රිපුතාමුපෛති.

ප්‍රයත්නාත්, උත්සාහයෙන්; ආරාධ්‍යමානඃ, සතුටුකරණු ලබන්නාවූ; නෘපතිඃ, රජතෙම; තොෂම්, සතුටකට; න ආයාති, නොපැමිණේ. අත්‍ර, මෙහි; කිංචිත්‍රං, කවර විසිතුරෙක්ද; සෙව්‍යමානඃ, ආශ්‍රයකරණු ලබන්නාවූ; යඃ, යමෙක්තෙම; රිපුතාං, සතුරුබවට උපෛති, පැමිණේද; අයංතු, මේ තෙම වනාහි; අපූර්වඃ, පෙරනූවූ; ප්‍රතිමාවිශෙෂඃ, එක්තරා ප්‍රතිමා රූපයෙක්වේ.

කාරණ නැතිව කිපෙන්නා සතුටුකළ නොහැකිබව.

421 නිමිත්තමුද්දිශ්‍ය හි යඃ ප්‍රකුප්‍යති
ධ්‍රුවං ස තස්‍යාපගමෙ ප්‍රසීදති,
අකාරණද්වෙෂිමනස්තු යස්‍ය වෛ
කථං ජනස්තං පරිතොෂයිෂ්‍යති.

යඃහි, යමෙක් වනාහි; නිමිත්තං උද්දිශ්‍ය, කාරණයක්දැක; ප්‍රකුප්‍යති, කිපේද; තස්‍ය, ඒ කාරණය; අපගමෙ, පහකළකල්හි; සඃ, හෙතෙම; ධ්‍රුවං, එකාන්තයෙන්; ප්‍රසීදති, පහදියි. යස්‍යතු, යමක්හුගේ වනාහි; මනඃ, සිත; අකාරණද්වෙෂිවෛ, කරුණු නැතිව කිපෙන්නේද; ජනඃ, ජනතෙම; තං, ඔහු; කථංපරිතොෂයිෂ්‍යති, කෙසේනම් සතුටුකරන්නේද.

මිත්‍රයන් විසින් උපකාරකරණලද්දාවූද කිසිවෙක් සතුරුබවට පැමිණෙයි සතුරන් විසින් අනුපකාරකරණ ලද්දේද අනිකෙක් ප්‍රීතියටම පැමිණෙයි යනබව.

422 විභෙදඃ සනිහෛගොබරූපකෘතමපි වෛෂ්‍යතාමෙති කශ්චිත්
සාක්ෂාදන්‍යෛරපකෘතමපි ප්‍රීතිමෙවොපයාති.
චිත්‍රං චිත්‍රං කිමථ චරිතං නෛකභාවාශ්‍රයාණාං
සෙවාධර්මඃ පරමගහනො යොගිනාමප්‍යගම්‍යඃ.

විඥෛඃ, නුවණැත්තාවූ; සන්මිත්‍රෛඃ, සෙනහසිත්ඇති මිත්‍රයන්විසින්; උපකෘතංඅපි, උපකාරකරණ ලද්දවූද; කශ්චිත්, කිසිවෙක්; වෛෂ්‍යතාං, සතුරුබවට; එති, පැමිණෙයි. අන්‍යෛඃ, සතුරන්විසින්; සාක්ෂාත්, ප්‍රත්‍යක්ෂවශයෙන්; අපකෘතං අපි, අනුපකාරකරණලද්දේද; ප්‍රීතිංඑව, ප්‍රීතියටම උපයාති, පැමිණෙයි, අහෝ, එසේකල්හි; කිංචිත්‍රං, කවර විස්මයෙක්ද; නෛකභාවාශ්‍රයාණං, නොයෙක් අදහස් ආශ්‍රයකළවුන්ගේ; චරිතං, පැවැත්ම; චිත්‍රං, ආශ්චර්‍ය්‍යවෙයි, සෙවාධර්මඃ, රජුන් ආශ්‍රයකිරීම; පරමගහනඃ, අතිශයින්ම දුක්වෙයි; යොගිනාංඅපි, සන්‍යාසිව්‍රතයෙහි යෙදුනවුන් විසින්පවා; අගම්‍යඃ, දතනොහැකිවෙයි.

අසත්පුරුෂයා සහිත අඥනාදීන්ගේ දෙෂ.

423 කෘතශතමසත්සු නෂ්ටං සුභාෂිතශතං ච නෂ්ටමබුධෙෂු
වචනශතමවචනකරෙ බුද්ධිශතමචෙතනෙ නෂ්ටම්.

අසත්සු, දුර්ජනයන්කෙරෙහි; කෘතශතං, කරණලදකාරණ සියයෙක්, නෂ්ටං, නස්නාලද්දේය- අබුධෙෂු, අඥනයන් කෙරෙහි; සුභාෂිතශතං ච, මනාව කියනලදකරුණු සියයෙක්ද; නෂ්ටං, නස්නාලද්දේය. අවචනකරෙ, වචනය නොකරන්නා (අකීකරුවා) කෙරෙහි; වචනශතම්; වචන සියයෙක්ද; අචෙතනෙ, කල්පනානැත්තා කෙරෙහි; බුද්ධිශතම්; නුවණ සියයෙක්ද; නෂ්ටං, නස්නාලද්දේය.

සම්පත්ඇති කල්හි විපත්ති රහිතවූ සැපතක් නැතිබව.

424 චන්දනතරුෂු භුජඞ්ගා ජලෙෂු කමලානි තත්‍ර ච ග්‍රාහාඃ
ගුණඝාතිනශ්ච පිශුනා භොගෙ න සුඛාන්‍යවිඝ්නානි.

චන්දනතරුෂු, සඳුන් වෘක්ෂයන්හි; භුජඞ්ගාඃ, සර්පයෝවෙත්. ජලෙෂු, ජලස්ථානයන්හි; කමලානි, පියුම්වෙත්. තත්‍රච, ඒ ජලයෙහිද; ග්‍රාහාඃ, කිඹුල්හුවෙත්, පිශුනාඃච, කෙළාම්කියන්නෝද; ගුණඝාතිනඃ, ගුණනැතිකෙරෙත්; භොගෙ, සම්පත්ඇති කල්හි; අවිඝ්නානි, විපත්ති රහිතවූ; සුඛානි, සැපයෝ; න, නැත්තාහුයි.

මනොඥවූ ද්‍රව්‍යයන්ගේ ලැබීමෙහි ඇති වෙහෙස.

425 මූලං භුජඞ්ගෛඃ කුසුමානි භෘඞ්ගෛඃ
ශාඛාඃ පලවඞ්ගෛඃ ශිඛරාණි භල්ලෛඃ,
නාස්ත්‍යෙව තච්චන්දන පාදපස්‍ය
යන්නාශ්‍රිතං දුෂ්ටතරෛඃ කූපඞ්ගෛඃ.

මූලං, මුල; භුජඞ්ගෛඃ, සර්පයන් විසින්ද; කුසුමානි, පුෂ්පයෝ, භෘඞ්ගෛඃ, බමරුන් විසින්ද; ශාඛාඃ, අතු, පලවඞ්ගෛඃ, වඳුරන්විසින්ද;

ශිඛරණිං, මස්තකාශ්‍රයෝ; භයෙදලඃ, වළසුන් විසින්ද; විභූනපාදපයස්‍ය සඳුත්වාක්ෂළයාගේ; යත්, යම්තැනක්; දුෂ්ඵතරෛඃ, අතිශයින් දුෂ්ඨවූ; කුපමෛඛෛඃ, නිඳිත පාපයන් විසින්; නාශ්‍රිතං, ආශ්‍රය නොකරණලද් දේද; තත්, එබඳු තැනෙක්; නාස්ති එව, නැත්තේමය.

දුර්ජනයාගේ ක්‍රියාවෝ.

426 දූරදූවජ්‍රිතපාණිරඤ්ජිනයනඃ ප්‍රොත්සාරිතොඞ්‍රීසනො
ගාඪාලිඞ්ගනතත්පරඃ ප්‍රියකථාප්‍රශ්නෙෂු දත්තාදරඃ-
අන්තඃගූඪවිෂො වහිර්මධුමයශ්චාතිව මායාපටුඃ
කො නාමායමපූර්වනාටකවිධිර්යඃ ශික්ෂිතො දුර්ජනෛඃ.

සඃ, යමෙක්තෙම; දුර්ජනෛඃ, අසත්පුරුෂයන් විසින්; ශික්ෂිතඃ, පුරුදුකරණලද්දේද; දූරත්, දුරපටන්; උවජ්‍රිතපාණිඃ, ඔසවනලද අත්ඇත්තාවූ; අඤ්ජිනයනඃ, (කඳුලෙන්) තෙත්වූ ඇස් ඇත්තාවූ; ප්‍රොත්සාරිත, ඉවත්කරණලද්දාවූ; අඞ්‍රීසනඃ, මුහුන අඞ්‍රියක්ඇත්තාවූ; ගාඪාලිඞ්ගනතත්පරඃ, දැඩිකොට වැළඳගැන්මෙහි ඇළුම්ඇත්තාවූ; ප්‍රියකථාප්‍රශ්නෙෂු, ප්‍රියවූ කථාවද ප්‍රශ්නදයන ක්‍රියාවන්හි; දත්තාදරඃ, පිහිටුවනලද ආදරඇත්තාවූ, අන්තඃගූඪවිෂඃ, ඇතුළත්හි සඟවනලද විෂඇත්තාවූ; බහිඃ, පිටත්හි; මධුමයඃ, මියෙන්කරණලද්දාවූ; අතිවමායාපටුඃ, කුහකක්‍රියාවෙහි අතිශයින් දක්ෂවූ; අපූර්වනාටකවිධිඃ, පෙරනැති නාටකවිධියක්වූ; අයං, මේ තෙම; කඃනාම, කවරෙක්ද.

ඒ ඒ ප්‍රයොජන ඉෂ්ටකරන්නාවූ උපායයෝ.

427 පොතො දුස්තරවාරිරාශිතරණෙ දීපොන්ධකාරාගමෙ
නිර්වාතෙ ව්‍යජනං මදාන්ධකරිණෙ දර්පොපශාන්ත්‍යෛ ශෘණිඃ
ඉත්ථං තද්භුවි නාස්ති යස්‍ය විධිනා නොපායචින්තා කෘතා
මන්‍යෙ දුර්ජනචිත්තවෘත්ති හරණෙ ධාතාපි භග්නොද්‍යමඃ.

දුස්තර, එතරවිය නොහැක්කාවූ; වාරිරාශිතරණෙ, ජලකඳෙකින් එතරවීමෙහි; පොතඃ, නැවද; අන්ධකාරාගමෙ, අඳුරඑනකල්හි; දීපඃ, පහනද; නිර්වාතෙ, පවන්නැති තැන්හි; ව්‍යජනං, තල්වැටද; මදාන්ධකරිණඃ, මදයෙන් අන්ධවූ ඇතාගේ; දර්පොපශාන්ත්‍යෛ, අහංකාරය ශමනකිරීම පිණිස; ශෘණිඃ, අකුස්සද; ඉත්ථං, මෙසේ; තත්, ඒ තෙම; භුවි, පෘථිවියෙහි; නාස්ති, නැත්තේද; යස්‍ය, යමක්හුගේ; විධිනා, ඇඹුවෙන්; කෘතා, කරණලද්දාවූ; උපායචින්තා, උපායචින්තාතොමෝ; නාස්ති

නැත්තිනම්; දුර්ජන චිත්තවෘත්තිහරණෙ, දුර්ජනයන්ගේ සිත් පැවතුම පහකිරීමෙහි; ධාතාඅපි, බ්‍රහ්මයාද; භග්නඋද්‍යමඃ, නටුවාවූ උත්සාහඇත්තේයයි; මන්‍යෙ, සිතමි,

ධනයෙන්හා බලයෙන්ද එක්සමානවූ උත්තම අධම දෙදෙනකුගේ විවාදය නොකටයුතුබව.

428 යයොරෙව සමං විත්තං යයොරෙව සමං බලම්
තයොර්විවාදො මන්තව්‍යො නොත්තමාධමයොඃ ක්වචිත්.

යයොඃඑව, දෙදෙනාගේම; විත්තං, ධනය; සමං, සමානද; යයොඃ එව, දෙදෙනාගේම; බලම්, බලය; සමම්, සමද; උත්තමඅධමයොඃ, උත්තමහානීචවූ; තයොඃ, ඔවුන්දෙදෙනාගේ; විවාදඃ, ඩබරයතෙම; ක්වචිත්, කිසිකාරණයෙක්හිද; නමන්තව්‍යඃ, නොසිතියයුතුවෙයි.

ඇමතියන්හුහා සමග රජහුගේ බිඳුනාවූ හිත ගැළපීමට පොහොසතක්හු නැතිබව.

429 මන්ත්‍රිණා පෘථිවීපාලචිත්තං විඝටිතං ක්වචිත්
වලයං ස්ඵටිකස්‍යෙව කො හි සන්ධාතුමීශ්වරඃ.

මන්ත්‍රිණා, අමාත්‍යයන්හුහා සමග; ක්වචිත්, කිසි කාරණයෙක්හි; විඝටිතං, බිඳුනාවූ; පෘථිවීපාලචිත්තං, රජහුගේසිත; ස්ඵටිකස්‍ය, පළිගුව කගේ; වලයංඉව, වළල්ලක්මෙන්; සන්ධාතුං, ගළපන්ට; කඃහි, කව රෙක් වනාහි; ඊශ්වරඃ, ශ්‍රෙෂ්ඨයෙක්වේද.

රාජතෙජස්හුගේ භයානකබව.

430 වජ්‍රඤ්ච රාජතෙජශ්ච ද්වයමෙවාතිභීෂණම්
එකමෙකත්‍ර පතති පතත්‍යන්‍යත් සමන්තතඃ.

වජ්‍රඤ්ච, ශක්‍රයාගේ ආයුධයද; රාජතෙජඃච, රාජතෙජසදයන; ද්වය මිඑව, දෙකම; අතිභීෂණම්, අතිශයින් ඝොරවෙයි. එකත්‍ර, එක්තැනෙ ක්හි; එකංපතති, එකක්වැටේද; අන්‍යත්, අන්‍යයතෙම; සමන්තතඃ, හා ත්පසින්; පතති, වැටේ.

සතුරාමරා මළහොත් ස්වර්ගයටද නැතහොත්
සැ ප ත ට ද පැ මි ණෙ න බව

431 මෘතඃ ප්‍රාප්නොති වා ස්වර්ගං ශත්‍රුං හත්වා සුඛානි වා,
උභාවපි හි ශූරාණාං ගුණාවෙතෞ සුදුර්ලභෞ:

ශත්‍රුංහත්වා, සතුරාමරා; මෘතඃ, මළතැනැත්තේ; ස්වර්ගංවා, දෙව් ලොවටහෝ; සුඛානිවා, සැපයන්ටහෝ; ප්‍රාප්නොති, පැමිණේ; එ

තෞඋභෞඅපි, මේ දෙකම; සුදුර්ලභෞ, අතිශයින් ලැබිය නොහැක් කාවූ; ශූරාණාංහි, වීරයන්ගේ වනාහි; ගුණෞ, ගුණයෝවෙත්.

සටන් කටයුතු කාරණයෙක්.

432 යත්‍රායුද්ධෙ ධ්‍රුවං නාශො යුද්ධෙ ජීවිතසංශයඃ
තමෙව කාලං යුද්ධස්‍ය ප්‍රවදන්ති මණීෂිණඃ

අයුද්ධෙ, සටන්නොකළ කල්හි; ධ්‍රුවං, ඒකාන්තයෙන්; නාශඃ, මරණයද; යුද්ධෙ, සටන්කළකල්හි; ජීවිතසංශයඃ, ජීවිතයාගේ සැකයද; යත්‍ර, යම්කාරණයෙක්හිවේද; තං එව, ඒ කාරණයම; යුද්ධස්‍ය, සංග්‍රාමයාගේ; කාලං, කාලයයි; මණීෂිණඃ. පණ්ඩිතයෝ; ප්‍රවදන්ති, කියත්.

සටන්නොකළ කල්හි තමාට කිසියම් වැඩක් නොපෙණේනම්
එකල්හි සටන් කටයුතුය යනබව.

433 අයුද්ධෙ හි යදා පශ්‍යෙන්න කිඤ්චිද්ධිතමාත්මනඃ
යුධ්‍යමානස්තදා ප්‍රාඥො ම්‍රියතෙ රිපුණා සහ.

අයුද්ධෙ, සටන්නොකළකල්හි; ආත්මනඃ, තමාහට; කිඤ්චිත්හිතං, කිසියම් සවල්පවැඩක්; යදා හි, යම්කලෙක්හි වනාහි; නපශ්‍යෙත්, නොදක්නේද; තදා, එකල්හි; ප්‍රාඥඃ, නුවණැති තැනැත්තේ; රිපුණාසහ, සතුරහා සමග; යුධ්‍යමානඃ, සටන්කරණුලබන්නේ; ම්‍රියතෙ, මියයේ.

සටනෙහි මරණය ලැබේයයි නොතැවියයුතු බව.

434 ජයෙ ච ලභතෙ ලක්ෂ්මීං මෘතෙචාපි සුරාඞ්ගණාම්
ක්ෂණවිධ්වංසිනඃ කායාඃ කා චින්තා මරණෙ රණෙ.

ජයෙ, ජයගත්කල්හි; ලක්ෂ්මීං, සම්පත්තියද; මෘතෙනඅපි, මරණය කරණකොටගෙණද; සුරාඞ්ගණාම්, දිව්‍යස්ත්‍රීයද; ලභතෙ, ලබයි. කායාඃ, දෙහයෝ; ක්ෂණවිධ්වංසිනඃ, ඇසිල්ලෙකින් නස්නාසුය. රණෙ, සටනෙහි; මරණෙ, මරණඇති කල්හි; කාචින්තා, කවර තැවීමෙක්ද.

තෙජස් නැත්තෙක් බලවත්වූයේද මැඩපැවැත්වීම
සුවසේ කළහැකිය යනබව.

435 බලවානපි නිස්තෙජාඃ කස්‍ය නාභිභවාස්පදම්
නිඃශඞ්කං දීයතෙ ලොකෛඃ පශ්‍ය භස්මචයෙ පදම්.

නිස්තෙජාඃ, තෙජස්නැත්තාවූ; බලවාන්අපි, බලඇත්තෙක්ද; කස්‍ය, කවරක්හට; අභිභවාස්පදම්, මැඩපැවැත්වීමට ස්ථානවූයේ; නා,

නොවේද; ලොකෙඃ, ජනයන්විසින්; භස්මචයෙ, අලුගොඩෙක්හි, නිඃශබ්දං, සැකනැතිව; පදංදීයතෙ, පාදය තබනුලැබේද; පශ්‍ය, බලව.

දුෂ්ටයන්ට නෑයෙක් නැතිබවහා බොහෝජන යාච්ඤාකිරීමෙ
න්ද කොපකළ හැකිබව ආදිය.

436 බන්ධුඃ කො නාම දුෂ්ටානාං කුප්‍යෙත් කො නාතියාචිතඃ
කො න දෘප්‍යති විත්තෙන කුකෘත්‍යෙ කො න පණ්ඩිතඃ.

දුෂ්ටානාං, දුෂ්ටයන්ගේ; බන්ධුඃනාම, නෑයෙක්නම්; කඃ, කවරෙක් ද; අතියාචිතඃ, අධිකකොට යාච්ඤා කරණලද්දාවූ; කඃ, කවරෙක්; නකුප්‍යෙත්, නොකිපෙන්නේද; විත්තෙන, ගුරුපූජාදි චාරිත්‍රයෙන්; කඃ, කවරෙක්; නදෘප්‍යති, සතුටුනොවේද; කුකෘත්‍යෙ, නින්දිතකාරණයෙහි; කඃ, කවරෙක්; න පණ්ඩිතඃ, පණ්ඩිත නොවේද.

කපටියන්ගේහා ශොභාඇත්තවුන්ගේ පැවතුම්.

437 දුර්වෘත්තඃ ක්‍රියතෙ ධූර්තෛඃ ශ්‍රීමානාත්මවිවෘද්ධයෙ
කිං නාම ඛලසංසර්ගඃ කුරුතෙ නාශ්‍රයාශවත්.

ධූර්තෛඃ, කපටයන් විසින්; දුර්වෘත්තඃ, නුසුදුසු පැවැත්මතෙම; ක්‍රියතෙ, කරණුලැබේ. ශ්‍රීමාන්, ශොභාඇති තැනැත්තේ; ආත්මවිවෘද්ධයෙ, තමාගේ වැඩීම පිණිසපවිති. ඛලසංසර්ගඃනාම, දුර්ජනයන්හා එක්වීමනම්; ආශ්‍රයාශවත්, ගිනිමෙන්; කිංනකුරුතෙ, කුමක් නොකෙරේද.

ධර්මය ඉක්ම පවත්නාවූ රජ්ජුරුවන් පාපයට ස්ථානවන බව.

438 පරෛඃ සම්භුජ්‍යතෙ රාජ්‍යං ස්වයං පාපස්‍ය භාජනම්
ධර්මාතික්‍රමතො රාජා සිංහො හස්තිබධාදිව.

පරෛඃ, අන්‍යයන්විසින්, රාජ්‍යං, රාජ්‍යය; සම්භුජ්‍යතෙ, අනුභවකරණු ලැබෙයි. හස්තිවධාත්, ඇතුන් මැරීම හෙතුකොටගෙණ; සිංහඃඉව, සිංහයෙක්මෙන්; ධර්මාතික්‍රමතඃ, ධර්මය ඉක්මවීම හෙතුකොටගෙණ; රාජා, රජතෙම; ස්වයං, තෙමේ; පාපස්‍ය, පාපයාගේ; භාජනං, ස්ථානවේ.

එක් ප්‍රදෙශයක් පොළොවනැසීමටවඩා නුවණැති අමාත්‍යය
කුගේ නැතිවීම බලවත්බව.

439 භූම්‍යෙකදෙශස්‍ය ගුණාන්විතස්‍ය
භෘත්‍යස්‍ය වා බුද්ධිමතඃ ප්‍රණාශෙ.
භෘත්‍යප්‍රණාශො මරණං නෘපානාං
නෂ්ටාපි භූමිඃ සුලභා න භෘත්‍යාඃ.

භූමිඑක දෙශස්‍ය, භූමියසම්බන්ධවූ එක් ප්‍රදෙශයක්හුගේද; ගුණාන්විතස්‍ය, ගුණයෙන් යෙදුනාවූ; බුද්ධිමතඃ, ප්‍රඥාවන්තවූ; භෘත්‍යස්‍යවා, අමාත්‍යයක්හුගේද; ප්‍රණශෙ, නැසීම අතුරෙහි; භෘත්‍යප්‍රණශඃ, අමාත්‍යයාගේ නැසීම්දතම; නෘපානාං රජුන්ගේ; මරණං, මරණයවේසි. නෂ්ටා අපි, නැසුනීද; භූමිඃ, භූමිතොමෝ; සුලභා, ලදහැක්කීය. භෘත්‍යාඃ, අමාත්‍යයෝ; න, ලදනොහෙත්.

ප්‍රාණ හානිකරන්නාවූ පිතෘආදීන් අතුරෙන් යමෙක්හෝ රජු
වි සි න් මැ රි ය යු තු බ ව.

440 පිතා වා යදි වා භ්‍රාතා පුත්‍රො වා යදි වා සුහෘත්
ප්‍රාණච්ඡෙදකරා රාඥා හන්තව්‍යා භූතිමිච්ඡතා.

පිතාවා, පියාහෝ; යදිවා, නොහොත්; භ්‍රාතා, සහොදරයෙක්හෝ; පුත්‍රඃවා, පුත්‍රයෙක්හෝ; යදිවා, නොහොත්; සුහෘත්, මිත්‍රයෙක්හෝ; ප්‍රාණච්ඡෙදකරාඃ, ජීවිතහානිය කරන්නාහු; භූතිමිච්ඡතා, සැපකැමැත්තාවූ; රාඥා, රජුවිසින්; හන්තව්‍යාඃ, මැරියයුත්තාහුවෙත්.

ධර්මාදියෙහි ඇති ස්වභාවය දන්නා තැනැත්තේ එකාන්තයෙන් කරුණා
සිත් ඇත්තෙක් නොවන්නේය, ඉවසීම ඇති තැනැත්තේ අත්
හිතුබූ ධනයකුදු රැක ගැන්මෙහි පොහොසත්
නො වෙ සි ය න බ ව.

441 ධර්මාර්ථකාමතත්වඥො නෛකාන්තකරුණො භවෙත්
න හි හස්තස්ථමප්‍යර්ථං ක්‍ෂමාවාන් රක්‍ෂිතුං ක්‍ෂමඃ.

ධර්මාර්ථකාම, ධර්මය—ධනය—සැපතය යන මොවුන්ගේ; තත්වඥඃ, විද්‍යමාන ස්වභාවය අවබොධකළාවූ තැනැත්තේ; එකාන්ත කරුණඃ, එකාන්ත කරුණාඇත්තෙක්; නභවෙත්, නොවන්නේය. ක්‍ෂමාවාන්, ඉවසීම්ඇත්තෙත්; හස්තස්ථංඅපි, අත්හි පැවැත්තාවූද; අර්ථං, ධනය; රක්‍ෂිතුං, රැකීමට; නහික්‍ෂමඃ, පොහොසත්නොවේ.

සතුරු මිතුරු දෙපක්‍ෂයකෙරෙහි ඉවසීම තපස්වීන්ට සැරසී
මෙක අපරාධකළවුන් කෙරෙහි ඉවසීම රජුන්ට
දූ ෂ්‍ය යෙ ක ය න බ ව.

442 ක්‍ෂමා ශත්‍රෞ ච මිත්‍රෙ ච යතීනාමෙව භූෂණම්
අපරාධිෂු සත්වෙෂු නෘපානාං සෛව දූෂණම්.

ශත්‍රෞච, සතුරාකෙරෙහිද; මිත්‍රෙච, මිත්‍රයාකෙරෙහිද; ක්‍ෂමා, ඉවසීම; යතිනාමෙව, තාපසයන්ගෙම; භූෂණම්, සැරසීමෙකැවේයි. නෘපා

නාං, රජුන්ගේ; අපරාධිෂුසත්වෙෂු, අපරාධයෙහි යෙදුනාවූ සත්වයන් කෙරෙහි; සෛව, ඒ ඉවසීමම; දූෂණම්, දූෂ්‍යයෙක්වේ.

රාජ්‍ය ලොභයෙන් ස්වාමිහුගේ තනතුර කැමැත්තාහුගේ
අපරාධයට යොග්‍ය ක්‍රියාවන් ප්‍රාණය නැසීම
හැ ර නැ ති බ ව.

443 රාජ්‍යලොභාදහඞ්කාරාදිච්ඡතඃ ස්වාමිනඃ පදම්
ප්‍රායශ්චිත්තං හි තස්‍යෛකං ජීවොත්සර්ගො න චාපරම්.

රාජ්‍යලොභාත් අහංකාරාත්, රාජ්‍යලොභයනම්වූ අහංකාරයෙන්; ස්වාමිනඃ, ස්වාමිහුගේ; පදම්, තනතුර; ඉච්ඡතඃ, කැමැත්තාහුගේ; ජීවිතොත්සර්ගඃහි, ජීවිතහැරකිරීම වනාහි; තස්‍ය, එහි; ඒකංප්‍රායශ්චිත්තං, පාපය නසන්නාවූ එකම ක්‍රියාවවෙයි. අපරම්, අන්ක්‍රියාවෙක්; න, නැත්තේය.

දු රු ක ට යු ත් තෝ.

444 රාජා ඝෘණී බ්‍රාහ්මණඃ සර්වභක්ෂඃ
ස්ත්‍රී චාවශා දුෂ්ප්‍රකෘතිඃ සහායඃ.
ප්‍රෙෂ්‍යඃ ප්‍රතීපොධිකෘතඃ ප්‍රමාදී
ත්‍යාජ්‍යා අමී යශ්ච කෘතං න වෙත්ති.

ඝෘණී, දොෂසොයන්නාවූ; රාජා, රජද; සර්වභක්ෂඃ, සියල්ල කන්නාවූ; බ්‍රාහ්මණඃ, බමුණුද; අවශා, යටත්නුවූ; ස්ත්‍රීච, භාර්‍යාද; දුෂ්ප්‍රකෘතිඃ, නුසුදුසු ස්වභාවඇත්තාවූ; සහායඃ, යහළුද; ප්‍රතීපඃ, අනනුකූලනුවූ; ප්‍රෙෂ්‍යඃ, දාසද; ප්‍රමාදී, ප්‍රමාදස්වභාවඇත්තාවූ; අධිකෘතඃ, කටයුත්තෙහි නියුක්ත තැනැත්තේද; යඃ, යමෙක්තෙම; කෘතං, කරණලද උපකාර; නවෙත්ති, නොදනීද; අමී, මොහු; ත්‍යාජ්‍යාඃ, දුරුකටයුතුවෙත්.

වෙශ්‍යා ස්ත්‍රියක්මෙන් රජහුගේද නානාප්‍රකාර නීතිඇතිබව.

445 සත්‍යානෘතා ච පරුෂා ප්‍රියවාදිනී ච
හිංස්‍රා දයාලුරපි චාර්ථපරා වදාන්‍යා.
නිත්‍යව්‍යයා ප්‍රචුරරත්නධනාගමා ච
වාරාඞ්ගනෙව නෘපනීතිරනෙකරූපා.

සත්‍යා, සැබෑබස්ඇත්තාවූද; අනෘතාච, බොරුකියන්නාවූද; පරුෂා, අප්‍රියබස්කියන්නාවූද; ප්‍රියවාදිනීච, ප්‍රියවාක්‍ය ඇත්තාවූද; හිංස්‍රා, වධකරණ ස්වභාවඇත්තාවූද; දයාලුඃ අපි, අනුකම්පා බහුලවූද; අර්ථපරා; ධනය උතුම්කොට ඇත්තාවූහෝ ලොභිවූද; වදාන්‍යා, දන්දෙන ස්වභාවඇ

ත්නාවූද; හිතෛෂිණො, හිතවිරුද්ධකාරණ සවනාඇත්තාවූද; ප්‍රචුරරත්න ධනාගමාච, බොහෝවූ රත්නධන ඉපදවීම් ඇත්තාවූද; චාරාධිගනාශ්ච, මෙශා සත්‍යක්මෙන්; නෘපනීතිඃ, රජ්ජුරුගේ නීති තොමෝ; අනෙකරූපා, නොයෙක් ආකාර වන්නීය.

දෙවෙනි භාගයාගේ අවසාන ශ්ලොකය.

446 සුහෘද්භෙදනදක්ෂාවිදභවතු භවතාං ශත්‍රුනිලයෙ
ඛලඃ කාලාකෘෂ්ටඃ ප්‍රලයමුපසර්පත්වහරහඃ,
ජනො නිත්‍යං භූයාත් සකලසුඛසම්පත්ති වසතිඃ
කථාරම්භෙරම්‍යෙ සතතමිහ බාලොපි රමතාම්.

භවතාං, පින්වතුන්ගේ; ශත්‍රුනිලයෙ, සතුරන්ගේ ගෘහයෙහි; සුහෘද්භෙදඃ, මිත්‍රභෙදයතෙම; තාවත් පළමුකොට; භවතු, වේවා. කාලආකෘෂ්ටඃ, මරුහු විසින් අදනා ලද්දාවූ; ඛලඃ, දුර්ජනතෙම; අහඃ අහඃ, දිනපාසා, ප්‍රලයං, විනාශයට; උපසර්පතු, පැමිණේවා. සකලසුඛසම්පත්ති, සියලු සැප සම්පත්තියෙහි; වසතිඃ, වසන්නාවූ; ජනඃ, ජනතෙම; නිත්‍යං භූයාත්, නිතර වේවා. රම්‍යෙ, සිත්කලුවූ; ඉහකථාරම්භෙ, මේ කථා ආරම්භයෙහි; බාලඃඅපි, අඥනාවූ තැනැත්තේද; සතතං, නිරන්තරයෙන්; රමතාම්, ඇලේවා .

හිතොපදෙශයෙහි දෙවනකාණ්ඩයෙහිවූ ශ්ලොකයන්ගේ සන්නයයි.

# හිතොපදෙශයෙහි තුන්වන කාණ්ඩය.

### කථාවත ගිජාකාලොකනයක්.

447 හංසෛඃ සහ මයූරාණාං විග්‍රහෙ තුල්‍යවික්‍රමෙ
විශ්වාස්‍ය වඤ්චිතා හංසාඃ කාකෛඃ ස්ථිත්වාරිමන්දිරෙ.

හංසෛඃසහ, හංසයන්හා සමග; මයූරාණාං, මොනරුන්ගේ; තුල්‍යවික්‍රමෙ, සමානවූ ශක්තිඇත්තාවූ; විග්‍රහෙ, සටනඇති කල්හි; කාකෛඃ, කපුටන්විසින්; අරිමන්දිරෙ, සතුරන්ගේ ගෘහයෙහි; ස්ථිත්වා, සිට; විශ්වාස්‍ය, විශ්වාසභාවයට පැමිණ; හංසාඃ, හංසයෝ; වඤ්චිතාඃ, වඤ්චාකරණ ලද්දාහුයි.

### රජක්හු නැතිකල්හි නාවිකයක්හු නැත්තාවූ නැවමෙන් ජනපදය හානිවනබව.

448 යදි න ස්‍යාන්නරපතිඃ සම්‍යඞ්නෙතා තතඃ ප්‍රජා
අකර්ණධාරා ජලධෞ විප්ලවෙතෙහ නෞරිව.

සම්‍යක්නෙතා, මනාකොට ගික්මවා පමුණුවන්නාවූ; නරපතිඃ, රජෙක්; යදිනස්‍යාත්, ඉදින් නොවේද; තතඃ, ඒ කාරණය හෙතුකොට ගෙණ; ඉහ, මේ ලොකයෙහි; ප්‍රජා, ජනයායයි කියයුතු ප්‍රජාතොමෝ; අකර්ණධාරා, නාවිකයක්හු නැත්තාවූ; නෞඃ, නැවක්; ජලධෞඉව, සාගරයෙහිමෙන්; විප්ලවෙත, නස්නීය.

### රජක්හුගේ ආරක්ෂාව ජනයාට ඕනෑබව.

449 ප්‍රජාං සංරක්ෂති නෘපඃ සා වර්ධයති පාර්ථිවම්
වර්ධනාද්‍රක්ෂණං ශ්‍රෙයස්තදභාවෙ සදප්‍යසත්.

නෘපඃ, රජතෙම; ප්‍රජාං, ජනයා; සංරක්ෂති, රක්ෂාකෙරේ; සා, ඒ ප්‍රජාතොමෝ, පාර්ථිවම්, රජ්ජුරුවන්; වර්ධයති, වර්ධනයකරන්නීය. වර්ධනාත්, වැඩීමටවඩා, රක්ෂණං, රැකීම; ශ්‍රෙයඃ, උතුම්වෙයි. තදභාවෙ; ඒ රක්ෂාකිරීම නැතිකල්හි; සත්අපි, ඇත්තාවූ ජනයාද; අසත්, නැත්තෙවේ.

### අවවාදයට අඥානයන් කිපෙනබව.

450 පයඃ පානං භුජංගානාං කෙවලං විෂවර්ධනම්
උපදෙශො හි මූර්ඛානාං ප්‍රකොපාය න ශාන්තයෙ.

භුජඞ්ගානාං, සර්පයන්ගේ; පයඃපානං, කිරිබීමතෙම; කෙවලං, නියමයෙන්; විෂවර්ධනම් විෂවැඩීමකෙරෙයි. උපදෙශඃ, අනුශාසනාව; මූර්ඛා

නාවීහි, අඥානයන්ගේ වනාහි; ප්‍රකෝපාය, නිවීම පිණිසවේ· ඥා නානයෙ, නිවීම පිණිස නොවේ·

නුවණැත්තන්ටම අනුශාසනා කටයුතුබවහා අඥානයන්ට අනුශාසනා නොකටයුතුබව.

451 විචාරෙණොපදෙෂ්ටව්‍යො නාවිචාරස්‍ය කදාචන
වානරානුපදිශ්‍යාඥාන් ස්ථානභ්‍රෂ්ටා යයුඃ ඛගාඃ·

විචාරවත්, පණ්ඩිතතෙමේම; උපදෙෂ්ටව්‍යඃ, අනුශාසනා කටයුතුය; අවිචාරස්‍ය, අඥානයා වනාහි; කදාචන, කිසිකලෙකත්; න, අනුශාසනා නොකටයුතුය. ඛගාඃ, පක්ෂීහු; අඥාන් වානරාන්, නුවණ්නැති වඳුරන්ට; උපදිශ්‍ය, අනුශාසනාකොට; ස්ථානභ්‍රෂ්ටාඃ, වසනතැන් නැතිවූවාහු; යයුඃ, ගියෝ *

වැස්සෙන්තෙමී වෙව්ලන්නාවූ වඳුරන්දැක පක්ෂීන්විසින් කියනලද ශ්ලෝකයෙක්.

452 අස්මාභිඃ නිර්මිතා නීඩාශ්චඤ්චුමාත්‍රාහෘතෛස්තෘණෛඃ
හස්තපාදාදිසංයුක්තා යූයං කිමවසීදථ·

චඤ්චුමාත්‍රාහෘතෛඃ, හොටපමණින් ගෙණඑනලද්දාවූ; තෘණෛඃ, තණවලින්; අස්මාභිඃ, අපවිසින්; නීඩාඃ, කැදලි; නිර්මිතාඃ, කරණලද්දාහුය· හස්තපාදාදිසංයුක්තාඃ, අත්පා ආදිය ඇත්තාවූ; යූයං, තොපි; කිමව සීදථ, උත්සාහ නොකොට කුමට පසුබටවව්ද.

---

* නර්මදානම්නදී ඉවුරෙහි පර්වත සමීප භූමියෙක්හි මහත්වූ ඉඹුල්ගසෙක් ඇත්තේය, ඒ ගසෙහි කරණලද්දාවූ කැදැල්ලෙහි (කූඩුවෙහි) වර්ෂාකාලයෙහිදී පක්ෂීහු සැපසේ වසත්. පසුව නිල්වස්ත්‍රයෙකින් මෙන් වැසිවලාපටලවලින් පිරිවරණලද අහසඇතිකල්හි වැගිරෙන්නාවූ ජලධාරා ඇතිමහත්වූ වර්ෂාවක්විය. එකල්හි ගස මුල ඉන්නාවූ ශීතයෙන් පීඩාවට පැමිණියාවූ වෙව්ලන්නාවූ වඳුරන්දැක පක්ෂීන් විසින් පින්වත් පින්වත් වඳුරෑ සමූහය මතාපවිසින් අසන්නලැබෙව. හොටපමණින් ගෙණඑනලද්දාවූ තණවලින් අපවිසින් ගෙවල්කරණ ලද්දාහුය. අත්පා ආදිය ඇත්තාවූ තොපි උත්සාහ නොකොට කුමට පසුබටවෙද්දැයි කියනලද්දේය ඒ අසා උපන්නාවූ ක්‍රොධසිත්ඇති වඳුරන්විසින් ඊයම්යෙක පවත්නැති කැදැල්ලෙහි උන්නාවූ සැපඇත්තාවූ පක්ෂීහු අපට නින්දාකෙරෙත්, එහෙයින් වැසි සන්සිඳේවයි සිතනලද්දේය. ඉන්පසු වැසි නැවතුනු කල්හි ඒ වඳුරන්විසින් ගස්වලටනැගී සියලු කැදලි කඩනලද්දාහුය. ඒ පක්ෂීන්ගේ බිජුද පාතහෙළනා ලද්දාහුය. යනාදී කථාවගේ මාතෘකාවශයෙන් මූලකී ශ්ලෝකය දක්වනලදී.

සතුරන්ගේ පීඩාවක් නැතිකල්හි ඉවසීමද සතුරුපීඩා ඇති
කල්හි ශක්ති දක්වීමද යන දෙකම
පුරුෂයාට සැරසිම්බව.

453 අනාපදි භූෂණං පුංසඃ ක්ෂමා ලජ්ජෙව යොෂිතඃ
පරක්‍රමඃ පරිභවෙ වෛයාත්‍යං සුරතෙෂ්විව.

යොෂිතඃ, ස්ත්‍රියගේ; ලජ්ජාඉව, ලජ්ජාවමෙන්; පුංසඃ, පුරුෂයහට, ක්ෂමා, ඉවසිමතොමෝ; අනාපදි, (සතුරු පීඩා නැත්තාවූ) අනිෂ්ටකාලයෙහි; භූෂණම්, ආභරණයෙක්වෙයි. පරිභවෙ, ගැහීවිස්ඇති කල්හි; පරක්‍රමඃ, බල පැවැත්වීමතෙම; සුරතෙෂු, රතික්‍රීඩාවන්හි; වෛයාත්‍යං ඉව, (ස්ත්‍රීන්ගේ) ලජ්ජානැතිවීමමෙන් (පුරුෂයන්ගේ සැරසිම) වෙයි.

තමාගේහා සතුරන්ගේද බලඇතිනැතිබව මනාව බලා විශෙ
ෂය දැනගැන්ම යමෙකුට නුපුලුවන්නම් ඔහුවිසින්
සතුරුපීඩා වැලැක්විය නොහෙනබව.

454 ආත්මනශ්ච පරෙෂාඤ්ච යඃ සමීක්ෂ්‍ය බලාබලම්
අන්තරං නෛව ජානාති ස තිරස්ක්‍රියතෙරිභිඃ.

යඃ, යමෙක්තෙම; ආත්මනඃච, තමාගේද; පරෙෂාඤ්ච, සතුරන්ගේද; බලාබලම්, බලඇතිබවහා දුර්වලබව; සමීක්ෂ්‍ය, බලා; අන්තරං, වෙනස; නෛවජානාති, නොදන්නේමවේද; සඃ, හෙතෙම; අරිභිඃ, සතුරන්විසින්; තිරස්ක්‍රියතෙ, ගහීකරණුලැබේ.

වචන දොෂයෙන් විනාශයට පැමිණෙනබව.

456 සුචිරං හි චරන්නිත්‍යං ක්ෂෙත්‍රෙ ශස්‍යමබුද්ධිමාන්
ද්වීපිචර්මපරිච්ඡන්නො වාග්දොෂාද්ගර්දභො හතඃ.

ද්වීපිචර්මපරිච්ඡන්නඃ, දිවිසමින්වසන ලද්දාවූ; අබුද්ධිමාන්, නුවණනැත්තාවූ; ගර්දභඃහි, කොටලුතෙම වනාහි; සුචිරං, බොහෝකාලයක් මුලුල්ලෙහි; නිත්‍යං, නිතර; ක්ෂෙත්‍රෙ, කුඹුරෙහි; ශශ්‍යං, ගොයම්; චරන්, කන්නේ; වාග්දොෂාත්, වාක්දොෂය හෙතුකොටගෙණ; හතඃ, නසනලද්දේය. *

* හස්තිනාපුරනම් (දිල්ලි) නුවර විමලපතනාමිඇති රදාවක් ඇත්තේය. ඒ රදාගේ කොටලුවෙක් අධිකබර ඉසිලීමෙන් දුර්වලවූයේ මලණකන්ශුමෙනවූයේය එබැවින් ඒ රදවාවිසින් මේ කොටලුතෙම දිවිසමෙන්නන්සා විතෙක් සමීපයෙහි ගොයම් කුඹුරෙක්හි මුදනලද්දේය. පසුව කොටලුවා දුරදීමදක දිවියෙක යනා දහසින් කුඹුර හිමියෝ විසාදුවිත්. ඒකල්හි හොංම රක්ෂාකරන්නාවූ ඒස්පරි එකෙත් මදක් පාණබූවනීණ වූ කම්බලියෙන් කරණලද දිගහැට්වමෙසුන් (ස

## උ ප දෙ ශ යෙ ක්.

456 සෙවිතව්‍යෝ මහාවෘක්ෂඃ ඵලච්ඡායාසමන්විතඃ
යදි දෛවාත් ඵලං නාස්ති ඡායා කේන නිවාර්‍ය්‍යතේ.

ඵල, ඵලද; ඡායා, සෙවනද යනමෙයින්; සමන්විතඃ, යුක්තවූ; මහාවෘක්ෂඃ, මහත්වූ රුකෙක්; සෙවිතව්‍යඃ, ආශ්‍රයකටයුතු; දෛවාත්, භාග්‍යය හේතුකොටගෙණ; ඵලං, ඵල; යදිනාස්ති, ඉදින් නැත්තේද; ඡායා, ඡායාතොමෝ; කේන, කවරෙක්හු විසින්; නිවාර්‍ය්‍යතේ, වලකනුලැබේද.

හීනයන් ආශ්‍රය නොකටයුතුබවහා උත්තමයන් ආශ්‍රය
ක ට යු තු බ ව.

457 හීනසේවා න කර්තව්‍යා කර්තව්‍යෝ මහදාශ්‍රයඃ
පයෝපි ශෞණ්ඩිකීහස්තේ වාරුණීත්‍යභිධීයතේ.

හීනසේවා, අඥනයන්ගේ ආශ්‍රයතොමෝ; නකර්තව්‍යා, නොකටයුත්තීය මහත් ආශ්‍රයඃ, උත්තමයන්ගේ ආශ්‍රයතෙම; කර්තව්‍යඃ, කටයුතු වෙයි. පයඃඅපි, කිරිද; ශෞණ්ඩිකීහස්තේ, රානනන ස්ත්‍රියගේ අත්හි වූ කල්හි; වාරුණීඉති, රායයි, අභිධීයතේ, කියනුලැබේ.

මහතුන් සිත්ගැණීමෙන් ලැබෙන ඵල.

458 අජා සිංහප්‍රසාදෙන වනේ චරති නිර්භයම්
රාමමාසාද්‍ය ලඞ්කායාං ලේභේ රාජ්‍යං විභීෂණඃ.

අජා, එළදෙන්තොමෝ; සිංහප්‍රසාදෙන, සිංහයාගේ ප්‍රසන්නයෙන්; නිර්භයම්, භයනැතිව; වනේ, වනයෙහි; චරති, ඇවිදිනීය. විභීෂණඃ, විභීෂණතෙම; රාමංආසාද්‍ය, රාමකුමාරයාසරා පැමිණ; ලඞ්කායාං, ලඞ්කාදිපයෙහි; රාජ්‍යං, රාජ්‍යය; ලේභේ, ලැබුයේය.

ගුණනැත්තවුන් ආශ්‍රය කරන්නාවූ උත්තමයෝ පවා
සු ළු ව න බ ව.

459 මහානප්‍යල්පතාං යාති නිර්ගුණේ ගුණවිස්තරඃ
ආධාරාධෙයභාවෙන ගජේන්ද්‍ර ඉව දර්පණේ.

ආධාර ආධෙයභාවෙන, ඉසිලිමහා උසුලනු ලැබීමෙන්; දර්පණේ, කැටපතෙහි; ගජේන්ද්‍රඃඉව, හස්තිරාජයකුමෙන්; ගුණවිස්තරඃ, ගුණයෙ

---

ත්නාහයෙකින්) යුක්තව ද්‍රන්නාවූ රස සඳ නැමූනාවූ ශරීරඇත්තේ එක්කෙළ වරක සිටියේය. පසුව සිඟු දුරදී දක කොවලුතෙම පිපුනාවූ ශරීරඇත්තේ මේ තෙම කොවුලුවෙකැයි සිතා ශබ්දකරන්නේ ඒ මනුෂ්‍යයාගේ අභිමුඛයට දිව්වේය. එකල්හි ඒ කොයම් රක්නා පුරුෂයාවිසින් මේ තෙම කොවුලුවේකැයි දැන ක්‍රීඩාවෙන්මවිදමරණලද්දේය.

න් පතලාවූ; මහාන්අපි, උතුම්වෙක් නමුදු; නිර්ගුණ, ගුණනැති දුර්ජනයාකෙරෙහි; අල්පතාං, ලඝුබවට; යාති, පැමිණේ.

මහත් ශක්තිඇත්තාවූ රජුන් ව්‍යාජවාකලකල්හිද සුවසේ

සිටුවනබව.

460 ව්‍යපදෙශෙපි සිද්ධිඃ ස්‍යාදතිශක්තෙ නරාධිපෙ

ශශිනො ව්‍යපදෙශෙන වසන්ති ශශකාඃ සුඛම්.

අතිශක්තෙ, අධිකබල ඇත්තාවූ; නරාධිපෙ, රජකුහු; ව්‍යපදෙශෙපි, ව්‍යාජකලකල්හිද; සිද්ධිඃ, කාර්‍ය්‍යසිද්ධිය; ස්‍යාත්, වන්නීය. ශශිනඃ, චන්ද්‍රයාගේ; ව්‍යපදෙශෙන, ව්‍යාජකිරීම කාරණකොටගෙණ; ශශකාඃ, සාවෝ; සුඛම්වසන්ති, සැපසේ වෙසෙත්. *

ඇතෙක් ඇල්වූ පමණින්ද සර්පයෙක් ඉඹගත් පමණින්ද රජෙක් පාලනයකළ පමණින්ද දුර්ජනයෙක් සිනාසුනු පමණින්ද නසනබව.

461 ස්පෘශන්නපි ගජො හන්ති ජිඝ්‍රන්නපි භුජඞ්ගමඃ

පාලයන්නපි භූපාලඃ ප්‍රහසන්නපි දුර්ජනඃ.

ගජඃ, හස්තිතෙම්; ස්පෘශන්අපි, අල්වන්නේද; භුජඞ්ගමඃ, සර්පතෙම; ජිඝ්‍රන්අපි, සිඹින්නේද; භූපාලඃ, රජතෙම; පාලයන්අපි, රක්නේද; දුර්ජනඃ, අසත්පුරුෂතෙම; ප්‍රහසන්අපි, සිනාසෙන්නේද; හන්ති, නසයි.

---

* වර්ෂාකාලයනාමුදු ග්‍රීෂ්මකාලයෙක්හි වැසි නැතිබැවින් පිපාසයෙන් පීඩිතවූ හස්ති සමූහයතෙම ස්වාමිනි අපගේ ජීවත්වීම පිණිස කවර උපායක්‍රමද නැත්තේය. නිලෙන ස්නානයක් නැතිබැවින් ක්ෂුද්‍ර සත්වයන්හා අපිද මලාහු සමානයෝය කොතැන්හි යමුද කුමක්කරමෝදැයි නායක ඇතාට කීවිය. පසුව හස්තිරජතෙම නුදුරුතැනකටගොස් පිරිසිදුවූ ගැඹුරු ජලයක් දුටුයේය. නැවත දවස් ඉක්මෙනකල්හි ඒ ජල ස්ථානයාගේ ඉවුරෙහි හැසිරෙන්නාවූ ඇතුන්ගේ පාවලින් මිරිකීමෙන් ක්ෂුද්‍රසාවෝ සුණුවූවාහුය. පසුව ශිලීමුඛනම් සාවෙක් පිපාසයෙන් ආකුලවූ මේ ඇත් සමූහයාවිසින් දවස්පාසා මෙහි ආ යුතුවෙයි එබැවින් අපේ කුලය විනාශවෙයි සිතුයේය. ඉන්පසු විජයනාම් මහළු සාවෙක් තොපි නොතැවෙව් මාවිසින් මෙහි ප්‍රතිකාර කටයුතුයයි කීයේය. පසුව මේ තෙම පොරොන්දුවීගියේය. යන්නාවූ ඒ සාවාවිසින් කෙසේ ඇත්සමූහයා මැදසිට කියයුතුද එබැවින් මම පර්වත මුදුනකට නැගී හස්තිරජයාට සන්දෙශවාක්‍යය දයන්නෙමි සිත ලද්දේය, එසේ සිටිකල්හි තෝ කවරෙක්ද කොතනින් ආයේදැයි ඇත්රජතෙම ඇසුයේය· මම සාවෙක්වෙමි පිණැත්තාවූ චන්ද්‍රයාවිසින් පින්වතුන්ගේ සමීපයට

## දූ ත ය ක් හු ගේ ස්ව භා ව ය.

462 උද්‍යතෙෂ්වපි ශස්ත්‍රෙෂු දූතො වදති නාන්‍යථා
සදෛවාවධ්‍යභාවෙන යථාර්ථස්‍ය හි වාචකඃ.

ශස්ත්‍රෙෂු, ආයුධයන්; උද්‍යතෙෂු අපි, එසවූ කල්හිදු; දූතඃ, දූතතෙම; අන්‍යථා, අන්ප්‍රකාරයෙකින්; නවදති, නොකියයි; සදා, හැමකල්හි; අවධ්‍යභාවෙන එවිහි; නොනසනබැවින්ම වනාහි; යථාර්ථස්‍ය, විද්‍යමාන වූ කාරණය; වාචකඃ, කියන්නෙක්වේ.

අමාත්‍යභාවයෙහි පිහිටුවියයුත්තෝ.

463 ස්වදෙශජං කුලාචාරෙ විශුද්ධමුපධාශුචිම්
ශාස්ත්‍රඥමව්‍යසනිනං ව්‍යභිචාරවිවර්ජිතම්.

ස්වදෙශජං, ස්වකීයදෙශයෙහි උපන්නාවූ; කුලාචාරෙ, කුලධර්මයෙහි; විශුද්ධං, පිරිසිදුවූ; උපධාශුචිම්, (කපටින්ගේ) පරීක්ෂාකිරීමෙන් පවිත්‍රවූ; ශාස්ත්‍රඥං, ශාස්ත්‍රදන්නාවූ; අව්‍යසනිනං, විපත්තිරහිතවූ; ව්‍යභිචාරවිවර්ජිතම්, දෘෂ්ක්‍රියාවලින් වෙන්වූ.

464 අධීතව්‍යවහාරඥං ඛ්‍යාතං මෞලං විපශ්චිතම්
අර්ථස්‍යොත්පාදකං සම්‍යග්නිදධ්‍යාත්මනත්‍රිණං නෘපඃ.

අධීතව්‍යවහාරඥං, පුහුනුකරණලද ක්‍රමදන්නාවූ; ඛ්‍යාතං, ප්‍රසිද්ධවූ; මෞලං, කුල පරම්පරාවෙන් ආවාවූ; විපශ්චිතං, නුවණැත්තාවූ; අර්

එවනලද්දේයයි සාවා කීය. කවයුත්ත කියනු ලැබේවයි හංසතෙම කීයේය: ආයුධ එසවූකල්හිදු දූතතෙම අන්පරිද්දෙකින් නොකියයි හැමකල්හිම මරණයට නුසුදුසු බැවින් ඇතිකාරණයම කියන්නේය. එහෙයින් මම ඔහුගේ ආඥාවෙන් කියමි. අසව චිත්‍රයාගේවිල රක්ෂාකරන්නාවූ යම් සාවෝ වෙද්ද ඒ සාවෝ තාවිසින් පහකරණ ලද්දාහුය. ඒ ක්‍රියාව සුදුසු නොවෙයි. ඒ සාවෝ අප විසින් බොහෝකාලයක් රක්නා ලද්දාහුය. එහෙයින්ම මට ශශාංකයයි ප්‍රසිද්ධිය වීයයි විජයතෙම කීයේය. දූතයා මෙසේකියනකල්හි ඇත්රජතෙම භයින් යුක්තවූයේ හිත තබව මේ තෙම නොදැනීමෙන් කරණ ලද්දේය නැවත නොකටයුතුයයි මෙසේකීයේය. ඉදින් එසේවිනම් අංචිල්හිකොපයෙන් වෙව්ලන්නාවූ පිණැත්තාවූ ඒ චන්ද්‍රයාවැඳ ප්‍රසන්නකරව යවයි දූතතෙම කීයේය. ඉක්බිති හස්තිස්වාමියා රාත්‍රියෙහි ගෙණ ගොස් දියෙහි සෙලවෙන්නාවූ සඳමඬල දක්වා ඇත්ස්වාමී වැන්දවූයේය. දූතයා විසින් මෙසේද කියනලද්දේය. ස්වාමීනි නොදැන්ම මෙතුකොටගෙණ මොහුවිසින් අපරාධය කරණ ලද්දේය. එහෙයින් ක්ෂමාකෙරේවා: අන්වාරයෙක්හි මෙසේ නොකරණු ලැබෙයි මෙසේකියා කීයේය. මේ සංඑාවගේ මාත්‍රෘකාවිශයෙන් මූල ගෙනුංනාස ඒ.ෂනාලදීඃ

ස්වොත්පාදකං, ධනය උපදවන්නාවූ; මන්ත්‍රිණං, අමාත්‍යයන්හු; නෘපඃ, රජතෙම; සම්‍යක්, මනාකොට; නිදධ්‍යාත්, නියමකරන්නේහෝ යොදන්නේය.

ලදනොහැකි ධනය කැමතිවන්නෝ.

465 රජා මත්තඃ ශිශුශ්චෛව ප්‍රමදා ධනගර්විතඃ
අප්‍රාප්‍යමපි වාඤ්ඡන්ති කිම්පුනර්ලභ්‍යමෙව යත්.

රජා, රජද; මත්තඃ, රබීමත්වූ තැනැත්තේද; ශිශුඃචඑව, ලදරුවාද; ප්‍රමදා, ස්ත්‍රීද; ධනගර්විතඃ, ධනයෙන් උඩඟුවූ තැනැත්තේද; අප්‍රාප්‍යංඅපි, ලදනොහැකිදෙයද; වාඤ්ඡන්ති, කැමතිවෙත්. යත්, යමක්; ලභ්‍යංඑව, ලැබියයුතුමද; ඊට ආශාවීම, කිංපුනඃ, කියනුකිම.

දූ ත යෙ ක් ක ට යු තු තැ නැ ත් තා.

466 භක්තො ගුණී ශුචිර්දක්ෂඃ ප්‍රගල්භො ව්‍යසනී ක්ෂමී
බ්‍රාහ්මණඃ පරමර්මඥො දූතඃ ස්‍යාත් ප්‍රතිභානවාන්.

භක්තඃ, ශ්‍රද්ධාඇත්තාවූ; ගුණී, ගුණඇත්තාවූ; ශුචිඃ, පිරිසිදුවූ; දක්ෂඃ, දක්ෂවූ; ප්‍රගල්භඃ, අහංකාරවූ; අව්‍යසනී, ව්‍යසනරහිතවූ; ක්ෂමී, ඉවසීම්ඇත්තාවූ; පරමර්මඥඃ, අනුන්ගේ මර්මස්ථානයන් දන්නාවූ; ප්‍රතිභානවාන්, පැමිණි කටයුත්තෙහි නුවණැති; බ්‍රාහ්මණඃ, බමුණෙක්; දූතඃස්‍යාත්, දූතයෙක්වන්නේය.

බ්‍රාහ්මණයෙක්ම දූතයෙක් කටයුතුබව.

467 ප්‍රසාදඃ කුරුතෙ පත්‍යුඃ සම්පත්තිං නාභිජාතතා
කාලිමා කාලකූටස්‍ය නාපෛතීශ්වරසඞ්ගමාත්.

පත්‍යුඃ, ස්වාමියාගේ; ප්‍රසාදඃ, ප්‍රසන්නතාය; සම්පත්තිං, වැඩීම; නකුරුතෙ, නොකෙරේ. අභිජාතතා, මනාවංශයෙහි උපන්බව (දියුණුකෙරේ) ඊශ්වරසඞ්ගාත්, ඊශ්වරයාහා ඇලීමෙන්; කාලකූටස්‍ය, කාලකූටවිෂයාගේ; කාලිමා, කාළුවර්ණය; නඅපෛති, පහනොවේ.

දුර්ජනයාගේ අමනොඥක්‍රියාවෙහි ඵලය සත්පුරුෂයා ලබනබව.

468 ඛලඃ කරොති දුර්වෘත්තං නූනං ඵලති සාධුෂු
දශානනොහරත් සීතාං බන්ධනං ස්‍යාන්මහොදධෙඃ.

ඛලඃ, දුර්ජනතෙම; දුර්වෘත්තං, දුශ්චරිතය; කරොති, කෙරේ. සාධුෂු, සත්පුරුෂයන්කෙරෙහි; නූනං, එකාන්තයෙන්; ඵලති, පලදෙයි. දශානනඃ, රාවණතෙම, සීතාං අහරත්, සීතාදෙවිය පැහැරගත්තේය මහොදධෙඃ, මහාසමුද්‍රයාගේ; බන්ධනංස්‍යාත්, බන්ධනයවූයේ :.

දුර්ජනයාහා සමග කිසිතැනෙක්හි නොයායුතුබවහා
නො සි ටි ය යු තු බ ව.

469 න ස්ථාතව්‍යං න ගන්තව්‍යං දුර්ජනෙන සමං ක්වචිත්
කාකසඞ්ඝාතතො හංසස්තිෂ්ඨන් ගච්ඡංශ්ච වර්තිකඃ.

දුර්ජනෙනසමං, දුර්ජනයාහා සමග; ක්වචිත්, කිසිතැනෙක්හි; නස්ථාතව්‍යං, නොසිටියයුතුය. නගන්තව්‍යං, නොයායුතුය. කාකසඞ්ඝාත්, කවුඩාහා එක්ව විසීම හෙතුකොටගෙණ; හංසඃ, හංසතෙම; හතඃ, නසනලද්දේය. තිෂ්ඨන්, සිටින්නාවූද; ගච්ඡන්, යන්නාවූද; වර්තිකඃච, වටුවෙක්ද මරණලද්දේය. *

අසත්පුරුෂයන්හා නොඇලීමද සත්පුරුෂයන්ගේ ආශ්‍රයද
පින්කිරීමද අනිත්‍යස්වරූපය සැලකීමද කටයුතුබව,

470 ත්‍යජ දුර්ජනසංසර්ගං භජ සාධුසමාගමම්
කුරු පුණ්‍යමහොරාත්‍රං ස්මර නිත්‍යමනිත්‍යතාම්.

දුර්ජනසංසර්ගං, අසත්පුරුෂයන්ගේ ගැලපීම; ත්‍යජ, හරුව; සාධුසමාගමම්, සත්පුරුෂයන්ගේ එක්වීම; භජ, සෙවනයකරව; අහොරාත්‍රම්, දි

* උදෙනිරට මාර්ගයෙහි මහත්වූ නුගගසෙක් ඇත්තේය. ඒ ගසෙහි හංසයෙක්හා කවුඩෙක්ද වසත්. එක්තරා ග්‍රීෂ්මකාලයෙක්හි ඩාවට පැමිණියාවූ එක් මඟියෙක් ඒ වෘක්ෂමූලයෙහි දුන්නහා ඊයද තබා සැතපුනේය. පසුව සූර්යයාගෙන් ඔහුගේ මුහුණකෙරෙහි ගසෙහි ඡායාව පහවිය. ඉක්පසු සූර්යරශ්මියෙන් පැතිරෙණලද ඔහුගේ මුහුණදක මහාසිත්ඇත්තාවූ පව්නොකරන්නාවූ ඒ පිපළ වෘක්ෂයෙහි වසන්නාවූ හංසරාජයාන් විසින් කරුණාවෙන් පක්ෂදෙක විසුරුවා නැවත ඔහුගේ මුහුණෙහි සෙවණකරණලද්දීය. ඉක්බිත්තෙන් සුඛිව නිදන්නාවූ සැපතින්යුත් මාර්ගයෙහි ගමනින් මිරිකුනාවූ ඩාවට පැමිණියාවූ මඟියාවිසින් මුහුණ ඇරැස්ම ඉවත්කරණ ලද්දේය. ඉක්පසු ස්වභාව දුර්ජනභාවයෙන් අනුන්ගේ සැපත ඉවසියනොහෙන්නාවූ ඒ කවුඩුතෙම ඔහුගේ මුඛයෙහි වර්චස්කොට ගියේය. ඉක්පසු මෙතෙම නැගිට යම්තාක්බලාද ඒ තාක් ඔහුවිසින් දක්නාලද්දාවූ හංසතෙම ඊයෙන්විද මරණලද්දේය.

වටුවාගේ කථාව මෙසේය.

පිණැත්තාවූ ගුරුළුහට ගමන්සෙදීමෙන් සියලුපක්ෂීහු එක්කාලෙක්හි මුහුදුවෙරළටගියෝය. ඉක්බිත්තෙන් කවුඩාහා සමග වටුවාද ගියේය. ඒකල්හි යන්නාවූ ගොපලු පුරුෂයෙක්හුගේදී (මීදුනාවූකිරී) භාණ්ඩයකෙරෙන් විටින්විට ඒ කවුඩාවිසින්දී කනුලැබේ. ඒකල්හි ගොපලුතෙම දී භාජනය බිමතබා උඩබලනුයේ ඔහුවිසින් කවුඩුවටු දෙදෙනා දක්නාලද්දාහුය. පසුව ඔහුවිසින් තළනාලද්දාවූ කවුඩුතෙම පියේය. ස්වභාවයෙන් අපරාධයක් නැත්තාවූ වටුතෙම මදගමනඇතිවූයේය. එහෙයින් පැමිණි තැනැත්තේ මරණලද්දේය. මේ කථාදෙක සඳහා මූලකී ශ්ලෝකය කියනලදී,

වාරත්‍රිදෙක්හි; පුණ්‍යම්, සුචරිතය; කුරු, කරව; අනිත්‍යතාම්, මනුෂ්‍යා දීන් නිතර නොපවත්නාබව; නිත්‍යම්, නිරන්තරයෙන්; ස්මර, සිහි කරව.

අසත්පුරුෂයන් විසින් කියනලද්දාවූ සිනාසහිත ප්‍රියකථාවෝද භයඑළවන්නේය යනබව.

471 දුර්ජනෛරුච්‍යමානානි සස්මිතානි ප්‍රියාණ්‍යපි
අකාලකුසුමානීව භයං සඤ්ජනයන්ති හි.

දුර්ජනෛඃ, අසත්පුරුෂයන් විසින්; උච්‍යමානානි, කියනුලබන්නාවූ; සස්මිතානි, සිනාසහිතවූ; ප්‍රියාණිඅපි, ප්‍රියවූ වාක්‍යයෝද; අකාලකුසුමානිඉව, අනියම්කාලයෙහි පිපෙන මල්මෙන්; භයංසඤ්ජනයන්තිහි, භය උපදවත්මය.

කරණලද දෝෂය තමා ඇසින්දුටුකල්හිද කණට ප්‍රියවූ මධුර වචනයෙන් අඥනයා සතුටුවෙසීයනබව.

472 ප්‍රත්‍යක්‍ෂෙපි කෘතෙ දොෂෙ මූඪඃ සාන්ත්වෙන තුෂ්‍යති
රථකාරො නිජාං භාර්‍ය්‍යාං සජාරං ශිරසා කරොත්.

කෘතෙ, කරණලද්දාවූ; දොෂෙ, දෝෂය, ප්‍රත්‍යක්‍ෂෙඅපි, ඇසින්දුටුකල්හිද; මූඪඃ, අඥනතෙම; සාන්ත්වෙන, ප්‍රියවචනයෙන්; තුෂ්‍යති, සතුටුවෙයි; රථකාරඃ, රථකරණවඩුතෙම; සජාරං, හොරහිමියා සහිතවූ; නිජාංභාර්‍ය්‍යාං, තමන් අඹුව; ශිරසා, ඉසින්; අකරොත්, කෙළේය. *

---

* ශ්‍රීනුවර මන්දමතිනම් වඩුවෙක් ඇත්තේය. ඒ වඩුතෙම තමාගේ අඹුව සොරපුරුෂයක්හුහා ඇළුම්ඇත්තීයයි දනී. එසේවී නමුත් සොරපුරුෂයාහා සමග එක්ස්ථානයෙක්හි තමා ඇසින් නොමදකී. එබැවින් මේ වඩුතෙම මම වෙනින්ගමකට යන්නෙමි කියා ගියේය. හෙතෙම මදක්දුරගොස් නැවත සැඟව අවුත් තමාගේ ගෙයි ඇඳයට වැටී සිටියේය. එකල්හි මගේ ස්වාමිපුරුෂයා අන්‍යගමකට ගියේයයි උපන්නාවූ විශ්වාසයෙන් ඒ අඹුවවිසින් හොරහිමියා සැන්දෑවෙහිම කැඳවනලද්දේය. පසුව ඒ හොරහිමියාහා සමග ඇඳෙහි දැඩිව ක්‍රීඩාකරන්නී ඇඳයට සිටියාවූ ස්වාමියාගේ කිසි ශරීරස්පර්ශයක් හෙතුකොටගෙණ ස්වාමියායයි දැන ඔතොමෝ කලකිරුණාවූ සිත්ඇතිවීය. එකල්හි හොරහිමියාවිසින් මාහා සමග අද කුමක්නිසා නි දැඩිව නොඇලෙන්නෙහිද විස්මයට පැමිණි තැනැත්තියක්මෙන් හැඟෙයි කියනලද්දේය. ඒ අසා ස්ත්‍රියවිසින් මාගේ ජීවිතයට අධිපතිවූ යමෙක් ඇද්ද හෙතෙම අද අන්‍යගමකට ගියේය. ඔහුගෙන් වෙන්වීම කරණකොටගෙණ සියලුජනයාගෙන් පිරුණාවූද මේ ගම මට වනයක්මෙන් වැටහෙයි එහි අන්තැනෙක්හි කුමක්වූයේද කුමක්කෑයේද කෙසේ නිදූයේදැයි කියාහෙයි මාගේ ලයපැලෙයි කියනලද්දීයද් එකල්හි සොරපුරුෂයාවිසින් තිගේ ඒ ස්වාමිපු

## ගුණවත් අඹුවගේ පැවතුම්.

473 පරුෂෙණපි චොක්තා යා දෘෂ්ටා වා කෘධචක්ෂුෂා
සුප්‍රසන්නමුඛී භර්තුඃ සා නාරී ධර්මභාජනම්.

සා, යම්අඹුවක්තොමෝ; පරුෂෙණ, රළුබසකින්; උක්තාඅපිච, (ස්වාමියාවිසින්) කියනලද්දීහෝ; කෘධචක්ෂුෂා, කිපුනාවූ ඇසින්; දෘෂ්ටාවා, බලනලද්දීහෝ; භර්තුඃ, ස්වාමිපුරුෂයාහට; සුප්‍රසන්නමුඛී, මනා ප්‍රසන්න මුහුණුඇත්තීද; සානාරී; ඒ ස්ත්‍රීතොමෝ; ධර්මභාජනම්, සුචරිතයට ස්ථානයි.

---

රුෂයතෙම ඔබරකරන්නෙක එබැවින් මෙබඳුවූ යෙනහකට සුතුබව කුමක්දැයි කියනලද්දේය. ඒ ඇසූ වෙශාස්ත්‍රිය බොල අඥානය තෝ කුමක්කියයිද? අසව ස්වාමි පුරුෂයා විසින් පරුෂබස් කියනලද්දවූහෝ කිපුනාවූ ඇසින් දක්නාලද්දවූහෝ යම් ස්ත්‍රියක්තොමෝ ස්වාමිපුරුෂයාහට අතිශයින් ප්‍රසන්නාවූ මුහුණාඇත්තීද ඒ ස්ත්‍රීතොමෝ දුවරිතයට භාජනාවේ. නුවරහෝ වනයෙහිහෝ වසන්නාවූ පවිටුවූ නොහොත් පිරිසිදුවූ ස්වාමිපුරුෂතෙම යම් ස්ත්‍රීන්ට ප්‍රියවේද ඒ ස්ත්‍රීන්ගේ ලොකයෝ වැඩෙන්නාහුය. ස්වාමිපුරුෂයා විනාහි ස්ත්‍රියට උතුම්වෙයි. සැරසීම්වලින් තොරවූ ස්ත්‍රියට පුරුෂයා සැරසීමක්වෙයි. ඒ පුරුෂයාගෙන් තොරවූ මේ ස්ත්‍රීතොතමෝ මනාපැටිතුම්ඇත්තීද නොහොබී. තෝද සොරසැමියෙහිය සිත්හි ලොල්බව හෙතුකොටගෙණ මල්හා ඩූලත් සමානවූයේ ඛිහිකලෙක්හි සෙවනයකරණු ලබව. ඒ මාගේ ස්වාමිතෙම මා විකුනන්වහෝ දෙවියන්ටහෝ බ්‍රාහ්මණයන්වහෝ දෙන්වද පොහොසත්වෙයි. බොහෝකොටතිමෙත් ප්‍රයොජනනොවෙයි. ඔහු ජීවත්වන කල්හි ජීවත්වෙමි. ඔහු මළකල්හි එක්ව මරණට පැමිණෙන්නෙමි. මෙසේ මේ තෙම මාගේ නියමයවෙයි යම් ස්ත්‍රියක් ස්වාමිපුරුෂයා සමග මරණයට පැමිණෙන්නීද ඒ ස්ත්‍රීතොමෝ මනුෂ්‍යයාකෙරෙහි තුන්කෙළ පණස්ලක්ෂයක් යම් ලොමයෝවෙද්ද එපමණකල් දෙව්ලොව වසන්නීය, සර්පයන් අල්වන්නෙක් තමාගේ බලය හෙතුකොටගෙණ බිලයක්කෙරෙන් සර්පයන්හු යම්සේ නගා ගණීද එසේම ස්වාමිපුරුෂයා රැගෙණ දෙව්ලොවඉපිද ඔහුහා සමගම සතුටුවන්නීය. මළාවූ ස්වාමියා සොහොනෙහි වැළඳගෙණ යම් ස්ත්‍රියක් තොමෝ තමාගේ ශරීරය හරණීද මෝ තොමෝ සියලක්ෂයක් පව්කොටද ස්වාමියාගෙණ දෙව්ලොවට යන්නීය. මේ ස්ත්‍රිය විනාහි පියාවිසින්හෝ පියාගේ අවසරය ඇතිකල්හි සහෝදරයා විසින්හෝ යමෙකුටදෙන්නේද ඕතොමෝ ජීවත්වන්නාවූ ඔහු ආශ්‍රයකරන්නීය. මළතැනැත්තාද නොසික්මවන්නේයයි කියන්නීය, මේ සියල්ලඅසා ඒ වඩුතෙම යෙන්නඇත්තාවූ ප්‍රියවචනකියන්නාවූ මෙබඳුභාර්‍යාවක් යමෙක්හටඇත්තීද ඒ මම පිණැත්තෙම්යි මෙසේ සලකා ස්ත්‍රීපුරුෂදෙදෙනා උන්නාවූ ඒ ඇඳ ඉසතබාගෙණ ඒ අඥානතෙම නැට්ටේය. මේ කථාවගේ මාතෘකාවශයෙන් මූලකී ශ්ලොකය දක්වනලදී.

## වැඩිදියුණුව අයිති ස්ත්‍රී හු.

474 නාගරස්ථා වනස්ථා වා පාපා වා යදි වා ශුචිඃ
යාසාං ස්ත්‍රීණාං ප්‍රියො භර්තා තාසාං ලොකා මහොදයාඃ.

නාගරස්ථඃ, නුවරසිටියාවූහෝ; වනස්ථඃවා, වනයෙහිවසන්නාවූහෝ; පාපඃවා, ලාමකවූහෝ; යදිවා, නොහොත්; ශුචිඃ, පිරිසිදුවූ; භර්තා, ස්වාමිපුරුෂතෙම; යාසාංස්ත්‍රීණාම්, යම් අඹුවන්ට; ප්‍රියඃ, ප්‍රියවේද; තාසාම්, ඒ අඹුවන්ගේ; ලොකාඃ, ලොකයෝ; මහොදයාඃ, මහත්වූ වැඩිම ඇත්තාහුයි.

## බබලන්නාවූ ස්ත්‍රියක්.

475 භර්තා හි පරමං නාය්‍යා භූෂණං භූෂණෛර්විනා
ඒෂා විරහිතා තෙන ශොභනාපි න ශොභතෙ.

භර්තාහි, ස්වාමිපුරුෂයාවනාහි; නාය්‍යාඃ, ස්ත්‍රීහට; පරමම්, උතුම්වේ; භූෂණෛඃවිනා, සැරසිම්වලින් තොරවූ ස්ත්‍රියගේද; භූෂණං, සැරසීමෙකි; තෙන, ඒ ස්වාමිපුරුෂයාගෙන්; විරහිතා, තොරවූ; ඒෂා, මේ ස්ත්‍රී තොමෝ; ශොභනාඅපි, මනාවීද; නශොභතෙ, බබලන්නී නොවේ.

## ස්වාමිපුරුෂයාහා සමග මියයන ස්ත්‍රියට ලැබෙන ඵල.

476 තිස්‍රඃ කොට්‍යර්ධකොටී ච යානි ලොමානි මානවෙ
තාවත්කාලං වසෙත් ස්වර්ගෙ භර්තාරං යානුගච්ඡති.

යා, යම්ස්ත්‍රියක්; භර්තාරං අනුගච්ඡති, ස්වාමිපුරුෂයාහා සමග මරණයට පැමිණේද ඒ ස්ත්‍රී තොමෝ; මානවෙ, මනුෂ්‍යයාකෙරෙහි; තිස්‍රඃ කොටී, තුන්කෙළක්හා; අර්ධකොටිච, පණස්ලක්ෂයක්ද; යානිලොමානි, යම්පමණ ලොමයෝවෙද්ද; තාවත්කාලං, එපමණකල් මුලුල්ලෙහි, ස්වර්ගෙ, දිව්‍යලොකයෙහි; වසෙත්; වාසයකරන්නේය,

## ස්වාමියාහා අඹුවත් දෙව්ලොව උපදින ක්‍රමය,

477 ව්‍යාලග්‍රාහී යථා ව්‍යාලං විලාදුද්ධරතෙ බලාත්
තථා භර්තාරමාදාය තෙනෛව සහ මොදතෙ.

ව්‍යාලග්‍රාහී, අහිතුණ්ඩිකයෙක් (සර්පයන් අල්වන්නෙක්) බලාත්, බලයෙන්; විලාත්, බිලයක් (සිදුරක්) කෙරෙන්; ව්‍යාලං, සර්පයක්හු; යථා උද්ධරතෙ, යම්පරිද්දෙකින් නගාගණීද; තථා, එ පරිද්දෙන්ම; භර්තාරං, ස්වාමිපුරුෂයා; ආදාය, ගෙණ; තෙනඑවසහ, ඔහුහා සමගම ;මොදතෙ, (දෙව්ලොවදී ගොස්) සතුටුවන්නීය.

හිමියා මළකල්හි ඔහු වැළඳගෙණ සොහොනෙහි මියයන

ස්ත්‍රි ය ට ලැ බෙ න ඵ ල.

478 චිතෙ පරිෂ්වජ්‍ය විචෙතනං පතිං
ප්‍රියා හි යා මුඤ්චති දෙහමාත්මනඃ.
කෘත්වාපි පාපං ශතලක්ෂමප්‍යසෞ
පතිං ගෘහීත්වා සුරලොකමාප්නුයාත්.

යාප්‍රියාහි, යම්අඹුවක් වනාහි; විචෙතනං, කල්පනානැත්තාවූ (මළාවූ); පතිං. ස්වාමිපුරුෂයා; පරිෂ්වජ්‍ය, වැළඳගෙණ; ආත්මනඃ, තමාගේ; දෙහං, ශරීරය; චිතෙ, සොහොනෙහි; මුඤ්චති, හරින්නීද; අසෞ මෙ තොමෝ; ශතලක්ෂංඅපි, ලක්ෂ සියයකුදු; පාපංකෘත්වාඅපි, පව්කොටද; පතිං, ස්වාමියා; ගෘහීත්වා, ගෙණ; සුරලොකං, දෙව්ලොවට; ආප්නුයාත්, පැමිණෙන්නේය-

ජීවත්වන්නාවූහෝ මළාවූ පුරුෂයෙක් අඹුවවිසින් නොහැරිය

යු තු බ ව.

479 යශෙසම දද්‍යාත් !පිතාතෙවනාං භ්‍රාතා චානුමතෙ පිතුඃ
තං ශුශ්‍රූෂෙත ජීවන්තං සංස්ථිතඤ්ච න ලඞ්ඝයෙත්.

පිතා, පියා හෝ; පිතුඃ, පියාගේ; අනුමතෙ, කැමැත්තඇති කල්හි; භ්‍රාතාච, සහෝදරයෙක්හෝ; එ නාංතු, මැ වනාහි; යශෙසම, යම් පුරුෂයක්හට; දද්‍යාත්, දෙන්නේද; ජීවන්තං, ජීවත්වන්නාවූ; තං, ඒ පුරුෂයා; ශුශ්‍රූෂෙත, ආශ්‍රයකරන්නේය, සංස්ථිතඤ්ච, මළතැනැත්තාද; න ලඞ්ඝයෙත්, නොහරණේය.

සියයක්දෙන්නේය ඩබර්නොකරන්නේය යන්න පණ්ඩිත සම්මතය

කාරණයක්නැතිවද සටන්කිරීම අඥනයන්ගේ

ලකුණෙක යනබව.

480 ශතං දද්‍යාන්න විවදෙදිති විඥස්‍ය සම්මතම්
විනා හෙතුමපි ඩන්ඩමෙතත් මූර්ඛස්‍ය ලක්ෂණම්.

ශතං, සියයක්; දද්‍යාත්, දෙන්නේය; නවිවදෙත්, විවාදනොකරන්නේය, ඉති, මෙසේ; විඥස්‍ය, නුවණැත්තහුගේ; සම්මතම්, සම්මතයයි, හෙතුංවිනාඅපි, හෙතුනැතිවද; ඒතත්ඩන්ඩං, මේ ඩබරය; මූර්ඛස්‍ය, අඥනයාගේ; ලක්ෂණම්, ලකුණයි.

මන්ත්‍රණය රහසේ කටයුතුබව.

481 වර්ණාකාරප්‍රතිධ්වානෛර්නෙත්‍රවක්ත්‍රවිකාරතඃ
අප්‍යූහන්ති මනො ධීරාස්තස්මාද්‍රහසි මන්ත්‍රයෙත්.

වර්ණ, ශරීරවර්ණය; ආකාර, ඇඟවිම්ක්‍රියාවය; ප්‍රතිධ්වානෛඃ, ශබ්දය යනාමේ තුනින්ද; නෙත්‍රවක්ත්‍රවිකාරතඃඅපි, නෙත්‍රවිකාර මුඛවිකාරය යනාමේ ක්‍රියාව හෙතුකොටගෙණද; ධීරාඃ, නුවණැත්තෝ; මනඃ, අදහස; ඌහන්ති, සලකත්; තස්මාත්, ඒ කාරණය හෙතුකොටගෙණ; රහසි, කිසිවකුත් නැති තැන්හි; මන්ත්‍රයෙත්, කථාකරන්නේය.

වෛද්‍යාචාර්‍ය්‍යාදි සතරදෙනෙකුගේ ජීවත්වීමට
ප්‍රයොජනවන කරුනු.

482 වෛද්‍යානාමාතුරඃ ශ්‍රෙයාන් ව්‍යසනී යො නියොගිනාම්
විදුෂාං ජීවනං මූර්ඛඃ සවතෙඥවා නෘපතෙර්ජනඃ.

ආතුරඃ, රොගයෙන්යුක්ත ජනතෙම; වෛද්‍යානාම්, වෙදුන්ට; ශ්‍රෙයාන්, ශුභවෙයි. යඃ, යම් රජෙක්තෙම; ව්‍යසනී, දූකෙළිම් ආදියෙහි ඇළුනේද (හෙතෙම); නියොගිනාම්, අමාත්‍යයන්ට (ශුභවෙයි); මූර්ඛඃ, අඥානතෙම; විදුෂාං, පණ්ඩිතයන්ට; ජීවනං, ජීවත්වීමවෙයි; සවඥවඃ, බලසහිතවූ; ජනඃ, ජනතෙම; නෘපතෙඃ, රජහුගේ ජීවත්වීමවෙයි.

සියරටෙහිහා අනුන්ගේ රටවලද කටයුතු නොකටයුතු බැලීමෙහි
ඇවිදිනාවූ පුරුෂයක්හු රජහට ඕනෑබව.

483 භවෙත් ස්වපරරාෂ්ට්‍රාණං කාර්‍ය්‍යාකාර්‍ය්‍යාවලොකනෙ
චාරශ්චක්ෂුර්මහීභර්තුර්‍යස්‍ය නාස්ත්‍යන්ධ එව සඃ.

ස්වපරරාෂ්ට්‍රාණං, තමන්ගේ දෙශයද අනුන්ගේ දෙශද යන දෙශයන්ගේ; කාර්‍ය්‍යඅකාර්‍ය්‍ය අවලොකනෙ, කටයුතු නොකටයුතු බැලීමෙහි; චාරඃ, ඇවිදිනාවූ පුරුෂතෙම; මහීභර්තුඃ, රජහුගේ; චක්ෂුඃභවෙත්, ඇසවන්නේය; යස්‍ය, යම්රජක්හට; නාස්ති, (ඒඇස) නැත්තේද; සඃ, හෙතෙම; අන්ධඃඑව, අන්ධයෙක්මය.

චරපුරුෂයා විසින් හැසිරියයුතු ක්‍රමය.

434 තීර්ථාශ්‍රමසුරස්ථානෙ ශාස්ත්‍රවිඥානහෙතුනා
තපස්විව්‍යඤ්ජනොපෙතෛඃ ස්වචරෛඃ සහ සංවදෙත්.

තපස්විව්‍යඤ්ජන, තාපසවරුන්ගේ වෙශයෙන්; උපෙතෛඃ, යුක්තවූ. ස්වචරෛඃසහ, තමන්පක්ෂයෙහිවූ සැඟවිසිටින්නාවූ චරපුරුෂයන්හා සමග; තීර්ථ, දූමොදරාදිතීර්ථද; ආශ්‍රම; සන්‍යාසි ආදිවූ වාසස්ථා

නදඃ ස්ඵරසම්භෙනෙ, දෙවාලදසභාමෙහි; ශාස්ත්‍රවිඥනහෙතනා ශාස්ත්‍ර ද
නගැන්ම නම්වූ කපටිභාවය හෙතුකොටගෙණ; සංවදෙත්, කථාකර
න්නේය.

රහස්මන්ත්‍රණය කටයුතුවතිබෙණ ක්‍රමය.

485 ෂට්කර්ණෝ භිද්‍යතෙ මන්ත්‍රස්තථා ප්‍රාප්තශ්ච වාර්තයා
ඉත්‍යාත්මනා විතීයෙන මන්ත්‍රඃ කාර්‍ය්‍යො මහීභෘතා.

ෂට්කර්ණඃ, කන්සයක් ඇත්තාවූද; තථා, එසේම; වාර්තයා, කථාවෙන්; ප්‍රාප්තඃච, පැමිණියාවූද; මන්ත්‍රඃ. රහස්වූ මන්ත්‍රණයතෙම; භිද්‍යතෙ ඉති, බිඳේයයි. ආත්මනාවිතීයෙන, තමා දෙවෙනිවූ; මහීභෘතා, රජහුවිසින්; මන්ත්‍රඃකාර්‍ය්‍යඃ, රහස්මන්ත්‍රණය කටයුතුවෙයි.

රජුන්ගේ රහස්මන්ත්‍රණය බිඳුනුකල්හි ඒ ගැළපිය
නො හෙ න බ ව.

486 මන්ත්‍රභෙදෙ හි යෙ දෝෂා භවන්ති පෘථිවීපතෙඃ
න ශක්‍යාස්තෙ සමාධාතුමිති නීතිවිදාං මතම්.

පෘථිවීපතෙඃ, රජහුගේ; මන්ත්‍රභෙදෙහි, රහස්මන්ත්‍රණය බිඳුනුකල්හි; යෙදෝෂාඃ, යම් දෝෂකෙනෙක්; භවන්ති, වෙද්ද; තෙ, ඒ දෝෂයෝ; සමාධාතුං, ගළපන්ට; නශක්‍යාඃඉති, නොහැක්කාහුයයි; නීතිවිදාං, නීතිශාස්ත්‍රය දන්නවුන් විසින්; මතං, දන්නාලදී.

පරීක්ෂානොකොට යුධකිරීමෙහිදෝෂ.

487 සචිවඃ කිං ස මිත්‍රී වා ස ආදෞවෙව භූපතිම්
යුධොද්‍යොගං ස්වභූත්‍යාගං නිර්දිශත්‍යවිචාරිතම්.

සඃ, යමෙක්තෙම; ආදෞඑව, පළමුකොටම; භූපතිම්, රජ්ජුරුවන්ට; අවිචාරිතම්, පරීක්ෂාරහිතවූ; යුධඋද්‍යොගං, සටනෙහි උත්සාහයහෝ; ස්වභූත්‍යාගං, තමන්ගේ රටහැරයාමහෝ; නිර්දිශති, දක්වාද; සඃ, හෙ තෙම; කිංසචිවඃ, කෙසේ අමාත්‍යයෙක්වේද; වා, නොහොත්; මන්ත්‍රී, මන්ත්‍රියෙක්වේද.

සතුරන්හා සටන්කිරීමෙන් ජයලැබීමට උත්සාහ නොකටයුතුබව.

488 විජෙතුං ප්‍රයතෙතාරීන් න යුද්ධෙන කදාචන
අනිත්‍යො විජයො යස්මාද් දෘශ්‍යතෙ යුධ්‍යමානයොඃ,

යුද්ධෙන, සටන්කිරීමෙන්; අරීන්, සතුරන්; විජෙතුං, ජයලබන්ට; කදාචන, කිසිකලෙක්හි; නප්‍රයතෙත; උත්සාහ නොකරන්නේය යුධ්‍ය

මානයොඃ. සටන්කරනුලබන්නාවූ දෙපක්‍ෂයාගේ; විජයඃ, ජය; අනිත්‍යඃ, අනිත්‍යයයි; යස්මාත්දෘශ්‍යතෙ, යම්හෙයකින් දක්නාලැබේද (එහෙයින්).

සටන්කිරීමෙන් සතුරන් ජය ලබන්ට උත්සාහ නොකොට
සාමදානයයි ව්‍යවහාරවූ උපායාදියෙන් සතුරෝ
ජයගතයුත්තෝය යනබව

489 සාම්නා දානෙන භෙදෙන සමස්තෛරථ වා පෘථක්
සාධිතුං ප්‍රයතෙතාරීන් න යුද්ධෙන කදාචන.

පෘථක්, වෙන්වශයෙන්; සාම්නා, සාමදානයයි ව්‍යවහාරකරණලද උපායෙන්ද; දානෙන, වස්තුදීමෙන්ද; භෙදෙන, භෙදකිරීමෙන්හෝ; අථවා, නොහොත්; සමස්තෛඃ, සියල්ලෙන්හෝ; අරීන්, සතුරන්; සාධිතුං, ජයගන්ට; ප්‍රයතෙත, උත්සාහ කරන්නේය. යුද්ධෙන, යුද්ධකිරීමෙන්; කදාචන, කිසිකලෙක්හි; න, උත්සාහ නොකරන්නේය.

නොකරණලද සටන්ඇති සියල්ලන් ශූරබව.

490 සර්ව එව ජනඃ ශූරො හ්‍යනාසාදිතවිග්‍රහඃ
අදෘෂ්ටපරසාමර්ථ්‍යඃ සදර්පඃ නො භවෙන්න හි.

අනාසාදිතවිග්‍රහඃ, නොලබනලද සටන්ඇත්තාවූ; සර්වඃඑවජනඃ, සියලුජනතෙමේම; ශූරඃහි, ශූරමැයි. අදෘෂ්ටපරසාමර්ථ්‍යඃ, නොදක්නාලද සතුරන්ගේ සමර්ථබව ඇත්තාවූ; කඃ, කවරෙක්නම්; සදර්පඃ, අහංකාරසහිතවූයේ; නභවෙත්, නොවන්නේද.

දඬුවලින් කරණලද සිත්නැත්තාවූ යන්ත්‍රයෙන් ගල්ඔසවන්
නාක්මෙන් සිත්ඇත්තාවූ මිනිසුන්විසින් කළනො
හැකිබවහා මන්ත්‍රණයෙහි ප්‍රයොජන.

491 න තථොත්ථාප්‍යතෙ ග්‍රාවා ප්‍රාණිනා දාරුණා යථා
අල්පොපායෙ මහාසිද්ධිරෙතන්මන්ත්‍රඵලං මහත්.

දාරුණා, (සිත්නැත්තාවූ) දඬුයන්ත්‍රයෙන්; ග්‍රාවා, ගල්, යථාඋත්ථාප්‍යතෙ, යම්සේ ඔසවනුලැබේද; ප්‍රාණිනා, (සිත්ඇත්තාවූ) මිනිසුන්විසින්; තථා, එ පරිද්දෙන්; න. (එසවිය) නොහේ. අල්පඋපායෙ, මඳවූ උපායෙන්; මහාසිද්ධිඃ, මහත්වූ සිද්ධියවන්නිය. එතත් මන්ත්‍රඵලං, මේ මන්ත්‍රණයෙහි ප්‍රයොජන; මහත්, මහත්වේ.

සුදුසුකාලයෙහි කරන්නාවූ උත්සාහයෙන් ගොවීන් ශස්‍යඵල
ලබන්නාමෙන් නීතියෙන්ද බොහෝකාලයෙකින්
ඵ ල ලැ බෙ න බ ව.

492 යථා කාලකෘතොද්‍යොගාත් කෘෂිඃ ඵලවතී භවෙත්
තද්වන්නීතිරියං දෙව චිරාත් ඵලති න ක්‍ෂණාත්.

කෘෂිඃ, ගොවිතෙම; කාලකෘත, සුදුසුකාලයෙහි කරණලද්දාවූ; උද්‍යොගාත්, උත්සාහය හෙතුකොටගෙණ; ඵලවතී, ඵලඇත්තේ; යථා භවෙත්, යම්සේවන්නේද; තද්වත්, එසේම; දෙව, මහරජ; ඉයංනීතිඃ, මේ නීතිතොමෝ; චිරාත්, බොහෝකාලයෙකින්; ඵලති, ඵලදායක වන්නීය. ක්‍ෂණාත්, ඇසිල්ලෙකින්; න, ඵලදායක නොවන්නීය.

විපත්තියක් ඇතිකල්හි උත්තමයා ධීරත්වයට
පැමිණෙනබව.

493 මහතො දූරෙ භිරුත්වමාසන්නෙ ශූරතා ගුණඃ
විපත්තෞ හි මහාංල්ලොකෙ ධීරත්වමධිගච්ඡති.

දූරෙ, දුරුවූ ස්ථානයෙහි; (පැවතීමෙන්) මහතඃ, උත්තමයාගේ; (සමීපයෙන) භිරුත්වං, භයස්වභාවය; ගුණඃ, ගුණයවේ. ආසන්නෙ, සමීප ව පවත්නා තැනැත්තාකෙරෙහි; ශූරතා, ශූරභාවය; (ගුණයවේ) ලොකෙ, ලොකයෙහි; මහාන්, උත්තමතෙම; විපත්තෞහි, විපත්තියක් එළඹසිටි කල්හි වනාහි; ධීරත්වං, නුවණඇති බවට; අධිගච්ඡති, පැමිණේ.

කලකිරීම සියලු සමෘද්ධීන්ගේ ප්‍රධානවූ හානියබව.

494 ප්‍රත්‍යූහඃ සර්වසිද්ධීනාමුත්තාපඃ ප්‍රථමඃ කිල
අතිශීතලමප්‍යම්භඃ කිං භිනත්ති න භූතලම්.

උත්තාපඃ, භයහෝ කලකිරීම; සර්වසිද්ධීනාං, සියලු අභිවෘද්ධීන්ගේ; ප්‍රථමඃ, මුල්වූ; ප්‍රත්‍යූහඃකිල, විපත්තිකරන්නේවෙයි. අම්භඃ, ජලයතෙම; අතිශීතලංඅපි, අතිශයින් සිහිල්වූයේද; භූතලම්, පොළෝතලය; නභිනත්තිකිං, කෙසේ නොබිඳිද.

බලඇත්තක්හු හා සමග සටන් කටයුතුයයි උදාහරණයක්
නැ ති බ ව.

495 බලිනා සහ යොද්ධව්‍යමිති නාස්ති නිදර්ශනම්
න යුද්ධං හස්තිනා සාර්ධං නරාණාං පාදයුද්ධවත්.

බලිනාසහ, බලඇත්තක්හු හා සමග; යොද්ධව්‍යංඉති, යුද්ධකටයුතුය යි; නිදර්ශනම්, උදාහරණයෙක්; නාස්ති, නැත්තේය, පාදයුද්ධවත්, අත්

පාවලින් මාලකුඩයමෙන්; කූඩං, සටනාතෙම; හස්තිනාසාර්ධං, ඇතාහා සමග; නරණං, මිනිසුන්ට; න, උතුම්නොවේ.

කාලය නොපැමිණි සතුරකෙරෙහි පැවැත්ම නුසුදුසුබව.

496 ස මූඪඃ කාලමප්‍රාප්‍ය යොපකර්තරි වර්ත්තතෙ
කලිර්බලවතා සාර්ධං කීටපක්ෂොද්ගමො යථා.

කාලංඅප්‍රාප්‍ය, කාලය නොපැමිණ; යඃ, යමෙක්තෙම; අපකර්තරි, සතුරකෙරෙහි; වර්ත්තතෙ, පවතිද; සඃ, හෙතෙම; මූඪඃ, අඥනාවේ. බලවතාසාර්ධං, බලඇත්තාහා සමග; කලිඃ, විවාදය; කීට, කුහුඹු ආදීන්ගේ; පක්ෂොද්ගමඃයථා, පියාපත් හටගැණීමමෙන් (විනාශයපිණිස) වෙයි.

නීතියදන්නා තැනැත්තේ ඉදිබුවාගේ ශරීරයමෙන් හැකිලීමට
පැමිණි පහරද ඉවසන්නේය, සුදුසුකාලයෙහි
ක්‍රූරසර්පයකුමෙන් නැගීසිටින්නේය
ය නා බ ව.

497 කෞර්මං සංකොචමාස්ථාය ප්‍රහාරමපි මර්ෂයෙත්
ප්‍රාප්තකාලස්තු නීතිඥ උත්තිෂ්ඨෙත් ක්‍රූරසර්පවත්.

නීතිඥඃ, නීතිශාස්ත්‍රයදන්නා තැනැත්තේ; කෞර්මං, ඉදිබුවාගේ ශරීරය බඳුවූ; සංකොචං, හැකිලීමට; ආස්ථාය, පැමිණ; ප්‍රහාරංඅපි, පහරද; මර්ෂයෙත්, ඉවසන්නේය. ප්‍රාප්තකාලඃතු, පැමිණියාවූ කාලයඇති තැනැත්තේ; ක්‍රූරසර්පවත්, ක්‍රූරසර්පයකුමෙන්; උත්තිෂ්ඨෙත්, නැගීසිටිනේය.

නදියෙහිවූ ජලවෙගය වෘක්ෂහා තණද ඉදිරීමට පොහොසත්වන්නාමෙන් උපායදන්නා තැනැත්තාද උත්තමයා කෙරෙහිද
ක්ෂුද්‍රයා කෙරෙහිද සමර්ථවනබව.

498 මහත්‍යල්පෙප්‍යුපායඥඃ සමමෙව භවෙත් ක්ෂමඃ
සමුන්මූලයිතුං වෘක්ෂාන් තෘණානීව නදීරයඃ.

නදීරයඃ, නදියෙහිවූ ජලවෙගයතෙම; වෘක්ෂාන්, ගස්හා; තෘණානි; තෘණයන්ද; සමුන්මූලයිතුංඉව, ඉදිරීමට (පොහොසත්වන්නා) මෙන්; උපායඥඃ, උපායදන්නාවූ පුරුෂතෙම; මහති, උත්තමයාකෙරෙහිද; අල්පෙඅපි, ක්ෂුද්‍රයාකෙරෙහිද; සමංඑව, සමවම; ක්ෂමඃ භවෙත්, සමර්ථයෙක්වන්නේය.

ප්‍රාකාරයාගේ ප්‍රයොජන.

499 එකඃ ශතං යොධයති ප්‍රාකාරස්ථො ධනුර්ධරඃ
ශතං දශ සහස්‍රාණි තස්මාද්දුර්ගං විශිෂ්‍යතෙ.

ප්‍රාකාරස්ථඃ, ප්‍රාකාරයෙහි (කොට්ටුවෙහි) සිටියාවූ; එකඃධනුර්ධරඃ, දුන්නු ගත්තාවූ එකෙක්තෙම; ශතං යොධයති, සියයක් නසයි. ශතං, සියයද නොත්; දශසහස්‍රාණි, දශදහසක් (නසයි) තස්මාත්, ඒ කාරණයෙන්; දුර්ගං, කොට්ටුවක්තෙම (ප්‍රාකාරයක්) විධයතෙ, කරනුලැබේ.

කොට්ටුවක් හෙවත් ප්‍රාකාරයක්නැති ස්ථානය සතුරන්ට බලබව.

500 අදුර්ගවිෂයඃ කස්‍ය නාරෙඃ පරිභවාස්පදම්

අදුර්ගානාශ්‍රයො රාජා පොතච්‍යුතමනුෂ්‍යවත්.

අදුර්ගවිෂයඃ, කොට්ටුවක්නැත්තාවූ නුවරතෙම; කස්‍යඅරෙඃ, කවර සතුරකුගේ; පරිභව ආස්පදංන, පරාජයකිරීමට ස්ථානනොවේද; අදුර්ගාන්, ප්‍රාකාරරහිතවූ ස්ථානයන්; ආශ්‍රයඃ, ආශ්‍රයකරන්නාවූ; රාජා, රජතෙම, පොතච්‍යුත, නැවක්කෙරෙන් වැටුනාවූ; මනුෂ්‍යවත්, මිනිසකුමෙනි.

කොට්ටුවක්කරණ ක්‍රමය.

501 දුර්ගං කුර්‍ය්‍යාන්මහාඛාතමුච්චප්‍රාකාරසංයුතම්

සයන්ත්‍රජලශෛලං හි සරින්මරුවනාශ්‍රයම්.

සරිත්, නදීන්ද, මරු, ජලරහිත ප්‍රදෙශද; වනාශ්‍රයම්, වනද ආශ්‍රය කොට ඇත්තාවූ; සයන්ත්‍රජලශෛලං, ජලයන්ත්‍රහා පර්වතසහිතවූ; මහාඛාතං, මහත්පොකුණු ඇත්තාවූ; උච්චප්‍රාකාර සංයුතම්, උස්වූ ප්‍රාකාරයෙන් යුක්තවූ; දුර්ගංහි, කොට්ටුවක් වනාහි; කුර්‍ය්‍යාත්, කරන්නේය

කොට්ටුවකට අයිතිවනකාරණ සතෙක්,

502 විස්තීර්ණතාතිවෛෂම්‍යං රසධාන්‍යෙධ්මසංග්‍රහඃ

ප්‍රවෙශශ්චාපසාරශ්ච සප්තෛතා දුර්ගසම්පදඃ.

විස්තීර්ණතා, පුළුල්බවද; අතිවෛෂම්‍යං, අතිශයින් විෂමබවද; රස, ලුණුද, ධාන්‍ය, ධාන්‍යද; ඉධ්ම, දරද (යනමොවුන්ගේ) සංග්‍රහඃ, රැස්කිරීමද; ප්‍රවෙශශ්ච, ඇතුල්වන මාර්ගද; අපසාරඃච, නික්මෙන මාර්ගද; දුර්ගසම්පදඃ, කොට්ටුවකගේ සම්පත්තිහු; එතාඃසප්ත, මොහු සද්දෙනෙක් වෙත්.

ශාස්ත්‍රවන්තයෙක් නමුදු නොදන්නාලද ක්‍රියාවන්හි මුළාවෙ නබැවින් ඒ ඒ ක්‍රියාවන්හ දක්ෂයෝම ක්‍රියාවල්හි යෙදියුතුබව.

503 යො යත්‍ර කුශලඃ කාර්‍ය්‍යෙ තං තත්‍ර විනියොජයෙත්

කාර්‍ය්‍යෙෂ්වදෘෂ්ටකර්මා යො ශාස්ත්‍රඥොපි විමුහ්‍යති.

යත්‍රකාර්‍ය්‍යෙ, යම් කටයුත්තෙක්හි; යඃ කුශලඃ, යමෙක් දක්ෂද; තත්‍ර, ඒ කටයුත්තෙහි; තං, ඒ දක්ෂයා; විනියොජයෙත්, යොදන්නේද;

යඃ, යමෙක්තෙම; අදෘෂ්ටකර්මා, නොදක්නාලද ක්‍රියා ඇත්තේද (හෙතෙම) ශාස්ත්‍රඥඃඅපි, ශාස්ත්‍රදන්නෙක් නමුදු; කාර්‍යෙෂු, ක්‍රියාවල්හි; විමුහ්‍යති, මුළාවේ.

මුඛයෙහි තබණලද්දාවූ රත්නයක් දිවිරැකීම නොකරණබැවින් අනික් ද්‍රව්‍යයන් රැස්කිරීමට වඩා ධාන්‍ය රැස්කිරීම උතුම්බව.

504 ධාන්‍යානාං සංග්‍රහො රාජන්නුත්තමඃ සර්වසංග්‍රහාත්
නික්ෂිප්තං හි මුඛෙ රත්නං න කුර්‍යාත් ප්‍රාණධාරණම්.

රාජන්, මහරජ; සර්වසංග්‍රහාත්, සියලු ද්‍රව්‍යයන්ගේ රැස්කිරීමටවඩා; ධාන්‍යානාං සංග්‍රහඃ, ධාන්‍යයන්ගේ රැස්කිරීමතෙම; උත්තමඃ, උතුම්වේ. මුඛෙනික්ෂිප්තං, මුඛයෙහි තබනලද්දාවූ ;රත්නංහි, රත්නයතෙම; ප්‍රාණධාරණම්, ප්‍රාණයන්ගේ ඉසිලීම; නකුර්‍යාත් නොකරන්නේය.

ලුණු නැති ව්‍යඤ්ජනය ගොමහා සමානබැවින් අනික් රස වලට වඩා ලුණුරසය උතුම්ය යනබව.

505 ඛ්‍යාතඃ සර්වරසානාං හි ලවණො රස උත්තමඃ
ගෘහීතං තං විනා තෙන ව්‍යඤ්ජනං ගොමයායතෙ.

සර්වරසානාං, සියලු රසයන්ටවඩා; ලවණඃ රසඃහි, ලුණුරසය වනාහි; උත්තමඃ, උතුම්යයි; ඛ්‍යාතඃ, ප්‍රසිද්ධයි. තෙන, ඒ කාරණයෙන්; තං විනා, ඒ ලුණු නැතිව; ගෘහීතං, ගන්නාලද්දාවූ; ව්‍යඤ්ජනං, ව්‍යඤ්ජනය; ගොමයායතෙ, ගොමමෙන්වේ.

තමන්ගේ නෑයන්හැර අනුන්ට ඇළුම්වීමෙහි විපත්තිය දැක්වීම පිණිසයි.

506 ආත්මපක්ෂපරිත්‍යාගාත් පරපක්ෂෙ ච යො රතඃ
ස පරෛර්හන්‍යතෙ මූඪො නීලවර්ණශෘගාලවත්-

යඃ; යමෙක්තෙම; ආත්මපක්ෂපරිත්‍යාගාත්, තමන් පක්ෂයාගේ හැරීමෙන්; පරපක්ෂෙ, අනුන්ගේ පක්ෂයෙහි; රතඃ, ඇළුනේද; සඃමූඪඃ, ඒ අඥානතෙම; නීලවර්ණශෘගාලවත්, නීලවර්ණ සිවලාමෙන්; පරෛඃ, සතුරන්විසින් හන්‍යතෙ, නසනුලැබේ. *

* සිසි සිවලෙක් තමා කැමැත්තෙන් නුවරකගේ සමීපයෙහි ඇවිදිනේ නිල් වූ අවළියුෂ තිබුණාවූ භාජනයෙක්හි වැටුනේය. පසුව එයින් නැගියානොහි උද ය තමා මලළුවකෙක්මෙන් ප්‍රකාශකොට දුන්නේය. එකල්හි අවර්ශ්‍යෂභාජනාඅ

## බල්ලෙන් රජකළත් වහන්කන්නාමෙන් ඕවූනොවුන්ගේ ස්වභාවයෙන් පවත්නා කාරණයන් නොයික්මෙනබව.

507 යඃ ස්වභාවො හි යස්‍ය ස්‍යාත් තස්‍යාසෞ දුරතික්‍රමඃ
ශ්වා යදි ක්‍රියතෙ රාජා ස කිං නාශ්නාත්‍යුපානහම්.

යස්‍යහි, යමෙක්හුගේ වනාහි; යඃ ස්වභාවඃ, යම් ස්වභාවයෙක්; ස්‍යාත්, වන්නේද; තස්‍ය, ඕහුගේ; අසෞ, මේ ස්වභාවයතෙම; දුරතික්‍රමඃ, නොසික්මේ. ශ්වා, බලුතෙම; යදිරාජාක්‍රියතෙ, ඉදින් රජෙක් කරණුලැබේද; සඃ, හෙතෙම; උපානහම්, වහන; (සෙරෙප්පුව) කිංනාශ්නාති, කෙසේ නොකාද.

---

ස්ත්‍රියා විසින් මේ සිවලා ගසවාගෙණ දුරුවූ තැනකට ගොස් දමණලද්දේය. පසුව මේ සිවල්තෙම වනයටගොස් නිලවණ්වූ ශරීරඇති තමා දැක මමදැනට උතුම් වණ්ඇත්තෙමි එහෙයින් තමන්ගේ උතුම්බව කුමක්නිසා සිඩනොකරෙම්දැයි සිතුයේය. මෙසේ කියා සිවිලුන්කැඳවා පින්ඇත්තාවූ වන දෙවියා විසින් තමා අතින් වනයට අයිති රාජ්‍යයෙහි සියලු බෙහෙත් යූෂයෙන් මම අභිෂෙකකරණ ලද්දේය. මාගේ වණ්ය බලත්වා, එහෙයින් අදපටන් මාගේ අණවෙන් මේ වනයෙහි ව්‍යවහාර කටයුත්තාහුයයි සිවලාවිසින් කියනලද්දේය. සිවිල්හුද විසිතුරු වණ්ඇති ඔහුදැක අවතැනක්නැමීම් සහිතව වැඳ දේවයන්වහන්සේ යම්ලෙසකින් අණකෙරේද එසේකරම්හයි කීවෝය. මෙසේ මේ ක්‍රමයෙන් වනයෙහි වසන්නාවූ සියල්ලවුන්ගේ කෙරෙහි අධිපති භාවය ඔහටම වූයේය. පසුව ඔහුවිසින් තමාගේ නෑයන් විසින් ශරීර අවයවලින් අධිකබව සිඩකරණ ලද්දේය. පසුව ඔහුවිසින් සිංහදිවි ඈදිවූ උතුම් පිරිවර ජනයාත් ලැබ සිවිලුන් දැක ලජ්ජාවට පැමිණි නෑනෑයන් තමාගේ නෑයෝ නිග්‍රහකොට දුරුකරණ ලද්දාහුය. පසුව කලකිරෙණ ලද්දාවූ සිවිලුන්දැක මහලු සිවලකුවිසින් නොපි කලනොකිරෙව් නීතිශාස්ත්‍රය නොදන්නාවූ මොහුවිසින් මම්ස්වාමිදන්නාවූ අපි යම් කාරණයෙකින් නෙරපාකරණ ලද්දාහුද එහෙයින් යම් කාරණයෙකින් මේ තෙම මැරේද ඒ තෙම මාවිසින් කටයුතුය, මෙහි දිවිආදීහු වණ්ය පමණෙකින් රැවටුනාහු සිවලා බවක් නොදැනා මූ රජක්හුයයි යම් කාරණයෙකින් සිතද්ද එහෙයින් මොහු සිවිලායයි යම් කාරණයෙකින් දන්නා ලැබේද ඒ කාරණය කෙරෙත්වා. ඒ කාරණයෙහි මම යමක් කියම්ද එසේ පටන්ගත යුතුය. සියල්ලෝ සවස්කාලයෙහි ළඟට හුදුරු තැනෙක් හිසිට එක්වර මහවූ ශබ්දකරව්. එකල්හි ඒ ශබ්දයඅසා ජාතිස්වභාවය හේතුකොටගෙණ ඌ ද සිවිලුන්ට ශබ්දකටයුතුවේයි. එකල්හි ශබ්දයෙන් සිවලායයි දැනා දිවියාවිසින් මැරියයුතුවේයි කියනලද්දේය, එසේකළකල්හි මළේය.

තමන්ට අයිතිවූ සතුරා සිදුරුද මර්මස්ථානද ශක්තියද යන සියල්ල දන්නාබව.

508 ඡිද්‍රං මර්ම ච වීර්‍ය්‍යං ච සර්වං වෙත්ති නිජො රිපුඃ
දහත්‍යන්තර්ගතශ්චෛව ශුෂ්කං වෘක්ෂමිවානලඃ.

නිජඃ රිපුඃ, තමන්ට අයිතිවූ සතුරුතෙම; ඡිද්‍රං, සිදුරුද; මර්මච, මර්මස්ථානද; වීර්‍ය්‍යංච, වීර්‍ය්‍යයදයන; සර්වංවෙත්ති, සියල්ල දනී. අන්තර්ගතඃ ච, ඇතුළතවූද; අනලඃ, ගිනිතෙම; ශුෂ්කවෘක්ෂම්ඉව, වියළිගසක්මෙන්; දහතිඑව, දවාමය.

තියුණුවූ දූත ප්‍රයොගයෙන් නන්දුරජු මළබව.

509 නන්දං ජඝාන චාණක්‍යස්තීක්ෂ්ණදූතප්‍රයොගතඃ
තද්දූරාන්තරිතං දූතං පශ්‍යෙද්ධීරසමන්විතඃ.

චාණක්‍යඃ, චාණක්‍ය පණ්ඩිතතෙම; තීක්ෂ්ණ දූතප්‍රයොගතඃ, තියුණුවූ දූතප්‍රයොගයෙන්; නන්දං, නන්දරජ්ජුරුවන්; ජඝාන, මැරුයේය; තත්, ඒ කාරණයෙන්; වීරසමන්විතඃ, ශූරභාවයෙන් යුක්තවූ තැනැත්තේ; දූරාන්තරිතං, දුරුවූ මැද ප්‍රදෙශයඇත්තාවූ හෙවත් දුරුව සිටියාවූ; දූතං, දූතයා; පශ්‍යෙත්, දක්නේය.

නුවණැත්තන් නැතිතැන සභාව නොවෙයි යනාදිය.

510 න සා සභා යත්‍ර න සන්ති වෘද්ධා
වෘද්ධා න තෙ යෙ න වදන්ති ධර්මම්.
ධර්මඃ ස නො යත්‍ර න සත්‍යමස්ති
සත්‍යං න තද් යද් භයමභ්‍යුපෙති.

යත්‍ර, යම්තැනෙක්හි; වෘද්ධාඃ, නුවණැත්තෝ; නසන්ති, නැත්තාහු ද; සා, ඕතොමෝ; නසභා, සභානොවන්නීය. යෙ, යම්කෙනෙක්; ධර්මංනවදන්ති, ධර්මයනොකියද්ද; තෙ, ඔහු; නවෘද්ධාඃ, නුවණැත්තෝ නොවෙත්. යත්‍ර, යම්තැනෙක්හි; සත්‍යං, සත්‍යවචනය; නාඅස්ති, නැත්තේද; සඃ, හෙතෙම; නොධර්මඃ, ධර්මයනොවේ. යත්, යමක්තෙම; භයං, භයට; අභ්‍යුපෙති, පැමිණේද, තත්, ඒ තෙම; සත්‍යංන, සත්‍යයනොවේ.

දූතයෙක් ම්ලේච්ඡයෙක්වුවත් නොමැරියයුතුය යනබව.

511 දූතො ම්ලෙච්ඡොප්‍යවධ්‍යඃ ස්‍යාද්‍රාජා දූතමුඛො යතඃ
උද්‍යතෙෂ්වපි ශස්ත්‍රෙෂු දූතො වදති නාන්‍යථා.

යතඃ,'යම්කාරණයෙකින්; රාජා, රජතෙම; දූතමුඛඃ, දූතයාමමුඛකොට] ඇත්තේ; ස්‍යාත්, වන්නේද ඒ කාරණයෙන්; දූතඃ, දූතතෙම; ම්ලෙ

චර්‍ය්‍යාපි, මෙලෙච්ඡයෙක්වුයෙද; අබධ්‍යඃ, නොමැරියයුතුවේයි. ශස්ත්‍රෙෂු, ආයුධයන්; උද්ධෘතෙෂ්වපි, එසවූකල්හිද; දූතඃ, දූතතෙම; අන්‍යථා, අන්පරිද්දෙකින්; නවදති, නොකියා.

හැම්කල්හිම නොමැරියයුතුබැවින් දූතතෙම සියල්ලකියයි.

512 ස්වාපකර්ෂං පරොත්කර්ෂං දූතොක්තෛර්මන්‍යතෙ තු කඃ
සදෛවාබද්ධ්‍යභාවෙන දූතඃ සර්වං හි ජල්පති.

දූතොක්තෛඃ, දූතයාගේ කථාවලින්; ස්වාපකර්ෂං, තමා හීනකිරීමද; පරොත්කර්ෂං, අනුන් උතුම්කිරීමද; කඃතු, කවරෙක් වනාහි; මන්‍යතෙ, සිතාද; සදාඑව, හැමකල්හිම; අබධ්‍යභාවෙන, නොමැරියයුතුබැවින්; දූතඃහි, දූතතෙම වනාහි; සර්වං සියල්ල; ජල්පති, කථාකෙරේ.

ඒ ඒ පැවතුම්වලින් පිරිහෙන්නෝ සතරදෙනෙක්

513 අසන්තුෂ්ටා විජා නෂ්ටාඃ සන්තුෂ්ටාඃ පාර්ථිවාඃ සදා
සලජ්ජා ගණිකා නෂ්ටා නිර්ලජ්ජා ච කුලාඞ්ගනා.

අසන්තුෂ්ටාඃ, ලදදෙයකින් සතුටුනොවන්නාවූ; විජාඃ, බ්‍රාහ්මණයෝ; නෂ්ටාඃ, නැසුනෝය; සදා, හැමකල්හි; සන්තුෂ්ටාඃ, සතුටුවූ; පාර්ථිවාඃ, රජහු (නැසුනෝය), සලජ්ජා, ලජ්ජාසහිතවූ; ගණිකා, වෙශීතොමෝ; නෂ්ටා, නැසුනිය. නිර්ලජ්ජා, ලජ්ජානැත්තාවූ; කුලාඞ්ගනාච, කුලවත් ස්ත්‍රිද නැසුනිය.

මිත්‍රයන්හා ඇමතිආදීන්ගේ ශ්‍රද්ධාව තමාකෙරෙහි ස්ථිරමෙන් සතුරන්ට වෙෂඇතිකල්හි සටන්කළයුතුබව.

514 මිත්‍රාමාත්‍යසහායාශ්ච යදා ස්යුර්දෘඪභක්තයඃ
ශත්‍රූණාං විපරීතාශ්ච කර්තව්‍යො විග්‍රහස්තදා.

මිත්‍රාමාත්‍ය සහායාශ්ච, මිත්‍රයෝද අමාත්‍යයෝද අනුකූලයෝද යන මොහු; දෘඪභක්තයඃ, ස්ථිරශ්‍රද්ධාඇත්තාහු, ශත්‍රූණාං, සතුරන්ට; විපරීතාශ්ච, ඇළුම්නැතිවූවාහු; යදාස්‍යුඃ, යම්කලෙක්හි වෙද්ද; තදා, එකල්හි; විග්‍රහඃ, ඩබරයතෙම; කර්තව්‍යඃ, කටයුතු.

භූමිය මිත්‍රය රන්යන මෙය ස්ථිරවූකල්හි සටන්කරන්නේය යනබව.

515 භූමිර්මිත්‍රං හිරණ්‍යඤ්ච විග්‍රහස්‍ය ඵලං ත්‍රයම්
යදෛතන්නිශ්චිතං භාවි කර්තව්‍යො විග්‍රහස්තදා.

භූමිඃ, භූමියද; මිත්‍රං, මිත්‍රද; හිරණ්‍යඤ්ච, රන්ද; විග්‍රහස්‍ය, ඩබරයාගේ; ඵලංත්‍රයං, ඵලතුනෙකි; එතත්, මේ ඵලයතෙම; යදා, යම්කලෙක්හි; නිශ්චිතංභාවි, ස්ථිරවූයේවනා සුළුද; තදා, එකලහි; විග්‍රහඃ, ඩබරයතෙම; කර්තව්‍යඃ, කටයුතු.

සතුරන්ගේබල පරීක්ෂානොකොට වහා සටනට වදින්නන්
කඩු මුවඅග වැළඳගන්නාබව.

516 විශන්ති සහසා මූඪා යෙවිචාය්‍ය විෂද්බලම්
ඛඩ්ගධාරාපරිෂ්වඞ්ගං ලභන්තෙ තෙ සුනිශ්චිතම්.

යෙමූඪාඃ, යම් අඥානජනයෝ; විෂද්බලම්, සතුරන්ගේ බලය; අවිචාය්‍ය, පරීක්ෂා නොකොට; සහසා, වහා, විශන්ති, (සටන්බිමට) වද්දද; තෙ, ඔහු; සුනිශ්චිතම්, නියමයෙන්; ඛඩ්ගධාර පරිෂ්වඞ්ගං, කඩුමුව අග් වැළඳගැන්ම; ලභන්තෙ, ලබා.

බෙහෙත්දන්ම පමණින් රෝගශමනය නොවන්නාසේ
පටන්ගැන්ම නැතිකල්හි ශාස්ත්‍රදත් රජහුගේ
මන්ත්‍රණයෙන් ප්‍රයොජනනැතිබව.

517 කිං මන්ත්‍රණෙනානුෂ්ඨානෙ ශාස්ත්‍රවිත්පෘථිවීපතෙඃ
නහ්‍යෞෂධපරිඥානාද්ව්‍යාධෙඃ ශාන්තිඃ ක්වචිද්භවෙත්.

අනනුෂ්ඨානෙ, පටන්ගැන්මහෝ කටයුතුනැතිකල්හි; ශාස්ත්‍රවිත්, ශාස්ත්‍රදන්නාවූ; පෘථිවීපතෙඃ, රජහුගේ; මන්ත්‍රණ, රහස්මන්ත්‍රණයෙන්; කිං, ප්‍රයොජන නොවේ. ඖෂධපරිඥානාත්, ඖෂධදන්ම හෙතුකොටගෙණ; ව්‍යාධෙඃ, රෝගයාගේ; ශාන්තිඃ, සන්සිඳීමතොමෝ; ක්වචිත්, කිසිතැනෙක්හි; නහිභවෙත්, නොවන්නේය.

යානොහැකි ගංගා පර්වතවනාය යනාමෙකී භයඇතිතැන්හි
සෙනා සමූහයන්හා සමග ප්‍රධානීහු රජුන්විසින්
සටන්කාලයෙහි යැව්යයුතුබව.

518 නද්‍යද්‍රිවනදුර්ගෙෂු යත්‍ර යත්‍ර භයං නෘප
තත්‍ර තත්‍ර ච සෙනානීර්යායාද් ව්‍යූහීකෘතෛර්බලෛඃ.

නෘප, මහරජ; නද්‍යද්‍රිවනදුර්ගෙෂු, යානොහැකිවූ ගංගාපර්වතවනාය යනාමෙකී තැන්අතුරෙහි; යත්‍රයත්‍ර, යම්යම් තැනෙක්හි; භයං, භයද; තත්‍රතත්‍රච, එඑතැන්හිද; ව්‍යූහීකෘතෛඃ, රැස්කරණ ලද්දාවූ; බලෛඃ, සෙනාහා සමග; සෙනානීඃ, සෙනාගෙ ප්‍රධානීහු; යායාත්, යන්නේය.

සටන්පිණිස යන පිළිවෙළ.

519 බලාධ්‍යක්ෂඃ පුරෙ යායාත් ප්‍රවීරපුරුෂාන්විතඃ
මධ්‍යෙ කලත්‍රං ස්වාමී ච කොෂඃ ඵල්ගු ච යද්බලම්.

ප්‍රවීරපුරුෂාන්විතඃ, ශූරපුරුෂයන්හා යෙදුනාවූ; බලාධ්‍යක්ෂඃ, සෙනානායකතෙම; පුරඃ, ඉදිරියෙහිද; කලත්‍රං, දෙවියද; ස්වාමී, ස්වාමිද; කො

ෂඃච, ධනරශියද; එල්ගු, සාරවූ; බලංච. සෙනාවදනන; යත්, යමෙක් ඇද්ද ඒ තෙම; මධ්‍යෙ, මධ්‍යයෙහි; යායාත්, යන්නේය.

සංග්‍රාමයට යන පිළිවෙළ.

520 පාශ්වීයොරුභයොරශ්වා අශ්වානාං පාශ්වීතො රථාඃ
රථානාං පාශ්වීතො නාගා නාගානාඤ්ච පදාතයඃ.

උභයොඃ පාශ්වීයොඃ, දෙපාශ්වීයෙහි; අශ්වාඃ, අශ්වයෝද; අශ්වානාං, අසුන්ගේ; පාශ්වීතඃ, පාශ්වීයෙන්; රථාඃ, රථද; රථානාං, රථයන්ගේ; පාශ්වීතඃ, පාශ්වීයෙන්; නාගාඃ, ඇත්හුද; නාගානාංච, ඇතුන්ගේද පාශ්වීයෙන්; පදාතයඃ, පාබල සෙනගද;

සෙනාපතියා පසුවයායුතුබවහා රජ්හුගේ ගමන් විධානාදිය.

521 පශ්චාත් සෙනාපතිර්යායාත් ඛින්නානාශ්වාසයන් ශනෛඃ
මන්ත්‍රිභිඃ සුභටෛර්යුක්තඃ ප්‍රතිගෘහ්‍ය බලං නෘපඃ.

සෙනාපතිඃ, සෙනාපතිතෙම; ඛින්නාන්, දුකටපැමිණියවුන්; ආශ්වාසයන්, අස්වසන්නේ; ශනෛඃ, සෙමින්; පශ්චාත්යායාත්, පසුභාගයෙහි යන්නේය. මන්ත්‍රිභිඃ, අමාත්‍යයන් විසින්ද; සුභටෛඃ, මහායොධයන් විසින්ද; යුක්තඃ, යුක්තවූ; නෘපඃ, රජතෙම; බලංප්‍රතිගෘහ්‍ය, සෙනගගෙණ.

සටන් පිණිස විෂමභූමිආදියෙහි යනවිධිය.

522 සමෙයාද්විෂමං නාගෛර්ජලාඪ්‍යං සමහීධරම්
සමමශ්වෛර්ජලං නෞභිඃ සර්වත්‍රෛව පදාතිභිඃ.

ජලාඪ්‍යං. ජලයෙන් යුක්තවූ; සමහීධරං, පර්වතසහිතවූ; විෂමං, විෂමභූමිය; නාගෛඃ, ඇතුන් කරණකොටගෙණ; සමෙයාත්, යන්නේය. සමං, සමභූමිය; අශ්වෛඃ, අසුන් කරණකොටගෙණද; ජලං, ජලය; නෞභිඃ, නැව්වලින්ද; සර්වත්‍රඑව, සියලුතැන්හිම; පදාතිභිඃ, පාබලසෙනඟහා සමගද (යන්නේය).

වැසිකාලයෙහි ඇතුන්ගෙන්ද සෙසුකාලවල අශ්වයන්ගෙන්ද සියලු කාලයෙහි පාබලසෙනඟහාද යායුතුබව.

523 හස්තිනාං ගමනං ප්‍රොක්තං ප්‍රශස්තං ජලදාගමෙ
තදන්‍යත්‍ර තුරඞ්ගාණාං පත්තිනාං සර්වදෛව හි.

ජලදාගමෙ, වැසිකාලයෙහි; හස්තිනාං, ඇතුන්ගේ; ගමනං, ගමනද; තත්අන්‍යත්‍ර, එයින් අන්‍යවූ කාලයන්හි; තුරඞ්ගානාං, අශ්වයන්ගේද; සර්වදාඑවහි, සියලුකාලවලදීම; පත්තිනාං, පාබලසෙනාවගේද; (ගමන) ප්‍රශස්තං, ප්‍රශස්තයයි. ප්‍රොක්තං, කියනලද්.

රජ්ජුරුවන් රක්ෂාකටයුතුතැන්හා රජහුගේ නිදනවිධිය.

524 ශෛලෙෂු දුර්ගමාර්ගේෂු විධෙයං නෘපරක්ෂණම්

ස්වයොධෛරක්ෂිතස්‍යාපි ස්වපනං යොගනිද්‍රයා.

ශෛලෙෂු, පර්වතයන්හිද; දුර්ගමාර්ගේෂු, යානොහැකි මාර්ගයන්හිද; නෘපරක්ෂණම්, රජහුගේ රක්ෂාකිරීම; විධෙයං, කටයුතු; ස්වයොධෛඃ, තමාගේ යුධසෙවකයන් විසින්; රක්ෂිතස්‍ය අපි, රක්ෂාකරණලද රජහුගේද; යොගනිද්‍රයා, කපටනිද්‍රාවෙන්හෝ ස්වල්පනිද්‍රාවෙන්; ස්වපනං, නිද්‍රාවටපැමිණීම; (නිදාගැන්ම කටයුතු).

සතුරන් නසන ක්‍රමයහා පරදෙශයට වදින විධිය.

525 නාශයෙත් කර්ශයෙච්ඡත්‍රූං දුර්ගකණ්ටකමර්දනෛඃ

පරදෙශප්‍රවෙශෙ ච කුර්‍ය්‍යාදාටවිකාන් පුරඃ.

දුර්ගකණ්ටකමර්දනෛඃ, යානොහැකි විෂම ස්ථානය—තුඩුසතුරුය—මැඩීමය යන මෙයින්; ශත්‍රූං, සතුරා, නාශයෙත්, නසන්නේය. කර්ශයෙත්, අදනේය. පරදෙශප්‍රවෙශෙච, අන්‍යදෙශයට වැදීමෙහිද; ආටවිකාන්, වනමාර්ගයෙහි පුරුදුඇත්තවුන්; පුරඃකුර්‍ය්‍යාත්, ඉදිරිකරන්නේය.

ධනරාශිය රක්ෂාකටයුතුබවහා—සෙවකයන්ට ධනදියයුතුබව,

526 යත්‍ර රාජා තත්‍ර කොෂො විනා කොෂං න රාජතා

ස්වභෘත්‍යෙභ්‍යස්තතො දද්‍යාත් කො හි දාතුර්න යුධ්‍යතෙ.

රාජා, රජතෙම; යත්‍ර, යම්තැනෙක්හිද; කොෂඃ, ධනරාශිය; තත්‍ර, එහි වේ. කොෂංවිනා, ධනරාශියනැතිව; රාජතා, රජබවක්; න, නැත්තේය. තතඃ, ඒ කාරණයෙන්; ස්වභෘත්‍යෙභ්‍යඃ, තමාගේ සෙවකයන්ට; දද්‍යාත්, දෙන්නේය. දාතුඃ, දෙන්නාහට; කඃහි, කවරෙක්නම්; නයුධ්‍යතෙ, සටන්නොකෙරේද.

මනුෂ්‍යතෙම මනුෂ්‍යයාගේ දාසනොවෙයි එසේද ධනයට දාස

වෙයි ධනඇති නැතිබව හෙතුකොටගෙණ

උත්තමාධමබවවෙයි යනබව.

527 න නරස්‍ය නරො දාසඃ කිං නාථ විත්තස්‍ය භූපතෙ

ගෞරවං ලාඝවං චාපි ධනාධනනිබන්ධනම්.

නරස්‍ය, මනුෂ්‍යයාගේ; දාසඃ, දාසවූ; නරඃ, මනුෂ්‍යයෙක්; න, නැත්තේය. භූපතෙ, එම්බා මහරජ; කිංනාථ, කුමකට දාසවේද; විත්තස්‍ය, ධනයාගේ දාසවෙයි. ගෞරවං, ගෞරවියද; ලාඝවචඅපි, සැහැල්ලුබවද; ධනාධන නිබන්ධනම්, ධන ඇතිනැතිබව හෙතුකොටගෙණවෙයි.

ඕවුනොවුන් සමගිභාවයෙන්යෙදී සටන් කටයුතුබවහා රක්‍ෂා
කටයුතුබවද මහා සෙනාව සමූහයාගේ මධ්‍යයෙහි
රක්‍ෂාකටයුතුබව.

528 අභෙදෙන ච යුධ්‍යෙයු රක්‍ෂෙයුශ්ච පරස්පරම්
වලගුසෛන්‍යං ච යත්කිඤ්චිත්මධ්‍යෙ ව්‍යූහස්‍ය කාරයෙත්.

පරස්පරං, ඕවුනොවුන්; අභෙදෙනච, සමගිභාවයෙන් යුක්තව; යුධ්‍යෙයුඃ, සටන්කරත්තේය. රක්‍ෂෙයුඃච, රක්‍ෂාදකරත්තේය. යත්කිඤ්චිත් වලගුසෛන්‍යඤ්ච, යම්කිසි උතුම්සෙනාවක් ඇද්ද ඒ සෙනඟද; ව්‍යූහස්‍ය, සමූහයාගේ, මධ්‍යෙ, මධ්‍යයෙහි; කාරයෙත්, කරවත්තේය.

සෙනඟ යොදන ක්‍රමයහා සතුරන් වැළැක්විය යුතුබව.

529 පදාතිංශ්ච මහිපාලඃ පුරොනීකස්‍ය යොජයෙත්
උපරුධ්‍යාරිමාසීත රාෂ්ට්‍රං චාස්‍යොපපීඩයෙත්.

මහිපාලඃ, රජතෙම; අනීකස්‍ය, සෙනාවගේ; පුරඃ, ඉදිරියෙහි; පදාතීන්ච, පාබලසෙනඟද; යොජයෙත්, යොදන්නේය. අරිං, සතුරා; උපරුධ්‍ය, වළකා; ආසීත, හිඳිත්තේය. අස්‍ය, මේ සතුරාගේ; රාෂ්ට්‍රංච, රටද; උපපීඩයෙත්, පීඩාකරන්නේය.

සමභූමිආදි ඒ ඒ ස්ථානවල සටන්කරණ විධිය.

530 ස්‍යන්දනාශ්වෛඃ සමෙ යුධ්‍යෙදනූපෙ නෞද්විපෛස්තථා
වෘක්‍ෂගුල්මාවෘතෙ චාපෛරසිචර්මායුධෛඃ ස්ථලෙ.

සමෙ, සමභූමියෙහි; ස්‍යන්දනාශ්වෛඃ, රථහා අශ්වයන්ගෙන්ද; යුධ්‍යෙත්, සටන්කරත්තේය. අනූපෙ, ජලබහුලතැන්හි; නෞද්විපෛඃ, නැව්වලින්හා ඇතුන්ගෙන්ද; තථා, එසේම; වෘක්‍ෂගුල්මාවෘතෙ, ගස්හා වැල්වලින් වටකරණලද ස්ථානයෙහි; චාපෛඃ, දුනුවලින්ද; ස්ථලෙ, ගොඩතැන්හි; අසිචර්මායුධෛඃ, කඩුපලිස් ආයුධ යනාමෙයින්ද (යුධකරත්තේය.)

සතුරන් සන්තක ද්‍රව්‍ය විනාශකරණ විධිය.

531 දූෂයෙච්චාස්‍ය සතතං යවසාන්නොදකෙන්ධනම්
භින්ද්‍යාච්චෛව තඩාගානි ප්‍රාකාරාන් පරිඛාංස්තථා.

අස්‍ය, මේ සතුරුසෙනඟගේ; යවසාන්නොදකෙන්ධනම්, ධාන්‍ය—ආහාර—දිය—දරයනාමේ ද්‍රව්‍ය; සතතං, නිරන්තරයෙන්; දූෂයෙත්, දූෂ්‍යකරත්තේය. තඩාගානිචඑව, විල්ද; ප්‍රාකාරාන්, ප්‍රාකාරයන්ද; තථා, එසේම; පරිඛාන්, අගල්ද;] භින්ද්‍යාත්, බිඳිනේය.

රජහුගේ සෙනඟඅතුරෙන් ඇතා ප්‍රධානබැව්හා ඇතා සතුරන්
නසන්නාවූ ආයුධ අටකින් යුක්තබව.

532 බලෙෂු ප්‍රමුඛො හස්තී න තථාන්‍යො මහීපතෙඃ
නිජෛරවයවෛරෙව මාතඞ්ගොෂ්ටායුධඃ ස්මෘතඃ.

මහීපතෙඃ, රජහුගේ; බලෙෂු, සෙනඟඅතුරෙහි; හස්තී, ඇත්තෙම; ප්‍රමුඛඃ, මුල්වේ. තථා, එබඳුවූ; අන්‍යඃ, අන්‍යයෙක්; න, නොවේ. නිජෛඃ, තමා පිළිබඳවූ; අවයවෛඃඑව, (පාසතරද දළදෙකද සොඬදවා ලබියද යන) අවයවයන් කරණකොටගෙණම; මාතඞ්ගඃ. හස්තිතෙම; අෂ්ටායුධඃ, ආයුධ අටක් ඇත්තේයයි; ස්මෘතඃ, දන්නාලදී.

අශ්වසේනාව සිත්ඇත්තාවූ ප්‍රාකාරයක්හා සමානබැවින් බොහෝ
අශ්වයන් ඇත්තාවූ රජ්ජු ජයගන්නාබව,

533 බලමශ්වශ්ච සෛන්‍යානාං ප්‍රාකාරො ජඞ්ගමො යතඃ
තස්මාදශ්වාධිකො රාජා විජයී ස්ථලවිග්‍රහෙ.

යතඃ, යම් කාරණයෙකින්; සෛන්‍යානාං, සෙනඟඅතුරෙන්; අශ්වඃ බලංච, අශ්වබලයද; ජඞ්ගමඃ, සිත්ඇතිව ගමන්කරන්නාවූ; ප්‍රාකාරඃ, ප්‍රාකාරයෙක්වේද; තස්මාත්, ඒ කාරණයෙන්; අශ්වාධිකඃ, අශ්වයන් බහුලකොටඇති; රාජා, රජතෙම; ස්ථලවිග්‍රහෙ, ගොඩතැන්හි සටනෙහි; විජයී, ජයලබන සුලුවෙයි.

දුරසිටියාවූද සතුරන් හස්තගතවනබැවින් යුඬකරන්නාවූ අසුන්
නැඟුනාහු දෙවියන් විසිනුදු ජයගත නොහැකිබව.

534 යුධ්‍යමානා හයාරූඪා දෙවානාමපි දුර්ජයාඃ
අපි දූරස්ථිතා යෙෂාං වෛරිණො හස්තවර්ත්තිනඃ.

දූරස්ථිතාඃඅපි, දුරසිටියාවූද; වෛරිණඃ, සතුරෝ; යෙෂාං, යම්කෙනෙකුන්ගේ; හස්තවර්ත්තිනඃ, හස්තගතවේද්ද; (එහෙයින්) යුධ්‍යමානාඃ, යුඬකරණු ලබන්නාවූ; හයාරූඪාඃ, අසුන්නැඟුනාහු; දෙවානාංඅපි, දෙවියන්විසිනුදු; දුර්ජයාඃ, දිනියයුත්තාහු නොවෙත්.

සියලු සේනාවගේ රක්ෂාකිරීම යුඬකරණබව මුල්කොට ඇත්
තේය දිශාහා මාර්ගයන්ගේ ශුඬකරණබව පාබළ
සේනාවසඳහාද කටයුතුය යනබව.

535 ප්‍රථමං යුඬකාරිත්වං සමස්තබලපාලනම්
දිඞ්මාර්ගාණාං විශොධිත්වං පත්තිකර්ම ප්‍රචක්ෂතෙ.

සමස්තබලපාලනං, සියලු සෙනඟ රක්ෂාකිරීම; ප්‍රථමං, පළමුකොට; යුඬකාරිත්වං, යුඬකරණබවයි. දිඞ්මාර්ගාණාං, දිශාහා මාර්ගයන්ගේ; වි

ශොධිතත්වං, පිරිසිදුකරණබව; පත්තිකම්, පත්තිකර්මයයි; ප්‍රචක්ෂතෙ, කියා.

අතිශයින් ශ්‍රෙෂ්ඨවූ සෙනග.

536 ස්වභාවශූරමස්ත්‍රඥමවිරක්තං ජිතශ්‍රමම්.
ප්‍රසිද්ධක්ෂත්‍රියප්‍රායං බලං ශ්‍රෙෂ්ඨතමං විදුඃ.

ස්වභාවශූරම්, ස්වභාවයෙන් ශූරවූ; අස්ත්‍රඥම්, ආයුධ ශිල්ප දන්නාවූ; අවිරක්තම්, සතුටුවූ; ජිතශ්‍රමම්, පරදවනලද වෙහෙසඇත්තාවූ; ප්‍රසිද්ධක්ෂත්‍රිය ප්‍රායම්, ප්‍රශස්තක්ෂත්‍රියයන් බහුලකොට ඇත්තාවූ; බලම්, බලයතෙම; ශ්‍රෙෂ්ඨතමම්, අතිශයින් ශ්‍රෙෂ්ඨයයි; විදුඃ, දනිත්.

රජුවිසින් කරණලද ආදරය කරණකොටගෙණ ලොව මනුෂ්‍යයෝ යම් පරිද්දෙකින් සටන්කෙරෙද්ද බොහෝ ධන දුන්කල්හිද එසේ සටන් නොකරණබව.

537 යථා ප්‍රභූකෘතාන්මානාද්‍යුධ්‍යන්තෙ භුවි මානවාඃ
න තථා බහුභිර්දත්තෛර්ද්‍රවිණෛරපි භූපතෙ.

භූපතෙ, මහරජ; ප්‍රභූකෘතාත්, රජක්හුවිසින් කරණලද්දාවූ; මානාත්, ආදරය හෙතුකොටගෙණ; භුවි; ලොකයෙහි; මානවාඃ, මනුෂ්‍යයෝ; යථායුධ්‍යන්තෙ, යම්පරිද්දෙකින් යුධකෙරෙද්ද; දත්තෛඃ, දෙනලද්දාවූ; බහුභිඃඅපි, බොහෝවූද; ද්‍රවිණෛඃ, ද්‍රව්‍ය කරණකොටගෙණ තථා, එසේ; න, යුධනොකෙරෙත්.

බලනැත්තාවූ.බොහෝ:සෙනගටවඩා සාරවූ ස්වල්ප සෙනග උතුම්බව.

538 වරමල්පබලං සාරං න බහ්වී මුණ්ඩමණ්ඩලී
කුර්‍යාදසාරභඞ්ගො හි සාරභඞ්ගමපි ස්ඵුටම්.

සාරං, සාරවූ; අල්පබලං, ස්වල්පසෙනග; වරං, උතුම්වේ. බහ්වී, බොහෝවූද; මුණ්ඩමණ්ඩලී, සාරනුවූ සෙනෙග; න, උතුම්නොවේ, අසාරභඞ්ගඃහි, සාරනුවූ සෙනගගේ බිඳීමතෙම වනාහි; ස්ඵුටම්, ප්‍රකට වූ; සාරභඞ්ගංඅපි, සාරවූ සෙනගගේ බිඳීමද; කුර්‍යාත්, කරන්නේය.

සෙනගකෙරේ රජක්හුගේ කලකිරීම ප්‍රකාශවන කරුණු.

539 අප්‍රසාදොනධිෂ්ඨානං දෙයාංශහරණඤ්ච යත්
කාලයාපො ප්‍රතිකාරස්තත්‍ර වෛරාග්‍යකාරණම්.

අප්‍රසාදඃ, තමාගේ සෙනග කෙරෙහි රජහුගේ ප්‍රසන්නනැති බවද; අනධිෂ්ඨානම්, තමන් සෙනගගේ බලය ප්‍රකාශ නොකිරීමද; යත්, ය

විබඳුවූ; දෙශාංශහරණක්‍ෂව, දියයුතු වැටුප්ආදී කොඨාශනොදීමද; කාලක්‍ෂෙපඃ, වියදමදීමට නියමවූ කාලය ඉක්මීමද; අප්‍රතිකාරඃ, සෙනඟ ඔවුනොවුන් බිඳුනු කල්හි ඒ බිඳීම නොවැළැක්වීමද; තත්‍ර, ඒ පිරිසකෙරෙහි; වෛරාග්‍යකාරණම්, නොඇලීමට කරුණුයි.

ජයගන්නා කැමැත්තාගේ පැවතුම්හා සුවසේ ජයගතහැකි

සෙ න ඟ.

540 අපීඩයන් බලං ශත්‍රූන් ජිගීෂුරභිෂෙණයෙත්
සුඛසාධ්‍යං ද්විෂාං සෛන්‍යං දීර්ඝප්‍රයාණපීඩිතම්·

ජිගීෂුඃ, ජයකැමැති තැනැත්තේ; බලම්, තමන්ගේ සෙනඟට; අපීඩයන්, පීඩානොකරන්නේ; ශත්‍රූන්, සතුරන්; අභිෂෙණයෙත්; සෙනඟහා සටන්පිණිස අභිමුඛයට යවන්නේය. දීර්ඝප්‍රයාණ පීඩිතම්, දීර්ඝවූ ගමනින් වෙහෙසුනාවූ; ද්විෂාම් සෛන්‍යම්, සතුරන්ගේ සෙනඟ; සුඛසාධ්‍යම්, සුවසේ පරාජය කටයුතුවේ.

සතුරන් භෙදකිරීමට පොහොසත්හු.

541 දායාදාදපරො මන්ත්‍රී නාස්ති භෙදකරො ද්විෂාම්
තස්මාදුත්ථාපයෙද්‍යත්නාද්දායාදං තස්‍ය විද්විෂඃ.

දායාදත්, ඥාතීහුකෙරෙන්; අපරඃ, අන්‍යවූ; ද්විෂාම්, සතුරන්ගේ; භෙදකරඃ, බිඳීම කරන්නාවූ; මන්ත්‍රී, ඇමතියෙක්; නාස්ති, නැත්තේය. තස්මාත්, එහෙයින්; තස්‍යවිද්විෂඃ, ඒ සතුරුහුගේ; දායාදම්, ඥාතියක්හු; යත්නාත්, උත්සාහයෙන්; උත්ථාපයෙත්, නගාසිටුවන්නේය.

භෙදකරණ විධිය.

542 සන්ධාය යුවරාජෙන යදි වා මුඛ්‍යමන්ත්‍රිණා
අන්තඃ ප්‍රකොපනං කාර්‍ය්‍යමභියොක්තුඃ ස්ථිරාත්මනඃ.

යුවරාජෙන, යුවරජ්ජුරුවන් සමගහෝ; යදිවා, නොහොත්; මුඛ්‍යමන්ත්‍රිණා, ප්‍රධාන අමාත්‍යයාහා සමග; සන්ධාය, මිත්‍රව; ස්ථිරාත්මනඃ, ස්ථිර සිත්ඇති; අභියොක්තුඃ, වධනියොග කරන්නාහුගේ; අන්තඃ, සිත; ප්‍රකොපනං, කොපය; කාර්‍ය්‍යම්, කටයුතු.

සතුරන්ට පීඩාකරණ විධිය.

543 ක්‍රූරං මිත්‍රං රණෙ චාපි භඞ්ගං දත්වාභිඝාතයෙත්
අථ වා ගොග්‍රහාකෘෂ්ටාත්තන්මුඛ්‍යාශ්‍රිතබන්ධනාත්.

ක්‍රූරංමිත්‍රං, රළුවූ මිත්‍රයා; රණෙ, යුධභූමියෙහි; භඞ්ගං, බිඳීම; දත්වාපි ච, දීද; අථවා, නොහොත්; ගොග්‍රහආකෘෂ්ටාත්, ගවයන්ගැණීමෙන්

ද; තත් මුඛ්‍යආශ්‍රිත බන්ධනාත්, ඔවුන්ට ප්‍රධානවූ ආශ්‍රයකරණලද්දන් බන්ධනගතකිරීමෙන්ද; අභිඝාතයෙන්. පීඩාකරන්නේය.

රජතුමා විසින් තමන් රටවැස්සන් සතුටුකරණ විධිය.

544 සම්‍යග්ගුප්තං වාසයෙද්‍රජා පරදෙශාපහාරණාත්

අථ වා දානමානාභ්‍යාං වාසිතං ධනදං හි තත්.

රාජා, රජතෙම; පරදෙශඅපහාරණාත්, සතුරන්ගේ දෙශයෙහි ද්‍රව්‍ය පැහැරගැන්මෙන්; සම්‍යග්ගුප්තම්, සියරට; වාසයෙත්, සතුටුකරන්නේය. අථවා, නොහොත්; දානමානාභ්‍යාම්, දීමය ආදරයයන දෙකින්; වාසිත ම්, සතුටුකරණ ලද්දේය. තත් හි, ඒ වනාහි; ධනදම්, ධනදීමයි.

නීතිශාස්ත්‍රයෙහි කරුණු දෙක.

545 ආත්මොදයඃ පරජ්‍යානිද්වයං නීතිරිතීයතී

තදූරීකෘත්‍ය කෘතිභිර්වාචස්පත්‍යං ප්‍රතායතෙ.

ආත්මඋදයඃ, තමාගේ වැඩීමද; පරජ්‍යානිඃ, අනුන්ට හානිකිරීමදය න; ද්වයං, දෙක; නීතිරිතියතී, නීතියයි කියනුලැබේ. තත්, ඒ නීති ය; ඌරීකෘත්‍ය, අයිතිකොට; කෘතිභිඃ, උත්සාහයන්හා සමග; වාචස්ප ත්‍යම්, වාගසපතිය; ප්‍රතායතෙ, රක්ෂාකෙරේ.

ශාස්ත්‍ර නියමය නැත්තාවූ බලය ප්‍රශස්තනොවනබව.

546 අන්‍යදුච්ඡෘඞ්ඛලං සත්ත්වමන්‍යච්ඡාස්ත්‍රනියන්ත්‍රිතම්

සාමානාධිකරණ්‍යං හි තෙජස්තිමිරයොඃ කුතඃ.

උච්ඡෘඞ්ඛලං, ශාස්ත්‍රනියමය නැත්තාවූ; සත්ත්වම්, බලය; අන්‍යත්, අනි කෙක; ශාස්ත්‍රනියන්ත්‍රිතම්, ශාස්ත්‍රයෙන් බඳනාලද්දාවූ බලය; අන්‍යත් අනිකෙක; තෙජස්තිමිරයොඃ, ආලොක අන්ධකාරදෙදෙනාගේ; සා මානාධිකරණ්‍යංහි, සමානවූ උපුලනබවක් වනාහි; කුතඃ, කො සින්ද.

අන්‍යවශී ඇත්තක්හුනමුදු හිතඇතිකල්හි නෑබවහා නෑසාද හිතනැති කල්හි අන්‍යවශී ඇත්තකුවනබව.

547 පරොපි හිතවාන් බන්ධු බන්ධුරප්‍යහිතඃ පරඃ

අහිතො දෙහජො ව්‍යාධිර්හිතමාරණ්‍යමෞෂධම්.

පරඃඅපි, අන්‍යයෙක්නමුදු; හිතවාන්, හිතඇත්තේ හෙවත් වැඩඇත් තේ; බන්ධුඃ, නෑයෙක්වේ. බන්ධුඃඅපි, නෑයෙක්නමුදු; අහිතඃ, වැඩ නැත්තේ; පරඃ, අන්‍යයෙක්වේ. දෙහජඃ, ශරීරයෙහි උපදනාවූ; ව්‍යා ධිඃ, රොගයතෙම; අහිතඃ, වැඩනැත්තේවේ. ආරණ්‍යං, වනයෙහි හට ගන්නාවූ; ඖෂධම්, ඖෂධය; හිතම්, හිතවේ.

ශුද්‍රක රජහට; වීරවරනම් සේවකයාගේ පුත්‍රයා දුන්බව.

518 ආසීද්වීරවරො නාම ශුද්‍රකස්‍ය මහීපතෙඃ

සෙවකඃ ස්වල්පකාලෙන ස දදෞ සුතමාත්මනඃ.*

ශුද්‍රකස්‍ය මහීපතෙඃ, ශුද්‍රකරජහුගේ; වීරවරඃ නාම, වීරවරනම්වූ; සෙවකඃ ආසීත්, සේවකයෙක්වූයේය. සඃ, ඒ සෙවකතෙම; ස්වල්පකාලෙන, මඳකාලයෙකින්; ආත්මනඃ, තමාගේ; සුතම්, පුත්‍රයා; දදෞ, දුන්නේය. *

---

* පූර්වකාලයෙහි ශුද්‍රකනම් රජහුගේ නුවරක්වූයේය. වීරවරනම් රාජපුත්‍රයෙක් කිසිදෙශයකින් එහි අවුත් රජගෙය දොරටුවෙහි වාරපාලකයාහට එලඹ මම ජීවත්වීමට උපායක් සොයන්නාවූ රාජපුත්‍රයෙක්වෙමි රජහට මා දක්වීම කරවයි කීයේය. එකල්හි ඔහුවිසින් රජහුගේ දක්වීම කරවන ලද්දාවූ ඒ රාජපුත්‍රතෙම මහරජ සෙවකවූ මාගෙන් ප්‍රයොජනඇත්තේද ඒකල්හි මට වියදම් නියමයක රණ්ඩුලැබෙව්වයි කීයේය. තට වියදම් කොතෙක්දැයි ශුද්‍රකරජතෙම කීයේය. දවසක් පාහා රන් සාරසියයක් වියදම් දුනමැනවැයි වීරවරවිසින් කියනලද්දේය. තාගේ ද්‍රව්‍යයෝ කවරහුදැයි රජතෙම විචාළේය. අත්දෙකද කඩුව තුන්වෙනි ද්‍රව්‍යයයි වීරවරතෙම කීයේය. මේ වියදමදීම නොහැකියයි රජතෙම කීයේය. වීරවරතෙම ඒ වචනයඅසා රජහට වැඳගියේය. එකල්හි අමාත්‍යයන් විසින් දෙවයන්වහන්ස දිනසතරකගේ වියදමදී කුමක්ද මේතෙම සුදුසුවූයේ මෙපමණ වියදමකණීද නොහොත් නුසුදුසුවූයේ කණීදැයි තමාහුගේ ස්වරූපයදන්නා ලැබෙව්වයි කියනලද්දේය. එකල්හි අමාත්‍යයන්ගේ වචනයෙන් කැඳවා බුලත්දී ඒ වියදම දුන්නේය. වියදම් ක්‍රියාවෙහි නියොගකිරීමද රජ්ජුවිසින් මිනිසුන් නැතිතැනෙක්හිසිට සොයනලද්දේය. ඒ වියදමින් අඩියක් වීරවරවිසින් දෙවියන්ටද බ්‍රාහ්මණයන්ටද දෙනලද්දේය. තිබුනු අඩියාගේ කොටසක් දුකටපැමිණියවුන්ටදදී එයින් ඉතිරිවූභාගය අනුභවකටයුතු ද්‍රව්‍ය වියදම් වශයෙන්ද සඳුවිවියදම් වශයෙන්ද නිතර කටයුතුවූ මේ සියල්ලකොට කඩුගත් අත්ඇත්තේ රජගෙය දොරටුවෙහි රෑදවල්දෙක්හි සෙවයකෙරෙයි. යම්වේලෙක්හි රජතෙම තෙමේම අණකෙරේද එකල්හි තමාගේ ගෙවදයෙයි. පසුව කළුවර පක්ෂයෙහි තුදුස්වනදින රාත්‍රියෙහි දයානුවිතවූ අඬන්නාවූ ශබ්දයක් රජතෙම ඇසුයේය. ඒ අසා රජතෙම කවරෙක්ද කවරෙක් දොරටුවෙහි සිටින්නේදැයි විචාළේය. එකල්හි ඔහුවිසින් දෙවයන්වහන්ස මම වීරවරයයි කියනලද්දේය. රජතෙම ඇඬීම අනුව ගමනකරණු ලැබෙව්වයි කීයේය. වීරවරද දෙවයන්වහන්සෙ යම්සේ අණකෙරේද ඒ කටයුතුයයි කියා ගියේය. මේ රාජපුත්‍රතෙම කටුඇනියයුතුවූ අන්ධකාරයෙහි තනිව මාවිසින් හරිනලද්දේය ඒ නුසුදුසුවෙයි එහෙයින් මමද ගොස් මේ කුමක්දැයි සොයමියි රජ්ජුවිසින් සිතනලද්දේය. ඉක්බිත්තෙන් රජද කඩුවගෙණ පසුපස්සෙහි යන ක්‍රමයෙන් නුවර දොරටුවකෙරෙන් පිටතට නික්මුනේය. ඉක්බිත්තෙන් වීරවර විසින් ගොස් හඬන්නාවූ රූපයෞවනශොභාවෙන්හා තරුණ අවස්ථාවෙන්ද යුක්තවූ සියලු ආභරණයෙන් සෑ

බුලතගේ ගුණ තෙළෙස.

549 තාම්බූලං කටුතිත්තමිශ්‍රමධුරං ක්ෂාරං කෂායාන්විතං
වාතඝ්නං කඵනාශනං කෘමිහරං දෞර්ගන්ධ්‍යදෝෂාපහම්.
වක්ත්‍රස්‍යාභරණං මලාපහරණං කාමාග්නිසන්දීපනං
තාම්බූලස්‍ය සඛෙ ත්‍රයෝදශ ගුණාඃ ස්වර්ගේප්‍යමී දුර්ලභාඃ,

තාම්බූලම්, බුලත්; කටු, කුළුරසද; තික්ත, තිත්තරසද; මිශ්‍ර, මිශ්‍රරසද; මධුරම්, මිහිරි රසදවෙයි, ක්ෂාරම්, ලුණුරසවෙයි. කෂාය අන්විතම්, කෂටරස යුක්තවෙයි. වාතඝ්නම්, වාතය නසයි; කඵනාශනම්, සෙම නසයි; කෘමිහරම්, පණුවන් නසයි; දෞර්ගන්ධ්‍ය දෝෂාපහම්, දුර්ගන්ධදෝෂය දුරුකෙරෙයි; වක්ත්‍රස්‍ය, මුඛයට; ආභරණම්, ආභරණයෙක්වෙයි; මලාපහරණම්, මලපහකෙරෙයි; කාමාග්නිසන්දීපනම්, කාමගින්න වඩයි; සඛෙ, මිත්‍රය; තාම්බූලස්‍ය, තාම්බූලයාගේ; ත්‍රයෝදශගුණාඃ, ගුණ තෙළසක්වෙත්. අමී, මොහු; ස්වර්ගේපි, දෙව්ලොවද; දුර්ලභාඃ, ලද නොහෙත්,

---

රඳුනාවූ ක්ෂිති සත්‍රියක් දක්නාලද්දීය. හි කවරක්ද කුමක්සඳහා හඬන්නීදැයි විචාරණලද්දී මම එක්තර ශුද්‍රක රජක්හුගේ ශ්‍රීකාන්තාවෙමි බොහෝකාලයක් මේ රජහුගේ අත්සෙවනෙහි මහත් සැපතින් සැනසිමි දෙවියගේ අපරාධයෙන් තුන්වෙනි දිනයෙහි රජතෙම මරණයට පැමිණෙන්නේය. මම අශරණවන්නෙමි, දුක් නොසිටිමියි හඬමියනු සත්‍රිය විසින් කියනලද්දේය. පින්ඇත්තියගේ නැවත මෙහි විසීම කෙසේවේදැයි විරවරතෙම කීයේය. ඉදින් තෝ ලක්ෂණ දෙතිසකින් යුක්තවූ ශක්තිධරයනනාම්ඇති තමන්පුත්‍රයාගේ ඉසතමා අතින්කපා පින්ඇත්තාවූ ශ්‍රීකාන්තාවට පූජාකෙරෙහිනම් එකල්හි රජතෙම සියක් අවුරුදු ආයුෂ ඇතිවන්නේය මම් සැපසේ වසමියි මෙසේ කියා නොපෙණෙන්නීවිය. ඉන්පසු විරවරවිසින් තමන්ගෙටගොස් නිද්‍රාවටපැමිණි අඹුවද පුත්‍රද නින්දෙන් පුබුදුකරණලද්දීය. ඔවුන්දෙදෙන නිද්‍රාවහැර සමීපයට පැමිණියෝය. විරවරතෙම ශ්‍රීකාන්තාවගේ ඒ සියලු වචන කීයේය. ඒඅසා ශක්තිධරනම් පුත්‍රතෙම සන්තොෂසහිතව ස්වාමිහුගේ රාජ්‍යය රක්ෂාකිරීම සඳහා සමක්හුගේ ආහාර වෙම්ද මෙබඳුවූ මම පින්ඇත්තෙම් පියානනි දූත් පමාව කුමක්ද කිසිකලෙක්හි වනාහි මෙබඳු ක්‍රියාවෙක්හි මේ දෙහයාගේ පරිත්‍යාගය පූජ්‍යවෙයි කීයේය. ශක්තිධරයාගේ මව්තොමෝ අපගේ ගොත්‍රයට සුදුසුවෙයි ඉදින් එසේ නොකවයුතුනම් එකල්හි ගනාලද රජහුගේ වියදම් ද්‍රව්‍යයාගේ නිදහස්වීම කෙසේවේදැයිකීය. මෙසේකියා සියල්ලෝ ශ්‍රීකාන්තාවගේ ස්ථානයට ගියෝය. එහි ශ්‍රීකාන්තාවට පූජාකොට විරවරතෙම දෙවිය සතුටුවව ශුද්‍රක මහරජතෙම ජයගණීවා මේ බිලිය ගන්නාලැබෙවයි කීයේය. මෙසේකියා පුත්‍රයාගේ ඉසකැපූයේය. ඉන්පසු විරවරතෙම ගන්නාලද රජහුගේ වියදම් ද්‍රව්‍යයාගේ නිදහස කරණලද්දේය. දූත් පුත්‍රයා නැත්තාවූ ජීවි

කුඩාසත්වයන්ගේ ඉපදීම්හා මැරීම.

550 ජීවන්ති ච ම්‍රියන්තෙ ච මද්විධාඃ ක්ෂුද්‍රජන්තවඃ
අනෙන සදෘශො ලොකෙ න භූතො න භවිෂ්‍යති.

මද්විධාඃ, මාවැනිවූ; ක්ෂුද්‍රජන්තවඃ, කුඩාසත්වයෝ; ජීවන්තිච ජීවත්දවෙත්; ම්‍රියන්තෙච, මියදයෙත්; අනෙනසදෘශඃ, මොහුහා සමානවූවෙක්; ලොකෙ, ලොකයෙහි; නභූතඃ, පෙරනූවූයේය; නභවිෂ්‍යති, මතු නොවන්නේය.

ප්‍රියකථා ඇත්තෝද ආත්මවර්ණනාව නොකරන්නෝද මනාවූ
අයවලට දෙන්නෝද මධුරනුවූ වචනඇත්තෝද
ය න මො හු.

551 ප්‍රියංබ්‍රූයාදකෘපණඃ ශූරඃ ස්‍යාදවිකත්ථනඃ
දාතා සත්පාත්‍රවර්ෂී ස්‍යාත් ප්‍රගල්භඃ ස්‍යාදනිෂ්ඨුරඃ.

අකෘපණඃ, ලොභනුවූහෝ දිළිඳුනුවූ තැනැත්තේ; ප්‍රියං, සිතට ප්‍රියවූ වචනය; බ්‍රූයාත්, කියන්නේය. ශූරඃ, ශූරවූ පුරුෂතෙම; අවිකත්ථනඃ, තමාගේ වර්ණනාව නොකරන්නෙක්; ස්‍යාත්, වන්නේය. දාතා, දෙනසුළුභාඇති තැනැත්තේ; සත්පාත්‍රවර්ෂී, සත්පුරුෂයන්ට දෙන්නෙක්; ස්‍යාත්, වන්නේය; ප්‍රගල්භඃ, කපටිවූ තැනැත්තේ; අනිෂ්ඨුරඃ, අමධුරවචන ඇත්තෙක්; ස්‍යාත්, වන්නේය.

---

ත්විමභාෂ්‍යයට කරුණක්යයි සිතුයේය. මෙසේකියා තමන්ගේ ඉසකැපුයේය. ස්වාමියාගේද පුත්‍රයාගේද ශොකයෙන් පීඩිතවූ ස්ත්‍රියවිසින්ද එසේකරණලද්දේය—මේ සියල්ලදැක අසාද රජතෙම ආශ්චර්‍ය්‍ය සහිතවූ කාරණය සිතුයේය. මාවැනිවූ කුඩාසත්වයෝ ජීවත්වෙත් මියදෙයෙත්. මොහුහා සමානවූවෙක් ලොකයෙහි පෙරනූවූයේය, මතුද නොවන්නේය. මොහුගෙන් තොරවූ රාජ්‍යයෙන්ද ප්‍රයොජන නොවෙයි කියා ශුද්‍රක රජ්ජුවිසින්ද තමන්ඉස සිඳීම පිණිස කඩුව ඔසවනලද්දේය. එකල්හි පෙණීසිටියාවූ පින්වත් ශ්‍රීකාන්තාව විසින් රජතෙම අතෙහි අල්වාගන්නාලද්දේය. පුත්‍රය රෞද්‍රවූ ක්‍රියාව සුදුසුනොවෙයි. දූත් තාගේරාජ්‍ය භෙදයෙක් නැත්තේයයි කියනලද්දේය. ඒඅසාරජතෙම අෂ්ටාංගයසහිතවවැදදෙවිය මාගේ රාජ්‍යයෙන්හෝ ජීවිතයෙන්හෝ සම්පත්තියෙන්හෝ ප්‍රයෝජනයෙක් නැත්තේය, ඉදින් මට අනුකම්පාකරන්නු ලැබේද. එකල්හි මාගේ ආයු ඉතිරිවීමෙන්ද අඹුදරුවන් සහිතවූ මේරාජපුත්‍රතෙම ජීවත්වේවා එසේ නොවීනම් මම මරණයට පැමිණෙම්යි කීයේය. ශ්‍රීකාන්තා තොමෝ තාගේ මේ උත්කෘෂ්ටවූ සත්‍යයෙන්ද සෙවකයාකෙරෙහි ඇත්තාවූ සෙනහයෙන්ද සියලු ප්‍රකාරයෙන් සතුටුවෙමි, තොපියවිජයඇත්තේවව, පිරිවර සහිතවූ මේ රාජපුත්‍රද ජීවත්වේවා යනුකීය. නැවත අඹුදරුවන් සහිතවූ වීරවරතෙම ලද්දවූ ජීවිතය ඇත්තේ තමාගේ ගෙටගියේය,

රජහුගේ කැමැත්ත නියායෙන් නොකටයුත්ත කටයුත්තක් මෙන් දක්වා අනුශාසනා කරන්නා ඇමතියකු නොවනබව.

552 යෝකාර්‍ය්‍යං කාර්‍ය්‍යවච්ඡාස්ති ස කිං මන්ත්‍රී නෘපෙච්ඡයා
වරං ස්වාමිමනොදුඃඛං තන්නාශො න ත්වකාර්‍ය්‍යතඃ.

නෘපෙච්ඡයා, රජහුගේ කැමැත්ත නියායෙන්; යඃ, යමෙක්තෙම; අකාර්‍ය්‍යම්, නොකටයුත්ත; කාර්‍ය්‍යවත්, කටයුත්තක්මෙන්; ශාස්ති, අනුශාසනාකෙරේද; සඃ, හෙතෙම; කිංමන්ත්‍රී, කෙබඳුනම් ඇමතියෙක්වේද; ස්වාමි, ස්වාමියාගේ; මනොදුඃඛම්, සිත්හි දුක; වරම්, උතුම්වේ- අකාර්‍ය්‍යතඃ, නොකටයුතු කාරණය හෙතුකොටගෙණ; තන්නාශඃතු, ඔහුගේ නැසීම වනාහි; න, උතුම්නොවේ.

රජහට ප්‍රියවචන නොකියයුත්තෝ.

553 වෛද්‍යො ගුරුශ්ච මන්ත්‍රී ච යස්‍ය රාඥඃ ප්‍රියංවදඃ
ශරීරධර්‍මකොශෙභ්‍යඃ ක්ෂිප්‍රං ස පරිහීයතෙ.

යස්‍යරාඥඃ, යම්රජක්හට; වෛද්‍යඃ, වෙදුහෝ; ගුරුඃච, ආචාර්‍ය්‍යයෝ; මන්ත්‍රීච, ඇමතියාහෝ; ප්‍රියංවදඃ, ප්‍රියවචන කියද්ද; සඃ, ඒ රජතෙම; ශරීරධර්‍මකොශෙභ්‍යඃ, ශරීරය—ධර්‍මය—ධනය යන මොවුන්කෙරෙන්; ක්ෂිප්‍රම්, වහා; පරිහීයතෙ, පිරිහෙනුලැබේ.

කථාවකගේ මාතෘකා ශ්ලෝකයෙක්.

554 පුණ්‍යාල්ලබ්ධං යදෙකෙන තන්මමාපි භවිෂ්‍යති
හත්වා භික්‍ෂුං යතො මොහාන්නිධ්‍යර්ථී නාපිතො මෘතඃ.

පුණ්‍යාත්, කුශලය හෙතුකොටගෙණ; එකෙන, එකෙක්හු විසින්; යත්ලබ්ධං, යමක් ලබනලද්ද; තත්, ඒ තෙම; මමඅපි, මටද; භවිෂ්‍යති, ව

---

ඔවුන් විසින් නොදක්නා ලද්දාවූ රජතෙම ප්‍රාසාදමස්තකයට නොස් ඒසේම සැත පුනේය. පසුව දොරටුවෙහි සිටිනාවූ වීරවරතෙම නැවත රජුවිසින් විචාරණලද්දේ දෙවයන් වහන්ස ඒ අඬන්නාවූ ස්ත්‍රීතොමෝ මාදෘක නොපෙණී මට පැමිණියා යයි කීයේය. අනික් කිසියම් කථාවක් නැත්තියයිද කීයේය. ඒ වචනයඅසා සතුටුවූරජතෙම මේ මහාසත්වතෙම කෙසේ ප්‍රශංසාකරණුලැබේද. ලොභනුවූ තැනැත්තේ ප්‍රිය වචනකියන්නේය ශූරවූතැනැත්තේ තමාගේ විණිනාව නොකෙරෙයි. කෘතඥවූ තැනැත්තේ සත්පුරුෂයන්ටදෙයි. කපටවූ තැනැත්තේ අමධුර වචනායි යන්නේය. මේ මහාපුරුෂ ලක්‍ෂණ සියල්ල මොහුකෙරෙහි ඇත්තේය. පසුව ඒ රජතෙම උදය පණ්ඩිත සභාවක්කොට සියලු කථාවකියා ප්‍රසන්නයෙන් ඔහටක ණ්ඩරාජ්‍යය දුන්නේය.

න්නේයයි; නිධ්‍යපී. නිධානය පතන්නාවූ; නාපිතඃ. කරනැවිතෙම; (ප නිස්සියෙක්) මොහාත්, මුලාවීම හෙතුකොටගෙණ; භික්ෂුං, වා, භික්ෂුවක්මරා; යථාමාතඃ, යම් කාරණයෙකින් මළේද (එමෙන් නස්නේය.) *

පූර්වයෙහිවූ කථාදැක්වීමෙන් අන්‍යයන්ගේ සැකහැරිය නොහෙනබව.

555 පුරාවෘත්තකථොද්ගාරෛඃ කථං නිර්ණීයතෙ පරඃ
කිං ස්‍යාන්නිෂ්කාරණො බන්ධුඃ කිං වා විශ්වාසඝාතකඃ.

පුරාවෘත්ත, පූර්වකාලයෙහි සිදුවූ; කථාඋද්ගාරෛඃ, කථා කීම්වලින්; පරඃ, අන්‍යයෙක්; කථංනිර්ණීයතෙ, කෙසේනම් සැකහරණු ලැබේද. බන්ධුඃ, නෑයෙක්; නිෂ්කාරණඃ, කරුණුරහිතවූයේ; කිංස්‍යාත්, කුමටවන්නේද; වා, නොහොත්, විශ්වාසඝාතකඃ, විශ්වාසය සිඳින්නෙක්; කිං, කුමට (වන්නේද.)

සුවසේ ජයගතහැකිවූ සතුරෝ.

556 ලුබ්ධඃ ක්‍රූරොඅලසොඅසත්‍යඃ ප්‍රමාදී භීරුරස්ථිරඃ
මූඪො යොධාවමන්තා ච සුඛච්ඡෙද්‍යො රිපුඃ ස්මෘතඃ.

ලුබ්ධඃ, ලොභතැනැත්තේද; ක්‍රූරඃ, රළුතැනැත්තේද; අවශඃ, අයිතිනුවූහෝ යටත්නුවූ තැනැත්තේද; අසත්‍යඃ, සත්‍යවචනනැති තැ

* අයොධ්‍යාපුරයෙහි චූඩාමණිය නම්ඇති ක්ෂත්‍රියයෙක් ඇත්තේය. ධනය පතන්නාවූ ශරීරය වෙහෙසන්නාවූ හිඟු විසින් පින්ඇත්තාවූ අඩිවකුඩ චූඩාමණිත්‍යය බොහෝකාලයක් මුලුල්ලෙහි සතුටුකරණ ලද්දේය. පසුව පහවූ පව්ඇති මේතෙම නිද්‍රාකල්හි අශීනලැබ භාග්‍යවත්හුගේ ප්‍රසන්නය හෙතුකොටගෙණ වෛශ්‍රවණයා විසින් තෝ අද උදයම ඉසගේ රැවුල් කප්පවාගෙණ පොල්ලක් ගත් අත් ඇත්තේ තමන්ගේ ගෙයි වාරයෙහි තනිව සිටින්නෙහිය- එකල්හි ආවාවූ මයම් භික්ෂුවක් මිදුලෙහි අක්නෙහිද ඒ භික්ෂු කරුණාරහිතව පෙ ලුපහරින් මරන්නෙහිය එකල්හි ඒ භික්ෂුතෙම එකෙණෙහි රන්පිරුණාවූ කලයෙක් වන්නේය. ඒ රණින් තෝ ජීවිතයන් ඇතිතෙක් සැපඇත්තෙක් වන්නෙහියයි; අණකරණලද්දේය. රාම පසු එසේකළ කල්හි ඒ කාරණය සිදුවූයේය. එකල්හි ඉසගේ රැවුල් කැපීම පිණිස කැඳවනලද්දාවූ කරනැවියා විසින් ඒ සියල්ලදැක අනො නිධානලැබීමට මේතෙම උපායවෙයි- එහෙයින් මම්ද කුමක්නිසා මෙසේ නොකෙරෙම්දැයි සිතනලද්දේය. එතැන්පටන් ඒ කරනැවිතෙම දවස්පතා එබඳු පොල්ලක්ගත් අත් ඇත්තේ භික්ෂුවකගේ රාම සොයයි. එක්දිනයෙක්හි ඒ කරනැවියා විසින් එයේ පැමිණියාවූ භික්ෂුවක්තෙම පොලුපහරින්හසා මරණලද්දේය. ඒ අපරාධය කරණකොටගෙණ ඒ කරනැවිතෙමේද රාජපුරුෂයන් විසින් තලනලද්දේ විනාශවිය. මේ කථාව සඳහා මුලතිබ ශ්ලෝකය කියනලදී.

නැත්තේද; ප්‍රමාදී, ප්‍රමාද ස්වභාඇත්තේද; භීරුඃ, භය සුලු තැනැත්තේද; අස්ථිරඃ, චඤ්චලවූ තැනැත්තේද; ලුබ්ධඃ, අභූතනද; යොධාවමන්තාච, සේවකයන්ට අනාදර කරණ සුලුතැනැත්තේද; සුඛච්ඡෙද්‍යඃ, සුවසේ බිඳියයුතුවූ; රිපුඃ, සතුරුයයි; ස්මෘතඃ, දන්නාලදී.

### රජක්හුවිසින් සතුරන් නසන විධි.

557 දීඝීවත්මපරිශ්‍රාන්තං නද්‍යද්‍රිවනසඞ්කුලම්

ඝොරාග්නිභයසන්ත්‍රස්තං ක්ෂුත්පිපාසාහිතක්ලමම්.

දීඝීවත්ම, දීඝීවූ මාගීයෙහි ගමනින්; පරිශ්‍රාන්තාම්, විඩාවට පැමිණියාවූ; නද්‍යද්‍රිවන, ගඞ්ගා—පවීත—වන යන මෙයින්; සඞ්කුලම්, අවකාශ රහිතවූ; ඝොර,!දරුණුවූ; අග්නිභය සන්ත්‍රස්තාම්, ගිනිබියෙන් තැතිගත්තාවූ; ක්ෂුත්පිපාසා, ක්ෂුධා පිපාසාදෙකද; අහිතක්ලමම්, සතුරු පීඩා යනමෙයින් වෙහෙසුනාවූ.

558 ප්‍රමත්තං භොජනව්‍යග්‍රං ව්‍යාධිදුභීක්ෂපීඩිතම්

අසංස්ථිතමභූයිෂ්ඨං වෘෂ්ටිවාතසමාකුලම්.

• ප්‍රමත්තං, මත්වූ; [භොජනව්‍යග්‍රම්, ආහාරයෙහි ඇලුනාවූ; ව්‍යාධිදුභීක්ෂපීඩිතම්, රොගයෙන්හා ආහාර නොලැබීමෙන් පෙළුනාවූ; අසංස්ථිතම්, මනාකොට නොසිටියාවූ; අභූයිෂ්ඨම්, ස්වල්පවූ; වෘෂ්ටිවාත, වැසිසුලඟින්; සමාකුලම්, නිතර ආකුලවූ; (කැලඹුනාවූ.)

559 පඞ්කපාංශුජලාච්ඡන්නං සුව්‍යස්තං දස්‍යුවිද්‍රුතම්

එවම්භූතං මහීපාලඃ පරසෛන්‍යං විඝාතයෙත්.

පඞ්කපාංශුජල, මඩධූලිදිය [යන මෙයින්; ආච්ඡන්නාම්, වැසුනාවූ; සුව්‍යස්තාම්, අතිශයින් පතළාවූ; දස්‍යුවිද්‍රුතම්, සතුරන්ගෙන් උපද්‍රුතවූ; එවම්භූතම්, මෙබඳුවූ; පරසෛන්‍යම්, සතුරු සෙනඟ; මහීපාලඃ, රජතෙම; විඝාතයෙත්, නසන්නේය.

560 අවස්කන්දභයාද්‍රාජා ප්‍රජාගරකෘතශ්‍රමම්

දිවාසුප්තං සදා හන්‍යාන්නිද්‍රාව්‍යාකුලසෛනිකම්.

අවස්කන්දභයාත්, සතුරු සෙනඟ විසින් තමන් සෙනඟ වසාගන්නා බියෙන්; ප්‍රජාගරකෘතශ්‍රමම්, නිදිවැළැක්මෙන් විඩාවට පැමිණියාවූ; දිවාසුප්තම්, දවල් නිද්‍රාවට පැමිණියාවූ; නිද්‍රාව්‍යාකුලසෛනිකම්, නිද්‍රාවෙන් ඇලලුනාවූ සෙනඟ; රාජා, රජතෙම; සදා, කැමකල්හි; හන්‍යාත්, නසන්නේය.

නොහික්මීම දෞර්භාග්‍යයට කාරණාබව.

561 න රාජ්‍යං ප්‍රාප්තමිත්‍යේවං වර්තිතව්‍යමසාම්ප්‍රතම්
ශ්‍රියං හ්‍යවිනයො හන්ති ජරා රූපමිවොත්තමම්.

රාජ්‍යම්, රාජ්‍යය; එවම්, මෙසේ; ප්‍රාප්තමිති, පැමිණියේයයි (දැනා;) අසාම්ප්‍රතම්, නුසුදුසු ක්‍රියාවෙහි; නවර්තිතව්‍යම්, නොයෙදියයුතු. උත්තමම් රූපම්, උතුම්වූ රූප සෞන්දර්‍ය්‍යය; ජරාඉව, ජරාව නසන්නාමෙන්; අවිනයඃහි, නොහික්මීම වනාහි; ශ්‍රියම්, සැපත; හන්ති, නසා.

සම්පත්තියටද, නිරොගිබවටද, සැපතටද, ශාස්ත්‍රයටද, ධර්මධන කීර්තිතුනටද, පැමිණෙන්නෝ.

562 දක්ෂඃ ශ්‍රියමධිගච්ඡති පථ්‍යාශී කල්‍යතාං සුඛමරොගී
උද්‍යොගී විද්‍යාන්තං ධර්මාර්ථයශාංසි ච විනීතඃ.

දක්ෂඃ, (ක්‍රියාවෙහි) දක්ෂපුරුෂතෙම; ශ්‍රියම්, සම්පත්තියටද; පථ්‍යාශී, හිතවූඅවිරුද්ධ ආහාර අනුභවකරණ පුරුෂතෙම; කල්‍යතාම්, නිරොගිබවටද; අරොගී, රොගනැති පුරුෂතෙම; සුඛම්, සැපතටද; උද්‍යොගී, උත්සාහවත් පුරුෂතෙම; විද්‍යාන්තම්, ශාස්ත්‍රයටද; විනීතඃ, හික්මුනු පුරුෂතෙම; ධර්මාර්ථයශාංසිච, ධර්මය, ධනය, කීර්තියයන මේ තුනට, ද; අධිගච්ඡති, පැමිණේ.

නුවණ නැත්තාවූ රජක්හු ශාස්ත්‍රදැනීමෙන් වැඩිසිටියවුන් ආශ්‍රයෙන් සැපතට පැමිණෙන බව.

563 අවිද්වානපි භූපාලො විද්‍යාවෘද්ධොපසෙවයා
පරාං ශ්‍රියමවාප්නොති ජලාසන්නතරුර්‍යථා.

අවිද්වාන්අපි, නුවණමදවූද; භූපාලඃ, රජතෙම; විද්‍යාවෘද්ධ, ශාස්ත්‍රයෙන් වැඩුනාවුන්ගේ; උපසෙවයා, ආශ්‍රයෙන්; ජලාසන්නා, ජලස්ථානයට ලන්වූ; තරුඃයථා, ගසක්මෙන්; පරාංශ්‍රියං, උතුම්වූ සම්පත්තියට; අවාප්නොති, පැමිණේ.

රජුන්ගේ විපත්තියට කරුණු.

564 පානං ස්ත්‍රී මෘගයා ද්‍යූතමර්ථදූෂණමෙව ච
වාග්දණ්ඩයොශ්ච පාරුෂ්‍යං ව්‍යසනානි මහීභුජාම්.

පානම්, මද්‍යපානයද; ස්ත්‍රී, ස්ත්‍රීයද; මෘගයා, මුවදඩයාමද; ද්‍යූතම්, දුකෙළිද; අර්ථදූෂණම්එවච, අනුන්ගේධනපැහැරගැන්මද; වාක්දණ්ඩඃ, වචනයෙන් තැළීමද; යශ්ච පාරුෂ්‍යම්, අමධුර වචනයද; (යනමොහු) මහීභුජාම්, රජුන්ට; ව්‍යසනානි, විපත්තිවෙත්.

නීතියෙහිද ශූරභාවයෙහිද සැප පවත්නාබව.

565 න සාහසෛකාන්තරසානුවර්තිනා
න චාප්‍යුපායොපහතාන්තරාත්මනා.
විභූතයඃ ශක්‍යමවාප්තුමූර්ජිතා.
නයෙ ච ශෞර්‍යෙ ච වසන්ති සම්පදඃ.

සාහසෛකාන්තරසඅනුවර්තිනා, රෞද්‍රභාවය නිරන්තරවූ රසයක්මෙ න් පැවතීමෙන් යුක්තවූහෝ; උපාය උපහත අන්තරාත්මනාවාපි, නාස නාලද උපායඇති සිතින්යුක්තවූහෝ; (පුරුෂයෙක්) විභූතයඃ, ඓශ්ව ර්‍යවලට; අවාප්තුම්, පැමිණෙන්ට; නශක්‍යම්, හැකිනොවේ. ඌර්ජි තාඃ, වැඩුනාවූ; සම්පදඃ, සම්පත්තීහු; නයෙච, නීතියෙහිද; ශෞර්‍යෙච, ශූරභාවයෙහිද; වසන්ති, වෙසෙත්.

දුෂ්ටඇමතියාකර නීතිදෝෂයන්ද අහිතද්‍රව්‍යයන් අනුභවකර න්නාකර රෝගයන්ද පැමිණෙනබව ආදිය.

566 දුර්මන්ත්‍රිණං කමුපයාන්ති න නීතිදෝෂාඃ
සන්තාපයන්ති කමපථ්‍යභුජං න රෝගාඃ.
කං ශ්‍රීර්න දර්පයති කං න නිහන්ති මෘත්‍යුඃ
කං ස්ත්‍රීකෘතා න විෂයාඃ පරිතාපයන්ති.

දුර්මන්ත්‍රිණම්, දුෂ්ටඅමාත්‍යවූහෝ නුසුදුසුවිනිශ්චයඇත්තාවූ; කම්, කව රක්හුකරා; නීතිදෝෂාඃ, නීතිදෝෂයෝ; නඋපයාන්ති, නොයෙද්ද; අප ථ්‍යභුජම්, අහිතවූ ද්‍රව්‍යානුභවය ඇත්තාවූ; කම්, කවරක්හු; රෝගාඃ, රෝගයෝ; නසන්තාපයන්ති, නොතවද්ද; ශ්‍රීඃ, සම්පත්තොමෝ; කම්, කවරක්හු; නදර්පයති, අහංකාර නොකරන්න්ද; මෘත්‍යුඃ, මරුතෙම; ක ම්, කවරක්හු. නනිහන්ති, නොනසාද; ස්ත්‍රීකෘතාඃ, ස්ත්‍රීන්විසින් කර ණලද්දවූ; විෂයාඃ, විෂයරසයෝ; කම්, කවරක්හු; නපරිතාපයන්ති, නොතවද්ද.

අඤ්ඩයාට කැටපතින් ප්‍රයොජන නැත්නාක් මෙන් නුවණනැත්තාහට ශාස්ත්‍රයෙන් ප්‍රයොජන නැතිබව.

567 යස්‍ය නාස්ති ස්වයං ප්‍රඥා ශාස්ත්‍රං තස්‍ය කරොති කිම්
ලොචනාභ්‍යාං විහීනස්‍ය දර්පණඃ කිං කරිෂ්‍යති.

ස්වයම්, තමාපිළිබඳවූ; ප්‍රඥා, බුද්ධිතොමෝ; යස්‍ය නාස්ති, යමක්හට නැත්සිද; තස්‍ය, ඔහට; ශාස්ත්‍රම්, ශාස්ත්‍රයතෙම; කිම්කරොති, කුමක්කෙරේද; ලොචනාභ්‍යාම්, ඇස්දෙකින්; විහීනස්‍ය, තොරවූවාහට; දර්පණඃ, කැටපතතෙම; කිම්කරිෂ්‍යති, කුමක් කරන්නේද.

කොපය නොදක්විය යුතු ස්ථානවූවෝ.

568 දෙවතාසු ගුරෞ ගොෂු රාජසු බ්‍රාහ්මණෙෂු ච
නියන්තව්‍යඃ සදා කොපො බාලවෘද්ධාතුරෙෂු ච.

දෙවතාසු, දෙවතාවන් කෙරෙහිද; ගුරෞ, ඇදුරින් කෙරෙහිද; ගොෂු, ගවයන් කෙරෙහිද; රාජසු, රජුන්කෙරෙහිද; බ්‍රාහ්මණෙෂුච, බමුණන්කෙරෙහිද; බාලවෘද්ධාතුරෙෂුච, බලයෝද මහල්ලෝද රෝගයෙන් පීඩිතයෝද යනාමොවුන් කෙරෙහි; කොපඃ, කොපයතෙම; සදා; හැම කල්හි; නියන්තව්‍යඃ, යමනය කටයුතු.

සතුරන් ගළපනකල්හි ඇමතියන්ගේද, ත්‍රිදොෂ සන්නිපාත යෙහි වෙදුන්ගේද ක්‍රියාවෙන් ප්‍රඥාව ප්‍රකාශවනබව.

569 මන්ත්‍රිණං භින්නසන්ධානෙ භිෂජාං සන්නිපාතකෙ
කර්ම්මණා ව්‍යජ්‍යතෙ ප්‍රඥා සුස්ථෙ කො වා න පණ්ඩිතඃ.

භින්නසන්ධානෙ, සතුරන්ගේ ගැළපීමෙහි මිත්‍රකිරීමෙහි; මන්ත්‍රිණම්, අමාත්‍යයන්ගේද; සන්නිපාතකෙ, වාතාදි ත්‍රිදොෂයන් විෂමවීමෙන් වූ රෝගයෙහි; භිෂජාං, වෙදුන්ගේද; කර්ම්මණා, සමාදනාදි ඒ ඒ ක්‍රියාවෙන්, ප්‍රඥා, ප්‍රඥාතොමෝ; ව්‍යජ්‍යතෙ, ප්‍රකාශකරණු ලබන්නීය; සුස්ථෙ, සුවසේසිටි කල්හි; කඃවා, කවරෙක්හෝ; නපණ්ඩිතඃ, පණ්ඩිත නොවේද.

අඥනයාගේ ආකුලභාවයහා ප්‍රඥවන්තයාගේ නිරාකුලබව.

570 ආරභන්තෙල්පමෙවාඥඃ කාමං ව්‍යග්‍රා භවන්ති ච
මහාරම්භාඃ කෘතධියස්තිෂ්ඨන්ති ච නිරාකුලාඃ.

අඥඃ, අඥනයෝ; අල්පම්එව, ස්වල්පයක්ම; ආරභන්තෙ, පටන්ගණිත්. කාමම්, එකාන්තයෙන්; ව්‍යග්‍රාඃ, ආකුලවූවාහු; භවන්ති, වෙත් මහාරම්භාඃ, බලවත්වූ ආරම්භ ඇත්තාවූ; කෘතධියඃච, නුවණැත්තෝ ව නාහි; නිරාකුලාඃ, නොකැලඹුනාහු; තිෂ්ඨන්ති, සිටිත්.

ඓශ්වය්‍ය්‍යීය නොහරින්නාවූ රජෙක්.

571 යඃ කාකිනීමප්‍යපථප්‍රපන්නාං සමුද්ධරෙන්නිෂ්කසහස්‍රතුල්‍යාම්
කදාපි කොටිෂ්වපි මුක්තහස්තස්තං රාජසිංහං න ජහාති
ලක්ෂ්මීඃ.

අපථප්‍රපන්නාම්, සුදුසුනුවූ කාරණයෙහි පැමිණියාවූහෝ නොමගට පැමිණීම් ඇත්තාවූ; කාකිනීම්අපි, කාකිනියක් හෙවත් තුට්ටුවකුදු; නිෂ්කසහස්‍රතුල්‍යාම්, නිෂ්කදහසක් හෙවත් රුපියල් සොළොස්දහස

ක් මෙන්, යඃ, යම්රජෙක්; සම්බරෙත්, මනාකොට ගන්නේද නොහො ත් රක්නේද; කදාපි, (සුදුසු කාරණයෙහි) කිසිකලෙක්හිද; කොවිදු අපි, කෙළගණනක් කෙරෙහිදු; මූකානහස්තඃ, මුදනලද අත් ඇත්තේ ද; තම්රාජසිංහම්, ඒ රාජසිංහයා; ලක්ෂ්මීඃ, ශ්‍රීතොමෝ; නජහාති, නො හරින්නීය.

### අධිකකොට ධනය වියදම් කටයුතුතැන්.

572 ක්‍රතෞ විවාහෙ ව්‍යසනෙ රිපුක්ෂයෙ
යශස්කරෙ කම්මණි මිත්‍රසඞ්ග්‍රහෙ.
ප්‍රියාසු නාරීෂ්වධනෙෂු බන්ධුෂු
හ්‍යතිව්‍යයො නාස්ති නරාධිපාෂ්ටසු.

ක්‍රතෞ, යාගක්‍රියායෙහිද; විවාහෙ, විවාහ සමයෙහිද; ව්‍යසනෙ, විප ත්තිකාලයෙහිද; රිපුක්ෂයෙ, සතුරන් නැසීමෙහිද; යශස්කරෙකම්මණි, කීර්තිය දියුනුකරන්නාවූ ක්‍රියාවෙහිද; මිත්‍රසඞ්ග්‍රහෙ, මිත්‍රයන්ට සඞ්ග්‍ර හ කිරීමෙහිද; ප්‍රියාසුනාරීෂු, ප්‍රියවූ ස්ත්‍රීන්කෙරෙහිද; අධනෙෂුබන්ධුෂු, ධනහීනඥතීන් කෙරෙහිද; නරාධිප, මහරජ, අෂ්ටසු, මේ අටකාරණ යන්හි; අතිව්‍යයඃහි, අධික වියදමෙක් වනාහි; නාස්ති, නැති.

### අඥනයා ස්වල්ප ධනයදීමට ලොභවීමෙන් සියල්ල විනාශකරණබව.

573 මූඪඃ ස්වල්පව්‍යයත්‍රාසාත් සර්වනාශං කරොති හි
කඃ සුධීස්ත්‍යජතෙ භාණ්ඩං ශුල්කස්‍යෙවාතිසාධ්වසාත්.

මූඪඃ, අඥනතෙම; ස්වල්පව්‍යයත්‍රාසාත්, මඳවූ වියදමට භයින්; සර්වනා ශම්, සියලු ද්‍රව්‍ය විනාශය; කරොති, කෙරෙයි; හි, ඒ එසේමැයි; ශුල්ක ස්‍යඑව, ශුංකමගේම හෙවත් රාජසන්තක වීමට දියයුතු බදුමුදලගේම; අතිසාධ්වසාත්, අධිකසැකය හෙතුකොටගෙණ; භාණ්ඩම්, (විකිනියයු තු) භාණ්ඩය; කඃසුධීඃ, කවර පණ්ඩිතයෙක්; ත්‍යජතෙ, හරීද.

### රජුන්විසින් මනාකොට පුදනලද්දාවූ සෙවකයන් සතුරන් ජ ය ග න් නා බ ව.

574 පරස්පරඥඃ සංහෘෂ්ටාඃ ත්‍යක්තප්‍රාණාඃ සුනිශ්චිතාඃ
කුලීනාඃ පූජිතාඃ සම්‍යග්විජයන්තෙ ද්විෂාං බලම්.

පරස්පරඥඃ, අන්‍යොන්‍යයන් දන්නාවූ; සංහෘෂ්ටාඃ, සතුටුකරණ ලද් දාවූ; ත්‍යක්තප්‍රාණාඃ, හරණලද ප්‍රාණආලයඇත්තාවූ; සුනිශ්චිතාඃ, අති

ශයින් නියමවූ; කුලීනාඃ, මහාකුලයෙහි උපන්නාවූ; සුපූජිතාඃ, මනාකොට පුදනලද්දාවූ සෙවකයෝ; විෂාච්බලම්, සතුරන්ගේ බලය; විජයන්තෙ, ජයගණිත්.

ශූරවූමනා සෙවකයෝ සතුරන් පන්සියයක් නමුදු ජයගන්නාබව.

575 සුභටාඃ ශීලසම්පන්නාඃ සංහතාඃ කෘතනිශ්චයාඃ
අපි පඤ්චශතං ශූරා නිඝ්නන්ති රිපුවාහිනීම්.

ශීලසම්පන්නාඃ, ශීලයෙන් යුක්තවූ; සංහතාඃ, සමගිවූ; කෘතනිශ්චයාඃ, කරණලද නියමයඇත්තාවූ; ශූරාඃ, ශූරවූ; සුභටාඃ, මනා සෙවකයෝ; පඤ්චශතම්, අපි, පන්සියයකුදු; රිපුවාහිනීම්, සතුරන්ගේ සෙනග; නිඝ්නන්ති, නසත්.

පණ්ඩිතයෝපවා විශෙෂනොදන්නාවූ රළුවූවන් හරිනබව.

576 ශිෂ්ටෛරප්‍යවිශෙෂඥ උග්‍රශ්ච කෘතනාශකඃ
ත්‍යජ්‍යතෙ කිං පුනර්නාන්‍යෛඃ පතන්‍යප්‍යාත්මම්භරිර්නරඃ.

අවිශෙෂඥඃ, විශෙෂ නොදත්තාවූ; උග්‍රඃච, රළුවූද; කෘතනාශකඃ, කරණලද උපකාර නොසලකන්නාවූ; ආත්මම්භරිඃනරඃ, තමා පොෂ්‍යය කරන්නාවූ ජනතෙම; ශිෂ්ටෛඃඅපි, පණ්ඩිතයන්විසින්පවා; ත්‍යජ්‍යතෙ, හරිණුලැබේ. අන්‍යෛඃ, සෙසු අඥනයන්විසින්; පතතිඅපි, අඹුවද; කිම්පුනඃන, කුමට හරිණු නොලබන්නීද.

දොෂතුනකින් සෙදුනාවූ රජ්ජුරුවන්ට නින්දකටයුතුබව.

577 සත්‍යං ශෞර්‍ය්‍යං තථා ත්‍යාගො නෘපස්‍යෛතෙ ත්‍රයො ගුණාඃ
එතෛස්ත්‍යක්තො මහීපාලඃ ප්‍රාප්නොති බලු වාච්‍යතාම්.

සත්‍යම්, සැබෑබසද; ශෞර්‍ය්‍යම්, ශූරබවද; තථා, එසේම; ත්‍යාගඃ, දීමද; එතෙත්‍රයඃ, මොහු තුන්දෙන; නෘපස්‍ය, රජක්හුගේ; ගුණාඃ, ගුණයෝයි. එතෛඃත්‍යක්තඃ, මොවුන්විසින් හරණලද්දාවූ; මහීපාලඃ, රජතෙම; වාච්‍යතාම්, නුගුණකියයුතුබවට; බලු, එකාන්තයෙන්; ප්‍රාප්නොති, පැමිණේ.

ධනදීමෙන් වියදම්කරන්නත් වැඩෙනබව.

578 යො යෙන ප්‍රතිබද්ධඃ ස්‍යාත් සහ තෙනොදයී ව්‍යයී
සුවිශ්වස්තො නියොක්තව්‍යඃ ප්‍රාණෙෂු ච ධනෙෂු ච.

යඃ, යම්රජෙක්තෙම; යෙන, යමක්හුහා සමග; ප්‍රතිබද්ධඃ, ධනාදියෙන් බඳනාලද්ද; තෙනසහ, ඕහුහා සමග; ව්‍යයී, ධනදෙන තැනැත්

නේ; උදයී, වැඩෙන්නේ; ස්‍යාත්, වන්නේය, ප්‍රාණෙහුව, ප්‍රාණයන්කෙරෙහිද; ධනෙහුව, ධනයන්කෙරෙහිද; සුවිශ්වස්තඃ, මනාකොට විශ්වාසකරණලද තැනැත්තෙක්; නියොක්තව්‍යඃ, නියොගකටයුතුවෙයි.

ඇමතිබවටගැණීමෙන් රජහුගේ විනාශයවන තුන්දෙනෙක්.

579 ධූර්ත්තඃ ස්ත්‍රී වා ශිශුර්යස්‍ය මන්ත්‍රිණඃ ස්‍යුර්මහීපතෙඃ
අනීතිපවනක්ෂිප්තඃ කාර්‍ය්‍යාබ්ධෞ ස නිමජ්ජති.

ධූර්ත්තඃ, දූකෙළින්නෙක්හෝ; ස්ත්‍රී, ස්ත්‍රියක්හෝ; ශිශුඃවා, ළදරුවෙක්හෝ; යස්‍යමහීපතෙඃ, යම්රජකුහුගේ; මන්ත්‍රිණඃස්‍යුඃ, අමාත්‍යයෝවෙද්ද; සඃ, ඒ රජතෙම; අනීති පවනක්ෂිප්තඃ, අවනඩුනැමැති සුලඟින් හරණලද්දේ; කාර්‍ය්‍යාබ්ධෞ, කටයුතුනැමැති සමුද්‍රයෙහි; නිමජ්ජති, ගිලේ.

රජුන්ගේ ධනය වැඩෙන විධිය.

580 හර්ෂක්‍රොධෞ සමෞ යස්‍ය කොශඃ ස්වල්පව්‍යයෙන ච
නිත්‍යං භෘත්‍යාන්වෙක්ෂා ච තස්‍ය ස්‍යාද්ධනදා ධරා.

යස්‍ය, යම්රජකුහුගේ; හර්ෂක්‍රොධෞ, සතුටහා කිපීමයන දෙක; සමෞ, සමානවෙද්ද; ස්වල්පව්‍යයෙන, මඳවියදමින් යුක්තවූ; කොශඃච, ධනය ඇත්තේද; නිත්‍යම්, නිතර; භෘත්‍යඅන්වෙක්ෂාච, ඇමතියන් බැලීමද; (ඇත්තේද) තස්‍ය, ඔහට; ධරා, පෘථිවීතොමෝ; ධනදාස්‍යාත්, ධනදෙන්නීවන්නීය.

වැඩීම්හානිදෙක්හි රජුහා සමගවූ නීතිදත් ඇමතියන්ට රජුවිසින් අනාදර නොකටයුතුබව.

581 යෙෂාං රාඥා සහ ස්‍යාතාමුපචයාපචයෞ ධ්‍රුවම්
අමාත්‍යාන් නීතිමාන් රාජා නාවමන්‍යෙත කර්හිචිත්.

යෙෂාම්, යම්කෙනකුන්ගේ; උපචය අපචයෞ, වැඩීම්හානිදෙක, රාඥාසහ, රජුහාසමග; ධ්‍රුවම්, නිරන්තරයෙන්; ස්‍යාතාම්, වෙද්ද; රාජා, රජතෙම; නීතිමාන්, නීතිදන්නාවූ; අමාත්‍යාන්, ඇමතියන්; කර්හිචිත්, කිසි කාරණයෙක්හි; නඅවමන්‍යෙත, අනාදර නොකරන්නේය.

මදයෙන් අන්ධවූ රජුවිසින් කටයුතු වරදවාගත්කල්හි ඇමතියන් ඊට පිටිවහල්වනබව.

582 මහීභුජො මදාන්ධස්‍ය මජ්ජතඃ කාර්‍ය්‍යසාගරෙ
ස්ඛලතො හි කරාලම්බඃ සුසචිවෛරෙව දීයතෙ.

කායස්ථසාගාරෙ, කායස්ථනැමැති මූෂිකයාගේ ගුහාවෙහි; මජ්ජතඃ, ගිලෙන්නාවූ; මදන්ධස්‍ය, මදයෙන් අන්ධවූ; මහිභුජඃ, රජහුගේ; සලිලතඃ, ගොඩකෙරෙන්; කරාලම්බඃහි, අතඑල්ලාගැන්ම වනාහි; ඥානිසෙක්ෂිතෙව. මනා පණ්ඩිතයන් විසින්ම; දීයතෙ, දෙනුලැබේ.

ජලයකෙරෙන් නික්මුනුකල්හි කෲරවූ කිඹුලාගේද වනයෙන් පිටතදී සිංහයාගේද බලනැතිබව.

543 විෂමොපි යථා නක්‍රඃ සලිලාන්නිඃසෘතොවශඃ
වනාත් තු ප්‍රච්‍යුතඃ සත්‍යං සිංහොපි ස්‍යාච්ඡෘගාලවත්.

නක්‍රඃ, කිඹුල්තෙම; විෂමඃඅපි, කෲරවූයේද; සලිලාත්, ජලයකෙරෙන්; නිඃසෘතඃ, නික්මුනේ; යථා අවශඃ, බලනැත්තේ යම්සේද; වනාත්. වනයකෙරෙන්; ප්‍රච්‍යුතඃ, නික්මුනාවූ; සිංහඃඅපි, සිංහයාද; ශෘගාලවත්, සිවලෙක්මෙන්; ස්‍යාත්, වන්නේය. සත්‍යං, සත්‍යමැයි.

සටන්භූමියෙහි රජුන්විසින් බලාසිටියයුතුබව.

584 පුරස්කෘත්‍ය බලං රාජා යොධයෙදවලොකයන්
ස්වාමිනාධිෂ්ඨිතඃ ශ්වාපි කිං න සිංහායතෙ ධ්‍රුවම්.

රාජා, රජතෙම; බලම්පුරස්කෘත්‍ය, සෙනඟ ඉදිරිකොට; අවලොකයන්, බලාසිටිනේ; යොධයෙත්, යුධකරවන්නේය. ස්වාමිනා, ස්වාමියාවිසින්; අධිෂ්ඨිතඃ, ආශ්‍රකරණ ලද්දාවූ; ශ්වාඅපි, බල්ලෙක්ද; ධ්‍රුවම්, එකාන්තයෙන්; කිංන සිංහායතෙ, කෙසේ සිංහයකුහා සමානව් නොහැසිරේද.

කොටුවකගේ හෙවත් නුවරකගේ විපත්ති.

585 අකාලසහමත්‍යල්පං මූර්ඛව්‍යසනිනායකම්
අගුප්තං භීරුයොධං ච දුර්ගව්‍යසනමුච්‍යතෙ.

අකාලසහම්, මඳකලක් සිටීම ඇතිබවද; අත්‍යල්පම්, ඉතාස්වල්පවූ සෙනාවඇතිබවද; මූර්ඛව්‍යසනිනායකම්, අඥනාවූ විපත්තියට පැමිණි ශ්‍රෙෂ්ඨයාඇතිබවද; අගුප්තම්, මනාකොට සැඟවුනාවූ; භීරුයොධංච; භයවූ යොධයන්ඇතිබවද; දුර්ගව්‍යසනම්, කොටුවකගේ විපත්තියයි; උච්‍යතෙ, කියනුලැබේ.

කොටුවකගේ පැන්නහැකිවන උපායසතර.

586 උපජාපශ්චිරාරොධොවස්කන්දස්තීව්‍රපෞරුෂම්
දුර්ගස්‍ය ලඞ්ඝනොපායාශ්චත්වාරඃ කථිතා ඉමෙ.

උපජාපඃ, බිඳීමද; චිරාරොබඃ, බොහෝකාලයක් වැසීමද; අවස්කන්ද, බලයෙන් පැනීමද; තිව්‍රපෞරුෂම්, උග්‍රවූ පුරුෂභාවයද; දුර්ගස්‍ය, කොටුවකගේ; චත්වාරඃ, ලබ්ධනඋපායාඃ, පැත්නහැකිවූ උපායසතර; ඉතිම, මොහුයයි; කථිතාඃ, කියනලද්දාහුයි.

සතුරන් එලඹසිටිකල්හි පරීක්ෂාකිරීමෙන් පමානොවියයුතුබව.

587 ධූමනභ්‍රිතං සුවික්‍රාන්තං සුප්‍රබුද්ධං සුපලායිතම්

ප්‍රාප්තකාලෙ යථා ශක්ති කුර්‍ය්‍යාන්න තු විචාරයෙත්.

ප්‍රාප්තකාලෙ, (සතුරන්) පැමිණිකල්හි; සුවික්‍රාන්තං, මනාශූරවූ; සුප්‍රබුද්ධම්, මනාප්‍රබුද්ධයහෝ; සුපලායිතම්, යාමහෝ; ධූමනභ්‍රිතම්, මනාවූ මන්ත්‍රණය; යථාශක්ති, ශක්තිපමණින්; කුර්‍ය්‍යාත්, කරන්නේය. නතුවිචාරයෙත්, පරීක්ෂානොකරන්නේය.

ඉවසිලි ඇත්තාවූ නිතරදීමට කැමතිවූ ගුණඇත්තාවූ ස්වාමියක්හු භාග්‍යයෙන් ලැබෙනබවහා පිරිසිදුවූ දක්ෂවූ ඇලුම්ඇත්තාවූ සෙවකයක්හුගේද දුල්භබව.

588 ක්ෂමී දාතා ගුණග්‍රාහී ස්වාමී භාග්‍යෙන ලභ්‍යතෙ ශුචිර්දක්ෂෝනුරක්තශ්ච භෘත්‍යඃ ඛලු සුදුල්භඃ.

ක්ෂමී, ඉවසනසුලුවූ; දාතා, දෙනසුලුවූ; ගුණග්‍රාහී, ගුණඇත්තාවූ; ස්වාමී, ස්වාමිතෙම; භාග්‍යෙන, භාග්‍යයෙන්; ලභ්‍යතෙ, ලබනුලැබේ. ශුචිඃ, පිරිසිදුවූ; දක්ෂඃ, දක්ෂවූ; අනුරක්තඃච, ඇලුනාවූද; භෘත්‍යඃ ඛලු, අමාත්‍යයෙක්; සුදුල්භඃ, ලදනොහේ,

මිනිසුන්ට මරණය නියතබැවින් සටන්භූමියහැරයාම නිරර්ථකවූ අපකීර්තියක්බව.

589 යදි සමරමපාස්‍ය නාස්ති මෘත්‍යො
භීයමිති යුක්තමිතොන්‍යතඃ ප්‍රයාතුම්.
අථ මරණමවශ්‍යමෙව ජන්තොඃ
කිමිති මුධා මලිනං යශඃ ක්‍රියෙත.

සමරම්, යුද්ධය; අපාස්‍ය, හැරගොස්; මෘත්‍යොඃ, මරුහුගේ; භයම්, බිය; නාස්ති, ඉදින් නැත්තේනම්; ඉති, එසේකල්හි; ඉතඃ අන්‍යතඃ, මෙයින් අන්තැනෙක්හි; ප්‍රයාතුම්, යාම; යුක්තම්, සුදුසුවෙයි. අථ, ඉදින්; ජන්තොඃ, සත්වයාගේ; මරණම්, මරණය; අවශ්‍යම්, එකාන්තනම්, ඉති; එසේකල්හි; මුධා, හිස්වූ; මලිනම්යශඃ, අපකීර්තිය; කිම්ක්‍රියෙත, කුමක් සඳහාකොටගෙණ කරන්නේද,

අනුන්ගේ ප්‍රයොජනයෙහි ජීවිතපරිත්‍යාගය කුශලයෙන්වනබව.

590 සංසාරෙස්මින් පවනොද්භ්‍රාන්තවීචිවිභ්‍රමභඞ්ගුරෙ

ජායතෙ පුණ්‍යයොගෙන පරාර්ථෙ ජීවිතව්‍යයඃ.

පවනොද්භ්‍රාන්ත, සුළඟින් නැගින්නාවූ; වීචිවිභ්‍රම; වීචින්ගේ හෙවත් රළයන්ගේ ගමනමෙන්; භඞ්ගුරෙ, බිඳෙන සුලුවූ; අස්මින්සංසාරෙ, මේ සංසාරයෙහි; පරාර්ථෙ, අනුන්ගේ ප්‍රයොජනයෙහි; ජීවිතව්‍යයඃ, දිවිදීම; පුණ්‍යයොගෙන, තමාගේ කුශල යෙහියෙදීමෙන්; ජායතෙ, උපදී.

රජහුවිසින් හරණලද අමාත්‍යයාගේ නොවැඩෙනබව.

591 ප්‍රකෘතිඃ ස්වාමිනා ත්‍යක්තා සමෘද්ධාපි න ජීවති

අපි ධන්වන්තරිවෛද්‍යඃ කිං කරොති ගතායුෂි.

ස්වාමිනා, ස්වාමියාවිසින්; ත්‍යක්තා, හරණලද්දාවූ; ප්‍රකෘතිඃ, නගරාගතොමෝ; සමෘද්ධාඅපි, වැඩුනීද; නජීවති, ජීවත්නොවෙයි. ධන්වන්තරිඃවෛද්‍යඃඅපි, ධන්වන්තරිනම්වෛද්‍යාචාරියාද; ගතායුෂි, කෙළවරවූ ආයුඇත්තා කෙරෙහි; කිංකරොති, කුමක්කෙරේද.

රජ්ජුරුවන් ප්‍රකාශනුවූකල්හි ලොකයා ප්‍රකාශ නොවනබව.

592 නරෙශෙ ජීවලොකොයං නිමීලති නිමීලති

උදෙත්‍යුදීයමානෙ ච රවාවිව සරොරුහම්.

නරෙශෙ, රජ්ජුරුවන්; නිමීලති, ප්‍රකාශනොවනකල්හි; අයංජීවලොකඃ, මේ සත්වලොකයතෙම; නිමීලති, වැසෙයි; උදීයමානෙච, උදාවනුලබන හෙවත් පහළවනු ලබනකල්හිද; රවෞ, හිරුනැගිකල්හි; සරොරුහම්ඉව, පියුම්හෙවත් නෙළුම් (පිපෙන්නාක්) මෙන්; උදෙති (ලොකයා) ප්‍රකාශවේ.

නගරංගඅට.

593 ස්වාම්‍යමාත්‍යශ්ච රාෂ්ට්‍රඤ්ච දුර්ගං කොශො බලං සුහෘත්

රාජ්‍යාඞ්ගානි ප්‍රකෘතයඃ පෞරාණාං ශ්‍රෙණයොපි ච.

ස්වාමී, ස්වාමීද; අමාත්‍යඃච, ඇමතිද; රාෂ්ට්‍රංච, දෙශයද; දුර්ගම්, නුවර හෙවත් කොටුවද; කොශඃ, ධනයද; බලම්, බළසෙනඟද; සුහෘත්, මිත්‍රද; ශ්‍රෙණයඃඅපිච, සමූහයද; රාජ්‍යාඞ්ගානි, රාජ්‍යයාගේ අවයවවූ; පෞරාණම්, නගරයන්ගේ; ප්‍රකෘතයඃ, ප්‍රකෘතිහුයි.

උත්තමයන් බොහෝනොවනබව.

594 ජනයන්ති සුතාන් ගාවඃ සර්වාඑව ගවාකෘතීන්.

විෂාණොල්ලිඛිතස්කන්ධං කාචිදෙව ගාවාම්පතිම්.

ගාවඃ, ගවදෙනුහු; ගවාකෘතීන්, ගවයන්ගේ ශරීර සටහන් ඇත්තවූ; සර්වාන්සුතාන්එව, සියලු පුත්‍රයන්ම; ජනයන්ති, උපදවත්; විෂාණ

උල්ලිඛිත, අහින් උලනලද; ඝෘෂ්ට, කඳඇති; ගවාම්පතිව, ගවස්වාමි යක්හු; කාචිත්එව, කිසිදෙනක්ම (වද).

### ස්වාමියාකෙරෙහි භක්තියෙන් සටන්භූමියෙහිදී දිවිදුන්නාවූ ශූරයොධයන් ස්වර්ගයෙහි උපදනාබව.

595 ආහවේෂු ච යෙ ශූරාඃ ස්වාම්යර්ථෙ ත්‍යක්තජීවිතාඃ
භර්තෘභක්තාඃ කෘතඥාඃ ච තෙ නරාඃ ස්වර්ගගාමිනඃ.

ආහවේෂු, සටන්ක්‍රියාවන්හි; ශූරාඃ, වික්‍රමාන්විතවූ; ස්වාම්යර්ථෙ, ස්වාමිහුගේ ප්‍රයොජනයෙහි; ත්‍යක්තජීවිතාඃ, හරණලද ජීවිතය ඇත්තාවූ; භර්තෘභක්තාඃ, ස්වාමියාකෙරෙහි ආදරඇත්තාවූ; කෘතඥාඃච, කළදෙය දන්නාවූද; යෙ, යම්කෙනෙක්වෙද්ද; තෙනරාඃ, ඒ මනුෂ්‍යයෝ; ස්වර්ගගාමිනඃ, ස්වර්ගයට යන්නාහුවෙත්.

596 යත්‍ර තත්‍ර හතඃ ශූරඃ ශත්‍රුභිඃ පරිවෙෂ්ටිතඃ
අක්ෂයාන් ලභතෙ ලොකාන් යදි ක්ලෛව්‍යං න ගච්ඡති·

ශත්‍රුභිඃ, සතුරන්විසින්; පරිවෙෂ්ටිතඃ, පිරිවරණලද්දේ; යත්‍ර තත්‍ර, යම්කිසිතැනෙක්හි; හතඃ, නසනලද්දාවූ; ශූරඃ, වික්‍රමවත් පුරුෂතෙම. අක්ෂයාන්ලොකාන්, නොගෙවෙන්නාවූ ලොකයන්; ලභතෙ, ලබා යදි, ඉදින්; ක්ලෛව්‍යම්, නපුංසකභාවයකට; නගච්ඡති, නොයේ·

### තු න් ව න ප රි ච්ඡෙ ද යෙ හි අ ව සා න ශ්ලො ක ය·

597 විග්‍රහඃ කරිතුරඞ්ගපත්තිභිඃ
නො කදාපි භවතාං මහීභෘතාම්.
නීතිමන්ත්‍රපවනෛඃ සමාහතාඃ
සංශ්‍රයන්තු ගිරිගහ්වරං ද්විෂඃ,

කරිතුරඞ්ගපත්තිභිඃ, ඇතුන් අසුන් පාබළ සෙනඟයන මොවුන්විසින්; විග්‍රහඃ, සටනෙක්; භවතාම් මහීභෘතාම්, පින්ඇත්තාවූ රජුන්ට කදාඅපි, කිසිකලෙක්හිදු; නො, නොවේවා; නීතිමන්ත්‍ර, නීතිභාමන්ත්‍රණ නැමැති; පවනෛඃ, වාතයන් විසින්; සමාහතාඃ, හමනලද්දාවූ; ද්විෂඃ, සතුරෝ; ගිරිගහ්වරම්, පර්වතයන්ගේ ගුහාස්ථානය; සංශ්‍රයන්තු, ආශ්‍රයකෙරෙත්වා.

හිතොපදෙශ සන්නයෙහි තුන්වන කථා සඞ්ග්‍රහයයි.

# හිතොපදෙශයෙහි සතරවනු කාණ්ඩය.

## සන්ධිනම් සතරවනකාණ්ඩයාගේ ප්‍රථම ශ්ලෝකයයි.

598 වෘතෙත මහති සඞ්ග්‍රාමෙ රාඥෝර්නිහතසේනයොඃ
ස්ථිතාභ්‍යාං ගෘධ්‍රචක්‍රාභ්‍යාං වාචා සන්ධිඃ කෘතඃ ක්ෂණාත්.

මහති, මහත්වූ; සඞ්ග්‍රාමෙ, යුද්ධය; වෘතෙත, පවත්නාකල්හි; රාඥොඃ, රජහුදෙදෙනාගේ; නිහතසෙනයොඃ, නස්නාලද සෙනාවඇති කල්හි; ස්ථිතාභ්‍යාං, සැක දුරුකරන්නාවූ; ගෘධ්‍රචක්‍රාභ්‍යාං, ගිජුලිහිනි—චක්‍රවාකයනමොහු දෙදෙනාවිසින්; වාචා, වචනයෙන්; ක්ෂණාත්, ඇසිල්ලෙකින්; සන්ධිඃ, ගැළපීමයෙම; කෘතඃ, කරණලදී.

මනාකොට යොදනලද කටයුත්ත වාසනාව හෙතුකොට ගෙණ නස්නාබව.

599 අපරාධඃ ස දෛවස්‍ය න පූනර්මන්ත්‍රිණාමයම්
කාය්‍යීං සුඝටිතඃ යතනාත් දෛවයොගාද්විනශ්‍යති.

සඃ අයංඅපරාධඃ, ඒ මේ අපරාධයතෙම; දෛවස්‍ය, වාසනාවගේ වන්නේය; මන්ත්‍රිණාම්පුනඃ, අමාත්‍යයන්ගේ වනාහි; න, නොවේ. යත්නාත්, උත්සාහයෙන්; සුඝටිතම්. මනාකොට ගළපනලද්දුවූ; කාය්‍යීම්, කටයුත්තතෙම; දෛවයොගාත්, වාසනාවයෙදීමෙන් විනශ්‍යති, නැසේ.

විෂමවූ අවස්ථාවටපැමිණ මනුෂ්‍යයන් වාසනාවට ගර්හාකරණ බවහා අඥානයන් තමන්ගේ කර්මදොෂය නොදන්නාබව.

600 විෂමාං හි දශාං ප්‍රාප්‍ය දෛවං ගර්හයතෙ නරඃ
ආත්මනඃ කර්මදොෂාංස්තු නෛව ජානාත්‍යපණ්ඩිතඃ.

නරඃ, මනුෂ්‍යතෙම; විෂමාංදශාංහි, විෂමවූ අවස්ථාවට වනාහි; ප්‍රාප්‍ය, පැමිණ; දෛවම්, වාසනාවට; ගර්හයතෙ, නින්දාකෙරේ. අපණ්ඩිතඃ, අඥානතෙම; ආත්මනඃ, තමාගේ, කර්මදොෂාන්තු, කර්මදොෂයන් වනාහි; නජානාතිඑව, නොදනීමය.

කථාවකගේ මාතෘකා ශ්ලෝකයෙක්.

601 සුහෘදාං හිතකාමානාං යො වාක්‍යං නාභිනන්දති
ස කූර්ම ඉව දුර්බුද්ධිඃ කාෂ්ඨාද්භ්‍රෂ්ටො විනශ්‍යති.

යඃ, යමෙක්තෙම; හිතකාමානාම්, වැඩකැමතිවූ; සුහෘදාම්, මිත්‍රයන්ගේ; වාක්‍යම්, වචනයට; නාභිනන්දති, සතුටුනොවේද; සඃ, හෙතෙ

ම; කාෂ්ඨාත්ග්‍රහණඃ. දණ්ඩකෙරෙන් වැටුනාවූ; ද්‍රුබ්ධිඃ, නුවණමදවූ; කූ
ර්මඃඉව, ඉදිබුවාමෙන්; විනශ්‍යති, නැසේ. *

කථාවකගේ මාතෘකාවක්.

602 අනාගතවිධාතා ච ප්‍රත්‍යුත්පන්නමතිස්තථා
ද්වාවෙතෞ සුඛමේධෙතෙ යද්භවිෂ්‍යො විනශ්‍යති.

අනාගතවිධාතාච, අනාගත විධාතානම් මත්ස්‍යද; තථා, එසේම; ප්‍ර
ත්‍යුත්පන්නමතිඃ, ප්‍රත්‍යුත්පන්නමතිනම් මත්ස්‍යදයන; එතෞවෞ, මේ

* මගධ දෙශයෙහි—ඵුල්ලොත්පල—යන නම් ඇති විලෙක් ඇත්තේය. එහි සංකට-විකට යන නම් ඇති හංසයෝ දෙදෙනෙක් බොහෝ කාලයක පටන් වසත්. ඒ හංසයන් දෙදෙනාගේ මිත්‍රවූ කම්බුග්‍රීව නම් ඉදිබුවෙක් වෙසෙයි. පසුව එක් දිනයෙක්හි කෙවුලන් විසින් එහි අවුත් අප විසින් අද වාසයකොට උදය මෙහි මත්ස්‍ය ඉදිබු ආදීහු නැසිය යුත්තාහුයයි කියනලද්දේය. ඉදිබුතෙම ඒ අසා මිත්‍රවරුනි කෙවුලන්ගේ මේ වචනය තෙම අසනලද්දේය. දැන් මා විසින් කුම ක් කටයුතුදැයි හංසයන්ට කීයේය. යමක්සුදුසුද ඒතෙම පසුව කටයුතුවෙයි. ඒකා ක් දන්නා ලැබේවයි හංසයෝ දෙදෙන කීවෝය. එකල්හි ඉදිබු තෙම යම් කාර ණයෙකින් මම් මෙහි දක්නාලද විපත්ති ඇත්තෙම්ද එහෙයින් මම අන් ගැඹුරු ජලයක් කරා යම් ලෙසකින් පැමිණෙම්ද ඒ තෙම අද කරණු ලැබේවයි කියයි. ජ ලස්ථානයක් අලට පැමිණී කල්හි තට මංගල්‍යයවෙයි. ගොඩතැන්හි යන්නාවූ තාගේ විධිය කවරේදැයි හංසයෝ කීවෝය. මම යම් ලෙසකින් පින්වතුන් දෙදෙ නා හා සමග ආකාශ මාර්ගයෙන් යෙම්ද ඒ උපායතෙම කරණුලැබේවයි ඉදිබු තෙම කියයි. උපාය කෙසේ ලැබේදැයි හංසයෝ කියත්. එකල්හි ඉදිබු තෙම නුඹ ලා දෙදෙනා විසින් හොටවලින් අල්වා ගන්නාලද්දවූ එක්දණ්ඩක් මා විසින් මු ඛයෙන් එල්බ ගතයුතුය. පසුව පින්වතුන් දෙදෙනාගේ ගමන කිරීමේ බලයෙන් මා විසින්ද සැපසේ යායුතුයයි කියයි. මේ තෙම උපාය වේවා, අප දෙදෙනා විසි න් ගෙණයනු ලබන්නාවූ තා දැක ලොකයා විසින් කිසිවක් කියයුතුමය ඒඅසා ඉ දින් තෝ උත්තරදෙන්නෙහිද එකල්හි තාගේමරණය වන්නේය. එබැවින් සියලු ලෙසින් මෙහිම සිටිනුලැබේවයි හංසයෝදෙදෙනාකීවි. ඉදිබුතෙම ඒකුමක්ද මම අඥානයෙක්ද මාවිසින් කිසිවකුදු නොකියයුතුයයි කියයි. පසුව මෙසේසිටිකල්හි ආකාශයෙහි ගෙණයනු ලබන්නාවූ ඒ ඉදිබුවංබලා සියලු ගව්පාලකයෝ පසුභාග යෙහිදුවත්. විස්මයෙක මහත් ආශ්චර්යයීයෙක පක්ෂින් දෙදෙනාක්විසින් ඉදිබුවෙක් උසුලනු ලැබෙයි යනුද කියත්. ඉදින් මේ ඉදිබු තෙම වැටේද එකල්හි මෙහිම පි ස කැයුතුයයි එහි කිසිවෙක් කියයි. ගෙට ගෙණ ගියයුතුයයි කිසිවෙක් කියයි. විල කගේ සමීපයෙහි පිසකෑයුතුයයි කිසිවෙක් කියයි. ඒ පරුෂ වචනය අසා ක්‍රොධ යෙන් සිහිමුලාවූ ඉදිබුතෙම තෙපි විසින් අලු කෑයුතුයයි කීයේය. කියන්නේම ද ණ්ඩ කෙරෙන් වැටුනේ ගොපොල්ලන් විසින් නසනලද්දේය.

මත්ස්‍යයෝ දෙදෙන; සුඛං, සැපත; එධෙතෙ, සිඛකෙරෙත්; යද්භවිෂ්‍යඃ, යද්භවිෂ්‍යනම් මත්ස්‍යතෙම; විනශ්‍යති, නැසෙයි. *

603 උත්පන්නාමාපදං යස්තු සමාධත්තෙ ස බුද්ධිමාන්

වණිජො භාර්‍ය්‍යයා ජාරඃ ප්‍රත්‍යක්ෂෙ නිහ්නුතො යථා.

වණිජඃ, වෙළඳහුගේ; භාර්‍ය්‍යයා, අඹුවවිසින්; ජාරඃ, සොරසැමියෙතෙම; ප්‍රත්‍යක්ෂෙ, ඇස්හමුයෙහි; යථා නිහ්නුතඃ, යම්සේ සඟවනලද්ද (එමෙන්); යඃතු, යමෙක් වනාහි; උත්පන්නාං ආපදම්, හටගත්තාවූ විපත්තිය; සමාධත්තෙ, ගළපාද; සඃ, හෙතෙම; බුද්ධිමාන්, නුවණැත්තේවේ. †

---

* මගධ දෙශයෙහි ඵුල්ලොත්පල යන නාම් ඇති විලෙක් ඇත්තේය. ඒ විලෙහි අනාගත විධාතා යන නාම් ඇති මත්ස්‍යයෙක් හා ප්‍රත්‍යුත්පන්නමති නාම් මත්ස්‍යයෙක්ද යද්භවිෂ්‍ය නාම් මත්ස්‍යයෙක්දැයි මත්ස්‍යයෝ තුන්දෙනෙක් වෙසෙත්. එකල්හි එක්දිනක් ඒ විල සමීපයට කෙවුලන් එළඹ සිටි කල්හි මසුන් තුන් දෙනා විසින් මෙසේ දක්නා ලද්දේය. එහි අනාගත විධාතා නාම් මත්ස්‍යයා විසින් මම වනාහි ජලය මධ්‍යයට යෙමියි කියනලද්දේ ගැඹුරු ජලය අතරට ගියේය. අනික් ප්‍රත්‍යුත්පන්නමති යන නාම් ඇති මත්ස්‍යයා විසින් සිඬනුවූ කාරණයාගේ ප්‍රමාණයක් නැති බැවින් මාවිසින් කොතැන්හි යායුතුද එහෙයින් කටයුත්ත හටගත් කල්හි කටයුත්තට සුදුසු පරිද්දෙන් පැවතිය යුතුයයි කියනලද්දේ පසුව යද්භවිෂ්‍ය නාම් මත්ස්‍යයා විසින් යමක් නොවන්නේද ඒතෙම නොවෙයි යමක් ඉදින් වේද ඒතෙම අන්පරිද්දෙකින් නොවෙයි කියනලද්දේය. පසුව උදය දැලෙන් බඳනා ලද්දවූ ප්‍රත්‍යුත්පන්නමති නාම් මත්ස්‍ය තෙම තමාමළ තැනැත්තක්හු මෙන් දක්වා සිටියේය. නැවත දැල කෙරෙන් පහකරණ ලද්දේ ගොඩ කෙරෙන් උඩපැන ගැඹුරු දියට වන්නේය. යද්භවිෂ්‍ය නාම් මත්ස්‍යතෙම පැමිණියේ කෙවුලන් විසින් මරණලද්දේය.

† වික්‍රම පුරයෙහි සමුද්‍රදත්තනාම් වෙළෙන්දෙක් ඇත්තේය. ඒ වෙළෙන්දාගේ රත්නප්‍රභා නාම් අඹුතොමෝ කිසියම් තමන්ගේ සෙවකයෙක්හු හාසමඟ සැමකල්හි ඇලෙයි. ඉක්බිත්තෙන් ඒ රත්නප්‍රභා තොමෝ ඒ සෙවකයාගේ මුඛයෙහි වැළඳ ගැන්ම දෙනා තැනැත්තී සමුද්‍රදත්ත නාම් වෙළෙන්දා විසින් දක්නා ලද්දීය. ඉක්බිත්තෙන් ඒ වෙශී තොමෝ වහා ස්වාමි පුරුෂයාගේ සමීපයට එළඹ ස්වාමිය මේ මෙහෙකරුවාගේ නුසුදුසු පැවතුම් මහත්වන්නීය. නුඹගේ ප්‍රයොජනය පිණිස ගෙණ ආවාවූ කපුරුකකයි. මොහුගේ මුඛයෙහි කපුරු සුවඳ ප්‍රත්‍යක්ෂවෙයි, මාවිසින් සිඹිනාලද්දේයයි කිය. ඒ අසා සෙවකයා විසින්ද කිපී යමක්හුගේ ගෙයි අඹුතොමෝ මෙබඳුවිද යම් තැනෙක්හි අඹුතොමෝ සෙවකයාගේ මුඛය සිඹිද එහි සෙවකයා විසින් කෙසේ විසියයුතුවේදැයි කියනලද්දේය. නැවත මේ තෙම නැගිට ගියේය. ඉක්බිත්තෙන් මේතෙම පණ්ඩිතයන් විසින් උත්සාහයෙන් අගවා දරණ ලද්දේය.

කථාවකගේ මාතෘකා ශ්ලෝකයෙක්.

604 උපායං චින්තයන් ප්‍රාඥඃස්වපායමපි චින්තයෙත්
පශ්‍යතො වකමූර්ඛස්‍ය නකුලෛර්භක්ෂිතාඃ සුතාඃ.

උපායං, උපාය; චින්තයන්, සිතන්නාවූ; ප්‍රාඥඃ, නුවණැති තැනැත්තේ වනාහි; අපායංඅපි, හානියද; චින්තයෙත්, සිතන්නේය. පශ්‍යතඃ, දක්නාවූ; වකමූර්ඛස්‍ය, අඥානකොකාහට ආදරනොකොට; නකුලෛඃ, මුගටින්විසින්; සුතාඃ, දරුවෝ; භක්ෂිතාඃ, කනලද්දාහුයි. *

ප්‍රේමය හෙතුකොටගෙණහෝ උපකාර හෙතුකොටගෙණහෝ
සතුරන්කෙරෙහි විශ්වාසකිරීමෙන් විපත්තිය
එළවන බව.

605 ප්‍රණයාදුපකාරද්වා යො විශ්වසිති ශත්‍රුෂු
ස සුප්ත ඉව වෘක්ෂාග්‍රාත් පතිතඃ ප්‍රතිබුධ්‍යතෙ.

ප්‍රණයාත්, ප්‍රේමය හෙතුකොටගෙණහෝ; උපකාරත්වා, උපකාර හෙතුකොටගෙණහෝ; යඃ, යමෙක්තෙම; ශත්‍රුෂු, සතුරන්කෙරෙහි; විශ්වසිති, විශ්වාසකෙරේද; සඃ, හෙතෙම; වෘක්ෂාග්‍රාත්, ගස්මුදුනක් කෙරෙන්; පතිතඃ, වැටුනාවූ; සුප්තඃඉව, නිදනලද්දෙක්මෙන්; ප්‍රතිබුධ්‍යතෙ, පුබුදී.

කරණලද කටයුතුඇති ඇමතියාවිසින් කරණලද්දක් නොන
සා ඔහු සතුටුකරන්නේය යනබව.

606 කෘතකෘත්‍යස්‍ය! භෘත්‍යස්‍ය කෘතං නෛව ප්‍රණශයෙත්
ඵලෙන මනසා වාචා දෘෂ්ට්‍යා චෛනං ප්‍රහර්ෂයෙත්.

කෘතකෘත්‍යස්‍ය, කරණලද කටයුතුඇති; භෘත්‍යස්‍ය, ඇමතියාවිසින්; කෘතං, කරණලද්ද; නෛවප්‍රණශයෙත්, නොනසන්නේය. ඵලෙන,

* උත්තරපථයෙහි ගෘධ්‍රකූටනාම් පර්වතයෙක්ඇත්තේය. එහි මහාම්ද නාදී ඉවුරෙහිවූ නුගගසෙක්හි කොක්කු වසත්. ඒ නුගවෘක්ෂයාගේ යට භාගයෙහිවූ සිදුරෙක්හි සර්පයෙක් සිටියි. ඒ සර්පතෙමේද කොකුන්ගේ බාලවූ දරුවන්කයි. පසුව ශොකයෙන් පීඩිතවූ කොකුන්ගේ ප්‍රලාපය අසා කිසි මහලු කොකෙක් විසින් පින්වත්නි තොපි මසුන් ගෙණවුත් මුගටියන්ගු වසනා බිලයක් පටන් සර්පයන්ගු වසනා බිලය දක්වා පිළිවෙළින් එකඑකා මසුන් විසුරුවාතබව්. එකල්හි ඒ ආහාර මාර්ගයෙන් මුගටියා විසින් අවුත් දක්කයුතුය, ස්වභාවයෙන්වූ ක්‍රොධය හෙතුකොට ගෙණ සර්පතෙම නැසිය යුතුයයි කියනලද්දේය, එසේ කල්හි ඒකාරණය සිදුවූයේය. එකල්හි මුගටින් විසින් ගස් මුදුනෙහි පක්ෂිපැටවුන්ගේ ශබ්දය අසනලද්දේය. පසුව ඒ මුගටියා විසින් කොක්පැටව් කනලද්දාහුය.

ඵලයෙන්ද; මනසා, සිතින්ද; වාචා, වචනයෙන්ද; දෘෂ්ට්‍යාච, බැලීමෙන්ද; එනම්, මොහු; ප්‍රහර්ෂයෙන්, සතුටුකරන්නේය.

නීචයන්ට කරණලද උපකාරයෙහි අනිස්ථිරභාවය.

607 අධිකාරෙණ යො ශුකතඃ කථං තස්‍යාස්ති බන්ධනම්
නීචෙෂූපකෘතං රජන් වාලුකාස්විව මුද්‍රිතම්.

යඃ, යමෙක්තෙම; අධිකාරෙණ, ස්වාමිභාවයෙන්; ශුකතඃ, ශුකනද: තස්‍ය, ඔහුගේ; බන්ධනම්, බිඳීම; කථම්අස්ති, කෙසේ ඇත්තේද; රජන්, මහරජ; නීචෙෂු, අධමයන් කෙරෙහි; උපකෘතම්, කරණලද උපකාරය; වාලුකාසු, වැලිමත්තෙහි; මුද්‍රිතම්ඉව, මුද්‍රාඞ්කණ කරණලද්දක් මෙනි.

කථාවකගේ මාතෘකා ශ්ලෝකයෙක්.

608 නීචඃ ශ්ලාඝ්‍යපදං ප්‍රාප්‍ය ස්වාමිනං ලොප්තුමිච්ඡති
මූෂිකො ව්‍යාඝ්‍රතාං ප්‍රාප්‍ය මුනිං හන්තුං ගතො යථා.

නීචඃ, අධම පුරුෂතෙම; ශ්ලාඝ්‍යපදම්, ප්‍රශංසා කටයුතු තනතුරට; ප්‍රාප්‍ය, පැමිණ; ස්වාමිනම්, ස්වාමියා; ලොප්තුම්, නසන්ට; ඉච්ඡති, කැමතිවෙයි. මූෂිකඃ, මීතෙම; ව්‍යාඝ්‍රතාං, ව්‍යාඝ්‍රබවට; ප්‍රාප්‍ය, පැමිණ; මුනිං, ඍෂියා; හන්තුම්, නසන්නු පිණිස; යථාගතඃ, ගියාමෙනි. *

කථාවකගේ මාතෘකා ශ්ලෝකයෙක්-

609 භක්ෂයිත්වා බහූන් මත්ස්‍යානුත්තමාධමමධ්‍යමාන්
අතිලෞල්‍යාද්වකො මූඪො මෘතඃ කර්කටකග්‍රහාත්.

---

* ගෞතම වනයෙහි මහා තපස්නම් ඍෂියෙක් ඇත්තේය, ඒ ඍෂි විසින් පත්සල සමීපයෙහි කවුඩන්ගේ මුඛයෙන් වැටුනාවූ මීපැටවෙක් දක්නා ලද්දේය, එකල්හි අනුකම්පා ඇත්තාවූ ඒ ඍෂි විසින් තෘණ ධාන්‍ය කැබලිවලින් මීයා වඩනා ලද්දේ; ඒ මීයා කැමට දුවන්නාවූ බලලෙක් ඍෂි විසින් දක්නා ලද්දේය. පසුව තපස් බලයෙන් ඒ ඍෂි විසින් මීතෙම අතිශයින් බලඇත්තාවූ බලලෙක් කරණ ලද්දේය. ඒ බලල්තෙම බල්ලකු කෙරෙන් භයවෙයි, එකල්හි මේ බලල්තෙම බල්ලෙක්කරණ ලද්දේය, බල්ලාහට ව්‍යාඝ්‍රයක්හු කෙරෙන් මහත් භයවෙයි ඊටපසු ඒ බලුතෙම ව්‍යාඝ්‍රයෙක්කරණ ලද්දේය. එකල්හි ඍෂිතෙම ඒ මීයා මීයා මෙන් දකී. පසුව එහි ආවාවූ සියලු ජනයෝ ඒ ව්‍යාඝ්‍රයා දැක මේ ඍෂි විසින් මේ මීයා ව්‍යාඝ්‍ර බවට පැමිණවූයේයයි කියත්. මේ කථාව අසා ඒ ව්‍යාඝ්‍රතෙම ව්‍යාකූල සහිත වූයේ මේ ඍෂි විසින් යම්තාක්කල් ජීවත්විය යුතුද එතාක් මේ මාගේ ස්වරූපය කියන්නාවූ නින්දා උපදවන කථාව නැතිනොවන්නේයයි මෙසේසිතා ඍෂියා නැසීමට උත්සාහ කෙළේය: ඍෂිතෙම ඔහුගේ කරණු කැමැත්තදැන නැවත මීයා වේවයි කියා මීයාමකෙළේය.

උත්තමාධමමධ්‍යමාන්, උත්තම අධමමධ්‍යමවූ; බහුන්මත්ස්‍යාන්, බොහෝ මසුන්; භක්ෂයිත්වා, කා; භූයඃවකඃ, අඥනාවූ කොක්තෙම; අති ලෝලත්‍යාත්, අධිකවූ ලොභය හෙතුකොටගෙණ; කර්කටකග්‍රහාත්; කකුළුවාගේ ගැණීමෙන්; මෘතඃ, මළේය. *

උපකාර කරන්නාවූ සතුරහා මිත්‍රවියයුතුය අනුපකාර කරන්නාවූ මිත්‍රයාහා නොගැළපිය යුතුය යනබව.

610 උපකත්‍රාරිණා සන්ධිනී මිත්‍රෙණාපකාරිණා
උපකාරාපකාරෞ හි ලක්‍ෂ්‍යං ලක්‍ෂණමෙතයොඃ.

උපකත්‍රා, උපකාරකරන්නාවූ; අරිණා, සතුරහා සමග, සන්ධිඃ, ගැළපියයුතු; අපකාරිණා, අනුපකාර කරන්නාවූ; මිත්‍රෙණ, මිත්‍රයාහා සමග; න, මිත්‍රනොවියයුතුය; උපකාර අපකාරෞහි, උපකාර අනුපකාර දෙක වනාහි; එතයොඃ, මේ සතුරු මිතුරු දෙදෙනාගේ; ලක්‍ෂ්‍යම්, අවබොධ කටයුතුවූ; ලක්‍ෂණම්, ලකුණයි.

* මාලවදෙශයෙහි පද්මගර්භ යනා නම් ඇති විලෙක් ඇත්තේය. ඒ විලෙහි එක් මහළු කොකෙක් ශක්තිනැත්තේ තමා කලකිරුණු එකෙක් මෙන් ප්‍රකාශ කොට සිටියේය. කිසි කකුළුවකු විසින් ඒ කොක්තෙමේද පින්වත්තෙම මෙහි ආහාර හැර්මෙන් වැළකී කුමට සිටීදැයි දුරදිම විචාරණ ලද්දේය. මත්ස්‍යයෝ මාගේ ජීවත්වීමට හෙතුවෙත්. මේ විල්හි මත්ස්‍යයෝ එකාන්තයෙන්ම කෙවිලන් විසින් මැරියයුතුයයි නුවර සමීපයෙහි කෙවිලන්ගේ කථාවක් අසනා ලද්දේය, එහෙයින් මෙයින් ජීවත්වීමට වියදම නැතිබැවින් මාගේ මරණය එළඹ සිටියේයයි දැන ආහාරයටද අලය නොකරණ ලදැයි කොකා විසින් කියනාලද්දේය. එකල්හි සියලු මසුන් විසින් දක්නාලද්දේය. මේ කොක්තෙම මේ කාලයෙහි වනාහි අපට උපකාරකරන්නෙකැයි කියාම දක්නාලැබේ; එබැවින් කටයුතු විධිය මේ කොකාම විචාරණු ලැබේවයි එම්බා කොකානාණි අපගේ රක්‍ෂාවන්නාවූ උපාය කොතැන්හිදැයි මත්ස්‍යයෝ කිවෝය: රක්‍ෂාවීමට හෙතුවූ ජලය තිබෙණ තැනෙක් ඇත්තේය. එහි මම තෙපි එකඑකා බැගින් ගෙණයමි කොක්තෙම කියයි. මසුන් විසින්ද කියනාලද කාරණය එසේවේවයි කියනා ලද්දේය. පසුව මේ දුෂ්ටවූ කොක්තෙම ඒ මසුන් එක එකා ගෙණගොස් කිසිතැනෙක්හිදී කා නැවත අවුත් ඒ මත්ස්‍යයෝ මා විසින් දියතිබෙනා තැනෙක්හි සිටුවනා ලද්දැහුයයි කියයි. පසුව කකුළුවාද පින්වත් කොකානනි මාද එහි ගෙණයවයි කොකාට කීය. එකල්හි කොකාද පෙරනොකනා ලද කකුළු මාංස කැමැත්තේ ආදර සහිතව කකුළුවා ගෙණගොස් ගොඩතැනෙක්හි තබාගත්තේය, කකුළුවාද මසුන්ගේ ඇටවිලින් හැවයි ගත්තාවූ භූමියදැක විෂමයෙක පින්නැත්තේ නාවුයෙමි, ඒ එසේ වේවා දැන් මම කාලයට සුදුස්සක් ව්‍යවහාරකරමියි සිතුයේය. මෙසේ සිතා ඒ කකුළුතෙම ඒ කොකාගේ බෙල්ල සින්දේය, කොකාද මියගියේය.

හයපැමිණීමට පළමුවෙන් භයවිය යුතුබවත් පැමිණි භයදැක
භයනැත්තක්හුමෙන් ගැසිය යුතුබව.

611 තාවද්භයාත් තු භෙතව්‍යං යාවද්භයමනාගතම්
ආගතං තු භයං දෘෂ්ට්වා ප්‍රහර්තව්‍යමභීතවත්.

භයාත්තු, භයඑළවියයුතු කාරණය හෙතුකොටගෙණ; යාවත්, යම් තාක්; භයම් අනාගතම්, භය නොපැමිණියේද; තාවත්, ඒ තාක්; හෙතව්‍යම්, භයවියයුතුය. ආගතම්භයම්, පැමිණි භය; දෘෂ්ට්වාතු, දැක වනාහි; අභීතවත්, භයනැත්තක්හුමෙන්; ප්‍රහර්තව්‍යම්, පහරදියයුතුය.

සටන්කරණ තැනැත්තා තමහට වැඩක් නොදක්නාකල්හි
මිය යන බව.

612 අභියුක්තො යදා පශ්‍යෙන්න කිඤ්චිද්ගතිමාත්මනඃ
යුධ්‍යමානස්තදා ප්‍රාඥො ම්‍රියතෙ රිපුණා සහ.

අභියුක්තඃ, සටන්කරණලද තැනැත්තේ; ආත්මනඃ, තමහට; කිඤ්චිත්ගතිම්, කිසිවැඩක්; යදා, යම්කලෙක්හි; නපශ්‍යෙත්, නොදක්නේද; තදා, එකල්හි; යුධ්‍යමානඃ, යුධකරණ්නු ලබන්නාවූ; ප්‍රාඥඃ, පණ්ඩිතතෙම; රිපුණාසහ, සතුරාහා සමග; ම්‍රියතෙ, මියයේ.

කළුවකගේ මාතෘකා ශ්ලොකයෙක්.

613 අනාගතවතීං චින්තාං කෘත්වා යස්තු ප්‍රහෘෂ්‍යති
ස තිරස්කාරමාප්නොති භග්නභාණ්ඩො ද්විජො යථා.

යස්තු, යමෙක් වනාහි; අනාගතවතීම්, මතුකාලයෙහි පැවතිය යුතුවූ; චින්තාම් කෘත්වා, සිතිවිලිකොට; ප්‍රහෘෂ්‍යති, සතුටුවේද; සඃ, හෙතෙම; භග්නභාණ්ඩඃ, බිඳුනාවූ භාණ්ඩඇති; ද්විජඃයථා, බ්‍රාහ්මණයාමෙන්; තිරස්කාරම්, පීඩාවට; ආප්නොති, පැමිණේ. *

* දෙවකොට්ට නුවරෙහි දෙවශර්මන්නම් බ්‍රාහ්මණයෙක් ඇත්තේය ඔහු විසින් මෙෂසංක්‍රාන්ති දිනයෙහි විලඳසුණු පිරුණු මණ්ඩියක් ලබණ ලද්දේය. නැවත ඒ මණ්ඩිය ගෙණ මේ බ්‍රාහ්මණතෙම බඩුවලින් පිරුණු කුම්භකාරයක්හුගේ මණ්ඩපයෙක්හි රෞද්‍රභාවයෙන් ආකුලවූයේ සැතපුනේය. නැවත විලඳසුණු රක්‍ෂාකරණු පිණිස අතට දණ්ඩක් ගෙණ මෙසේ සිතුයේය. ඉදින් මම මේ විලඳසුණු මණ්ඩිය විකුණා සල්ලිදෙකක් මුදල් ලබන්නෙම්ද එකල්හි ඒසල්ලිදෙකින් මේ කාලයෙහිකල මණ්ඩි ඇදීයගෙණ නොයෙක් පරිද්දෙන් වැඩුනාවූ ඒ ධනවලින් නැවත නැවත පුවක් වස්ත්‍රාදියගෙණ විකුණ වෙළඳම්කොට ලක්‍ෂගණන් ධනයන් උපදවා ස්ත්‍රීන් සතරදෙනෙක් විවාහකෙරෙම් පසුව ඒ ස්ත්‍රීන් අතුරෙහි යම්

### රජහුගේ නුසුදුසු පැවැත්මක් ඇතිකල්හි සේනාපති ආදීන් විසින් රජුට නින්දා කටයුතුබව.

614 මදොද්ධතස්‍ය නෘපතෙඃ ප්‍රකීර්ණස්‍යෙව දන්තිනඃ
ගච්ඡන්ත්‍යුන්මාර්ගයාතස්‍ය නෙතාරඃ ඛලු වාච්‍යතාම්.

මදොද්ධතස්‍ය, මදයෙන් දුෂ්ටවූ; ප්‍රකීර්ණස්‍ය, වික්ෂිප්තවූ; දන්තිනඃඉව, හස්තියාටමෙන්; උන්මාර්ගයාතස්‍ය, නොමගයන්නාවූ; නෘපතෙඃ, රජු ට; නෙතාරඃ, සේනාපති ආදීහු; ඛලු, ඒකාන්තයෙන්; වාච්‍යතාම්, නින්දාකටයුතුබවට; ගච්ඡන්ති, යෙත්.

### යමක් රජහට අප්‍රියනමුදු ඒය වැඩ එළවන්නේනම් එහි යොදවන්නාවූ ඇමතියා මනාය යනබව.

615 යො හි ධර්මං පුරස්කෘත්‍ය හිත්වා භර්තුඃ ප්‍රියාප්‍රියම්
අප්‍රියාණ්‍යාහ පථ්‍යානි තෙන රාජා සහායවාන්.

යොහි, යම් ඇමතියෙක් වනාහි; ධර්මංපුරස්කෘත්‍ය, ධර්මය මුල්කොට; භර්තුඃ, ස්වාමියාහට; ප්‍රියාප්‍රියම්, ප්‍රිය අප්‍රිය දෙක; හිත්වා, (නොතකා) හැර; අප්‍රියාණි, (රජහට) අප්‍රියවූ; පථ්‍යානි, හිතවූ කාරණයන්; ආහ, කියාද; තෙන, ඒ ඇමතියාහා සමග; රාජා, රජතෙම; සහායවාන්, මිත්‍රසං වග ඇත්තේ වන්නේය.

### සැකවූ ජයඇතිකල්හි සමානවූ බලඇත්තාහා සමගද මිත්‍රවිය යුතුබව.

616 සන්ධිමිච්ඡෙත් සමෙනාපි සන්දිග්ධො විජයො යුධි
න හි සංශයිතං කුර්‍ය්‍යාත් ඉත්‍යුවාච බෘහස්පතිඃ.

යුධි, සටනෙහි; සන්දිග්ධඃ, සැකවූ; විජයඃ, ජයඇත්තේද; සමෙනාපි, සමවූ බලඇති රජක්හුහා සමගද; සන්ධිම්, මිත්‍රබව; ඉච්ඡෙත්, කැමතිවන්නේය. සංශයිතම්, සැකයට ස්ථානවූ සටන; නකුර්‍ය්‍යාත් නොකරන්නේය. ඉති, මෙසේ; බෘහස්පතිඃ, බෘහස්පතිතෙම; උවාච, කීයේය.

---

සප්‍රියක් රූපශ්‍රීයෙන් හා තරුණ අවස්ථාවෙන්ද යුක්තද ඈ කෙරෙහි අධිකව ඇල්ම කෙරෙමි, ඉන්පසු හටගත්තාවූ රාගය ඇති ඒ අන්‍ය අඹුවෝ ඔවුනොවුන් යම් දිනයෙක්හි බබර කෙරෙද්ද එකල්හි මම කොපයෙන් කැලඹී සියලු අඹුවන්ට පොල්ලෙන් තළන්නෙමියි. මෙසේකියා ඔහු විසින් පොල්ල දමනලද්දේ විලඳසුණු මණ්ඩය සුණුවූයේ භාණ්ඩයෝද බිඳුනාහුය. පසුව බිඳුනාවූ භාණ්ඩයන්ගේ ශබ්දය ඇසීමෙන් ආවාවූ කුඹලා විසින් බොටුව අල්වා මණ්ඩපයෙන් බමුණා පිටත්කරණලද්දේය.

## සැකයන් යුධ නොකටයුතුබව.

617 සුහෘද්බලං තථා රජ්‍යමාත්මානං කීර්ත්තිමෙව ච
යුධි සන්දෙහදොලස්ථං කො හි කුර්‍ය්‍යාදබාලිශඃ.

යුධි, සටනෙහි, සුහෘද්, මිත්‍රද; බලම්, සෙනඟද; තථා, එසේම; රජ්‍යම්, රජ්‍යයද; ආත්මානම්, තමාද; කීර්ත්තිම්එවච, කීර්ත්තියද; සන්දෙහදොලස්ථම්, සැකනැමැති දොලාවෙහි සිටියක්; අබාලිශඃ, අඥානනුවූ; කඃහි, කවරෙක් වනාහි; කුර්‍ය්‍යාත්, කරන්නේද.

### කථාවකගේ මාතෘකා ශ්ලොකයෙක්.

618 යුධෙ විනාශො භවති කදාචිදුභයොරපි
සුන්දොපසුන්දාවන්‍යොන්‍යං සමවීර්‍ය්‍යෞ හතෞ න කිම්.

යුධෙ, සටනෙහි; කදාචිත්, කිසිකලෙක්හි; උභයොඃ අපි, දෙපක්‍ෂයාගේම; විනාශඃභවති, විනාශයවෙයි. සමවීර්‍ය්‍යෞ, සමානවූ වීර්‍ය්‍යඇති; සුන්දොපසුන්දෞ, සුන්දඋපසුන්දයන දෙදෙන; අන්‍යොන්‍යම්, ඔවුනොවුන්; කිම්නහතෞ, කුමක්ද නොනසන ලද්දාහුද. *

---

* පූර්ව්කාලයෙහි සුන්ද උපසුන්ද යන නම් ඇති සහෝදරවූ අසුරයෝ දෙදෙනෙක් තුන්ලොකයෙහි රජ්‍යය කැමැත්තාවූ මහත් ශරීරදුකින් බොහෝ කාලයෙකින් ඊශ්වරයා සතුටුකළාහුය. පසුව ඔවුන් දෙදෙනාහට ඊශ්වරතෙම සතුටුවූයේ වරයක් ඉල්වවයිකීයේය. නැවත ඔවුන් දෙදෙනාහට ආරූඪවූ සරස්වතිදෙවිය විසින් අනිකක් කියනුලබන්නාවූ ඔවුන් දෙදෙනාලවා ඉදින් අප දෙදෙනාට ඊශ්වරතෙම සතුටුද එකල්හි නුඹවහන්සේගේ දෙවියවූ උමාවදෙනසේක්වයි අනිකක් කියවන ලද්දේය. එකල්හි කිපියාවූ ඊශ්වරයා විසින් වරදීම එකාන්ත බැවින්ද මූලාවූ බැවින්ද උමාදෙවි තොමෝ දෙනලද්දීය. එකල්හි ඒ උමාවගේ රූපශොභාවෙන් ලොභවූ ලොකයා නසන්නාවූ උත්සාහසිත් ඇත්තාවූ පාපයෙන් අන්ධවූ මාගේයයි ඔවුනොවුන් ඩබරකරන්නාවූ සුන්ද උපසුන්ද යන දෙදෙනා කිසියම් නීතිශාස්ත්‍රදත් මධ්‍යස්ථ පුරුෂයෙක් විචාරණු ලැබේවයි අදහස්කළකල්හි ඒ ඊශ්වරතෙම මහලුවූ බ්‍රාහ්මණ වෙශයක් ඇත්තේ එළඹ එහි සිටියේය. පසුව අප දෙදෙනා විසින් මේ උමාතොමෝ ස්වකීය බලයෙන් ලද්දීය, මෝතොමෝ අප දෙදෙනා අතුරෙන් කවරෙක්හට වේදැයි බ්‍රාහ්මණයා විචාළාහුය, ඒ අසා මහලුබමුණුතෙම නුවණින් ප්‍රධානවූ බ්‍රාහ්මණද බලඇත්තාවූ ක්‍ෂත්‍රියද ධනධාන්‍යයෙන් අධිකවූ වෛශ්‍යද බමුණන්ට සේවය කිරීමෙන් ශූද්‍රද පූජ්‍යවෙයි. එබැවින් තොපි ක්‍ෂත්‍රියයෝය තොපට යුධයම නියමවෙයි මෙසේකීකල්හි මොවුහු විසින් කියනලද්දේ මනායයි සලකා සමාන බලඇත්තාවූ ඔහු දෙදෙනා ඔවුනොවුන් නැසීමෙන් එකවිට මියගියෝය.

ක්‍ෂත්‍රියාදි වංශ සතරෙහි උපන්නන් පූජ්‍යවන කාරණය.

619 ඥානශ්‍රෙෂ්ඨො විජඃ පූජ්‍යඃ ක්‍ෂත්‍රියො බලවානපි
ධනධාන්‍යාධිකො වෛශ්‍යඃ ශුද්‍රස්තු විජසෙවයා.

ඥානශ්‍රෙෂ්ඨඃ, නුවණින්ශ්‍රෙෂ්ඨවූ; විජඃ, බ්‍රාහ්මණද; බලවාන්, බල සෙන්ද්‍රකහාවූ; ක්‍ෂත්‍රියඃඅපි, ක්‍ෂත්‍රියයාද; ධනධාන්‍ය අධිකඃ, ධනධාන්‍ය යෙන් වැඩිසිටියාවූ; වෛශ්‍යඃ, වෛශ්‍යද; විජසෙවයාතු, බමුණන්ට සෙවය කිරීමෙන් වනාහි; ශුද්‍රඃ, ශුද්‍රතෙම; පූජ්‍යඃ, පූජ්‍යවෙයි.

මි ත්‍ර ක ට යු තු ස ත් දෙ න.

620 සත්‍යාර්ජවී ධාර්මිකොනාර්‍ය්‍යො භ්‍රාතෘසඞ්ඝාතවාන් බලී
අනෙකයුද්ධවිජයී සන්ධෙයාඃ සප්ත කීර්තිතාඃ.

සත්‍යආර්ජවී, සත්‍යධර්ම ඇත්තාහා උතුම් හැසිරීම් ඇත්තාදයන දෙදෙනාද; ධාර්මිකඃ, ධර්මිෂ්ඨද; අනාර්‍ය්‍යඃ, අධමද; භ්‍රාතෘසඞ්ඝාතවාන්, සහෝදරයන් සමූහයක් ඇත්තාද; බලී, බලඇත්තාද; අනෙකයුද්ධවිජයී, නොයෙක් සටන් ජයගත් තැනැත්තාද; සන්ධෙයාඃ, මිත්‍රකටයුතුවූ; සප්ත, සත්දෙනෙක්; කීර්තිතාඃ, ප්‍රකාශ කරණ ලද්දාහුය.

සත්‍යවචන ඇත්තාගේද උතුම් හැසිරීම් ඇත්තාගේද ස්වභාව.

621 සත්‍යානුපාලයෙත් සත්‍යං සන්ධිතො නෛති වික්‍රියාම්
ප්‍රාණබාධෙපි සුව්‍යක්තමාර්‍ය්‍යො නායාත්‍යනාර්‍ය්‍යතාම්.

සත්‍යඃ, සත්‍යවචන ඇති තැනැත්තේ; සුව්‍යක්තම්, අතිශයින් ප්‍රකටවූ; සත්‍යම්, සැබෑව; අනුපාලයෙත්, රක්නේය; සන්ධිතඃ, කරණලද මිත්‍රබවඇත්තේ; වික්‍රියාම්, වෙනසකට; නඑති, නොපැමිණේ. ආර්‍ය්‍යඃ, පූජ්‍යතැනැත්තේ; ප්‍රාණබාධෙඅපි, ජීවිතයන්ගේ විනාශයෙහිදු; අනාර්‍ය්‍යතාම්, අපූජ්‍යබවට; නආයාති, නොපැමිණේ.

ධර්මිෂ්ඨයාහට සියල්ල යෙදෙනබව.

622 ධාර්මිකස්‍යාභියුක්තස්‍ය සර්වෙ එව හි යුජ්‍යතෙ
ප්‍රජානුරාගාද්ධර්මාච්ච දුඃඛවර්ජ්‍යො හි ධාර්මිකඃ.

අභියුක්තස්‍ය, සටන්කරණලද්දාවූ; ධාර්මිකස්‍ය, සුචරිතයෙහි හැසුරුණහට; සර්වඃ එවහි, සියල්ලම; යුජ්‍යතෙ, යෙදේ. ධාර්මිකඃ, ධර්මයෙහි පිහිටි තැනැත්තේ; ප්‍රජානුරාගාත්, ලොකයාට ඇලීම හෙතුකොටගෙණද; ධර්මාත්ච, ධර්මය හෙතුකොටගෙණද; දුඃඛවර්ජ්‍යඃහි, දුක් නැසිය යුතුමැයි.

විපත්තියක් එළඹසිටිකල්හි අධමයාහා සමගද මිත්‍රවිය යුතුබව.

623 සන්ධිඃ කාය්‍ය්‍යොප්‍යනාය්‍ය්‍යෙණ විනාශෙ සමුපස්ථිතෙ
විනා තස්‍යාශ්‍රයෙණාය්‍ය්‍යඃ නකුය්‍ය්‍යාත්ත කාලයාපනම්.

විනාශෙ, විපත්තියක්; සමුපස්ථිතෙ, එළඹසිටිකල්හි; තස්‍ය, ඔහු ගේ; ආශ්‍රයෙණවිනා, ආශ්‍රයනැතිව; අනාය්‍ය්‍යඃ, අන්කෙ[illegible]; කාලයාපනම්, කාලය ගතකිරීම; නකුය්‍ය්‍යාත්, නොකරන්නේද; (එකල්හි) අනාය්‍ය්‍යෙණඅපි, අධමයාහා සමගද; සන්ධිඃ කාය්‍ය්‍යඃ, මිත්‍රබව කරන්නේය.

බොහෝ සහෝදරයන් ඇත්තාගේ බලය.

624 සංහතත්වාද්‍යථා වෙණුර්නිවිඩඃ කණ්ටකෛර්වෘතඃ
න ශක්‍යතෙ සමුච්ඡෙත්තුං භ්‍රාතෘසංඝාතවාංස්තථා.

කණ්ටකෛඃ, කටුවලින්; වෘතඃ, පිරිවරණලද්දාවූ; නිවිඩඃ, ඝනවූ; වෙණුඃ, උනහෝ බටගසතෙම; සංහතත්වාත්, බැඳී පවත්නාලදබැවින්; සමුච්ඡෙත්තුම්, සිඳින්ට; යථානශක්‍යතෙ, යම්සේනොහැකිද; භ්‍රාතෘසඞ්ඝාතවාන්, සහොදරයන් විසින් පිරිවරණලද තැනැත්තේ; තථා, එසේමැයි.

බලසම්පන්නයාහා සමග සටන් නොකටයුතුය යනබව.

625 බලිනා සහ යොද්ධව්‍යමිති නාස්ති නිදර්ශනම්
ප්‍රතිවාතං න හි ඝනඃ කදාචිදුපසර්පති.

බලිනාසහ, බලඇත්තක්හුහා සමග; යොද්ධව්‍යම්ඉති, යුද්ධකටයුතුය යි; නිදර්ශනම්, උපමාවෙක්; නාස්ති, නැත්තේය; ඝනඃ, මෙඝයාතෙම; ප්‍රතිවාතම්, උඩුසුලඟකරා; කදාචිත්, කිසිකලෙක්හි; නහිඋපසර්පති, නො එළඹේ.

බොහෝ සටන් ජයගත්තහුගේ බලය.

626 ජමදග්නෙඃ සුතස්‍යෙව සර්වඃ සර්වත්‍ර සර්වදා
අනෙකයුද්ධජයිනඃ ප්‍රතාපාදෙව භුජ්‍යතෙ.

ජමදග්නෙඃ, ජමදග්නිඍෂිහුගේ; සුතස්‍යඉව, පුත්‍රවූ පරසුරාමයාහට මෙන්; අනෙකයුද්ධජයිනඃ, නොයෙක් යුද්ධජයගත්තහු විසින්; ප්‍රතාපාත් එව, තෙජස හෙතුකොටගෙණම; සර්වත්‍ර, සියලුතැන්හි; සර්වදා, සැමකල්හි; සර්වඃ, සියල්ල; භුජ්‍යතෙ අනුභවකරණුලැබේ,

627 අනෙකයුද්ධවිජයී සන්ධානං යස්‍ය ගච්ඡති
තත්ප්‍රභාවෙන තස්‍යාශු වශමායාන්ති ශත්‍රවඃ.

අනෙකයුද්ධවිජයී, නොයෙක් යුද්ධ ජයගත් තැනැත්තේ; යස්‍ය, යමක්හුගේ; සන්ධානම්, ගැළපීමටහෝ යෙදීමට; ගච්ඡති, යේද; තත්ප්‍රතාපෙන, ඒ ජයගත්තාලද යුද්ධ ඇත්තහුගේ තෙජයින්; තස්‍ය, ඔහුගේ; ශත්‍රවඃ, සතුරෝ; ආශු, වහා; වශම් ආයාන්ති, අයිතියටහෝ යටත්බවට පැමිණෙත්.

මිත්‍රභාවයට නුසුදුස්සෝ.

628 බාලො වෘද්ධො දීර්ඝරොගී තථා ඥාතිවහිෂ්කෘතඃ
භීරුකො භීරුකජනො ලුබ්ධො ලුබ්ධජනස්තථා.

බාලඃ, ළදරුද; වෘද්ධඃ, මහල්ලාද; දීර්ඝරොගී, බොහෝකල් පවත්නා රොගඇති තැනැත්තාද; තථා, එසේම; ඥාතිවහිෂ්කෘතඃ, නෑයන්විසින් පිටත්කරණලද්දද; භීරුකඃ, භයසුලු තැනැත්තාද; භීරුකජනඃ, භයප්‍රකෘතිවූ සෙනාඇත්තාද; ලුබ්ධඃ, ලොභතැනැත්තාද; තථා, එසේම; ලුබ්ධජනඃ, ලොභවූ සෙනාඇත්තාද.

629 විරක්තප්‍රකෘතිශ්චෛව විෂයෙෂ්වතිසක්තිමාන්
අනෙකචිත්තමන්ත්‍රශ්ච දෙවබ්‍රාහ්මණනින්දකඃ.

විරක්තප්‍රකෘතිඃචඑව, හරණලද ඇමතියන්ඇති තැනැත්තේද; විෂයෙෂු, විෂයරසයන්හි; අතිසක්තිමාන්, අතිශයින් ඇලුනු තැනැත්තේද; අනෙකචිත්තමන්ත්‍රඃච, නොයෙක් කල්පනාහා මන්ත්‍රණඇති තැනැත්තේද; දෙවබ්‍රාහ්මණනින්දකඃ, දෙවියන්ටහා බමුණන්ට නින්දා කරණ තැනැත්තේද.

630 දෛවොපහතකශ්චෛව දෛවචින්තක එව ච
දුර්භික්ෂව්‍යසනොපෙතො බලව්‍යසනසඞ්කුලඃ.

දෛවොපහතකශ්චෛව, නටුවාවූ භාග්‍යඇති නොහොත් භාග්‍යය නැතැයි කියන තැනැත්තේද; දෛවචින්තකඃඑවච, භාග්‍යය සිතන තැනැත්තේද; දුර්භික්ෂව්‍යසනොපෙතඃ, දුර්භික්ෂව්‍යසනයෙන් යුක්ත තැනැත්තේද; බලව්‍යසනසඞ්කුලඃ, සමූහයාගේ විපත්තිවලින් යුක්ත වූ තැනැත්තේද.

631 අදෙශස්ථො බහුරිපුර්යුක්තඃ කාලෙන යශ්ච න
සත්‍යධර්මව්‍යපෙතශ්ච විංශතිඃ පුරුෂා අමී.

අදෙශස්ථඃ, තමන් දෙශයෙහි නොසිටි තැනැත්තේද; බහුරිපුඃ, බොහෝ සතුරන් ඇති තැනැත්තේද; යඃ, යමෙක්තෙම; කාලෙන නයුක්තඃ, සුදුසුකාලයෙහි සටන්කිරීමෙන් යුක්තනොවේද; සත්‍යධර්මව්‍යපෙතඃච, සත්‍යවචනයෙන් පහවූ තැනැත්තේද; අමීවිංශතිඃ, පුරුෂාඃ පුරුෂයෝ මොහු විසිදෙනායි.

632 එතෛඃ සන්ධිං න කුර්වීත විගෘහ්ණීයාත් තු කෙවලම්
එතෙ විගෘහ්‍යමාණා හි ක්ෂිප්‍රං යාන්ති රිපොර්වශම්.

එතෛඃ, මොවුන්හා සමග; සන්ධිං, මිත්‍රභාවය; නකුර්වීත, නොකර න්නේය. කෙවලම්තු, කුමක් කටයුතුදයත්. විගෘහ්ණීයාත්, සටන්කර න්නේය. විගෘහ්‍යමාණාඃ, සටන්කරණු ලබන්නාවූ; එතෙහි, මොහු ව නාහි; ක්ෂිප්‍රම්, වහා; රිපොඃ, සතුරාගේ; වශම්යාන්ති, සන්තකබවට යෙත්.

බාලයා විසින් සටන්කළ නොහෙනබව.

633 බාලස්‍යාල්පප්‍රභාවත්වාන්න ලොකො යොද්ධුමිච්ඡති
ශුභාශුභඵලං යස්මාත් ශ්‍රුතුං ශක්තො න බාලිශඃ.

බාලිශඃ, අඥාන තෙම; ශුභාශුභඵලං, සටන්කිරීමෙහි හෝ සටන් නොකිරීමෙහි ප්‍රයොජන; ශ්‍රුතුං, දැනගන්ට; යස්මාත්ශක්තඃන, යම් හෙයකින් ශක්ති ඇත්තේ නොවේද; බාලස්‍ය, අඥානයා; අල්පප්‍රභාව ත්වාත්, ස්වල්පවූ අනුභාව ඇතිබැවින්; ලොකඃ, ජනතෙම; යොද්ධුං සටන්කිරීමට; නඉච්ඡන්ති, කැමති නොවෙත්.

මහල්ලා හා බොහෝකල් පවත්නා රෙග ඇත්තා විසින්ද
සටන්කළ නොහැකි බව.

634 උත්සාහශක්තිහීනත්වාද් වෘද්ධො දීර්ඝාමයස්තථා
ස්වෛරෙව පරිභූයෙතෙ ද්වාවප්‍යෙතාවසංශයම්.

උත්සාහශක්තිහීනත්වාත්, උත්සාහ ශක්තිනැති බැවින්; වෘද්ධඃ, මහලු තැනැත්තේද; තථා, එසේම; දීර්ඝාමයඃ, බොහෝකල් පවත්නා රෙග ඇති තැනැත්තේදයන; එතෞද්වෞඅපි, මොහු දෙදෙනාම; අසංශය ම්, සැකනැතිව; ස්වෛඃඑව, තමා විසින්ම; පරිභූයතෙ, ගර්හාකරණු ලැබේ.

නෑයන් විසින් හරණලද තැනැත්තාගේ සුවසේ
ජයගත හැකි බව.

635 සුඛොච්ඡෙද්‍යශ්ච භවති සර්වඥාතිබහිෂ්කෘතඃ
ත එවෛනං විනිඝ්නන්ති ඥාතයශ්චාත්මසාත්කෘතාඃ.

සර්වඥාතිබහිෂ්කෘතඃ, සියලු නෑයන් විසින් පිටකරණලද තැනැත් තේ; සුඛඋච්ඡෙද්‍යඃච, සැපසේ නැසිය යුත්තෙක්ද, භවති, වෙයි. ආ ත්මසාත්කෘතාඃ, තමහට අයිතිකරණ ලද්දාවූ; තෙඑවඥාතයඃච, ඒ ඥා තිහුම, එනං, මොහු; විනිඝ්නන්ති, නසත්.

භයසුලු තැනැත්තා හා භයසුලු සෙනාව ඇති තැනැත්තාද
නස්නා බව.

636 භීරුර්යුද්ධපරිත්‍යාගාත් ස්වයමෙව ප්‍රණශ්‍යති
තථෛව භීරුකජනඃ සංග්‍රාමෙ තෛර්විමුච්‍යතෙ.

යුද්ධපරිත්‍යාගාත්, හරණලද සටන්භූමිය ඇතිබැවින්; භීරුඃ, භයසුලු තැනැත්තේ; ස්වයමේව, තමාම; ප්‍රණශ්‍යති, නසියි. තථාඑව, එසේම; භීරුකජනඃ, භයසුලු සෙනඟඇති තැනැත්තේ; තෛඃ, ඒ සෙනඟ විසින්; සංග්‍රාමෙ, සටන්භූමියෙහි; විමුච්‍යතෙ, මුදනුලැබේ.

ලොභයා හා ලොභවූ සෙවකයන් ඇත්තා සටන් භූමියෙහි
නස්නා බව.

637 ලුබ්ධස්‍යාසංවිභාගිත්වාන්න යුධ්‍යන්තෙනුජීවිනඃ
ලුබ්ධානුජීවිකෛරෙෂ දානහීනෛර්නිහන්‍යතෙ.

ලුබ්ධස්‍ය, ලොභයා; අසංවිභාගිත්වාත්, ධනනොදෙන බැවින්; අනුජීවිනඃ, සෙවකයෝ; නයුධ්‍යන්තෙ, යුධ නොකරත්; දානහීනෛඃ, දීමෙන් තොරවූ; ලුබ්ධඅනුජීවිකෛඃ, ලොභවූ සෙවකයන් විසින්; එෂඃ, මේතෙම; නිහන්‍යතෙ, මරණුලැබේ.

ඇමතියන් කෙරෙහි ඇලුම් නැත්තාවූ ස්වාමියා හා විෂය
රසයෙහි අතිශයින් ඇලුන තැනැත්තාද සටන් භූමියෙහි
නස්නා බව.

638 සන්ත්‍යජ්‍යතෙ ප්‍රකෘතිභිර්විරක්තප්‍රකෘතිර්යුධි
සුඛාභියොජ්‍යො භවති විෂයෙෂ්වතිසක්තිමාන්.

විරක්තප්‍රකෘතිඃ, ඇමතියන්කෙරෙ ඇලුම් නැත්තාවූ තැනැත්තේ; ප්‍රකෘතිභිඃ, ඇමතියන් විසින්; යුධි, සටන් භූමියෙහි; සන්ත්‍යජ්‍යතෙ, හරිණුලැබේ. විෂයෙෂු, විෂය රසයන්හි; අතිසක්තිමාන්, අතිශයින් ඇලුනු තැනැත්තේ; සුඛාභියොජ්‍යඃ, සුවසේ ජයගතයුතුවූයේ; භවති, වෙයි.

නොයෙක් කල්පනා ඇත්තා ජය නොලබන බව.

639 අනෙකචිත්තමන්ත්‍රස්තු ද්වෙෂ්‍යො භවති මන්ත්‍රිණාම්
අනවස්ථිතචිත්තත්වාත් කාර්‍යෙෂු තෛඃ ස උපෙක්ෂ්‍යතෙ.

අනෙකචිත්තමන්ත්‍රඃතු, නොයෙක් අදහස්හා මන්ත්‍රණ ඇති තැනැත්තේ; මන්ත්‍රිණාම්, අමාත්‍යයන් විසින්; ද්වෙෂ්‍යඃ, ක්‍රොධකටයුතුවූයේ; භවති, වේ. කාර්‍යෙෂු, කටයුත්තෙහි; අනවස්ථිතචිත්තත්වාත්, එකඟසිත් නැතිබැවින්; සඃ, ඒ ස්වාමිතෙම; තෛඃ, ඒ සෙවකයන් විසින්; උපෙක්ෂ්‍යතෙ, ඉවසනුලැබේ.

දෙවියන්ට හා බමුණන්ටද නින්දාකරණ තැනැත්තා හා
නටුවාවූ භාග්‍ය ඇති තැනැත්තාද හිංසාවට
පැමිණෙන බව.

640 සද්‍යඃ බම්බලීයස්වාදෙවබ්‍රාහ්මණනින්දකඃ
විශීයසීඞ්තා ස්වයං හ්‍යෙව දෛවොපහතකස්තථා.

දෙවබ්‍රාහමණනින්දකඃ, දෙවියන්ට හා බ්‍රාහ්මණයන්ට නින්දාකරණ තැනැත්තේද; තථා, එසේම; දෛවොපහතකඃ, නටුවාවූ භාග්‍ය ඇති තැනැත්තේද; සද්‍ය, හැමකල්හි; අබම්බලීයස්වාත්, අබම්ය බලකොට ඇති බැවින්; ස්වයංඑවහි, තමා විසින්ම; විශීයසීතෙ; හිංසාකරණු ලැබේ.

භාග්‍යය උතුම්කොට ඇත්තහුගේ ස්වභාවය.

641 සම්පත්තෙශ්ච විපත්තෙශ්ච දෛවමෙව හි කාරණම්
ඉති දෛවපරෙ ධ්‍යායන් නාත්මානමපි චෙෂ්ටයෙත්.

සම්පත්තෙඃච, සම්පත්තියගේද; විපත්තෙඃච, විපත්තියගේද; කාරණම්, හෙතුව; දෛවම්එවහි, භාග්‍යයමය; දෛවපරඃ, භාග්‍යය උතුම්කොට ඇති තැනැත්තේ; ඉතිධ්‍යායන්, මෙසේ සිතන්නේ; ආත්මානංඅපි, තමාද; නචෙෂ්ටයෙත්, උත්සාහ නොකරන්නේය.

දුර්භික්ෂයෙන් පීඩිතයා විසින්හා ව්‍යසනප්‍රාප්ත සෙනාව
ඇත්තා විසින් සටන්කළ නොහැකි බව.

642 දුර්භික්ෂව්‍යසනී චෛව ස්වයමෙවාවසීදති
බලව්‍යසනයුක්තස්‍ය යොද්ධුං ශක්තිර්නි ජායතෙ.

දුර්භික්ෂව්‍යසනීචඑව, දුර්භික්ෂ ව්‍යසනයෙන් යුක්ත තැනැත්තේද; ස්වයම්එව, තමාම, අවසීදති, ක්ලාන්තවෙයි. බලව්‍යසනයුක්තස්‍ය, සෙනාවගේ ව්‍යසන ඇත්තාහට; යොද්ධුං, යුද්ධය පිණිස; ශක්තිඃ, ශක්තිතොමෝ; නජායතෙ, නූපදී.

ස්වකීය දෙශයෙහි නුවූ තැනැත්තා ස්වල්ප දෙනෙක් විසින්
ජය ගත හැකි බව.

643 අදෙශස්ථො හි රිපුණා ස්වල්පකෙනාපි හන්‍යතෙ
ග්‍රාහොල්පීයානපි ජලෙ ගජෙන්ද්‍රමපි කර්ෂති.

අදෙශස්ථඃහි, ස්වකීය දෙශයෙහි නුවූ තැනැත්තේ වනාහි; ස්වල්පකෙනඅපි, ස්වල්පවූද; රිපුණා, සතුරා විසින්; හන්‍යතෙ, නසනු ලැබේ.

අල්පියාන්අපි, ස්වල්පවූද; ග්‍රාහඃ, කිඹුල්තෙම; ජලෙ, ජලයෙහි, ග ජේන්‍ද්‍රංඅපි, හස්තිරජයකුද; කර්ෂති, ඇදී.

බොහෝ සතුරන් ඇති තැනැත්තා විපත්තියට පැමිණෙන බව.

644 බහුශත්‍රුසත්‍ර සන්ත්‍රස්තඃ ශ්‍යෙනමධ්‍යෙ කපොතවත්
යෙනෛව ගච්ඡති පථා තෙනෛවාසෞ විපද්‍යතෙ.

බහුශත්‍රුඃතු, බොහෝ සතුරන් ඇති තැනැත්තේ වනාහි; සන්ත්‍ර ස්තඃ, තැතිගත්තේ; අසෞ, මේතෙම; යෙනඑවපථා, යම් මාර්ගයෙකි න්ම; ගච්ඡති, යේද, තෙනඑව, ඒ මාර්ගයෙන්ම; ශ්‍යෙනමධ්‍යෙ, උකු සුවන්ගේ මධ්‍යයෙහි; කපොතවත්, පරෙවියක්හුමෙන්; විපද්‍යතෙ, වි පත්තියට පැමිණේ.

යුඩයට නුසුදුසු කාලයෙහි සෙනාවෙන් යුක්තයා නසනබව.

645 අකාලසෛන්‍යයුක්තස්තු හන්‍යතෙ කාලයොධිනා
කෞශිකෙන හතජ්‍යොතිර්නිශීථ ඉව වායසඃ.

අකාලසෛන්‍යයුක්තඃතු, නුසුදුසු කාලයෙහි (වර්ෂා කාලයෙහි) සෙ නාවෙන් යුක්තවූ තැනැත්තේ වනාහි; නිශීථෙ, මධ්‍යම රාත්‍රියෙහි; හ තජ්‍යොතිඃ, නට්ඨවාවූ ආලොකය ඇති; වායසඃ, කව්ඩුතෙම; කෞශි කෙනඉව, බකමුහුනකු විසින් මෙන්; කාලයොධිනා, සුදුසු කාලයෙහි සටන්කරන්නා විසින්; හන්‍යතෙ, නසනුලැබේ.

සත්‍යධර්මයෙන් තොරවූවක්හුහා සමග කිසිකලකත් මිත්‍ර
ෙනාවියයුතු බව.

646 සත්‍යධර්මව්‍යපෙතෙන න සන්දධ්‍යාත් කදාචන
ස සංහිතොප්‍යසාධුත්වාදචිරද්‍යාති වික්‍රියාම්.

සත්‍යධර්මව්‍යපෙතෙන, සත්‍යධර්මයෙන් තොරවූවක්හුහා සමග; කදා චන, කිසිකාලයෙක්හිදු; නසන්දධ්‍යාත්, නොගැළපෙන්නේය. සං හිතඃඅපි, ගැළපෙන ලද්දවූද; සඃ, ඒ අසත්‍යවාදිතෙම; අසාධුත්වාත්, අසත්පුරුෂ බැවින්; අචිරාත්, ස්වල්ප කාලයෙකින්; වික්‍රියාම්, වෙනස ට හෙවත් සතුරු බවට; යාති, පැමිණේ.

නීති දන්නවුන් උතුම්බව.

647 යා හි ප්‍රාණපරිත්‍යාගමූල්‍යෙනාපි න ලභ්‍යතෙ
සා ශ්‍රීර්නීතිවිදං පශ්‍ය චඤ්චලාපි ප්‍රධාවති.

යාහි, යම් සැපතක් වනාහි; ප්‍රාණපරිත්‍යාගමූල්‍යෙනඅපි, ජීවිතය දෙන්නාවූ මුදල් අගයෙන්ද; නලභ්‍යතෙ, ලබනු නොලබන්නීද; සා

ශ්‍රීඃ, ඒ සම්පත් තොමෝ; නීතිවිදුං, නීති දන්නවුන්ගේ සමීපයෙහි වන්නීය; පශ්‍ය, බලව; චඤ්චලාඅපි, චඤ්චලවූවාද; ප්‍රධාවති, දුව න්නීය.

ඒ සලු මිනිසුන්ට අනුශාසනා කිරීමට සුදුස්සෙක්.

618 විත්තං යදා යස්‍ය සමං විභක්තං
ගූඪශ්ච චාරෙ නිභෘතශ්ච මන්ත්‍රඃ
න චාප්‍රියං ප්‍රාණිෂු යො බ්‍රවීති
ස සාගරාන්තාං පෘථිවීං ප්‍රශාස්ති.

යස්‍ය, යමක්හුගේ; විත්තම්, ධනය; සමම්, සමානව; යදා, යම්කලෙක්හි; විභක්තම්, බෙදනලද්ද; චාරඃ, චරපුරුෂතෙම; ගූඪඃච, සැඟවුනේද; මන්ත්‍රඃ, රහසතෙම; නිභෘතඃච, තනිවූයේද; යඃ, යමෙක්තෙම; ප්‍රාණිෂු, ප්‍රාණීන්කෙරෙහි; අප්‍රියම්, නොමනාබසක්; නචබ්‍රවීති, නොකියාද; සඃ, ඒතෙම; සාගරාන්තාම්, සමුද්‍රය කෙළවරකොටඇති; පෘථිවීම්, පොළව; ප්‍රශාස්ති, අනුශාසනා කෙරේ.

සතුරන් මුළාකරණ විධිය.

649 සුගුප්තිමාධාය සුසංහතෙන බලෙන වීරෙ විචරන්නරාතීන්
සන්තාපයෙද්‍යෙන සමං සුතප්තස්තප්තෙන සන්ධානමු
පෛති තප්තඃ.

තප්තඃ, රත්වූ ලොහයක්; සුතප්තඃ, අතිශයින් රත්වූයේ; තප්තෙනසමම්, රත්වූ ලොහයක් හා සමග; සන්ධානම්, ගැළපීමට; යෙනඋපෛති, යම්කාරණයෙකින් පැමිණේද ඒ කාරණයෙන්; වීරඃ, සූරවූ පුරුෂතෙම; සුසංහතෙන, මනාකොට ගැළපුනාවූ; බලෙන, සෙනාවහාසමග; ආධාය, පිහිටාගෙණ; විචරන්, හැසිරෙන්නේ; සුගුප්තිම්, මනාවසැඟවුනාවූ; අරාතීම්, සතුරා; සන්තාපයෙත්, තවන්නේය.

විශ්වාසයට පැමිණියවුන්ගේ වඤ්චාව පණ්ඩිතභාවයක්
නොවනබව.

650 විශ්වාසප්‍රතිපන්නානාං වඤ්චනෙ කා විදග්ධතා
අඞ්කමාරුහ්‍ය සුප්තං හි හත්වා කිං නාම පෞරුෂම්.

විශ්වාසප්‍රතිපන්නානාම්, විශ්වාසයට පැමිණියවුන්ගේ; වඤ්චනෙ, වඤ්චාකිරීමෙහි; කාවිදග්ධතා, කිනම් පණ්ඩිතභාවයක්ද; අඞ්කම්, ඇකයට; ආරුහ්‍ය, නැගී; සුප්තම්හි, සැතපුනු එකක්හු වනාහි; හත්වා, මරා; පෞරුෂම්, පුරුෂ වික්‍රමය; කිංනාම, කුමක්ද.

කළුවිකාගේ මාතෘකා ශ්ලෝකයෙක්.

651 ආත්මෞපම්‍යෙන යො වෙත්ති දුර්ජනං සත්‍යවාදිනම්

ස එව වඤ්චිතස්තෙන බ්‍රාහ්මණශ්ඡාගතො යථා.

යඃ, යමෙක්තෙම; දුර්ජනම්, දුර්ජනයා; ආත්මෞපම්‍යෙන, තමාහා ස මානකොට සිතීමෙන්; සත්‍යවාදිනම්වෙත්ති, සැබෑකියන්නක්හුයයි දනීද; ඡාගතඃ, එළුවාකෙරෙන්; බ්‍රාහ්මණඃයථා, බමුණාමෙන්; තෙන, ඒ දුර්ජනයාවිසින්; සඃ, හෙතෙම; වඤ්චිතඃඑව, වඤ්චාකරණ ලද්දේ මය. *

කථාවකගේ මාතෘකා ශ්ලෝකයෙක්.

652 මතිර්දෝලායතෙ නූනං සතාමපි ඛලොක්තිභිඃ

තාභිර්විශ්වාසිතො යොසෞ ම්‍රියතෙ චිත්‍රකර්ණවත්.

සතාම්අපි, පණ්ඩිතයන්ගේද; මතිඃ, අදහස; ඛලොක්තිභිඃ, දුර්ජනයන්ගේ කථාවලින්; නූනම්, ඒකාන්තයෙන්; දෝලායතෙ, චඤ්චලවකෙරේ. තාභිඃ, ඒ කථාවලින්; යඃ, යමෙක්තෙම; විශ්වාසිතඃ, විශ්වාසකරණ ලදද; අසෞ, මේ තෙම; චිත්‍රකර්ණවත්, චිත්‍රකර්ණයාමෙන්; ම්‍රියතෙ, මියේ. †

---

* ගෞතම ආරණ්‍යයෙහි පටන්ගන්නාලද යාගඇති ස්වී බ්‍රාහ්මණයෙක් අන්‍යගම්කටගොස් එළුවකු මිලදීගෙණ කරතබාගෙණ යන තැනැත්තේ කපටින් තුන්දෙනකු විසින් දක්නාලද්දේය. එකල්හි ඒ කපටිහු ඉදින්මේ එළුතෙම කිසියම් උපායෙකින් ලබනු ලැබේද එකල්හි බුද්ධිය උතුම්වේයයි සම්මතකොට ගෙණ මාර්ගයෙහි ගස්තුනක්මුල ඒ බ්‍රාහ්මණයාගේ මාර්ගයෙහි ප්‍රවේශව සිටියාහුය. එහි එක් ධූර්තයෙක්හු විසින් ඒ බමුණුතෙම පින්වත් බ්‍රාහ්මණය තා විසින් බල්ලෙක්කරින් කුමට උසුලනුලැබේදැයි කියනලද්දේය. එකල්හි බමුණා විසින් මේතෙම බල්ලෙක් නොවෙයි. මේතෙම පිදියයුතු එළුවෙකැයි කියනලද්දේය. ඉන්පසු ක්‍රොශයෙකින් පමණ ඈත සිටියාවූ දෙවෙනි තැනැත්තාවිසින්ද ඒ වචනයම කියනලද්දේය. ඒ අසා බ්‍රාහ්මණතෙම එළුවා බිමතබා නැවත නැවත පරීක්ෂා කොට නැවත කරතබා චඤ්චලසිත් ඇත්තේ ගියේය. ඉන්පසු තුන්වෙනි කපටියාගේ වචනයඅසා ඒ බමුණුතෙම බල්ලෙකැයිසිතා එළුවාහැර ස්නානයකොට ගෙටගියේය. එළුවාදගෙණගොස් ධූර්තයන්විසින් කනලද්දේය.

† කිසිවනයෙක්හි මදෝත්කටනම් සිංහයෙක් ඇත්තේය. කව්ඩෙක්ද—ව්‍යාඝ්‍රයෙක්ද—සිවලෙක්දැයි ඒ සිංහයාගේ සෙවකයෝ තුන්දෙනෙක්වෙත්. එකල්හි ඇවිදිනාවූ ඔවුන්විසින් වැඩෙන් පිරිහුනාවූ ඔටුවෙක් දක්නාලද්දේ පින්වත්තෙම කොයිසිට ආයේදැයි විචාරණලද්දේය. හෙතෙම තමාගේ පැවැත්ම කීයේය. පසුව ඔවුන්විසින් ගෙණගොස් මේතෙම සිංහයාට දක්වනලද්දේය. සිංහයාවිසින්ද භයනැතිකිරීම ප්‍රතිඥාස වචනකියා චිත්‍රවර්ණයයයි නාමක්කොට සිටුවූනලද්දේය

ආහාරදිය ක්ෂයවූකල්හි මනුෂ්‍යයන් කරුණා රහිතව දුශ්චරිතයෙහි හැසිරෙණබව.

653 ත්‍යජේත් ක්ෂුධාර්තා මහිලාපි පුත්‍රං
ඛාදෙත් ක්ෂුධාර්තා භුජගී ස්වමණ්ඩම්.
බුභුක්ෂිතඃ කිං න කරෝති පාපං
ක්ෂීණා නරා නිෂ්කරුණා භවන්ති.

---

මෙසේ අවස් ඉක්මෙනකල්හි පසුව කිසිදිනයෙක්හි සිංහයාගේ ශරීරය විකලබයට පැමිණීම හෙතුකොටගෙණද මහත්වූවෘෂ්ටි හෙතුකොටගෙණද අහාර නොලබන්නාවූ ඔහු කැලඹුනාහුය. පසුව කව්ඩුව්‍යාඝ්‍රසිවල්යන මොවුනවිසින් ස්වාමිතෙම චිත්‍රකණ්ණයාම යම්පරිද්දෙකින් මරද එසේකරණුලැබේවා මේ කවුකන්නාවූ ඔවුවාගෙන් අපට කවර ප්‍රයොජනදැයි කියනලද්දේය. මේ ඔවුතෙම ස්වාමියාවිසින් අභය වචනදී ගන්නාලද්දේය එසේකිරීමට කෙසේලැබේදැයි ව්‍යාඝ්‍රතෙම කියේය. ඒ අසා කව්ඩුතෙම මේ කාලයෙහි ස්වාමිතෙම ආහාරයෙන් කලාන්තවූයේය එහෙයින් පාපයක් නමුදු කරන්නේයයි කියයි. මෙසේ නිසමකොට සියල්ලෝ සිංහයාගේ සමීපයට ගියෝය. ආහාරයපිණිස කිසිවක් ලද්දේදැයි සිංහයාවිසින් කියනලද්දේය. එවිට කව්ඩුතෙම දෙවයන්වහන්ස උත්සාහයෙන් සෙව්වේද කිසිවක් නොලද්දේයයි කියේය. එවිට සිංහතෙම දැන් ජීවත්වන උපාය කවරේදැයි කීයේය. ඒ අසා කව්ඩුතෙම තමාසන්තකවූ අහාරය නොගෙණ හැරීමෙන් මේ තියලුහානිය එලඹසිටියේයයි කියේය. එවිට සිංහයාවිසින් මෙහි අහාරය කවරේද කුමක් ක්‍රමාසන්නකදැයි කියනලද්දේය. චිත්‍රකණ්ණයායයි කව්ඩුතෙම කණ සමීපයෙහි කියයි. එවිට සිංහතෙම බිම පහුරුගා කන්දෙක කසයි මාවිසින් මෝහට අභයවචනයදෙන ලද්දීය එබැවින් මෙසේකිරීම කෙසේනම් ලැබේදැයි කීයේය. ඒඅසා කව්ඩුතෙම මේ ඔවුතෙම ස්වාමියාවිසින් නොමැරියයුතුය. යම් ප්‍රකාරයකින් මේ ඔවුතෙම තමාගේ ශරීරයදීම අයිතිකෙරේද අපවිසින් එසේකටයුතුයයි කියේය. ඒ අසා සිංහයා කථානොකොට සිටියේය. පසුව මේ කව්ඩුතෙම ලබනලද අවකාශඇත්තේ කපටභාවයකොට සියල්ලවුන්ගෙණ සිංහයාගේ සමීපයට අයේය. එකල්හි කව්ඩාවිසින් දෙවියන්වහන්ස උත්සාහයෙනුත් ආහාරයෙක් නොපැමිණියේය. ස්වාමිතෙම මහත්වූ නිරාහාරභාවයෙන් දුකට පැමිණියේය. එහෙයින් මාගේ ශරීර මාංශය අනුභවකරණු ලැබේවයි කියනලද්දේය ඒ අසා සිංහයාවිසින් පිනැත්ත ජීවිතහානිය උතුම්වෙයි. නැවත මෙබඳුවූ ක්‍රියාවෙහි පැවැත්ම උතුම්නොවෙයි. කියනලද්දේය. සිවලාවිසින්ද එසේම කියනලද්දේය. සිංහයාවිසින්ද එසේ නොවේවයි කියනලද්දේය. එකල්හි ව්‍යාඝ්‍රතෙම ස්වාමිතෙම මාගේ ශරීරයෙන් ජීවත්වන සේක්වයි කියේය. සිංහයාවිසින් එසේ නොවේවා එසේකිරීම කිසිකලකත් සුදුසුනොවෙයි කියනලද්දේය. එකල්හි චිත්‍රකණ්ණයාද හටගත් විශ්වාස ඇත්තේ එසේම තමාගේ ශරීරයදීම කියේය. ඒ වචනය කියන්නාවූම ඒ ඔවුතෙම දිවිගාවිසින් මරණලද්දේ සියල්ලවුන් විසින් කනලද්දේය.

මහිලා, ස්ත්‍රීතොමෝ; ක්‍ෂුධාතීාඅපි; ක්‍ෂුධාවෙන් පීඩිතවීද; පුත්‍රම්, පුත්‍රයා; ත්‍යජෙත්, හරණේය. ක්‍ෂුධාතීා, ක්‍ෂුධාවෙන් මඩනාලද්දාවූ; භුජගී, සර්පධෙනුතොමෝ; ස්වම්අණ්ඩම්, තමාගේ බිජය; ඛාදෙත්, කන්නීය. බුභුක්‍ෂිතඃ, ක්‍ෂුධාතුර තැනැත්තේ; කිං පාපම්, කවරනම් පාපයක්; නාකරෙති, නොකෙරේද; ක්‍ෂීණාඃ, ආහාරනැත්තාවූ; නරාඃ, මනුෂ්‍යයෝ; නිෂ්කරුණාඃ, කරුණා නැත්තාහු; භවන්ති වෙත්.

ධර්මය නොසලකන්නෝ.

654 මත්තඃ ප්‍රමත්තශ්චොන්මත්ත ආර්තඃ ක්‍රොධී බුභුක්‍ෂිතඃ
ලුබ්ධො භීරුඃස්වරයුක්තඃ කාමුකශ්ච න ධර්මවිත්.

මත්තඃ, මද්‍ය පානාදියෙන් මත්වූ තැනැත්තේද; ප්‍රමත්තශ්ච, වික්‍ෂිප්ත සිත්ඇති තැනැත්තේද; උන්මත්තඃච, උමතුවූ තැනැත්තේද; ආර්තඃ, පීඩාවටපැමිණි තැනැත්තේද; ක්‍රොධී, ක්‍රොධසිත්ඇති තැනැත්තේද; බුභුක්‍ෂිතඃ, ක්‍ෂුධාවෙන් පීඩිත තැනැත්තේද; ලුබ්ධඃ, ලොභවූ තැනැත්තේද; භීරුඃ, භයසුලු තැනැත්තේද; ත්වරයුක්තඃ, වෙගයෙන් යුක්ත තැනැත්තේද; කාමුකඃච, කාමයෙහිගිජු තැනැත්තේද; නධර්මවිත්, ධර්මය නොදන්නේයි.

අභය දානයටවඩා මහත්වූ දානයක් නැතිබව.

655 න භූප්‍රදානං න සුවර්ණදානං න ගොප්‍රදානං න තථාන්නදානම්
යථා වදන්තීහ මහාප්‍රදානං සර්වප්‍රදානෙෂ්වභයප්‍රදානම්.

අභයප්‍රදානම්, අභයදීම; ඉහ, මේ ලොකයෙහි; සර්වප්‍රදානෙෂු, සියලු දානයන් අතුරෙහි; මහාප්‍රදානම්, මහත් දානයයි; යථාවදන්ති, යම්සේකියද්ද, තථා. එබඳුවූ; අන්නදානම්, ආහාර දානයෙක්; න, නැත්තේය; ගොප්‍රදානම්, ගවයන්දීමෙක්; න, නැත්තේය; සුවර්ණදානම්, රන්දීමෙක්; න, නැත්තේය; භූප්‍රදානම්, පෘථිවිදානයෙක්, න, නැත්තේය.

පිහිට සඳහා ආවක්හු රක්‍ෂාකිරීමෙහි ඵල.

656 සර්වකාමසමෘද්ධස්‍ය අශ්වමෙධස්‍ය යත්ඵලම්
තත් ඵලං ලභතෙ සම්‍යක් රක්‍ෂිතෙ ශරණාගතෙ.

සර්වකාමසමෘද්ධස්‍ය, සියලු සැපයෙන් සමෘද්ධවූ; අශ්වමෙධස්‍ය, අශ්වමෙධයාගයාගේ; යත්ඵලම්, යම්ඵලයෙක් ඇද්ද; ශරණාගතෙ; පිහිට සඳහා ආ එකක්හු; සම්‍යක්, මනාකොට; රක්‍ෂිතෙ, රක්‍ෂාකරණලද කල්හි; තත්ඵලම්, ඒ ඵලය, ලභතෙ, ලබා.

සියලු ඇමතියන් ස්වාමියා මුල්කොට ඇතිබව.

657 ස්වාමිමූලා භවන්ත්‍යෙතාඃ සර්වාඃ ප්‍රකෘතයඃ ඛලු
සමූලෙෂු හි වෘක්ෂෙෂු ප්‍රයත්නඃ සඵලො නෘණාම්.

එතාඃසර්වාඃප්‍රකෘතයඃ, මේ සියලු සෙවකයෝ; ඛලු, එකාන්තයෙන්; ස්වාමිමූලාඃ, ස්වාමියා මුල්කොට ඇත්තාහු; භවන්ති, වෙත්. සමූලෙෂු, මුල් සහිතවූ; වෘක්ෂෙෂුහි, වෘක්ෂයන් කෙරෙහි වනාහි; නෘණාම්, මිනිසුන්ගේ; ප්‍රයත්නඃ, උත්සාහය; සඵලඃ, ඵලසහිතවෙයි.

ගංගාවගේ ජලධාරාවෙන් මුලතෙමන ලද්දාවූගස් සිදිනබව.

658 ලොකො වහති කිං රජන් න මූර්ධ්නා දග්ධුමින්ධනම්
ක්ෂාලයන්නාපි වෘක්ෂාඞ්ඝ්‍රිං නදීවෙගො නිකෘන්තති.

කිම්, කුමක්ද; රජන් මහාරජ; ලොකඃ, ජනතෙම; දග්ධුම්, දැවීම පිණිස; ඉන්ධනම්, දර; මූර්ධ්නා, ඉසින්; නවහති; නොමඋසුලයි, නදීවෙගඃ, ගංගාවගේ ජලප්‍රවාහයතෙම; වෘක්ෂාඞ්ඝ්‍රිම්, ගස්මුල්; ක්ෂාලයන්අපි, තෙමන්නේද; නිකෘන්තති, හෙලයි.

කථාවකගේ මාතෘකා ශ්ලොකයෙක්.

659 සකන්ධෙනාපි වහෙච්ඡත්‍රූන් කාර්‍ය්‍යමාසාද්‍ය බුද්ධිමාන්
යථා වෘද්ධෙන සර්පෙණ මණ්ඩූකා විනිපාතිතාඃ.

වෘද්ධෙන, මහලුවූ; සර්පෙණ, සර්පයා විසින්; මණ්ඩූකාඃ, මැඩියෝ; යථා විනිපාතිතාඃ, යම්සේ නසනලද්දාහුද; එමෙන් බුද්ධිමාන්, නුවණැති තැනැත්තේ; කාර්‍ය්‍යම්ආසාද්‍ය, කටයුත්තකට පැමිණ; ශත්‍රූන්, සතුරන්; සකන්ධෙනඅපි, පිටින්ද, වහෙත්, උසුලන්නේය. *

* ජීර්ණෝද්‍යානයෙහි මන්දවිෂ නම් සර්පයෙක් ඇත්තේය. ඒ සර්පතෙම අතිශයින් ජරාවට පැමිණි බැවින් තමාගේ ආහාරයද සෙවීමට අපොහොසත්වූයේ විල් ඉවුරෙහිවැටී උන්නේය. ඉක්බිත්තෙන් කිසි මැඩියකු විසින් දුරදී දක්නාලද්දාවූ සර්පතෙම පින්වතා කුමක් නිසා ආහාර නොසොයන්නේදැයි විචාරණ ලද්දේය, ඒ අසා සර්පතෙම පින්නැත්තාවූ මාගේපැවැත්ම ඇසීමෙන්තට ප්‍රයෝජනනොවෙයි එහෙයින් සවයි කියයි පින්වත පසුව උපන්නාවූ විශ්වාසය ඇති ඒ මැඩිතෙම සියලුලෙසින් කියනුලැබේවයි ඒ සර්පයාට කීයේය. සර්පතෙම පින්වත මේ බ්‍රහ්මපුරයෙහි කෞණ්ඩින්‍යනම් වෙදඋගත්වන්නාවූ බ්‍රාහ්මණයකුගේ පුත්‍රවූ විසි අවුරුදු වයස්වූ සියලුගුණයෙන් සමන්විතවූ මාණවකතෙම අවාසනාව හේතුකොටගෙණ ක්‍රෑරවූ මා විසින් දෂ්ටකරණ ලද්දේය. පසුව මළාවූ සුශීල යන නම්ඇති පුත්‍රයා දැක කෞණ්ඩින්‍යබ්‍රාහ්මණ තෙම ශොකයෙන් මූර්ඡාවට පැමිනියේ

### මිනිසුන් මලකල්හි ශෝකකිරීම නුසුදුසුබව.

660 ක්‍රොඩීකරෝති ප්‍රථමං යදා ජාතමනිත්‍යතා
ධාත්‍රීව ජනනී පශ්චාත් තදා ශෝකස්‍ය කඃ ක්‍රමඃ

අනිත්‍යතා, අනිත්‍යභාවයතොමෝ; ජාතම්; උපන්නාවූ මනුෂ්‍යයා; ධාත්‍රීව, කිරිමව්මෙන්; ප්‍රථමං, පළමුකොට; ක්‍රොඩීකරෝති, සනාථක කරන්නීය. පශ්චාත්, පසුව; ජනනී, මව් (මෙන්) යදා, යම්කලෙක්හි (සනාථකකරන්නීද) තදා, එකල්හි; ශෝකස්‍ය, ශෝකයාගේ; කඃක්‍රමඃ, පිළිවෙළ කුමක්ද.

661 ක්ව ගතාඃ පෘථිවීපාලාඃ සසෛන්‍යබලවාහනාඃ
වියොගසාක්ෂිණී යේෂාං භූමිරද්‍යාපි තිෂ්ඨති.

යේෂාම්, යම්කෙනෙකුන්ගේ; වියොගසාක්ෂිණී, වෙන්වීමට සාක්ෂිවූ; භූමිඃ, භූමිතොමෝ; අද්‍යාපි, දැනුදු; තිෂ්ඨති, පවත්නීද; සසෛන්‍යබල වාහනාඃ, සෙනාබලවාහන සහිතවූ; පෘථිවීපාලාඃ, රජහු; ක්වගතාඃ, කොතැන්හි ගියාහුද.

---

පොළෝතලයෙහි පෙරලුනේය. ඉත්පසු බ්‍රහ්මපුරයෙහි වසන්නාවූ ඔහුගේ සි සලුනෑයෝ එහි එවූත උන්නෝය. ඉත්පසු කපිල නම් සන්‍යාසව්‍රත ඇති බ්‍රාහ්මණය යන්හුගේ අනේකප්‍රකාරවූ අනුශාසනාවලින් නින්දෙන් ප්‍රබෝධවූවෙක් මෙන් නැඟිට ශෝකයෙන් කැලඹුනාවූ ඒ බ්‍රාහ්මණයා විසින් අදපටන් මැඩියන්ගේ වාහනයෙක් වෙවයි මම ශාපකරණු ලැබුයෙම් නැවතද කපිල බ්‍රාහ්මණයා ගේ අනුශාසනා නැමැති අමෘතයෙන් නිවනලද ශෝකාග්නි ඇත්තාවූ කෞණ්ඩි න්‍යබ්‍රාහ්මණ තෙම සුදුසු පරිද්දෙන් සන්‍යාසිව්‍රතයට පැමිණියේය. එබැවින් බ්‍රාහ්මණයාගේ ශාපය අනුභවකිරීම පිණිස මැඩියන්ගේ ඉසිලීම සඳහා මෙහිසි ටිමියායේය. ඉත්පසු ඒ මැඩියා විසින් ගොස් මැඩියන්ගේ ස්වාමිවූ ජලපාදයාට ඒ කථාව කියනා ලද්දේය. පසුව ඒ මැඩිස්වාමිතෙම අවුත් සර්පයාගේ සමීපයෙහි සිටියේය. ඒ සර්පතෙම ඒමැඩි ස්වාමියා පිටෙහි තබාගෙණ ශීඝ්‍රව ගමන්කෙළේය. අනික් දිනයෙහි ගමන්කරන්ට නොහැක්කාවූ ඕහට මැඩිස්වාමිතෙම පිළිවිසා අද කුමක්නිසා මඳවූගමන් ඇත්තේද්දැයි විචාළේය. ඒ අසා සර්පතෙම දෙවයන්ව හන්ස ආහාර නොලැබීමෙන් හීනවූ බලඇත්තෙමි කීයේය. ඒඅසා මැඩිස්වාමි තෙම මාගේ අණෙවෙන් මැඩියන් කවයි කීයේය. පසුව මේතෙම මහත් අනුග්‍රහ යක් ලද්දේයයි කියා පිළිවෙළින් ඒ සර්පතෙම මැඩියන් කයි. පසුව මැඩියන්නැත්තාවූ විලදක මැඩිස්වාමියාද සර්පයා විසින් කනලද්දේය.

### ශරීරය නිතර ගෙවීයනබව.

662 ප්‍රතික්ෂණමයං කායඃ ක්ෂීයමාණො න ලක්ෂ්‍යතෙ
ආමකුම්භ ඉවාම්භඃස්ථො විශීර්ණඃ සන් විභාව්‍යතෙ.

ප්‍රතික්ෂණම්, නිතර; ක්ෂීයමාණඃ, ගෙවෙන්නාවූ; අයංකායඃ, මේ ශරීරයතෙම; නලක්ෂ්‍යතෙ, නොදන්නාලැබේ. අම්භඃස්ථඃ, දියෙහිලූ; ආමකුම්භඃඉව, අමුමැටිකලයක්මෙන්; විශීර්ණඃ සන්; විසිරයත්තේ; විභාව්‍යතෙ, දන්නාලැබේ.

### දවස්පතා සත්වයන්ට මරුවා ලන්වනබව.

663 ආසන්නතරතාමෙති මෘත්‍යුර්ජන්තොර්දිනෙ දිනෙ
ආඝාතං නීයමානස්‍ය වධ්‍යස්‍යෙව පදෙ පදෙ.

ආඝාතම්, මරණස්ථානයට; නීයමානස්‍ය, ගෙණයනුලබන්නාවූ; වධ්‍යස්‍ය, මැරියයුතු අපරාධකළ තැනැත්තාහට; පදෙපදෙඉව, පියවරක් පියවරක් පාසා මරණස්ථානය ආසන්නවන්නාමෙන්; ජන්තොඃ, සත්වයාහට, දිනෙ දිනෙ, දවසක්පාසා, මෘත්‍යුඃ, මරුතෙම; ආසන්නතරතාම්, අතිශයින් ආසන්නබවට; එති, පැමිණේ.

### තරුණභාවාදිසයක් නිතර නොපවත්නාබව.

664 අනිත්‍යං යෞවනං රූපං ජීවිතං ද්‍රව්‍යසඤ්චයඃ
ඓශ්වර්‍ය්‍යං ප්‍රියසංවාසො මුහ්‍යෙත් තත්‍ර න පණ්ඩිතඃ.

යෞවනං, තරුණ අවස්ථාවද; රූපං, රූපසම්පතද; ජීවිතං, ජීවිතයද; ද්‍රව්‍යසඤ්චයඃ; ධනරැස්කිරීමද; ඓශ්වර්‍ය්‍යම්, ඓශ්වර්‍ය්‍යයද; ප්‍රියසංවාසඃ, ප්‍රියයන්හා එක්ව විසීමද; අනිත්‍යම්, නිත්‍යනොවේ. පණ්ඩිතඃ, පණ්ඩිතතෙම; තත්‍ර, ඒ යෞවනාදියෙහි; නමුහ්‍යෙත්, මුළානොවන්නේය.

### සත්වයන්ගේ සමාගමය ස්ථිරනොවනබව.

665 යථා කාෂ්ඨඤ්ච කාෂ්ඨඤ්ච සමෙයාතාං මහොදධෞ
සමෙත්‍ය ච ව්‍යපෙයාතාං තද්වද්භූතසමාගමඃ.

කාෂ්ඨඤ්ච, දණ්ඩක්ද; කාෂ්ඨඤ්ච, දණ්ඩක්ද; මහොදධෞ, සමුද්‍රයෙහි; යථාසමෙයාතාම්, යම්සේ ගැළපෙන්නාහුද; සමෙත්‍යච, ගැළපීද; ව්‍යපෙයාතාම්, පහවයෙද්ද; භූතසමාගමඃ, සත්වයන්ගේ සමාගමය; තද්වත්, එබඳුයි.

### ජනයාගේ ගැළපිසිටීමට උපමාවක්.

666 යථා හි පථිකඃ කශ්චිච්ඡායාමාශ්‍රිත්‍ය තිෂ්ඨති
විශ්‍රම්‍ය ච පුනර්ගච්ඡෙත් තද්වද්භූතසමාගමඃ.

කශ්චිත්පථිකඃ, කිසි මගියෙක්; ඡායාමාශ්‍රිත්‍ය, සෙවනක් ආශ්‍රය කොට; යථාහිතිෂ්ඨති, යම්සේ සිටීද. විශ්‍රම්‍ය, විඩාසන්සිඳුවා; පුනඃච, නැවතද; ගච්ඡෙත්, යන්නේද; භූතසමාගමඃ, ජනයාගේ සමාගමය; තවත්, එබඳුයි.

### මැරුණුකල්හි ඇඬීමෙහි නිරර්ථකබව.

667 පඤ්චභිර්නිර්මිතෙ දෙහෙ පඤ්චත්වඤ්ච පුනර්ගතෙ
ස්වාං ස්වාං යොනිමනුප්‍රාප්තෙ තත්‍ර කා පරිදෙවනා.

පඤ්චභිඃ, පඤ්චභූතයන්ගෙන්; නිර්මිතෙ, කරණලද්දාවූ; දෙහෙ, ශරීරය; පුනඃච, නැවතද; පඤ්චත්වං, පසබවට; ගතෙ, පැමිණීකල්හි; ස්වාං ස්වාං යොනිං, තමතමා සන්තකවූ යොනියට; අනුප්‍රාප්තෙ, පැමිණීකල්හි; තත්‍ර, ඒ කාරණයෙහි; පරිදෙවනා, හැඬීමතොමෝ; කා, කුමක්වන්නීද.

### සිත්හි ප්‍රිය සම්බන්ධය හෘදයෙහි උල්ඇණීමක් සමානබව.

668 යාවතඃ කුරුතෙ ජන්තුඃ සම්බන්ධාන් මනසඃ ප්‍රියාන්,
තාවන්තොස්‍ය නිඛන්‍යන්තෙ හෘදයෙ ශොකශඞ්කවඃ.

ජන්තුඃ, සත්වතෙම; මනසඃ, චිත්තයාගේ; ප්‍රියාන්සම්බන්ධාන්, ප්‍රියවූබන්ධනයන්; යාවතඃ, යම්පමණ; කුරුතෙ, කෙරේද, තාවන්තඃ, එපමණ; අස්‍ය, මොහුගේ හෘදයෙ, ලෙහි; ශොකශඞ්කවඃ, ශොකනැමැති උල්; නිඛන්‍යන්තෙ, අනිනුලැබෙත්.

### තමාගේ ශරීරයහා සමගද අත්‍යන්ත සම්බන්ධය නො ලැ බෙ න බ ව.

669 නායමත්‍යන්තසංවාසො ලභ්‍යතෙ යෙන කෙනචිත්
අපි ස්වෙන ශරීරෙණ කිමුතාන්‍යෙන කෙනචිත්.

යෙනකෙනචිත්, යම්කිසිවක්හුහා සමග; අයං අත්‍යන්තසංවාසඃ, මේ අතිශයින් ප්‍රියව විසීමතෙම; නලභ්‍යතෙ, නොලැබේ. ස්වෙන ශරීරෙණඅපි, තමාගේ ශරීරයහා සමගද (නොලැබේ); අන්‍යෙනකෙනචිත්, අන්කිසිවක්හුහා සමග; කිමුත, කියනුකිම.

### සම්බන්ධය වෙන්වීම ප්‍රකාශකරණබව.

670 සංයොගො හි වියොගස්‍ය සංසූචයති සම්භවම්
අනතික්‍රමණීයස්‍ය ජන්ම මෘත්‍යොරිවාගමම්.

ජන්ම, උත්පත්තියතෙම; අනතික්‍රමණීයස්‍ය; වැළැක්විය නොහැක්කාවූ; මෘත්‍යොඃ, මරුවාගේ; ආගමම්ඉව, පැමිණීමමෙන්; සංයොගඃහි, සම්බන්ධය වනාහි; වියොගස්‍ය, වෙන්වීමගේ; සම්භවම්, හටගැන්ම; සංසූචයති, ප්‍රකාශකෙරේ.

### ඒ කාලයෙහි සිත්කලුවූ සම්බන්ධය පෙරලීමෙන් දුක්
### එලවනබව.

671 ආපාතරමණීයානාං සංයොගානාං ප්‍රියෛඃ සහ
අපථ්‍යානාමිවාන්නානාං පරිණාමො හි දාරුණඃ.

ප්‍රියෛඃසහ, පියයන්හා සමග; ආපාතරමණීයානාං, ඒ කාලයෙහි සිත්කලුවූ; සංයොගානාං, සම්බන්ධයන්ගේ; පරිණාමඃහි, පෙරලීමව ; නාහි; අපථ්‍යානාං, අහිතවූ; අන්නානාංඉව; ආහාරයන්ගේ පෙරලීම මෙන්; දාරුණඃ, ඉවසියනොහේ.

### දිවාරාත්‍රිදෙක සත්වයන්ගේ ආයුසය ගෙණයනබව.

672 ව්‍රජන්ති න නිවර්ත්තන්තෙ ස්‍රොතාංසි සරිතාං යථා
ආයුරාදාය මර්ත්‍යානාං සදා රාත්‍ර්‍යහනී තථා.

සරිතාං, ගංගාවන්ගේ; ස්‍රොතාංසි, බස්නාවූ ජලයෝ; ව්‍රජන්ති, යෙද්ද; යථානනිවර්ත්තන්තෙ, යම්සේ නොනවතිද්ද; තථා, එසේම; රාත්‍ර්‍යහනී, රෑදවල්කාලයෝ; මර්ත්‍යානාං, මිනිසුන්ගේ; ආයුඃ ආදාය, ආයුස; යගෙණ; සදා, හැමකල්හි (යෙත්).

### සැප රසවිඳීමහා පණ්ඩිතයන්ගේ සමාගමද දුකට
### හෙතුවනබව.

673 සුඛාස්වාදපරො යස්තු සංසාරෙ සත්සමාගමඃ
ස වියොගාවසානත්වාත් දුඃඛානාං ධූරි යුජ්‍යතෙ.

යඃතු, යමෙක් වනාහි; සුඛාස්වාදපරඃ, සැපයන්ගේ රසවිඳීම උතුම්කොට ඇත්තේ; සංසාරෙ, සංසාරයෙහි; සත්සමාගමඃ, සත්පුරුෂයන්ගේ සමාගමය ඇත්තේද; සඃ, හෙතෙම; වියොගඅවසානත්වාත්, වෙන්වීම අවසානකොටපවත්නාබැවින්; දුඃඛානාං, දුඃඛයන්ගේ; ධූරි, වියෙහි; යුජ්‍යතෙ, යොදනුලැබේ.

පණ්ඩිතයන් සත්පුරුෂයන්ගේ සමාගම නොකමැතිවනබව.

674 අත එව හි නෙච්ඡන්ති සාධවඃ සත්සමාගමම්
සච්යොගාසිල්නස්‍ය මනසො නාස්ති භෙෂජම්.

වියොගඅසි, වෙන්වීම නැමැති කඩුවෙන්; ලූනස්‍ය, සිඳිනලද්දාවූ; ම නසඃ, සිතට; භෙෂජම්, බෙහෙතක්; යත්නාස්ති, යම්හෙයකින් නැත් තේද; අතඃඑවහි, එහෙයින්ම; සාධවඃ; සත්පුරුෂයෝ; සත්සමාගමම්, සත්පුරුෂ සමාගම; නඉච්ඡන්ති, නොකැමැතිවෙත්.

සගරාදි රජුන්ද මනාකොට කරණලද ක්‍රියාවන්ද
නාස්තිව ගියබව.

675 සුකෘතාන්‍යපි කර්ම්මාණි රාජභිඃ සගරාදිභිඃ
අථ තාන්‍යෙව කර්ම්මාණි තෙ චාපි ප්‍රලයං ගතාඃ.

සගරාදිභිඃ, සගරාදිවූ; රාජභිඃ, රජුන්විසින්; කර්ම්මාණිඅපි, ක්‍රියාවෝ ද; සුකෘතානි, මනාකොට කරණලද්දාහුය. අථ, පසුව; තානිකර්ම්මාණි එව, ඒ ක්‍රියාවෝද; තෙචඅපි, ඒ සගරාදි රජහුද; ප්‍රලයංගතාඃ, විනාශය ට පැමිණියාහුය,

මරණය සිතීමෙන් උත්සාහ අඩුවනබව.

676 සඤ්චින්ත්‍ය සඤ්චින්ත්‍ය තමුග්‍රදණ්ඩං මෘත්‍යුං මනුෂ්‍යස්‍ය
විචක්ෂණස්‍ය

වර්ෂාම්බුසික්තා ඉව චර්ම්බන්ධාඃ සර්වේ ප්‍රයත්නාඃ ශිථිලීභවන්ති.

මෘත්‍යුං, මරණනැමැති; තංඋග්‍රදණ්ඩං, ඒ මහත් දඬුවම; සඤ්චින්ත්‍ය සඤ්චින්ත්‍ය, සිත සිතා, වර්ෂාම්බුසික්තාඃ, වැසිදියෙන් තෙමනලද්දාවූ; ච ර්ම්බන්ධාඃඉව, සම්බැඳුම්මෙන්; විචක්ෂණස්‍ය, නුවණැත්තාවූ; මනුෂ්‍ය ස්‍ය, මනුෂ්‍යයාගේ; සර්වේප්‍රයත්නාඃ, සියලු උත්සාහයෝ; ශිථිලීභවන්ති, ලිහිල්වෙත්.

මව්කුසට පැමිණිතැන්පටන් දවසක්පාසා මරණය සමීපයට
මනුෂ්‍යයා පැමිණෙනබව.

677 යාමෙව රාත්‍රිං ප්‍රථමාමුපෛති ගර්භෙ නිවාසං නරවීරලොකඃ
තතඃ ප්‍රභෘත්‍යස්ඛලිතප්‍රයාණඃ ස ප්‍රත්‍යහං මෘත්‍යුසමීප මෙති.

නරවීරලොකඃ, උතතමජනතෙම; ප්‍රථමාං, පළමුවූ; යාංරාත්‍රිංඑව, යම් රාත්‍රියෙක්හිම; ගර්භෙ, මව්කුසෙහි; නිවාසංඋපෛති, වාසයට එළඹේද; තතඃප්‍රභෘති, එතැන්පටන්; අස්ඛලිතප්‍රයාණඃ, අප්‍රමාදව යන්නාවූ; සඃ, හෙතෙම; ප්‍රත්‍යහං, දවසක්පාසා; මෘත්‍යුසමීපං, මරහුගේ සමීපය ට; එති, පැමිණේ.

කරුණු නොසැලකීම ශොකයට හෙතුබව.

678 අශ්‍රුතං කාරණං න ස්‍යාද්වියොගො යදි කාරණම්
ශොකො දිනෙෂු ගච්ඡත්සු වර්ධතාමපයාති කිම්.

අශ්‍රුතං, නොදැත්ම; කාරණං නස්‍යාත්, හෙතුනොවන්නේනම්; වියොගඃ, වෙන්වීම; යදි, ඉදින්; කාරණම්, හෙතුනම්; දිනෙෂුගච්ඡත්සු, දවස් ඉක්මෙනකල්හි; ශොකඃ, ශොකයතෙම; වර්ධතාං, වැඩේවා; කිම්අපයාති, කුමක් හෙතුකොටගෙණ පහවයේද.

ශොකයට හෙතුව නොසැලකීමම බලවත් ඖෂධයක්බව.

679 අකාණ්ඩපාතජාතානාමස්ත්‍රාණං මර්මභෙදිනාම්
ගාඪශොකප්‍රහාරාණාමචින්තෛව මහෞෂධම්.

අකාණ්ඩපාතජාතානාම්, ඊදඬුවැදීමෙන් නූපන්නාවූ; මර්මභෙදිනාම්, මර්මස්ථානයන්ගේ බිඳීම කරන්නාවූ; ගාඪශොකප්‍රහාරාණාම්, බලවත්වූ ශොකප්‍රහාරනැමැති; අස්ත්‍රාණං, ආයුධයන්ගේ; අචින්තාඑව, නොසිතීමම; මහෞෂධම්, උතුම් ඖෂධයෙකි.

ඉන්ද්‍රිය නිග්‍රහකිරීමෙන් රාගඇල්ම වලක්වාගැන්මෙහි වැඩ.

680 වනෙපි දොෂාඃ ප්‍රභවන්ති රාගිණාං
ගෘහෙපි පඤ්චෙන්ද්‍රියනිග්‍රහස්තපඃ.
අකුත්සිතෙ කර්මණි යඃ ප්‍රවර්තතෙ
නිවෘත්තරාගස්‍ය ගෘහං තපොවනම්.

රාගිණාම්, රාගඇල්ම ඇත්තවුන්ට; වනෙපි, වනයෙහිද; දොෂාඃප්‍රභවන්ති, දොෂයෝ උපදිත්. ගෘහෙඅපි, ගෘහයෙහිදු; පඤ්චෙන්ද්‍රියනිග්‍රහඃ, (චක්ෂුරාදි) පඤ්චෙන්ද්‍රිය යන්ගේ නිග්‍රහයතෙම; තපඃ, තපසවෙයි. යඃ, යමෙක්තෙම; අකුත්සිතෙ, නින්දිතනූවූ; කර්මණි, ක්‍රියාවෙහි; ප්‍රවර්තතෙ, පවතිද; නිවෘත්තරාගස්‍ය, වළක්වනලද රාගයඇත්තාහට; ගෘහං, ගෙය; තපොවනම්, තපස්වනයයි.

වස්ත්‍රාදීන්ගේ වෙශයහෝ ලක්ෂණය ධර්මයට
හෙතුනොවනබව.

681 දුඃඛිතොපි චරෙද්ධර්මං යත්‍ර කුත්‍රාශ්‍රමෙ රතඃ
සමඃ සර්වේෂු භූතෙෂු න ලිඞ්ගං ධර්මකාරණම්.

දුඃඛිතඃඅපි, දුකට පැමිණියෙක්ද; යත්‍රකුත්‍රආශ්‍රමෙ, යම්කිසි ආශ්‍රමයෙක්හි; රතඃ, ඇලුනේ; සර්වේෂුභූතෙෂු, සියලු සත්වයන්කෙරෙහි; ස

මඃ, සමචූයේ; ධර්මං චරෙත්, ධර්මයෙහි හැසිරෙන්නේය. ඵධගං, වෛශ්‍යය ධර්මකාරණංන, ධර්මයට හෙතුවෙක්නොවේ.

සානොහැකිතැන්වලින් යන්නෝ.

682 වෘත්ත්‍යර්ථං භොජනං යෙෂාං සන්තානාර්ථඤ්ච මෛථුනම්
වාක් සත්‍යවචනාර්ථඤ්ච දුර්ගාණ්‍යපි තරන්ති තෙ.

වෘත්ත්‍යර්ථං, දිවිපැවැත්ම පිණිස; භොජනං, ආහාරයද; සන්තානාර්ථං, පුත්‍රයන්සඳහා; මෛථුනඤ්ච, මෛථුනයද; සත්‍යවචනාර්ථං, සැබෑකීම පිණිස; වාක්ච, වාක්‍යයද; යෙෂාම්, යම්කෙනෙකුන්ගේද; තෙ, ඔහු; දුර්ගාණිඅපි, සානොහැකි ස්ථානයන්ද; තරන්ති, එතරවෙත්.

ආත්මයතුළ ජලයෙන් ශුද්ධකළ නොහැකිබව.

683 ආත්මා නදී; සංයමපුණ්‍යතීර්ථා සත්‍යොදකා ශීලතටා දයොර්මිඃ
තත්‍රාභිෂෙකං කුරු පාණ්ඩුපුත්‍ර න වාරිණා ශුද්ධ්‍යති
චාන්තරාත්මා.

සංයම, ඉන්ද්‍රියනිග්‍රහනැමැති; පුණ්‍යතීර්ථා, පුණ්‍යතීර්ථයක් ඇත්තාවූ, සත්‍යොදකා; සත්‍යවචන නැමැති දියඇති, ශීලතටා, ශීලනැමැති ඉව්ර ඇති, දයොර්මිඃ, කරුණා නැමැති රළඇති; ආත්මානදී, ආත්මය සමාන වූ නදියවන්නිය; පාණ්ඩුපුත්‍ර, පාණ්ඩුරජ පුත්‍රය; තත්‍ර, ඒ නදියෙහි; අභිෂෙකං, අභිෂෙකය හෙවත් තෙමීම; කුරු, කරව; අන්තරාත්මා, අභ්‍යන්තරවූ ආත්මයතෙම; වාරිණා, දියෙන්; නශුද්ධ්‍යති, ශුද්ධනොවේ.

සංසාරයහරින්නාහට සැපබව.

684 ජන්මමෘත්‍යුජරාව්‍යාධිවෙදනාභිරභිප්ලුතම්
සංසාරමිදමත්‍යන්තමසාරං ත්‍යජතඃ සුඛම්.

ජන්ම, ඉපදීමද; මෘත්‍යු, මරණයද; ජරාව්‍යාධිවෙදනාභිඃ, ජරාවය— ව්‍යාධිය යනමේ වෙදනාවලින්; අභිප්ලුතම්, පතළාවූ; අත්‍යන්තං අසාරම්, අතිශයින් අසාරවූ; ඉදම්සංසාරම්, මේ සංසාරය; ත්‍යජතඃ, හරින්නාහට; සුඛම්, සැපයි.

දු ක ම මු ත් සැ ප ත ක් නැ ති බ ව.

685 දුඃඛමෙවාස්ති න සුඛං යස්මාත්තදුපලක්‍ෂ්‍යතෙ
දුඃඛාර්තස්‍ය ප්‍රතිකාරෙ සුඛසංඥා විධීයතෙ.

දුඃඛංඑව, දුකම; අස්ති, ඇත්තේය; සුඛම්, සැපයෙක්; න, නැත්තේය. තත්, ඒදුක; යස්මාත්, යම්කාරණයෙකින්; උපලක්‍ෂ්‍යතෙ, දන්නා

ලැබේද; දුඃඛාර්තස්‍ය, දුකින් මඩනාලද්දහුගේ; ප්‍රතීකාරෙ, ශමනකළ කල්හි; සුඛසංඥා, සැපයයන නාමයතොමෝ; 'විධීයතෙ, කරණු ලැබේ.

ඇලීම හළයුතුබව හා සත්පුරුෂයන්හා ඇලියයුතුබව.

686 සඞ්ගඃ සර්වාත්මනා ත්‍යාජ්‍යඃ ස චෙත් ත්‍යක්තුං න ශක්‍යතෙ
ස සද්භිඃ සහ කර්තව්‍යඃ සතාං සඞ්ගො හි භෙෂජම්.

සඞ්ගඃ, ඇලීමතෙම; සර්වාත්මනා, සියලු පරිද්දෙන්; ත්‍යාජ්‍යඃ, දුරුකට යුතුය; සඃ, ඒ ඇලීම; චෙත්, ඉදින්; ත්‍යක්තුං, හරින්ට; නශක්‍යතෙ, හැකිනොවේද; සඃ, ඒමිත්‍රභාවයතෙම; සද්භිඃසහ, පණ්ඩිතයන්හා සමග; කර්තව්‍යඃ, කටයුතුවෙයි. සතාම්, පණ්ඩිතයන්ගේ; සඞ්ගඃහි, මිත්‍රභාවය වනාහි; භෙෂජම්, බෙහෙදෙකි,

කාමය හළයුතුබවහා එසේ නොහැකිනම් ස්වකීය අඹුවකෙරෙහි පැවතියයුතුබව.

687 කාමඃ සර්වාත්මනා හෙයඃ ස චෙද්ධාතුං න ශක්‍යතෙ
ස්වභාර්‍ය්‍යාං ප්‍රතිකර්තව්‍යඃ සෛව තස්‍ය හි භෙෂජම්.

කාමඃ, කාමයතෙම; සර්වාත්මනා, සියලුලෙසින්; හෙයඃ, හළයුතුවෙයි. සඃ, ඒ කාමයතෙම; හාතුං, දුරුකරන්ට; චෙත්නශක්‍යතෙ, ඉදින්හැකි නොවේද; ස්වභාර්‍ය්‍යාංප්‍රති, තමාගේ අඹුවකෙරෙහි; කර්තව්‍යඃ, කටයුතුය. සාඑව, ඒ අඹුවම; තස්‍යහි, ඕහට වනාහි; භෙෂජම්, බෙහෙදෙකි.

උත්තමයන්හු සතුරගේ වැඩහෝ අවැඩ ප්‍රකාශනොකරණබව.

688 න ශරන්මෙඝවත් කාර්‍ය්‍යං වෘථෛව ඝනගර්ජිතම්
පරස්‍යාර්ථමනර්ථං වා ප්‍රකාශයති නො මහාන්.

ශරත්මෙඝවත්, ශරත් ඍතුවෙහි වැසිවලාමෙන්; වෘථාඑව, සිස්මවූ; ඝනගර්ජිතම්, මෙඝගර්ජිනාව; නකාර්‍ය්‍යං, නොකටයුතුය. මහාන්, උත්තමතෙම; පරස්‍ය, සතුරගේ; අර්ථං, වැඩහෝ; අනර්ථංවා, අවැඩහෝ; නොප්‍රකාශයති, පහළ නොකෙරේ.

බොහෝවූ සතුරෝ රජක්හුවිසින් ජයගතනොහැකිබව,

689 එකදා න විගෘහ්ණීයාත් බහූන් රාජා විවාදිනඃ
සදර්පොප්‍යුරගඃ කීටෛර්බහුභිර්නාශිතො ධ්‍රුවම්.

රාජා, රජතෙම; එකදා, සමහරකාලයෙක්හි; බහූන්විවාදිනඃ, බොහෝ සතුරන්; නවිගෘහ්ණීයාත්, ජයනොගන්නේය. සදර්පඃ, අහංකාර සහිතවූ; උරගඃඅපි, සර්පතෙමේද; බහුභිඃකීටෛඃ, බොහෝවූ පණුවන් විසින්; ධ්‍රුවම්, එකාන්තයෙන්; නාශිතඃ, නසනලද්දේය.

### කථාවකගේ මාතෘකා ශ්ලෝකයක්.

690 යොර්ථතත්වමවිඥාය ක්‍රොධස්‍යෛව වශං ගතඃ
ස තථා තප්‍යතෙ මූඪො බ්‍රාහ්මණො නකුලාදිව.

යඃ, යමෙක්තෙම; අර්ථතත්වං, අර්ථයන්ගේඇති ස්වභාවය; අවිඥාය, නොදැන; ක්‍රොධස්‍යෙව, ක්‍රොධයාගේම; වශංගතඃ, යටත්බවට පැමිණියේද; සඃමූඪඃ, ඒ අඥානතෙම; නකුලාත්, මුගටියා කෙරෙන්; බ්‍රාහ්මණඃඉව, බමුණාමෙන්; තථා, එ පරිද්දෙන්; තප්‍යතෙ, තැවේ. *

### අමාත්‍යයාගේ උතුම්ගුණ.

691 ස්මෘතිශ්ච පරමාර්ථෙෂු විතර්කො ඥානනිශ්චයඃ
දෘඪතා මන්ත්‍රගුප්තිශ්ච මන්ත්‍රිණඃ පරමො ගුණඃ.

පරමාර්ථෙෂු, උතුම්අර්ථයෙහි; ස්මෘතිඃච, සිහිකිරීමද; විතර්කඃ, පරීක්ෂාවද; ඥානනිශ්චයඃ, ප්‍රඥාවගේ නියමයද; දෘඪතා, ස්ථිරබවද; මන්ත්‍රගුප්තිඃච, රහස් සැඟවීමද; මන්ත්‍රිණඃ, ඇමතියාගේ; පරමඃගුණඃ, උතුම් ගුණවෙයි.

### පරීක්ෂානොකිරීම විපත්තියට ස්ථානබැවින් ක්‍රියාවක් වහා නොකටයුතුබව.

692 සහසා විදධීත න ක්‍රියාමවිවෙකඃ පරමාපදාං පදම්
වෘණතෙ හි විමෘශ්‍යකාරිණං ගුණලුබ්ධාඃ ස්වයමෙව සම්පදඃ.

---

* උදෙනි නුවරෙහි මාධවනම් බ්‍රාහ්මණයෙක් ඇත්තේය. ඔහුගේ අඹුතොමෝ දරුවකු වැදීය. ඒ අඹුතොමෝ ළදරුපුත්‍රයා රක්නාපිණිස බමුණාසිටුවා ස්නානය පිණිස ගියාය. එකල්හි බමුණාට අමාවක් දිනයෙහි පිතෘදානයක් දීමට රජ්ජුකෙරෙන් කැඳවන්නෙක් ආයේය. ඔහු දැක බ්‍රාහ්මණතෙම උපන්තැන්පටන් දිළිඳු බැවින් වහානොයන්නේනම් එකල්හි අන් කිසිවෙක් දානය ගන්නේයයි සිතුයේය. ළදරුවාද මෙහිනවෙයි. රක්ෂාකරන්නාවූ කිසිවෙක්ද නැත්තේය. එබැවින් කුමක්කෙරෙම්ද. බොහෝකාලයක් මුලුල්ලෙහි රක්නා ලද්දාවූ පුත්‍රයකුහා වෙනස්නුවූ නම් මේ මුගටියෙක් ඇද්ද ඒ මුගටියා බාලයා රක්නාපිණිස නියමකොට යන්නෙමියි එසේකොට ගියේය, පසුව එහි මුගටියා විසින් බාලයා සමීපයට නිඃශබ්දව එන්නාවූ නාගයෙක් මරණලද්දේ සිඳිනා ලද්දේය. පසුව මේ මුගටිතෙම එන්නාවූ බ්‍රාහ්මණයාදැක ලේතැවරුණාවූ මුඛයහා පාදයඇත්තේ වහා එළඹ බ්‍රාහ්මණයාගේ පාදෙහි ඇලුනේය, ඉක්බිත්තෙන් මේ බ්‍රාහ්මණතෙම එබඳුවූ ඔහු දැක මාගේ පුත්‍රතෙම මේ මුගටියා විසින් කනලද්දේයයි සිතා පරීක්ෂානොකොට ඒ මුගටියා මැරුයේය, පසුව බමුණුතෙම යම්තාක් සමීපයට එළඹ බලාද ළදරුතෙම සැපසේ නිදයි. නසනලද සර්පයාද ඇත්තේය. එකල්හි ඒ බ්‍රාහ්මණතෙම අතිශයින් කලකිරීමට පැමිණියේය,

ක්‍රියාම්, ක්‍රියාව; සහසා, වහා; නවිදධීත, නොකරන්නේය; අවිවෙ
කඃ, පරීක්ෂා නොකිරීම; පරම්, අතිශයින්; ආපදම්, විපත්තීන්ගේ; පද
ම්, ස්ථානවෙයි. විමෘශ්‍යකාරිණං, පරීක්ෂාකොට කරන්නාවූ; ගුණලු
බ්ධාඃ, ගුණයෙහි ලොභවූ; සම්පදඃ, සම්පත්තීහු; ස්වයම්එව, තෙමෙව;
වෘණතෙහි; ආශ්‍රයකෙරෙත්මය.

ගැ ළ පි මෙ හි වැ ඩ.

693 යද්‍යප්‍යුපායාශ්චත්වාරො නිර්දිෂ්ටාඃ සාධ්‍යසාධනෙ
සංඛ්‍යාමාත්‍රං ඵලං තෙෂාං සිද්ධිඃ සාමනි ව්‍යවස්ථිතා.

සාධ්‍යසාධනෙ, සිඬකිරීමට යොග්‍යයන්ගේ සිඬකිරීමෙහි; යදිඅපි, ඉදින්වනාහි; චත්වාරඃ උපායාඃ, උපාය සතරක්; නිර්දිෂ්ටාඃ, දක්වනලද්දැහුද; තෙෂාම්, ඔවුන්ගේ; ඵලං, ඵලය; සංඛ්‍යාමාත්‍රං, ගණන පමණක්වෙයි. සාමනි, ගැළපීමෙහි; සිද්ධිඃ, වැඩීම; ව්‍යවස්ථිතා, නියමකරණ ලද්දීය.

ස්වල්ප නුවණින් අපණ්ඩිතවූවක්හු සතුටුකළ නොහැකිබව.

694 අඥඃ සුඛමාරාධ්‍යඃ සුඛතරමාරාධ්‍යතෙ විශෙෂඥඃ
ඥානලවදුර්විදග්ධං බ්‍රහ්මාපි නරං න රඤ්ජයති.

අඥඃ, අඥානතැනැත්තේ; සුඛම්, සැපසේ; ආරාධ්‍යඃ, සතුටුකළයුතුවේ. විශෙෂඥඃ, විශෙෂදන්නා නුවණැති තැනැත්තේ; සුඛතරම්, අතිශයින් සුවසේ; ආරාධ්‍යතෙ, සතුටුකරණුලැබේ. ඥානලව, ස්වල්ප නුවණින්; දුර්විදග්ධං, අඥානවූ; නරං, මනුෂ්‍යයා; බ්‍රහ්මාඅපි, බ්‍රහ්මයාද; නරඤ්ජයති, සතුටු නොකෙරේ.

අසම්මුඛයෙහි ගුණපැවතුම් උතුම්බව.

695 කර්මානුමෙයාඃ සර්වත්‍ර පරොක්ෂගුණවෘත්තයඃ
තස්මාත් පරොක්ෂවෘත්තීනාං ඵලෛඃ කර්ම විභාවයෙත්.

පරොක්ෂෙ, අසම්මුඛයෙහි; ගුණවෘත්තයඃ, ගුණපැවතුම්; සර්වත්‍ර, සියලුතැන්හි; කර්මානුමෙයාඃ, ක්‍රියාවට ප්‍රමාණවන්නාහුය. තස්මාත්, එහෙයින්; පරොක්ෂවෘත්තීනාං, අසම්මුඛයෙහි ගුණපැවතුම් ඇත්තවුන්ගේ; ඵලෛඃ, ඵලයන් කරණකොටගෙණ; කර්ම, ක්‍රියාව, විභාවයෙත්, දක්වන්නේය.

කුහකයන්ගේ කපටියෙදිම්වලින් වඤ්චලවූ ලොකයා සැබෑ
වකෙරෙහිත් සැක කරණබව.

696 සරසි බහුශස්තාරාච්ඡායෙක්ෂණාත් පරිවඤ්චිතඃ
කුමුදවිටපාන්වෙෂී හංසො නිශාසු විචක්ෂණඃ.
න දශති පුනස්තාරාශඞ්කී දිවාපි සිතොත්පලං
කුහකචකිතො ලොකඃ සත්‍යෙප්‍යපායමපෙක්ෂතෙ.

විචක්ෂණඃ, නුවණැත්තාවූ; හංසඃ, හංසතෙම; සරසි, විල්හි; කුමුදවිටප, මහනෙල්දඹු; අන්වෙෂී, සොයන්නේ; නිශාසු, රාත්‍රිකාලයන්හි; තාරජායාභ්‍රක්ෂණාත්, තාරකාවන්ගේ ජායා දැකීමෙන්; බහුශඃ, බොහෝ සෙයින්; පරිවඤ්චිතඃ, රැවටුනේ; පුනඃ, නැවත; තාරශඞ්කී, තරුයයි සැකඇත්තේ; දිවාඅපි, දවල්කාලයෙහිද; සිතොත්පලම්, සුදුඋපුල්; න දශති, මුඛයෙන් නොගණී; කුහකචකිතඃ, කපටීන්නිසා චඤ්චලවූ; ලොකඃ, ජනතෙම; සත්‍යෙඅපි, සැබෑවෙහිද; අපායං, අසත්‍යයයි; අපෙක්ෂතෙ, දකී.

දුර්ජනයන් කෙරෙහි දූෂ්‍යසිත් ඇත්තාහට සත්පුරුෂයන් කෙරෙ
හිත් විශ්වාසයක් නැතිබව.

697 දුර්ජනදූෂිතමනසඃ සුජනෙෂ්වපි නාස්ති විශ්වාසඃ
බාලඃ පායසදග්ධො දධ්‍යපි නනු ඵූත්කෘත්‍ය භුඞ්ක්තෙ.

දුර්ජනදූෂිතමනසඃ, අසත්පුරුෂයන්කෙරේ දූෂ්‍යසිත්ඇත්තාහට; සුජනෙෂ්වපි, සත්පුරුෂයන්කෙරෙහිද; විශ්වාසඃ, විශ්වාසයෙක්; නාස්ති, නැත්තේය. පායසදග්ධඃ, කිරිබතින් දවනලද්දාවූ; බාලඃ, ලදරුතෙම; ඵූත්කෘත්‍ය, ඵූයන ශබ්දකරණ ලද්දාවූ; දධිඅපි, දීද; භුඞ්ක්තෙ, අනුභව කෙරේ; නනු, නොවේද.

ලොභතැනැත්තාද—තදතැනැත්තාද—අඥනයාද—පණ්ඩිත
යාදයන සතරදෙනාගේ සිත්ගන්නා ක්‍රමය.

698 ලුබ්ධමර්ථෙන ගෘහ්ණීයාත් ස්තබ්ධමඤ්ජලිකර්මණා
මූර්ඛං ඡන්දානුවෘත්තෙන යාථාතථ්‍යෙන පණ්ඩිතම්.

ලුබ්ධං, ලොභතැනැත්තා; අර්ථෙන, ධනදීමෙන්ද; ස්තබ්ධම්, තදතැනැත්තා; අඤ්ජලිකර්මණා, නමස්කාරකිරීමෙන්ද; මූර්ඛං, අඥනයා; ඡන්දානුවෘත්තෙන, කැමැත්තට එකඟව පැවැත්මෙන්ද; පණ්ඩිතම්, පණ්ඩිතයා; යාථාතථ්‍යෙන, ඇති ස්වභාවයෙන්ද; ගෘහ්ණීයාත්, සිත් ගන්නේය.

මිත්‍රාදීන්ගේ සිත්ගන්නාක්‍රමය.

699 සද්භාවෙන හරෙන්මිත්‍රං සම්භ්‍රමෙණ තු බාන්ධවාන්
ස්ත්‍රීභෘත්‍යාන් දානමානෙශ්ච දාක්ෂිණ්‍යෙනෙතරං ජනම්.

මිත්‍රම්, මිත්‍රයා; සද්භාවෙන, ඇති ස්වභාවයෙන්ද; බාන්ධවාන්, නෑයන්; සම්භ්‍රමෙණ, ආදර පැවැත්වීමෙන්ද; ස්ත්‍රීභෘත්‍යාන්, ස්ත්‍රියහා අමාත්‍යයන්; දානමානෛඃච, දීමය—ආදරයයන මෙයින්ද; ඉතරංජනම්, සෙසුජනයා; දාක්ෂිණ්‍යෙන, අනුකූලභාවයෙන්ද; හරෙත්, සිත්ගන්නේය.

මිත්‍රකටයුත්තෙක්.

700 බලීයසා'භියුක්තස්තු නෘපොනාන්‍යප්‍රතික්‍රියඃ
ආපන්නඃ සන්ධිමන්විච්ඡෙත් කුර්වාණඃ කාලයාපනම්.

බලීයසා, බලඇත්තක්හුගා සමග; අභියුක්තඃ, ගැළපුනාවූ; නෘපඃ, රජතෙම; අනන්‍යප්‍රතික්‍රියඃ, අනික්ප්‍රතිකාරයක් නැත්තෙක්බවට; ආපන්නඃ, පැමිණියේද; කාලයාපනම්, කාලය පසුකරගැන්ම; කුර්වාණඃ, කරණ තැනැත්තේ; සන්ධිං, මිත්‍රභාවය; ඉච්ඡෙත්, කැමැතිවන්නේය.

මිත්‍රවීම් සොළස.

701 කපාල උපහාරශ්ච සන්තානඃ සඞ්ගතස්තථා
උපන්‍යාසඃ ප්‍රතීකාරඃ සංයොගඃ පුරුෂාන්තරඃ.
අදෘෂ්ටනර ආදිෂ්ට ආත්මාදිෂ්ට උපග්‍රහඃ
පරික්‍රයස්තථොච්ඡින්නස්තථා ච පරගූෂණඃ.
ස්කන්ධොපනෙයඃ සන්ධිශ්ච ෂොඩශෛතෙ ප්‍රකීර්තිතාඃ
ඉති ෂොඩශකං ප්‍රාහුඃ සන්ධිං සන්ධිවිචක්ෂණාඃ.

කපාලඃ, කපාලසන්ධිය; උපහාරඃච, උපහාරසන්ධියද; සන්තානඃ, සන්තානසන්ධිය; තථා, එසේම; සඞ්ගතඃ, සඞ්ගතසන්ධිය; උපන්‍යාසඃ, උපන්‍යාස සන්ධිය; ප්‍රතීකාරඃ, ප්‍රතීකාරසන්ධිය; සංයොගඃ, සංයොගසන්ධිය; පුරුෂාන්තරඃ, පුරුෂාන්තරසන්ධිය; අදෘෂ්ටනරඃ, අදෘෂ්ටනර සන්ධිය; ආදිෂ්ටඃ, ආදිෂ්ටසන්ධිය; ආත්මාදිෂ්ටඃ, ආත්මාදිෂ්ටසන්ධිය; උපග්‍රහඃ, උපග්‍රහසන්ධිය; පරික්‍රයඃ, පරික්‍රය සන්ධිය; තථා, එසේම; උච්ඡින්නඃ, උච්ඡින්නසන්ධිය; තථාච, එසේම; පරගූෂණඃ, පරභූෂණසන්ධිය; ස්කන්ධොපනෙයඃසන්ධිඃච, ස්කන්ධොපනෙයසන්ධියදැයි; එතෙෂොඩශ, මොහු සොළොස්දෙන; ප්‍රකීර්තිතාඃ, කියනලද්දාහුය; ෂොඩශකංසන්ධිං, සන්ධිසොළස; සන්ධිවිචක්ෂණාඃ, ගැළපීම් දන්නා නුවණැත්තෝ; ඉතිප්‍රාහුඃ, මෙසේ කීහු.

කපාල—උපහාරසන්ධිදෙක්හි ප්‍රකාශය.

702 කපාලසන්ධිර්විඥෙයඃ කෙවලං සමසන්ධිතඃ
සම්ප්‍රදානාද්භවති ය උපහාරඃ ස උච්‍යතෙ.

කෙවලං, සියල්ල; සමසන්ධිතඃ, සමවූ ගැළපීම් වශයෙන්; කපාලසන්ධිඃ, කපාලසන්ධියතෙම; විඥෙයඃ, දතයුතු. යඃ, යම් ගැළපීමෙක්; සම්ප්‍රදානාත්, (බන) දීමෙන්; භවති, වේද; සඃ, ඒ සන්ධියතෙම; උපහාරඃ, උපහාරසන්ධියයි; උච්‍යතෙ, කියනුලැබේ.

සන්තාන—සඞ්ගතසන්ධි දෙදෙනාගේ දැක්වීම.

703 සන්තානසන්ධිර්විඥෙයො දාරිකාදානපූර්වකඃ
සද්භිස්තු සඞ්ගතඃ සන්ධිර්මෛත්‍රීපූර්ව උදාහෘතඃ.

දාරිකාදාන පූර්වකඃ, කන්‍යාවන්දීම මුල්කොටඇත්තේ; සන්තානසන්ධිඃ, සන්තානසන්ධියයි; විඥෙයඃ, දතයුතු. මෛත්‍රීපූර්වඃ, මෛත්‍රිය මුල්කොට ඇත්තේ; සඞ්ගතඃ සන්ධිඃ, සඞ්ගතසන්ධියයි; සද්භිඃ, පණ්ඩිතයන් විසින්; උදාහෘතඃ, කියනලදී.

704 යාවදායුඃප්‍රමාණස්තු සමානාර්ථප්‍රයොජනඃ
සම්පත්තෞ වා විපත්තෞ වා කාරණෛර්යො න භිද්‍යතෙ.
සඞ්ගතඃ සන්ධිරෙවායං ප්‍රකෘෂ්ටත්වාත් සුවර්ණවත්
තථාන්‍යෛඃ සන්ධිකුශලෛඃ කාඤ්චනඃ ස උදාහෘතඃ.

ආයුඃප්‍රමාණඃතු, ආයුප්‍රමාණයවනාහි; යාවත්, යම්තාක්ද; සමානාර්ථප්‍රයොජනඃ, සමානවූ වැඩහා ප්‍රයොජන ඇත්තාවූ; යඃ, යම් මිත්‍රභාවයක්; සම්පත්තෞවා, සම්පත්තිකාලයෙහිහෝ; විපත්තෞවා, විපත්තිකාලයෙහිහෝ; කාරණෛඃ, හෙතුවලින්; නභිද්‍යතෙ, බිඳිනු නොලැබේද; අයං, මේතෙම, සුවර්ණවත්, රන්මෙන්; ප්‍රකෘෂ්ටත්වාත්, උත්කෘෂ්ටබැවින්; සඞ්ගතඃ සන්ධිඃඑව, සඞ්ගතසන්ධියමවෙයි. තථා, එසේම; සන්ධිකුශලෛඃ, මිත්‍රභාවයෙහි දක්ෂවූ; අන්‍යෛඃ, සෙස්සන්විසින්; සඃ, ඒ සන්ධිතෙම; කාඤ්චනඃ, කාඤ්චනසන්ධියයි; උදාහෘතඃ, කියනලදී,

උපන්‍යාස සන්ධිය.

705 ද්‍රව්‍යාත්මකාය්‍යසිද්ධිං තු සමුද්දිශ්‍ය ක්‍රියෙත යඃ
ස උපන්‍යාසකුශලෛරුපන්‍යාස උදාහෘතඃ.

ද්‍රව්‍ය, ධනය; ආත්මකාය්‍යසිද්ධිංතු, තමාගේ කටයුතු සිද්ධකිරීමද වනාහි; සමුද්දිශ්‍ය, උදෙසා; යඃ, යම් මිත්‍රභාවයෙක්; ක්‍රියෙත, කරන්නේද; සඃ, ඒ ගැළපීම; උපන්‍යාසකුශලෛඃ, උපන්‍යාසයෙහි දක්ෂයන් විසින්; උපන්‍යාසඃ, උපන්‍යාස සන්ධියයි; උදාහෘතඃ, කියනලදී.

ප්‍ර ති කා ර ස න්ධි ය.

706 මයාස්‍යොපකෘතං පූර්වං මමාප්‍යෙෂ කරිෂ්‍යති
ඉති යඃ ක්‍රියතෙ සන්ධිඃ ප්‍රතිකාරඃ ස උච්‍යතෙ.

මයා, මාවිසින්; පූර්වං, පළමුකොට; අස්‍ය, මොහට; උපකෘතං, උපකාරකරණලද්දේය; එෂඃ, මේතෙම; මමඅපි, මටද; කරිෂ්‍යති, (උපකාර)

කරන්නේදැයි; ඉති, මෙසේ; යඃසන්ධිඃ, යම් මිත්‍රභාවයෙක්; ක්‍රියතෙ, කරණුලැබේද; සඃ, ඒ මිත්‍රභාවයතෙම; ප්‍රතිකාරඃ, ප්‍රතිකාර සන්ධියයි; උච්‍යතෙ, කියනුලැබේ.

707 උපකාරං කරෝම්‍යස්‍ය මමාප්‍යෙෂ කරිෂ්‍යති
අයං චාපි ප්‍රතිකාරෙ රාමසුග්‍රීවයොරිව.

අස්‍ය, මොහුට; උපකාරං, උපකාරය; කරෝමි, කෙරෙමි. එෂඃ මේතෙම; මමඅපි, මටද; කරිෂ්‍යති, (උපකාර) කරන්නේයයන; රාමසුග්‍රීවයොඃ ඉව, රාමසුග්‍රීව දෙදෙනාගේ මිත්‍රභාවයමෙන්; අයංචාපි, මේ තෙතෙම්ද; ප්‍රතිකාරඃ, ප්‍රතිකාරසන්ධියවෙයි.

සංයොග සන්ධිය.

708 එකාර්ථං සම්‍යගුද්දිශ්‍ය ක්‍රියාං යත්‍ර හි ගච්ඡති
සුසංහිතප්‍රමාණස්තු ස ච සංයොග උච්‍යතෙ.

එකාර්ථං ක්‍රියාං, එකක් ප්‍රයොජනකොට පවත්නාවූ ක්‍රියාවක්; උද්දිශ්‍යහි, උදෙසා වනාහි; යත්‍ර, යම්තැනෙක්හි; සම්‍යක්, මනාකොට; ගච්ඡති, යේද; සුසංහිතප්‍රමාණඃතු, මනාව ගැළපිච් ප්‍රමාණවූ; සඃච, ඒ මිත්‍රභාවයද; සංයොගඃ, සංයොගසන්ධියයි; උච්‍යතෙ, කියනුලැබේ.

පුරුෂාන්තර සන්ධිය.

709 අවයොර්‍යොධමුඛ්‍යෙස්තු මදර්ථඃ සාධ්‍යතාමිති
යස්මින් පණස්තු ක්‍රියතෙ ස සන්ධිඃ පුරුෂාන්තරඃ,

ආවයොඃ, අප දෙදෙනාගේ; යොධමුඛ්‍යෛඃතු, ප්‍රධාන සෙවකයන් විසින් වනාහි; මත්අර්ථඃ, මාගේවැඩ; සාධ්‍යතාම්ඉති, සිඩකරණුලැබේව යි; යස්මිනතු, යමක්හුකෙරෙහි වනාහි; පණස්තුක්‍රියතෙ, මිත්‍රභාවයකරණුලැබේද; සඃසන්ධිඃ, ඒ මිත්‍රභාවය; පුරුෂාන්තරඃ, පුරුෂාන්තරනම්.

අදෘෂ්ටනර සන්ධිය.

710 ත්වයෛකෙන මදීයොර්ථඃ සම්ප්‍රසාධ්‍යස්ත්වසාවිති
යත්‍ර ශත්‍රුඃ පණං කුර්‍යාත් සොදෘෂ්ටපුරුෂඃ ස්මෘතඃ.

ත්වයාඑකෙන, තුදකලාවූ තාවිසින්; මදීයඃ, මාසන්තකවූ; අසෞඅර්ථඃ, මේ අර්ථයතෙම; සම්ප්‍රසාධ්‍යස්තුඉති, මනාකොට සිඩකරණුලැබේව යි; යත්‍ර, යම්තැනෙක්හි; ශත්‍රුඃ, සතුරුහුගේ; පණංකුර්‍යාත්, මිත්‍රභාවය කරන්නේද; සඃ, ඒ මිත්‍රභාවයතෙම; අදෘෂ්ට පුරුෂඃ, අදෘෂ්ටනරසන්ධියයි; ස්මෘතඃ, දන්නාලදී.

ආදිෂ්ට සන්ධිය.

711 යත්‍ර භූම්‍යෙකදෙශෙන පණෙන රිපුර්වර්ජිතඃ
සන්ධීයතෙ සන්ධිවිද්භිඃ ආදිෂ්ටඃ ස උදාහෘතඃ.

යත්‍ර, යම්කාලයෙක්හි; භූම්‍යෙකදෙශෙන, භූමියසම්බන්ධවූ එක්භාගයක්වූ; පණෙන, මිත්‍රභාවයෙන්; රිපුවර්ජිතඃ, සතුරන්ගේ දුරුකිරීම කරණලද්දේ; සන්ධීයතෙ, මිත්‍රකරණුලැබේද; සඃ, ඒ මිත්‍රභාවයතෙම, සන්ධිවිද්භිඃ, ගැළපිම් දන්නාවුන්විසින්; ආදිෂ්ටඃ උදාහෘතඃ, ආදිෂ්ට සන්ධියයි කියනලදී·

ආත්මාදිෂ්ටසන්ධිය—උපග්‍රහසන්ධියයන දෙක·

712 ස්වසෛන්‍යෙන තු සන්ධානමාත්මාදිෂ්ට උදාහෘතඃ
ක්‍රියතෙ ප්‍රාණරක්ෂාර්ථං සර්වදානාදුපග්‍රහඃ·

ස්වසෛන්‍යෙනතු, තමාගේ සේනාවෙන් වනාහි; සන්ධානං, ගැළපිම; ආත්මාදිෂ්ටඃ, ආත්මාදිෂ්ටසන්ධියයි; උදාහෘතඃ, කියනලද්දේය. ප්‍රාණරක්ෂාර්ථං, ප්‍රාණරක්ෂාව පිණිස; සර්වදානාත්; සියල්ලදීම හෙතුකොට ගෙණ; උපග්‍රහඃ, උපග්‍රහසන්ධියතෙම; ක්‍රියතෙ, කරණුලැබේ.

ප රි ක්‍ර ය ස න්ධි ය.

713 කොශාංශෙනාර්ධකොශෙණ සර්වදානෙන වා පුනඃ
ශිෂ්ටස්‍ය ප්‍රතිරක්ෂාර්ථං පරික්‍රය උදාහෘතඃ·

ශිෂ්ටස්‍ය, ඉතිරිප්‍රකෘතීහුගේ; ප්‍රතිරක්ෂාර්ථං, රැකගන්නා පිණිස; කොශාංශෙන, ධනකොටසෙකින්හෝ; අර්ධකොශෙණ, අර්ධධනයෙකින්හෝ; පුනඃ, නැවත; වා, නොහොත්; සර්වදානෙන, සියලු ධනයදීමෙන් කරණුලබන සන්ධියතෙම; පරික්‍රයඃ, පරික්‍රය සන්ධියයි; උදාහෘතඃ, කියනලදී·

උච්ඡින්නය—පරභූෂණයයන සන්ධි දෙක·

714 භුවාං සාරවතීනාං තු දානාදුච්ඡින්න උච්‍යතෙ
භූම්‍යුත්ථඵලදානෙන සර්වෙණ පරභූෂණඃ.

සාරවතීනාං, සාරඇත්තාවූ; භුවාංතු, භූමිභාගයන්ගේ වනාහි; දානාත්, දීම හෙතුකොටගෙණ කරණුලබන සන්ධියතෙම; උච්ඡින්නඃ, උච්ඡින්නසන්ධියයි; උච්‍යතෙ, කියණුලැබේ සර්වෙණභූම්‍යුත්ථඵලදානෙන, භූමියෙහි උපදනාවූ සියලු ඵලදීමෙන්; පරභූෂණඃ, පරභූෂණ නම් සන්ධිය කියනුලැබේ·

ස්ක න්ධො ප නෙ ය ස න්ධි ය.

715 පරිච්ඡින්නං ඵලං යත්‍ර ප්‍රතිස්කන්ධෙන දීයතෙ
ස්කන්ධොපනෙයං තං ප්‍රාහුඃ සන්ධිං සන්ධිවිචක්ෂණාඃ.

යත්‍ර, යම්තැනෙක්හි; පරිච්ඡින්නං, සිඳිනලද්දාවූ; ඵලං, ඵල; ප්‍රතිස්කන්ධෙන, එක් එක් කොටසින්; දීයතෙ, දෙනුලැබේද; තංසන්ධිං, ඒ සන්ධිය; සන්ධිවිචක්ෂණාඃ, සන්ධිදන්නා නුවණැත්තෝ; ස්කන්ධොපනෙයං, ස්කන්ධොපනෙය සන්ධියයි; ප්‍රාහුඃ, කියත්,

ස න්ධි ස ත ර ක්.

716 පරස්පරොපකාරස්තු මෛත්‍රී සම්බන්ධකස්තථා
උපහාරශ්ච විඥෙයාශ්චත්වාරශ්චෛව සන්ධයඃ.

පරස්පරොපකාරඃතු, පරස්පරොපකාරසන්ධිදද; මෛත්‍රී, මෛත්‍රීසන්ධිය ද; තථා, එසේම; සම්බන්ධකඃ, සම්බන්ධකසන්ධිදද; උපහාරඃචඒව, උපහාරසන්ධියදයන; චත්වාරඃසන්ධයඃ, සතරසන්ධිහු; විඥෙයාඃ, දතයුතුකතාහුය

ම ත දැ ක් වී මෙ ක්.

717 එක එවොපහාරශ්ච සන්ධිරෙව මතො මම
උපහාරවිභින්නාස්තු සර්වේ මෛත්‍රවිවර්ජිතාඃ.

එකඃ උපහාරඃ සන්ධිඃ එවච, එකම උපහාරසන්ධියයි කියාම; මම මතඃ, මාගේ මතයයි. උපහාරවිභින්නාඃ, උපහාරයා කෙරෙන් වෙන්වූ; සර්වේ සියල්ලෝ; මෛත්‍රවිවර්ජිතාඃඑව, මිත්‍රභාවයෙන් තොරවූවාහුමවෙත්.

උපහාර සන්ධියහැර අන්සන්ධියක් නැතිබව.

718 අභියොක්තා බලීයස්ත්වාද ලබ්ධ්වා න නිවර්තතෙ
උපහාරාදෘතෙ තස්මාත් සන්ධිරන්‍යො න විද්‍යතෙ.

අභියොක්තා, නියොගකරණ තැනැත්තේ; බලීයස්ත්වාත්, බලඇතිබැවින්; අලබ්ධ්වා, ජයනොලැබ; නනිවර්තතෙ, නොනවති. තස්මාත් උපහාරාත්, ඒ උපහාරයකෙරෙන්; ඍතෙ, තොරවූ කල්හි; අන්‍යඃ සන්ධිඃ, අන්සන්ධියෙක්; නවිද්‍යතෙ, නැත්තේය.

අධර්මයෙහි හැසිරීමේ නිරර්ථකබව.

719 ආධිව්‍යාධිපරීතාපෛරද්‍ය ශ්වො වා විනාශිනෙ
කො හි නාම ශරීරාය ධර්මාපෙතං සමාචරෙත්.

ආධි, චිත්තපීඩාය; ව්‍යාධි, ලෙඩය; පරීතාපෛඃ, සිත්තැවීමය යනමෙසින් යුක්තවූ; අද්‍ය, අදහෝ; ශ්වොවා, සෙටහෝ; විනාශිනෙ, නස්නාවූ; ශරීරාය, ශරීරයසඳහා; කඃහිනාම, කවරෙක්නම්; ධර්මාපෙතං; අධර්මයෙහි; සමාචරෙත්, හැසිරෙන්නේද.

දෙහයෙහි අනිස්ථිරත්වය සලකා ධර්මයෙහි හැසිරියයුතුබව,

720 ජලාන්තශ්චන්‍ද්‍රචපලං ජීවිතං ඛලු දෙහිනාම්
තථාවිධම්තිඥාත්වා ශශ්වත් කල්‍යාණමාචරෙත්.

දෙහිනාම්, මිනිසුන්ගේ; ජීවිතංඛලු, ජීවිතය වනාහි; ජලාන්තශ්චන්‍ද්‍රචපලම්, ජලමධ්‍යයෙහිවූසඳමෙන් චඤ්චලවෙයි. තථාවිධංඉති, එබඳුය යි; ඥාත්වා, දැන; ශශ්වත්, නිරන්තරයෙන්; කල්‍යාණං, ධර්මයෙහි; ආචරෙත්, හැසිරෙන්නේය.

සත්පුරුෂයන්හා ගැළපියයුතුබව.

721 මාතෘතාමරසමං විෂම සංසාරං කණ්ටකාකුලම්
සජ්ජනෛඃ සඞ්ගතං කුර්‍යාත් ධර්මාය ච සුඛාය ච.

කණ්ටකාකුලම්, කණ්ටයකින් බිඳෙන සුලුවූ; සංසාරං, සංසාරය; මාගතාමරසමං, පිරිගුඩියසමයයි; විෂම, සලකා; ධර්මායච, ධර්මයසඳහාද; සුඛායච, සැපසඳහාද; සජ්ජනෛඃ, සත්පුරුෂයන්හා; සඞ්ගතං, යෙදීම; කුර්‍යාත්, කරන්නේය.

ස ත්‍ය යා ගේ ම හ ත්ත්ව ය.

722 අශ්වමේධසහස්‍රං ච සත්‍යඤ්ච තුලයා ධෘතම්
අශ්වමේධසහස්‍රාද්ධි සත්‍යමෙවාතිරිච්‍යතෙ.

අශ්වමෙධසහස්‍රංච, අශ්වමෙධයාග දහසෙක්ද; සත්‍යඤ්ච, සැබෑබස ද; තුලයා, තරාදියෙන්; ධෘතම්, දරණලද්දේ; අශ්වමෙධ සහස්‍රාත්හි, අශ්වමෙධයාග දහසටවඩා; සත්‍යංඑව, සැබෑබසම; අතිරිච්‍යතෙ, අධික වෙයි.

හිතොපදෙශයෙහි අවසාන ශ්ලෝකය.

723 සන්ධිඃ සර්වමහීභුජාං විජයිනාමස්තු ප්‍රමොදඃ සදා
සන්තඃ සන්තු නිරාපදඃ සුකෘතිනාං කීර්ත්තිශ්චිරං වර්ද්ධතාම්.
නීතිර්වාරවිලාසිනීව සතතං වක්ෂඃස්ථලෙ රාජතාං
වක්ත්‍රං චුම්බතු මන්ත්‍රිණාමහරහො භූයාන්මහානුත්සවඃ.

. සන්ධිඃ, මිත්‍රභාවයතෙම; සර්වමහීභුජාං, සියලු රජුන්ට; අස්තු, වේවා විජයිනාම්, ජයඇත්තවුන්ගේ; සදා, හැමකල්හි; ප්‍රමොදඃ, සන්තොෂයතෙම; (වේවා); සන්තඃ, සත්පුරුෂයෝ; නිරාපදඃ, විපත්තිරහිතවූවාහු; සන්තු, වෙත්වා; සුකෘතිනාම්, මනාක්‍රියා ඇත්තවුන්ගේ; කීර්ත්තිඃ, කීර්ත්තිතොමෝ; චිරං, බොහෝකාලයක් මුලුල්ලෙහි; වර්ද්ධතාම්, වැඩේවා; නීතිඃ, නීතිතොමෝ; වාරවිලාසිනීව, වෙසාස්ත්‍රියක්මෙන්; සතතං, නිරන්තරයෙන්; වක්ෂඃස්ථලෙ, උරස්ථලයෙහි; රාජතාං, බබලාවා. මන්ත්‍රිණාං, අමාත්‍යයන්ගේ; වක්ත්‍රං, මුඛයද; චුම්බතු, සිඹිවා. අහඃ අහඃ, දවසක් දවසක්පාසා; මහාන්උත්සවඃ, මහත්සැනකෙළියතෙම; භූයාත්, වේවා.

--- ස මා ප්ත මි ---

# හිතොපදෙශයෙහි කථා

# හි තො ප දෙ ශ යෙ හි ක ථා.

හිතොපදෙශයෙහි සන්නය ලියන්නාවූ අපි පොත මහත්වූකල මුද්‍රාඞ්කණ කරවීමේ දුෂ්කරය සලකා ශ්ලොක පමණක් සන්නකර මුද්‍රාඞ්කණ කරවීමට අදහස්කර එසේම මුද්‍රාඞ්කණ කරවමින් එන අතර අපමිත්‍රයන්ගේ ඉල්ලීම නිසා **347** වෙනි ශ්ලොකයපටන් කථාවන්ගේ මාතෘක ශ්ලොකලඟ ලකුණුකොට එහිපාත ඒ ඒ ශ්ලොකවලට අයිති කථාවන්ද සිංහල භාෂාවෙන් පමණක් ලියමින් අවුත් සමාපත කළෙමු. තවද, මෙහි කියනලද ශ්ලොකයට මුලින් එකමකථාවකුදු නොදැක්වූ බැවින් ඒ භාගවලද කථාවන් මෙහි ලිවීම සඳහා පොතේ ප්‍රකාශවූ මාතෘකා ශ්ලොකයන්ගේ ගණන් පමණක් මුලටකොට ඒ ඒ කථා දක්වනුලැබේ.

### 43 වෙනි මාතෘකා ශ්ලොකයෙහි කථාවයි.

ගොදාවරීනදී ඉවුරෙහි විශාලවූ ඉඹුල් වෘක්ෂයෙක් ඇත්තේය. නොයෙක් දිශාවෙහිවූ දෙශවලින් අවුත් පක්ෂීහු ඒ ගසෙහි වසත්. එකල්හි එක් දවසෙක්හි රාත්‍රිය ඉක්මුනුකල්හි පිණැත්තාවූ හෙළ උපුලට නායකවූ සඳමඬල අස්තපර්වතයෙහි තෝඩුවක්මෙන් එල්වෙනකල්හි පිබිදුනාවූ ලඝුපතනකයන නම්ඇති කවුඩුතෙම දෙවෙනිවූ මරුවකුමෙන් එන්නාවූ වැද්දා දුටුයේය. ඒ වැද්දාදැක අද උදයකාලයෙහිම අප්‍රියවූ දැකීමෙක්වූයේය. කවර අප්‍රියයෙක් කරන්නේදැයි නොදනිමියනු සිතුයේය. මෙසේ කියා ඒ කල්පනාවට එකඟවූ ක්‍රමයෙන් කැලඹුනාවූ සිත්ඇත්තේ ගියේය.

එකල්හි ඒ වැද්දා විසින් සහල්කැබලි විසුරුවා දැලවිසුරුවන ලද්දේය. ඒ වැද්දාද එහි සැඟවී සිටියේය. පිරිවර සහිතව අහස්හි හැසිරෙන්නාවූ චිත්‍රග්‍රීවනම් පරවි රජෙක් මේ කාලයෙහිම ඒ සහල්කැබලි දුටුයේය. නැවත පරවිරජතෙම සහල්කැබලිවලට ලොභවූ පරවියන්ට මිනිසුන්නැති මේ වනයෙහි සහල්කැබලි කොයින් ලැබේද ඒ කාරණය පළමුකොට සොයනුලැබේවා මෙය මනායයි නොසිතමි. මේ සහල්කැබලිවලට ලොභකිරීමෙන් බොහෝසෙයින් අපවිසිනුදු විපත්තියට පැමිණිය යුතුය. එබැවින් සර්වප්‍රකාරයෙන් පරීක්ෂා නොකරණලද ක්‍රියාව නොකටයුතුයයි කීයේය, මේ වචනයඅසා එක්තර පරවියෙක් විස්මයෙන කුමට මෙසේ කියනුලැබේදැයි අහංකාර සහිතවූ වචන කි

යේය. මේ වචන අසා සියලු පරවියෝ එතැන්හි උන්නාහුය. නැවත ඒ සියලු පරවියෝ දැලෙහි බැඳුනාහුය. ඉක්බිත්තෙන් ඇමක්හුගේ වචනයෙන් ඒ දැලෙහි එල්ලුනාහුද ඒ පරවියාට සියල්ලෝ නින්දාකෙරෙත්. ඔහුගේ ගර්හාකිරීම අසා චිත්‍රග්‍රීවතෙම මේ තෙම මොහුගේ දෝෂයෙක්නොවේ, විපත්තියට පැමිණිකල්හි විස්මයට පැමිණීම අඥාන ජනයාගේ ලක්ෂණයවෙයි, එහෙයින් මේ විපත්තියෙහිදී ධෛර්‍ය්‍යය වැළදගෙණ විපත්තියෙන් මිදීම පිණිස උපාය සොයනුලැබේවා. දැන් වනාහි සියල්ලවුන් විසින් එක්සිත්මෙන්වී දැලගෙණ අහසටනැගියනු ලැබේවයි කියේය. මෙසේ සිතා සියලු පක්‍ෂීහු දැලගෙණ නැගී ගියාහුය, ඉන්පසු ඒ වැදිතෙම දැලගෙණ යන්නාවූ ඔවුන් දුරදී බලා පසුභාගයෙන් දුවන්නේ සමගිවූ මේ පක්‍ෂීහු මාගේ දැලගෙණයෙත්. යම්දිනයෙක්හි වනාහි වැටෙද්ද එකල්හි මාගේ අයිතියට පැමිණෙයියනු සිතුයේය. නැවත ඒ පක්‍ෂීන් චක්‍ෂුපථය ඉක්මුණුකල්හි ඒ වැදිතෙම නැවැත්තේය. එකල්හි නැවතුනාවූ වැද්දාදැක දැන් කුමක් කිරීම සුදුසුදැයි පරවියෝ කීවෝය.—හිරණ්‍යකනම් මීරජෙක් ගණ්ඩකිනාදී ඉව්රෙහි වෙසෙයි, හෙතෙම මාගේ මිත්‍රවෙයි. හෙතෙම අපගේ බන්ධනකපන්නේයයි කියේය. මෙසේ නියමකොට සියල්ලෝ හිරණ්‍යකනම් මීයාගේ බිලය සමීපයට ගියෝය. හිරණ්‍යකයාද විපත්තිවලට සැකයෙන් හැමකල්හි සියයක් මුඛඇති බිලයක්කොට වසයි. ඉක්බිත්තෙන් හිරණ්‍යකතෙම පරවීයන් බස්නා හඬින් චඤ්චලවූයේ කථානොකොට සිටියේය. එකල්හි චිත්‍රග්‍රීවතෙම යහලු හිරණ්‍යකය කුමක්නිසා අපහා සමග කථානොකරන්නෙහිදැයි කියේය. එකල්හි හිරණ්‍යකතෙම ඒ වචනයදැන වහා පිටතට නික්ම විස්මයෙක පිණැත්තෙක්වෙමි මාගේ ප්‍රිය මිත්‍රවූ චිත්‍රග්‍රීවතෙම ආයේයයි කියේය. එකල්හි දැලින්. බැඳුනාවූ මොවුන්දැක විස්මයට පැමිණියේ ක්‍ෂණයක් කල්සිට යහලුව මේ කුමක්දැයි කියේය. එකලැහි චිත්‍රග්‍රීවතෙම මිත්‍රය මේතෙම අපගේ පූර්වජාතියෙහි කරණලද කර්මයාගේ ඵලයයි කියේය. මේ කථා අසා මූෂිකතෙම චිත්‍රග්‍රීවයාගේ බන්ධනය කැපීම පිණිස වහා එළඹෙයි. එකල්හි චිත්‍රග්‍රීවතෙම මිත්‍රය එසේ නොකරව, පළමුකොට මා ආශ්‍රයකරණලද්දවූ මොවුන්ගේ දැල්කපව එකල්හි පසුව මාගේ බන්ධනය සිඳින්නෙහියි කියේය.—හිරණ්‍යක තෙමේද මම මඳවූ ශක්තිඇත්තෙමි, මාගේ දන්තයෝද මෘදුවෙත්, එහෙයින් මොවුන්ගේ දැල් කැපීම පිණිස මම කෙසේ පොහොසත්වෙම්ද, එහෙයින් මාගේ දන්තයෝ හානිවීමට පළමු තාගේ බැම්ම කපම් ඉන්පසු මොවුන්ගේද බැඳුම් හැකිනම් සිඳින්නෙමි කියේය. චිත්‍රග්‍රීවතෙම එසේ වේවා එසේවී නමුදු ශක්තිපරිද්දෙන් මොවුන්ගේ බන්ධනය කපුවයි කීයේය, තමා හරිමින් ආශ්‍රිතයන්

යේ යම් රක්‍ෂාකිරීමෙක් ඇද්ද ඒ තෙම නීති දන්නවුන්විසින් සම්මත නොකරණලදැයි කියනලද්දේය. එකල්හි චිත්‍රග්‍රීවතෙම මිත්‍රය නීති ය වනාහි මෙබඳුමය, එසේවී නමුදු මා ආශ්‍රිතයන්ගේ දුක ඉසිලීමට මම සියලු ලෙසින් පොහොසත් නොවම් ඒ කාරණයෙන් මේ වචනය කී යෙම්යී කීයේය. මේ කීම අසා හිරණ්‍යකතෙම අතිශයින් සතුටුසිත් ඇත්තේ රොමොද්ගතවූයේ මිත්‍රය යහපත යහපත මේ ආශ්‍රිතයන්ට ප වත්නා ප්‍රෙමයෙන් තුන්ලොකයාගේද ස්වාමිභාවය තා කෙරෙහි යෙදෙ යී කීයේය. මෙසේ කියා ඔහුවිසින් සියල්ලවුන්ගේ බන්ධනයෝ සිඳින ලද්දාහුය, ඉක්බිත්තෙන් හිරණ්‍යකතෙම සියල්ලවුන්ට පුදා මිත්‍රවූ චිත්‍ර ග්‍රීවයමෙහි දැලින් බැඳීම් විධිය ඇති කල්හි දෛශයට සැකකොට තමා කෙරෙහි අගෞරවය සියලු ලෙසින් නොකටයුත්තීයයි ආදර සහිතවූ වචනය කීයේය. මෙසේ අවබොධකර ආගන්තුක සත්කාරදකොට වැ ළඳගෙණ හැරියේය. චිත්‍රග්‍රීවයාද පිරිවර සහිතවූයේ කැමතිදෙශවල ට ගියේය. හිරණ්‍යකයාද තමාගේ බිලයතුළට වන්නේය.

එකල්හි සියලු කථා දන්නාවූ ලඝුපතනකනම් කවුඩුතෙම හිරණ්‍යක යාවිස්මයෙක පූජ්‍යවූයෙහිය එබැවින් මමද තාහා සමග මිත්‍රව විසීමට කැමැත්තෙමි. එබැවින් මට මිත්‍රභාවයෙන් අනුග්‍රහකිරීමට සුදුස්සෙහි යයි ආශ්චය්‍ය සහිතවූ මේ වචනය කීයේය. මේ කථාව අසා හිරණ්‍යක යාද බිලයතුළ හිඳ තෝ කවරෙක්දැයි කීයේය. මම ලඝුපතනකනම් කවුඩුවෙම්යි හෙතෙම කීයේය. ඒ අසා මූෂිකතෙම සිනාසී තාහා සම ග මාගේ මිත්‍රභාවයකුමක්දැයි කීයේය, තෝ චඤ්චලවූයෙහිය චපලයා හා මිත්‍රභාවයතෙම සියලු පරිද්දෙන් නොකටයුතුය පින්වතා අපගේ සතුරු වගීයවෙයි යනු හිරණ්‍යකතෙම කීයේය. ඒ අසා ලඝුපතනක තෙම මාවිසින් සියල්ල අසන ලද්දේය එසේද නුඹහා සමග මිත්‍රභාවයා ගේ අයිති කිරීම කටයුතුයයි මෙපමණක්ම මාගේ අදහසවෙයි, ඉඳි න් ඒ කැමැත්ත එසේ නුවූයේ වීනම් ආහාර නොගැණීමෙන් තාගේ දොරටුවෙහි ජීවිතය නසාගන්නෙම්යී කීයේය. ඒ වචනයඅසා හිරණ්‍ය කතෙම පිටතට නික්ම පින්වතාගේ මේ වචන නැමැති අමෘත රසයෙ න් මම ප්‍රීතියට පැමිණියෙමි, පින්වතාගේ ඒ කැමැත්තම වේවයි මෙ සේ කියා මූෂිකතෙම මිත්‍රභාවයකොට ආහාර වර්‍ගවලින් කවුඩා සතු ටුකොට බිලයතුළට වන්නේය, කවුඩාද තමාගේ ස්ථානයට ගියේය.

එතැන් පටන් ඔවුනොවුන්ට ආහාරදීමෙන්ද ඉනාප්‍රශනවලින්ද කෙ ළිකවට කථාවලින්ද ඔවුන් දෙදෙනාගේ කාලයතෙම ඉක්මෙයි. එක් දිනයෙක්හි ලඝුපතනකතෙම මිත්‍රය කවුඩාහට මේ ස්ථානය දුකසේ ලැබියයුතු ආහාර ඇත්තේය, එබැවින් මේ ස්ථානයහැර අන් ස්ථානය

කටයුතු කැමැත්තෙම්යි මූෂිකයාට කීයේය. ඒ අසා මූෂිකතෙම මිත්‍රය
කොතනකට යායුතුදැයි කීයේය. මනාස්ථානයක් ඇත්තේයයි කවුඩු
තෙම කීයේය. ඒ ස්ථානය කවරේදැයි මූෂිකතෙම ඇසූයේය. දණ්ඩකනා
ම් වනයෙහි කර්පූරගෞරයනනාම්ඇති විලෙක් ඇත්තේය. ඒ විලෙහි
මාවිසින් බොහෝකාලයක් ආශ්‍රයකරණ ලද්දාවූ මාගේ ප්‍රිය මිත්‍රවූ ස්ව
භාවයෙන් ධර්මයෙහි පිහිටියාවූ මන්ථරයන නාම්ඇති ඉදිබුවෙක් වෙ
සෙයි. හෙතෙම ආහාර වර්ගවලින් මා වඩන්නේයයි මූෂිකතෙම කී
යේය. හිරණ්‍යකයාද එසේවීනම් මේ අවස්ථාවෙහි මාවිසින් කුමක් කා
ටයුතුද එබැවින් මාද එහිගෙණයව්යි කීයේය.—එකල්හි කවුඩුතෙම ඒ
මිත්‍රයාහා සමග විසිතුරු කථාවලින් යුක්තව සැපයෙන් ඒ විල සමීපයට
ගියේය. ඉක්බිත්තෙන් ඉදිබුතෙම දුරදීම කවුඩාදැක නැගිසිට සුදුසුවූ
ආගන්තුක සත්කාරකොට මීයාට ආගන්තුක සත්කාර කෙලේය. කවුඩු
තෙම මිත්‍රවූ ඉදිබුව මේ මීයාට නොයෙක් පූජාකරව, මේතෙම පුණ්‍ය
කර්මයන් උසුලන්නාවූ කරුණා නැමැති රත්නයන්ට ආකරවූ හිරණ්‍ය
කනාම් මීරජවෙයි. මොහුගේ ගුණවර්ණනාව දිව් දෙදහසෙකින් අන
න්තනම් නාගරාජතෙම කිසිකලෙක්හි කිරීමට සමර්ථවන්නේයයි කී
යේය. මෙසේ කියා චිත්‍රග්‍රීවයාගේ කථාවද විස්තරකොට කීයේය. ඉදිබු
තෙම ආදරසහිතව හිරණ්‍යකයාට පුත්‍ර පින්වත මිනිසුන් නැත්තාවූ
වනයට තමාගේ ඊමට කාරණයකිම සුදුස්සෙහියයි කීයේය. මූෂිකතෙ
ම මම කියම් අසනුලැබේවයි කීයේය.—චම්පකයන නාම්ඇති නුවරෙහි
පරිබ්‍රාජකයන් වසන ස්ථානයෙක් ඇත්තේය. ඒ ස්ථානයෙහි චූඩාකර්ණ
නම් පරිබ්‍රාජකයෙක් වෙසෙයි. ඒ පරිබ්‍රාජක තෙමේද අනුභවකිරීමෙ
න් ඉතිරිවූ සිඟනලද ආහාරසහිතවූ සිඟන භාජනය බිත්තියෙහි යො
දනලද දණ්ඩක්හි තබා සැතපෙයි. මමද පැන ඒ ආහාර සැම දවස්
හි කමි. නැවත ඒ පරිබ්‍රාජකයාගේ ප්‍රියමිත්‍රවූ වීණා කර්ණනම් පරිබ්‍රාජ
කයෙක් ආයේය. ඒ වීණාකර්ණයාහා සමග නොයෙක් කථාවන්හියෙදී
උන්නාවූ චූඩාකර්ණතෙම මාගේ තැතිගැන්වීම පිණිස දිරගියබටද
ණ්ඩකින් බිමට ගැසූයේය. එසේකරන්නාවූ චූඩාකර්ණයාදැක වීණාකර්ණ
තෙම මිත්‍රය මිත්‍රතෙම මාගේ කථාවෙහි නොසතුටුවූයේ අන්‍යක්‍රියාවෙ
ක්හි කුමට ඇලෙන්නේදැයි ඇසූයේය. මිත්‍රය මම නොසතුටුවූයෙම්
නොවෙම්, එසේද මාගේ සතුරුවූ මූෂිකතෙම සැමකල්හි පැන පාත්‍ර
යෙහිවූ සිඟනලද ආහාරකයි, බලවයි චූඩාකර්ණයා විසින් කියනලද්දේ
ය. වීණාකර්ණතෙම බිත්තියෙහිවූ දණ්ඩබලා ස්වල්ප බලඇත්තාවූ මූෂි
කතෙම මෙතෙක්දුර කෙසේ පනීද, එහෙයින් මෙහි කිසියම් කාරණ
යෙකින් යුක්තවියයුතුය. ශක්තිය උදෙසා කිසියම් කාරණයෙකින් යු
ක්තවියයුතුයයි කීයේය, ක්ෂණයක් කල්පනාකොට මෙහි කාරණය

ධන බහුලබවයයි වැටහෙයි යනු පරිබ්‍රාජකයා විසින් කියනලද්දේය, පසුව උදුල්ලක්ගෙණ ඔහුවිසින් බිලය සාරා බොහෝකාලයක් මුලුල්ලෙහි රැස්කරණලද මාගේ ධනයගන්නා ලද්දේය. එතැන්පටන් තමාගේ ශක්තියෙන් පිරිහුනේ ජනයාට අයිතිවූ උත්සාහ නැත්තේ තම, ගේ ආහාරයපවා උපදවාගැන්මට නුසුදුසුවූයේ භයසහිතව සෙමින් සෙමින් එළඹෙන්නාවූ මම චූඩාකර්‍ණයා විසින් දක්නාලද්දේය. මේ සියල්ලදැන මෙහි මාගේ විසීමට සුදුසු නොවෙයි. මේ කථාපිළිවෙළ අනිකෙකුට කිමද සුදුසුනොවෙයි යනු මාවිසින් සලකනලද්දේය. මෙසේ පරීක්‍ෂාකොට ඒ ක්‍රමක්ද සිඟා අනුභවයෙන් රැකෙම්ද දුක්වන්නේය, ඒද දෙවෙනිවූ මරණවාරයෙක්වෙයි යනු සිතා ලොභයෙන් නැවතත් ඔහු සන්තකවූ ආහාරගැණීම පිණිස උත්සාහකෙළෙමි,—නැවත සෙමින් සෙමින් එළඹෙන්නාවූ ඒ වීණාකර්‍ණයා විසින් බටදණ්ඩෙන් තළනාලද්දාවූ මම ලොභවූ තැනැත්තේ වනාහි නොසතුටුවූයේ නියමයෙන් තමාට ද්‍රොහිවූයේවෙයි සිතුයෙමි. ඒ තෙම මේ අවස්ථාවෙහි යෙදුනාවූ ආයසීයන්ගේ නිශ්චයවෙයි. මෙසේ සිතා මම මිනිසුන් නැත්තාවූ වනයට ආයෙය. නැවත මාගේ පුණ්‍යඵලය හෙතුකොටගෙණ මේ මිත්‍රයාවිසින් සෙනහවූ පැවැත්මෙන් මට අනුග්‍රහකරණ ලද්දේය, දැනුදු පුණ්‍ය පරම්පරාවෙන් පින්වතාගේ ආශ්‍රය නැමැති ස්වර්ගයටම මාවිසින් පැමිණෙන ලද්දේයයි කියේය, ඒ අසා ඉදිබුතෙම නුඹලාවිසින් බොහෝ සෙයින් ධණය රැස්කරණලද්දේය, මේ තෙම ඒ රැස්කිරීමගේ දෘෂයවේ, එබැවින් දැන් යේවා ඉක්මගියාවූ කථාකිමෙන් ප්‍රයොජන නොවේ, මිත්‍රය සියලුකල්හි උත්සාහ සහිතවන්නාවූ තාවිසින් වියයුතුය, මිත්‍රය එබැවින් ඉතිරිව පවත්නාවූ අවස්ථාවෙන් ශාන්තිය කටයුත්තිය. බොහෝවූ කෙළිකථාවෙන් කවර ප්‍රයොජනද මාහා සමගම මෙහි කාලය ඉක්මවනු ලැබේවයි කියේය. මේ කථා අසා කවුඩුතෙම ඉදිබුව පිණැත්තෙහිය, සැමකල්හි ඇසිය යුතුවන්නෙහියයි කියේය. එකල්හි ඔහු ස්වකීය කැමැත්තෙන් ආහාරගැණීමද හැසිරීමද කරන්නාහු සතුටුවූවාහු සැපසේ විසුවාහුය. නැවත එක්දිනයෙක්හි චිත්‍රාඞගනම් මුවෙක් කිසිවක්හු විසින් තැතිගන්වන ලද්දේ අවුත් එක්වූයේය. ඉක්බිත්තෙන් පසුව පැමිණෙන්නාවූ භයහෙතුවක් සලකා ඉද්බුතෙම දියට ප්‍රවිෂ්ටවූයේය. මීයාද බිලයට ගියේය. අහසට නැගුනාවූ කවුඩුතෙම ගස්මුදුනකට නැගුණේය, නැවත කවුඩාවිසින් බොහෝ දුර බලා භයටහෙතුවූ කවර කාරණයකුදු නොදක්නාලද්දේය. පසුව අවුත් නැවත සියලුදෙනා එක්ව උන්නාහුය පින්වත් මෘගය තට මගල්‍යයක්වේවා, තමාගේ කැමැත්තෙන් දියආදි ආහාර අනුභවකරණු ලැබේවා. මෙහි විසීමෙන් මේ වනය ස්වාමි කරණුලැබේවයි ඉදිබුවාවිසින්

කියනලද්දේය. වැද්දුවිසින් නැතිගත්වන ලද්දාවූ මම පින්වතුන්ගේ
පිහිට සඳහා ආයේය. එබැවින් පින්වතුන්හා සමග මිත්‍රභාවය කැමැ
ත්තෙමියි චිත්‍රාඞ්ගතෙම කීයේය. ඒ අසා හිරණ්‍යකතෙම පින්වතාගේ
වනාඞ්ග අපහා සමග මිත්‍රභාවය උත්සාහරහිතවීමෙන් හටගත්තේමය.
එබැවින් මෙහි ස්වකීය ග්‍රහයහා වෙනසක්නොවන පරිද්දෙන් වසනු
ලැබේවයි කීයේය. ඒ වචනයඅසා සතුටුවූ මුවතෙම තමා කැමතිසේ
ගන්නාලද ආහාර ඇත්තේ පැන්බී ජලයට ලත්වූ ගස් සෙවනෙක්හි
උන්නේය.—එකල්හි ඉදිබුතෙම යහලු මෘගය කවරක්හු විසින් නැතිගා
ත්වන ලද්දෙහිද මිනිසුන් නැත්තාවූ මේ වනයෙහි කිසිකලෙක්හි
වැද්දෝ කුමට හැසිරෙද්දැයි විචාළේය. ඒ අසා මුවාවිසින් කලිඟුදෙශ
යෙහි රුක්මාඞ්ගදනම් රජෙක් ඇත්තේය. ඒ රජතෙමේද දිශාවන් ජ
යගන්නා ක්‍රමයෙන් අවුත් චන්ද්‍රභාගානදී ඉවුරෙහි ප්‍රවෙශකරණලද
සෙනාවලලු ඇත්තේ හිඳියි. උදයකාලයෙහිද ඔහුවිසින් අවුත් කර්පූර
විලසමීපයෙහි විය යුතුය. මෙසේ වැද්දන්ගේ ඉදිරියෙන් අසනුලැබෙ
යි. එබැවින් මෙහිද උදය විසීම භයට හෙතුයයි දැන ඊට සුදුසු කටයු
තු පටන්ගන්නා ලැබේවයි කියනලද්දේය. ඒ අසා ඉදිබුතෙම භයස
හිතව මිත්‍රය ජලස්ථානයතුළටයෙමි කීයේය. කවුඩු—මුවදෙදෙනාද
මිත්‍රය එසේවේවයි කීවෝය. මූෂිකතෙම විමසා නැවත ජලස්ථානයට
පැමිණි කල්හි ඉදිබුවාහට මඞ්ගල්‍යයවෙයි. ගොඩයන්නාවූ මෝහට කු
මක්වන්නිදැයි කීයේය. ඉක්බිත්තෙන් ඒ වචනයඅසා මහත් භයින් ඉ
දිබුතෙම ජලස්ථානය හැර ගියේය. ඒ මූෂිකාදීහුද ඔහුට පසුව ගියා
හුය. එකල්හි වනයෙහි ඇවිදින්නාවූ එක්තරා වැද්දෙක් විසින් ගො
ඩයන්නාවූ ඒ ඉදිබුතෙම දක්නාලද්දේය. ඒ වැදිතෙම ඉදිබුවාගෙණ
ඔසවා දුන්නෙහිබැඳ පිනැත්තෙමියි කියා තමාගේගෙට අභිමුඛව ගියේ
ය. එකල්හි මුව—කවුඩු—මූෂිකයන ඔහු තුන්දෙනාද අතිශයින් කල
කිරීමට පැමිණියාහු ඔහු පසු පස්සෙහි ගියාහුය, ඉක්බිත්තෙන් මූෂික
තෙම විලාපකියයි, මොහොතක් සිතා මාගේ අභාග්‍යය විස්මයෙකැයි
බොහෝසේ විලාප කියා මූෂිකතෙම මෘග—කාකදෙදෙනාට මේ වැද්
දා වනයෙන් නික්මීමට පළමු ඉදිබුවා මුදවන්ට උත්සාහකටයුතුයයි
කීයේය. වහා ඊට කටයුතු දක්වවයි ඔහුදෙදෙනා කීවෝය. ඒ අසා හි
රණ්‍යකතෙම මුවා ජලස්ථානයක් සමීපයටගොස් ක්‍රියාරහිතවූ මළාවූ
ශරීරයක්මෙන් දක්වාවා, කවුඩුතෙමේද ඒ මුවාගේ මත්තෙහි සිට
තුඩින් කිසිතැනෙක්හි කොටාවා, මුවමාංස කැමැත්තාවූ මේ වැද්දා
විසින් ඉදිබුවා එහිදමා ඒකාන්තයෙන් වහා යායුතුය, ඉන්පසු මම ඉදි
බුවාගේ බන්ධනය කපන්නෙමි කීයේය. ඉක්බිත්තෙන් චිත්‍රාඞ්ගලඝු
පතනක දෙදෙනාවිසින් වහාගොස් එසේ සිටිකල්හි ඒ වැදිතෙම විඩා

එටපැමිණීයේ පැන්බී වෘක්ෂයකගේමුල උන්නේ එසේවූ මුවාදක ඉදී බූවා ජලයසමීපයෙහි තබා නැත්තගෙණ සතුටුසිත් ඇත්තේ මුවාසමී පයට ගියේය. මේ අතරෙහි මූෂිකයාවිසින් අවුත් කපනලද බැම් ඇත් තාවූ ඒ ඉදිබුතෙම වහා ජලස්ථානයට ප්‍රවිෂ්ටවූයේය, ඒ මුවතෙමේද ආසන්නවූ ඒ වැද්දාබලා වහානැගිසිට දිව්යේය. ආපසු හැරුණවූ වැ දිතෙම වෘක්ෂමූලයකරා යම්තාක් පැමිණේද ඒ තාක් ඉදිබුවා නොදක අපරීක්ෂාකාරීවූ මට මේතෙම සුදුසුවෙයි සිතුයේය.

ඉක්බිත්තෙන් වැදිතෙම තමාගේ ක්‍රියාවගේ වශයෙන් ආශානැත් තේ පර්වතමධ්‍යයට වන්නේය. මිදුනාවූ විපත්තිඇත්තාවූ මණ්රාදී සිය ල්ලෝද තමතමන්ගේ ස්ථානවලට ගියාහු සැපසේ විසූවාහුය.

(තවද, 45 වෙනි ශ්ලෝකයෙහි සන්නයට අනතුරුව මෙහි මතුදක් වනුලබන ශ්ලෝකය දක්වීමෙන් කථාවනැතිව එහි අදහස නොහැ ගෙණබැවින් ප්‍රථමවර එහි නොදැක්වූබවත් දැනට මෙහි කථාවහා ස මග දක්වනබවත් දතයුතු.)

මාතෘකා ශ්ලෝකයෙක්.

කඞ්කණස්‍ය තු ලොභෙන මග්නඃ පඞ්ක සුදුස්තරෙ
වෘද්ධව්‍යාඝ්‍රෙණ සම්ප්‍රාප්තඃ පථිකඃ ස මෘතො යථා.

කඞ්කණස්‍ය, (රන්) වලල්ලගේ; ලොභෙනතු, ලොභයෙන්වනාහී; සු දුස්තරෙ, එතරවියනොහැක්කාවූ; පඞ්ක, මඩෙහි; මග්නඃ, ගිලුනාවූ; වෘද්ධව්‍යාඝ්‍රෙණ, මහලුව්‍යාඝ්‍රයාවිසින්; සම්ප්‍රාප්තඃ, පැමිණෙනලද්දාවූ; සඃපථිකඃ, ඒ මගීතෙම; යථාමෘතඃ, මරණලද්දේවැනි වෙයි.

එක්කලෙක්හි දක්ෂිණවනයෙහි ඇවිදිනාවූ මම දුටුයෙමි. ජලස්නාන යකළාවූ එක්මහලු ව්‍යාඝ්‍රයෙක් විල්ඉවුරෙක්හිසිට පින්වත් පින්වත්මගී ය මේ රන්වලල්ලකුශ තණගත් අත්ඇත්තාකෙරෙන් ගන්නාලැබේව සිතියා ඉක්බිත්තෙන් ලොභයෙන් අදනාලද්දාවූ එක්මගියෙක් විසින් මේ තෙම පිණින් ලැබෙයි. එසේවීනමුත් මේ ජීවිත සැකයෙහි පැවැත් මකට සුතුනොවන්නේය. එසේද සියලුතැන්හි ධනඋපස්කිරීමෙහි පැ වැත්ම සැකඇත්තේමය. එබැවින් පළමුකොට සොයමිසි තාගේ රන්ව ලල්ල කොතැන්හිදැයි ප්‍රකාශකොට කියයි. එකල්හි ව්‍යාඝ්‍රතෙම අත දී ගඇර දක්වයි. මාරයාවැනිවූ තා කෙරෙහි කෙසේ විශ්වාස ඇත්තෙම් දැයි මගියා කියේය. ඒ අසා ව්‍යාඝ්‍රතෙම බොල මගිය අසව පළමුකොට යෞවන අවස්ථාවෙහි අතිශයින් දුෂ්‍යවූ පැවතුම් ඇත්තෙම්වෙමි නො ඉක් ගවයනහා මිනිසුන් මැරීම හෙතුකොටගෙණ මාගේ පුත්‍රයෝ

හා අඩුවෝද මළාහුය. මම පුත්‍රයන්ගෙන් පිරිහුනෙමි. එබැවින් !ශ්‍රී ධාර්මිකයෙක් විසින් පින්වත්තෙම දන්දීමෙහිහා!ධර්මාදියෙහි හැසිරෙව සි අනුශාසනාකරණ ලද්දේය. ඒ අනුශාසනාවෙන් දැන් මම ජලස්නානය කරණ ස්වභාඇත්තේ ත්‍යාගිවූයේ මහලුවූයේ වැටුනාවූ නියභා දත්ඇත්තේ කෙසේනම් විශ්වාසකටයුතු නොවෙම්ද, තමාගේ අතෙහිවූ රන්වලල්ල යම්කිසිවක්හට දෙනුකැමැත්තෙම් මාගේ මෙපමණ ලොභයෙන් වෙන්විමවෙයි, එසේද, ව්‍යාඝ්‍රතෙම මිනිසුන්කයි යන ලොකාපවාදය වැළැක්විය නොහැක්කේය, මාවිසින් ධර්මශාස්ත්‍රයෝ පුහුනුකරණලද්දාහුය. එබැවින් මේ විල්හි ස්නානයකොට රන්වලල්ලගණුවසි කියේය. ඉක්බිත්තෙන් මේ තෙම යම්තාක් ඒවචනය විශ්වාසකොට ලොභයෙන් විල්හි ජලස්නානයට වදිද ඒතාක් මහත් මඩෙහි ගිලුනේ යන්ටනොහැකිවූයේය. මඩෙහි ගිලුනු තැනැත්තාදැක ව්‍යාඝ්‍රතෙම අහෝ, මහ මඩෙහි වැටුනෙහිද එසේවීනම් තා නගාසිටුවම්යි මෙසේ කියා සෙමින් සෙමින් ලන්ව ඒ ව්‍යාඝ්‍රයාවිසින් අල්වාගන්නා ලද්දාවූ ඒ මිනිතෙම මාවිසින් මාරයෙක්වැනිවූ මොහුකෙරෙහි කරණලද විශ්වාසය මනාකොට නොකරණ ලද්දේයයි සිතනලද්දේය. මෙසේ සිතන්නාවූම ව්‍යාඝ්‍රයා විසින් අල්වාගන්නා ලද්දාවූ මරණලද මේ තෙම කන ලද්දේය.

94 වෙනි මාතෘකා ශ්ලෝකයෙහි කථාවයි.

මගධ දෙශයෙහි චම්පකාවතීනම් වනයක් ඇත්තේය. ඒ වනයෙහි මුවෙක්හා කවුඩෙක්ද යන දෙදෙනෙක් බොහෝකාලයකපටන් මහත් ස්නෙහයෙන් වාසයකෙරෙත්. තමාකැමති පරිද්දෙන් ඇවිදිනාවූ සතුටුවූ ස්ථූල ශරීරඇත්තාවූ ඒ මුවාද එක් සිවලෙක් විසින් දක්නා ලද්දේය. ඒ මුවාදැක අහෝ අතිශයින් බබලන්නාවූ මේ මාංසය කෙසේ කම්ද එසේවේවා පළමුකොට විශ්වාසය උපදවම්යි සිතුයේය. මෙසේ සිතා මිත්‍රය නුඹට මඞ්ගල්‍යයෙක්වේවා යනු එළඹසිට කීයේය. ඒ අසා මුවාවිසින් තෝ කවරෙක්දැයි අසනලද්දේය. මම ක්‍ෂුද්‍රබුද්ධිනම් සිවලෙක්වෙමි, නෑයෙක් නැත්තාවූ මම මේ වනයෙහි මළඑකක්හුමෙන් වසම් දැන් මිත්‍රවූ තාකරා පැමිණ නැවත නෑයෙක් ඇත්තේ ජීවත්විමනම්වූ ලොකයට ඇතුල්වූයේ වෙම් දැන් මාවිසින් සර්ව ප්‍රකාරයෙන් තාගේ අනුචරයෙක් වියයුතුයයි කියයි. එසේ වේවයි මුවාවිසින් කියන ලද්දේය. පසුව වනාහි පිණෑත්තාවූ රශ්මිමාලා ඇත්තාවූ ඉරු අස්තයට ගිය කල්හි ඔහු දෙදෙනා මුවාගේ වාසස්ථානයට ගියාහුය. ඒ ස්ථානයෙහි සපුගසකගේ ශාඛාවෙක්හි මුවාගේ බොහෝකාලයක පටන් මිත්‍රවූ සුබුද්ධිනම් කවුඩා වෙසෙයි, සිවල්—මුවදෙදෙනාදැක සහලූව දෙවෙනිවූ

මොහු කවරෙක්දැයි කවුඩා ඇසීය. මාගේ මිත්‍රභාවය කැමතිව ආවාවූ මේ තෙම සිවලෙක්යයි මුවා කීයේය. මිත්‍රය නොකරුණේ එන්නාහා සමග මිත්‍රභාවය සුදුසුනොවන්නේය, ඒ හැසිරීම මනානොවෙයි කුල සිරිත නොදන්නා තැනැත්තාට වසනතැන් නොදියයුතුය යනු කවුඩු තෙම කීයේයි. ඒ කථා අසා ඒ සිවල්තෙම මුවාගේ පළමු දක්නා දිනයෙහි පින්වතාද කුලසිරිත නොදත්තෙක්මවූයේය, එබැවින් පින්වතාහා මොහුගේද ප්‍රේමයෙන් පැවැත්ම කෙසේ මතුමත්තෙහි වැඩේද. මුවා යම්සේ මාගේ නෑයාද පින්වතාද එසේම ඥාතිවූයේයයි කෝප සහිත වූ වචනය කීයේය. එකල්හි මුවතෙම මේ කථාවෙන් ප්‍රයෝජන නොවෙයි එක්තැනෙක්හි කෙළිකවටකථාවලින් සැප අනුභවකරන්නාවූ සියල්ලවුන් විසින් වසනුලැබේවයි කීයේය එසේ වේවයි කවුඩාවිසින්ද කියනලද්දේය. පසුව උදයකාලයෙහි සියල්ලෝ කැමති දිශාවලට ගියාහුය එක්දිනයෙක්හි සිවල්තෙම යහලු මෘගය මේ වනයෙහිම එක් ප්‍රදේශයෙක්හි ගොයමින් පිරුණාවූ කුඹුරක් ඇත්තේය, එබැවින් මම තා එහිගෙණගොස් දක්වම්යි තණ්වසිට කීයේය. එසේකළ කල්හි මුවා දවසක්පාසා එහිගොස් ගොයම්කයි. ඉක්බිත්තෙන් කිපදවසකින් පසු කුඹුරහිමියා විසින් ඒ දැක රැහැණක් යොදනලද්දේය,

ඉන්පසු නැවත ආවාවූ මුවතෙම ඒ ස්ථානයෙහි හැසිරෙන්නේ රැහැන්වලින් බැඳි මරගුගේ රැහැණෙන් බැන්දුක්වැනිවූ වැද්දාගේ මේ රැහැණ කෙරෙන් මා රැකගැණීම පිණිස මිත්‍රයා හැර අන්කවරෙක් සමර්ථදැයි සිතුයේය. මේ අතුරෙහි සිවලා එහි අවුත් ලන්වසිටියේ අපගේ කෛරාටිකවූ යෙදීම වනාහි ඵලඇතිවූයේය, මාගේ අභිමතාර්ථ සිද්ධියද බොහෝසෙසින් වන්නේය, කපනු ලබන්නාවූ මොහු මාංසහා ලේ තැවරුණාවූ ඇට මාවිසින් ඒකාන්තයෙන් ලැබියයුතු වෙත්යයි සිතුයේය. ඒ මුවාද ඔහුදැක සතුටුවූයේ මිත්‍රය මාගේ බන්ධනය වනාහි වහා කපව මා රැකගණුවයි කීයේය. සිවල්තෙම රැහැණ නැවත නැවත බලා මේ මුවා වනාහි දැඩිවූ බන්ධනයෙන් බැඳෙනලද්දේවෙයි, මිත්‍රය නහරවලින් කරණලද මේ රැහැන් අද ඉරිදා දවස්හි මාගේ දත්වලින් කෙසේ අල්වම්ද මිත්‍රය සිතෙහි අන්පරිද්දෙකින් නොසිතන්නේ නම් උදය කාලයෙහි තා විසින් යමක් කියයුතුද ඒ මාවිසින් කටයුතුයයි කීයේය. ඉක්බිත්තෙන් ඒ කවුඩුතෙම සවස්කාලයෙහි මුවා නොඑන්නාදැක එතන මෙතන සොයනුයේ එසේවූ ඔහුදැක මිත්‍රය මේ කුමක්දැයි කීයේය. මිත්‍රය මේ තෙම අනාදරකරණ ලද්දාවූ මිත්‍ර වාක්‍යයාගේ ඵලය යි මුවාවිසින් කියනලද්දේය. ඒ වඤ්චාකාරයා දැන් කොතැන්හිවූයේදැයි කවුඩා ඇසුයේය. මාගේ මාංස කැමැත්තේ මෙහිම සිටින්නේයයි මු

වා කීයේය, මාවිසින් පළමුකොට කියනලද්දේමයයි කවුඩා කීයේය. පසුව කවුඩා දිඝීව අසුව්ලා බොල විඃසවාකාරය ලාමක ක්‍රියාඇත්තාවූ තාවිසින් කුමක්කරණ ලද්දේදැයි කීයේය ඉක්බිත්තෙන් උදයකාලයෙහි පොල්ලක්ගත් අත්ඇතිව ඒ ස්ථානයට යන්නාවූ ඒ ගොවියා කවුඩා විසින් දක්නාලද්දේය. ඔහු දැක කවුඩාවිසින් මිත්‍රවූ මෘගය තෝ තමා මළඑකත්හුමෙන් දක්වා වාතයෙන් බඩපූරවාගෙණ පදෑන් දැඩිකොට සිටුව මම තාගේ ඇසෙහි තුඩින් කොටන්නෙමි, යම්වේලෙක්හි මම ශබ්දකෙරෙම්ද එකල්හි තෝ නැගිට වහා දුවන්නෙහි යයි කියනලද්දේය, මුවතෙම කවුඩාගේ වචනයෙන් එසේම සිටියේය. ඉක්බිත්තෙන් සතුටින් ප්‍රබොධවූ ඇස්ඇති ගොවියා විසින් එසේවූ මුවා දක්නාලද්දේය. ආඃ තමාම මළේයයි මෙසේ කියා මුවා බන්ධනය කෙරෙන් මුද රැහැන්ඇකිලිමට උත්සාහ ඇතිවූයේය. එකල්හි ගොවියා මදක්දුරුවූ කල්හි කවුඩාගේ ශබ්දයඅසා ඒ මෘගතෙම වහා නැගිට දිව්වේය. ඔහු දැක ඒ ගොවියා විසින් කොපයෙන් දමනලද පොල්ලෙන් සිවල්තෙම නාසනලද්දේය.

## 95 වෙනි ශෙලාකයාගේ කථාවයි.

ගඞ්ගානදියගේ ඉවුරෙහි ගෘඩකූටනම් පවීතයෙහි මහත්වූ පුලිල වෘක්ෂයෙක් ඇත්තේය. ඒ වෘක්ෂයාගේ බිලයෙක්හි අවාශනාව හෙතු කොටගෙණ නටුවාවූ නියභා දත්ද නෙත්‍රද ඇත්තාවූ [ජරත්ගවනම් ගිජු ලිහිනියෙක් වෙසෙයි. එකල්හි කරුණාවෙන් ඔහුගේ ජීවත්වීම පිණිස ඒ වෘක්ෂයෙහි වසන්නාවූ පක්ෂීහු තමන්ගේ ආහාරය කෙරෙන් මදක් වෙන්කොටදෙති, ඒ ආහාරයෙන් මේ ගිජුලිහිනිතෙම ජීවත්වෙසි. ඉක්බිත්තෙන් එක්දිනයෙක්හි දීඝීකණීනම් එක් බලලෙක් පක්ෂිපැටවුන්කනු පිණිස ඒ ගස්බිලයකරා ආයේය. එකල්හි එන්නාවූ ඔහුදැක භයින් පිඩාවට පැමිණියාවූ පක්ෂිපැටවුන් විසින් කොලාහලකරණ ලද්දේය. ඒ අසා ගිජුලිහිනියා විසින් මේ කවරෙක් ඒ දැයි කියනලද්දේය. දීඝීකණීතෙම ගිජුලිහිනියාදැක භා නැසුනේවෙමි එබැවින් දැන් ඉතාලන්වූහෙයින් දුවන්ට නොහැකිවෙමි, එබැවින් යමක් වියයුතුද ඒ වේවා පළමුකොට විශ්වාස භාවය උපදවා මොහුගේ සමීපයට එළඹෙමියි භය සහිතවූ කල්පනාවක් කෙළේය. මෙසේ සිතා ඔහුසමීපයට එළඹ ස්වාමිනි නුඹවහන්සේට වඳිමි කීයේය. තෝ කවරෙක්දැයි ගිජුලිහිනිතෙම කීයේය. මම බලලෙක්මියි හෙතෙම කීයේය. ගිජුලිහිනිතෙම මේ ස්ථානයෙන් දුරුවයව ඉදින් නොගියේවීනම් මාවිසින් මැරියයුතුයයි කීයේය. පළමුකොට මාගේ වචන අසනුලැබේවා, පසුව මම ඉදින් මැරියයුතුනම් මැරියයුතුයයි බලලා කීයේය. තෝ කුමට ආයෙහිද

කියවයි ගිජුලිහිනියා කීයේය. මම මේ නදීතීරයෙහි නිතර ස්නානයක
රණුයේ ආහාර අනුභවයක් නැත්තේ බ්‍රහ්මචර්‍ය්‍යාවෙන් යුක්තව චා
න්‍ද්‍රායණ ව්‍රතයෙහි හැසිරෙන්නේ සිටිමි. ධර්‍ම දන්නාවූ නුඹවහන්සේ
ගේ ප්‍රේම විශ්වාසයට ස්ථානවූ පක්ෂීහු සැමකල්හි මා ඉදිරියෙහි නුඹව
හන්සේ පිළිබඳවූ ගුණසමූහය වර්ණනා කෙරෙත්. එබැවින් ශාස්ත්‍රයෙන්
දියුනුවට පැමිණියාවූ නුඹවහන්සේගේ ධර්‍මය ඇසීම පිණිස මෙහි ආ
යේය. මෙබඳුවූ ධර්‍මය දන්නාවූ නුඹවහන්සේ ආගන්තුකවූ මා මැරීමට
යත්න කෙලේද, මේ තෙම ගෘහස්ථ භූමියෙහි වසන්නවුන්ගේ ධර්‍මය
ක්ද, ඉදින් ආහාර නැත්තේනම් එකල්හි මනා ප්‍රිතිවචනයෙන්ම හෝ ප
ළමුකොට ආගන්තුකතෙම පිදියයුතුයයි බලලා කීයේය.

බලල්තෙම වනාහි මාංසයට ප්‍රියවෙයි, මෙහිද පක්ෂිපැටව් වසත්, එ
හෙයින් මෙසේ කීවෙමියි ගිජුලිහිනිතෙම කීයේය. ඒ වචනයඅසා බල
ල්තෙම බිම පහුරුගා කන්දෙක කසයි, දෙවියනි දෙවියනි, ධර්‍මශාස්ත්‍ර
යඅසා දුරුකරණලද රාගසිත්ඇත්තාවූ මාවිසින් දුෂ්කරවූ මේ චාන්‍ද්‍රාය
ණ ව්‍රතය පූරණලද්දේය. ඔවුනොවුන් විවාදකරණු ලබන්නවුන්ගේ
ද හිංසා නොකිරීම මුල්කොට ඇති ධර්‍මය ධර්‍මශාස්ත්‍රයන්ගේ යම්කාර
ණයෙකින් මෙහි එකම අදහසදැයි කියයි මෙසේ අදහවා ඒ බලල්තෙ
ම ගස්බිලයෙහි සිටියේය. නැවත දවස් ඉක්මෙනකල්හි පක්ෂිපැටවුන්
අල්වාගෙණ ගස්බිලයකරා ගෙණවුත් දවස්පාසා කයි. එකල්හි යම්
පක්ෂීන්ගේ පුත්‍රයෝ කනලද්දාහුද, ශොකයෙන් පීඩිතවූ විලාපකියන්
නාවූ ඒ පක්ෂීන්විසින් අතන මෙතන සෙවීම පටන්ගන්නා ලද්දීය.
ඒ ක්‍රියාවදැන බලල්තෙම බිලය කොරෙන් නික්ම පිටතට ගියේය.

පසුව ඒ ඒ තැන සොයන්නාවූ පක්ෂීන්විසින් ඒ ගස්බිලයෙහි පක්ෂි
පැටවුන්ගේ ඇට ලබනලද්දාහුය. පසුවද මේ ජරද්ගවයා විසින් අප
ගේ පැටවු කනලද්දාහුයයි සිතා සියලු පක්ෂීන්විසින් රැස්ව ගිජුලිහි
නිතෙම නසනලද්දේය.

### 151 වෙනි ශ්ලෝකය කොරෙන් පරභාගයෙහිවූ
### මාතෘකා ශ්ලෝකය.

අකස්මාත් යුවති වෘද්ධං කෙශෙෂ්වාකෘෂ්‍ය චුම්බති
පතිං නිර්දයමාලිඞ්ග්‍ය හෙතුරත්‍ර භවිෂ්‍යති.

යුවති, තරුණීතොමෝ; වෘද්ධංපතිම්, මහළුවූ ස්වාමිපුරුෂයා; කේශෙ
ෂු, කෙශයන්හි; ආකෘෂ්‍ය, ඇද; නිර්දයම්, දැඩිව; ආලිඞ්ග්‍ය, වැලඳගෙ
ණ; අකස්මාත්, නොකරුණෙන්; චුම්බති, සිඹියි. අත්‍ර, මෙහි; හෙතුඃ,
කාරණයෙක්; භවිෂ්‍යති, වන්නේය.

ගෞඩදේශයෙහි කෞශාම්බීනම් නුවරක් ඇත්තීය. ඒ නුවරෙහි මහත් ධනඇත්තාවූ චන්‍ද්‍රනන්‍දසනම් වෙළඳෙක් වසයි. අනතිම වයසෙහි සිටියාවූ කාමයවිසින් නියොගකරණලද සිත්ඇති ඔහු විසින් ධනයාගේ අහංකාරය හෙතුකොටගෙණ ලීලාවතීනම් වෙළඳ දුවක් විවාහකරණලද්දීය. ඈද අනාඪ්‍යයාගේ වෛජයන්තියමෙන් තරුණ අවස්ථාඇත්තිවීය. ඒ මහලු ස්වාමිතෙම ඈගේ සතුට පිණිසනූවූයේය. ඒ මහලු ස්වාමියාද ඈ කෙරෙහි අතිශයින් ඇලුම්ඇතිවූයේය. ඒ කාරණයෙන් ඒ ලීලාවතී තොමෝ යෞවන එඩිය හෙතුකොටගෙණ ඉක්මවනලද කුලසීමාඇත්තී කිසියම් වෙළඳ පුත්‍රයකුහු හා සමග ඇලුම්ඇත්තිවීය. එක්දිනයෙක්හි රත්නයන්ගේ රශ්මියෙන් විසිතුරුවූ ආසනයෙක්හි ඒ වෙළඳ පුත්‍රයා හා සමග ක්‍රීඩා කථාවලින් යුක්තව සැපසේ උන්නාවූ ඒ ලීලාවතී තොමෝ ස්වල්ප ලකුණකින් සමීපව සිටියාවූ ඒ සොරසැමියාදැක වහා නැගිට කෙශයන්හි ඇද අතිශයින් වැලඳගෙණ සිඹගත්තීය. ඒ අවකාශයෙන් සොරසැමිතෙමේද නැගිට ගියේය. ඒ වැලඳගැන්මදැක සමීපව සිටියාවූ කුට්ටිනීතොමෝ මැ මොහු නොකරුණෙන් වැලඳගන්නීයයි සිතීය. පසුව ඒ කුට්ටිනිය විසින් ඒ කාරණයදැන ඒ ලීලාවතීතොමෝ රහස්වශයෙන් දඬුවම්කරණ ලද්දීය.

### 213 වෙනි ශ්ලෝකයෙහි කථාවයි.

කල්‍යාණකටකදේශයෙහි වසන්නාවූ භෛරවනම් වැද්දෙක්වූයේය. මාංසයෙහි ලොභවූ හෙතෙමේද එක්දිනයෙක්හි දුන්න රැගෙණ වින්‍ධ්‍යවන මධ්‍යයට ගියේය. එහි ඔහුවිසින් එක් මුවෙක් මරණලද්දේය. මුවා ගෙණයන්නාවූ ඔහු විසින් දරුණුවූ ආකාර ඇති ඌරෙක් දක්නාලද්දේය. එකල්හි ඔහුවිසින් මුවා බිමතබා ඌරුතෙම ඊයෙන් නසනලද්දේය. කල්පාන්තයෙහි ශබ්දය බඳු ශබ්දවූ දරුණු ගර්ජනාකරන්නාවූ ඌරාවිසින්ද අවුත් ඒ වැද්දතෙම අණ්ඩදෙශයෙහි ගසනලද්දේ කපනලද ගසක්මෙන් වැටුනේය. එකල්හි ඔවුන් දෙදෙනාගේ පාදයන් චඩලවීමෙන් සර්පයෙක්ද මැරෙණලද්දේය. මේ අතරෙහි ආහාර කැමතිව ඇවිදනාවූ දීර්ඝරාවනම් සිවලෙක් මළාවූ මුව—වැද්—සර්ප—ශූරුයන ඔවුන් දුටුයේය. දැක දෛවය විස්මයෙක මහත්වූ ආහාරයෙක් එලඹසිටියේය, මොවුන්ගේ මාංසවලින් මාස තුනකට වඩා මාගේ ආහාරය වන්නේයයි මේ සිවල්තෙම සිතුයේය. එහෙයින් පළමු ක්ෂුධාකාලයෙහි දුනුකෙළවර පවත්නා මධුරනුවූ මේ සම්බැම්ම කමයි මෙසේ කායා එසේ කෙළේය. පසුව සම්බැම්ම සිඳිකල්හි වහා උඩට පැනගුනාවූ දුන්නෙන් බිඳුනා ... ඇති ඒ සිවල්තෙම මරණයට පැමිණියේය.

249 වෙනි ශ්ලෝකයාගේ පදාර්ථය.

ස්වයං වීක්ෂ්‍ය යථා වධ්වාඃ පීඩිතං සනකුඩ්මලම්
වණික්පුත්‍රො භවද්දුඃඛී ත්වං තථෛව භවිෂ්‍යසි.

වණික්පුත්‍රඃ, වෙළඳපුත්‍රතෙම; වධ්වාඃ, භාර්‍ය්‍යාවගේ; පීඩිතං, පීඩා කරණලද්දාවූහෝ ස්පර්ශකරණලද්දාවූ; සනකුඩ්මලං, පයොධර කුඩ්මලය; ස්වයම්, තමා; වීක්ෂ්‍ය, බලා; දුඃඛී, දුක්ඇත්තෙක්; යථා අභවත්. යම්සේවූයේද; ත්වං, තෝ; තථාඑව, එසේම; භවිෂ්‍යසි, වන්නෙහිය.

කාන්‍යකුබ්ජ දෙශයෙහි වීරසෙනනම් රජෙක් ඇත්තේය. ඒ රජු විසින් වීරපුරනම් නුවරෙහි තුඞ්ගබලයන නම්ඇති රජපුත්‍රයෙක් යුවරජ කරණ ලද්දේය. මහත් ධනඇත්තාවූ තරුණවූ හෙතෙම එක්දින යෙක්හි තමන් පුරයෙහි ඇවිදිනේ අතිශයින් මහත් තරුණවූ ලාව ණ්‍යවතිනම් වෙළඳපුත්‍ර භාර්‍ය්‍යාවක් දුටුයේය. නැවත තමාගේ ප්‍රාසා දයටගොස් කාමයෙන් අලල්නලද බුද්ධිඇත්තේ ඈ කැඳවීම පිණිස දූති යක් හැරියේය. ඒ ලාවණ්‍යවතියද ඒ බැලූකෙණෙහි පටන් කාමනැ මැති ඊ පහරින් පීඩාකරණලද ලය ඇත්තී ඒ සිතම ඇත්තීවීය. එකල් හි දූතියගේ වචනයඅසා මම පතිව්‍රතාවෙමි අන්‍යපුරුෂයක්හුගේ ස්පර් ශයක පමණකුදු නොකෙරෙමි, එහෙයින් මාගේ ස්වාමිපුරුෂතෙම යම ක් යමක් නියොග කෙරේද ඒ නියොගයම මම පර්‍ය්‍යා නොකොට කෙරෙමයි ලාවණ්‍යවතිය කීය. ලාවණ්‍යවතිය මේ සැබෑවක් කීය, මේ තෙම සැබෑමවෙයි. පසුව ලාවණ්‍යවතිය විසින් කියනලද්දාවූ කථාව වෙනස් නොකොට සියල්ලම දූතියවිසින් ගොස් තුඞ්ගබලනම් යුවරජහුගේ ඉදිරියෙහි දන්වනලද්දේය.

ඒ අසා තුඞ්ගබලතෙම විෂමවූ ඊයෙන් වණිකරණලද ලයඇත්තෙ ම්, ඈ නැතිව මම කෙසේ ජීවත්වෙම්දැයි කීයේය. ඒ අසා කුට්ටිනිතො මෝ ස්වාමිපුරුෂයාලවා ගෙන්වා ප්‍රවෙශකර වියයුත්තීයයි කීය. එකල් හි තුඞ්ගබලතෙම මේ තෙම කෙසේ හැකිවේදැයි කීයේය. ඒ අසා කුට් ටිනී උපායෙක් කරණු ලැබේවයි කීය, පසුව කුට්ටිනියගේ අනුශාසනා වෙන් ඒ රජපුත්‍රතෙම ඒ චාරුදත්තයන නම්ඇති වෙළඳපුත්‍රයා සෙව කයෙක්හු කෙළේය. පසුව ඒ රජපුත්‍රයා විසින් මේ සෙවකතෙම සියලු වි ශ්වාස කටයුතු ක්‍රියාවන්හි යොදනලද්දේය. එක්දිනයෙක්හි කුට්ටිනිය ගේ අනුශාසනාවෙන් ස්නානය කරණ ලද්දාවූ සුගන්ධ ද්‍රව්‍ය ශරීරයෙ හි ආලෙපකරණ ලද්දාවූ රන් ආභරණ පැලැන්දාවූ ඒ රජපුත්‍රයාවිසින් එම්බා චාරුදත්තය මාවිසින් එක්මසක් මුලුල්ලෙහි යම්තාක් ගෞරීව්‍ර තය කටයුතුද, එහෙයින් අදපටන් රාත්‍රියකපාසා වංශවත්වූ එක් තරු

ණී සතියන්ගෙණ අවුත් ප්‍රවේශකරව, ඕ තොමෝ මාවිසින් සුදුසු විධියෙන් පිළිසඳුත්තීයයි කියනලද්දේය.

පසුව ඒ චාරුදත්තතෙම එබඳුවූ තරුණියක් ගෙණඅවුත් ප්‍රවේශකෙරෙයි පසුව සැහවිස්වී තැනැත්තේ මේතෙම කුමක්කෙරේදැයි පරීක්ෂාකෙරෙයි ඒ තුඩගබලද ඒ තරුණිය ස්පර්ශ නොකරන්නේම දුරින්මසිට වස්ත්‍රාභරණ සුවඳ සඳුන් වලින් මනාව පූදා රක්ෂාකරන්නාවූත් දී එකෙණෙහිම හරී. ඉක්බිත්තෙන්'ඒ දැක හටගත්නාලද විශ්වාස ඇත්තාවූ ලොභයෙන් අදනාලද සිත්ඇත්තාවූ ඒ වෙළඳ පුත්‍රයාවිසින් තමාගේ අඹුව්ගෙණඅවුත් ප්‍රවේශ කරණලද්දීය. ඒ තුඩගබලතෙමේද ඇ සිතට ප්‍රියවූ ලාවණ්‍යවතියයි දැන වේගසහිතව නැගිසිට දැඩිව වැලඳගෙණ සතුටින් දල්වනලද ඇස්ඇත්තාවූ සතුටුසිත්ඇති තැනැත්තේ අනෙකප්‍රකාරවූ කාමක්‍රීඩාකොට ඇහා සමග ඇඳෙහි සයනයකොළේය. ඒ බලා වෙළඳපුත්‍රතෙම ක්‍රියාඅඩගභාවයෙහි පරීක්ෂාරහිතවූ තැනැත්තේ ක්‍රීඩාකරන්නාවූ ස්ත්‍රියම්කළ රූපයක් සමානයයි සිතා අතිශයින් කලකිරීමට පැමිණියේය.

### 251 වෙනි ශෛලාකයාගේ කථාව.

බ්‍රහ්මවනයෙහි කර්පූරතිලකනම් ඇතෙක් ඇත්තේය. ඒ ඇතාදැක සියලු සිවල්හු මේ තෙම කිසියම් උපායෙකින් ඉදින් මරණු ලැබේද එකල්හි මේ ශරීරයෙන් අපට මාස සතරකගේ තමන් කැමතිපරිද්දෙන් ආහාරයවන්නේයයි සිතුවෝය. පසුව ඔවුන්අතුරෙන් එක් මහලු සිවලෙක් විසින් මා විසින් ප්‍රඥා අනුභාවයෙන් මොහුගේ මරණය සිද්ධකරවන්නෙමියි ප්‍රතිඥා කරණලද්දීය, ඉන්පසු ඒ වඤ්චාකාරයා කර්පූරතිලකයාගේ සමීපයට ගොස් අටතැනක් හෙලීම්සහිතවූ නමස්කාරයකොට දෙවයන්වහන්ස බැලිම ප්‍රසන්න කෙරේවයි කියේය.

හස්තිතෙම තෝ කවරෙක්ද, කොතනින් ආයේදැයි කියයි. ඒ අසා සිවල්තෙම මම සිවලෙක්වෙමි, වනයෙහි වසන්නාවූ සියලු සිව්පාවුන් විසින් එක්ව නුඹවහන්සේගේ සමීපයට එවනලද්දේය, යම්හෙයකින් රජෙක්නැතිව සිටින්ට සුදුසු නැත්තේද එහෙයින් මේ වනරාජ්‍යයෙහි අභිෂෙක කිරීමට සියලු ස්වාමිගුණයෙන් යුක්තවූ පින්වත්තෙම නියම කරණලද්දේය. එබැවින් මුහුර්තකාලය යම්සේ නොයේද එසේ කොට දෙවයන්වහන්සේ විසින් වහාඑනු ලැබේවයි කියා නැග්ට ගියේය. ඉක්බිත්තෙන් රාජ්‍ය ලොභයෙන් අදනාවූ මේ කර්පූරතිලකතෙම සිවලාවිසින් දක්වනලද මාගයෙන් දුවන්නේ මහ; මඩෙහි ගිලුනේය. එකල්හි හස්තියාවිසින් යහලු සිවල දැන් කුමක් කටයුතුද මම මහත් මඩෙහි ගිලුනෙයයි කියනලදදේය. සිවලාවිසින් දෙවයනවහනස මාගේ වාලධි අ

ගෙහි අල්වා නැගීසිටුව මැනව්, යම්හෙයකින් වචනය කෙරෙහි නුඹවහන්සේ විසින් විශ්වාසකරණලද්දේද, මේ තෙම ඒ විශ්වාසයාගේ ඵලයයි සිතායි කියනලද්දේය. පසුව මහා මඩෙහි ගිලුනාවූ හස්තිතෙම සිවලුන්විසින් කනලද්දේය.

### 293 වෙනි ශ්ලෝකයාගේ කථාවයි

මගධදෙශයෙහි බම්බාරණ්‍ය සමීපයෙහිවූ භූමියක්හි ශුභදත්ත නම්ඇති ශුද්‍රජනයා විසින් නෘත්‍යශාලාවක් කරවීම පිණිස පටන්ගන්නාලද්දේය. එහි කියනකින් පලනුලබන්නාවූ දඬුකණුවකගේ මැදක් දුර පලනලද දඬුපලුදෙකකගේ මධ්‍යයෙහි වඩුවාවිසින් උලෙක් ගසනලද්දේය. එහිද වනයෙහි වසන්නාවූ මහත් වඳුරු සමූහයක් ක්‍රීඩා පිණිස ආයේය. ඔවුන්අතුරෙහි එක් වඳුරෙක් මරණදණ්ඩන් එවනලද්දෙක්මෙන් ඒ දණ්ඩ අත්දෙකින් අල්වා උන්නේය. ඉක්බිත්තෙන් එල්ලෙන්නාවූ ඒ වානරයාගේ අණ්ඩදෙක දඬුපලුදෙක අතරෙහි ප්‍රවෙශවූයේය. ස්වභාවයෙන් උපන් චඤ්චලභාවය ඇතිබැවින් නැවත මහත් උත්සාහයෙන් උලඇද්දේය. උලඇද්දකල්හි දඬුපලුදෙකින් සුණුකරණලද අණ්ඩදෙක ඇත්තේ මරණයට පැමිණියේය.

### 294 වෙනි ශ්ලෝකයාගේ කථාවයි.

බරණැස්පුරයෙහි කර්පූරපටනම් රදවෙක්ඇත්තේය. ඒ රදුතෙමේද එක්දිනයෙක්හි අලුත්වූ වයසඇත්තාවූ අඹුවහා සමග බොහෝවෙලාවක් ක්‍රීඩාකොට තදවූ නින්දට පැමිණියේය. ඉන්පසු ද්‍රව්‍යපැහැරගැන්ම පිණිස ඒ ගෙට සොරෙක් ඇතුල්වූයේය. ඒ ගෙය මිදුලෙහි බඳනාලද්දාවූ කොටලුවෙක් සිටියි. බල්ලෙක්ද නුදුරුව උන්නේය. කොටලුතෙම ඒ සොරුදැක මේ ක්‍රියාව පින්වතාගේවෙයි, ඒ කුමක්ද තෝ උස්වූ ඝොෂාවලින් ශබ්දකොට ස්වාමියා නිදි නොවළක්වන්නෙහිදැයි බල්ලාට කියේය ඒ අසා බලුතෙම මේ නියොගයාගේ සිතීම තාවිසින් නොකටයුත්තිය, මම මොහුගේ ගෙය යම්පරිද්දෙකින් රක්ෂාකෙරෙම්ද ඒ කාරණය තෝම දන්නෙහිය, මේ තෙම බොහෝ කාලයෙකින් මිදුනේ මාගේ යෙදීම යම්හෙයකින් නොදනීද; ඒ කාරණයෙන් දැන් මට ආහාරදීමෙහිද ස්වල්ප ආදරඇත්තේය. විකලභාවයාගේ දැනිමක් නැතිකල්හි ස්වාමීහු මෙහෙකරුවන් කෙරෙහි මඳවූ ආදර ඇත්තාහුවෙත් යයි කියයි, ඒ අසා කොටලුතෙම බොල නීචය අසවයි කරුණු කියයි. නැවත කොපසහිතවූ කොටලුතෙම විස්මයෙක, යම්තෝ ස්වාමියාගේ කටයුත්තෙහි උත්සාහ නැතිව පසුබස්නෙහිද අතිශයින් පාපයෙක් වෙයි, එසේවේවා, ස්වාමිතෙම යම් පරිද්දෙකින් නින්දෙන් පුබුදීද එපරිද්දෙන් මාවිසින් කටයුතුයයි කියේය. මෙසේ කියා හෙතෙම මහත් ශ

කිඳකෙළේය. එවිට ඒමහත් ශබ්දයෙන් පිබිදුනාවූ ඒරජතෙම නිද්‍රාව වැළැක්වීමට කොපයෙන් නැගිසිට පොල්ලෙකින් කොටලුවාට තැළුයේය. ඒ තැළීමෙන් පසුව කොටලුතෙම මරණයට පැමිණියේය.

352 වෙනි ශ්ලොකයාගේ කථාවයි·

ශ්‍රීපර්වත මධ්‍යයෙහි බ්‍රහ්මපුරනම් පුරයෙක් ඇත්තේය. එහි පර්වත මුදුනෙහි ඝණ්ටාකර්ණනම් රාක්ෂසයෙක් වාසයකෙරේයි යන මිනිසුන්ගේ කථාවක් අසනුලැබෙයි. එක්කලෙක්හි ඝණ්ටාරයක් ගෙණයන්නාවූ එක් සොරෙක් ව්‍යාඝ්‍රයකුවිසින් නසනලද්දේය. ඔහුගේ අතින් වැටුනාවූ ඝණ්ටාරය වානරයන්විසින් ගන්නාලද්දීය. ඒ වානරයෝ ඒ ඝණ්ටාරය නිතර ශබ්දකෙරෙත්, පසුව කනලද මනුෂ්‍යයා නුවර මිනිසුන්විසින්දක්නාලද්දේය. නිරන්තරයෙන් ඝණ්ටාරශබ්දයදඅසනුලැබෙයි. ඉන්පසු ඝණ්ටාකර්ණයා කිපුනේ මිනිසුන්කයි, ඝණ්ටාරයද ශබ්දකෙරෙයි යනු කියා සියලුජනයෝ නුවරකෙරෙන් නික්මගියාහුය. පසුව කරාලා නම් කුට්ටිනියවිසින් විමසා වඳුරෝ ඝණ්ටාරයක් ශබ්දකෙරෙත්යයි තමාදැන දෙවයන්වහන්ස ස්වල්පයක් ධනය ඉදින් වියදම්කරණුලැබේද එකල්හි මම මේ ඝණ්ටාකර්ණයා සිඛකරන්නෙමියි රජතෙම දන්වනලද්දේය. ඉක්බිත්තෙන් සතුටුවූ රජ්ජුවිසින් ඇට ධනදෙනලද්දේය, කුට්ටිනිය විසින්ද සෙනාසමූහයක්කොට එහි ගණෙශාදීන්ට ගෞරවපවත්වා තෙමේ වඳුරන්ට ප්‍රියවූ ඵලයන්ගෙණ වනයටවැද ඵලයෝ විසුරුවන ලද්දාහුය· පසුව ඝණ්ටාරයදමා වඳුරෝ ඵලයන්හි ඇලුනාහුවූවාහුය කුට්ටිනියද ඝණ්ටාරයගෙණ නුවරට ආ තැනැත්ති සියලු ජනයාවිසින් පිදියයුත්තියක්විය.

372 වෙනි ශ්ලොකයකෙරෙන් පසුභාගයෙහි
මාතෘකා ශ්ලොකයයි.

ස්වර්ණරේඛාමහං ස්පෘෂ්ට්වා බද්ධ්වා තමා නශ්‍යව දූතිකා
ආදිත්සුශ්ච මණිං සාධුඃ ස්වදෙෂාද්දුඃඛිතා ඉමෙ.

අහං, මම; ස්වර්ණරේඛාං, ස්වර්ණරේඛාව; ස්පෘෂ්ට්වා, ස්පර්ශකොටද; දූතිකා, දූතිකාතොමෝ; ආත්මානං, තමා; බද්ධ්වාච, බැඳද; සාධුඃ, සත්පුරුෂතෙම; මණිං, මාණික්‍යය; ආදිත්සුඃච, කැමතිවද; ඉමෙ, මොහු; ස්වදෙෂාත්, තමන් දෙෂය හෙතුකොටගෙණ; දුඃඛිතාඃ, දුක්ඇතිවූවාහුයි.

කාඤ්චනපුරනම් නුවර වීරවික්‍රමනම් රජෙක්ඇත්තේය. ඒ රජහුගේ සුකතිස්වාමියාවිසින් මරණස්ථානයට ගෙණයනු ලබන්නාවූ එක් කරනැවැම්යෙක් (පනික්කියෙක්) සත්පුරුෂයක්හු දෙවෙණිකොටඇති කන්දර්පකෙතුනම් පරිබ්‍රාජකයෙක් විසින් මේ තෙම නොමැරියයුතුයයි

නියා චණ්ඩකොණ ගත්තාලද්දේය. රජ්පුරුෂයෝ තුම්හ්නිසා මේ තෙම නොමැරියයුතුද්දැයි කීවෝය. මෙතෙම අපනුලැබේවයි කීයේය. ස්වර්ණරෙඛා මහං ස්පෘෂ්ටවායනමේ ආදිය කියයි. මේ කෙසේදැයි රජ්පුරුෂයෝ කීවාහුය. පරිබ්‍රාජකතෙම කියයි. මම සිංහලද්වීපයෙහි ජීමූතකෙතු රජහුගේ ඇතුළුවූ කන්‍දර්පකෙතුවෙමි- ඉක්බිත්තෙන් එක්දිනයෙක්හි ක්‍රීඩාවනයෙහි සිටියාවූ මාවිසින් මේ සමුද්‍ර මධ්‍යයෙහි තුදුස්වක් දිනයෙහි පහලවූ කල්පවෘක්ෂමූලයෙක්හි මාණික්‍ය රශ්මි පඞ්ක්තියෙන් හොබනාවූ පුටුවෙක්හි උන්නාවූ සර්වාභරණයෙන් සැරහුනාවූ ශ්‍රීකාන්තාවමෙන් වීණාවක් ශබ්දකරන්නාවූ එක් කන්‍යාවක් දක්නාලැබෙයි යනු නැව්වෙළෙන්දෙකුගේ ඉදිරියෙන් අසනලද්දේය—ඉක්බිත්තෙන් මම ඒනැව් වෙළඳුගෙණ නැවට නැඟී එහි ගියේය. නැවත එහිගොස් මාවිසින් එසේම ඇ දක්නා ලද්දීය. නැවත සමග හැසිරෙන්නාවූ විද්‍යාධරදුවහා සහිතවූ ඇ සමුද්‍රමධ්‍යයෙහි ගිලුනී නොපෙණී ගියාය.

පසුව ඇගේ මණිගුණයෙන් අදනාලද්දාවූ මා විසින්ද නැවත ඇට පසුභාගයෙන් පැනීම දෙනාලද්දේය. ඉන්පසු රත්පවුනාට පැමිණ රත් ප්‍රාසාදයෙක්හි එසේම ඇ පුටුවෙක්හි උන්කැනැත්ති අලුත්වූ තරුණ විද්‍යාධරීන් විසින් සෙවනයකරණු ලබන්නී මාවිසින් දක්නාලද්දීය. ඇ විසින්ද මම දුරදීමද්දැක ඇ හා සමග හැසිරෙණ විද්‍යාධර දුවක් එවා ආදර සහිතව කථාකරණලද්දේය. එකල්හි මාවිසින් විචාරණලද්දාවූ ඒ සෙවක ගාන්ධර්වී දුව විසින්ද මෝ තොමෝ කන්‍දර්පකෙලිනම් විද්‍යාධර චක්‍රවර්තිහුගේ දුවූ රත්නමඤ්ජරීනම් වන්නීය යමෙක් තෙම රත්පවුනාට අවුත් සියඇසින් දකීද ඒ තෙමේම මා විවාහකරන්නේයයි මෑ විසින් පොරොන්දුකරණ ලද්දේයයි කියනලද්දේය. එබැවින් මෑ ගාන්ධර්වී විවාහයෙන් විවාහකෙලේය. ඉක්බිත්තෙන් ගාන්ධර්වී විවාහය සිදුවූ කල්හි ඇ හා සමග මම ඇලෙන්නෙම් බොහෝ කාලයක් විසෙමි. පසුව ඇ විසින් එක්දිනයෙක්හි ස්වාමිනි මේ සියල්ල තමන් කැමති පරිද්දෙන් අනුභව කටයුතුය. එසේද චිත්‍රරූපවූ පැවතුම්ඇති මේ ස්වර්ණරෙඛානම් විද්‍යාධරී තොමෝ කිසිකලෙක්හි ස්පර්ශ නොකටයුත්තීයයි රහස්තැනෙක්හි කියනලද්දේය පසුව උපන්නාවූ විස්මයඇති මාවිසින් ඒ ස්වර්ණරෙඛාව අතින් අල්වනලද්දීය. චිත්‍රරූපවූ ඇ විසින්ද පාදපද්මයෙන් ගසනලද්දාවූ මම අවුත් තමාගේ දෙශයෙහි වැටුනේය.

එබැවින් දුකින් පීඩිතවූ මම පැවිද්දාවූයේ පෘථිවියෙහි ඇවිදින් මේ නුවරට පැමිණියේය. මෙහිද පසුගියදිනයෙහි ගොපලුවෙගයි සයනයකරන්නේ දුටුයෙමි. සවස්කාලයෙහි ඒ ගොපලුතෙම ගාලකෙරෙන් ආ කැනැත්තේ දූතියන් හාසමග කථාකරන්නාවූ තමන් අඹුව දුටුයේය. ඉන්

බිඳ.තෙන් ඒ ගොපලු භාය්‍යාවට තළා කණුවෙන්හි බැඳ සැතපුනේය. පසුව මධ්‍යම රාත්‍රියෙහි ඒ බැට්ටියාගේ අඹුවූ දූත සඛී තොමෝ නැවත ඒ ගොපලු භාය්‍යාවකරා එළඹ තිගෙන් වෙන්වීම නැමැති ගින්නෙන් දවනලද මේ තෙම මූළාවූවෙක්මෙන් පවති මහත් අනුභාවයවෙයි. එබැවින් මම තමා මෙහි බැඳසිටිම් තී එනිගොෂ ඔහුට කථාකොට ව හාඑවයි කීය, එසේ සිටි කල්හි පිබිදුනාවූ ඒ ගොපලුතෙම නිමෙක්ද දූත් සොරසැමියාගේ සමීපයට නොයන්නෙහිදැයි කියයි, ඉක්බිත්තෙන් ඒ දූත සඛිය කිසිත් නොකීකල්හි අහංකාරයෙන් මාගේ බසට උත්තරනොදෙන්නෙහිදැයි මෙසේ කියා කිපී ඔහුගේ ආයුධයෙන් නාසය කපනලද්දීය. එසේ කොට නැවත සැතපුනාවූ ගෝපලුතෙම නිද්‍රාවට පැමිණියේය—නැවත ආවාවූ ඒ ගොපලු භාය්‍යාතොමෝ පැවතුම් කෙසේදැයි දූතිය විචාළිය. ඒ අසා දූත සඛී තොමෝ බලව මාගේ මුඛයම පැවතුම් කියයි කීය. පසුව ඒ ගොපලු දූව එසේම තමා බැඳසිටියාය. දූත සඛී තොමෝ කපනලද නාසයගෙණ තමන් ගෙටවැද සිටියාය. ඉක්බිත්තෙන් උදෑසනම ඒ බැට්ටයා විසින් කඩකැති භාණ්ඩ ඉල්වනලද්දාවූ ඒ සඛී තොමෝ ඔහට කඩකැති භාණ්ඩ නොදී එක් කඩකැත්තක් දුන්නීය. පසුව කිපුනාවූ ඒ කරනැවැම්තෙම දුරසිටියේම කඩකැත්ත විසිකෙළේය. එකල්හි කරණලද විලාපශබ්ද ඇත්තාවූ මැ අපරාධයක් නැතිව මාගේ නාසය සිඳිනලද්දීයයි කියා නිති ස්වාමියා සමීපයට මේ කරනැවැමියාගෙන්වන ලද්දේය, ඒ ගොපලු දුවද ඒ ගොපාලයා විසින් විචාරණලද්දී බොල පාපය මහත් පතිව්‍රතාවූ මා විරූපකිරීමට කවරෙක් සමර්ථද මාගේ ව්‍යවහාරය ලොකපාලක දෙවිවරු අටදෙනාම දනිත්යයි කීය. එබැවින් මහා පතිව්‍රතාවූ මම මාගේ ස්වාමියාහැර අනිකක්හු සිතින් පමණවත් ඉදින් නොසිතම්ද එකල්හි මාගේ මුඛය කැපීම් නැතිවේවයි කීය. ඉක්බිත්තෙන් මේ ගොපලුතෙම පහනක්ගෙණ ඇගේ මුඛය යම්තාක් බලාද ඒතාක් නොකපන ලද්දාවූ මුඛයබලා ඇගේ පාදෙක සමීපයෙහි වැටුනේය.

යම් මේ සත්පුරුෂයෙක්වූයේද මොහුගේ කථාවද අසව්. තමන් ගෙයින් නික්මුනාවූ මේ තෙම දෙළොස් අවුරුද්දෙකින් මලය රට සමීපය කොරත් මේ නුවරට ආයේය. මෙහිද වෙශ්‍යකගේ ගෙයි සැතපුනේය. ඉක්බිත්තෙන් කුට්ටිනියගේ ගෙය මිදුලෙහි තබනලද දඬුවලින් කරණලද වෙතාල රූපයකගේ මුදුනෙහි උතුම්වූ එක් මාණික්‍යයෙක් ඇත්තේය. ඒ මාණික්‍යය දැක ධනයෙහි ලොභවූ මේ සත්පුරුෂයා විසින් රාත්‍රියෙහි නැගිට අල්වනලද්දේය. එකල්හිම නූහුල්වලින් ගමක්කරවනලද්දාවූ ඒ වෙතාල රූපයවිසින් අත්දෙකින් පීඩාකරණලද තැනැත්තේ විලාපශබ්දකෙළේය. පසුව නැඟිට කුට්ටිනිය විසින් පුත්‍රය මලයර

ට සමීපයකොටගෙන් ආපෙහුද එබැවින් මොහුට සියලු රත්නයන්දෙව, ඉදින් එසේ නොවිනම් මොහු විසින් හැරිය යුත්තෙතක් නොවන්නෙ හිය, මේ දූසතෙම මෙසේම යයි කියනලද්දේය. ඉක්බිත්තෙන් මොහු විසින් සියලු රත්නයෝ දෙනලද්දාහුය. දූත් හරණලද සියලු ධනය ඇති මොහුද අපකෙරෙහි එක්වූයේය. මේ සියල්ල අසා රාජපුරුෂයන් විසින් යුක්තිය පවත්වන ලද්දේය. කරනැවැච්චි භායසී තොමෝ ඉස මුඩුකරණ ලද්දීය. ගොපලු භායසී තොමෝ අනුශාසනා කරණ ලද්දීය. කුට්ටිනියද දඹුවම්කරණ ලද්දීය. සත්පුරුෂයාගේ ධනයෝ දෙන ලද්දාහුය.

# ශුද්ධි පත්‍රය

| පිට. | පෙළ. | අශුද්ධ. | | ශුද්ධ |
|---|---|---|---|---|
| iv | 18 | කරුණු | ... | කරුණු |
| ,, | 32 | ඉපම | ... | ඉපදීම |
| ,, | 34 | ප්‍රත්‍යයශබ්ද | ... | ප්‍රත්‍යයාදිශබ්ද |
| v | 20 | කලයක | ... | කාලයක |
| ,, | 21 | බෙම්බාය | ... | බොම්බාය |
| ,, | 34 | ශස්ත්‍රය | ... | ශාස්ත්‍රය |
| vii | 21 | විවස්වාන් | ... | විවස්වාන් |
| ,, | 23 | නිතිය | ... | නීතිය |
| viii | 2 | ඉදුබු | ... | ඉදිබු |
| 3 | 1 | විද්‍යාශස්ත්‍රව, ශුද්ධශා ස්ත්‍රයද; ශාස්ත්‍රව, ශාස්ත්‍රයද | | ශස්ත්‍රව, ආයුධශිල්පයද; ශා ස්ත්‍රඥව; ශාස්ත්‍රයද; විද්‍යා, විද්‍යායි |
| ,, | 5 | ආද්‍රීයතෙ | ... | ආද්‍රියතෙ |
| 4 | 29 | අභිගමනම්, අසබ්ධීමය; නවරම්එව, උතුම් නොවේමය; | | න අභිගමනම්, නොවිළඹීම; වරම්එව, උතුම්මය |
| 5 | 4 | අවිවාත් | ... | අවිවාන් |
| ,, | 20 | කිදෘශී, කෙබඳුද යනු | | කීදෘශිභවති,කෙබඳුවන්නිද යනු |
| 6 | 3 | සියගණනක්ද | ... | සියගණනකින්ද |
| 7 | 20 | නුම | ... ... | මනු |
| 10 | 8 | කවුඩනුයනකල තල්එලයක් වැටුනායයි | | කාකයක්හුගේ ගමනක්මෙන්ද තල්ඵලයක් වැටුනාක් මෙන්ද |
| 11 | 8 | පාරගමී | ... | පාරගාමී |
| ,, | 18 | දිගමනාහි | ... | පච්ච |
| 12 | 4 | ශුකඃ | ... | ශුක |
| 13 | 7 | උපායක් නැත්තාවූ | | ක්‍රියාකාරණ අද්‍යවරහිතවූ |
| 14 | 2 | වූයේද | ... | උවතිද |
| ,, | 15 | සන්තොෂද | ... | ස්වර්ගවද |
| 16 | 13 | පූරදු | ... | පූරුදු |

| පිට. | පේළි. | අශුද්ධ. | ශුද්ධ. |
| --- | --- | --- | --- |
| ,, | 30 | දුහිතාභරණඃ, ස්වාමිපුරුෂයාකෙරෙහි සොභාගරහිත ස්ත්‍රියගේ—නොහොත් අවාශනාවන්ත ස්ත්‍රියගේ ආභරණමෙන්; ක්‍රියාම්විනා, උපාය නැත්තාවූ; ඥානම්, ප්‍රඥාව; ප්‍රායඃ භාරඃ, බොහෝසෙසින් බරවේ. | දුහිතාභරණප්‍රායඃ, ස්වාමියාකෙරේ සොභාගරහිත ස්ත්‍රියගේ ආභරණමෙන්; ක්‍රියාම්විනා, නුවණින්පටන්ගන්නා ක්‍රියාරහිතවූ; ඥානම්, ප්‍රඥාව; භාරඃ, බරවේ. |
| 17 | 14 | සෙයනු ... | සොයනු |
| ,, | 26 | සඳමඩල ... | සඳමඬල |
| ,, | 28 | ලලෙහි ... | ලළෙහි |
| ,, | ,, | ලද්දේද ... | ලද්දක්ද |
| 18 | 11 | විචාරෙන භොජනෙපි | විචාරෙණ භොජනෙපය |
| ,, | 14 | විචාරෙන ... | විචාරෙණ |
| ,, | 15 | ප්‍රවර්ත්තතෙ, පැවැත්මවේ | අප්‍රවර්ත්තතෙ, පැවැත්මනොවේ |
| 18 | 27 | ඝාණී, ලොභ ... | ඝෘණී, වරදසොයණ |
| 19 | 4 | මොහිතඃ ... | මොහිතාඃ |
| ,, | 10 | කාමප්‍රජායතෙ ... | කාමඃ ප්‍රජායතෙ |
| ,, | 26-23 | ඉන්ද්‍රයාරා ... | ඉන්ද්‍රියාණ |
| ,, | 30 | තත්ජය ... | තජ්ජය |
| 20 | 4-8 | සතමින් ... | සතමහි |
| ,, | 28 | බව ... | බවද |
| ,, | 30 | විෂාදෙන ... | විෂාදෙ |
| 21 | 24-27 | තෘෂෙ ... | තුෂෙ |
| ,, | 27 | අතිශයින් ... | අතිශයින් |
| 23 | 10 | නෛරපි ... | නෛරපි |
| 23 | 31 | සත්පුරු ... | සත්පුරුෂ |
| 24 | 5 | තදුභවිෂ්‍යති ... | තදභවිෂ්‍යති |
| ,, | 19 | තිත්ය ... | තිතීතිය |
| 25 | 24 | විෂම ... | විසම |
| 27 | 2-3 | දැත්තෑහට, වාසඃ, තමාඑක්ව විසීමට කැමැත්ත; කස්‍යචිත්, කිසිකාරණයෙක්හි. | ඇත්තාවූ; කස්‍යචිත්, කිසිවෙකුට; වාසඃ, තමාඑක්ව විසීමට කැමැත්ත. |

| පිට. | පෙළ. | අශුද්ධ, | ශුද්ධ. |
|---|---|---|---|
| ,, | 5-6 | ඇතිව්‍රකතෙම, (මුවන් මරන්නාවූ දිවියා සමාන වනයෙහි වසන සිවුපාවගීයක්) | ශිජ්ජලිඝිනිතෙම |
| 28 | 5 | කුව්නාති ... | කුව්නෑති |
| 29 | 6 | වැලකුනාහු ... | වැළකුනාහු |
| ,, | 21 | දක්නේය ... | දකිව් |
| 31 | 25 | එතද් ... | එතත් |
| 32 | 2 | හෑත්වා ... | හැදවා |
| ,, | 7-10 | විෂකුමහ ... | විෂකුම්භං |
| ,, | 10 | ඇතුලත ... | ඇතුළත |
| ,, | 15 | කෘතානාං ... | කෘතානාම් |
| 33 | 25 | හෘ ... | හෘදි |
| 34 | 9 | න්නොවේ ... | තේනොවේ |
| ,, | 20-22 | සාගරමහ ... | සාගරම්භ |
| 36 | 8 | මෘත් ... | මෘද් |
| 37 | 7-10 | සමානං ... | සාමාන්‍යං |
| 37 | 12 | සුහෘත් ... | සුහෘද් |
| 41 | 7 | සත්‍රිනාම් ... | සත්‍රිණාම් |
| 42 | 8 | සත්‍රිනාං ... | සත්‍රිණං |
| 45 | 9 | සත්‍රිබුබෝ ... | සත්‍රිබුබෝ |
| 46 | 26 | තානිපද්‍රි ... | තානීපද්‍රි |
| 48 | 13 | දෘරිද්‍යාද්‍රිය ... | දරිද්‍යාද්‍රිය |
| ,, | 19 | පිරිහෙනු ලැබේ ... | පිරිහේ |
| 49 | 16 | වෙශී ... | වෙසා |
| 52 | 26—31 | පෘථුවීං ... | පෘථිවීං |
| 54 | 26 | දිළිඳුතැනැත්තේ... | ලොභතැනැත්තේ |
| ,, | 28 | සැරුසේද ... | සාරතබාද |
| 55 | 12 | සාරණලද්දාවූ; නිබෑතෙන, වලසකිකියන ලද්දාවූ | සැරීමෙන්; නිබාතෙන, පිහුටුවන ලද්දාවූ |
| ,, | 29, 31, 32 | යම් කාරණයෙකින් | යමක් |
| 56 | 10 | දිළිඳුන්හා ... | සතුරන්හා |
| ,, | 19 | බමුනන් ... | බමුණන් |
| 57 | 31 | ඉතිරිවනුලැබේ ... | ඉතිරිවේ |
| 58 | 31 | නාවාඤ්ඡනත් ... | නාඅභිවාඤ්ඡනති |
| 59 | 26 | සුඛම්, සැපතද ... | දුඃඛම්, දුකද |
| 62 | 18 | විසින්ද ... | විසින්ද; ආමිෂම්, ආහාරයතෙම |
| ,, | 20 | සෙස්සන්ගේ ද්‍රව්‍ය අනුභවකෙරේ. ... | සෙස්සන් විසින් අනුභවකරණුලැබේ. |
| 63 | 9—12 | කාවෙජ්ජනා | කාවෙජ්ජණ |

| පිට. | පේළි. | අශුද්ධ. | | ශුද්ධ. |
|---|---|---|---|---|
| 65 | 11 | සරණාගතම් | ... | ශරණාගතම් |
| 67 | 19 | සරණම් | ... | ශරණම් |
| ,, | 26 | හසනි | ... | හසති |
| 69 | 23 | යාදෘක් | ... | යාදෘශ් |
| 70 | 16 | ත්‍රාණං | ... | ත්‍රාණං |
| ,, | 30 | භාජනං | ... | පාත්‍රඃ |
| ,, | 32 | පහසුවේ | ... | පහසුවේ. සම්බාධසමයෙය, දී ශුනුවූ කාලයෙහි; |
| 71 | 3 | ඔහුන්ට | ... | ඔවුන්ට |
| ,, | 15 | පදෛඃලක්ෂම්ඃ | ... | පදෛලීක්ෂම්ඃ |
| 72 | 29 | ත්‍යුපගුහිතුං | ... | ත්‍යුපගූහිතුං |
| 73 | 20 | නොවැඩේ | ... | නොවඩා |
| ,, | 29—32 | වෙක්ෂයාත් | ... | වෙක්ෂයා |
| 74 | 17 | පිරේ | ... | පූරණුලැබේ |
| 77 | 20 | වෙශා | ... | වෙසා |
| 79 | 33 | මෙනි | ... | මෙන්; විශීදති, කලකිරේ |
| 80 | 4—8 | සම්භාෂයෙද් | ... | සම්භාවයෙත් |
| ,, | 9 | කළුනොකරන්නේද | | ආදරනොකරන්නේද |
| ,, | 10 | වලක්වන්නෙක් | ... | වළක්වන්නෙක් |
| 83 | 13 | පවත්වනු ලැබේද | ... | පවත්වාද |
| 84 | 12 | නිපාත්‍යත | ... | ණිපාත්‍යතෙ |
| ,, | 20 | තත්වත් | ... | තවත් |
| 85 | 24 | මනං | ... | මනඃ |
| 86 | 16 | කිංඅපිඅසති | ... | කිංඅසති |
| 89 | 6 | වෙත් | ... | වෙත්. ගුණඃ, ගුණයෝ; ත්‍රිවිධාඃ, ත්‍රිවිධවෙත් |
| ,, | 26 | සදෑකි | ... | සදෘහිඃ |
| 93 | 33 | ද්‍රදීපස්‍ය | ... | ප්‍රදීපස්‍ය |
| 94 | 8 | සාරතාං | ... | සාරතාම් |
| 98 | 3—5 | වාජ්‍යා | ... | වාඡ්‍යා |
| ,, | 11—15 | කෘවෙජ්ණ | ... | කෘවෙජ්‍රණ |
| ,, | 20 | වශ්‍රුතිභාතඃ | ... | ශ්‍රුතිභාවතඃ |
| ,, | 24 | කටයුතුබව | ... | කාරණබව |
| ,, | 29 | නොකටයුතු | ... | නැත්තේවේ |
| 100 | 10 | නිතර හැසිරීමද | ... | එකාගබවගෝ මනාසවභාවයද |

| පිට. | පෙළ | අශුද්ධ. | | ශුද්ධ. |
|---|---|---|---|---|
| ,, | 26-27-28-29-30 | දුෂ්ටව්‍රණෝද්ගව, අසාධ්‍ය වර්ණයන් මෙන්; උද්වේජෛඃ, මහත්වශයෙන්; නිපීඩිතාඃ, මිරිකන ලද්දෑහු; අනතඃසාරං, (වණය) ඇතුළත පවත්නා සැරව; වමනති; (පිටතට) නීකුත්කෙරෙත්; නියොගිනඃ, නියොගකරන්නාවූඇමති වරයෝ; මහීපතෙඃ, රජහුගේ; (බනාස පීඩාකරණලද් දෑහුම;) ප්‍රායඃ, බොහෝසෙයින්; (නිකුත්කරන්නාහු) භවනති, වෙත්මැයි. | | උද්වේජඃ, ශොකස්යන්විසින් නිපීඩිතාඃ, පීඩාකරණලද් දෑහු; මහීපතෙඃ, රජහුගේ අනතඃසාරං, ඇතුළත බනාස; වමනති. නිකුත්කෙරෙත්. නියොගිනඃනි, නියොගකරන්නෝ වනාහි; ප්‍රායඃ, බොහෝසේ; දුෂ්ටව්‍රණෝද්ගව, දුෂ්ටවණමෙන්; භවනති, වෙත්. |
| 102 | 3 | රජා | ... | නෘපතිඃ |
| ,, | 17—21 | තථ්‍යා | ... | තත්‍ථ්‍යා |
| 104 | 2 | තා, සත්‍රි තොමෝ | ... | තාඃ, සත්‍රිහු |
| ,, | 4 | සිශු | ... | ශිශු |
| ,, | 10 | විකිණී | ... | විකිණී |
| ,, | 21 | සෙක්වේංකා | ... | සෙක්වේ. කා |
| ,, | 28 | කණික | ... | කනක |
| 106 | 28 | වේසි | ... | වෙසි |
| 107 | 2 | දෘෂ | ... | ෆෙද්‍රෂ |
| 108 | 18 | කාඩ්ස්ෂ්ං | ... | කාඩ්ස්ෂාං |
| ,, | 25 | හෙතම | ... | හෙතෙම |
| 111 | 2 | අකුශලාන්, දුශ්චරිතයන් | ... | අකුශලාත්, දුශ්චරිතයකෙරෙන් |
| ,, | 34 | බදින්නේය | ... | නසන්නේය |
| 112 | 7 | තම | ... | තමා |
| 114 | 7 | කැමකල්හි | ... | හැමකල්හි |
| ,, | 14—24 | කෙෂ්මෙන | ... | කෂේමෙණ |
| ,, | 31 | අම් | ... | අසම් |
| 116 | 6 | යතනාත් | ... | යතනාන් |
| 118 | 7 | සාරිතො | ... | සාරිතා |
| 120 | 6—10 | මණී | ... | මනී |
| ,, | 20 | මාතෙචා | ... | මාතෙනා |
| ,, | ,,—23 | ගණ | ... | ගනා |
| 121,122 | 33—5 | පානාං | ... | පාණං |

| පිට. | පෙළ. | අශුද්ධ. | ශුද්ධ. |
|---|---|---|---|
| 122 | 20—22 | තථව ... | තතථව |
| 123 | 24 | වෙශා ... | වෙසා |
| ,, | 32 | වදනාසා ... | වඳනාසා |
| 124 | 11 | සූත ... | සූතා |
| 125 | 30—32 | මූර්ධානාම් ... | මූර්ධාණම් |
| 129 | 13 | කළපමණින් ... | කරන්නේ |
| 131 | 25 | සඞ්ගාත් ... | සඞ්ගමාත් |
| 134 | 11 | වෙශා ... | වෙසා |
| 135 | 17 | හා සමග මියයන ... | ට අනුව පවත්නා |
| ,, | 21 | හා සමග මරණයට පැමිණෙන් | අනුව පවති |
| ,, | 27 | තවත් ... | තවත් |
| 140 | 9 | තත්වත් ... | තවත් |
| ,, | 15 | මහාංලොකෙ ... | මහාලෝකෙ |
| 142 | 2 | රසවි ... | රසවීඃ |
| 146 | 17 | වෙශි ... | වෙසී |
| 147 | 28 | සෙනාගණශ්‍රේෂ්ඨානිශු | සෙනාපතිතෙම |
| 148 | 30 | ගාණ ... | ගානා |
| 153 | 10 | ජිගීෂුඃ ... | ශත්‍රූන්, සතුරන්; ජීගීෂුඃ |
| ,, | 11 | ශත්‍රූන්, සතුරන්; ... | ......... |
| ,, | 12 | සවන්නේය ... | සන්නේය |
| ,, | 31—33 | කාෂ්ඨා ... | කාෂ්ඨයා |
| 154 | 2 | තත් ... | තත් |
| 154 | 28 | බන්ධුබ ... | බන්ධුබී |
| 156 | 8 | කසාය ... | කෂාය |
| ,, | 9 | කෂට ... | කසට |
| ,, | 31 | ගනා ... | ගන්නා |
| 157 | 6 | මත්විධා ... | මද්විධා |
| 158 | 11 | තත්නා ... | තන්නා |
| 162 | 5 | සක්‍ය ... | ශක්‍ය |
| ,, | 17 | ශ්‍රිණී ... | ශ්‍රිතී |
| 163 | 7 | බල ... | බාල |
| 164 | 18 | දුම ... | දම |
| 165 | 2 | සුපූජිතාඃ ... | සම්‍යක්පූජිතාඃ |
| 168 | 2 | සකාඥ ... | සකාඥඃ |
| ,, | 24 | රම්පාසය ... | රම්පාසය |
| 169 | 33 | ගාවාම්ප ... | ගවාම්ප |
| ,, | 34 | ඇත්ත ... | ඇත්තා |
| 127 | 31 | විෂම ... | විසම |
| ,, | ,, | දෙදෙනක් .. | දෙදෙනෙක් |
| 174 | 15 | සතු | ශතු |
| ,, | 18 | ප්‍රලාප | විලාප |

| පිට. | පේළි. | අශුද්ධ. | | ශුද්ධ |
|---|---|---|---|---|
| 176 | 25–26 | බලලෙක් | ... | බළලෙක් |
| ,, | 31 | පැම්ණාවූයේ | ... | පමුණුවනලද්දේ |
| 177 | 31 | බනවලි | ... | බනවලින් |
| 179 | 20 | ඉදින් | ... | ඉදින් |
| 181 | 31 | කබ්සු | ... | කසුබ |
| 182 | 9 | හිරූ | ... | හිරු |
| ,, | 12 | හිරූ | ... | හිරු |
| 183 | 16 | නාහි, තැමකිනොවෙත් | | හි, කැමතිනොවේ. |
| 185 | 17 | ආතම | ... | ආතමා |
| 187 | 23 | ෂූර | ... | ශූර |
| 188 | 35 | ඔවූන | ... | ඔවුන් |
| ,,–189 | 36–35 | වණ | ... | තණ |
| ,, | ,, | සිටුවූන | ... | සිටුවන |
| 191 | 12 | මහාරජ | ... | මහරජ |
| ,, | 23 | සජීෘ | ... | සජී |
| ,, | 25 | දක්න | ... | දක්නා |
| 191 | 28 | පින්වත පසුව උපන් නාවූ විෂමසිත්ඇති ඒ මැඩිතෙම | | පසුව උපන්නාවූ විස්මසිත් ඇති ඒ මැඩිතෙම පින්වත |
| 193 | 10 | මෘතීෘ | ... | මෘත්‍යු |
| ,, | 22 | ප්‍රීය | ... | ප්‍රිය |
| 195 | 13 | පිය | ... | ප්‍රිය |
| 197 | 6 | නාසෘත් | ... | නාසාත් |
| 199 | 18 | ශක්‍යතෘ | ... | ශක්‍යතෙ |
| 200 | 3–5 | තථව | ... | තතථව |
| ,, | 30 | බ්‍රාහමන | ... | බ්‍රාහ්මණ |
| ,, | 33 | නොකට | ... | නොකොට |
| ,, | ,, | මරුයේය | ... | මැරුයේය |
| 201 | 4 | රන්නාවූ | ... | රන්නා |
| 202 | 4 | තරා | ... | තාරා |
| ,, | 13–17 | ඵූත් | ... | ඵුත් |
| 203 | 8 | ඉවෙජත් | ... | ඇව්වෙජත් |
| 205 | 19 | අවයො | ... | ආවයො |
| 207 | 6 | උපහර | ... | උපහාර |
| 209 | 9 | මාතෘක | ... | මාතෘකා |
| 210 | 27 | එකලහි | ... | එකල්හි |
| 218 | 24 | බලලෙක් | ... | බළලෙක්. තවත්තැන්වල |

ශ්‍රීමද්‍යශාත්‍යාගබලාන්විතො යඃ
සුසෙව්‍යදෙශාස්සාදිදිශාධිපාඪ්‍යඃ,
ප්‍රශස්තාශුරෙ විරජමනශ්‍රී
ආරාධිතඃ තෙන විචක්ෂණෙන,

ශ්‍රීසුමඞ්ගලසංඝෙශො යඃ
ස්ථවිරඃ සත්‍යතත්පරඃ,
තෙනෙදං ලිඛිතා ව්‍යාඛ්‍යා
ලොකාර්ථාය තපස්විනා.

ගතෙ ශාකෙ නවනන්ද
ගිරිචන්ද්‍රෙ සුමුද්‍රිතා,
හිතොපදෙශව්‍යාඛ්‍යෙයං
හිතමාර්ගොපදෙශිනී.

සබ්බ දානං ධම්ම දානං ජිනාති



නිබ්බාන පච්චයෝ හෝතු